# සිංහල සාහිත්‍ය වංශය

ප්‍රාචීන භාෂෝපකාර සමාගම විසින්
පණ්ඩිත උපාධි ප්‍රදානයෙන් සම්මතයි

සම්පාදක :

**පුඤ්චිබණ්ඩාර සන්නස්ගල**

පළමුවන මුද්‍රණය 1947

මුද්‍රණය
කොළඹ ලේක්හවුස් හි
දිනමිණ යන්ත්‍රාලය

# සිංහල සාහිත්‍ය වංශය

ආරම්භයේ සිට ක්‍රි: ව: 1600 දක්වා සංක්ෂෙපයෙන් ද එතැන් සිට ක්‍රි: ව: 1900 දක්වා විස්තරයෙන් ද සිංහල සාහිත්‍ය වංශය පිළිබඳ තොරතුරු සංගෘහිතා යි.

# පුෂ්පෝපහාරය.

යම් මවක් තොමෝ හදම්බලින් උතුරු ආ ප්‍රේම රසය වැනි කිරි පොවා මා ඇති දැඩි කළා ද, යම් පියෙකුත් සියල් සිරුරින් නැගි මෛත්‍රීබිඳු වන් සෙවද ජලයෙහි වහලින් කයින් හා බුද්ධියෙන් මා මුහුකුරුවාලූයේ ද —

ඒ මාගේ දයාබර මවුපියනට මේ සාහිත්‍යපුෂ්පය මහත් භක්තියෙන් පූජා කරනු ලැබේ.

පූඤ්චිබණ්ඩාර සන්නස්ගල

# පටුන


පිටු

ප්‍රස්තාවනා ... ... i—vii

සාහිත්‍ය ප්‍රවේශය

ලංකාවේ ආදිම ලේඛක හා සිංහල භාෂාව; අනුරාධපුර — පොළොන්නරු — දඹදෙණි — කුරුණෑගල — ගම්පල — කෝට්ටේ — සීතාවක සමයන්හි සිටි පඬිවරුන් හා ලියැවුණු පොත්පත් පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු. ... ... ... ix—xxxviii

ආමුඛය

සිංහල ජාතිය — භාෂාව හා සාහිත්‍යය හැදින්වීම; ග්‍රන්ථ කරණ ප්‍රවෘත්ති. ... 1 — 5

ප්‍රාරම්භ කථා

ජයවර්ධනපුර කෝට්ටේ උන්නතිය හා අවනතිය; සීතාවක රාජධානිය හා මහනුවර පුරාවෘත්තය. ... ... ... 5 — 17

I භාසන තරඞ්ගය

ක්‍රි: ව: 1600 – 1700 අතර දේශීය – ශාසනික – ශාස්ත්‍රීය ප්‍රවෘත්ති; තත් කාලීන පොත්පත් හා පඬිවරු. ... ... ... 18 — 45

II උද්ගම තරඞ්ගය

ක්‍රි: ව: 1700 — 1800 අතර දේශීය — ශාසනික හ ශාස්ත්‍රීය තොරතුරු; තත් කාලීන ග්‍රන්ථ හා පඬිවරු; කතෝලික සමය හා තත් සාහිත්‍ය කෘති. ... ... 46 — 136

III වර්ධන තරඞ්ගය

ක්‍රි: ව: 1800 — 1900 අතර දේශීය – ශාසනික හා ශාස්ත්‍රීය තොරතුරු; වාද විවාද හා ප්‍රවෘත්ති පත්‍රාදිය; ග්‍රන්ථ හා තත් කර්තෘවරු. 137 — 164

සාහිත්‍ය ශේෂය

ව්‍යාඛ්‍යා — සාමයික — ඓතිහාසික — සාමාජික හා ශික්ෂාපනික ග්‍රන්ථ; වෛද්‍ය — ජ්‍යොතිෂ — භූතවිද්‍යා ග්‍රන්ථ; පැරණි ලිපි වගී හා ප්‍රබන්ධ. .... ... ... 165 — 188

විෂය සූචිය ... ... ... 189 — 192

# ප්‍රස්තාවනා

---

**පොත් පත්**

පොත් පත් වූකලි චිත්‍ර පටයෙකි. ඉන්ද්‍රිය පථයට විෂය වන්නාවූත්, ඉන්ද්‍රිය ශක්තිය ඉක්ම සිටියාවූත් සජීවාජීව ලෝක විස්තාර යෙහි අපරිමාන දර්ශනයන් ප්‍රතිභාපූර්ණ බුද්ධිමතුන්ගේ ස්වභාව නිර්මල මනෝ යන්ත්‍රයෙන් කැටිකොට දක්වන විශාල චිත්‍ර පටයෙකි. ආගමය, දර්ශනය, ඉතිහාසය, ව්‍යාකරණය, අලඞ්කාරය, ඡන්දසය, ජ්‍යොතිෂය, ගණිතය, මිණිතය, උපදේශය, රසායනය, කලායැ යි මේ ආදීන් විවිධ විභාගවත් වූ එහි ඇතැම් කොටසක් ජීවිතයෙන් එපිට බලනු සඳහා ය. එතෙර සැපත සඳහා ය. සමහරක් ජීවනය සඳහා ය. ජීවිතයේ ශිෂ්ටත්වය, සැපත, ප්‍රීතිය සඳහා ය.

ලෙව්හි අසඞ්ඛ්‍ය සඞ්ඛ්‍යාත පශු-පක්ෂීන් හා මනුෂ්‍යයා ලේ-මසින් යුත් ශරීර පිණ්ඩයෙන් සමවන කල්හි දු යම් ගුණයක් නිසා උසස් යැ, විශිෂ්ට යැයි සලකනු ලැබේ නම් ඒ බුද්ධිය මේ පොත් පත්හි මාතාව වෙයි. අනාපතිමත් සුබාශාව ඇති මිනිසා ස්වකීය ඉෂ්ටප්‍රාප්තිය සඳහා පූර්වෝක්ත බුද්ධිය උපයෝගී කර ගනියි. එහි පැන නගින විවිධ චින්තාවලීන් හෝ වාක්‍යයට නගයි. ගීතියට නගයි. එකකු නැගූ මේ චින්තාවලිය සෙස්සෝ විමසති. එයට විවරණ කරති. එය පසසති. අනුකූල වූ නව අදහස් පල කරති. නොහොත් එය හෙළා දකිති. එයට ඉදුරා විරුද්ධ වූ අන් මගක් හුවා දක්වති. ඒ සියල්ල වාක්‍යයෙන් ලියන ලද්දේ එක් එක් පොතෙකි.

එකෙක් ස්වකීය ජීවනයුගයෙහි ජනජීවිතය බලා එහි චාරිත්‍ර-ව්‍යවස්ථාවන් රැස්කරයි. තමහට පෙනෙන පරිදි— සිතෙන පරිදි— ස්වාභාවික හා කෘත්‍රිම වූ ද්‍රව්‍යාද්‍රව්‍යයන් ගැන ලියයි. අප්‍රාණීන් කෙරෙහි ප්‍රාණය ආරූඪ කරයි. ලලිත වස්තූන් හා සමකොට දක්වයි. ඒ කාව්‍යයෙකි.

තවෙකෙක් ස්වකීය ජීවනයුගය ඔස්සේ පසුගිය කාලය දෙස බලයි. දන්නාවූත් විචාරයි. නටබුන්වී යමින් පවත්නා දෙය පිරික්සයි. ඉක්බිති ස්වකීය නිගමනය ඉදිරිපත් කරයි. ඒය ඉතිහාසය නම්.

එකෙක් අනාගතය දක්නට තැත් කරයි. ආකාශගත වූ විදුලිය, ග්‍රහ-තාරකා, වලාකූට අංදිය හා භූමිජාත වෘක්ෂලතාදී යෙහි මල් පලදූරුම, සාමන්‍ය වාතයේ ශිශිරෝෂ්ණය වැනි ස්වාභාවික පරාවර්තනශීලී ද්‍රව්‍ය අද්‍රව්‍ය වස්තූන් පිළිබඳ ස්වකීය

ප්‍රත්‍යක්‍ෂයන් සාධක කොට ගෙන මසකින් එපිට දකියි. වර්‍ෂයකින් එපිට දකියි. වර්‍ෂ සහශ්‍රයකින් එපිට දකී. ඒ ය ජ්‍යොතිෂය.

ලෝකය දෙස බලනුවට තරම්ව විශද නො වූ ඇතැම් අය පැරැන්නන්ගේ නිගමනයන් ලියූ භාෂාව දෙස බලයි. එහි අකුර පදය වාක්‍යය විමසයි. එහි විවිධ යෙදුම් ශාස්ත්‍රස්ථානයෙහි තබා භාෂාව නීතිගත කරයි. එකෙක් එහි ලලිත කථාවන් හා වක්‍රොක්තීන් පිඩුකරයි. නැතහොත් ගීතියට සීමා වූ මාත්‍රා සඞ්ඛ්‍යාව, අකුරු පරිමාණය, විසඳයි. ව්‍යාකරණය, අලඞ්කාරය, ඡන්දස යැයි ඉදිරිපත් කරන්නේ ඒවා ය.

**ලෙඛකයා**

ලෝකය කහටත් සාධාරණවතුදු එහි ඇති සාමාන්‍ය–අසාමාන්‍ය දර්‍ශනයන් පිඬුකොට වාක්‍යයට හෝ කාව්‍යයට නැගීම සියල්ලවුන් විසින් නො කළ හැක්කේ ය. ඉන්ද්‍රිය ශක්තිය ඉක්ම ගියවුන් තබා ඉන්ද්‍රිය ගොචර වූ දෙය දු විචිත්‍රාකාරයෙන් තබා ඇති සැටියෙන්වත් කියාපෑම බොහෝ දෙනකුන් විසින් නො කළ හැකි ය. එහි ලා සමර්ථ වන්නෝ දහසින් එකෙකි. එහෙයින් මැ ය කීයේ—

> "ශතෙෂු ජායතෙ ශූරඃ–සහශ්‍රෙෂු ච පණ්ඩිතඃ
> වක්තා ශතසහශ්‍රෙෂු ———" යි,

ජන්මාන්තරාගත අභ්‍යාසය හෙතු කොට ලත් ප්‍රතිභාණය ඇති, එහෙයින් ම ප්‍රබුඬ වූ මතින්ද්‍රියවත්; භාෂා ශාස්ත්‍රයෙහි හා සමාජයෙහි හසළ, එහෙයින් විමංශනාත්මක වූ ප්‍රඥා චක්‍ෂුස ඇති කිහිපදෙනෙක් ම එහිලා සමර්ථ වෙති. ඔහු ඉන්ද්‍රිය ගොචර වූ ආරම්මණපථය තත් වූ පරිදි හඳුනති. එහි ඇතුළත– බැහැර ගුණාගුණයන් විමසති. සමාජයෙහි ආචාර–විචාරයන් විභාග කරති. සුගුණ–දුර්ගුණයන් මනිති. එහිලා ඔහුට ඇතිවන ප්‍රීතිය, අනුකම්පාව, සංවෙගය, උත්සාහය, ආශ්චර්‍ය්‍යය, භීතිය, ශාන්තිය අන් අයටත් ඇසෙන සේ කියති. පෙනෙන සේ ලියති. එහිලා අභිනව අර්ථයන් ගැබ් වූ තරමට– අම්ලාන ප්‍රසාදවත් වාක්‍යයන් යෙදුනු තරමට ලෝවැස්සෝ පහදිති. එහෙයින් ම ලෙඛකයා යශසට– ධනයට– බුහුමනට පාත්‍ර වෙයි.

කීයේ මැනු:— "කාව්‍යං යශසෙ‍ර්ථකාතෙ"

එබඳු ලෙඛකයෝ නො මියති. ඔවුනුදු ගේ කෘතීහු නො අතුරුදහන් වෙති. වර්‍ෂ සහශ්‍ර පරිමාණ කාල යුගයෙහි ඔවුහු ද ඒවා ද බහුමාන ප්‍රතිග්‍රහණයෙන් බැබලෙති. බලනු මැනවි. සත්ලක්‍ෂයකැයි කියන පොළොන්නරු වැස්සෝ මිය ගියහ. එක් මැ ගුරුළුගෝමීහු ජීවත් වෙති. සිය ගණන්

ක්ෂත්‍රියයෝ මලහ. එක් මැ පැරකුම්බාවෝ ගී ගයති. හෙළ දිවයින බැබළවූ දහස් ගණන් ප්‍රව්‍රජිතයන් වහන්සේ තුළු-තම්බා අරම් සමඟ ම පොළොව මතුයෙහි සුණු බවට පත්හ. එක් මැ රහල් හිමියෝ කවි කියති.

සෙස්සෝ ජීවත් නුවූවෝ ද? පොතක්-පතක් තැනූ අන් කෙනෙක් නැද් ද? වූවෝ ය. එහෙත් ඔහු බොහෝ දෙන සමාජ තත්ත්වයෙහි නො හසල දැනුම් ඇත්තෝ ය. ඔවුන් ගේ පොත-පත එදට පමණක් ම ප්‍රයෝජන විය. ඒ පුරුෂායුෂයෙන් පසු ඒවා හණමිටි මෙන් ජනසම්භාවනයෙන් ඈත් වූවෝ ය. යුගයෙන් යුගයට ම ඇත්තවන- සාමාජික තත්ත්වයනට එකඟවන- මනොවිඥානයෙහි පතුල දක්වා කාවැදෙන සදාකාලීන රසයක්-උපදෙශයක් ඒවායේ නො තිබුණ වන. ඒ ගත්කරුවෝ ස්වකීය ග්‍රන්ථයනට ජීව ශක්තිය නො දුන්නෝ ය. දුන්නෝ නම් අල්ප ආයුෂයකි. එහෙයින් ඇතැම් පොතක් ගත්කරුවා මියන්නට ද පෙරාතුව ම මිය යයි. අනිකක් දෙවන යුගය අවසනැ කීර්තිශෙෂ වේ.

**ග්‍රන්ථ විනාශය හා එයට හේතු**

ලේඛකයකු පොතක් ලියූ තරමට එය කියවීමට— කියවා රැක ගැනීමට බැඳුණු සමාජයෙක් නැති. යම් කෙනෙක් රැක ගනිත් නම් රැක ගනිත්වා. එහෙත් කිසි දු ආරක්ෂායකු නැතිව, ජනගැටුම්වලින් යුත් ලෝක සංග්‍රාම භූමියෙහි ඇතිවන අපරිමාණ උපද්‍රවයන්ගෙන් නො පෙළී තමා ම රැකිය හැකි— ස්වයං පාලන ශක්තිය හා ජීව ප්‍රාණය ඒ පොත්වලට කාවැද්දීම ලේඛකයා සතු යුතුකම වෙයි. තමා අමරණීය වනු කැමති- ස්වකීය කෘතිය අමරණීය කරනු කැමති ලේඛකයන් මෙය හොඳින් සැලකිය යුතු ය. රඝුවංශය ලියූ කාලිදාසයෝ "අනේ! මෙය රැකගන්නැ" යි කිසිවකු නො යැද්දහ. ඔවුන්ගේ ජීවන සමයෙහි සිට මේ වන විට ශතවර්ෂ පසළොසක් පමණ ගෙවුණේ ය. එහෙත් රඝුවංශය මිය නො ගියේ- අදත් ලියූදා තුබූ සමාජ පරිසරය පෙන්වමින් අසඞ්ඛ්‍යායුෂ්ක රජකු මෙන් තාරුණ්‍යයෙන් බබළමින් සිටී නො?

යුගයෙන් යුගයට පරිවර්තනය වන ලෝකයාගේ රුචිකත්වය දැසින් මෙන් දක්නා ලේඛකයන් මේ පරිවර්තනශීලී රුචිකත්වයට ඔරොත්තු දෙන පරිද්දෙන්, ඉගෙනීමෙන් නො ගෙවෙන අගය හා විඳීමෙන් නො ගෙවෙන රසය කැටි කොට සම්පාදනය කළ ග්‍රන්ථයෝ, අව්වැසි වලින් නො ගෙවී කාලයේ වෙගයට ඔරොත්තු දෙමින් සෞන්දර්යකාමීන් පිනවමින් හා භක්තිමතුන් දනවමින්, අනුරාධපුර-මහමෙව්නා වනයේ බබළන සෙල්පිළිම වැන්නහ.

එහෙත් ලෝකය, සමාජය, ජීවනය, නො දන්නා- ප්‍රතිභාවිහීන- කුණ්ඩවිමංශනයෙන් යුත් මඳ නුවණැත්තවුන් තැනූ පොත් පත් සිරිමැටියෙන් තැනූ බලි රූ වැන්නහ. එවා එදිනෙදසින් පසු බිඳ හෙලති. නොහොත් හැලෙති. දසදහස් සඞ්ඛ්‍යාත වර්ෂ කාලයෙහි විවිධ දෙශයන්හි මැවුණු අප්‍රමාණ ග්‍රන්ථයන් අතර සිය ගණනින් ගිණිය හැකි අල්ප සඞ්ඛ්‍යාවක් ම ශෙෂ වූයේ මේ නිසා ය.

වර්ෂ දෙදහසක පමණ පැරණි ශිෂ්ටත්වයක් ඇති සිංහල සාහිත්‍යයෙහි ශෙෂ ව ඇත්තේ පොත් කොතෙක් ද? මේ දීර්ඝ කාලයෙහි රචිත ව, විනෂ්ට වී ගිය පොතුත්- ශෙෂ ව පවත්නා පොතුත් අතර පරතරය සියයත්-එකත් අතර ඇති පරතරය තරම් ය. මෙසා විශාල සඞ්ඛ්‍යාවක් ග්‍රන්ථ අභාවයට ගියේ මක්නිසා ද? මාඝයන්ගේ දෙමළ සුළි සුළඟින් බොහෝ පුස්කොළ පොත් විසිරී ගිය බව ඇත්තකි. රාජසිංහ i ගේ කොප ගින්නෙන් දැවී පිළිස්සී ගිය බව ද ඇත්තය. එහෙත් කිය යුත්තකි.

මයූරපාද හිමියන්ගේ පූජාවලිය නො වැනසුණේ ය. පැරකුම්බාවන් ගේ කව්සිළුමිණ- වීදගම තෙරණුවන් ගේ බුදුගුණාලඞ්කාරය නො දැවුණේය.

මේවාට වඩා හෝ මේ සම අගනා ග්‍රන්ථ නැසී ගිය පොත් අතර නොතිබුණහ යි අපි නො කියමු. එහෙත් මේ තරම් ජනසම්භාවනයක් හෝ බහුතර ප්‍රචාරයක් නො තුබුණා විය යුතු ය. මිසදිටුවන්ගේ පරම වෛරයට පාත්‍ර විය යුතු සිංහල ජාතක පොත මොනයම් උපද්‍රවයකින්වත් නො වැනසුණේ ය. තවත් හවුරුදු සිය ගණනක් ගෙවෙන තුරු ද නො වැනසෙනතේ ය.

මේ අනුව- අභාවප්‍රාප්ත ග්‍රන්ථයන් ගැන වග කිවයුත්තෝ හුදෙක් අභාග්‍යසම්පන්න මාඝ-රාජසිංහාදීහු ම නො වෙති. ඒ ග්‍රන්ථයනට සාමාජික බහුමානය ලබා නො දුන් තද්ග්‍රන්ථ කර්තෘවරයෝ ද වග කිවයුත්තාහු මැ යි.

මුද්‍රණකලාවේ වහල ලැබ වර්ෂයකට දහස් ගණනින් අද බිහිවන පොත් අතර කීයක් ඊළඟ ශත වර්ෂයේදී දකින්නට ලැබේ ද යනු කාලය විසින් ම විසඳනවා ඇත.

**තමා අමරණීය වනු කැමති-සවකීය කෘතිය අමරණීය කරනු කැමති ලෙඛකයා මෙය වෙසෙසින් සලකා බැලිය යුතු බව නැවතත් කිව යුත්තේ එහෙයිනි.**

**සාහිත්‍යවංශ රචනය**

ජාතීන් පිළිබඳ අතීතය දක්ක හැක්කේ ඒ ඒ ජාතීන් අයත් සාහිත්‍යය ඔස්සේ එබී බැලීමෙනි. ජනසමාජයේ ඒ ඒ දශාවන්හි ඇති වූ නැඟුම්-බැසුම්, සිතුම්-පැතුම්, රුචි-අරුචිකම්, සවාධීන-පරාධීනතා, දුෂ්ට-

ශිෂ්ටතා ආදී දහසක් සාමාජික පරිසථිතීන් සොයා ඒ ජාතියේ පූර්ණසමාජ ඉතිහාසය විසඳගත යුත්තේ ඒ ඒ යුගයන්හි ලියැවුණු උස්-පහත් පොත් ඇසුරෙනි. ඒ ඒ දෙශයන්හි ශිෂ්ටත්වයේ සමාරම්භයේ පටන් ම ශතවර්ෂයෙන් ශතවර්ෂයට- රාජ්‍යයුගයෙන් රාජ්‍යයුගයට- පහළව ශෙෂ වී පවත්නා පොතේ පෙර-පසු පිළිවෙළින් තබා සාහිත්‍යවංශ රචනා කිරීමට නවීනයන් උත්සාහවත් වැ ඇත්තේ මේ නිසා ය. පැරණියෝ මෙබඳු සාහිත්‍යවංශ කිරීමෙහි යෙදුනාහු ද? යන්නට එසේ යැ යි හෝ නො එසේයැ යි එකහෙලා කීමට කරුණු සුලභ නැත. එහෙත් සිංහල ජාතක පොතේ නිදාන කථාවෙහි ආ පොත් සඞ්ග්‍රහය, නිකායසඞ්ග්‍රහ පාඨ, කාව්‍යශෙඛරයේ "නත්වරද ලොප්වන" ආදිය වැනි සංක්‍ෂිප්ත සටහන් කීපයක් දෙස බලනවිට ඔවුන් මේ මගට නමනව සිටි බව නම් නො පැකිලී කිය හැකි ය.

සද්ධර්මාලඞ්කාරකරුවෝ සවාචාර්යවරයන්ගේ ශාස්ත්‍රීය කෘතීන් පාලි පද්‍යයෙන් පිඬු කොට ලියූහ. සැරියුත් මාහිමියන්ගේ ශිෂ්‍යයකු සවාචාර්යවරයන්ගේ කෘතීන් පිළිබඳ ව කළ ගාථා කීපයෙක් ද ඇත. ගිනිගත්පිටියේ දීපඞ්කර සාමණෙර හිමියෝ තම ඇදුරුතුමන්ගේ සියලු කෘතීන් හැකි තරමින් සඞ්ග්‍රහ කොට ලියූ පාලි පද්‍යකෙණෙක් ද දක්නා ලැබෙත්. මෙසේ දක්වා ලිය හැකි සියයක් කරුණු ද පැරණියනුත් පුරාතන කෘතීන් බෙදා සාරය-තත්ත්වය-කර්තෘන් ගළපා සාහිත්‍යවංශ සැපයීමෙහි හෙළූ නොතැතිව හුන් බව පැහැදිලි කරලන්නේ ය.

මේ මෙසේ වුවත් ග්‍රන්ථසංසන්දනය සාහිත්‍ය විෂයයක් වශයෙන් වැඩෙන්නට වූයේ මේ නො බෝ කලක සිට ය. එහි දු බටහිර වැස්සෝ අප පසුබා පියවර බොහෝ ගණනක් ඉදිරියට ගොස් සිටිති.

සිංහල භාෂාවේ මේ වනතුරු එබඳු සාහිත්‍ය වංශයක් නො පහළ වූයේ ය. මෙසේ පවතිද්දී අපට මෙබඳු පරිශ්‍රමයක යෙදෙන්නට වීම භාග්‍යයක් කොට සලකමු.

### මගේ පරිශ්‍රමය

භාෂා පයෙර්ෂණ කටයුතු අතින් තව ම මුල් පියවරින් එහා නො ගිය සිංහල භාෂාව සඳහා සාහිත්‍යවංශයක් සැපයීම ඉතා බැරෑරුම් වැඩකි. අපගේ මේ පරිශ්‍රමය සම්පූර්ණ සාහිත්‍ය ඉතිහාසයක් සැපයීම සඳහා යයි මොහොතකටවත් සිතනු නො යෙදේ. මේ වනාහි ඒ පිළිබඳ විශෙෂඥයනට මං පෑදීමක් වැනි ආරම්භක ව්‍යාපාරයකි. අපේ මේ පරිශ්‍රමයේ ප්‍රතිඵල සෙවීම මෙය කියවන්නාට භාර යැ. කියවා මෙහි ඇති අඩුලුහුඬුකම් දක්වතොත් ඒ අපට මදිකමෙක් නො වේ. සාහිත්‍යයට කරන සේවයකි.

**ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ** අවසාන පරීක්‍ෂණයෙන් උත්තීර්ණ ව **පණ්ඩිත උපාධිය** කැමැත්තෙන් ඒ සමාගමේ අනුදැනීම පරිදි මේ ග්‍රන්ථය සැපයුම ද ඒ මේ ග්‍රන්ථකරණයේ ප්‍රමුඛ නිමිත්ත නො වේ. එම විභාගයට පෙනී සිටින්නට දෙතුන් වසකට පෙරතුව මෙබඳු පරිශ්‍රමයක යෙදීමේ ආශාව අප තුළ තදින් පහළ වී තිබුණේ ය. එසේ තිබියදී යථෝක්ත සමාගමේ අනුදැනීමත් ඇතිව මෙය සම්පාදනය කරන්නට අවස්ථාව ලැබීම අදහස් දෙකක් එක්විට සඵල කර ගැනීමකි. ග්‍රන්ථකරණයට ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අනුමතිය නො විණි නම් අද මේ ග්‍රන්ථය මීට වඩා දෙගුණයකින් විශාල වන්නට තිබුණි. සම්පූර්ණ සිංහල සාහිත්‍යවංශයම තැනීම සඳහා සමාගමේ අනුදැනීම ලබා ගන්නට ගියෙන් කාර්යයේ ඇති බරපතලකම සිතූ සමාගම අප කෙරෙහි අනුකම්පා කළා ය. එහෙයින් ම මහනුවර කාලීන ග්‍රන්ථවංශය පමණක් සපයන ලෙස දැන්වූවා ය. ඒ අනුව සිංහල සාහිත්‍ය වංශයේ පුරාතන-මධ්‍යතන යන අවස්ථාවය තබා මේ නූතන අවස්ථාව සම්පාදනය කෙළෙමි. එහෙත් සම්පූර්ණ සාහිත්‍ය වංශය ඉගෙන ගන්නවුනට බාධා නො එළවන පරිද්දෙන් ඒ මුල් අවස්ථාවයේ කරුණු ද පිඬු කරවා මෙහි ඇතුළත් කෙළෙමි. එම කාණ්ඩවය විස්තරයෙන් ලියැවෙනතුරු එය ප්‍රමාණවත් කොට සලකනු මැනවි.

**අපකාර හා උපකාර**

මේ පොත සැපයීමේදී අපි බොහෝ කරදරයනට මුහුණ පෑවෙමු. පොත් පත්වල අගය නම් එය සඟවා තැබීම නොව හෙළිදරව් කිරීම බව නොදත් මසුරන් අප වෙහෙසට පත් කළ වාර බෙහෙවි. දුර්ලභ පොත් සොයා ගිය විට ඇතැමුන්ගේ පොත් අල්මාරිවල යතුරු නැති වී ගොස් ය! ඇතැම්හු එකෙණෙහි හටගත් දරුණු රෝග පීඩා ඇත්තෝ ය! ඇතැමුන්ගේ පොත්-පත් අතුරුදහන් වී ගොස් ය!

මේ මෙසේ වුවත් ඇතැම් පින්වත්හු පොත්ගුළු-අල්මාරි ආදියෙහි යතුරු පවා අපවෙත පවරා නොයෙක් සංග්‍රහ ද කළහ. එබඳු උතුමන්ගේ උපකාරය නිසා නො වේ නම් මෙ පමණකින්වත් මෙය සම්පාදනය කළ හැකි නො වේ.

**ප්‍රණාම හා ආශංසා**

මෙසේ මේ කාර්යය කිරීමෙහි ලේශමාත්‍රවූත් පුළුවන් කමෙක් විණි නම් ඒ මා සන්තක නො වේ. ඒ සම්පූර්ණයෙන් ම මාගේ ගුරුභූමිය වූ මොල්ලිගොඩ **ප්‍රවචනෝදය පරිවෙණස්ථානය** සන්තක මැයි. සුදුසු කල සුදුසු සේ මා ශාස්ත්‍රයෙන් වැඩූ තත් පරිවෙණෝපප්‍රධානාචාර්ය, විමලකීර්ති ශ්‍රී ඉඳජෝති **අරියවංශාභිධාන** අනුනායක මාහිමියන්වහන්සේට මාගේ නමස්කාරය වේවා.

එසේ ම සැම කල්හි අපට හිත-වැඩ සැලසූ පණ්ඩිත මාඹුවිට ශ්‍රී ඥානානන්ද ස්වාමීන්ද්‍රයන්වහන්සේ, පණ්ඩිත ගල්තොට ගිරිමානන්ද ස්වාමීන්ද්‍රයන්වහන්සේ හා ආචාර්ය කළුතර දේවානන්ද ස්වාමීන්ද්‍රයන්වහන්සේ ද යන මාගේ ආචාර්යවරයන් වහන්සේලා ද මෙහිදී භක්තිප්‍රණාමයෙන් සිහිපත් කරනු ලැබේ.

රචනාවෙහිදී පැමිණි සියලු ගැටමුසුතැන් විසඳීමෙහි මාගේ ආචාර්ය පණ්ඩිත ලබුගම ලංකානන්ද හාමුදුරුවන්වහන්සේගේ සදුපදේශය ම පිහිට විය. ඒ හැම අවස්ථාවකදී ම උන්වහන්සේ සිය කටයුතු පවා අතපසු කොට මාගේ ව්‍යාපාරයට උපකාරී වූහ. එහෙයින් මෙහිලා මාගේ ප්‍රණාම පූර්වක භක්තිපූජාව උන්වහන්සේට අනිවාර්යයෙන් පිරිනැමිය යුතුව තිබේ.

මේ හැර මේ සඳහා නානා අයුරින් සහාය වූ ගිහි-පැවිදි හිතමිත්‍ර පිරිසකි. ඒ අතර වෙසෙසින් සිහිපත් කළ යුතු හිතවතාණ කෙනෙක් නම්, පණ්ඩිත නාහල්ලේ පඤ්ඤාසේන ස්වාමිපාදයන් වහන්සේ ය. සාහිත්‍යය විෂයෙහි මහත් ඇල්මක් හා දීප්තිමත් බහුශ්‍රැතතාවක් ඇතිව තුබූ හෙයින් මෙහිදී උන්වහන්සේ විසින් බොහෝ සේ උපකාර කළ හැකි විය. පොත්පත් සෙවීමේ සිට මුද්‍රණ කාර්යය දක්වා සියලු අවස්ථායෙහි අපට ඉතා හිතවත් ව උපකාර වූ උන්වහන්සේගේ කාර්යක්ෂමතාව නිසා නො වේ නම් මෙහිලා අප විසින් දෙගුණ වූ පරිශ්‍රම භාරයක් දැරිය යුතුම් තුබුණේ ය. සාහිත්‍ය වංශයෙහි මුල් අවධියට අයත් පුරාතන- මධ්‍යතන අවස්ථාද්වය පිළිබඳ සාහිත්‍යප්‍රවේශය ද උන්වහන්සේ විසින් ම ලියූ බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

මුද්‍රණය සඳහා විශාල මුදලක් වියදම් කොට එය මගේ ම දියුණුව සඳහා යෙදවූ මගේ කණිටු සහෝදර ඇස්. ඇස්. ඇම්. අප්පුහාමි ද ආදරයෙන් සිහිපත් කළ යුතු ව තිබේ.

මුද්‍රණ කාර්යය ඉතා හොඳින් කරදුන් බර්නාඩ් ද සිල්වා මහතා ප්‍රමුඛ දිනමිණ මුද්‍රණශිල්පීන්ට ද මගේ කෘතඥතාව මෙයින් පිරිනැමේ.

පුඤ්චිබණ්ඩාර සන්නස්ගල

සිරිසරණ,
යහලබැද්ද,
හපුතලේ.
1947. 1. 2.

# සාහිත්‍ය ප්‍රවේශය

**සා**හිත්‍යය වූකලි සමාජයෙන් ම පහළ වන්නකි. සමාජය හා මැ වැඩී දියුණු වී සමාජය හා මැ පිරිහෙන්නකි. එ හෙයින් සාහිත්‍ය ඉතිහාසය දන ගනු කැමැත්තකු විසින් සමාජ ඉතිහාසය සොයා බැලිය යුතු ම ය. පිළිගත හැකි ශාස්ත්‍ර අනුව වර්තමාන සිංහල සමාජයේ ආරම්භය විජයාවතරණය ප්‍රභව කොට ඇත්තේ ය. ක්‍රි: ව: යට 543 වැන්නෙහි ගොඩ බට විජය කුමරුන් හා සත් සියයක් පිරිස ලඞ්කාව ශිෂ්ටාචාර භූමියක් කොට රාජධානි ඉදි කරවා ආණ්ඩු බලය පිහිටවා ගැනීමෙහි පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අටළොස් වැන්න දක්වා පැවති දෙ දහස් තුන් සිය සත් පනස් වසක් (2357) පමණ වූ කාලය සිංහල ජාතියෙහි ස්වාධීන අවස්ථාව වන්නේ ය. රාජධානි වශයෙන් අනුරාධපුර– පොළොන්නරු– දඹදෙණි— කුරුණෑගල— ගම්පළ— කෝට්ටේ— සීතාවක— මහනුවර යන කාල පරිච්ඡේද අටෙක්හි සංග්‍රහ වන මේ දීර්ඝ කාලාන්තරයෙහි වූ සාහිත්‍ය ඉතිහාසය පරිපූර්ණ ව දක්වා ලීම එ තරම් පහසු නොවේ. අතරින් පතර පූරුක් ගැලවී ගිය දම්වැලක මෙන් සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි ද කරුණු අවුණා ගත නො හැකි වීමෙන් කඩතොලු ව, ගියාවූත් හිස් ව ගියාවූත් තැන් රාශියක් ම ඇති බව පිළිගත යුතු ඇත්තකි. මිත් වඩාත් කඩතොලු ව ගිය කාල පරිච්ඡේදයක් වූ මහනුවර යුගය නම් ලත් නූතන අවස්ථාව පිළිබඳ සාහිත්‍ය ඉතිහාසය ට මේ ග්‍රන්ථයෙන් ලැබී ඇත්තේ සන්තෝෂ විය හැකි පරිපූර්ණතාවකි. මෙ තෙක් කිසිදු විචාරකයකු විසින් හෙළි නො කළ සාහිත්‍ය යෙහි ලා ඉතා වැදගත් වූ කරුණු රාශියක් හෙළිවී තිබීම නිසා ඒ කාණ්ඩය මහ ඍපූර්ණ සේ සකස් වී ඇත. එහෙත් ඒ වූකලි සාහිත්‍යයේ නූතන අවස්ථාව පිළිබඳ ව පමණෙකි. පුරාතන මධ්‍යතන අවස්ථාවන් පිළිබඳ ව සිත නො මෙහෙය වූ පාඨකයා මේ පරිච්ඡේදය ට බැස ජනාකීර්ණ මහ වේ මැද අහසින් බටුවකු මෙන් විය හැකි ය. එහෙයින් ආධුනිකයා මේ සාහිත්‍ය පුරයට ගෙනා යනු සඳහා තනන පියවර මඟක් මෙන් ආරම්භයේ සිට මහනුවර දක්වා සාහිත්‍යය පිළිබඳ ඉතිහාසය මෙහි ඉතා සිහින් රේඛාවකින් ඇඳ දක්වනු ලැබේ.

මේ ග්‍රන්ථයෙහි ප්‍රමාණ කළ පරිදි දෙවනපෑතිස් රජු සමයෙහි පටන් මහා පරාක්‍රමබාහු රජුගේ අභිෂේකප්‍රාප්තිය දක්වා **පුරාතන අවස්ථා** නම් ද, එ තැන් සිට සීතාවක රාජසිංහ රජුගේ අවසානය දක්වා **මධ්‍යතන අවස්ථා** නම් ද වේ. එහි දු පුරාතන අවස්ථාවෙහි ශිලා මෙඝසේන රජු දක්වා

**ශිලාලේඛන තරඞ්ග** නම් ද, එ තැන් සිට මහා පරාක්‍රමබාහු රජු දක්වා **ග්‍රන්ථලේඛන තරඞ්ග** නම් ද වෙයි. මධ්‍යතන අවස්ථාවෙහි ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ අවසානය දක්වා **උත්කෘෂ්ට තරඞ්ගය** නමින් ද එ තැන් සිට සීතාවක රාජසිංහ අවසානය දක්වා **අපකෘෂ්ට තරඞ්ගය** නමින් ද හැඳින්විණ.

**පුරාතන අවස්ථාව**

## ශිලාලේඛන තරඞ්ගය i

| | |
|---|---|
| දෙවනපෑ තිස්— | ශිලාමෙඝ සේන |
| ක්‍රි: ව: යට 307— | ක්‍රි: ව: 848 |

වර්ෂ එක් දහස් එක් සිය පනසක් (1150) පමණ වූ මේ අවධියෙහි සම්පාදිත ග්‍රන්ථයන්ගෙන් සේස වූ එක ද පොතක් මේ තාක් හමු වී නැත. ලේඛනයන් වශයෙන් දක්නට ලැබෙන එක ම දෙය නම් ශිලාලිපි පමණ ය. එහි ද විජය රජු පටන් දෙවන පෑ තිස් රජු දක්වා පැවති කාලයෙහි කැරුණු ශිලා ලේඛනයකුදු මේ තාක් සොයා ගෙන නැත. ශිලාලේඛන සෙවූ පුරාවිද්‍යාඥයන් ගේ පර්යේෂණයන්ට අනුව අද දක්නට ලැබෙන ආදිම ලේඛන පවා මිහිඳු මාහිමියන්ගෙන් බෞද්ධ ශිෂ්ටාචාරය මෙහි පතළ ව ගියාට පසු සම්පාදිත ඒවා ය.

**ලක්දිව ආදිම ලේඛන** බුද්ධාගම පිහිටු වූ සමීප කාලයෙහි මෙ රට බෞද්ධයෝ ගල් ගුහාවන් ආවාස වශයෙන් තනා සඟ සතු කොට භික්ෂූන් වහන්සේ ට පුද කළහ. එහි දී ඔවුහු සවකීය නම් ගම පරපුර හා ඇතැම් විට තත්කාලීන රජුගේ නම ද ගුහා පාර්ශ්වයෙහි කොටවා තැබූහ. ලක්දිව ආදිම ලේඛන වශයෙන් සැලකිය හැක්කේ වෙස්සගිරිය නාවල් නීරාවි මලෙයි ආදි තන්හි තිබී සොයා ගන්නාලද මේ පූජාවාක්‍ය කීපය ය. පුරාතන ලාංකික බෞද්ධ ස්ත්‍රී පුරුෂයන් කීප දෙනකුගේ නම් හා රජ රට ඇතැම් ගම්වල නමක් ද වැනි ප්‍රවෘත්ති මාත්‍රයක් මේ ලේඛනයන් ගෙන් දත හැකි ය.

**අණිකට සොණ පිතහ බරිය උවශික තිශය ලෙණෙ දමරකිත තෙරශ දිනෙ**

වෙස්සගිරියේ දක්නට ලැබෙන මේ ශිලාලේඛන පාඨය එයට නිදසුන් කොට දක්වමු. (අණිකටයි සෝණගේ පියාගේ භාර්යාව වූ තිස්සා උපාසිකාව ගේ ලෙණ ධම්මරක්ඛිත ස්ථවිර යන් වහන්සේ ට දෙනලදි).

මීළඟට ඇතිවූ ලේඛන වැවක් කැණවීම හෝ සඟසතු කොට පිදීම වැනි ප්‍රවෘත්තියක් ඇතුළත් වූ පර්වතයන්හි කොටවන ලද ඒවා ය. මේ ලිපි පූර්වෝක්ත ගුහාලේඛනයන්ට

වඩා මඳක් විස්තරයෙන් ලියා තැබූ බව පෙනේ. රජාදි ප්‍රසිද්ධ පුරුෂයකු සඳහන් කරන විට බෙහෙවින් ඔහුගේ පියා ද සඳහන් කිරීම සිරිතක් ව තුබූ බව මේ ලේඛනයන්ගෙන් දත හැකි ය.

**පරුමක අබය පුත පරුමක තිශහ වපි අචගිරික තිශ පවතහි අගත අනගත° චතුදිස සගස දිනෙ. දෙවනපි මහරජ ගමිනි අබය නියශෙ අව නගරකව (නපි) රිතිය නාගරකව පරුමක අබය පුත පරුමක තිස නියත පිතෙ රජහ අගත අනගත චතුදිස සගස දිනෙ.**

මේ තෝණිගල සෙල්ලිපිය ඒ වගීයේ ලේඛනයන් අතර වැදගත් කොට සලකනු ලැබේ. එහි සඳහන් ගමිනි අබය රජු දුට්ඨගාමිනී හෝ වට්ටගාමිනී බව අනුමාන කොට ඇත. වාතීමානිකයන් බෙහෙවින් අපේක්‍ෂා කරන තත්කාලීන ජන සමාජයේ අධ්‍යාපනය, සිතුම් පැතුම්, ආහාරපාන වැනි විෂයයක් මේ සෙල්ලිපිවලින් අනාවරණය වන්නේ ඉතා කලාතුරකිනි. එහෙයින් සාහිත්‍යික ලේඛන වශයෙන් මින් ලැබෙන ලාභය අත්‍යල්ප ය

**සෙල්ලිපි භාෂාව**

සාහිත්‍ය ප්‍රවෘත්තීන් අනාවරණය නො ව තුදු තත්කාලීන භාෂා තත්ත්වය හෝ අනාවරණය වේ නම් එද ඉතා වැදගත්ය. භාෂාවේ ආදිම තත්ත්වය මේ සෙල්ලිපිවල පිළිබිඹු වූයේ නම් වාතීමානිකයනට මිහිඳු මාහිමියන් දම් දෙසූ බස, දුටුගැමුණු රජු කථා කළ වචන, වලගම්බා රජුගේ වැටසෝ හස්න ආදිය ගැන අනුමානයෙන් සිතා සන්තෝෂ විය හැකිව තුබුණේ ය. එහෙත් අභාග්‍යයට මෙන් මේ සෙල්ලිපිවල දක්නට ලැබෙන්නේ එ කල මහා ජනයා කථා කළ වාග්ව්‍යවහාරය නො වේ. හුදු ස්වරාන්ත වචනයන්ගෙන් ම යුක්ත වූ අල්ප ප්‍රාණ ව්‍යඤ්ජන හා හ්‍රස්ව ස්වර පමණක් ඇති මේ මුල් යුගයේ පැවති සෙල්ලිපි භාෂාව එ කල ව්‍යවහාරයැයි කියතොත්, සිදත් සඟරාවෙන් සීමිත වූ භාෂාව දඹදෙණි ව්‍යවහාරයැයි කිය හැකි ද වේ. මේ සෙල්ලිපි භාෂාව ගැඹුරු අදහස් මාලාවක් කියා පෑමට කිසි සේත් සුදුසු නො වන බව දුටු පමණින් ම වටහා ගත හැකි ය. එහෙත් මේ යුගයෙහි මිහිඳු මාහිමියන්ගේ ශිෂ්‍ය වූ ලාංකේය භික්‍ෂූන් ත්‍රිපිටක අටුවාවන් හෙළ බසින් ලියා තැබූ බව ඉතිහාසාගත සත්‍යයකි. සම්බුද්ධ දර්ශනයෙහි සියුම් අදහස් නො වෙනස් ව පැහැදිලි සේ වැටහෙන අයුරින් හෙළ'ටුවා වැනි විශාල සාහිත්‍යයක් නිපදවීමට පූර්වෝක්ත භාෂාව කෙසේ වත් තරම් නො වේ. එහෙයින් එ කල කථාවෙහි හා රචනයෙහි ව්‍යවහාර වූ භාෂාව හුදු හ්‍රස්ව ස්වරාන්ත සීමිත පටු බසක් නො ව, හලන්ත මිශ්‍ර, දීර්ඝ සංයුක්ත මහාප්‍රාණාදියෙන් යුක්ත වූ විශ්‍රැත ප්‍රචාර ප්‍රාප්ත භාෂාවක් ව තිබෙන්නට

ඇති බව නිසැක ය. ඒ එසේ මැයි. පස්වන කාශ්‍යප රජුගේ ධම්පියා ගැටපද සන්නයෙන් උපුටා ගත් මේ හෙළ'වුවා පාඨයෝ එකල සිංහල භාෂාවෙහි ස්වරූපය කෙබඳු දැයි පැහැදිලි කර දක්වති.

i යොගෙ සො හෙව දනකි උපද්දව හිදිමි.
ii වෙරියෙක් විද මැරිය
iii ඝන ගත මටැක
iv රහදෙ වදන කිද අවාට හි නම්

මෙපමණක් නොව ගුරුළුගෝමීන්ගේ ධම්ප්‍රදීපිකා වෙහිදු පූර්වෝක්ත සමයට අයත් භාෂා ස්වරූපය වටහා ගැනීමට වහල් වන ප්‍රවෘත්තියක් දක්නාලැබේ. රුවන්වැලියේ නිදන් කිරීම සඳහා ධාතු සොයා නා ලොව වැඩි සොණුත්තර සාමණේරයන් වහන්සේ ධාතු ගෙන පුද පිරිවෙනින් මතු වූ හ. "කිමැ"යි පුළුවුත් සඟනට දසි මාළෙ යි වදළහ. ධාතු යැ මා අළියේ (ගෙනායේ) යනු අදහසය. දෙව් මිනිස්සු ධාතු කරඬුව දැක දනැගේ යි ගුගුළහ. නාගයෝ නාගලු ලිදින් මතුව ඉන්සේ ඉන්සේ යි කිහ. ඉන් සේසයක් දෙන්නැයි කී නියා ය. ඉක්බිති හෙරණපාණෝ ද පුදසි මාළෙ යි වදළහ. ධාතු පුදව මා අළියෙ යැ යූ සේ යි. මෙහි දසි මාළෙ, ද නැගේ, ඉන් සේ යන වචනයන්හි දීර්ඝස්වර, හලක්ෂර මතු නො ව අර්ධානුනාසික 'හ' කාරයකුදු යෙදී තිබෙන සැටි දැක්ක හැකිය. යථොක්ත ශිලාලෙඛනයන්හි යෙදුන හුදු ස්වරාන්තවත් භාෂාව තත්කාලීන වාග් ව්‍යවහාරය නම් මේවචන කීපය එද ව්‍යවහාරය වශයෙන් ලියා අර්ථ දු ගෙන හැර දැක්වීමට තරම් ගුරුළුගෝමීහු විචාර විරහිත වෙත් ද? මෙ හෙයින් ඒ ආදිම ගුහාපජීත ලෙඛනයන්හි දක්නා ලැබෙන භාෂාව තත්කාලීන වාග් ව්‍යවහාරයැයි හෝ වර්තමාන භාෂාව එහි ක්‍රම පරිණාමයෙන් ඇතිවිණැයි හෝ සලකනු නො යෙදේ.

එසේ නම් ඒ ආදිම ශිලාලෙඛනයන්හි දක්නා ලැබෙන භාෂාව කුමක් ද? ඒ වූකලි ඉන්දිය ප්‍රාකෘත භාෂාවනට අයත් ලක්ෂණයන් ගෙන් අනූන වූ අශොක සෙල්ලිපි බසට බොහෝ සෙයින් සමාන ව්‍යතිමිශ්‍ර ප්‍රාකෘතයකි. මේ ශිලාලෙඛනයන්හි ප්‍රකෘතියෙන් ද, ප්‍රත්‍යයයෙන් ද, වාක්‍යරීතියෙන් ද අශොක සෙල්ලිපි වලට සමාන වන තැන් බෙහෙවි.

අශොකාක්ෂරයෙන් ලියැවුණු මේ සෙල්ලිපි භාෂාව සිවුවන ශතවර්ෂය දක්වා ප්‍රාකෘත ලක්ෂණයෙන් අනූන ව ම පැවත ආවා ය. ඉක්බිති ඉතා හෙමින් ප්‍රාකෘත ලක්ෂණයෙන් මිදෙන්නට ආරම්භ වූවාය. 'ඇ'කාරය වැනි සිංහලයට ම ආවෙණික වූ ලක්ෂණ කිහිපයක් ද මෙ සමයට අයත් සෙල්ලිපි වල දක්නට ලැබේ. එහෙත් සිවුවන ශත වර්ෂයෙන් පසු ඇති වූ ඒ ලක්ෂණ කීපය නිසා මෙ කලට අයත් සෙල්ලිපිවල කිසි යම්

වෙනස් වීමක් මිස සීඝ්‍රශීලී පරිණාමයක් නො වී ය. පැරණි සෙල්ලිපි බසින් ම හතරවන ශතවර්ෂයෙන් පසු ද සෙල්ලිපි ලියන්නට උත්සාහ කළ බව පෙනේ. පෙර පටන් ම ව්‍යවහාරයෙහි පැවති ලක්ෂණ කිහිපයක් ලියන්නන් අතින් නිරුත්සාහයෙන් ම ඇතුළත්වීම නිසා ඒ ස්වල්ප මාත්‍ර වෙනස් වීම ඇති වූ සේ සලකනු සුදුසු යැ. මේ නිසා අටවන ශතවර්ෂයෙන් ඔබ ශතවර්ෂ 10 ක් පමණ වූ මේ කාලයෙහි ලියැවී තිබෙන වෙස්සගිරි තෝණිගල, රිටිගල, මෝලහිටියවෙලේගල, විහාරේගල, පහළ කහිනාවිටම, පෙරුමය්යන්කුලම, පාලුමැකිච්චාව, මහරත්මලේ, කතරගම, රුවන්වැලිය, අභයගිරිය, නාගිරිකන්ද, කළුදිය පොකුණ, මැදගම ආදි ලේඛනයන්හි දක්නට ලැබෙන්නේ සමාන භාෂා ස්වරූපයෙක් ම ය.

### වර්තමාන භාෂාවේ ආරම්භය හා විශිෂ්ට සෙල්ලිපි

ක්‍රමයෙන් පැවති සෙල්ලිපි පිළිබඳ මේ තත්ත්වය අටවැනි ශතවර්ෂය පමණේදී හදිසියෙන් ම මහත් වෙනසකට පත් විය. පූර්වෝක්ත පරිදි සෙල්ලිපියට විශේෂ වෙමින් පැවති භාෂාව මුළුමනින් අත හැර දමා කථාවෙහි හා රචනයෙහි ව්‍යවහාර වූ සිංහල භාෂාවෙන් ලිපි කෙටවීමට පටන් ගැනීම නිසා මේ මහත් පරතරය ඇති වූයේ ය. පැරණි කාලයට අයත් වූ ඒ සෙල්ලිපි හා අටවන ශතවර්ෂයෙන් පසු ලියැවුණු සෙල්ලිපිත් අතර භාෂා තත්ත්වයෙන් ඇති වෙනස කොතරම් ද යනු මෙහි පහත දක්වන කාශ්‍යප iii රජුගේ ගැරඬිගල සෙල්ලිපිය හා පෙර දැක්වූ තෝණිගල සෙල්ලිපිය ද සසඳා බැලීමෙන් වටහා ගත හැකි ය.

**දම්බදිව් දුනු සිරි සන්බෝ මපුර්මුකා තුන් වන්නෙ මිහින්ද් මහසාණන් ගොම්බියෙන් පහණ් හින්ද්වා දුන් කිරියක් කුම්බුරි ඉසා බුද් මහ මලුන් මහ බො දෙණියෙන් පහණ් හින්ද්වා දුන් දෙ පයක් කුඹුරි ඉසා..................මහ මලුන් මිහින්තරියෙන් පහණ් හින්ද්වා දුන් කුම්බුරි දෙ පයක් ඉසා මේ ලෙණ සෙනසන බැන්ද දෙව.**

මේ වනාහි ව්‍යවහාර සිංහල භාෂාවෙන් ලියූ පළමුවන ලේඛනයන්ගේ ස්වරූපය යි. මෙ තැන් සිට ලියැවුණු සෙල්ලිපි පිළිවෙළින් පරීක්ෂා කිරීමෙන් සිංහල භාෂාවේ ක්‍රමානුගත සංවර්ධනය හා ඒ ඒ යුගයන්හි අමුතු ව පැමිණි විශේෂයන් ද මැනවින් දක්ක හැක්කේ ය. පෙර ලියූ සෙල්ලිපි සංසන්දනය වන්නේ අශෝක සෙල්ලිපි සමඟ මුත් තත්කාලීන ව්‍යවහාර භාෂාව හෝ එ සමයට අයත් පොත්පත් සමඟ නො වේ. එ හෙත් අටවන ශතවර්ෂයෙන් ආරම්භ වන මේ සෙල්ලිපි තත් තත් කාලීන කථා—ලිපි භාෂාවන් හා විශේෂ සම්බන්ධතා ඇත්තේ අශෝක සෙල්ලිපි හා මහත් පරතරයක් ඇත්තේ ද වෙයි. අතිප්‍රසිද්ධ සීගිරි පද්‍යයන් විමසා බැලීමෙන් ද මේ

නිගමනය සාර්ථක බව පැහැදිලි වේ. මේ සෙල්ලිපි අතර ද මුගසින් සෙන් (ක්‍රි: ව: 868) පටන් මිහිඳු iv (ක්‍රි: ව: 967) දක්වා කැරුණු සෙල්ලිපි අතිශයින් විශිෂ්ට ය. මේවා සංඛ්‍යාවෙන් ද, දිග-පළලින් ද විෂයමහත්වයෙන් හා ප්‍රයෝජන පක්ෂයෙන් ද අතිශයින් උසස් ය. මෙහි සමහර සෙල්ලිපි, විහාර දහගැබ් පන්සල් හා සඟසතු කෙත් වත් ද, ආරාම- ආරාමිකයන් ද, පිළිබඳ අණපනත් හා භික්ෂූන් වහන්සේ ගේ අධ්‍යාපනය . සාමාජිකත්වය ගරුත්වය සුශීලත්වය හා බලය පෙන්වන ශාසනික ඉතිහාස ග්‍රන්ථ වැන්නහ. ඇතැම් ලිපි රටවැසියන් ගේ ගම් බිම් ගනුදෙනු, වෙළ හෙළඳාම්, උකස්ඉමුණු, දන්පින් ආදි තොරතුරු ඇතුළත් සාමාජික වාර්තා වැන්නහ. තවත් ලිපියක් රජය, නිලධාරීන්, බලතල, ගරුනම්, ද්‍යූතකම්, දඬුමුඬ වැනි පාලන ක්‍රමය පිළිබිඹු කර දක්වන්නකි. මේ අතර උපමා-රූපකයෙන් බර වූ සාටෝප දිග වැකියෙන් ලියූ ලිපි ද ඇත. මේ නිසා භාෂාවේ ක්‍රමවිකාශයත් සාහිත්‍යයේ උන්නතියත් සාමාජික තත්ත්වයනුත් වටහා ගැනීමට පොත්පත් රහිත ව වුවද මේ සෙල්ලිපි ප්‍රමාණවත් ය. එහෙත් මේ මුතලි සෙල්ලිපි විවරණයක් නො වේ. පොත්පත් රහිත කාලපරිච්ඡේදය යන්නමින් වටහා ගැනීම සඳහා ලියැවුණ සාහිත්‍ය රේඛාමාත්‍රයකි. දෙවනපෑ තිස් රජු පටන් පළමුවන සේන රජු දක්වා සිටි රජුන් එක්සිය දෙදෙනෙකුන් අයත් මේ දීර්ඝ කාලපරිච්ඡේදයෙහි සම්පාදිත ව සෙස වූ එකද ග්‍රන්ථයක් නැති හෙයින් සාහිත්‍යය දෙස බැලිය හැක්කේ මේ ශිලාලිපි ඔස්සේ ය.

**ප්‍රථම ලිපි බද්ධ සාහිත්‍යය**

කීර්තිමත් පඬිවරයන් සමූහයක් ම මේ යුගයෙහි පහළ වුවද එහෙයින් ම ශ්‍රේෂ්ඨ සිංහල ග්‍රන්ථ පද්ධතියක් ම පහළ වුවද, පසු කල ඇති වූ අභ්‍යන්තර කලිකලහ, පර සතුරු වියවුල්, හා අව්චාරවත් පාලන ක්‍රමයන් නිසා ඒවා නාම මාත්‍රය පමණක් තබා අප අතරින් සදහට ම වියෝ ව ගියහ. මහානාම හිමියන් ගේ මහාවංශය ආශ්‍රයෙන් දත හැකි එබඳු පොත්පත් අතර පළමුවැන්න හෙළ'ටුවා යි. විපප්‍රසාදක මහින්ඳු මාහිමියන්ගේ අනැවැසි භික්ෂූන් විසින් හෙළ බසට පරිවර්තිත වූ එය ලක්දිව ප්‍රථම ලිපිබද්ධ සිංහල සාහිත්‍යය ද වෙයි. මහා **අට්ඨකථා —මහා පච්චරි-කුරුන්දි** නමින් හැඳින්වුණ එබඳු හෙළ'ටුවා පොත් තුනක් මාගධී අටුවා සම්පාදනයෙහි ආශ්‍රිත බව ග්‍රන්ථාගත ය. මින් බැහැරි වූ **සංඛෙප -අන්ධක** අටුවා වය කුමන බසින් කරනලද ද යනු මේ තාක් අවිනිශ්චිත ය. එහෙත් පූර්වෝක්ත අටුවා තුන නම් හෙළ'ටුවා බව බුද්ධඝෝෂ මාහිමියෝ ම පැවසූහ.

"මහා අට්ඨකථං චෙව—මහා පච්චරි මෙව ච
කුරුන්දිං චාති තිස්සො පි — සීහළ'ට්ඨකථා ඉමා"

මින් වඩා පැරණි වූවාත්, මහත් වූවාත්, සම්භාවිත වූවාත් **මහා අටුවාව** ම ය. මෙය **මූල් අටුවාව** නමින් ද හැඳින්විණ. **මහාපච්චරී අටුවාව** වළගම් අබා සමයෙහි හටගත් දුර්භික්ෂයේ දී දඹකොළ පටුන සම්පසට සාගරයේ බඳනා ලද මහ පසුරෙහි සිට කරන ලද්දකැයි ද, **කුරුන්දි අටුවාව** කල්ලාට නාග රජු කරවූ කුරුන්දිපාසක විහාරයේ හෝ විජයබාහු i රජු විසින් පිළිසකර කරවූ කුරුන්දි විහාරයේ හෝ සිට කරන ලද්දකැයි ද කියනු ලැබේ. පසු කල නිපදවූ මාගධී අටුවා මෙන් වෙන් වෙන් පිටකයට හෝ සඟියට- ප්‍රකරණයට- පාලියට නොව මුළු තුන් පිටකයට ම සාධාරණ වන සේ කළ මේ අටුවාවන් ගැන පාලි සිංහල ග්‍රන්ථ සමූහයක ම සඳහන් ය. දඹදෙණි සමයෙන් පසු නිපදවූ කිසිදු පොතපතක ඒ පිළිබඳ යම් කිසිවක් මෙතාක් දකින්නට නොලැබුණේ ය. මේ අනුව බුදුගොස් මාහිමියන් මාගධී අටුවාවන් සම්පාදනය කරන තුරු ධර්මකාමීනට අතිශය ප්‍රතිෂ්ඨාභූත ව ද, ශාරිපුත්‍ර මාහිමියන් ටීකා සපයන තුරු අතිශය භ්‍රාජමාන ව ද, පැරකුම්බා ii රජු විශුද්ධිමාර්ග සන්නය ලියන තුරු අවිනෂ්ට ව ද පැවති ඒ හෙළ'ටුවා ඉන් පසු අභාවයට ගිය හයි සිතිය හැකි ය. ධම්පියා ගැටපදයෙන් උපුටා පෙර දක්වූ පාඨාන්තර කීපය අවුල් ව ගොස් තුබුණ ද හෙළ'ටුවා ලියූ භාෂාස්වරූපය මටහා ගැනීමට ප්‍රයෝජනවත් ය.

මාගධී අටුවා ලිවීමෙන් පසු සිංහල පඬිවරු ඒ අටුවාවන්හි වූ ගැටපදයන් විවරණය කරමින් **මහා ගණ්ඨිපද මජ්ඣිම ගණ්ඨිපද චූළගණ්ඨිපද** නම් වූ ගැටපද පෙළක් සැපයූහ. පැරකුම්බා ii රජු ගේ විසුද්ධිමග්ග සන්නයට ආශ්‍රය වූ **පැරණි විශුද්ධිමාර්ග සන්නයන්** සරණංකර සංඝරාජයන් ගේ සතර බණවර සන්නයට ආශ්‍රය වූ **සංක්ෂෙපාර්ථ විවරණයත්** අද දක්නට ලැබෙන **ධම්පියා ගැටපද සන්නය** හා **ජාතක ගැටපද** සන්නයත් ඒ පැරණි ගැටපද මාලාවෙහි ඇතුළත් වූහයි සිතනු නුසුදුසු නො වේ.

ධම්කිත්ති හිමිපාණන් ගේ දාඨාවංස මාගධී පද්‍යයට ආශ්‍රය වූ පැරණි **හෙළු දළදාවංස කාව්‍යය** සිරිමෙවන් රජු දවස ලියන ලද්දකි. මෙසේ ම මහාධම්කථී යතින් ගේ **සූත්‍රපිටක අනුවාදය**, මුගලන් i සමයේ රචිත **කෙසධාතු වංස කාව්‍යය**, දෙවන මුගලන් රජු ගේ **ධම්කාව්‍යය**, අග්‍රබොධි i සමයේ සිටි දොළොස් මහ කිවියන්ගේ **අසක්ද කව** ආදිය, දප්පුල රජුගේ **නාඩිනින්දු සටහන**, මහාවංශයට ආශ්‍රයවූ **පුරාණ සිංහල මහාවංසය**, උපතිස්ස ස්වාමිපාදයන් ගේ පාලි බොධිවංශයට ආශ්‍රය වූ **පුරාණ සිංහලබොධිවංශය**, කළණමිත් තෙරුන්ගේ **සඳස් ලකුණ**, **පුරාණ මධුරසභෛෂජය**, රසවාහිනියට ආශ්‍රය වූ **පුරාණ සිංහල කථාවස්තු** ආදි පොත්පත් කීපයද මේ කාලපරච්ඡේදයෙහි රචිත ව කාලයේ පාංශු කදම්බයෙන් යට ව ගියාහු වෙති.

**පුරාතන අවස්ථාව**

# ග්‍රන්ථ ලේඛන තරඞ්ගය ii

ශිලා මෙඝ සේන — මහා පරාක්‍රමබාහු
ක්‍රි: ව: 848 — ක්‍රි: ව: 1153

ක්‍රි: ව: 848 දී අභිෂේකය ලත් සේන i රජතුමන් පටන් සිංහල රාජාවලියේ උත්කෘෂ්ට වීරවරයා වූ මහාපරාක්‍රමබාහු නරපතිතුමන් තෙක් වර්ෂ තුන්සීයක් පමණ වූ කාලය මේ තරඞ්ගයෙහි ලා ප්‍රමාණ කරනු ලැබේ. පිරිහෙමින් පැවති අනුරාධපුරය අතහැර දමා සිංහල රජුන් පොළොන්නරුව ස්වකීය රාජධානිය කර ගන්නා ලද්දේ මේ කාලයේදී ය. මෙවක බොහෝ සිංහල අධිපතිහු ආත්මාර්ථකාම්ත්වයෙන් වැසුණු නුවන් ඇත්තෝ වූහ. රටට කුමක් වුවත් ස්වාර්ථය සිදුකරගත හොත් මැනවැයි සිතූ බොහෝ රාජවංශිකයෝ අයුතුකමින් රජ බව පැතූහ. ස්වකීයයා පරදවනු සඳහා . තුන් දෙමළ රජයෙන් ම දෙමළ භටයන් ගෙන්වාගැනීම මෙවක සිරිතක් මෙන් පැවැත්තේ ය. මහා නගරය කුඩා ඉන්දියාවක් මෙන් පෙනෙන්නට තිබුණි. ක්‍රමයෙන් මේ විදේශිකයෝ ධන බලයෙන් හා ආධිපත්‍යයෙන් වැඩිදියුණු වූහ. මේ නිසා අනුරාධපුරය පාලනය කරගත නුහුනු ඇතැම් සිංහල නරපතිහු බෙරම්ණිපාය, පොළොන්නරුව වැනි ආරක්ෂාස්ථානයන් සොයා ගියහ. එහෙත් සමාදානය සම්භම නැවත අනුරාධපුරයට පැමිණීම ඒ රජුන් ගේ සිරිත විය. මෙසේ පවත්නා අතර සේන i රජු දවස පාණ්ඩ්‍ය මහත් බල සෙනඟක් ගෙන ලංකාක්‍රමණයෙහි යෙදුනහ. පරාජයට පත් සේන i රජතෙමේ පොළොන්නරුවට පලා ගියේ ය. මෙතැන් සිට පොළොන්නරුව සිංහලයේ අගනුවර බවට පත් වූයේ යි.

✗ සාහිත්‍යෝන්නතිය අපේක්ෂා කළ රජුන් බහුල නො වීම, ග්‍රන්ථ රචනයෙහි අවශ්‍ය තරමට රට සන්සුන්ව නොපැවතීම, ආදි කරුණු නිසා මේ කාලයෙහි විශාල සේ පැතුරුණු හෝ උසස් සේ බැබළුණු සාහිත්‍යයක් නො වී ය. එතකුදු වුවත් සේන i, සේන ii, උදය i, කාශ්‍යප iv, කාශ්‍යප v, මිහිඳු iv, විජයබාහු i ආදි නැණවත් රජුන් ගේ සාවධාන ක්‍රියාපද්ධතිය නිසා මේ වකවානුවට අයත් ග්‍රන්ථ කීපයක් වාර්තමානිකයන් අතට ලැබී ඇත්තේය.

**සියබස් ලකර** ශිලාමේඝසේන නමින් හඳුන්වන පළමුවන සේන රජතුමා උදාර වීරයකු නො වුවද උසස් පඬිවරයෙක් වූයේ ය. සිංහල භාෂාවෙන් මේතාක් ම නිපදී ඇති එකම අලඞ්කාර ග්‍රන්ථය වූ සියබස් ලකර සම්පාදනය කරනලද්දේ ඒ රජතුමන් විසිනි. දණ්ඩ්‍යාචාර්යවරයන්ගේ කාව්‍යාදර්ශය සියබස්ලකරට ගුරු පොත වූ

නමුදු සේන i රජුගේ කෘතිය විචාරපූර්ණ වීමට ඒ බාධාවක් නො වී ය. කාව්‍යාදර්ශයේ දක්වූ අලංකාර භේද ඒ රජතුමා කොතෙකුත් පරිවර්තනය නො කෙළේ ය. තුඩුවම්නා බොහෝ විස්තර බැහැර කොට අවශ්‍ය වූ බොහෝ දේ ඇතුළත් කිරීම නිසා සියබස්ලකර කාව්‍යාදර්ශයේ අනුවාදයක් නො වන තරමට සකස් වූයේ ය. සිංහල කවින් අතරම සම්මත ව තුබූ ඇතැම් කාව්‍යානුශාසන එතුමන් ගේ කෘතියෙහි දක්නට ලැබේ. දැනට දක්නට ලැබෙන ඉතා ම පැරණි ග්‍රන්ථය වන සියබස් ලකරින් එයට පෙර තුබූ ඡන්දස් ග්‍රන්ථයක් ගැන කරුණු දැනගන්නට ලැබීම වැදගත් ය. කාව්‍යාදර්ශ කතුවරයෝ පද්‍ය කාව්‍ය භේද විස්තරයට පැමිණ—

"ඡන්දෝ විචිත්‍යාං සකලස්තත්ප්‍රපඤ්චෝ නිදර්ශිතඃ" යි ඒ සියල්ල ඡන්දෝවිචිතියෙහි දක්වන ලද්දේයයි කීහ. මේ අනුව සියබස්ලකර කතුවරයෝ ද සවකීය ග්‍රන්ථයෙහි මෙ තැනට පැමිණ—

" කලාගුරු සුලුපා - වැසි වූ කුළුණු නුවණ යුත්
කලණමිතන වියතුන්-ගත්හි පියුම් ලකුණු ඇ " ආදි පද්‍ය කීපයක් ලීවේ ය. කලාගුරු සුලුපාය හෝ කල්‍යාණමිත්‍රයන් හෝ ගැන කිසියම් විස්තරයක් මේතාක් දැනගන්නට නො ලැබිණ. එහෙත් දැනට දක්නට ලැබෙන ඡන්දෝලඞ්කාර ග්‍රන්ථයන්ට පෙර ම ඒ විෂයයන් ගැන ලියැවුණ පරිපූර්ණ ග්‍රන්ථ තුබූ බවට ඒ සාක්ෂ්‍යය හොඳට ම ප්‍රමාණවත් ය. එතෙක් සම්පාදිත නො වූ චම්පූ නම් කාව්‍යවිශේෂය ගැන සඳහන් කළ සේන i රජතුමා එද සම්පාදනය කරනු ලැබේවා යි ප්‍රාර්ථනා කෙළේ ය. මෙයින් පෙනෙන්නේ ඒ වන විට අන් බොහෝ ග්‍රන්ථ සම්පාදනය වී තුබුණු බව ය. අලඞ්කාර ශාස්ත්‍රයා ගේ අඞ්කුර දශාවෙහි විරචිත කාව්‍යාදර්ශය ගුරුතන්හි තබා ගැනීම නිසා සියබස් ලකර ද අලඞ්කාර ග්‍රන්ථයක් වශයෙන් එතරම් උසස් නො වී ය ගී සාරසියයකින් නිමවුණු මෙහි ඇතුළත් වූයේ දශප්‍රාණ -පන්තිස් අලඞ්කාර - නව දෝෂ හා යමකාදී බන්ධනවිශේෂ කිහිපයකුත් ය. සියබස්ලකර සම්පාදනය කරන සේ ආරාධනා කළේ ගත්කරුවන් ගේ කණිටු සොහොයුරු අමරගිරි කාශ්‍යප නම් ආදිපාද කුමාරයා ය. සේනi රජුගෙන් පසු අභිෂේකය ලත් සේන ii රජතුමා මේ ආදිපාදයන් ගේ පුත්‍රයා ය. මහ පියා දවස සිංහලයන් ලත් පරාජයේ අපකීර්තිය පිඹ හැර පාඬින් දිනූ මේ සේන ii රජතුමා ලෝ-සසුන් වැඩ වැඩූ උදාර වීරයෙකි. මෙතුමන් පුත් වූ කාශ්‍යප v රජතුමා උත්කෘෂ්ට පඬිවරයෙකි. ව්‍යක්තවාදියෙකි. යුද්ධ වීරයෙකි.

**ධම්පියා ගැටපද සන්නය** එතුමන් නිපදවූ ධම්පියා ගැටපද සන්නය සෙසඹ් පවත්නා ගද්‍යයන් අතර පළමුවැන්න ය. ධම්මපදට්ඨකථා වේ ගැඹුරු පදයන්ට ලියූ විස්තර ව්‍යාඛ්‍යානයක් වූ එය නත් කර්තෘවරයාගේ විශිෂ්ට ශබ්දඥානය හා පෘථුල ධර්මඥානය පිළිබිඹු වන කැඩපතකි. නිර්වචන, ව්‍යාකරණ ලක්ෂණ පදනිෂ්ඨයන් ගෙන් පමණක් නො ව මතාන්තර නිරාකරණයෙන් හා මූල ග්‍රන්ථය පිළිබඳ සංශෝධනයන්ගෙන් ද යුක්ත වූ මේ ගැටපද සන්නය තත්කාලීන භාෂා තත්ත්වය මුළුමනින් දක්වන ආදර්ශපාඨයන්ගෙන් සමුපේතය. මේතාක් ප්‍රකට අන් කිසි ම ග්‍රන්ථයකින් හෝ සෙල් ලිපියකින් නූගත හැකි නිරුක්ති හා පද යෙදුම් ක්‍රම ආදි බොහෝ දේ ඉගෙන ගැනීමට මේ ග්‍රන්ථය අත්‍යන්තොපකාරය. අභිෂේකයෙන් සවන වසෙහි කසුප් රජු අභයගිරියේ කපාරමුල භික්ෂු ආයතනයට අයත් ගම්බිම්හි හා ආවාසයන්හි ද පැවැත්විය යුතු පුදසිරිත් ව්‍යවස්ථා කරවා ලියැවූ **අභයගිරි සෙල්ලිපිය** ද අගනා සාහිත්‍ය කෘතියක් වැන්න. එහි කාශ්‍යප v රජු ගේ ලොකශාසනොපකාර ක්‍රියා ද සඳහන් ව ඇත්තේ ය. රජතුමන් විසින් රචිතපිණැයි මේ සෙල් ලිපියේ සඳහන් වන **අභිධර්මව්‍යාඛ්‍යානය** හා **බුඩසෙනාශ්‍රය** දැකිමට තරම් භාග්‍යයක් නවීනයනට නැති. භික්ෂූන් වහන්සේගේ සුසීලත්වය, ගරුත්වය හා ඵාසුවිහරණය ගැන එකල මහත් සැලකිල්ලක් ඇති ව තුබූ බව මේ සෙල් ලිපියෙන් මෙන් ම සමීප කාලයෙහි නිපදවන ලද සිඛවළඳ විනිස ආදි ග්‍රන්ථ කීපයකින්ද පැහැදිලි ව පෙනේ.

**සිඛවළඳ හා සිඛවළඳ විනිස** උප සම්පන්න නවක භික්ෂූන් විසින් ආදියෙහි ම හික්මිය යුතු විනය ශික්ෂාවන් සංග්‍රහ කළ සිඛවළඳ හා පෙළ – අටුවාවන් බලා එයට කළ විවරණය වූ සිඛවළඳ විනිස ද ධම්පියා ගැටපදය හා සමකාලීන කෘතීන් කොට සැලකිය හැක්ක. කර්තෘවරයා අඥාත වුවද එතුමන් ගේ විනයධරත්වය හා ගුණසම්පත්තිය නම් සිඛවළඳ විනිසේ වැකියක් පාසා දක්නා ලැබේ. සම්පාදිත තැන් පටන් ම මේ ග්‍රන්ථය විනයගරුකයන් ගේ අතිශයාදරයට පාත්‍ර ව තුබූ බව පශ්චාත් කාලීන ලේඛනයන්හි සඳහන් වූ දෙයින් පෙනේ. සිඛවළඳෙහි "සිඛ කරණී කියූ සෙයින් සිවුර් හැන්ද" පෙරවිය යුතු බව **මිහින්තලා සෙල්ලිපියේ** සඳහන් විය. "ග්‍රන්ථ ධුරයෙන් වැසියක් කොට ගත නොහෙන අන්තෙවාසික සද්ධිවිහාරිකයන් ලවා යැටත් පිරිසෙයින් විනයෙන් මුල්සිඛ සෙඛියා වනපොත් කරවා සිඛවළඳ විනිස අස්වා සමසින් සමසැ ආද්‍යන්තකොට සමනා විචාළ තැනක් කියන්ට පොහොසත්" කර විය යුතු බව මහ පැරකුම්බා රජු ගේ **පොළොන්නරු කතිකාවතින්** මෙන් ම පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ **දඹදෙණි කතිකාවතින්** ද නියම කරන ලද්දේ ය. පද්මවති

පිරිවෙනේ පැවිදිශිෂ්‍යයන් සිඛ වළඳ උගත් බව හංස සන්දේශකාරයෝ පැවසූහ. දඹදෙණි සමයේ වැඩ විසූ පඬුමූල පිරිවෙණාධිපති මඩිහල තෙරණුවෝ මේ සිඛවළඳ පාලි භාෂාවට ද පෙරළූහ. එය අද දු සික්ඛාපදවලඤ්ජන නමින් දක්නා ලැබේ.

මේ ගණයේ වැටෙන අනික් ග්‍රන්ථය නම් හෙරණසිඛ ය. ප්‍රමාණයෙන් කුඩා වුවද එ ද අපේක්ෂිතාර්ථය සඳහා ප්‍රමාණවත් ය. පූර්වෝක්ත කතිකාවත් කීපයෙහි ම සාමණේරවරුන් මේ හෙරණසිඛ උගන්වා හික්මවිය යුතු බව දක්වා තිබීමෙන් පෙනෙන්නේ එ ද පැරණියන්ගේ සම්භාවනයට පාත්‍ර වූ බව ය.

**අභිධර්ම ව්‍යාඛ්‍යා**

කාශ්‍යප v රජුගෙන් පසු බෙහෙවින් සාහිත්‍යෝන්නතිය අපේක්ෂා කළ රජු නම් සතරවන මිහිඳු ය. එ තුමන්ගේ ආරාධනයෙන් සිතළුගාම වාසී ධම්මදින්න තෙරණුවෝ අභිධර්මව්‍යාඛ්‍යානයක් කළහ. විජයබාහු i රජතුමා අභිධර්ම ව්‍යාඛ්‍යානයක් සැපයූයේ ද මේ සමීප කාලයකදී ය. කාශ්‍යප v, ධම්මදින්න, විජයබාහු යන පඬිවරයන් මේ සමීප කාලයෙහි මෙසේ අභිධර්ම ව්‍යාඛ්‍යානත්‍රයක් ම සැපයූයේ සිංහල තුන් පිටකය සම්පූර්ණ කිරීම සඳහා ය යි සිතිය හැකි ය. ආදියෙහි ම මිහිඳු මාහිමියන්ගේ අතවැසි භික්ෂූහු මාගධී අටුවාව හෙළ බසට පෙරළූහ. බුද්ධදාස රජු දවස මහාධර්මකථී යතිවරයෝ සූත්‍රපිටක අනුවාදය සැපයූහ. සිඛවළඳ හා විනිස, හෙරණසිඛ ආදියෙන් විනය පිටකය අවශ්‍ය තරමින් සිංහලයට පෙරළුණේ ය. එහෙයින් මේ පඬිවරයන් මෙසේ අභිධර්ම ව්‍යාඛ්‍යානයන් සැපයීම උචිත ම ය. එහෙත් මේ ව්‍යාඛ්‍යානත්‍රය ම අද නාමමාත්‍රාවශිෂ්ට ය. මින් කාශ්‍යප v, ධම්මදින්න, දෙපඬිවරයන් ගේ ව්‍යාඛ්‍යානයන් කවර කවර ප්‍රකරණයන් සඳහා ද යනුත් නො කිය හැකි ය. විජයබා රජුගේ ව්‍යාඛ්‍යානය නම් ධම්මසංගණිය සඳහා ය.

මිහිඳු iv රජතුමා අභිෂේකයෙන් සොළොස්වන හවුරුදුයෙහි මිහින්තලා විහාරයේ පැවැත්විය යුතු පුදසිරිත් හා තදායත්ත ගම්බිම් ආදියෙහි පැවැත්විය යුතු ව්‍යවස්ථා ඇතුළත් කොට කරවූ සෙල්ලිපි යුග්මය ද මෙකලට අයත් උසස් සාමාජික ග්‍රන්ථයක් වැන්න. තත්කාලීන භික්ෂු ආයතනයක තුබූ විධිමත් ක්‍රියා පිළිවෙළ හා ඇතැම් රාජ්‍යපාලන නීතින් ද ඉන් දත හැකි ය.

මිහිඳු iv රජතුමා කළ සියලුවැඩ රටේ අභිවෘද්ධිය සඳහා පැවතුණ ද එතුමන්ගේ කාලිඞ්ග මෙහෙසිය හා පුතුන් දෙදෙනා අනුරාධපුර පරිහානිය ඉක්මන් කරවූවෝ ය. වැඩුමහල් පුත් සේන v තෙමේ සුරා බී දෙවිසිවනවියේදී මළේය. මේ අදූරදර්ශී ළපටි රජු හා එතුමන්ගේ දුරාචාරවත් මව ද උතුන් එරෙහිව

ගෙන තරඟයට ගොඩ බැස්වූ දෙමළ බලමුළු නිසා අනුරාධපුරයේ සිටගත නො හැකි වූ කාණ්ටු පුත් මිහිඳු v රජතෙමේ රුහුණු බලා පලා ගියේ ය. අනතිමෙදී සොළීහු එ රජහු උපාය බලයෙන් අල්වා මුහුදින් එතෙර ගෙන ගියහ. අනුරාධපුරයෙන් සිංහල රාජ්‍යය සදහට ම තුරන් වූයේ මින් පසුව ය.

කෙවුලත් විසින් හැරදමන ලදුව, කවුඩු කැණහිලුන් ගැවසීගත් මුහුදුබඩ ගමක් මෙන් අනුරාධපුරය අරාජකව, අශ්‍රිකව, මංපැහැරිමක් වැනි සොළීන්ගේ අනාචාර පාලන බලයෙන් මැඬෙමින් සයාසූවසක් ගතවූ කල්හි මූර්තිමත් වූ කීර්තියක් වැනි කීර්ති නම් කුමාරයෙක් රුහුණෙන් නැඟීවුත් සොළීන් පලවා හැර විජයබාහු i නමින් පොළොන්නරුවේ රජබවට පත්වූයේ ය. එතුමන් ගේ දූසි උත්සාහය නිසා යළිත් සිංහලය සිංහලබලයට යටත් වී ශාස්ත්‍රය අකුරු ලමින් වැඩෙන්නට පටන්ගත්තේ ය. එහෙත් අභාග්‍යයට මෙන් ඉක්බිතිව රජ වූ ජයබා විකුම්බා ගජබා රජුන්ගෙන් එයට කිසිත් අනුබලයක් නො ලැබුණේ ය. එහෙයින් ග්‍රන්ථලෙඛන තරඟයෙහි ලා විස්තර විය යුතු වෙන ග්‍රන්ථයක් පහළ වීමට කාලය අවකාශ නො දුන්නේ ය.

**මධ්‍යතන අවස්ථාව**

# උත්කෘෂ්ට තරඟය i

මහා පරාක්‍රමබාහු — ශ්‍රී පරාක්‍රමබාහු
ක්‍රි: ව: 1153 — ක්‍රි: ව: 1469

ත්‍රිසිංහලය එක්සත් කොට තුන් නිකාය සමඟි කරවා රටත් සසුනත් නිරවුල් කළ මහපැරකුම්බා මහරජුගෙන් උත්කෘෂ්ට තරඟය ආරම්භ වන්නේ ය. දිඹුලාගල කාශ්‍යප සංඝරාජ ස්වාමීන්ද්‍රයන්ගේ උපකාරිත්වයෙන්, වළගම්බා කල පටන් එක් දහස් දෙසිය සූපනස් වසක් භින්න නිකාය ව සිටි භික්ෂු සංඝයා සමඟි කරවා ලූ එතුමා මතු ශාසනයෙහි නිර්මල පැවැත්ම සඳහා කතිකාවතක් කරවා පොළොන්නරුවේ ගල්වෙහෙර භිත්තියෙහි කොට වූයේ ය. කාශ්‍යප සංඝරාජ මාහිමියන්ගේ ශිෂ්‍ය පරම්පරායෙහි වූ ව්‍යක්තාතිව්‍යක්ත මහ පඬිවරයන් සමූහයක් ම මෙ කල වැඩ සිටිය ද සිංහලය දෙස එතුමන්ගේ නෙත් සිත් යොමු වූ බවක් නො පෙනේ. ශාරිපුත්‍ර, මොග්ගල්ලාන, කච්චාන, ධම්කිත්ති, බුද්ධප්‍රිය ආදී ඒ වියතුන් නිසා තත්කාලීන පාලි සාහිත්‍යය ශත ගුණයෙන් බැබලී වැඩුණේ ය. ශාස්ත්‍රනිධාන බඳුවූ මේ අතිශ්‍රේෂ්ඨපඬිවරයන් අතින් සිංහල ග්‍රන්ථ සම්පාදනය නො වීම අපේ සාහිත්‍ය වංශයට පාඩුවකි. යත්තමකට වත් එතුමන් සිංහලය දෙස බැලූවේ සන්න කීපයක් සපයාතැබීමට පමණ ය. මහා කාශ්‍යප හිමියෝ සමන්තපාසාදිකා නම් විනය අටුවාවට ද, ශාරිපුත්‍රහිමියෝ අභිධර්මාර්ථ සංග්‍රහයට ද, සන්න කළහ. දක්ෂිණාරාමාධිපති බුද්ධප්‍රිය තෙරණුවෝ තමන් කළ

පද්‍යමධු නම් කුඩා මාගධී පද්‍යයට සන්නයද තුමූ ම ලීහ. ජානකීහරණ, කාව්‍යාදර්ශ, අමරකෝෂ, මේඝදූත යන ග්‍රන්ථයනට ලියූ සන්න හා ගුරුළුගෝමීන්ගේ අමාවතුරු වාක්‍යරීතිය පිළිබිඹුකරන මොග්ගල්ලායන ව්‍යාකරණයට ලියූ විජිත සන්නය ද මෙ සමයට ම අයත් බව සිතනු ලැබේ. අභිධර්මාර්ථසංග්‍රහ සන්න, පිරිතසන්නය වැනි ඒ ඇතැම් සන්නයකින් මූලික ග්‍රන්ථයට වඩා සිංහලයට සිදුවන සේවය උසස් ය.

ලඞ්කාව අධිරාජ්‍යයක් කොට තෙතිස් වසක් රාජ්‍යය කළ මහපැරකුම්බා රජු සවර්ගස්ථ වී නො බෝ දිනකින් ම රට වියවුල් ව ගියේය. පැරකුම්බා රජුගෙන් පසු රාජ්‍යයට පත් වූ කවීශ්වර පණ්ඩිත විජයබාහු රජුට රාජ්‍යය කළ හැකි වූයේ එක් වසකි. එතුමන් මරවා රජය පැහැර ගත් කාලිඞ්ග මිහිඳු දින පසකි. ඉක්බිති රජ වූ කීර්ති නිශ්ශඞ්ක තෙමේ සාහිත්‍යය උදෙසා වැඩ කළ අභිමානවත් රජෙකි. බෙහෙවින් සවකීය වර්ණකථනය ඇතුළත් වූ සෙල්ලිපි සමූහයක් ම පිහිටු වූයේ මේ රජතුමා ය. විශාලත්වයෙන් අග්‍රගණ්‍ය වූ පොළොන්නරු ගල් පොත නැමති සෙල් ලිපිය ද මේ රජතුමන්ගේ ය. අභිෂේකයෙන් නවවැනි වසෙහි කීර්තිනිශ්ශඞ්ක මල්ල රජු ඇවෑමෙන්, පරාක්‍රමබාහු මහ රජු මහෝද්‍යෝගයෙන් ඇති කළ සිංහල අධිරාජ්‍යය බිඳ වැටුණේ ය. මින් පසු පැරකුම් මෙහෙසිය වූ ලීලාවතිය තුන්වරක් ද, නිශ්ශඞ්ක මෙහෙසිය වූ කල්‍යාණවතිය එක්වරක් ද රාජ්‍යයෙහි අභිෂේක කරනු ලැබූහ. මේ රාඥීන් දෙදෙනම සාහිත්‍ය වර්ධනයෙහි රුකුල් දුන් බව පෙනේ.

**සසඳවත හා මුවදෙව්දාවත**

ගී දෙසිය අනූතුනකින් (293) යුත් **සසඳවත** ලියනලද්දේ ලීලාවතී රැජිනගේ පළමුවන රාජ්‍ය වර්ෂ (1197—1200) තුනේදී ය. ඈගේ ප්‍රථම රාජ්‍ය යුගයේ දී සම්පාදිත සසඳවතෙහි මෙන් ම අනතිම රාජ්‍යයුගය (1211) වූ සත්මස ඇතුළත කළ දඨාවංස මාගධී පද්‍යයෙහි ද ඇයගේ කීර්තිය ප්‍රතිබිම්බිත ය. ලීලාවතිය ප්‍රථම වර රාජ්‍යයෙහි අභිෂේක කර වූ කීර්ති සෙනෙවියා සසඳවතෙහි ද, පශ්චිම වර රාජ්‍යයෙහි අභිෂේක කරවූ පරාක්‍රම සෙනෙවියා දඨාවංසයෙහි ද වර්ණිත විය. සසඳවතට තත්කර්තෲවරයා ම හෝ සමකාලීන අන් වියතකු විසින් කළ පැරණි සන්නයක් ද ඇත්තේය. එහි 179 ගීයට ලියූ සන්නය අනුව මේ ඛණ්ඩකාව්‍යයට කාව්‍යතිලක යන නාමයක් ද තුබූ බව නිශ්චය වන්නේ ය. බාලරාමායණ, ශකුන්තල, රඝුවංස, කුමාරසම්භව, මේඝදූත ආදී සංස්කෘත ග්‍රන්ථයන්ගෙන් පෙරළා ගත් අදහස් සසඳවතෙහි බොහෝ ය. එය තත් කර්තෲවරයාගේ පාණ්ඩිත්‍යය විදහා පෙන් වන්නකි. එමෙන් ම පොළොන්නරු යුගයෙහි සංස්කෘතය බල පෑ විවිධාංශයන්ගෙන් එක් අංශයක ලක්ෂණයකි.

ගී 164 කින් යුක්ත මුවදෙව්දාවත ද සසදාවත ගත් මග ම ගිය කවෙකි. එද බෙහෙවින් සංස්කෘත ග්‍රන්ථයන් අනුගමනය කළ බව පෙන්වතුදු සසදාවතට වඩා පරිණත කවිත්වය හා ප්‍රතිභා පූර්ණත්වය දක්වන වැනුම්වලින් යුක්ත විය. පැරණියන් විසින් ද මුවදෙව්දාවත වඩා සම්භාවිත සේ සැලකූ බවට සිදත්, සදස් කරුවන්ගේ නිදසුන් පාඨ නිදසුන් කළ හැකි ය. සසජාතකය හා මඛාදෙව ජාතකය මෙසේ කව් කළ මේ බහුශ්‍රැත කවීන් දෙදෙන කවරහුදැයි නිශ්චය කිරීමට තරම් සාධක තව ම අප හමුවෙහි නැති.

නිශ්ශඞ්ක මෙහෙසිය වූ කල්‍යාණවතිය රාජ්‍යයෙහි අභිෂේක කරවූ ආයශ්මන්ත සෙනෙවියා කළ **ධර්මාධිකරණ** නම් නීතිශාස්ත්‍රීය ග්‍රන්ථය හා වාචිස්සර හිමියන්ගේ **ථූපවංසය** ද අද සම්පූර්ණයෙන් ම අභාවප්‍රාප්ත ග්‍රන්ථයෝ ය.

**ශ්‍රේෂ්ඨ ගද්‍ය කෘති**

මීළඟට රචිත වූ ග්‍රන්ථමය සිංහල සාහිත්‍යයෙහි දත්තාභිෂේක වූ මහපඬිවරයාගේ ය. බුද්ධචරිතය හා බුද්ධධර්මය වස්තු කොට රචිත වූ **අමාවතුර** හා **ධර්මප්‍රදීපිකාව** කාලය විසින් යටපත් නො කළ හැකි ග්‍රන්ථයෝ ය. කාලයෙන් කාලයට ම ආදර්ශ විය හැකි අමාවතුරු භාෂාරීතිය තත්කර්තෘභූත ගුරුළුගෝමීන්ගේ භාෂානෛපුණ්‍යයට හා චින්තනශක්තියට දෙස් දෙන්නේ ය. පුරිසදම්ම සාරථි බුද්ධගුණය ප්‍රස්තුත කොට සම්පාදිත රස-භාව පූර්ණ පරිච්ඡේද අටළොසකින් හෙබි එය පසුකල රචිත වූ ගද්‍යග්‍රන්ථ බොහොමයකට ම ගුරුපොත විය.

**ධර්මප්‍රදීපිකාව** ගැටපද විවරණයකි. උපතිස්ස ස්වාමිපාදයන් ගේ පාලි මහාබොධිවංසයේ දෙසියපහක් පදයන්ට ලියූ පරිකථාවක් වන එය ගුරුළුගෝමීන් ගේ මහාධර්මධරත්වය හා නානා ග්‍රන්ථයන්හි බහුශ්‍රැතභාවය ද පෙන්වයි.

ගද්‍යකාව්‍යයන් අතර අග්‍රස්ථානය **අමාවතුරට** ය. ගැටපද විවරණයන් අතර අග්‍රස්ථානය **ධර්මප්‍රදීපිකාවට** ය. ගුරුළුගෝමීන් නැගූ මේ ජයස්තම්භය යටකිරීමෙහි සමත් කවියෙක් මේතාක් සිංහලයන් අතර පහළ නො වීය.

විද්‍යාචක්‍රවර්තීන් ගේ **බුත්සරණ** ජනප්‍රිය ගද්‍යකාව්‍යය යි. බුදුගුණ ගැයීමෙහි නිසර්ගසිද්ධ ප්‍රතිභාවක් හා සාලඞ්කාර වාක්‍ය රචනයෙහි අනුපම ශක්තියක් තුබූ ඒ පඬිවරයා සැබවින් ම විද්‍යාචක්‍රවර්ති කෙනෙකි. හාස්‍යය කරුණාව වැනි කාව්‍යරසයන් බුත්සරණින් නැගී එන්නේ බුදුගුණ කිරිසයුරින් නැගෙන සුදෝසුදු රළපෙළ සෙයිනි.

ගුරුළුගෝමීන් ගේ බුද්ධචරිතය **අමෘතප්‍රවාහ** (අමාවතුර) නම් විය. විද්‍යාචක්‍රවර්තීන් ගේ බුද්ධචරිතය (බුත්සරණ) **අමෘතාවහ** නම් විය. දිග අදහසක් කෙටියෙන් කීම ඕජෝ ගුණය නම්. කෙටි අදහසක් විස්තරයෙන් කීම ද ඕජෝගුණය

නම් වේ. ගුරුළුගෝමි විද්‍යාචක්‍රවර්ති දෙ පඬිවරයන් ගේ බුද්ධ චරිතවිය මේ දෙයාකාර ඔජෝගුණයට සැපයූ හොඳම නිදසුන් දෙක ය. ගුරුළුගෝමීන් ගේ **ධර්මප්‍රදීපිකාව** සංස්කෘත මිශ්‍ර කථිත සිංහලයෙන් ලියන ලද්දකි. විද්‍යාචක්‍රවර්තීන් ගේ **ධර්මසරණ** ද සංස්කෘත මිශ්‍ර කථිත සිංහලයෙන් ලියන ලද්දකි. ධර්මප්‍රදීපිකාවෙහි සුලූකලිඟුදුව ගුරුළුගෝමීන් ගේ නිර්මාණ ශක්තියටත්— ප්‍රතිභාසම්පන්න කවිත්වයටත් නිදසුන් වන අයුරින් සැපයී තිබේ. පරාක්‍රමබාහු ii වැනි අතිශ්‍රේෂ්ඨ කවීන් විසින් පමණක් නොව දුනුවිල ගජනායක නිලමේ වැනි කණිෂ්ඨ කවීන් ද මේ රචනය ආදර්ශයට ගත් බව කියාපාන සලකුණු ඔවුන්ගේ නිබන්ධයන්හි දක්නා ලැබේ. ගුරුළුගෝමීන් ගේ සුලූකලිඟුදුව දැකීමෙන් දෝ විද්‍යාචක්‍රවර්ති තෙමේ ද ධර්මසරණෙහි වෙස්සන්තර කථාව මිහිරි සිංහලයෙන් ලිවී ය. ඒ වූකලි බුත්සරණෙහි ආ තත් ප්‍රවෘත්තිය ඒ වර්ණනා විලාශයෙන් ම නැබීමකි. පසු කල විසූ ගත්කතුවරයන් මේ වෙස්සන්තර ප්‍රවෘත්තිය ඉතා ප්‍රිය කළ බව පෙනේ. කුරුණෑගල පරාක්‍රමබාහු රජු දවස පාලි ජාතක පොත හෙළුබසට නැඟීමේදී වෙස්සන්තරජාතකය විද්‍යාචක්‍රවර්තීන් ගෙන් ගෙන බහාලූයේ එහෙයිනි.

**සඟසරණ** විද්‍යාචක්‍රවර්තීන් ගේ බවට දක්විය හැකි එක ම සාධකය නම් පිළිවෙළින් ආ 'සරණ' යන නම පමණි. විද්‍යාචක්‍රවර්තීන් තුන් සරණ ම ලියා තබන්නට ඇතැයි සිතීමෙන් සඟසරණයට විද්‍යාචක්‍රවර්ති කර්තෘත්වය පිරිනැමුණු බව පෙනේ. භාෂාවිලාශයෙන් හෝ රචනාමාර්ගයෙන් සඟසරණ, බුත්සරණට හෝ ධර්මසරණට බොහෝ ඈතින් වත් නෑකම් නො කිය හැක්කකි.

සකලවිද්‍යාචක්‍රවර්ති පරාක්‍රමපණ්ඩිතයන්ගේ **ථූපවංසය** ද විද්‍යාචක්‍රවර්ති කර්තෘත්වයට ම යටත් කොට නැබීමට මෙ රට බොහෝ පඬිවරුන් සිතූ නමුදු ඒ සාකල්‍යයෙන් අහේතුක වූවකි. ථූපවංස කතුවරයා විද්‍යාචක්‍රවර්තීන් හමුයෙහි ආධුනිකයෙකි. විද්‍යාචක්‍රවර්තීන්ට සම ව තබා එතුමන් ආදර්ශයට ගැනීමෙන් වත් ඒ වාක්‍යශෛලියෙන් ලිවීමට ථූපවංස කතුවරයාට නො හැකි විය. බුත්සරණ වාක්‍යප්‍රදේශ එහෙමපිටින් ම උපුටා ගැනීමට පරාක්‍රමපණ්ඩිතයන් සිතුයේ ඒ නිසා විය යුතු ය.

### ජාතක ගාථා සන්නය හා ජාතක ගැටපදය

බුද්ධඝොෂ මාහිමියන්ගේ ජාතකට්ඨකථාව ඇසුරු කොට දෙදෙනකු විසින් ලියන ලද **ජාතක ගාථා සන්නය** හා **ජාතක ගැටපද සන්නය** ද පොළොන්නරු යුගයට අයත් මහඟු ග්‍රන්ථ දෙකකි. ජාතකට්ඨකථාවේ දසක නිපාතය දක්වා ඇති ජාතක 450 කට පමණ අයත් එක්දස් එකසිය පහක් පමණ වූ ගාථාවන්ට සන්නය ලියූ ඒ ආචාර්යවරයා රාජමුරාරි නමැයි කියනු ලැබේ.

**ජාතකගැටපද සන්නය** ලියූ ආචාර්යවරයා අඥාත ය. භාෂාප්‍රයෝගය අතින් ඒ ජාතකගාථාසන්නයට හා අභිධර්මාර්ථ සංග්‍රහ සන්නයට බොහෝ සේ සමාන ය. ශාස්ත්‍රීය විස්තර, පැරණි වචන, අප්‍රකට නිරුක්ති, තත්කාලීන ව්‍යාකරණවිධි, පාලියෙන් අර්ථ කීම්, සංස්කෘත ධාතු පෙන්වීම්, ආදි අන් සියලු ලක්ෂණයන්ගෙන් ජාතක ගැටපදය, ධම්පියා ගැටපදයේ කණ්ටු සොහොයුරකු තරමට සමාන මුහුණුවර ඇත්තේ ය. දෙකෙහි ඇති විශේෂය නම් ධම්පියා ගැටපදයේ පාලි තත්සම ශබ්ද බහුල බව හා ජාතක ගැටපදයේ සංස්කෘත තත්සම ශබ්ද බහුල බවත් ය. ඒ වූකලි ග්‍රන්ථයෙහි රචනා කාලය වෙන් වෙන් වශයෙන් පෙන්වන ලක්ෂණයක් ද වෙයි.

උත්කෘෂ්ට තරඞ්ගයෙහි මෙ තෙක් සඳහන් වූ ග්‍රන්ථයන් මහ පැරකුම්බා මහ රජුගේ හා දිඹුලාගල කාශ්‍යප සංඝරජයන් ගේ මහොද්යොගයෙන් ඇති වූ විද්‍යාලතාවේ හටගත් මල්සැති වැන් නැයි කිය හැකි ය.

ලීලාවතී බිසව රජයෙන් පහ කොට රාජ්‍යය පැහැර ගත් පරාක්‍රම පණ්ඩු පඬි රජු තුන් වසක් ගෙවූ ඉක්බිති මූර්තිමත් වූ අනතුරයක් වන් මාඝ නම් මොඝ පුරුෂයෙක් සූවිසිදහසක් දෙමළ බල පිරිස් පිරිවරා වුත් පොළොන්නරුව පැහැර ගත්තේ ය. (1215). “අපි කෙරළ යොධයම්හ” යි උන්නාද කරමින් කුළු මීමුන් මෙන් ලාඞ්කිකයන්ට භය ඉපදවූ මේ මාඝ මාරභටයන් ගෙන්, ජාතියට ආගමට හා සාහිත්‍යයටත් සිදු වූ විපත් ලියා නිම නො කළ හැකි තරම් ය. නැවතත් විජය බාහු කෙනකුන් පහළ වන තුරු ඔවුහු ලඞ්කාව ගිනි තබමින් එක්විසිවසක් ගෙවූහ. පසුගිය වර දෙමළසංහාරය රුහුණෙන් ඇරඹුණු නමුත් මේ වර දඹදෙණියෙන් පැන නැංගේ ය. විජයබා කෙනෙක් නැගී දෙමළ බල බල ඔබලකොට මායාරට රාජ්‍යයට පැමිණියේ ය. මෙ තෙක් රුහුණට හා පිහිටිරටට අයත් ව තුබූ ලඞ්කාරාජ්‍යය මෙතැන් සිට මායා රටට අයත් වූයේ ය. මහා විජයබාහුගෙන් සිදු වූ තරමට දෙමළ සතුරන් දුබල වී පොළොන්නරුව නැගුණු තරමට දඹදෙණිය නැගී පැවැත්තේ ය. සියල්ල සම්පූර්ණකොට දඹදෙණිය උත්කෘෂ්ට රාජධානියක් බවට පමුණුවා සිංහල සාහිත්‍ය ලතාව නැවත වරක් මල්ගැන්වීමට තවත් ඇත්තේ පරාක්‍රමබාහු කෙනකුන් පහළ වීම පමණ ය. විජයබා රජුගේ පුත් කුමරුවෝ පණ්ඩිත පරාක්‍රමබාහු නමින් රජයට පැමිණි යහ. සරත් සමයෙහි අහසැ පිපෙන තරු සෙයින් යළිත් පඬි වරු පහළ වන්නට වූහ. ඉක්බිති අභිරමණීය සුගන්ධයෙන් යුත් සාහිත්‍යපුෂ්පයෝ පිපෙන්නට පටන්ගතු.

**කව්සිළුමිණ**

පණ්ඩිතපරාක්‍රමබාහු රජු කළ කුසද කව දඹදෙණි සමයේ මතු නොව සිංහල ජනතාව ආරම්භ වී මේ තාක් ම සම්පාදිත උසස්තම පද්‍ය කාව්‍යය යි. ගී හත්සිය හැත්තෑවක් ඇති සර්ග පසළොසකින් නිමියා වූ මේ ග්‍රන්ථය ලාංකේය සාමාජික චාරිත්‍රයන්ගෙන් හා අන් කවියකු විසින් නො කී තරම් අපූර්ව තාත්වික ලක්‍ෂණයෙන් ද යුක්ත ය. සසදාවතින් හා මුවදෙව්දාවතින් ඇරැඹුණු ගීතිග්‍රන්ථාවලියේ අවසානවූත් පරිපූර්ණවූත් ග්‍රන්ථය නම් මේ **කව්සිළුමිණිකුසදාව** ම ය. කවිත්වයට අසහාය හෙතු වූ නිසර්ග සිද්ධ ප්‍රතිභාව, බහුශ්‍රැතභාවය, හා අමන්දාභ්‍යාසය යන සකල හෙතූන්ගෙන් ම අනූන වූ කව්සිළුමිණි කතුවරයන්ගේ අනුපම නිර්මාණ කෞශල්‍යය නිසා මේ මහා කාව්‍යය කියවන පාඨකයා ඇතැම් විටක ධර්මශාලාවකට පැමිණි උවසුවකු මෙන් වෙයි. ඇතැම් විටක අවන්හලකට වන් විනොදකාමී තරුණයෙක් වෙයි. ඇතැම් විටක මඟුල් හලකට වන් සලීල පුරුෂයකු මෙන් ද තවත් විටක රණපිටියට බට යුද සෙබළකු මෙන් ද වෙයි. අපූර්වතම ප්‍රතිභාව පරිණත කවිත්වය හා අද්භූත නිර්මාණ කෞශල්‍යයත් එකට කැටි ව තුබුණේ මේ ගත්කතුවරයා කෙරෙහි ය. මහා කාව්‍යයක ඇති විය යුතු ය යි පැරණියන් කී සියලු ලක්‍ෂණයෙන් ද, නවීනයන් අපේක්‍ෂා කරණ සියලු අර්ථයෙන්ද ගැබී යම් කවක් වේ නම් ඒ මේ කව්සිළුමිණි කුසදාකව හැර අනිකක් නොවේ.

**කව්සිළුමිණ කර්තෘ**

කව්සිළුමිණ දඹදෙණියේ පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ කෘතියක් බවට දැක්විය හැකි සාධක නම් i නිගමන ගීතිත්හි යෙදුන 'කලිකල් සවැණි' යන නාමය හා ii පරම්පරාගත විශ්වාසයත් iii විශුද්ධිමාර්ගී සන්නයෙන් හෙළි වන එතුමන්ගේ මහා පණ්ඩිත්‍යය හා iv රාජ්‍ය කටයුතුවලින් වෙන් ව සිටි නිසා සාහිත්‍යසේවය සඳහා එතුමන් ලත් අවකාශයත් යන කරුණු ය.

ගත් කතුවරයා තමා චන්ද්‍රවංශයට අයත් පඬිරජ පරපුරේ වූවකු බව ග්‍රන්ථාවසානයේදී කී ය. දඹදෙණි පැරකුම්බා රජු පියපක්‍ෂයෙන් සූර්‍යවංශයට අයත් කාලිඞ්ග පරම්පරායෙහි වූවෙකි. මේ නිසා කව්සිළුමිණ කර්තෘ දඹදෙණි පැරකුම්බා රජු නොවේයයි නූතන විචාරබුද්ධිසම්පන්න බහුශ්‍රැත මහපඬිවරු දෙදෙනෙක් තර්ක කළහ. ඉන් කෙනෙක් එහි කර්තෘ මහා පරාක්‍රමබාහුයයි ද කෙනෙක් කවීශ්වර පණ්ඩිත විජයබාහු යයි ද කීහ.

පොළොන්නරුවේ මහාපරාක්‍රමබාහු රජු චන්ද්‍රවංශයට අයත් පඬිපරපුරැ වූවකු බව සැබෑ වුව ද එතුමනට මෙ තරම් විශාල සාහිත්‍යකෘතියක් නිපදවීමට තරම් ශ්‍රේෂ්ඨ කවිත්ව

යක් හෝ අවකාශයක් තුබූ බවට ඉතිහාසයෙන් ලැබෙන සාක්‍ෂ්‍ය අල්පය. බාල්‍යයෙහි සිට ම එතුමන් ගේ කාලය ගත වී ගියේ සතුරන් මැඩීමට හා රට වැඩීමටත් ය.

කලිකාලසර්වඥ (කලිකල් සවැණි) යන උපාධියකුදු එතුමනට තුබූ බවක් අසනු නො ලැබේ.

මහපැරකුම්බා රජු සියැසින් දුක—එතුමන්ගේ ජීවන ප්‍රවෘත්තිය හා ලෝකශාසනෝපකාර ක්‍රියාවන් ප්‍රත්‍යක්‍ෂයෙන් දුන එතුමන් පිළිබඳ ඉතා සුළු දෙය පවා උදුර අන්දමින් වැනූ ධම්මකිත්ති මාහිමියෝ ද කව්සිළුමිණ හෝ අන් පොතපතක් හෝ එතුමන් කළ බවක් සවකීය මහාවංශයෙහි සඳහන් නො කොළෝ ය.

කවීශ්වර විජයබාහු රජුගේ චන්ද්‍රවංශිකත්වය නොපැහැදිලි වූවකි. එතුමන් සමයෙහි ලියූ සෙල් ලිපියකින් පෙනෙන්නේ ඔහු කාලිඞ්ග ව ශයට අයත් බව ය.

යම්හෙයකින් ඔවුන් චන්ද්‍රවංශිකයෙකැයි ගත හැකි වුව ද මේ මහ කව කිරීමට තරම් අවකාශයක් ඔවුනට ලැබුණු සේ නොසැලකිය හැකි ය. පැරකුම් රජුගේ අධිරාජ්‍යයට අත දිගු කරන අභ්‍යන්තර සතුරන් මැද එක් වසක් දුකසේ රාජ්‍යය කළ විජයබාහු රජතුමා දීපනී නම් ගොපලු සත්‍රියකගේ වසඟ යට පැමිණ මරණ ලද්දේ ය. කව්සිළුමිණකරු කවිත්වයෙන් පාණ්ඩිත්‍යයෙන් පමණක් නොව රාජකාර්‍යවිෂයෙහි හා ලෝක චරිත්‍රවිෂයෙහි පරිණත බුද්ධියකින් ද යුත් යුද්ධවීරයකු බව කව්සිළුමිණ පද්‍යයන්ගෙන් පැහැදිලි ව ම පෙනේ. කවීශ්වර විජය බාහු රජුට එ වැනි අන්දකීමක් තුබුණේ ද?

විජයබා රජුගේ උපාධිනාමය කවීශ්වර යන්න මිස කලි කාල සර්වඥ යන්න නො වේ.

"කලිකාලසර්වඥ උපාධිය දරූ රජතුමා එය ඉතා උසස් කොට සැලකූ බව එය ම කව්සිළුමිණෙහි යෙදීමෙන් හැඟේ. මහ පැරකුම්බා රජතුමාගේ උපාධි නාමයන් අතර මේ උසස් උපාධිය නො තිබීමෙන් ම පැහැදිලි වන්නේ කව්සිළුමිණ කළ කලිකල් සවැණි නිරිඳුන් එතුමා නො වන බවය" යි විජය බාහු පක්‍ෂය ගත් පඬිවරයෝ කියති. මේ අනුව බලනවිට විජයබා රජුගේ ද උපාධි නාමය කලිකාල සර්වඥ යන්න නො වීමෙන් පෙනෙන්නේ කව්සිළුමිණ කළ කලිකල් සවැණි නිරිඳුන් එතුමාත් නොවන බව නො වේද?

කලිකාලසර්වඥ උපාධිය ලැබූ රජතුමා කව්ද යනු මහා වංශයේ ඉතා පැහැදිලි ව දක්වා ඇත. එතුමා නම් අන් කෙනකු නොව දඹදෙණියේ විජයබා රජුගේ පුත් පණ්ඩිත පරාක්‍රමබාහු රජු ය. මේ හැර මේ උපාධිය ලත් අන් රජ කෙනකුන් ගැන අපේ කොහිම ඉතිහාසයකවත් සඳහන් වී නැති. "ශ්‍රී විමල මලය දෙශාභි ජාත ජම්බුද්‍රොණී නම් නුවර **කලිකාල සාහිත්‍ය සර්වඥ** යන උදුර විරුදු බණවන ක්‍ෂත්‍රිය පඬිත්..." දළද පූජාවලියේ (47 පිට) දක්නා මේ උපාධිය කා සඳහා යෙදුනක්

දැයි විමසිය යුතුව තිබේ. චන්ද්‍රවංශිකත්වය හෝ සූර්‍ය්‍ය වංශිකත්වය පැහැදිලි කර ගැනීම් නම් කච්සිළුමිණ කරු නිශ්චය කර ගැනීමට එතරම් රුකුලක් විය හැකැයි නොසිතිය යුතුය. මේ උභයවංශික ක්ෂත්‍රියයෝ බොහෝවිට අන්‍යෝන්‍ය ඥාතිසම්බන්ධයෙන් බැඳී විසූහ. මහා පරාක්‍රමබාහු රජුට කව්සිළුමිණ කර්තෘත්වය පවරා දෙනු කැමැත්තන් එතුමන් චන්ද්‍රවංශිකයකු කොට දක්වතත්, පැරකුම්බා සිරිත් කරුවන් හා කාව්‍යශෙඛර කරුවෝ එතුමන් සූර්‍ය්‍යාන්වයිය ලමැණිකුලවතකු බව කිහ. එමෙන්ම දඹදෙණි පැරකුම් රජුගේ සූර්‍ය්‍යාන්වයිය බව හෝ මහබෝ වඩාගෙන ආ පෙළපතින් පැවති බව හෝ ඒ දෙපක්ෂවරයෝ නොපිළිගත්හ. පිළිගත්තු නම් එ තරම් ප්‍රසිද්ධ නො වූ උපතිස්ස—මහානාම රජුන් පවා දක්වද්දී මෙ තරම් ප්‍රසිද්ධ වූ පණ්ඩිත පරාක්‍රමබාහු රජුන් නො දක්වත්නට හේතු නැති.

වත්මන්හි මෙන් එකල ද වංශය ගණන්ගැනීමෙහි පිය පක්ෂය බල පැවැත්වුව ද මවු පසින් වංශය සැලකූ අවස්ථා ද නැත්තේ නො වේ. විජය රජුගේ කාලිඞ්ග වංශිකත්වය මෙනි. මෙ සෙයින් පණ්ඩිත පරාක්‍රම බාහු රජු මවු පසින් චන්ද්‍රවංශිකයකු විණැ යි සැලකිය නො හැකි නො වේ.

ඉදින් පණ්ඩිත පරාක්‍රමබාහු රජු මව්පසින් චන්ද්‍රවංශයට අයත් විණි නම්, සූර්‍ය්‍යවංශිකයකු කොට පැරණියන් විසිනුත් නො සලකන ලද නම්, කලිකාල සර්‍වඥ උපාධිය ලැබුයේත් එතුමා නම්, ග්‍රන්ථරචනයෙහි ආවශ්‍යක වූ කවිත්වය, හා අවකාශයත් තුබුණේ එතුමනට නම් කව්සිළුමිණ කර්තෘත්වය එතුමන් ගෙන් පැහැර ගැනීමට ඇති යුතුකම කවරේ ද?

පැරකුම්බා රජුගේ සාහිත්‍යසේවය කව්සිළුමිණ සැපයීමට ම සීමා වත්නේ නො වේ. බුද්ධදත්ත ස්වාමිපාදයන් ගේ ගාථා හාරදහසකටත් අධික වූ විනය විනිශ්චයට හා බුද්ධඝොෂ ස්වාමිපාදයන්ගේ බුද්ධ ධර්‍මය පිළිබඳ සාර සංග්‍රහයක් වූ විශුද්ධිමාර්‍ගයට ද ඒ රජතුමා මනහර ව්‍යාඛ්‍යානවයක් සැපයූයේ ය. මින් විනය විනිශ්චය සන්නය අද නාමාවශෙෂ ය. එහෙත් විශුද්ධිමාර්‍ග සන්නය භාෂා ඉතිහාසය හදුරන්නවුන්ට මාර්‍ගදේශකයකුව ධර්‍මකාමීනට ආචාර්‍ය්‍යවරයකු ව අදත් බබලන්නේ ය. මේ සන්නය සැපයීමෙහි ලා ආශ්‍රය කළ-අටුවා-ටීකා ග්‍රන්ථයන් හා නානා විෂයීය සංස්කෘත ග්‍රන්ථයන් ද ගැන සිතා බැලීමෙන් පැරකුම් රජුගේ ග්‍රන්ථඥානය කො තරම් විශාරද වූවක් ද යනු යන්තමින් සිතා ගත හැකි ය.

කඞ්ඛා විතරණී සන්නය නමිනුදු හැඳින්වෙන ප්‍රාතිමොක්ෂ අටුවා ගැටපදය වූ කඞ්ඛාවිතරණී පිටපොත ද දඹදෙණි සමයට ම අයත් වත්තක් බව භාෂා සාම්‍යයෙන් සිතා ගත හැකි වුව ද එහි කර්තෘහු කවරහුදැ යි නිගමනය කිරීමට නම් කිසිදු පිටුවහලක් මේ තාක් නො ලැබුණේ ය.

පැරණි ග්‍රන්ථමාලාවෙන් අද ශේෂ ව පවත්නා එක ම ව්‍යාකරණය හා ඡන්දස් ග්‍රන්ථය ද නිපදවන ලද්දේ මෙ සමයෙහි ය. ප්‍රතිරාජ පරිවෙණාධිපති මාහිමියන් ගේ සිදත් සඟරා නම් ඒ සදලකුණ හා භද්‍රස්ථවිරයන් ගේ **විරිත් මිණි** මල් නම් වූ ඒ සඳස් ලකුණ ද අද සාහිත්‍ය ග්‍රන්ථ දෙකක් වශයෙන් ද උපයෝගී කොට ගත හැකි ව තිබේ. මේ ග්‍රන්ථවයේ නිදසුන් පද්‍යයන් ගෙන් අභාවප්‍රාප්ත පැරණි සාහිත්‍යග්‍රන්ථ කීපයක ම ලකුණු දක්ක හැකි ය.

**ජනප්‍රිය ග්‍රන්ථ**

බුද්ධපුත්‍ර මාහිමියන් ගේ **පූජාවලිය** හා ධර්මසේන මාහිමියන් ගේ **සද්ධර්මරත්නාවලිය** ද මෙ සමයෙහි සාමාන්‍ය ජනයා කෙරෙහි ද ශාස්ත්‍ර රුචිකත්වය පැතිරී තුබූ බවට සාක්ෂ්‍ය වෙති. පරිච්ඡේද සූතිසකින් හෙබි **පූජාවලිය**, ගුරුළුගෝමීන්ගේ පුරිසදම්මසාරථී පද වර්ණනා නම් අමාවතුරට පසු ඒ මග ගත් ගද්‍යය විය. අරහං යන බුදු ගුණය ශීර්ෂ කොට ගෙන පෙළ—අටුවාවෙන් හා පූර්වග්‍රන්ථයන් ගෙන් කරුණු සංග්‍රහ කොට නිමැවූ ඒ ග්‍රන්ථය ගුරුළුගෝමීන්ට සමාන කවිත්වයක් හෝ උසස් චින්තන ශක්තියට සාක්ෂ්‍ය වූ කෙටි වාක්‍යරීතියක් හෝ නො දක්වතුදු ජනප්‍රිය වර්ණනාසරලයෙන් හා උපදේශාත්මක ධර්ම විචාරයෙන් සමලංකෘත ය. අවසානයෙහි වූ සූතිස්වන පරිච්ඡේදය ලංකා ඉතිහාසයෙහි ලා මහඟු විවරණයකි. බණ පොතක් වශයෙන් පූජාවලිය තරම් ප්‍රතිග්‍රහණයක් ලැබූ පොත් සිංහල සාහිත්‍යයෙහි ම ඇත්තේ තවත් එකක් දෙකක් පමණි.

ධම්මපදට්ඨකථාවේ අනුවාද ස්වරූපයෙන් රචිත වූ **සද්ධර්මරත්නාවලිය** කථා වස්තු තුන්සීයකින් පරිමිත ය. දේශීය හැඟීම් හා ලක්ෂණ පිළිබිඹු වන ග්‍රන්ථයන් අතර ඒ අග්‍ර ගණ්‍ය ය. ධර්මඥානයෙන් මතු නොව දේශඥානයෙන් ද මැඩී සිටි රත්නාවලී කරුවෝ ගැමියන් ගේ දිවිපෙවෙත හා රුචිකත්වය ගැන හොඳින් දැන සිටියෝ ය. එතුමන් සුදුසු තැන බලා අනවරතයෙන් යෙදූ දේශීය වූ ප්‍රත්‍යක්ෂ උපමා නිසා රත්නාවලී කථා වස්තුනට ලැබුණේ අසාමාන්‍ය ප්‍රියත්වයකි. උපමා දැක්වීමෙහි බුත්සරණ කරුවන් ද අද්විතීය චාතුර්යයක් උසුලතත් එයින් බොහොමයක් සාහිත්‍යාගත වාක්මාලා ය. ධර්මසේන මාහිමියන් ගේ උපමා බෙහෙවින් ම පොදුජන ජීවිතය ඇසුරු කළ ඒවා ය. උන්වහන්සේ ගේ අපරාධීන නිහතමාන බව රචනාවිලාශයෙහි ම ගැබ් වී ඇත.

ප්‍රහේලිකා ගණයට වැටෙන **දහම් ගැටය** නම් කුඩා පද්‍යය ද ධර්මසේන මාහිමියන් විසින් ම රචිත ය යි සලකනු ලැබේ.

නිමි ජාතකය ආශ්‍රය කොට අත්ථදස්සී නම් යතිවරයකු විසින් සම්පාදිත **නිරය වර්ණනා** නම් පොතක් ද දක්නට ඇත. මේ ගත් කරුවෝ නිබන්ධමුඛයෙහි යෙදූ ගාථාකිහිපයෙන්

තමන් ටීකාචාර්ය ශාරිපුත්‍ර මාහිමියන් ගේ ශිෂ්‍යයෙකැයි හඟවති. ශාරිපුත්‍ර මාහිමියන් ගේ ශිෂ්‍ය පරම්පරාව විසින් සම්පාදිත අතිශ්‍රේෂ්ඨ ග්‍රන්ථයන් දෙස බලන විට නිරයවර්ණනාව රත්මිණිරුසක් හමුයෙහි කදම්ණක් වැනි ව පෙනේ. ආදර්ශමත් රචනාමාර්ගයක් හෝ නැගී එන සාහිත්‍යරසයක් එහි නැත. එහෙත් කාරණානුරූප ධර්මපාඨයන් උපුටා සංග්‍රහ කිරීම නිසා ගත් කරුවන් ගේ අපේක්ෂිතාර්ථය වූ නිරය වැනීම නම් සඵල වූ බව පෙනේ.

පැරකුම්බා ii රජුගේ පන්තිස් වස ඉක්ම ගියේ ය. නැවත ද සිංහල රාජ්‍යය අවුලෙන් අවුලට වැටුණේ ය. රාජධානිය එහ මෙහා වෙනස් කරන්නට සිදුවි ය. එහෙයින් මේ සමීප කාලයෙහි යාපව්ව, පොළොන්නරුව, කුරුණෑගල, ගම්පොළ කෝට්ටේ යන ස්ථාන කිහිපයෙක්හි ම රාජ්‍යපාලන මණ්ඩලය පිහිටුවා ගන්නට සිදු විය.

ක්‍රි: ව: 1303 දී කුරුණෑගල රාජධානියෙහි අභිෂේක ලත් පරාක්‍රමබාහු iv රජතුමාගෙන් සාහිත්‍යයට සැලකිය යුතු සේවයක් සැලසුණේ ය. දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු ය යි නම් ලත් මේ රජතුමන් දවස ද සිංහල ගද්‍යාංශය උසස් ව පොෂණය විණ.

**ද්විතීය ගද්‍ය යුගය**

සිංහල සාහිත්‍යයෙහි උපදෙශ භාණ්ඩාගාරය වූ -කථාරත්නාකරය වූ -අතිශය ජනාදෘත මහා ගද්‍යය වන **සිංහල ජාතක පොත** සම්පාදිත වූයේ මෙතුමන් දවස ය. මෙ තරම් මහජනයා අතට පත් වෙනත් ග්‍රන්ථයක් සිංහල සාහිත්‍යයෙහි ඇත්තේ ම නැත. උගතා මෙන් ම නූගතා ද එකසේ ප්‍රිය කළ ජාතක පොතින් අපේ සාහිත්‍යය හා සමාජය ලත් පොෂණය ද විශාල ය. අර්ථයෙන් ම විශාල ය. අනුරාධපුර සමයෙහි පාලි වචනයන් ගෙන් ද පොළොන්නරු සමයෙහි සංස්කෘත වචනයන්ගෙන් ද පොෂණය වෙමින් ආ සිංහල භාෂාව මේ වන විට බෙහෙවින් දෙමළ වචනයන් හා සම්බන්ධ වන්නට පටන් ගත් සැටි රත්නාවලී උමංද ආදියෙන් පෙනෙන අතර ජාතක පොතින් පෙනෙන්නේ කුළු ගත් සැටියකි. භාෂා විලාශයෙන් ජාතක පොත මුළුමනින් එක් ආකාර නො වේ. එය එක් පරිවර්තකයකුගේ කෘතියක් නොව කර්තෘ මණ්ඩලයක කෘතියක් වීම එයට එක් හේතුවකි. කලින් පරිවර්තනය වී බුත්සරණ ආදියෙහි ඇතුළත් වූ කථා වස්තූන් එ ලෙසින් ම ඇතුළු කර ගැනීම තවත් හේතුවකි.

ජාතක පොතෙහි විශාලතම කථාවස්තුව වූ **උම්මග්ග ජාතකය** සිංහලයට පෙරළන ලද්දේ සිංහල ජාතක පරිවර්තනයෙහි ජ්‍යෙෂ්ඨ කර්තෘවරයකු වූ වීරසිංහ ප්‍රතිරාජ ඇමතිතුමා ය. එය වෙන ම පොතක් වශයෙන් ද දක්නා ලැබේ. වීරසිංහ

ප්‍රතිරාජයන්ගේ රස වෑහෙන සරල භාෂා ශෛලිය නිසා උම්මග්ග කථාවෙහි ඇති රසවත් කම දෙගුණ තෙගුණ වී එයි. එය මෙ තරම් ජනප්‍රිය වූයේ ද ඒ නිසා ම ය.

පැරකුම් iv රජුගේ ආරාධනාවෙන් දෙවරාජ නම් විනිශ්චය කාර ඇමතියන් ලියූ **දළදා සිරිත** සිංහලයට අමුතු රචනා විලාශයක් ඇතුළු කළ ග්‍රන්ථයකි. අනුප්‍රාස බහුල ශබ්ද රචනයෙන් කාව්‍යයක් සේ කියැවෙන මේ වාග්ලීලාව ව්‍යත්තගන්ධි නමැයි පඬිවරයෝ කියති. මෙ සමයට ම අයත් වූ **දඹදෙණි අස්න** හා කෝට්ටේ සමයෙහි රචිත වූ **කුරුණෑගල අස්න** ද මේ භාෂා ස්වරූපය ගෙන හැර පාන අතික් ග්‍රන්ථයෝ ය. එහෙත් ඒවා යාදිනි මිස සාහිත්‍ය ග්‍රන්ථ නොවේ. **දළදා පූජාවලිය** වූකලී පැරකුම් iv රජු ඇතුළු පකට රජුන් සත් දෙනකුන් පමණ කළ දළදා පූජෝත්සවයන් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවකි.

කැලණි විහාරාධිපති ව වැඩවිසූ විල්ගම්මුල සංඝරාජ මාහිමියන්ගේ **බොධිවංස, අනාගතවංස** අනුවාද ද්වය ද මෙ කලට අයත් ය. පරිච්ඡේද දොළොසකින් හෙබි උපතිස්ස මාහිමියන් ගේ පාලි බොධිවංසය පාලිසාහිත්‍යයෙහි ඔජෝ ගුණ භූයිෂ්ඨ ග්‍රන්ථයකි. විල්ගම්මුල මාහිමියෝ ස්වකීය පරිවර්තනයෙහි දී මේ ගුණය නො පිරිහෙන සේ බෙහෙවින් පරිස්සම් වූහ. බොහෝ තන්හි පදානුපදික සේ පෙනෙන මේ පරිවර්තනය ඇතැම් තන්හි සාලඞ්කාරවත්-විස්තරවත් තිබෙනු දක්ක හැකි ය. ගුරුළුගෝමීන්ගේ මහාබොධිවංස පරිකථාවේ (ධම්පදීපිකාවේ) එන වර්ණනාසථලයන් එලෙසින් ම ඇතුළු කර ගැනීම එයට එක් හෙතුවකි. අනාගතවංස පාලිය හා සමන්තභද්දිකා නම් එම අටුවාව ද ආශ්‍රයෙන් රචිත වූ **සිංහල අනාගතවංසය** ද පසු කල විසූ ගත්කරුවන් බොහෝ දෙනකුන් විසින් සම්භාවනා කළ උසස් ගද්‍යයකි.

කුරුණෑගල රාජ්‍යය වැටී ගම්පොළ නැගී සිටියේ ය. ගම්පොළ අවධියෙහි ඇතිවූ සාහිත්‍ය උන්නතියේ ගෞරවය හිමි වන්නේ රජකට නොව මැති-ඇමැතිවරුන් කිප .දෙනකුට ය. මෙ වකට කීර්තිමත් ව සිටි භික්ෂූහු පළාබත්ගල ධර්මකීර්ති පරපුරෙ වූවෝ ය.

තෙවන ධර්මකීර්ති මාහිමියෝ රසවාහිනියෙහි අනුවාද ස්වරූප වූ **සද්ධර්මාලඞ්කාරය** තැනුවෝ ය. ඒ වනාහි විසිතුරු පැහැයෙන් තොර වූ සුදු රෝස කුසුමක් වැනි නිර්ව්‍යාජ සරල රචනයකි. එහි ලාඞ්කික කථාවස්තූන් දක්වෙන කොටස මේ රට නගර- ග්‍රාම- තීර්ථාදී විස්තරයන්ගෙන් හා ජන සමාජයෙහි සිදු වූ සාමාන්‍ය ප්‍රවෘත්තීන්ගෙන් යුක්ත ය. එහෙයින් ම ලඞ්කා සමාජ ඉතිහාසය හදාරන්නවුන්ට ඉතා ප්‍රයෝජනවත් ය.

ධර්මකීර්ති මාහිමියෝ ශාසනික හා ජාතික ඉතිහාසය විෂයෙහි හසළ දැනුම් ඇත්තෝ ය. එ හෙයින් ම ය **නිකාය සංග්‍රහය** වැනි සාරගර්භ-සංක්ෂිප්ත ව්‍යක්ත ඉතිහාස ලේඛනයක් සපයා තැබීමට උන්වහන්සේට හැකි වූයේ. **ශාසනාවතාරය**

නම් වූ මේ නිකාය සංග්‍රහය හැර ශාසන ඉතිහාසය පිළිවෙළින් දැන ගැනීමට තරම් අන් ලේඛනයක් පැරණියන් අතින් සම්පාදිත නො වී ය.

ශතෘසිංහ කුඤ්ජර නම් ඇමති කෙනකුන්ගේ ආරාධනයෙන් ලියැවී තිබෙන **අත්තනගලුවංස අනුවාදයේ** කර්තෘ අවිනිශ්චිත ය. එහෙත් එය පරිවර්තනයෙහි හුරු-පුරුදු ව්‍යක්ත පණ්ඩිතයකුගේ කෘතියක් බවට එහි රස ශෛලික වාක්‍යයන් නිදසුන් කළ හැකි ය.

**සිවුපද කාව්‍ය**

පස්වන බුවනෙකබා රජු දවස කවීශ්වර පණ්ඩිතයන් තැනූ **මයූර සන්දේශය** පැරණි සන්දේශාවලියේ ගුරුපොත ය. මුළුමනින් එළිසම කොට බඳනාලද සිවුපද කාව්‍යයන්ගෙන් සෙස වූ පැරණි පොත ද එ ය. සිංහල පද්‍යය ගීතියට ඇරුණු කාලය තුළ ද එළිසමය හා එය අනිවාර්ය ලක්ෂණය කොට ගත් සිවුපදය ද බෙහෙවින් තුබුණු බවට සඳස්ලකුණේ නිදර්ශන පද්‍යයන් සාධක කළ හැකි ය. එහෙත් වර්තමාන සිවුපද කාව්‍ය ග්‍රන්ථයන්ගේ මූලාරම්භය නම් මේ මයූර සන්දේශයෙනි. කවීශ්වර පණ්ඩිතයෝ අනුප්‍රාස රසය අතිශයින් ප්‍රිය කළහ. ඒ අතින් මයූරය පැරදවිය හැකි කව් පොතක් සිංහලයේ නැත. බුවනෙකබා රජු හා තුන්බෑ කුමරුවන් ද දම්කිත් මාහිමියන් ද රැක දෙන සේ යදිමින් ගම්පළ සිට දෙවුනුවර දේවාලයේ උපුල්වන් දෙවියන් වෙත යවන හස්නක විලාශයෙන් රචිත එය පද්‍ය 164 කින් යුක්ත ය. කිසි ලෙසකිනුත් දෙස් දැක්විය නො හැකි පද යෙදීමකුත්, එයට හොබනා අර්ථ නිපදවීමකුත්, සියල්ලෙහි ප්‍රමාණවත් වර්ණනාවකුත් නිසා මයූර සන්දේශය සිංහල සාහිත්‍යයට ආභරණයක් වූයේ ය.

පැරණි සන්දේශාවලියේ මේ පළමුවන රචනයෙහි මෙන්ම එහි අවසාන රචනය වූ සැවුල් සන්දේශයෙහි ද කර්තෘවරයා ගිහි පණ්ඩිතයෙකි. මේ අතර සැපයුණු අන් සියලු සන්දේශයන් හි කතුවරයන් පැවිදි පණ්ඩිතයන් බව සිතිය හැක්ක.

දැදිගම පරාක්‍රමබාහු රජුට ආසිරි පතා කිසි යම් පණ්ඩිතයකු (ගලතුරු මූල මෛත්‍රෙය මහා ස්වාමි?) විසින් පද්‍ය 184 කින් රචිත **තිසර සන්දේශය** පැරණි කමින් දෙවැන්න ය. බලවත් සතුරන් මධ්‍යයේ දුකසේ විසූ පැරකුම් රජු දැදිගම සිංහාසනය රැකගන්නට මහත් උත්සාහයක් දරද්දී එයට පිටුවහල් වනු කැමති රජුට හිත මිත්‍ර වූ මේ පණ්ඩිතතෙමේ තිසරයකු අත හස්නක් යවමින් එ රජුන් ආරක්ෂා කොට සිංහාසනය ඔහුට ම ස්ථිර කොට දෙන සේ දෙවුනුවර උපුල්වන් දෙවිඳුගෙන් ඉල්ලීය. එහෙත් දෙවියෝ පිහිට නුවූහ. මහ වීදගම හිමියන්ගේ උපස්ථම්භය ලත් ශ්‍රීපරාක්‍රමබාහු කුමාරතෙමේ දැදිගම පරාක්‍රමබාහුන් නසා ලංකාව එකච්ඡත්‍ර කොට කෝට්ටේ රාජධානියෙහි අභිෂේක ලැබූයේ ය.

මහ පැරකුම්බා රජුගෙන් පොළොන්නරුවටත්, පණ්ඩිත පරාක්‍රමබාහු රජුගෙන් දඹදෙණියටත් ලැබුණු උත්කර්ෂය හා උද්දීපනය ශ්‍රී පරාක්‍රමබාහු රජුගෙන් ජයවර්ධනපුර කෝට්ටයට ලැබුණේ ය. මෙ තරම් කවිගීත වූ නාමයක් ඇති අන් රජෙක් සිංහල රාජාවලියේ ම නැත. වැළිත් ඒ අධික වර්ණනයෙක් නො වී ය. සූපනස් වසකට සීමා වූ එ රජුගේ රාජ්‍යසමයට අයිති මහගු සාහිත්‍ය රචනයන් දෙස බලන විට ඒ අතිශයින් සමීචීන වූ වර්ණනයක් හා සතුතිපූජාවක් බව පෙනේ. කෝට්ටේ රාජධානියෙහි ශ්‍රී සමෘද්ධිය තත්කාලීන පරෙවි, සැළලිහිණි, ගිරා, කොවුල්, හංස සන්දේශයන් හි මැනවින් පිළිබිඹු වී ඇත. සිරිපැරකුම් රජතෙමේ ලඞ්කාභූමිය පොහොර කළේ ය. එහෙයින් තොටගමුව- වීදගම- කෑරගල- පැපිළියාන ආදී ප්‍රදේශයන් හි උත්තුඞ්ග සාහිත්‍යවෘක්ෂයෝ පුහුඹුල් ව වැඩුණහ. ඉන් සාහිත්‍යරසය උරා–පූ තරුණ කවිකෝකිලයෝ තරඟ දිදී නද දෙන්නට වන්හ. ලඞ්කාව කවිනාදයෙන් නිනාද ව ගියා ය.

කවීන් අතර කවියකු වූ සිරි රහල් මාහිමියන්ගේ කාව්‍යශේඛරය සිංහලයේ දෙවන මහාකාව්‍යය යි. පළමුවන සිංහල මහා කාව්‍යයට සමාන වූ නිමිත්තක්, සර්ග සංඛ්‍යාවක් හා වස්තුවක් ඇති මෙය, එයට අසමාන වූ ලක්ෂණයක් හා රුචිකත්වයක් දක්වන්නේ ය. කව්සිළුමිණ මෙන් ම කාව්සේකරයත් කිරීමෙහි ඇයැදියෝ රජ කුමරියන් දෙදෙනෙක. දෙක ම බෝසත් සර වැනුම් ය. බොධිසත්ව චරිත වර්ණනා ය. දෙක ම සර්ග පසළොස බැගින් ඇත්තේ ය. කව් සිළුමිණෙහි පද්‍ය සංඛ්‍යාව හත්සියහැත්තෑවකි. කාව්සේකරයෙහි අටසිය අසූනතකි.

කව්සිළුමිණ ගීති බද්ධ ය. කාව්සේකරය එළිසම යුක්ත ය. පළමු වැන්නේ පද්‍යයන් හි ප්‍රතිභාපූර්ණ චමත්කාර ජනක අර්ථ රසය ඇත්තේ ය. දෙවැන්නේ බහුශ්‍රැතතායෙන් පිරි සාභිමාන පද යෙදුම් ඇත්තේ ය.

රාහුල මාහිමියන් ගේ ප්‍රතිභාපූර්ණ පරිණත කවිත්වය දක්වන්නේ මේ මහා කාව්‍යය නොව පද්‍ය එකසියඅටක් ඇති **සැළලිහිණි සන්දේශය** යැ. එකකට එකක් නො දෙවන තරම් මිහිරි වූ මේ සමුද්‍රඝොෂ පද්‍යමාලාව රස විඳින්නකුට නම් මසක් කියවාත් නිම නො කළ හැකි ය. කාව්‍යශෙඛරය ලියන ලද්දේ සිරිපැරකුම් රජුගේ දූ වූ උලකුඩය දේවියගේ ආරාධනයෙනි. සැළලිහිණිය ලියන ලද්දේ ඇයගේ ස්වාමිපුරුෂයා වූ නන්නුරුතුනයා ඇමතියන්ගේ ආරාධනයෙනි. උලකුඩය දේවියට පුත්‍රයකු ඉල්වා කැලණියේ විභීෂණ දෙවියන් වෙත යැවුණු මේ සන්දේශය සඵල වූ බව ඉතිහාසයෙන් පෙනේ.

එහෙත් රහල් හිමියන් තරුණ වියෙහි චන්ද්‍රවතී කුමරියට සුදුසු ස්වාමියකු හා පුත්‍රයකු ඉල්වා උපුල්වන් දෙවියන් වෙත යැවුණු පද්‍ය 208 කින් යුත් **පරවිසන්දේශ** යෙන් අභිප්‍රේතාර්ථ සිද්ධිය නො වී ය.

සිරි රහල් මාහිමියන්ගේ කීර්තිය එවකට බෙහෙවින් පැතිර ගියේ කවියකු වශයෙන් ම නොව ෂඩ්භාෂා පරමේශ්වර මහා පාණ්ඩිත්‍යයෙන් යුත් මහානුභාව සම්පන්න සංඝ පිතෘවරයකු වශයෙනි. තත්කාලීනයන් සිරි රහල් මාහිමියන්ට දක්වූ භක්තිමත් අවනත භාවය හා ආචාර්ය ගෞරවය ගිරා කොකිල සන්දේශයන්හි පිළිබිඹු වී ඇත. වෙසෙසින් ගිරා සන්දේශයෙහි දක්වෙන මේ බහුමාන සමාචාරවන්තභාවය නිසා එය රහල් හිමියන්ගේ ශිෂ්‍යයකු විසින් නිපදවන ලදැයි අනුමාන කරනු ලැබේ. අවස්ථෝචිත වර්ණනය හා දීප්තිමත් පද මාලාව නිසා **ගිරාසන්දේශය** අනිකුත් සන්දේශයන් අතර විශිෂ්ටත්වයක් උසුලයි. පැරකුම් රජුන් හා රහල් මාහිමියන් වර්ණනා කළ සැටියෙන් ගිරාකතුවරයන්ගේ උසස් විචාරශීලී භාවය සිතා ගත හැකි ය. ගිරා පක්ෂියා යන්නේ සිරි රහල් මාහිමියන් වෙතට ය.

මෙහිත් පිබිදුනු වීදගම පරපුරේ තරුණ කවියෙක් කෑරගල පද්මවතී පිරුවෙන්හි වනරත්න සංඝරාජ මාහිමියන් වෙත ස්වකීය භක්ත්‍යතිශය දක්වා හංසයකු යැවූහ. රහල් හිමියන් දසට පොරණ කෙළ පැමිණියහ යි ගිරා සන්දේශයෙන් කියැවෙන විට වනරත්න මාහිමියන් ඒවා වරදැයි ඉවත ලූ බව **හංස සන්දේශ** කාරයෝ කීහ. රහල් හිමියන් දසට විදුනැන් ප්‍රවේණි කොට ගත්හ යි කී ගිරාහඬට වනරත්න හිමියන් සූසැට කලාව ම නිසරු කොට දුටහ යි හංසනාදයෙන් පිළිතුරු ලැබුණේ ය.

පදයෙන් පදය ගටා –අර්ථයෙන් අර්ථය ගටා –වෘත්තයෙන් වෘත්තය ගටා– දෙමාහිමිවරුන් වැනූ මේ කවිභටයන් දෙදෙන කවරහුදැයි නිශ්චයෙන් දත නො හැකි වීම පාඩුවකි.

**කෝකිල සන්දේශය** ඉරුගල්කුල–තිලක පරිවෙණාධිපතීන් වහන්සේගේ ය. එතුමන් ද ෂඩ්භාෂායෙහි කෙළ පැමිණි පඬිවරයකු වශයෙන් දන්නා ලැබේ. සන්දේශයන් අතර විශාලතම වූයේ ඔබගේ කොකිලාලාපය යැ. ලක්දිව දකුණු තුඩුවේ සිට උතුරු තුඩුව දක්වා වැනූ මාර්ග–ග්‍රාම වර්ණනාවක් ඇතිවීම නිසා භෞගෝලික පරිස්ථිතිය හා ඓතිහාසික විනිශ්චය බලාපොරොත්තු වන්නන්ට ඒ ඉතා අගනේ ය. ආර්ය චක්‍රවර්තීන් දිනා යාපා පටුන යටත් කොට ගත් සපුමල් කුමරුන්ට ආසිරි පතා දෙවුනුවර උපුල්වන් දෙවියන් යැද එ බව ඔහුට කොවුලකු අත දන්වා යවන සේ මේ සන්දේශය සම්පාදිත ය. එහි පද්‍ය සංඛ්‍යාව දෙසිය අටාසූවකි.

පද්‍ය පන්සිය එකොළසකින් හෙබි වෑත්තෑවේ හිමියන්ගේ **ගුත්තිලය** අමරණීය ජාතක කාව්‍යයකි. මෙ කාව්‍ය කතුවර යන් තුළ ධර්මසේන මාහිමියන්ට වැනි අපරාධිත නිහතමාන බවකුත්, මයූර කතුවරයන්ට වැනි අනති විස්තර වර්ණනාප්‍රිය බවකුත්, සැලලිහිණි කතුවරයන්ට වැනි සුලලිත පද යෙදීමේ හුරු බුහුටි කමකුත් තුබුණු බව පෙනේ. ඔබ ද රහල් හිමියන් ගේ ම ශිෂ්‍යයෙකැ යි කියති.

සිංහල සාහිත්‍යයේ දක්නා ලැබෙන එක ම භක්තිකාව්‍යය සැපයූවෝ වීදාගම මහානෙත්‍රප්‍රසාදමූල විතිය මෛත්‍රෙය ස්වාමිපාදයෝ ය. පද්‍ය හයසියඑකොළොසකින් පරිමිත ඒ **බුදුගුණාලඞ්කාරය** එතුමන් තත්කාලීන අන් බොහෝ උගතුන් ගෙන් වෙන් කොට දක්වන සලකුණක් වැන්න. රහල් හිමියන් වැනි බහුශ්‍රැතයන් තරයේ පිළිගත් ලෞකික ශාස්ත්‍රයන්ට හා බමුණුමතයන්ටත් අස්ථාන දේවභක්තියටත් උන්වහන්සේ තුළ කො තරම් පිළිකුලක් හා අසහනයක් තිබුණේ ද යනු බුදුගුණාලඞ්කාරයෙන් ඉඳුරා පැහැදිලි කර ගත හැක්ක. **බුදුගුණාලඞ්කාරයට** වස්තු වූයේ විශාලාපුර දුර්භික්ෂය යි. එ කව කරුණාරසය ආඪ්‍ය වූවක් සේ පිළිගැනීමට හේතුව ඒ ය. එහෙත් ඒ රසපෝෂණයෙහි ගෞරවය වීදාගම හිමියන්ට අයත් වන්නේ ස්වල්ප වශයෙනි. වැඩි කොටසක ගෞරවය අයත් වන්නේ බුත්සරණ තැනූ විද්‍යාචක්‍රවර්තීන්ට ය.

සද්ධර්මෝපායනය ඇසුරු කොට මේ වීදාගම හිමියන් ම තැනූ **ලෝවැඩ සඟරාව** සාමාන්‍ය ජනතාව පිළිගත්තේ අතිශය ආදර භක්තියකිනි. අභිඥායෙන් ම ලෝ වැඩ සඟරාවක් වූ එහි පද්‍යයන් කියැවෙන විට "බණ බැරි වුණත් ගම වීදාගම" යන ආප්තාලාපයෙන් සිහි කරන වීදාගම මාහිමියන්ගේ කන්කලු ධර්මදේශනයෙහි ස්වරය කණට එන්නා සේ දැනේ.

දහම්ගැටය අනුව යමින් සම්පාදිත දහම්ගැටමාලාවත්, ඉෂ්ටාතිෂ්ට ගණ ආදි කාව්‍යකරණෝපදේශ සංග්‍රහ කළ **කව්ලකුණුමිණත්**, වීදාගම හිමියන්ගේ ම යයි සලකති.

**ලකුණුසර** නම් පද්‍ය අටපනසකින් යුත්, කාව්‍ය උපදෙශ සංග්‍රහ වූ කුඩා පද්‍යය ද මෙ සමයට අයත් ය. ඒ අවිනිශ්චිත කර්තෘක ය.

පද්‍ය 426 කින් යුත් **සඳකිඳුරුදා කව** ද මෙ සමයට අයත් සිලිටු පද්‍යයකි. රචනා පක්ෂයෙන් බුදුගුණාලඞ්කාර–ගුත්තිල පද්‍යයන්ට ආසන්න වූ එය විල්ගම්මූල පරපුරේ යතිවරයකුගේ කෘතියකි. විල්ගම්මූල නාමමාත්‍රයම සාක්ෂි කොට සඳකිඳුරුදා කව බෝධි වංශය තැනූ ප්‍රසිද්ධ විල්ගම්මූල සංඝරාජයන් අයත් කොට දක්වන පක්ෂයක්දු ඇති. එහෙත් විල්ගම්මූල පලාබත්ගල ආදී කීර්තිමත් පණ්ඩිත පරම්පරායාත භික්ෂූන් මහනුවර අධිකාර යුගය හා සමාසන්න ව පවා වැඩසිටි බව අමතක කරනු අයුක්ත යැ.

**නාමාවලිය** හා **රුවන්මල් නිඝණ්ඩුව** එ නෙක් සිංහලයෙහි තිබූ අඩුපාඩුවක් පිරිමසමින් හා කෝට්ටේ සාහිත්‍යයෙහි අඞ්ග සම්පූර්ණ කරමින් සම්පාදිත වූ කොෂග්‍රන්ථ දෙකකි. කලකට පෙර රචිත වූ පියුම්මල නැමැති නම් වට්ටෝරුව ඇසුරු කරමින් සිරිපැරකුම් රජු තැනූ **රුවන්මල් නිඝණ්ඩුව** පද්‍ය හත්සියඅට සැටකි. එතුමන්ගේ බෑණනුවන් වූ නන්නූරුතුනයා නැමැති මිණිසත්නස හාර ඇමතියාගේ **නාමාවලිය** පද්‍ය දෙසිය අසූහයකි.

පතික්කි නම් ඇමතිකෙනකුන් ගේ ආරාධනයෙන් ලියැවී තිබෙන **එළු සිලෝ සතකය** නැමති බුද්ධචරිතකාව්‍යය සිංහල යෙහි සිලෝබන්ධනයට දොරටුව හළ කවකි. ගිය හා සිව්පදය මෙන් සිලෝව සිංහල පද්‍යයට මඞ්ගල පීපියක් නො වූ නමුදු ඒ මහනුවර කවීන් කිපදෙනකු ගේ කවිත්වය ගමන් කර වූ රමණීය මාවතකි.

පද්‍ය සාරදහස්පන්සියසත්පනස්කින් (4557) යුත් **යෝග රත්නාකරය** නැමති විශාල වෛද්‍යවිෂයීය පද්‍යය ද කෝට්ටේ සාහිත්‍යයට තවත් අඞ්ගයක් වැඩි කළේය.

මේසා විශාල වූත් අඞ්ග සම්පූර්ණ වූත් සාහිත්‍යයකට සවිඨායෙන් අවකාශ සැලසූයේ සිරි පැරකුම් රජු හෙයින් කවිහු එතුමන්ගේ ගුණ ගායනයට ද කවි තැනූහ. ඉන් ශෙෂ ව පවත්නා එක ම ග්‍රන්ථය **පැරකුම්බාසිරිත** ය. පසුකල රචිත වූ විරුද කාව්‍යයන්ට අවිශෙෂයෙන් ගුරු වූ එය සිංහල කාව්‍ය සාගරයට උත්පාතයක් වැනි විය. මෙතෙක් පද්‍ය සම්පාදනය පැවැත්තේ හුදු තද්භව ශබ්ද යෙනි. පැරකුම්බා සිරිත් කරුවෝ මේ චිරාගත සම්ප්‍රදාය සැණෙකින් වෙනස් කොට සංස්කෘත තත්සම ශබ්ද බහුල වූ දීර්ඝ වෘත්තාත්මක පද්‍ය තැනූහ. වීර රස පොෂණයෙහි එය මහත් රුකුලක් බව දුටු පසු කල විසූ විරුද කරුවෝ එය විරුදකාව්‍ය සම්ප්‍රදායයක් සේ පිළිගත්හ.

පද්‍ය සාහිත්‍යය මෙසේ අත්‍යුච්චාංශයෙන් ම දියුණු වූ අතර ගද්‍යය පිරිහෙමින් පැවැත්තේ ය. සිරිරහල් හිමියන්ගේ පඤ්චිකා ප්‍රදීපය හා විමලකීර්ති හිමියන් ගේ **සද්ධර්මරත්නාකරයත්** හැරෙන විට **කඨිනානිසංස** වැනි සුළු නිබන්ධ කිපයක් මිස සැලකිය යුතු ගද්‍යයක් මෙ සමයෙහි සම්පාදිත නොවිය. මොග්ගල්ලායන පඤ්චිකාව සඳහා රහල්හිමියන් ලියූ **පඤ්චිකා ප්‍රදීපය** උන්වහන්සේ ගේ අසාමාන්‍ය බහුශ්‍රැතතාව හා අප්‍රතිසම ව්‍යාකරණ විශාරදත්වයත් පිළිබිඹු වන කැඩපතකි.

“සව්සත කෙළ පැමිණි-ගුරුවත් දෙරණ සපැමිණි” යන කාව්‍යශෙඛර පද්‍යය රහල්හිමියන් සඳහා නිරර්ථක ආත්මශ්ලාඝාවක් නොවන බව හැඟෙන්නේ මේ **පඤ්චිකාප්‍රදීපය** කියවූ විට ය. එහෙත් එය ඉගෙනගැනීමට මිස කියවා රස විඳීමට තැනූවක් නොවේ. එය ගැටපදවිවරණයකි.

පලාබත්ගල අවසාන පඬිවරයා වූ ධර්මදින්නාචාර්ය විමල කීර්ති හිමියන් ගේ **සද්ධර්මරත්නාකරය** ගද්‍ය සාහිත්‍යයේ පරිහානියට දෙස් දෙන්නකි. පුන පුනා කීම් හා අප්‍රස්තුත වර්ණනාදී රචනාදෝෂ බොහොමයක් ම එහි පිවිස ගෙන තිබෙනු දක්ක හැකි ය. එහෙත් 'සාරසංගහ' වැනි පාලි පොත් ඇසුරෙන් වටිනා ධර්මකොටස් සංග්‍රහ කිරීම නිසා බණපොතක් වශයෙන් නම් එය මහත් අගය ඇත්තේ ය. පසු කල විසූ සර්වඥගුණාලඞ්කාරය වැනි ධර්ම සංග්‍රහ තැනූවන් එය බෙහෙවින් ආශ්‍රය කළේ මේ නිසා ය.

**මධ්‍යතන අවස්ථාව**

## අවකෘෂ්ට තරඞ්ගය ii

ජයබා ii — රාජසිංහ i

ක්‍රි: ව: 1469 — ක්‍රි: ව: 1592

සිරිපැරකුම් රජු අභාවප්‍රාප්ත වී නොබෝ දිනකින් කෝට්ටේ රාජ්‍යය දුර්වල වන්නට වූයේ ය. සාහිත්‍යය ද වේගවත් පරිහානියකට යොමු ව පැවැත්තේ ය. අනතුරය හඟවන රතුකොඩි වැනි ලේවන් පෘතුගීසීහු ගොඩ බටුවෝ ය. ලඞ්කාව රණබිමක් වූවා ය

මින්පසු කෝට්ටේ රාජ්‍යසමයට අයත් වන ග්‍රන්ථ සාහිත්‍ය රසයෙන් හා ප්‍රයෝජන පක්ෂයෙන් බෙහෙවින් හීන ය. ඉන් අභයරාජ පිරිවෙන් හිමි විල්ගම්පායේ තෙරණුවන් ගේ **රාජ රත්නාකරය** විජයාවතරණයේ සිට අටවැනි බුවනෛකබා රජු දක්වා ඇති සාමාන්‍ය ඓතිහාසික ප්‍රවෘත්ති සංග්‍රහයකි. ලඞ්කාසේනෙවිරත් පරිවෙණාධිපතින් වහන්සේ ගේ **විමුක්ති සංග්‍රහය** 'උද්ධෘත ධර්ම සංග්‍රහයකි. ලලාට ධාතූන් වහන්සේ පිළිබඳ සංක්ෂිප්ත ඉතිහාසය සඞ්ග්‍රහ කරමින් කකුසන්ධ නම් තෙර කෙනකුන් විසින් ලියා තිබෙන **ධාතුවංශය** ද මේ කාල පරිච්ඡේදයට ඇතුළත් විය යුතු සේ පෙනේ. මේ පොත් කීපය ම යුද ගොස නිසා අවිවේකයෙන් සිටිමින් ලියූවා වැන්න.

මායාදුන්නේ හා තත්පුත්‍ර ටිකිරි බණ්ඩාර රාජසිංහයන් ගේ සීතාවක රාජධානිය, රාජධානියකට වඩා යුද කඳවුරක සිරි ඉසිලී ය. රාජසිංහ i රජු කීර්තිමත් යුද්ධවීරයකු වුවද නැණවත් අනුශාසකයෙක් නො වී ය.

එහෙසින් එතුමන් ගෙන් සාහිත්‍යයට හෝ ශාසනයට කිසිදු යහපතක් සිදු නො වී ය. වූයේ බිහිසුණු විපතකි. විනාශයකි. භාග්‍යයට මෙන් ධර්මධ්වජ පඬිතුමන් හා තත්පුත්‍ර අලගියවන්නයන් සිටි හෙයින් මිස නැත්නම් සීතාවක රාජධානිය අපේ සාහිත්‍ය වංශයෙහි නාම මාත්‍රයෙන් පවා ඇතුළු නොවන්නට තිබුණි.

රාජසිංහ i රජුගේ මුල් වස් කීපය තුළ අලගියවන්න පඬිවරයෝ එතුමන්ගේ කවිමඬුවෙහි මූලදූත ගෙන සිටියෝ ය. පැරණි සන්දේශාවලියට තවත් එකක් එකතු කරමින් පද්‍ය දෙසිය සතරකින් යුත් **සැවුල් සන්දේශය** තනා සුමන සුරිඳු ගෙන් රාජසිංහ රජුට හා ඇමති මණ්ඩලයට ආරක්ෂාව ඉල්ලා සිටියේ මෙ සමයේ ය.

අලගියවන්න මොහොට්ටාලගේ පියා වන ධර්මධ්වජ පඬිවරයන්ගේ කෘතියෙකැයි සලකන **දහම්සොඬ කව** පද්‍ය එකසියහැටතුනකින් යුක්තය. සඞ්මාලඞ්කාරයේ පලමුවන දහම්සොඬ ප්‍රවෘත්තිය මේ කාව්‍යයෙහි වස්තුසාරය විය. ග්‍රන්ථ කරණයෙහි ආරාධනය ලැබුණේ සමරදිවාකර නම් වයශ්‍ය මුකවෙටි කෙනකු වෙතිනි.

අලගියවන්නයන් ගේ **සුභාෂිතය** පද්‍ය සියයකි. එය වීදාගම හිමියන් ගේ ලෝවැඩ සඟරාව තරමට හෝ ඊටත් වඩා ජනප්‍රිය වූ කවකි.

කවි හයසිය අසූහතකින් යුත් **කුසජාතක කාව්‍යය** අලගිය වන්නයන් ගේ විශාල ම කෘතිය වෙයි. දඹදෙණි පැරකුම්බා රජුගේ කව්සිළුමිණට වස්තු වූයේ ද මේ කුසජාතක කථාව ම ය. කාව්‍යයෙහි අසම සම්පත්තිය යි සලකන ශෘඞ්ගාර රසය පිරි ඇති ජනප්‍රිය වස්තුවකි එ. සරසවිය නම් රජබිසොව ගේ ආරාධනයෙන් පැරකුම්බා රජු කව්සිළුමිණ කළාක් මෙන් ම අලගියවන්නයෝ ද අත්තනායක මැතිවරයන්ගේ භාර්යාව වූ මැණික්සාමි නම් කාන්තාවකගේ ආරාධනයෙන් කුසජාතක කාව්‍යය කළෝ ය. කුසජාතක කාව්‍යය රස-භාවයෙන් හෝ ගුණාලඞ්කාරයෙන් කව්සිළුමිණ හමුයෙහි පළිඟුවක් තරමට වත් දු, වස්තු වින්‍යාශයෙන් නම් ඒ මහ කව වුවද පරදවන තරම් ය. කථාරසය කැමති සාමාන්‍යයන් කව්සිළුමිණ එක් වරක් වත් නො කියවතුදු කුසජාතක කාව්‍යය නම් දෙතුන් වර කියවති.

මේ වන විට බුඞාගම ලබා තුබුණේ ද සිංහල සාහිත්‍යයට නො දවන තරම් දුර්භාග්‍යයකි. උක්දිව බුඞාගම පැතිරීගිය පසු මේ වන තෙක් සර්, ජා යෙන් සිංහල වූ කිසිදු රජෙක් මිසදිටු නො වීය. එහෙත් මේ ලඟ ලඟ සමයෙහි වුසූ රජුන් දෙදෙනම මිසදිටුවන් වී රටටත් ජාතියටත් ආගමටත් මහත් විනාශයක් ලං කළහ. එපමණකින් නැවතිණි නම් එද සැනසිලි දායක ය යි කියමි. සිංහල ග්‍රන්ථයක් සැපයීමට තරම් ශක්තිය තුබූ එකම පඬිවරයා වූ අලගියවන්න තෙමේ ද පාරම්පරික ව ලත් සවකීය ආගම හිස් වෙළුමක් මෙන් ගලවා දමා ක්‍රිස්තු ලබ්ධිය වැළඳ ගත්තේ ය. අලගියවන්න "දොන් . ජරනිමෝ" වුණේ මින් පසුව ය.

ඉක්බිති එතුමා ප්‍රතිකාලූන් යටතේ වසමින් සිංහලජාතියට පරම සතුරු වූ කොන්ස්තන්තිනු ද සා නම් පෘතුගීසි ආණ්ඩුකාර යකුට සතුතිපූජා කරනු සඳහා යේසුස් ක්‍රිස්තු සුරිඳුන් වැද කවි එකසියහැත්තෑ හයකින් යුත් කුස්තන්තීනු හටන රචනා කළේ ය. ඒ මූකලි අලගියවන්නයන් ගේ අවසාන කෘතිය යි.
සිරි පැරකුම් රජුගෙන් පසු ඇති වූ සාහිත්‍යයේ වේගවත් පිරිහීම නවතාලීමට අලගියවන්නයන් දැරූ ප්‍රයාශය මුළුමනින් සම්පූර්ණ නො වුව ද එතුමන් ගත් උත්සාහය සජීවීයෙන් පැසසුම් ලැබිය යුත්තේ ය.

කෝට්ටේ අවසාන භාගයෙහි සිට සීතාවක වැටීම දක්වා ඇතුළත් කාල පරිච්ඡේදය මෙහි අවකෘෂ්ට තරඞ්ගයැ යි නම් කළේ රසභාවපූර්ණ ආදර්ශමත් සාහිත්‍යකෘතීන් එකකගේ ද සම්භවයක් නොවූ නිසා ය. මේ කාලපරිච්ඡේදය මේ ග්‍රන්ථයේ ප්‍රාරම්භකථාවෙහි සංග්‍රහ වී විස්තර වන හෙයින් ඇපි ඉතා සංක්ෂිප්ත වැ ලියුම්හ.

සාහිත්‍ය ඉතිහාසයේ මධ්‍යතන අවස්ථාව මින් කෙළවර වෙයි. මෙ තැන් සිට හායන-උද්ගම-වර්ධන යන තරඞ්ගත්‍රයකින් සමුපේත වූ නූතන අවස්ථාව පිළිබඳ සාහිත්‍යඉතිහාස ය මෙ ග්‍රන්ථයෙන් ක්‍රමානුකූල ව විස්තරව ඇත.

දේශීය— ශාසනික— හා ශාස්ත්‍රීය ප්‍රවෘත්තීන්ගෙන් විමංශනාත්මක ඉතිහාස ඥානයක් හා ග්‍රන්ථවිවරණයන් ගෙන් තුලනාත්මක සාහිත්‍යඥානයකුත් එකවට ඇතිවන සේ සම්පාදිත එයින් නූතන අවස්ථාව අනූන ව ප්‍රසාද සංවෙගවත් ව හඳුල හැකි ය. අප විසින් කළේ ආධුනික සාහිත්‍ය කාමීනට අත පා මං දක්වීමකි.

මෙහිලා දැරූ මගේ උත්සාහයෙන් යම් පුණ්‍යඵලයක් සිඬ ද, එය, මා සුත ප්‍රේමයෙන් හදා වැඩූ වරකාගොඩ ගල්ලෙන රජමහා විහාරාධිපති ව වැඩ සිට දිවඞ්ගත වී වදාළ බෙන්තර සිරි සීලානන්දාභිධාන මද්ගුරුදේවයන් වහන්සේගේ කීර්ති ප්‍රතිබිම්බය හමුයෙහි සුවඳමලක් වේවා.

නාහල්ලේ පඤ්ඤාසෙන භික්ෂු

වරකාගොඩ
ගල්ලෙන විහාරයේ දීය.

# සිංහල සාහිත්‍ය වංශය

## ආමුඛය

තුන් ලොවට පිහිට වූ තෙරුවන් වැඳ සිංහල භාෂාවේ
සාහිත්‍යවංශ කථාව වර්ණනා කෙරෙමි.

---

**සිංහල භාෂාව**

සිංහල භාෂාව වූකලී ප්‍රාචීන භාෂා අතර උච්ච ස්ථානයෙහි ලා සැලකෙන ඉපැරණි භාෂාන්තරයෙකි. මෝ භාෂා තොමෝ ධර්මේතිහාස- කාව්‍ය- ව්‍යාකරණ- ඡන්දෝලඞ්කාරාදි වූ නොයෙක් විෂයයන් ගෙන් අලඞ්කෘත වූවා- ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථ ප්‍රවේණියකින් සාඩම්බර වැ පැවැතෙන්නී ය. අවුරුදු දෙ දහසකට අධික වූ පූර්වයෙහි එ තෙක් කල් කිසි දූ භාෂාන්තරයකට පරිවර්තිත නො වූ ත්‍රිපිටක අටුවා කථා ලිවීමට තරම් යෝග්‍ය වැ සම්භාව්‍යත්වයක ද ප්‍රවෘත්ත වූ යැ. සිංහල භාෂාව ඉතා පෙරත් ලෝක භාෂාවන් අතර අග්‍ර ගණ්‍ය වැ පැවැති බව දැනගන්නට මෙය ම ප්‍රමාණ වේ.

**සිංහල නාම- ඉතිහාසය**

බොහෝ කලක් අපේ ඓතිහාසිකයන් ගේ අදහස ව පැවැත්තේ 'සිංහල නාමය' විජය කුමරුන් ගෙන් පසු වැ ලක්දිව පහළ වූ බව ය. එහෙත් එය වූකලි විජය පරපුරෙන් පසු ලොවට පැමිණියක් නො වේ. සිංහල ශබ්දයෙන් ලක්දිව මැ වාච්‍ය වූයේ-එය විජයප්‍රභව කොට ඇතැයි පෞරාණිකයෝ කීහ. අර්ථකථාචාර්යවරයන් හා මහාවංශකාරාදි ශ්‍රේෂ්ඨතම ඓති- හාසිකයෝ ද එ මග මැ ගියෝ ය. එ මතු යැ, ගුරුළුගෝමි ආදි සුවිශද ප්‍රාඥයෝ පවා ලේශ මාත්‍රයකිනු දු නො සැලී එ-නිරුක්ත්‍යර්ථයෙහි සිටියාහු මැනු? සිංහලප්‍රභවය සෙවී මෙහි විශේෂ අර්ථසිද්ධියක් ඔවුන් නො තැකූ හෙයිනි. එ මෙසේ ඇති කල්හි 'පවදත් උදය' පිරුවත් හිමියෝ සු ප්‍රකට 'සත්‍යාර්ථ සඞ්ග්‍රහය' මගින් සිංහල නාමයාගේ ආදිතමත්වය හෙළි කළෝ මෙ විසිවන ශතවර්ෂයා ගේ ආදිභාගයෙහි ය. ඒ එසේ මැ සි. විජයාවතරණයෙන් වර්ෂ දහස් ගණනකට පෙරතු ව ද සිංහල නාමය ලෝක ඉතිහාසයෙහි ප්‍රතිබිම්බිත විය. බොහෝ හේතු යුක්තින් අනුව එය අන්‍ය දිවයිනකට නො වැ මේ ලඞ්කා ද්වීපයට ම ව්‍යවහාර වූ බව සිතාගත හැක්ක.

විජයොත්පත්තියෙන් ශතවර්ෂ ගණනකට පෙර අටලොස් මහා පුරාණයක් කිරීමෙන් සංස්කෘත සාහිත්‍යය පුළුල් කළ වියත් රුසිවරයන් අතර කෙනෙක් සවනිය රචනයන්හි සිංහල නාමය සඳහන් කළහ. ජම්බුද්වීපය පිළිබඳ අෂ්ට උපද්වීපයන් දැක්වෙන 'භගවත් පුරාණ' ශ්ලෝකයන්හි සිංහලය ද එයින් එකෙකැ යි දැක්වේ. ඒ සිංහලද්වීපයෙන් ලක්දිව ම වාච්‍ය වූ බව යළි, 'ගරුඩ පුරාණ'යෙන් පැහැදිලි ය. 'ලංකා'යැ, 'රාවණ ගඞ්ගා' යැ යි අපර නාම ඇයකිනු දු එහි සිංහලය හැඳින් වූ බැවිනි. එ මතු ද, ජ්‍යොතිස්තත්ත්ව- මහාභාරත යන ග්‍රන්ථයන්හි දු පැනෙන සිංහල නාමය මෙලක්දිව සඳහා ම කියන ලද්දකි. විජයොත්පත්තියට පෙර කරන ලදැ යි විවාද රහිතව පිළිගත් යථොක්ත පුරාණයන්හි සඳහන් එ පුවත කිසිසේත් බැහැර ලිය යුතු නො වේ.

**සිංහලයේ ව්‍යාප්තිය**

මෙසේ කවර අවස්ථාවක හෝ සිංහල නාමය පහළවත් මැ එ රට වැසි ජනයා අතර භාවිතයට පත් භාෂාව ද එ නමින් හඳුන් වන්නට වූ යැ. ලංකා තොමෝ ඒ සිංහලයනට වාසභූමි වූවා ය. මෙසේ කල් යත් බුදුන් පිරිනිවි දා විජය කුමරුන් ගේ ලංකාවතරණය සිදු විය. වර්තමාන සිංහලයේ ව්‍යාප්තිය පිළිබඳ ඉතිහාසය එය හිමි කොට පවති. විජයාවතරණයෙන් පූර්වයෙහි සිංහලයේ උසස් දියුණුවක් ඇති නො වී යැ යි තැකීමට ඉඩෙක් නැති. රාවණ යුගය සිහිකරන්නකුට සිංහලයේ විශිෂ්ට යුගයක් හමුවන හෙයිනි. එ නමුත් ඒ පිළිබඳ වෘත්තාන්තය කාලය නැමැති මරුකතරින් වැසී දුර්ගම වැ පවති. එහෙයිනි වර්තමාන සිංහලයේ ව්‍යාප්තියට විජය කුමරුන් ගේ කාලය හිමි කොට දැක්වූයේ. විජය කුමරුන් පැමිණෙන විට මෙහි විසූවන්ගේ භාෂාව වූයේ සිංහලය මැ යි. ආගන්තුක වැ පැමිණි ඒ පිරිස මෙහි වැසියන් හා මිශ්‍ර විය. අතීතයේ ලංකාව ඉන්දියාවට යාව තිබුණේ ය යන්න සැබෑ නම් දෙ රටෙහි පැවැති සම්බන්ධය බොහෝ කලක් නො නැසී පැවැති බව පිළිගත යුත්තෙකි. එසේ නම් දෙ රට භාෂාව පිළිබඳ සම්බන්ධය විජය කුමරුන් ගේ පැමිණීමෙන් පෙර ඇති වූවකි. සිංහලය ප්‍රාකෘතයක් වීමේ මගට වඩා දෙ රට භාෂාවේ සම්බන්ධය මේ අනුව ඇතිවිණැ යි කිම හේතු සාධකයෙන් පොෂිත ය. වැඩි අපහසුවක් නැතිව විජය පිරිසට ලංකාවේ පැවැති භාෂාව ව්‍යවහාර භාෂාව කර ගත හැකි වූයේ එහෙයිනි.

**භාෂාන්තර සම්බන්ධතා**

විජය කුමරුන් පැමිණෙන කල මෙහි විසූයේ යක්ෂයනැ යි පෞරාණිකයෝ කීහ. එහෙත් ඔවුහු වර්තමානිකයන් සලකන අන්දමේ 'යක්' පිරිසක් නො වූහ. ඔහු කෙ බන්දත් වුව ද, ඔවුනගේ බලය බිඳ විජය තෙමේ ලංකාධිපත්‍යයට පත් වූයේ ය. ඔහු පිරිස් වැස්සෝ තත්හි තත්හි ගම් පිහිටුවා පදිංචි වූහ. ඉක්බිති ලංකාව ක්‍රමයෙන් සමෘද්ධිමත් වූ යැ.

ඒ ආගන්තුක පිරිස තම ජාතිය හෝ භාෂාව මෙහි තහවුරු කර ලීමට නො සිතූහ. ලඞ්කාධිපත්‍යයට පත් වූව ද, එ වැන්නක් සඳහා ඔවුනට අවකාශ නොලැබීම ඊට හේතු විය හැකි. එ බැවින් ඔවුහු ලක්වැසියන් වශයෙන් ම පෙනී සිටියෝ ය. ලාට රටින් පැමිණි විජය පිරිස ගේ භාෂාව 'වඞ්ගය' වී නම් වර්තමාන සිංහල භාෂාව හා මිශ්‍ර වූ භාෂාන්තර යන් අතර ප්‍රථම ස්ථානය එයට හිමි වේ.

මීලඟට සිංහල භාෂාවට පාලි භාෂාවේ සම්බන්ධය ලැබිණ. දෙවනපිය තිස් රජු සමයෙහි බුද්ධ ධර්මය මේ රටට ගෙන ඒම හා අනතුරු ව පෙළ අටුවා සිංහලයෙන් ලිවීමත් කරණකොට සිංහල භාෂා තොමෝ පාලි භාෂා විෂයෙහි දූඩි සම්බන්ධයක් ලද්දී– පෝෂණය වන්නට පටන් ගතු. මාතෘ භාෂාවක් වශයෙන් පාලි භාෂාවට සිංහලයේ ගෞරවය හිමි වනුයේ මේ නිසා ය.

එක් අතකින් සංස්කෘත භාෂාව පාලියටත් පෙරාතු ව මැ සිංහලය හා සම්බන්ධය ලැබූවකි. රාවණ යුගයෙහි ලඞ්කාවේ මැනවින් වර්ධනය වැ තිබූ සංස්කෘත සාහිත්‍යය එයට අදාළ විය. එහෙත් වර්තමාන සිංහල භාෂාවේ නම් සංස්කෘත භාෂාව හා සම්බන්ධය පැනෙනුයේ අනුරාධපුර රාජධානියේ අවසාන කාලයේ සිට ය. එයට පෙර සැපයුණු ලේඛන වැසියක් පවතින්නේ පාලි භාෂාවට බර වීමෙන්.

යළි, සිංහලය හා පෙර පටන් ම ද්‍රවිඩ සාහිත්‍යයෙහි සම්බන්ධය පැනේ. එය ඇතිවූයේ දුටුගැමුණු කාලයට ද පෙර සිදු වූ ද්‍රවිඩයන් ගේ ලඞ්කාවතරණය හේතුකොට ගෙන යැ. කල් යත් ම ද්‍රවිඩ පඬිවරු සිංහල සාහිත්‍ය සේවයෙහි පවා නිරත වූහ. ද්‍රවිඩ ග්‍රන්ථයන් සිය බසට පෙරළා සාහිත්‍ය වංශය පෝෂණය කළ සිංහල පඬිවර කෙනෙක් ද මේ අතර වූහ. දෙ කරුණ ම සිංහල භාෂාවෙහි ද්‍රවිඩ වචනයන් ගේ සංක්‍රමණය ටත්, සම්මිශ්‍රණයටත් හෙතු විය. එ මතු ද, ද්‍රවිඩ භාෂාව සෙංකඩගල රාජ්‍යයේ පශ්චිම යුගයේ රාජකීය භාෂාව වශයෙනු දු ගෞරව ලද්දී ය.

මෙ තෙක් පෙරදිග සාහිත්‍ය සම්මිශ්‍රණය පමණක් ලත් සිංහල භාෂා තොමෝ සොළොස් වැනි ශතවර්ෂය ආරම්භයේදී යුරෝපිය භාෂාවන් ගේ සංකලනය ලැබුවා– ශතවර්ෂ තුනක් පමණ කල් පෘතුගීසි– ලන්දේසි භාෂාවන් හා ගැටුනි, අද ඉංග්‍රීසි භාෂාව හා මිශ්‍ර වෙමින් පවත්නී ය.

**සිංහල සාහිත්‍යය**

සාහිත්‍ය යනු සංස්කෘත භාෂාවෙහි නිපන් විවිධ අර්ථයන්හි බැස ගත් ශබ්දයකි. මේලනය හෙවත් එක්වීම යැ, පද්‍යාත්මක කාව්‍යයැ, කාව්‍යානුශාසනය හෙවත් අලඞ්කාර ශාස්ත්‍රයැ ආදි අරුත් දැක්වීමට මේ ශබ්දය යෙදුණු තැන් ඇත. තථාගතයන් වහන්සේ—

'අප්පම්පි චෙ සහිතං භාසමානො'

යි ත්‍රිපිටකය සහිත යී වදාළහ. සහිතය ම හෝ සහිතයාගේ බව සාහිත්‍යය යි කිය යුතු ය. මෙසේ ත්‍රිපිටකය ප්‍රමුඛ පෙළ බසින් ලියැවුණු ග්‍රන්ථ සමූහය පාලි සාහිත්‍යය නම් විය. එ හෙයින් ම ත්‍රි වේදය ප්‍රමුඛ සකු බසින් බැඳුණු ග්‍රන්ථ සමූහය සංස්කෘත සාහිත්‍යය නම් වෙයි. පාලි භාෂාවට තථාගතයන් ප්‍රභව වූවා සේ ම සංස්කෘත භාෂාවට මහර්ෂීහු ප්‍රභව වූහ. එහෙත් සිංහලයට එබඳු ආශ්‍රයක් නො දක්විය හැකි හෙයින් ලාංකේය මහා කවීන්ගේ ශිෂ්ට ප්‍රයොගයෝ ම සිංහල සාහිත්‍යයාගේ මූලය විය. ඒ ශිෂ්ට ප්‍රයොගයන් ආශ්‍රයෙන් ලියැවුණු විවිධ අංශයන්ට අයත් ගද්‍ය පද්‍යාත්මක වූ නිබන්ධ සමූහය සිංහල සාහිත්‍යය යි සලකනු ලැබේ. ඒ සාහිත්‍ය ශබ්ද ව්‍යවහාරය දුරාතීතයෙහි සිට ම ලක්දිව පඬිවරුන් අතර ව්‍යවහාරයට පැමිණියක. මෙකල අපට හමු වන සිංහල සාහිත්‍යයාගේ ආරම්භය වූකලි ලංකා ශිලා ලෙඛන සමයෙහි ආදිම අවස්ථාව වශයෙන් පැනෙන දෙවනපෑ තිස් මහීපාල යන් ගේ රාජ්‍ය සමය වන්නේ ය.

**සිංහල සාහිත්‍ය වංශය**

ඕ මෝ සිංහල සාහිත්‍ය වංශ කථා තොමෝ අවස්ථා භෙදයෙන් ලක්ෂිත වූවා– **පුරාතන, මධ්‍යතන, නූතන** යයි ත්‍රිවිධ වන්නී ය. එහි සිංහල සාහිත්‍ය වංශයාගේ ආරම්භය වූ අනුරාධපුර රාජධානි සමයෙහි පැවැති සාහිත්‍ය පරම්පරාව **පුරාතන අවස්ථා**යෙහි ද, පොළොන්නරු රාජධානි සමය පටන් සීතාවක හිම් කොට ඇති සමයෙහි සාහිත්‍ය පරම්පරාව **මධ්‍යතන අවස්ථා**යෙහි ද, යළි, වර්තමාන සාහිත්‍යොත්පත්තියට ආරම්භ වූ සෙංකඩගල පුර රාජධානි කාලය පටන් මෙ දවස හිම් කොට පවත්නා සාහිත්‍ය පරම්පරාව **නූතන අවස්ථා**යෙහි ද ලා ගිණිය යුත්තී ය. මෙසේ මේ අවස්ථා භෙදයෙන් ත්‍රිවිධ වූ සාහිත්‍ය වංශය තත්ත්ව භෙදයෙන් සප්ත තරඞ්ගයෙක්හි ලා විස්තර වන්නේ ය. එහි දු, ශිලාමේඝවර්ණ රාජ්‍යෝදය දක්වා පැවැති දුරාතීතය පිළිබඳ සාහිත්‍ය වංශය **ශිලා ලෙඛන තරඞ්ගයැ** යි ද, එ තැන් සිට මහා පරාක්‍රමබාහු රාජ්‍යෝදය දක්වා **ග්‍රන්ථ ලෙඛන තරඞ්ගයැ** යි ද, 'පුරාතන අවස්ථාව' ද්විවිධ වන්නී ය. 'මධ්‍යතන අවස්ථාව' ද, මහාපරාක්‍රමබාහු රාජ්‍යෝදයේ පටන් ශ්‍රී පරාක්‍රමබාහු අවසානය තෙක් **උත්කෘෂ්ට තරඞ්ගයැ** යි ද, එතැන් සිට සීතාවක රාජසිංහයන්ගේ රාජ්‍යාවසානය දක්වා **අවකෘෂ්ට තරඞ්ගයැ** යි ද, ද්විවිධ වන්නී ය. 'නූතන අවස්ථාව' වූකලි සෙංකඩගල පුර රාජ්‍යාරම්භය පටන් ශ්‍රී වීරපරාක්‍රම නරෙන්ද්‍රසිංහ රාජ්‍යෝදය දක්වා **භායන තරඞ්ගයැ** යි ද, එ තැන් සිට බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ පූර්වකාලය දක්වා **උද්ගම තරඞ්ගයැ** යි ද, එතැන් සිට අද දක්වා **වර්ධන තරඞ්ගයැ** යි ද, ත්‍රිවිධ වන්නී ය.

ඕ සාහිත්‍ය වංශ කථා නොමෝ සම්භාව්‍ය වූ ද, දීර්ඝ වූ ද, මතාන්තරයෙන් ගහණ වූ ද, ඉතිහාස කථාවක ද ගැබ් කොට පවත්නී ය. එ හෙයින් තත් වර්ණනය අත්‍යර්ථයෙන් දුෂ්කර වන්නේ ය. එතකුදු වුවත් සාහිත්‍ය ප්‍රේමයෙන් ඇලලී ගිය සිත මා මෙ ඉ මහත් දුෂ්කරයෙහි පවා මෙහෙයා මැ යි.

ලක්දිව සිංහල සාහිත්‍යය ඇතුලු ප්‍රාචීන භාෂා ශාස්ත්‍රයන්ගේ සංවර්ධනයට අත්‍යන්තෝපකාරී වූ පරම සම්භාව්‍ය ප්‍රාචීන **භාෂෝපකාර සමාගමේ** අනුදැනීම පරිදි සිංහල සාහිත්‍ය වංශයේ පුරාතන- මධ්‍යතන- අවස්ථායැ යි නම් කල පූර්ව කාණ්ඩ ත්‍රය තබා, තරඞ්ග ත්‍රයකින් යුත් නූතන අවස්ථාවට අයත් සිංහල සාහිත්‍ය වංශය මේ ග්‍රන්ථයෙහි ලා විස්තර කරනු ලැබේ.

එහි ලා මෙම ග්‍රන්ථවංශයාගේ ප්‍රාරම්භ කථාව ප්‍රකාශ කොට තත් තත් කාලීන වූ දේශීය- ශාසනික- ශාස්ත්‍රීය ප්‍රවෘත්ති ද යථා ස්ථානයෙහි දක්වමින්, අනුක්‍රමයෙන් ඒ ඒ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයන්ගේ කර්තෘ- කාලය- තත්ත්වය හා සාරය පිළිබඳ විස්තරය යථා ශක්තිත් වර්ණනා කරනු ලැබේ.

රචනා විෂයෙහි ආධුනික වූ මාගේ මෙම කෘතියෙහි අනවධාන ජනිත සඛලිතයෙක් වී නම්, එය සත්පුරුෂ විද්වද්වරේණ්‍යයන් ගේ කාපාපූර්ණ ප්‍රේක්ෂාවට පාත්‍රවේ වයි ආශංසනය ද කෙරෙමි.

සිංහල සාහිත්‍ය වංශය පිළිබඳ නූතන අවස්ථා නම් වූ අවසාන කාණ්ඩය ලඞ්කා ඉතිහාසය හා ගැලපීම සඳහා පළමු කොට මේ **ප්‍රාරම්භ කථා** සංදර්ශනය වන්නේ යි:

# සිංහල සාහිත්‍ය වංශය

## ප්‍රාරම්භ කථා

ජයවර්ධනපුර කෝට්ටේ රජ පැමිණි ශ්‍රී පරාක්‍රමබාහු (ක්‍රි: ව: 1415—1467) නරේන්ද්‍ර තෙමේ ප්‍රතාපවත් වීරවරයෙකි. සතුරු උවදුරු මැඩ සිරිලක එක්සත් කොට ගත් ඒ මිහිපල් තෙමේ සම්බුද්ධ ශාසනයත්, සිංහල ජාතියත් නඟා සිටුවීම සඳහා දූසි සේ ක්‍රියාරම්භ කෙළේ ය. උදාරතර චරිතශ්‍රියෙන් හෙබ වූ දෙ පනස් වසක් පමණැති ඒ රජුගේ රාජ්‍ය කාලය ලඞ්කා ඉතිහාසයේ උත්කර්ෂවත් යුගයෙක් විය. පර සතුරු පීඩනයක් හෝ අභ්‍යන්තර වියවුලක් නොමැති වැ රට ඉතා සන්සුන් ව පැවැති හෙයින් ආගමික ජාතික සහ සාහිත්‍යාත්මක වූ අභිවෘද්ධිය මැනවින් සිදු වූයේ ය. රට ඉසුරු බරින් පිරුණු මේ රාජ්‍ය කාලය වූකලී සිංහල ඉතිහාසයේ අවසාන දීප්තිමත් යුගය යි.

**කෝට්ටේ සමයෙහි ලංකාව**

එකල ලංකාවේ අගනුවර ජයවර්ධනපුර කෝට්ටේ විය. එය උපරාජ්‍ය කිහිපයකින් යුක්ත වූවකි. ඒ උපරාජ්‍යයෝ මාණ්ඩලිකවරුන් යටතෙහි පාලනය වූහ. බොහෝ විට මේ මාණ්ඩලිකවරු රජ පෙළපතකින් පැවැතෙන කුමාරවරු ම වූහ. ඔවුහු අවුරුදු පතා මහ වාසල වෙත අය බදු පැමිණවීම ද සිරිතක් කොට පැවැත් වූහ. යම් විටක මහා රාජ්‍යය දුර්වල කුමරකුට හිමි විණි නම් ඒ අවකාශයෙහි මේ ප්‍රාදේශික රජයෝ බෙහෙවින් මහ රජ කම සඳහා යුද වැදුණාහ. රට ඇතුලේ කැලඹීම් ඇතිවීමටත්, එ හෙයින් ම ඇතැම් විටක විදේශික බලයට යටත් වීමෙන් සිංහල ආණ්ඩුව දුර්වල වීමටත්, එම කාරණය ප්‍රධාන හේතුවක් විය. රටේ පැවැති මේ පාලන ක්‍රමය අනුව ශ්‍රී පරාක්‍රමබාහු මහීපාලයන්ගේ අභිෂේක සමයෙහි ලංකාව ප්‍රධාන රාජ්‍ය දෙකකට* හා ප්‍රාදේශික රාජ්‍ය කිහිපයකට ද බෙදී තිබුණේය. ඒ ප්‍රාදේශික රාජ්‍යයන් මහ වාසලට යටත් වැ පැවැති නමුත්, උතුරේ රාජ්‍යය සම්පූර්ණ ස්වාධීන රාජ්‍යයක් ව පැවැත්තේ ය. එහි ආර්යචක්‍රවර්ති නම් දෙමළ රජෙක් යාපා පටුන අග නුවර කොට රාජ්‍යය කෙළේ ය. පරාක්‍රමබාහු මනුජේන්ද්‍ර තෙමේ සපුමල් කුමරු යවා ආර්යචක්‍රවර්තීන් දිනා- එහි ආධිපත්‍යය එ කුමරුනට පවරා යාපා පටුන කෝට්ටේ උපරාජ්‍යයක් කොට ගත්තේ ය. වන්නිනායකයන්† සතු ව පැවැති ඒ ඒ ප්‍රදේශයන් ද, එ සේ ම සිය අණසකෙහි පිහිටුවා රුහුණු- මායා- පිහිටි යන ත්‍රි සිංහලය ම කෝට්ටේ සත්සෙවනට අයත් එක ම රාජ්‍යයක් බවට පත් කෙළේ ය.

**ධර්ම ශාසනෝන්නතිය**

රට එක්සත් කිරීමෙන් පසු ඒ නරවීරයන් විසින් මෙරට ශාසනාභිවර්ධනයත්, ශාසනෝන්නතියත්, අරභයා කරවූ ක්‍රියා පද්ධතිය ලක්වැසියන්ට කිසි කලෙකත් අමතක නො වන්නේය.

---

* රාජාවලිය (65 පිට)

† ද්‍රවිඩයනට පසුව ලංකාවතරණය කොට උතුරුකරයේ වාසයට පත් වන්නියාර් වරු නම් ඉන්දියානු පිරිසක් විය. එළාර සංහාරයේදී ගැමුණු රජු ගෙන් පහර ලත් ද්‍රවිඩ නායකයන් අතර මේ වන්නියාර්වරු ද වූහ. පරාජයට පත් ඔහු තුමූ උතුරේ වනගත පෙදෙස්හි විසුම් ගත්හ. එ තැන් සිට ඒ බිම 'වන්නි' යයි පළට විය. කල් යෑමෙන් ජන ගහනයෙන් අධික වූ ඔවුහු අධිපති යන් පත්කොට ගෙන තමන් පාලනය කර ගැනීමට පටන් ගත්හ. එහෙත් උතුරේ ද්‍රවිඩ රජු ඔවුන් අබිබවා කප්පන් ගෙන්වා ගත්තේ ය, සිංහල රාජ්‍යය දුර්වල කුමාරවරුන් අතට පත්වූ විට මේ වන්නියාරයන් ඔවුනට විරුද්ධ වැ නැඟී සිටි බව ද පෙනේ. ශ්‍රී පරාක්‍රමබාහු නරේන්ද්‍රයන්ගේ අභිෂේක සමයෙහි අට ළොස් වන්නියක් පැවැති බව ග්‍රන්ථාගතය. සිරිලක එක්සත් කිරීමේදී ඒ රජු එකී වන්නි ජය ගත් හැටි ගිරාසන්දෙශ- රාජරත්නාකරාදියෙන් දක්ක හැකි. කෝට්ටේ රාජධානිය ප්‍රතාපවත් භාවයෙන් ගිලිහෙත් ම, නැවත ත් වන්නි නායකයෝ ස්වාධීනත්වය පවත්වා ගත්හ. එ නමුත් නො බෝ කලකින් ම රාජසිංහ රජු විසින් ඒ වන්නි යළි ද සීතාවක රාජ්‍යයේ යටත් ප්‍රදේශයන් බවට පමුණුවන ලද්දේ ය. ඔහුට අනතුරු ව පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් ද වරින් වර යටත් කර ගනු ලැබූ එකී වන්නි ප්‍රදේශයන් අවසානයේදී සිංහල රාජ්‍යයත් සමග ඉංග්‍රීසීන්ට අයත් වූහ. අදත් එ පෙදෙස් 'වන්නි' නමින් ම ව්‍යවහාර කරනු ලැබේ.

ප්‍රසිද්ධ ශාස්ත්‍ර ශාලා ඇති කිරීමෙන් හා දියුණු කිරීමෙන් විද්‍යා ලතාව මල් ගැන්වූ ඒ භූපති තෙමේ ව්‍යක්ත පඬිවරයන් ලවා ග්‍රන්ථ නිපදවා, ලේඛකයන්ට වැටුප් පිණිස ගම්-කෙත් නින්ද කොට දී, එකී ග්‍රන්ථ දිනපතා ලියන ලෙස ආඥා ද කර ඊ. මෙසේ ඒ නරවීර තෙමේ ග්‍රන්ථ සුලභ කොට පුස්තකාලයන් ද පිහිටුවා රට පුරා ශාස්ත්‍රාලෝකය පැතිර වූයේ ය. විහාරස්ථ පිරිවෙන්, එ කල ප්‍රසිද්ධ ශාස්ත්‍ර ශාලා වූහ. සිංහල- පාලි- සංස්කෘත හා ද්‍රවිඩ යන භාෂාත්, තර්ක- ව්‍යාකරණ- ඡන්දෝ-ලඞ්කාර- පුරාණේතිහාස- වෛද්‍ය- නක්ෂත්‍ර- ගණිත- මිණිත- අර්ථවිද්‍යාදී ශාස්ත්‍රත් යන අධ්‍යාපාධ්‍යයන් ගෙන් එකල මෙ රට අධ්‍යාපනය හැඩ ගැසී තිබුණේ ය. දඹදිව සිට පැමිණි නොයෙක් ශාස්ත්‍රසෙවීහු ද ඒ විද්‍යාස්ථානයන්හි අධ්‍යයන අධ්‍යාපනයෙහි නිරතව සිටියහ. කෝට්ටේ එරබත්තොට ධර්මරාජ, වීදගම ශ්‍රී ඝනානන්ද, කෑරගල පද්මවති, පැපිලියානේ සුනේත්‍රාදේවී, සහ තොටගමුවේ විජයබාහු ආදි පරිවෙණස්ථාන එ කල ලඞ්කාවේ පැවැති අතිප්‍රසිද්ධ මහා ශාස්ත්‍ර ශාලා වූහ.

සිංහල රාජධානිය කෝට්ටේ වීම නිසා මුහුදු බඩ පෙදෙස්හි ශාස්ත්‍රාලෝකය වෙසෙසින් බැබලී ගියේ ය. යථෝක්ත විද්‍යාස්ථාන ප්‍රමුඛ බොහෝ පිරිවෙන්-විහාරාරාමයන්හි දහස් ගණන් ගිහි පැවිදි ශිෂ්‍යයෝ අධ්‍යයනය කළහ. එ සේ ම සහශ්‍ර සංඛ්‍යාත නානා විෂයීය ග්‍රන්ථ එම විද්‍යාස්ථානයන්හි ද, ප්‍රසිද්ධ පුස්තකාලයන්හි ද, තැන්පත් ව තිබුණේ ය. මෙසේ භික්ෂූන් වහන්සේ ගේ අනුශාසනයත්, රජතුමා ගේ උද්‍යෝගයත්, සහයෝග වීමෙන් මෙකී ශාස්ත්‍රීය කටයුතු සියල්ල සමෘද්ධ වැ සිංහල සාහිත්‍යය පිළිබඳ ශ්‍රේෂ්ඨතම ස්වර්ණ යුගයක නවෝදය ඇතිවූයේ ය.

**කෝට්ටේ පරිහානියට හේතු**

ශ්‍රී පරාක්‍රමබාහු නරනාථයන් ගේ ඇවෑමෙන් කෝට්ටේ සිංහාසනය උදෙසා පැන නැගුණු අර්බුදයන් කාරණකොට ගෙන නැවතත් ලඞ්කාව භේද වන්නට පටන් ගත. උතුරේ පැවැති ද්‍රවිඩ බලය වැනසී එහි ආධිපත්‍යය සපුමල් කුමරු වෙත පැවරී තිබුණේ වී නමුත්, එ කුමරු කෝට්ටේ සිංහාසනය සඳහා යුහුසුලු වී යාපනය හැර දැමූයෙන්, එ පෙදෙස යළිත් ද්‍රවිඩයන් සතු විය. ශ්‍රී පරාක්‍රම බාහු රජුගෙන් පසු අභිෂේක ලත් තරුණ ජයබා (ක්‍රි: ව: 1467-1469) කුමරුන් මරවා සපුමල් කුමරු කෝට්ටේ භුවනෙකබා vi (ක්‍රි: ව: 1469-1476) නමින් රජවීම නිසා රට ඇතුලේ නොයෙක් වියවුල් පැන නඟින්නට වන. ඔහුගෙන් පසු කෝට්ටේ සිංහාසනය දුර්වල රජුන් වෙත ම පැමිණියෙන් ප්‍රාදේශික නායකයෝ ද ලත් අවකාශ ඇත්තාහු- ස්වෛරීව ක්‍රියා කරන්නට පටන් ගත්තු. මේ අවස්ථාවෙහි රටේ සාමය වැනසී, භේදය උත්සන්න වී ගියෙන්, කර්මාන්ත දියුණුව- ආර්ථික තත්ත්වය සමග ම කෘෂි කර්මය ද, පිරිහෙන්නට වන.

මෙ තෙක් කල් ස්වයං පෝෂිතව පැවැති ලඞ්කාවට සහල් පවා විදෙශයෙන් ගෙන්වා ගැනීමට සිදුවූයේ, එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මේ කාලය වනවිට යෝනක ජාතිහු ඉන්දියා සාගරයේ වාණිජාධිපත්‍යයට පැමිණියෝ, ආසියාවත්– යුරෝපයත් අතර වෙළඳාමෙහි යෙදී සිටියාහු ය. ලඞ්කාවේ විදෙශීය වෙළඳාම ද ඔවුන් අත පැවැති හෙයින් මෙ රටට වුවමනා සහල් ආදී ද්‍රව්‍යයන් විදෙශයෙන් ගෙන ඒම ද ඔවුන් විසින් ම කරන ලදි. මේ හේතුකොට ගෙන ලඞ්කාවේ මුහුදුබඩ නගරයන්හි සම්පූර්ණ වෙළඳාම යෝනකයන් වෙත ම පැවතුණෙන්, මෙහි ඔවුන්ගේ වෙළඳ දියුණුව අතිමහත් වූවක් විය.

පසළොස් වැනි ශතවර්ෂය ආරම්භයේදී පෙරදිගට පැමිණි පෘතුගීසීන් තුළ වෙළඳාම දියුණුකර ගැනීම විනා රටවල් අත්කර ගැනීමේ බලාපොරොත්තුවක් ආරම්භයේදී නො පැවතිණ. එ නමුත් කල්යෑමේදී ඔවුහු අධිපති බවට පැමිණ තමන් හා සම්බන්ධ ව පැවැති බොහෝ ප්‍රදේශයන්හි පාලන ප්‍රභූත්වය සියතට ගැනීමෙහි යුහුසුලු වූහ. මෙසේ පෙරදිග පෘතුගීසි බලය ක්‍රමයෙන් වැඩිවත් ම, කලක් ආසියාවත් යුරෝපයත් අතර වෙළඳාමෙහි යෙදී සිටි මුස්ලිම් වරුන්ගේ ඒකී වෙළඳ බලය නැතිවන්නට පටන් ගත. නැවත, පෙරදිග මුළු වෙළඳ බලය සියතට ගැනීමෙහි සමත් වූ ඒ ප්‍රතිකාල්වරු තමන් ගේ මුල් අදහස වෙනස් කොට රටවල් අයිතිකර ගැනීමෙහි ව්‍යාවෘත වූහ. අයිති කර ගත් ප්‍රදේශයන්හි ක්‍රිස්තු සමය පැතිර වීම ත් ඔවුහු ප්‍රමුඛ කටයුත්තක් කොට ගත්හ. සමුද්‍ර මාර්ගයක ලඞ්කාව පිහිටා තිබීමත්, කුළු බඩු වර්ග බෙහෙවින් ලබාගත හැකි වීම හා ස්වකීය ආගම පැතිර වීමට තිබූ අවකාශයත් නිසා පෘතුගීසීහු පළමු ගමනින්* පසු මෙ රට හිමි කර ගැනීමෙහි පෙළඹුණහ. නො බෝ කලකින් මුහුදු බඩ පෙදෙස්හි අධිපති බවට පැමිණි පෘතුගීසීන් නිසා යෝනක බලය ලඞ්කාවෙන් ඈත් වන්නට පටන් ගති. එහෙත් පෘතුගීසීන්ගේ ආධිපත්‍යයෙන් මෙ රටට සිදු වූයේ නො මද හානියෙක් මැයි.

එකල මෙරට පැවැති තත්ත්වය මැනවින් අවබොධ කළ පෘතුගීසීහු සිය අදහස් සම්පූර්ණකර ගැනීමේ මාර්ගය දත්හ. එ හෙයින් ම ඔවුහු සිංහල රජුන් සමග ගිවිසුම් ඇතිකර ගැනීමෙහි සහ මෙරට බලකොටු බැඳ ගැනීමෙහි ද යුහුසුලු වූහ. මේ වනවිට දුර්වල රජුන් කෝට්ටේ සිංහාසනයෙහි සිටීම, ඔවුනට ස්වකීය මනොරථයන් මුදුන් පමුණුවා ගැනීමට අනුබලයෙක් විය. මින් පසු මුහුදුබඩ ප්‍රදෙශ ඔවුන් ගේ දරුණු පහරට ලක් වූයේ ය. ඒ වනාහී කෝට්ටේ රාජධානිය ශීඝ්‍රතම පරිහානියකට තුඩු දෙමින් පැවැති අවස්ථාව යි.

---

* ක්‍රි: ව: 1505 නොවැම්බර් මස 15 දා පෘතුගීසිහු ප්‍රථම වරට ලංකාවතරණය කළහ. නැව් සතරකින් සමන්විත එම පිරිසේ නායකයා වූයේ දොන්. ලෝරන්සෝ ද අල්මේදා නැව්පති තෙමේ ය.

**කෝට්ටේ පරිහානිය සහ සීතාවක ආරම්භය**

මේ සමයෙහි සීතාවක උපරජව විසූ මායාදුන්නේ* කුමාර තෙමේ සිංහලයන් ගේ ස්වාධීනත්වය පවත්වා ගැනීම සඳහා කෝට්ටේ රාජධානිය කෙරෙහි විශ්වාසය තැබිය නො හැකි බව දැන මිතු ඇති වන පෘතුගීසි ආදි විදේශික සතුරන් ගෙන් සිංහල රාජ්‍යය ආරක්ෂා කරගනු කැමැත්තේ, සීතාවක රාජධානිය ගොඩ නැංවී ය. රාජ්‍යතන්ත්‍රයෙහි ප්‍රවීන බුද්ධියක් ඇති මායාදුන්නේ කුමාර තෙමේ නො බෝ දිනකින් ම සීතාවක නගරය කෝට්ටේ රාජධානියට නො දෙවෙනි මහත් බල පරාක්‍රමයෙන් යුක්ත කොට සේනා සංවිධානයෙන් සමන්විත වැ විසී ය. මේ අතර කෝට්ටේ රාජ්‍යය ධම්පාල† කුමරුට හිමිකර දීම සඳහා බුවනෙකබා රජු උපාය යොදන බවක් එතුමන්ට සැලව ගියේ ය. මෙයින් ප්‍රකෝපයට පත් මායාදුන්නේ රයිගම් බණ්ඩාර ද කැටුව කෝට්ටේ රාජ්‍යය උදුරා ගැනීමේ අදහසින් එම පෙදෙසෙහි කිහිප වරක් ම කැරලි ඉපද වී ය. එ හෙත් පෘතුගීසීන් ගේ ඉමහත් උපකාරය කෝට්ටේ රජුට ලැබීමත් කන්ද උඩ රට අධිපතියන්ගෙන් සීතාවකට වරින් වර හිරිහැර පැමිණීමත්, නිසා මායාදුන්නේට කෝට්ටේ රාජ්‍යය පිළිබඳ අභිලාෂය මුදුන් පමුණුවා ගත නො හැකි විය. මෙසේ රට වියවුල්ව පවතිද්දී බලාපොරොත්තු රහිත ලෙස බුවනෙකබා vii රජුගේ අවසානය සිදුවූයෙන්, පූර්වෝක්ත ධම්පාල කුමාර තෙමේ දොන්. ජුවන් පෙරියබණ්ඩාර නමින් බව්තීස්ම ලැබ පළමුවැනි

* බුවනෙකබාහු vi රජුගේ සොහොයුරකු වූ වීරපරාක්‍රමබාහු (ක්‍රි: ව: 1486—1508) රජුහට බිසෝවරු දෙදෙනෙකි. ඉන් පළමු බිසවට ධම් පරාක්‍රම බාහුය, රාජසිංහය, විජයබාහුය, මහරයිගම්බණ්ඩාර යැ යි පුත්‍රයෝ සතර දෙනෙක් වූහ. දෙවැනි බිසවට සකලකලාවල්ලභ, තනියවල්ලභ, යන පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. මේ කුමාරවරුන් අතර ධම් පරාක්‍රමබාහු තෙමේ පිය රජුගේ ඇවෑමෙන් කෝට්ටේ රජ විය, මහරයිගම් බණ්ඩාර රයිගම ද, සකලකලාවල්ලභ උඩුගම්පොළ ද, තනියවල්ලභ මාදම්පේ ද, විසූහ. රාජසිංහ විජයබාහු යන දෙ කුමරුවෝ එක ම බිසවක පාවා ගෙන මැණික්කඩවර විසූහ. ඔවුන් දෙදෙනට බුවනෙකබා, මායාදුන්නේ සහ රයිගම්බණ්ඩාර යන පුත්තු තිදෙනෙක් උපන්හ. ධම් පරාක්‍රමබාහුගේ ඇවෑමෙන් කෝට්ටේ සිංහාසනය ඔහුගේ සහෝදර විජයබාහු vii (ක්‍රි: ව: 1530—34) කුමරුට හිමි විය, ඒ තෙමේ තමාගේ ඇවෑමෙන් සිය දෙවෙනි බිසවගේ අයැදීම පරිදි ඇගේ සොහොයුරකු වූ දෙවරාජ කුමරුට රාජ්‍යය හිමි කරවීමට සූදානම් විය. මෙ බව දත් රාජ්‍යයේ නියම හිමියන් වන තුන්බෑ කුමරුවෝ පිය රජු මැර වූහ. විජයබා කොල්ලය නමින් ප්‍රකට වූ මේ දරුණු විප්ලවයේ අවසානයෙහි වැඩි මහලු කුමාරතෙමේ බුවනෙකබා vii (ක්‍රි: ව: 1534—51) නමින් රාජ්‍යයට පත් කරන ලද්දේ ය. ඉක්බිති මායාදුන්නේ, රයිගම්බණ්ඩාර දෙ කුමරුවෝ සීතාවකට හා රයිගමට පැමිණ උපරජවරු වශයෙන් එ පෙදෙස් ආණ්ඩු කළහ.

† බුවනෙකබා vii රජුගේ එක ම දියණියන් වූ සමුද්‍රා දේවී කුමරිය වීදියේබණ්ඩාර කුමරුට පාවා දෙන ලදී. ඔවුන් දෙදෙනාට උපන් කුමාර තෙමේ ධම්පාල නම් විය. තමන්ගේ ඇවෑමෙන් මේ මුණුබුරාට රාජ්‍යය හිමි කර දෙනු කැමැති බුවනෙකබා රජු ඒ කුමරුන්ගේ පිළිරුවක් තනවා සල්ලප්පු ආරච්චි නම් තානාපතියකු අත පෘතුගාලයේ දොන් ජෝන් රජු වෙත යවා ඒ රූපයට ඔටුණු පැළඳ වූය. රාජ්‍යය ලැබීමෙන් පසු මායාදුන්නේ ආදීන්ගෙන් ඇතිවිය හැකි උපද්‍රව වළක්වා ධම්පාල කුමරු පෘතුගීසීන් ලවා ආරක්ෂා කරවීම රජු මෙයින් බලාපොරොත්තු වූ ඵලය යි.

සිංහල ක්‍රෛස්තව රජු වශයෙන් ක්‍රි: ව: 1551 දී කෝට්ටේ රාජ්‍යයෙහි අභිෂේක* ලැබී. මින්පසු මුහුදුබඩ ප්‍රදේශයන්හි සම්පූර්ණ පාලන බලය පෘතුගීසීන් අතට පත් වූයෙන්, සිංහල රාජ්‍යබලයෙන් තොර වූ කෝට්ටේ නගරය අන්තිමේදී නාම මාත්‍ර රාජධානියක් බවට පත් වූයේ ය.

ධර්මපාල කුමරුට කෝට්ටේ සිංහාසනය හිමි වීම, පෘතුගීසීන්ගේ අදහස් මුදුන් පමුණුවා ගැනීමට අතිශයින් උපකාරී විය. මායාදුන්නේ ආදීන් ගේ විරුද්ධ කම් නො පැවැතියේ නම් මුළු ලංකාව අත්පත් කර ගැනීමේ අවකාශය ඔවුනට ලැබෙන්නට තිබුණි. ධර්මපාල රජුට සතුරන්ගෙන් ආරක්‍ෂාව සලස්වා තම අදහස් ඉටුකර ගැනීම සඳහා පෘතුගීසීන් වෙත පැවැති බලාපොරොත්තුවට මායාදුන්නේ රජුගේ පුත්‍ර ටිකිරි බණ්ඩාර කුමරුන්ගෙන් මහත් සේ පහර වැදිණ. සවකීය පියාණන්ගේ ඇවෑමෙන් සීතාවක රාජසිංහ නමින් අභිෂේක ලැබූ නො බෝ කලකින් මෙ කුමරු කෝට්ටේ රාජ්‍යයට අයිති බොහෝ ප්‍රදේශ අත්පත් කර ගත් හෙයින් ජීවිතාරක්‍ෂාව කැමැති ධර්මපාල තෙමේ කෝට්ටේ රාජධානිය හැර දමා කොළඹ පෘතුගීසි කොටුවට පැමිණ විසී ය. අනාගතයෙහි සිංහලයට සිදු වන මහත් විපත ගැන කිසිසේත් නො සලකා, හුදෙක් පලිගැනීමේ චේතනාවෙන් මඩනා ලද ඒ බාන සුළු ධර්මපාල තෙමේ කෝට්ටේ රාජ්‍යය පිළිබඳ සවකීය සම්පූර්ණ අයිතිවාසිකම ත්‍යාගපත්‍රයක්† කින් පෘතුගාලයේ රජුට පාවා දුන්නේ ය.

---

* ධර්මපාල රජු ගැන කිසි ම පුවතක් මහාවංශයෙහි සඳහන් නො වේ. බුවනෙකබා vii රජුගෙන් පසු එහි සඳහන් වන්නේ මායාදුන්නේ රජු හැටියටත්, සීතාවක රාජධානිය හැටියටත් ය. ධර්මපාල ක්‍රෛස්තවයකු වී පෘතුගීසින් ගැතිව සිටීම නිසා ඔහු සිංහලයේ රජකු හැටියට හෝ ඔහු විසූ කෝට්ටේ නගරය සිංහල රාජධානිය හැටියට නො සැලකූ බව මෙයින් පෙනේ. දළදාවහන්සේ යමකු වෙත ද, සිංහලයේ රජ තෙමේ සි. දළදාවහන්සේ පිහිටියේ යම් නුවරක ද සිංහලයේ රාජධානිය එය යැ, යන සම්මතය පෙර සිට ම පැවැත එන බවක් මෙයින් පැහැදිලි නොවේ ද?

† ධර්මපාල රජු සවකීය අයිතිවාසිකම පෘතුගීසි රජුට පවරා දෙනු ලැබූ ත්‍යාග ඔප්පුවේ සිංහලානුවාදයෙන් කොටසක් මෙසේ යි.

“................... දැනට ප්‍රතිකාලයේ සිංහාසනාරූඪ වූ· දොම් හෙන්රික් මහ රජාණන්ට සහ ඔහුගෙන් පසු සිංහාසනය ලබන රාජපරම්පරාවලට ද මගේ ම තනි නිදහස් කැමැත්තෙන් හොඳ හිතින් මට අයත් සියලු ම රාජධානි සම්පූර්ණයෙන් ම තෑගි කොට දීමට මම අධිෂ්ඨාන කරගනිමි. එ බැවින් මම ඒ රාජධානි එකී ප්‍රතිකාල් රජ දරුවන්ට මෙයින් ත්‍යාග කොට නියම වූ සියලු අයිතිවාසිකම් එකී දෙමි. හෙන්රික් මහ රජු සහ ඒ රජු ඇවෑමෙන් සිංහාසනයට හිමිවන සියලු රජ දරුවන්ට ද මගේ මරණින් පසු ලැබෙන සේ පවරා දෙමි. තවද එකී මා අයත් රාජධානි මා විසින් මෙතෙක් කල් භුක්ති වින්දක් මෙන් ද මාගේ මුත්තනු වූ ද, සවර්ගගාමී වූ ද, භුවනෙකබාහු මහ රජාණන්ගේ ඇවෑමෙන් මට අයිති වූවාක් මෙන් ද, එකී පෘතුගීසි රජදරුවන්ට නියත ලෙස ම පැවරෙන්නාහ. ඒ රජදරුවන්ට හැකි නම් ඊටත් වඩා හොඳින් මේ රාජධානි අයත්කර ගෙන ඔවුන්ගේ ම දෙයක් මෙන් මනාපයක් කරගැනීමට හැකි ලෙස ද, දැනට නීති විරෝධි ලෙස එකී රාජධානි අල්ලාගෙන සිටින ඒ සතුරන්ගේ බලය, එකී රාජධානි මේ තෑගි ඔප්පුවෙන් නැතිකොට, මේ දිවසට පෙර සිටිය රජදරුවන් අභිභවා කෝට්ටේ රජුන් විසින් එකී රාජධානිවල සවකීය බලය පතුරුවා සිටියාක් මෙන් එකී ප්‍රතිකාල් රජදරුවන්ට ද නීත්‍යානුකූලව සතුරන් සමග යුද කොට ඒ රාජධානි අයිතිකර ගත හැකිවන ලෙස ද පවරා අයිති කොට දෙමි................” දොන්. ජුවන්. පෙරියබණ්ඩාර.

මෙසේ ධර්මපාල රජු සවකීය අයිතිවාසිකම් පෘතුගීසීන්ට ත්‍යාග ඔප්පුවක් පිට පැවරූ හෙයින් ඔහුගෙන් පසු ජයවර්ධනපුර කෝට්ටෙන් සිංහල රාජධානිය සම්පූර්ණයෙන් ම අතුරු දහන් වූයේ ය.

**සීතාවක අවනතිය**

ක්‍රමයෙන් සමෘද්ධ වෙමින් පැවැති සීතාවක මේ සිදුවීමෙන් පසු ලඞ්කාවේ නියම රාජධානිය බවට පත් විය. ප්‍රතාපවත් රණශූරයකු වූ මායාදුන්නේගේ පුත්‍ර ටිකිරි බණ්ඩාර රාජසිංහ යන්ගෙන් පසු එහි බලය පිරිහී ගියේ ය. මෙසේ ක්‍රි: ව: 1530 දී මායාදුන්නේ රජු ඉදි කළ අභිනව රාජධානිය ක්‍රි: ව: 1592 න් පසු අභාවයට ගියෙන්, සීතාවක ලක්දිව රාජධානිය වැ පැවැත්තේ දෙසැට වසක් පමණි.

**ධර්ම ශාසන පරිහානිය**

මේ අවස්ථාව වන විට මුහුදුබඩ ප්‍රදේශයන්හි පෘතුගීසි බලය අති මාත්‍ර වැ පැවැති හෙයින්, ඔවුන් සවකීය සෛවරී පාලනයේ ශක්තිය යොදා ක්‍රිස්තු සමය පතුරුවා

---

ක්‍රි: ව: 1580 ක්වූ මෙම වර්ෂයෙහි අගෝස්තු මස 12 ද ලංකාද්වීපයේ කොළඹ නම් නගරවරයෙහි.

"………… ඉහත කී නරදෙවයන් වහන්සේගේ අන පරිදි මා විසින් ලියා පිළියෙල කරන ලද මේ තෑගි ඔප්පුවට මහරජ තුමාණන් වහන්සේ පහත සදහන් සාක්ෂි කාරයන් ඉදිරිපිටදී සවකීය රාජමුද්‍රා අත්සන තැබූ බව ඉහත නම් සදහන් නොතාරිස් තැන වූ මම මෙයින් සහතික කරමි.

මහරජාණන් වහන්සේගේ ඔප්පු තිරප්පු පිළිබද
ප්‍රසිද්ධ නොතාරිස් ධුරය දරන—
ඇන්ටෝනියෝ රිබෙයිරෝ·

මීට සාක්ෂි:

1. දැනට ඉහත කී නගරයෙහි සන්ත ඇන්තෝනි පූජකාලයේ කන්‍යාරාම යෙහි භාරකාර තැන වූ ප්‍රේ. සෙබස්ටියන් ඩ්වාවුස් පියතුමා.
2. එහි ම විකාර් තැන වූ මැනුවෙල් ලුයිස් පියතුමා.
3. මේ දිවයිනේ මහෙස්ත්‍රාත් තැන වූ—ඇස්ටෝනි පියේරා විඩෙෝවර්.
4. පේරෝ ජෝර්ජ් ජරන්කෝ විනිශ්චයකාර තුමා.
5. කොළඹ පදිංචි අන්තෝනියෝ ලොරන්සෝ.
6. ඉහත කී මහරජතුමන්ගේ මහ ගබඩා නිලමේ සහ දිසාපති තැන් පත් දොම්. ස්ටීවන් මුදලි.
7. රජ වාසල නිලමක්කාර දොම්. ඇම්ටම් මුදලි.
8. ඇන්ඩෘ බේජම් මුදලි.
9. ' දොම්. ප්‍රන්සිස්කෝ ඇන්රිකාස් මුදලි.

මෙකී සාක්ෂිකාරයන් ඉදිරියේ සහ ඉහත කී මහරජතුමාණන් වහන්සේ ඉදිරියේද මේ ඔප්පුව කියවා තෝරා දුන් මහරජතුමාණන් වහන්සේගේ භාෂාපරිවර්තක මුදලි තැන් පත්

1. දොම්. ප්‍රනාන්දෝ මුදලි.
2. රජතුමාගේ ලේකම් තැන සහ විනිශ්චයකාර තැන වූ ලොරන්සෝ ප්‍රනාන්දස්.

අපේ මහරාජෝත්තමයාණන් වහන්සේගේ නාමයෙන් එකී පරිත්‍යාගය පිළිගෙන වදාළ අප මහරජතුමාණන්ගේ වාසල තිලකාරිතැනවූ—
කපිතන් මැනුවෙල් ද සෞසා"

හැරීමේ දරුණු ක්‍රියා මාර්ගය* ආරම්භ කර තිබුණි. එ හෙයින් තත් ප්‍රදේශවාසී භික්ෂු කෙනකුට මතු නො ව, බෞද්ධ ගිහියකුට පවා සිටිය හැකි අවස්ථාවක් එළඹියේ ය. දුර්භාග්‍ය සමය උදාවත් ම මුහුදුබඩ පෙදෙස් වැසි බොහෝ භික්ෂූහු ද, ආත්ම ගෞරවය සැලකූ බොහෝ බෞද්ධයෝ ද කන්ද උඩ රටට පලා ගියහ. යාගත නොහැකි බොහෝ භික්ෂූන් සිවුරු හරින අතර, බොහෝ බෞද්ධයෝ ක්‍රිස්තු සමය වැළඳ ගත්හ. මෙතෙක් කල් තමනට 'උරුම' ව පැවැති බුද්ධ ශාසන සංරක්ෂණයත්, සාහිත්‍ය පෝෂණයත්– කිරීමට අවකාශ නො ලබන භික්ෂූහු සිය දිවි පෙවෙත පමණක් රකිනු කැමැත්තෝ– ආරක්ෂා ස්ථානයන්හි සැඟවී ගත්හ. මුහුදුබඩ පෙදෙස් මෙසේ භික්ෂූන්ගෙන් සිස් වන්නට පටන් ගත් කල්හි, ආගමත් ශාස්ත්‍රයත් පිරිහෙන්නට වන. එතෙක් කල් සුරක්ෂිත ව පැවැති ග්‍රන්ථ ආරක්ෂා රහිත බවට පත් විය. බොහෝ විහාර–විද්‍යාස්ථාන හා පුස්තකාගාරයෝ පාළු වූවාහු සිව්පා සතුන්ගේ කෙළි මඬුළු බවට පත් වූහ. ඒවා රැක බලා ගනිමින් සිටි ඒ ආරක්ෂක පිරිස ප්‍රාණාරක්ෂාව සඳහා ගමන් ගත් හෙයින්, සහශ්‍ර සංඛ්‍යාත වූ එම ග්‍රන්ථ සමූහය ඒ ඒ තැන් වල ම අසරණව තිබෙන්නට වන. අනේ! මෙතෙක් තෙල් සඳුන් දුම් හා කුසුමොපහාර ලත් අපේ මහාර්ඝ ග්‍රන්ථ සමූහය! මුල් කාලයේදී කන්ද උඩ රට සුරක්ෂිත ව පැවැති යම් යම් ග්‍රන්ථ කෙනෙක් වූහු නම්– ඔහුත්, යම් විධියකින් යම් යම් ග්‍රන්ථ කෙනෙක් මේ පරිහානිකර අවස්ථාවේදී කන්ද උඩරට කරා පැමිණ වූහු නම්– ඒ ග්‍රන්ථ කිහිපයත් හැර අවශේෂ සියල්ල ම විහාරාරාම කොල්ල කෑමට පැමිණි පෘතුගීසීන් කාරණකොට ගෙන වැනසෙන්නට පටන් ගත. එ සිනුත් යමක් ශේෂ වී නම් සීතාවක රාජසිංහ (ක්‍රි: ව: 1581–92) නරදෙටුවන්ගේ අග්නි හෝමයෙන් දැවී ගියේ ය. උගතුනුත්, ඉගෙන ගන්නවුනුත්, දුර්ලභ ව, ප්‍රසිද්ධ විද්‍යාස්ථාන නටබුන් ව යෑමේදී යම් යම් ස්ථානයන්හි ශේෂ මාත්‍ර ව පැවැති ග්‍රන්ථ කිහිපයක්වත් වී නම්– ඒවාත් ආරක්ෂා විරහිත වීමෙන් වේ බත් වූහ.

සිංහලයන්ගේ මේ අවාසනාවත් කාලපරිච්ඡේදයෙහි පහළ වූ වීරවික්‍රම (මතු සඳහන් වන) රජ්ජු වැනි ශාසන මාමකයන්ගේ ත්, වැඩි සිටි සංඝයා වහන්සේගේත්, දැඩි උත්සාහය වූයේ කෙසේ නමුත් අවශිෂ්ට ව තිබූ බෞද්ධ ග්‍රන්ථ කිහිපය වත් ආරක්ෂාකර ගැනීම ය. එ හෙත් තැන තැන විසිරී තිබූ බොහෝ පොත් පත් ආරක්ෂා විරහිත වීමෙන් නාම ශේෂොපගත වූයේ මැ යි.

* පෘතුගීසීහු සව සමය ලඞ්කාවේ පැතිර වීමට නො යෙක් උපාය යෙදූහ. ගම් බිම් දීමෙන් ද, මිල මුදලින් ද, ස්ථානාන්තරයෙන් හා නම්බුනාමයන්ගෙන් ද, පොළඹවා ඇතැම් සිංහලයන් ක්‍රිස්තු භක්තිකයන් කර ගන්නා අතර, එසින් නො පෙළඹෙන්නවුන් කස පහර, කඩු පහර, වෙඩි පහර, හිර ගෙදර හා දඬු ආදියෙන් බිය ගන්වා සිය සමයට ඇද ගත්හ. මේ නිසා එ කල මුහුදුබඩ නම්න් පමණක් ක්‍රිස්තියානි වූ සිංහල බෞද්ධයෝ සිය දහස් ගණනෙකි.

**මහනුවර ආරම්භය** පූර්වෝක්ත පරිදි කෝට්ටේ ජයවර්ධන පුරය පෘතුගීසීන්ගේ බල මඩුල්ලක් වැ-සීතාවක රාජධානිය දෙදරුම් කා-සිංහල රාජ්‍යය අනාරක්ෂිත වූ කල්හි, කලින් කල සිංහල රාජකුමාර වරුනට කඳවුරු ගම් හා වාස භූමි වීමෙන් රාජධානිය වීමට යළිත්, පෙර මං බලා සිටි ගම්පල හා පේරාදෙණියත් අබිබවමින් සෙංකඩගල මහනුවර සිංහලයේ අග්‍ර රාජධානිය වන්නට පටන් ගත්තේ යි.

## මහනුවර

මහනුවර වූකලී සිංහලයේ අවසාන රාජධානිය වෙයි. එහි පුරාවෘත්තය කරා ගමන් කරන්නකුට පැරණි නගරය ශ්‍රීවර්ධනපුර, සෙංකඩගල යන අපර නාම ද්වයකින් හැඳින් වූ යුගයක් ද හමු වෙයි. මින් ශ්‍රීවර්ධනපුර යනු අනෙකට වඩා ඉතිහාසයෙහි පැරණි සමයට අයත් වන නාමයකි. මහා වංශයේ පළමු වරට ශ්‍රීවර්ධනපුරයක් ගැන අසන්නට ලැබෙනුයේ දඹදෙණි පරාක්‍රමබාහු රජු ජාත භූමියේ කළ දළදා පූජෝත්සවය සඳහන් කළ අවස්ථාවෙහි ය. පැරකුම් රජුගේ මේ ජාත භූමිය දඹදෙණිය සමීපයෙහි පිහිටි ශ්‍රීවර්ධන නම් නගරයෙකි. මේ නගරය ඓතිහාසික ප්‍රවෘත්ති සංග්‍රහකොට ලියූ තත් කාලීන ග්‍රන්ථයන්හි* මහත් අභිරුචියෙන් සඳහන් කොට තිබේ. පැරකුම් රජුගේ ජාත භූමිය වූ මේ ශ්‍රීවර්ධන නගරය වර්තමාන මහනුවර ය යි ඇතැම් ඉතිහාසඥයන් සලකතත්, ඒ වූකලී හෙතු යුක්තීන්ගෙන් පිහිට නොලබන අදහස් මාත්‍රයකි. වර්තමාන මහනුවර දඹදෙණියේ සිට සැතපුම් සතළිසක් පමණ දුරින් පිහිටියේ ය. දඹදෙණියත්, ඒ ශ්‍රීවර්ධන නගරයත්, දෙක ම හොඳින් දත්, පූර්වෝක්ත දළදා පූජෝත්සවය සිය ඇසින් දුටු විරූ 'පූජාවලී' කතුවරයන් වහන්සේ මේ දෙනගරය අතර දුර ප්‍රමාණය අඩ යොදුනකැ යි කියති.† එ පමණකුත් නො වැ පැරකුම් රජු ශ්‍රීවර්ධන පුරයෙහි කරවන ලද විහාරයේ

---

* මහාවංශය (85 පරි.), පූජාවලි (35 පරි.), දළදා පූජාවලි (12 පරි.), නිකාය සංග්‍රහ (20 පිට)

† "තවද තමන් ජාත වූ ශ්‍රීවර්ධන නම් නුවර ප්‍රාසාද චඞ්ක්‍රමණ.............. පවුරු, වාසල්, ආදි නානාවිධ කර්මාන්තයෙන් අලඞ්කෘත වූ **රජමහා විහාරයක්** කරවා තමන් වසන ජම්බුද්‍රෝණි නම් පුරයෙහි පටන් ඒ පුරය දක්වා දිගින් **අඩ යොදුනක්** හා පුළුලින් ඉස්බක් පමණ තැන් භෙරි තලයක් සේ සම කරවා ............ මග සුදු වැල්ලෙන් තවරා දෙපස ධජ පුන් කලස තනා වෙහෙර පවුර සිසාරා බුදු පූජාවට ආ මෙඝ රාජයාගේ ඉන්ද්‍ර චාප සහශ්‍රයන් බඳු වූ විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් හොබනා දිගින් මහත් වූ තොරණ සහශ්‍රයෙන් හා බුදුන් පුදම්හ යි .............. බුදුන්ගේ මහ මඬුලු යෙහි අලඞ්කෘත වූ පූජාවෙන් ............ දළදා පාද ධාතු රත්න ............ ඒ පුරයට වඩා එක මුඛයක්හි කියා නිමවා ගත නො හැකි අප්‍රමාණ වූ තුනුරුවන් පූජාකොට එ වෙහෙර මහ සඟනට සාංඝික කොට .............. තමන් නමින් **පරාක්‍රමබාහු නම් පිරිවෙනක්** කරවා ............ මහත් පූජා කළහ.

(පූජාවලිය පිටු 695—696)

හෝ පැරකුම්බා පිරිවෙනැ නෂ්ටාවශේෂයෙක් ද වර්තමාන මහනුවර නැති. ඒ පිළිබඳ ජන කථා හෝ මහනුවරැනට නුපුරුදු යැ. මහනුවර නගරයේ පැරණිතම විහාරස්ථානය වශයෙන් පුරා තත්ත්වවිදයන් සලකනුයේ, අස්ගිරි ය යි. ඉන් පැරණි වූ විහාරයක් හෝ පැරකුම්බා පිරිවෙනක් මේ මහනුවර තිබූ බවට සාක්ෂියක් මෙතාක් ම නැති. එසේ නම් පූර්වෝක්ත ශ්‍රීවර්ධනපුරය මේ මහනුවර නො ව අන් තැනෙක පිහිටියක් විය යුතු ය.

පසුකල රාජධානියක් බවට පත් ඇතුගල (කුරුණෑගල) නගරය දඹදෙණියට නුදුරු ව පිහිටියේ ය. දෙ නගරය අතර දුර ප්‍රමාණය ද පූජාවලී කතුවරයන්ගේ අඩ යොදුන හා සැසඳෙන සුලු ය. දඹදෙණි යුගයට අයත් විහාරස්ථානයන්හි නෂ්ටාවශේෂ ද මෙහි බොහෝ ය. දඹදෙණි පැරකුම් රජුගේ පූර්වෝක්ත දළදා පූජෝත්සවය පිළිබඳ මුඛ පාරම්පරික කථා ද එහි වැසියනට පුරුදු ය. එ මතු දැ පැරකුම් රජුගේ බාල්‍යය-වර්ධනාදිය හා සම්බන්ධ ගම් බිම් ද අදත් එ නමින් ම ප්‍රකට ව වර්තමාන කුරුණෑගල නගරය හාත්පස පිහිටා ඇත්තේ ය. ශ්‍රීවර්ධනපුර යනු දු සෙංකඩගලට මතු නො වැ, මැත භාගයෙහි ලක්දිව පහළ වූ රාජධානි කිහිපයකට ම අවිශේෂයෙන් ව්‍යව-හාර වූ බවෙක් ද, ග්‍රන්ථාන්තරයෙහි පෙනේ. මේ නිසා පැරකුම් රජුගේ ජාත භූමිය වූ ශ්‍රීවර්ධන නගරය නම් සෙංකඩගල නො වැ, වර්තමාන කුරුණෑගල බව අවිවාදයෙන් පිළිගත හැක්ක.

මීට පසුව ශ්‍රීවර්ධනපුරයක් ගැන අසන්නට ලැබෙනුයේ, කෝට්ටේ සමයෙහි ය. 'රාජරත්නාකර'– 'සිංහල දළදාවංශ' යන ග්‍රන්ථයන්හි එය දක්නට ලැබේ. ඒ ශ්‍රීවර්ධනපුර නාමය නම් ව්‍යවහාර කරන ලද්දේ ජයවර්ධනපුර කෝට්ටය සඳහා ය. මේ අනුව ශ්‍රීවර්ධනපුර යනු හුදෙක් මහනුවරට ම විශේෂ වූ නාමයක් නො වන බව පැහැදිලි ය.

**ශ්‍රීවර්ධන නාමය හා මහනුවර**

එහෙත් ශ්‍රීවර්ධනපුර නාමයෙන් අද නම් ගැනෙනුයේ සෙංකඩගල මහනුවර මැ යි. කෝට්ටේ අවනතියත් සමග උදා වූ මහ-නුවරට, ඉන්පසු ශ්‍රීවර්ධන නාමය ව්‍යවහාර වන්නට විය. මේ ව්‍යවහාරය පෙනෙනුයේ, වීරවික්‍රම උපරජු-ගෙන් පසුව ය. මෙකල ලියැවුණු ඉතිහාස ග්‍රන්ථයන් අතුරෙ, මහාවංශය හැර රාජාවලී ආදි ග්‍රන්ථයන්හි සෙංකඩගලට ශ්‍රීවර්ධන-පුර නාමය ව්‍යවහාර වූ තැනෙක් නැති. ඒ ග්‍රන්ථයන්හි මහ-නුවර හැඳින් වූ තැන්වල දක්වෙනුයේ, හුදු සෙංකඩගල නාමය පමණි. මෙයින් පෙනෙනුයේ ශ්‍රීවර්ධන යනු සෙංකඩගල රාජ-ධානියට සම්භාවනා වශයෙන්* ආගන්තුක ව පැමිණි නාමයක්

* ශ්‍රීවර්ධන නම් ඇමැතියකු පිහිට කරවන ලද හෙයින් එ නම වී ය යි ද කියති.

බව යැ. මෙසේ ආරම්භයේදී අනියමින් ව්‍යවහාර වූ ශ්‍රීවර්ධනපුර නාමය කල් යත් ම රූඪි වූ යේ, සෙංකඩගලට ම විශේෂ වැ ව්‍යවහාර වන්නට පටන් ගත.

**සෙංකඩගල නාමය හා මහනුවර**

මහනුවරට ව්‍යවහාර වූ අනික් නාමය වන 'සෙංකඩගල' පිළිබඳ ඉතිහාසය එ තරම් නිරවුල් වූවක් නො වේ. සෙංකඩගල නගරයේ ආදිකාරකයා වශයෙන් ප්‍රකට ව ම සඳහන් වනුයේ පූර්වෝක්ත වීරවික්‍රම උප-රජු ය. එහෙත් සෙංකඩගල නාමය වීරවික්‍රම රජුට පූර්වයෙන් ව්‍යවහාර වූ බව "......... මායාදුන්නේ රජ්ජුරුවෝ ......... සෙන්කඩගල නුවරට වැද ජයවීර රජ්ජුරුවන් දක්කෝ ය." යන 'රාජාවලි' වචනයෙන් පෙනේ. මේ ප්‍රවෘත්තිය සිදු වී තිබෙන්නේ මායාදුන්නේගේ පිය වූ විජයබාහු vii (ක්‍රි: ව: 1530–34) රජුගේ අවසාන කාලයේදී ය. වීරවික්‍රමයන්ගේ රාජ්‍යාභි-ෂේකය ක්‍රි: ව: 1542 දී සිදු විය. මහාවංශයෙහි දක්නට ලැබෙන මේ වර්ෂ නියමය නිවැරදි බව වීරවික්‍රම රජු දවස කළැ යි සලකන 'රාජරත්නාකර'යෙන් ද ඒ වර්ෂය එ ලෙසින් ම සඳහන් වී තිබීමෙන් පෙනේ. මේ අනුව සෙංකඩගල රාජ්‍යය වීරවික්‍රමයනට පූර්වයෙහි ඇතිවී තිබුණ බව නිගමනය වන්නේ යි. එසේ නම් සෙංකඩගල නගරයේ නිර්මාපකයා කවරෙක්දු යි? මීළඟට සොයා බැලිය යුතු වේ.

සවකීය ආචාර්ය වූ ගොලහත්වත්තේ ධම්කිත්ති හිමියන්ට නරේන්ද්‍රසිංහ රජු විසින් ගම්- බිම් පුද කොට දෙන ලද ගෙඩිගේ විහාර තඹ සන්නසෙහි වික්‍රමබාහු රජ කෙනකුන් ගැන සඳහන් වෙයි. ඒ වික්‍රමබාහු රජු විසින් සන්නස් පිට පිදූ දේ ම නැවත ස්ථිර කොට දෙන බව නරේන්ද්‍රසිංහ රජ තෙමේ පවසයි. මේ වික්‍රමබාහු රජු නම් ගම්පළ තෙවැනි වික්‍රමබාහු ය යි ද, සතුරු උවදුරු වැඩිවීම නිසා සිය මවත් සමග පලා ගිය එ කුමරු මාතලේ අස්ගිරි කෝරළයේ ගල්ලෙනක වැස කලක් ගත වූ පසු අරාජක වූ කන්ද උඩ රට රාජ්‍යයට මඟුලැතු යැවීමෙන් තෝරා ගන්නා ලදු ව එන අවස්ථාවේදී 'සෙංඛණ්ඩ' නම් තවුසාගේ අසපුව සමීපයෙහි ජය බිමක් දැක, එහි මාලිගයක් තනවා ගෙන වසන්නේ- පූර්වෝක්ත අස්ගිරි ලෙනේ විසූ හෙයින් 'අශ්වගිරිදේවී' ය යි ප්‍රකට වැ සිට මිය ගිය සවකීය මානාව සිහි කරමින් 'අස්ගිරි' විහාරය තනා ඇය සතු කෙත් වත් ආදිය මෙසේ සඟ සතු කොට සන්නස් පිට පූජා කෙළේ ය යි ද, ජනාලාපයෙක්හි අසන්නට ලැබේ. පූර්වෝක්ත සන්නසෙහි සඳහන් වික්‍රමබාහු ගම්පළ තෙවැනි වික්‍රමබාහු බවට මේ ජනාලාපය සාක්ෂි දෙයි. එසේ නම් සෙංකඩගල නිර්මාපකයා ඒ මේ වික්‍රමබාහු විය යුතු නො වේ ද?

අපගේ මේ උත්සාහය වීරවික්‍රම රජුට පෙර ම සෙංකඩගල නාමය මහනුවරට ව්‍යවහාර වූ බව දක්වීම සඳහා යි.

**සෙංකඩගල උන්නතිය**

ආරම්භය මෙසේ වුව ද, සෙංකඩගල ශ්‍රී සමෘද්ධියට නම් සීමාවත්තේ වීරවික්‍රම රජු බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. එබැවින් ඒ පිළිබඳ ගෞරවය එතුමන්ට නිර්විවාදයෙන් හිමි වේ. වීරවික්‍රම උපරාජ තෙමේ ස්වකීය කාලය, එවක පැවැති අභ්‍යන්තර විය වුල් සඳහා හෝ පෘතුගීසීන් මැඩලීම පිණිස හෝ නො යොදා ජාතික හා ආගමික සංරක්ෂණය උදෙසා ශක්ති පරිද්දෙන් කටයුතු කිරීමට යෙද වී ය. හේ තෙමේ සෙංකඩගලපුරයෙහි වසමින් සිංහල රාජධානියක පැවැතිය යුතු බොහෝ අඞ්ගයන් සමෘද්ධ කරවා ලී ය. පළමු කොට ඒ රජ තෙමේ චෛත්‍යයක් කරවා අනතුරුව දෙ මහල් පොහොමළුවක් ද කොට, ස්වකීය නගරය සංඝයාට යෝග්‍ය ස්ථානයක් කෙළේ ය. ඒ ඒ තැන්හි විසූ භික්ෂූහු රජුගෙන් ලත් උපස්ථාන ඇත්තෝ මේ අභිනව සංඝාරාමයන්හි වෙසෙමින් අභාවයට යමින් පැවැති ධර්ම ශාස්ත්‍රීය කර්තව්‍යයන් ආරක්ෂා කිරීමෙහි ව්‍යාවෘත වූහු. ධර්මධර භික්ෂූන්ගේ අනුශාසනය පරිදි ඒ රජතුමන් විසිනු දූ ලේඛකයන් ලවා ලියවා ග්‍රන්ථ සුරක්ෂිත කර වීමෙන් කරන ලද්දේ වටිනා ශාස්ත්‍ර සංග්‍රහයකි. කලකින් ලක්දිව උපසම්පදා කර්මයක් නො කළ විරූ බව ඇසූ රජු මහවැලි ගඟෙහි උදකොත්ක්ෂේප සීමාවට ත්‍රි සිංහලයෙහි භික්ෂූන් කැඳවා ධර්මකීර්ති මහාස්ථවිර ප්‍රමුඛ පන්තිස් නමක් ලවා තෙසිය පස් නමක් පමණ වූ හෙරණුන්ද උපසම්පත්තියට පැමිණවීම ඉක්බිති කරන ලද මහා ශාසන සංග්‍රහය විය. මේ වනාහි මහනුවර ඉතිහාසයෙහි ප්‍රථම වරට කරන ලද උපසම්පදා කර්මය යි. ශාසන විනාශක ආත්මාර්ථ-කාමී අධිපතීන්ගෙන් ගහණ වැ විදේශීය මිසදිටු සතුරන්ගෙන් පිරි පැවැති සිංහලයේ ඒ පරිහානිකර අවස්ථායෙහි මේ ආදී වූ වීරවික්‍රම උපරජුගේ අභ්‍යුදය ක්‍රියා පද්ධතිය අන්ධකාරයෙන් පැන නැඟුණු ගිනි පුළිඟුවක් සේ සිංහලය පෙබයීමෙහි සමර්ථ වූයේ යි.

මෙසේ වීරවික්‍රම රජුගෙන් ආරම්භ වූ සෙංකඩගල නුවර අර්ධශතසංවත්සර ප්‍රමාණ වූ (ක්‍රි: ව: 1542–1592) කාලයක් ලංකාවේ උපරාජධානියක් වශයෙන් පැවැත්තේ ය. කෝට්ටේ දෙන් ජුවන් පෙරියබණ්ඩාරය, සීතාවක රාජසිංහය, යන දෙ රජුන්ගේ ඇවෑමෙන් ඇති වූ විමලධර්මසූර්යයී, රාජ්‍යෝදයත් සමඟ සෙංකඩගල පුරය සිංහලයේ අග නුවර බවට පත්වූයේ පසුව මහනුවර* නමිනු දූ හඳුන්වන්නට පටන් ගති.

**මහනුවර රාජධානිය (ක්‍රි: ව: 1592–1815.)**

එතැන් පටන් සෙනාරත්නය, ද්විතිය රාජසිංහය, ද්විතීය විමලධර්මසූර්යයය, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහය, යන සිංහල නරපතීන් සිවු දෙනෙක්ද, ශ්‍රී විජය රාජසිංහය, කීර්තිශ්‍රී රාජසිංහය, රාජාධිරාජසිංහය, ශ්‍රී

* කීර්තිශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ පටන් මහනුවර ව්‍යවහාරය ඇති විය.

වික්‍රම රාජසිංහ යයි වඩුග රජවරු සතර දෙනෙක්ද යි මෙසේ නව රජදරු කෙනෙක් මහනුවර රාජධානිය කොට අවුරුදු දෙ සිය තෙ විස්සක් පමණ කල් ලඞකාව පාලනය කළාහු ය.

ඉක්බිති සිංහලයන් විසින් ඉංග්‍රීසිනට පාවා දෙනු ලැබූ ශ්‍රී ලඞකා තොමෝ සර් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයන් සිට සර් එන්ඩ්‍රූ කැල්ඩිකොට් ලඞකෙශ්වරයන් තෙක් සිටි ආණ්ඩුකාරවරු සවිසි දෙනකුන් විසින් කොළඹ අගනුවර කොට පාලනය කරනු ලැබුවා- මෙ දවස සර් හෙන්රි මෙසන් මුවර් උතුමාණන් විසින් පාලනය කරනු ලබන්නී එක්සිය එක්තිස්වැනි වස ඉක්ම වූවා ය.

ප්‍රාරම්භ කථා නිමි.

---

# සිංහල සාහිත්‍ය වංශය

## නූතන අවස්ථාව

### 1 හාටන තරඞ්ගය
### (ක්‍රි: ව: 1600—1700)

රජවරු:—

| | |
|---|---|
| විමලධර්මසූර්ය i | 1592—1604. |
| සෙනා රත්න | 1604—1634. |
| රාජසිංහ ii | 1634—1684. |
| විමලධර්මසූර්ය ii | 1684—1706. |

## දෙශීය ප්‍රවෘත්ති

සෙංකඩගලපුර ලඞ්කාවේ රාජධානිය වන විට සිංහලය පැවැතියේ භයානක පරිහානි තත්ත්වයක යැ. ඒ වූකලී ආගම හා ශාස්ත්‍රය පිරිහී-ජාතිය භෙදවී-ධනය හීන වී රට පාලුව ගිය සමයෙකි. සමාරම්භයේ සිට මඑකිනෙකට ඉවහල් ව ගැටී-බැඳී පොෂණය වූ අත්‍යුත්කෘෂ්ට බුඩ ශාසනය හා භාෂා සාහිත්‍යයත් තදවනත සදාචාරයත්, සියලු කල්හි ආරක්ෂිත වූයේත්, වැඩිදියුණු වූයේත්, සිංහල රාජ්‍යයේ ශක්ති මහත්ත්වය අනුව ම ය. සොළොස් වැනි ශතවර්ෂය සිංහලයට අතිශය හානිකර අවස්ථාවක් වූයෙන්, එම කාලයතුල දී සිංහලයන්ගේ එකී මහඟු ධනය හඞ්ගවී ගොස් තිබුණේ ය. එ හෙයින් සතළොස්වැනි ශතවර්ෂය හෙවත් සෙංකඩගල පුර රාජධානිය ආරම්භ වන විට ස්වකීය පාරම්පරික ධනයෙන් ඔවුනට ඉතුරු වී තිබුණේ, සිංහල යන නාම මාත්‍රය පමණකි. සිංහලයන්ගේ මේ සංවෙගදායී පරිහානියට අතිශයින් හේතු වූ කරුණු දෙකකි. පළමුවැන්න වූකලී ජාතිය ආරක්ෂා කර ගැනීමේ ශක්තිය ඇතිව සිටි අධිපතීන් ඔවුනොවුන් නො ඉවසීමෙන් රට ඇතුළේ ඇති කළ භෙදය යි. දෙවැන්න වූයේ අනවරතයෙන් පැවැති පර සතුරු පීඩනය යි. කවර ජාතියක් වුව ද, පරිහානියට පත් කිරීමේ මහත් ශක්තිය ඇති මේ උග්‍ර හෙතු දෙක සම සම ව බල පවත්වද්දී, සිංහල යන නාම මාත්‍රය අවශෙෂ වූයේ පුදුමය කි. පරිහානිය මෙ තරම් දරුණු ව පැවැති සමයක එය පුනරුත්ථානයට පත් කර ලීම කෙ තරම් ශක්ති සම්පන්නයකුට වුව ද, එ තරම් ලෙහෙසි කරුණක් ව නො තිබුණේ ය.

ලඞ්කාව මෙ බඳු තත්ත්වයක පවත්නා සමයෙහි විමලධර්මසූර්ය i රජතුමා වැනි භාග්‍ය සම්පන්න නරවීරයකුගේ පහළ වීම සිංහලයට මහත් සැනසිලි දායක කරුණක් විය. පර සතුරු පීඩන වලින් රට මෙළී- දූවවී පවතිද්දී, අභ්‍යන්තර වියවුල් බොහෝ දුරට සංසිඳුවා සෙංකඩගල සිංහාසනයේ එකාධිපතියා

වශයෙන් පෙනී සිටීමට විමලධර්මසූර්ය රජුට හැකි වූයේ, එතුමන් තුළ පැවැති ජාතික ඖදාර්යයෙන් ඉද වැඩී ගිය අප්‍රතිහත ධෛර්යය කරණකොට ගෙන ය.

සිංහලයන්ගේ අත්‍යුත්තම ශුබ වස්තුව වූ ශ්‍රීමත් දන්ත ධාතුන් වහන්සේ ප්‍රසිද්ධියේවබා හිඳුවීමත්, ජාතික ආගමික කත්වෳයන්හි යෙදීමට ඒ නරවීරයා තුළ නිසර්ගයෙන් පිහිටි ලැදිකමත් නිසා මේ දුර්භාග්‍ය සමයෙහි සිංහල රාජ්‍යය පිහිටුවා ගැනීමට ඉතා සුදුසු නගරය සෙංකඩගල හැටිය ටත්, එහි සිංහාසන ය උදෙසා තමන්ට ඉතා සුදුසු ස්වාමියා විමලධර්මසූර්ය රජු හැටියට ත්, එදා සිංහලයෝ එක හෙලා පිළිගත්හ. සිංහලය නගා සිටුවීම උදෙසා ඒ රජතුමන් විසින් ආරබ්ධ ක්‍රියා පද්ධතිය රටට නව ජීවනයක් ගෙන දීමෙහි සමර්ථ විය. රට පුනරුද්ධීපනයට පත්කර ලීමේ ශක්තිය විමලධර්මසූර්ය නරේශයන් තුළ සහජ යෙන් පිහිටා තිබුණ ද, රටේ පැවැති ඉමහත් දුර්භාග්‍ය තත්ත්වය ත්, බලාපොරොත්තු නො වූ තරම් ඉක්මනින් එළඹි අවසානය ත්, නිසා එතුමනට ස්වකීය ක්‍රියාවන්හි සම්පූර්ණ ප්‍රතිඵල ලැබිය නො හැකි විය.

ජාතිකොත්තතිය බෙහෙවින් අපේක්ෂා කළ සෙනාරත්න නරේන්ද්‍රයන්ට සිතූ තරමට අදහස් සම්පූර්ණ කර ගැනීමට පර සතුරෝ ඉඩ නො දුන්හ. කන්ද උඩ රට නතු කර ගැනීමේ බලාපොරොත්තු ඇති පෘතුගීසීන්, ඉතා වෑයමෙන් ගොඩ නැගී ගත ආ සෙංකඩගල නුවර වැනසූයේ එතුමන්ගේ රාජ්‍ය සමයේදී ය.

සෙංකඩගල පුර රජුන් අතර අතිශයින් ප්‍රතාපවත් නරේන්ද්‍ර යා නම් පනස් වසක් රාජ්‍යය කළ දෙවැනි රාජසිංහ මහීපාල තෙමේ ය. එක්සිය තෙපනස් වසක් පමණ ලංකාවේ මුහුදුබඩ පෙදෙස් පාලනය කළ පෘතුගීසීන් සහමුලින් පරාජය කිරීමෙන් සෙංකඩගල ඉතිහාසයේ මහා වීරයා බවට පත් වූ රාජසිංහ ii පෘථිවීශ්වරයන්ට ලන්දේසීන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීම නිසා නො වේ නම් ලක එක්සත් කර ගන්නට හැකි ව තිබුණි.

"මිරිස් දී ඉඟුරු ගත්තාක්" මෙන් පෘතුගීසීන් පන්නා ලන්දේසීන් ලංකොට ගත් ස්වකීය පිය–මුතු දෙ රජුන්ගේ ක්‍රියා වෙහි විඵලත්වය දුටු දෙවැනි විමලධර්මසූර්ය නරේන්ද්‍ර තෙමේ මහනුවර විසූ සමාදාන කාමී රජුන් අතර කෙනෙකි. ඉවසිලිමත් ක්‍රියා කලාපය නිසා එතුමනට ස්වකීය රාජ්‍යාදියේ පටන් ම ලන්දේසීන් සමග මිත්‍රත්වයෙන් විසීමට හැකි විය. එ හෙයින් ම දෙ විසි වසක් පැවැති මේ රාජ්‍ය සමයෙහි ලන්දේසි බලය මුහුදු බඩ පෙදෙස් හි දියුණු වී ගිය නමුදු, රට වැසියා අන්තර්විවාද සතුරු පීඩන ආදියකින් නො පෙළුණේ ය. මහනුවර පළමු වැනි ශතවර්ෂයේ අවසාන නරේන්ද්‍රයා වූ එතුමන්ගේ රාජ්‍ය

සමය වනාහි පෘතුගීසීන්ගේ ලංකාවතරණයෙන් පසු යුද කෝලාහල වලින් නො පෙළී රට වැසියා නිදහස් ලෙස කාලය ගත කළ එකම අවස්ථාව යි.

## ශාසනික ප්‍රවෘත්ති

ජාතික- සාහිත්‍යික- කටයුතු මෙන් ම ශාසනික කටයුතු ද මැනවින් දියුණු කොට ලීම සමෘද්ධිමත් සිංහල රාජ්‍යයෙහි විශිෂ්ට අඞ්ගයක් විය. සිංහල රාජ්‍යය යම් යම් අවස්ථාවක සමෘද්ධියට පත් වී නම් ඒ මේ කාරණත්‍රය අභිවර්ධනයට පත් කර වීමෙනි. මෙහිනු දු අපේ රජවරු ශාසනික කටයුතු වඩා උතුම් කොට සැලකූහ. මේ නිසා සමාරම්භයේ පටන් ම ලංකා බුද්ධ ශාසනයාගේ චිරස්ථිතියට මූල්‍ය හේතුව වූ උපසම්පදා කර්මය කරවීම සිංහල රජුන් ම අයත් කර්තව්‍යයක් වැ පැවැත්තේ ය. මෙ හෙයින් ශාසන මාමක නරේශයෝ සුදුසු කාලයන් හි උපසම්පදා කර්මය කරවීමෙන් ශාසනය නො නැසියදී පවත්වා ගෙන ආහ. යුද කෝලාහල බහුල වී රටේ සාමය නැතිවී යෑමෙන් හෝ රාජ්‍යය පර සතුරන් අතට පත්ව යෑමෙන් රට විපර්යාස වූ අවස්ථාවන් හි අනිකුත් කටයුතු මෙන් ම යථෝක්ත ශාසනික කර්මය ද අත පසු වී යෙයි. එසේ කලක් ගතවූ විට එම කර්මය කිරීමෙ හි පළ පුරුදු භික්ෂූහු ද දුර්ලභ වෙත්. එවිට ඒ සඳහා විදෙශයෙන් භික්ෂූන් ගෙන්වන්නට සිදු වෙයි. කිහිප වරක් ම විදෙශයෙන් උපසම්පන්න භික්ෂූන් ගෙන්වා මෙරට බුද්ධ ශාසනය ප්‍රකෘතිමත් කරවීමට සිදු වූයේ එහෙයිනි.

මේ අයුරින් ම කෝට්ටේ අවනතියෙන් පසු, කලක් නො පැවතිමෙන් ලංකාවේ ශාසනික කටයුතු සෙංකඩගල ආරම්භ වන විට සම්පූර්ණයෙන් නැතැ යි කිය යුතු තරම් අභාවයට පත්ව තිබුණේ ය. වීරවික්‍රම රජු විසින් කර වූ ශාසන සංග්‍රහයෙහි දී තුන්සිය පස්පනස් නමක් පමණ සාමණේර වරුන් වහන්දෑ උපසම්පත්තිය ලත් බවත්, බොහෝ කුල පුත්‍රයන් පැවිදි වූ බවත්, සඳහන් වෙයි. එ නමුත් අර්ධ ශත සංවත්සරයක් පමණ කාලය අතර තුර, ලංකා ශාසනය කෙතරම් දුරට පිරිහී ගියේ ද යතහොත්, විමලධර්මසූර්ය i රජු රජ පැමිණෙන විට එකී භික්ෂූන් අතුරෙන් ගණ පූරණයට පොහොනා පමණවත් භික්ෂූහු ලංකාවේ නො :ැවියහ. කෝට්ටේ අවනති යුගයේ දී එතෙක් කල් රාජකීය කර්තව්‍යයක් වැ පැවැත ආ උපසම්පදා කර්මය අභාවයට යෑමත්, ඒ සමග ම පිළිවෙලින් ලක් රජය ඉසුලූ ධර්මපාල- රාජසිංහ i දෙ රජුන් ම මිසදිටු වීම ත් යන දෙ කරුණ ශීඝ්‍රශීලි පරිහානියට හේතු විය. මෙහිනු දු සීතාවක රාජසිංහයන්ගේ ක්‍රියා කලාපය එද ලක් සසුනට අතිශයින් ම විපත්ති කර වූයේ යි.

සම්බුද්ධ ශාසනය වවනු කැමැති ඒ විමලධර්මසූර්ය i රජ තෙමේ රාජ්‍යයට පත් නො බෝ කලකින් නගරය වටා උස් වූ ප්‍රාකාරයක් කරවා හාත්පස සුදුසු ස්ථානයන් හි බලකොටු

බැඳවීමෙන් සෙංකඩගල රාජධානිය සතුරන්ගෙන් ආරක්‍ෂා කර විය. ඉක්බිති එම නගරයෙහි සුරක්‍ෂිත භාවය සැලකූ රජ තෙමේ බොහෝ කල් දෙල්ගමු විහාරයේ සඟවා තිබූ බෞද්ධ ලෝකයාගේ අසහාය මුදුන් මල්කඩ වූ ශ්‍රීමත් දන්ත ධාතූන් වහන්සේ ස්වකීය නගරයට වැඩම කරවා රාජ මන්දිර සමීපයෙහි කරවන ලද විසිතුරු දෙමහල් පායෙහි ප්‍රසිද්ධ වැ වඩා හිඳුවා ව්‍යවස්ථානුගත පුද සිරිත් පැවැත් වී ය. බොහෝ කලකින් උපසම්පදා කර්මයක් නො කිරීම නිසා බුද්ධ ශාසනය පරිහානියට යමින් පැවැති බව ඇසූ රජ තෙමේ එයට සුදුසු භික්‍ෂූන් සොයා ගත නො හැකි වැ රක්ඛඞ්ග දෙශයට ඇමැතියන් යවා **නන්දිචක්කාය, චන්ද විලාශය** යන තෙරුන් ප්‍රමුඛ දශ වර්ගික භික්‍ෂූන් ගෙන්වා ක්‍රි: ව: 1597 දී ගැටඹේ තොට උදකොක්ඛෙප සීමාවේදී උපසම්පදා කර විය. මේ වනාහි මහනුවර ඉතිහාසයෙහි සඳහන් දෙ වැනි ශාසනික සඞ්ග්‍රහය යි. මේ ශාසන සඞ්ග්‍රහයේ දී සියගණන් කුල පුත්‍රයෝ ද පැවිදි කරනු ලැබූහ. ඒ රජ තෙමේ බොහෝ විහාරස්ථාන පිළිසකර කරවා ඒවා භික්‍ෂූන් ට පවරා දීමෙන් ශාසනයට බොහෝ උපකාරී විය. මේ රජතුමන් ඉතා දූක සේ සිදු කළ මේ කාලොචිත ක්‍රියා කිහිපය හේතුකොට ගෙන බොහෝ කලක් තාඩන පීඩන වලට භාජනවැ දුබලව සිටි භික්‍ෂූන් වහන්සේ ට ශාසනික ක්‍රියාවන්හි ව්‍යාවෘත වීමට යම් තම් අවකාශයක් ලැබී ගියේ ය.

මෙසේ විමලධර්මසූර්‍ය නරනාථයන් ඇති කළ ශාසනික දියුණුව වැඩෙමින් පවතින අතර, සෙනරත් රජු රාජ්‍යයට පැමිණි නො බෝ කලකින් නැවතත් විපත්තිකර අවස්ථාවක් එළඹියේ ය. ක්‍රි: ව: 1628 වැනි වර්ෂයේදී කොන්ස්තන්තීනු ද සා නම් පෘතුගීසි ආණ්ඩුකාරයකු සෙනරත් රජුට විරුද්ධවැ මහත් යුද්ධ සෙනාවක් මහනුවරට මෙහෙයීම නිසා හදිසියේ ම රජුට හා භික්‍ෂූන්ට ද, නගරය හැරදමා යන්නට සිදු වූයෙන්, ක්‍රමයෙන් පැවැත ආ ශාසනික කටයුතු සියල්ල ම නැවතත් කැඩී-බිඳී ගියේ ය. සෙංකඩගල නගරය දවා විහාර- පොත් ගුල්- පන්සල්- හා මාලිගාත් බිඳ දමා ඔවුන් මේ වර කළ ඒ මහත් දුෂ්ට ක්‍රියාව වැඩෙන පැළයකට උණු දිය ඉසීමක් මෙන් විය.

සේනාරත්න, රාජසිංහ ii යන දෙ රජවරු බෞද්ධ සමය පිළිබඳ සමාන්‍ය කටයුතු කිරීමෙහි ප්‍රමාද නො වූහ. දළදා වහන්සේ මැනවින් ආරක්‍ෂා කරගැනීම ත්, විහාර-ප්‍රතිමාලය යන් වැඩි දියුණු කිරීම ත්, එ රජුන් විසින් චාරිත්‍රානුගත ලෙස පවත් වන ලදි. එ රජුනට අයත් අසූ වසක් පමණ වූ දීර්ඝ කාල පරිච්ඡේදය සතුරු පීඩනයන්ගෙන් ම ගෙවී ගියේ ය. එ හෙයින් ශාසනෝන්නතියට අදාළ වන මහා ව්‍යාපාරයන්හි නිරත වීමට එ රජුනට අවකාශ නො ලැබුණි. මේ නිසා විමලධර්මසූර්‍ය i රජු විසින් ආරම්භ කරන ලද උපසම්පදා කර්මය තහවුරු වැ පවත්වා ගත නො හැකි වූයෙන් මේ වනවිට යළිත් ශාසනය

පිරිහෙමින් පැවැත්තේ ය. මෙසේ අනුක්‍රමයෙන් ශාසනික ක්‍රියා අභාවයට ගොස් භික්ෂු ප්‍රතිපත්ති නැතිවී- කල් යෑමේ දී ශාසනගත කිහිපදෙන වුවත්, ප්‍රතිපත්ති රැකීමෙහි අපොහොසත් වූවෝ සවකීය ආරාමස්ථාන පමණක් රැක ගනිමින් විසූහ.

**ගණින්නාන්සේ වරු**

උපසම්පන්න භික්ෂූන් දුලීභ වැ ශාසනික විනය කර්මයන් නැතිව පැවැති මේ අවස්ථාවෙහි බොහෝ විහාරාරාමයන්හි විසූවෝ **ගණින්නාන්සේ** නමින් හැඳින් වූ සාමණේර වරුය. තවත් වර්ෂ කිහිපයක් ගත වත් ම, එම විහාරස්ථාන තමන් සතු පියඋරුමයන් මෙන් සැලකූ ඒ පැවිදි පිරිස සැදූහැති හෝ නැති සිය නෑ දරුවන් ම පැවිදි කරවා තමන් ඇවෑමෙන් එම ස්ථාන ඔවුනට හිමිවන සේ උරුම කොට දුන්හ. පැවිදි වීමෙහි කොතරම් ආශාවක් දක්වුව ද, අන් කුලයක දරුවකුට ඒ ස්ථානයන්හි පැවිදි වීමට අවකාශයෙක් නො ලැබිණ. තම කුල පරම්පරාව ම උතුම් ශාසන පරම්පරාව කොට තැකූ ඒ පැවිදි පිරිස විසින් ආරබ්ධ එකී දුර්භාග්‍ය සම්පන්න චාරිත්‍රය අදත් ඇතැම් පෞරාණික විහාරස්ථානය කැ දක්නට ලැබේ. ප්‍රතිපත්තිකාමී වැ පැවිදි වුවත් දුලීභ වී වස්තු තෘෂ්ණාවෙන් වෙළීගත් සැදූහැ නැත්තවුන් ගෙන් එ වක ශාසනය පිරී යෑමට යථෝක්ත කාරණය හේතු වූයේ ය එකී පැවිද්දෝ ඒ ඒ විහාරස්ථානයන්ට පෙර රජවරුන් ලියවිලි මගින් පුද කල ගම්-කෙත් දියුණු කොට ඒ මගින් දිවි රැක ගන්නට පටන් ගත්හ. මේ පැවිද්දන් අතර ඇතැම් කෙනෙක් වෙදකම්- නැකැත් කම් බලි තොවිල් වෙළඳාම් ආදි අශාසනික ව්‍යාපාරයන් හි ව්‍යාපෘත වූවාහු- ඉන්. රජකුමර, රදළ, නිලමවරුන් සතුටු කොට තවත් ගම්-බිම්, පුද-පඬුරු, ලැබ ගැනීමෙහි ප්‍රොත්සාහී වූහ. විහාර සන්තක ආදායමෙන් දිනපතා බුඩ පූජාව පැවැත් වීම නම් ඔවුහු අමතක නො කළහ. ඔවුන් තුළ පැවැති මේ ගුණධර්මය ද මහඟු වූවකි. **ගණින්නාන්සේ** නමින් සෙංකඩගල ඉතිහාසයෙහි හඳුන්වනු ලබන්නෝ නම් මොහු යැ.

උගත් ධර්මධර භික්ෂූන් දුලීභ වූයෙන්, තත් කාලීන රජ නිලම රදළ ආදී ප්‍රභූන්ට ද, ශාසන ප්‍රතිපත්තීන් ගැන නියම අවබොධයක් ඇතිකර ගැනීමට මාර්ගයක් නො වී ය. ඔවුන් තුළ පැවැත්තේ ද පාරම්පරිකව පැවැත ආ ශාසන භක්තිය ම පමණි. තමන් මෙන් ම ශාසන ප්‍රතිපත්තීන් විෂයෙහි අවිදග්ධ වූ යථෝක්ත පැවිදි පිරිස ගේ අනුශාසනා පරිදි ක්‍රියා කිරීමට සිදු වීම නිසා ශාසනය කෙරෙහි පැවැති භක්තිය කෙතරම් වුව ද, ශාසනොන්නතියෙහි ලා මහත් මෙහෙයක් සැලසීමට ඒ ප්‍රභූනට අවස්ථාව නො ලැබිණ. එ බැවින් මේ අවස්ථාව වන විට බුඩාගමේ සාමාන්‍ය කටයුතු පිළිබඳ දියුණුවක් විනා එය චිරස්ථායී වන පරිදි කටයුතු සැලසී නො තිබුණේ ය.

එකී කටයුතු කෙතෙක් කල් අතපසු වී තිබුණේ ද යත්, විමලධර්මසූරිය i රජු විසින් කරවූ උපසම්පද කර්මයෙන් පසු ශතසංවත්සරයක් පමණ කාලයක ලංකාවේ රජුන් විසින් කරවූ එක ද උපසම්පද කර්මයක් ගැන සඳහන්ව නැති. එදා ශාසනය මෙතෙක් දුරට පිරිහී ගොස් තිබුණේ, ඒ ශ්‍රේෂ්ඨ විනය කර්මය නො පැවැත්වීම් හේතුවෙන් ම ය. විමලධර්මසූරිය ii රජතුමන්ගේ කාලයෙහි ලංකාවේ උපසම්පන්න භික්ෂූන් නො වූහ යි නො කිය හැකි වුවත්, ඒ උපසම්පද කර්මය කිරීමට දත්තාහු දුර්ලභ වූහ. එතුමන් ගේ රාජ්‍යාදය ත් සමග උදා වූ සාමය ශාසනික ක්‍රියාවකට යම් තම් අවකාශ දෙන්නක් විය. එම අවස්ථාවේදී ප්‍රතිපත්ති කාමී ප්‍රව්‍රජිතයන් වහන්සේගේ අනුශාසනා පරිදි ලංකාවේ උපසම්පද කර්මයක් කිරීමට ඒ රජ තෙමේ කටයුතු සැලැස් වී ය. ඒ පිණිස භික්ෂූන් ලබා ගැනීම සඳහා රක්ඛඞ්ග දෙශයට ඇමැතියන් යැවූ පසු එ රටින් සන්තාන, ලොකරාග පුඟ්ගල, යන මහා ස්ථවිර ප්‍රමුඛ තෙ තිස් නමක් පමණ භික්ෂූන් වහන්සේ මෙහි වැඩ එකල උපසම්පන්නාපෙක්ෂකව සිටි තෙ තිස් නමක් පමණ සාමණේර වරුන් ක්‍රි: ව: 1697 දී ගැටඹේතොට දී උපසම්පද කර වූහ. මහනුවර ඉතිහාසයේ තෙවැනි වූ එම ශාසන සඞ්ග්‍රහයාගේ අවසානයේදී එක්සිය විසි දෙනෙක් පමණ කුල දරුවන් ද පැවිදි කර වූහ. විමලධර්මසූරිය ii රජ තුමන් එකී ශාසනික සඞ්ග්‍රහය කරවූ නමුදු, එයින් ශාසන චිරස්ථිතියට කටයුතු නො සැලසුණේ ය. ඒ ශාසන සඞ්ග්‍රහය කිරීමෙහි එ රජුට අනුශාසක වූවෝ පූජ්‍යෝත්තම විහාරස්ථානයන් හි වාසය කළ 'සිල්වත්' පක්ෂයේ කිහිප දෙනෙකි. එ හෙයින් ඒ සිල්වතුන්ගේ අදහස පරිදි ඒ අවස්ථාවේදී මහණ උපසම්පදාව ලැබුණේ, ඔවුනොවුනගේ නෑ දරුවන්ට හා එම විහාරස්ථාන යන්හි පැවිදිව සිටි පිරිසට ද පමණි. උපසම්පදාව ලැබූවන් තෙ තිස් නමක් වැ, පැවිදි ලද්දවුන් එක්සිය විසිනමක් වන පරිද්දෙන් ඒ ශාසන සංග්‍රහයෙන් එල ලැබූවන් ගේ ගණන එ තරම් සුලු වූයේ එහෙයිනි. ලාංකික භික්ෂූන්, සන්තානාදි මහා ස්ථවිරවරුන් ගෙන් බලාපොරොත්තු වූයේ, ඒ කිහිප නම උපසම්පද කරවා ගැනීම පමණක් හෙයින්, ඊටපසු ඒ මහාස්ථවිර වරු සියරට බලා ගමන් ගත්හ. එහෙයින් ම ඒ වර පිහිටු වන ලද උපසම්පද කර්මය එක් වරක එක් පිරිසකට පමණක් විශේෂ වූවක් විය. එසේ ම දුෂ්ප්‍රතිපන්නයන් දුරු කොට ශාසනය පිරිසුදු කර වීමක් ද එදා සිදු නො වී ය.

මේ වනාහි හායන තරඞ්ගයෙහි සංග්‍රහ විය යුතු ශාසනික ප්‍රවෘත්ති පිළිබඳ ලේශ මාත්‍රයකි.

## ශාස්ත්‍රීය ප්‍රවෘත්ති

ශාස්ත්‍රීය පක්ෂයෙන් ද මේ ශත සංවත්සර ප්‍රමාණ කාලය ශාසන පක්ෂයෙන් මෙන් ම අන්ධකාරවත් ය. භික්ෂු තත්ත්වය දුර්වල වූ හැම අවස්ථාවක ම අපේ සාහිත්‍ය කටයුතුත්, අතපසු

වීම ස්වභාවය වූ බැවින්, මේ අවස්ථාවෙහි පැවැති සාහිත්‍ය තත්ත්වය කෙබඳු වූවක් ද යනු සිතා ගැන්ම දුෂ්කර නො වේ. වීර වික්‍රම උපරාජයාගේත්, විමලධර්මසූර්ය i නරේශයාගේත්, අනලෝපාත්සාහය නිසා සාහිත්‍යය පිළිබඳ ප්‍රමාණවත් ආලෝකයක් උදා වුව ද, එය සෙංකඩගල අවට ප්‍රදේශයන්හි පමණක් ව්‍යාප්ත වූවක් විය. අපේ සාමයික ග්‍රන්ථ ආරක්‍ෂණය සඳහා එයින් මහගු සේවයක් සැලසිණ. සෙනරත් රාජ්‍යාදිය සමයේ දී පෘතුගීසීන් මහනුවර පැහැර ගත් විට බොහෝ ග්‍රන්ථ විනාශ වූවාට සැක නැති. පෘතුගීසින්ගෙනුත්, සීතාවක රාජසිංහයන් ගෙනුත්, ආරක්‍ෂා වී යම්තම් කන්ද උඩ රට කරා පමුණුවා ගත් පොත් වලින් වැඩි කොටසක් නැති වී ගියේ මේ වියවුලේ දී ය.

සීතාවක සමයෙහි විසූ අලගියවන්න මුකවෙටිරයන් කළ ග්‍රන්ථ කිහිපයත්, 'රාජාවලී' වැනි තවත් ඉතිහාස ග්‍රන්ථයකුත්, රාජ ස්තෝත්‍ර කාව්‍ය කිහිපයකුත්, ජාතක කාව්‍ය කිහිපයකුත්, සහ ද්‍රවිඩ කථා කිහිපයක් පෙරළා කළ කාව්‍ය කිහිපයකුත් හැර, මේ සමයෙහි ලා වෙන කිව යුතු ශාස්ත්‍රීය ග්‍රන්ථයෙක් දක්නට නැති. මේ වන විට යම් යම් ස්ථානයක සාහිත්‍ය සේවයට තරම් මුහුකුරා ගිය බුද්ධිය ඇති පඬිවර කෙනකුන් සිටිය ද, එතුමන්ට ග්‍රන්ථ කරණාදිය සඳහා කිසි දු අවකාශයක් නැතිවීම ඊට මුඛ්‍ය හේතුව විය.

අකුරු කරවීමත්, සාමාන්‍ය වශයෙන් ඒ ඒ විහාරස්ථානයන්හි බණ-දහම් පුරුදු කරවීමත්, හැර ප්‍රසිද්ධ ශාස්ත්‍රශාලා මගින් කරවූ අධ්‍යාපනයක් ගැන ද, අසන්නට නැති. දෙවැනි රාජසිංහ රජු භික්‍ෂූන්ට ඉගැන්වීම සඳහා පිහිටූ වූ 'හඟුරන්කෙත විද්‍යාස්ථානය' මෙවක අසන්නට ලැබෙන එකම ශාස්ත්‍රශාලාව යි.

සොළොස්වැනි ශතවර්ෂය සිංහලය යුරෝපීය භාෂාවක් සමග ඝට්ටනය වූ ප්‍රථම අවස්ථාව ද විය. ශතවර්ෂ එක හමාරක් පමණ වූ දීර්ඝ කාලයක් ලංකාවේ පැවැති පෘතුගීසි භාෂාවෙන් සිංහල සාහිත්‍යයට විශිෂ්ට සේවයක් සිදු වීමට අවකාශ තිබුණි. නොයෙක් විෂයීය ග්‍රන්ථ ඇති කර වීමෙන් අපේ සාහිත්‍ය වංශය පොහොසත් කරවීම, එයින් ලැබිය හැකිව තිබුණු උසස් සේවය යි. එ නමුත් පෘතුගීසීන්ගේ පාලන ක්‍රමයේ පැවැති දුෂ්ටත්වය නිසා එය නැතිවී ගියේ ය. නො වැළැක් විය හැකි පරිද්දෙන් පැමිණි ව්‍යවහාරානුගත වචන කිහිපය සිංහලයට පෘතුගීසි භාෂාවෙන් ලැබුණු ලාභය වුව ද, පෘතුගීසීන්ගේ ක්‍රියා මාර්ගය නිසා වැඩෙමින් පැවැති සිංහල සාහිත්‍යයට අත් වූ විපත ඊට වඩා හානි කර විය. ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ මේ තත්ත්වය විමසීමේදී සිංහල සාහිත්‍ය වංශයේ 'නූතන අවස්ථාව' පිළිබඳ මේ **භායනතරඩගය** අපේ සාහිත්‍ය සෙවීන් පිත වීමෙහි පොහොසත් නො වන බව පෙනී යේ.

# ග්‍රන්ථ විවරණ

මෙසේ 'නූතන අවස්ථාව'ට අයත් භාෂනන්තරඩගය පිළිබඳ දේශීය- ශාසනික- හා ශාස්ත්‍රීය ප්‍රවෘත්ති සැකෙවින් දක්වා ප්‍රාප්තාවසරයෙහි මෙම තරඩගාගත තත් තත් ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයෝ අනුක්‍රමයෙන් විවරණය කරනු ලැබෙත්.

## රාජසිංහ විරුදාවලි i

**කර්තෘ:-** ඌවේ කුඩා මොහොට්ටාල,
**කාලය:-** ක්‍රි: ව: 1634-38 අතර.
**ප්‍රමාණය:-** පද්‍ය 112.

"ගද්‍ය පද්‍යමයී, රාජස්තුතිර්විරුද මුච්‍යතෙ' යි රජුනට සෙතාත්‍ර සඳහා ගද්‍ය-පද්‍ය ද්වාරයෙන් කරනු ලබන ප්‍රබන්ධයෝ 'විරුද කාව්‍ය' නම් වෙති කිහ. 'විරුද මණිමාලා' ආදි එකී ප්‍රබන්ධ සංස්කෘත සාහිත්‍යයෙහි බෙහෙවින් ප්‍රකටය හ. එහෙත් සිංහල කවීනට 'විරුදු කාව්‍ය' බන්ධනය හුදු පද්‍යයෙන් ම අභිමත විය. සිංහල සාහිත්‍ය වංශයෙහි දක්නට ලැබෙන මේ විරුදාවලීන් අතුරෙහි සම්භාව්‍ය වූයේ ද, පුරාතන වූයේ ද, කෝට්ටේ සමයෙහි සිරි පැරකුම්බා නිරිඳුන්ට සතුති මුඛයෙන් කළ **පැරකුම්බා සිරිත** යැ. ඊට පෙර සිංහල විරුදාවලීන්ගේ සම්භව යෙක් නො වී ය යි තැකීමට ඉඩෙක් නැති. එහෙත් එ බන්දෙක් වී නම් තකීනයට පවා හේතු නො තබා අප හමුයෙහි කාලධූමයෙන් වැසී ගියේ ය.

ක්‍රි: ව: 1634 දී සෙංකඩගල පුර රජ පැමිණි රාජසිංහ ii මහීපාලයන්ගේ සමයෙහි බිහි වූ විරුදාවලීහු බොහෝ වෙති. ඒ බව:—

'පුබුදු කරන සැම දන මන කොඳ කැන් කුමුදාකර අයු රූ
පසිඳු තෙදණ දිය රජසිහ සොබමන් දිපද දිප මහ රූ
විරිදු කිවිදු බැඳ හෙළු සහ දෙමළෙන් විරුදාවලි ගැමු රූ
කිවිඳු දෙපස සිට පවසති මුදුනෙන් නුමුදා කර තමු රූ'

යනුවෙන් හැඟේ ම ය. එකී විරුදාවලීන් අතර අප හමුවට පැමිණියෝ කිහිපයකි. ඉන් ඌවේ කුඩා මොහොට්ටාල නමැති කවීන්ද්‍රයාණන් විසින් රචිත ය යි සලකන ග්‍රන්ථය පළමු වැන්න හැටියට සැලකේ.

සිංහල කවීනට පුරුදු වූ විරුද කාව්‍ය ලක්ෂණයෙන් නිබන්ධ හෙයින් විරුදාවලි යනු මෙම කාව්‍යයට සාමාන්‍ය සංඥා ය. රාජසිංහ රජුගේ චරිතය වැනූ හෙයින් **රජසිහ සිරිත** යි හෝ,ඔහුට සතුති මුඛයෙන් කී හෙයින් **රජසිහ විරුදුව** යි අන්වර්ථ සංඥා යි සවකීය රජු කෙරෙහි කවියා තුළ පැවැති භක්ති ප්‍රේමාතිශය ග්‍රන්ථ කරණයෙහි නිමිති වීය යි සැලකිය හැක්ක.

ඌවේ කුඩා මොහොට්ටාල නමැති කවීන්ද්‍රයෝ මෙහි කර්තෘ වූහ යි බොහෝ දෙනා සලකති. එහෙත් ග්‍රන්ථයෙහි කිසි තැනෙක හි දු කර්තෘ නාමය නො දක්වූ හෙයින්, යථොක්ත මතයට සාධක නැති. එතෙකුදු වුවත්, කුඩා මොහොට්ටාල රාජසිංහ ii රජුගේ කවි සභායෙහි වැජඹුණැ යි ද, ඔවුන් විසින් 'රජසිහ විරිඳු' වක් රචිත ය යි ද, අසන හෙයින් යථොක්ත මතයට ඉඩ හැරීම මැනව යි හඟිමි. මේ කවීන්ද්‍රයෝ ඌව රට සවජන්මයෙන් හෙළි කරමින් රාජසෙවයෙහි හා රාෂ්ට්‍ර සෙවයෙහි යෙදුණෝ ය. රාජසිංහ ii රජතුමා ඌවේ උපන්නෙකි. එතුමන්ගේ කුමාර කාලයෙන් වැඩි කලක් ගත වූයේ ද ඌවෙහි ය. රන්දෙනි වෙලේ සිදු වූ මහ සටනෙහි සිංහල සේනාව මෙහෙයන ලද්දේ සතළොස් හැවිරිදි වූ ඒ රාජසිංහ කුමාරයන් විසිනි. මෙ සෙයින් රාජසිංහ කුමරු ඌවේ වසන විට, එතුමන් හා කුඩා මොහොට්ටාල අතර සම්බන්ධය ඇතිවූ බව සිතා ගත හැකි ය. මේ හැර ගත් කතුවරයන් පිළිබඳ දක්විය හැකි පුවතෙක් මේ තාක් සුලභ නො වී ය. එහෙත් ඔවුන් පිළිබඳ විසිතුරු කථා* ශ්‍රැයමාන ය.

---

*ඌවේ කුඩා මොහොට්ටාල රාජසිංහ ii රජුගේ භක්තිමත් සෙවකයෙකි. මහා මන්ත්‍ර වෛදියෙකි. ඌව වැසියන් විසින් හෙතෙමේ මහත් ආදරයෙන් සම්භාවනා කරන ලද්දේ විය. එහෙත් එතුමන්ගේ අවසානය පිළිබඳ අසන්නට ලැබෙන පුවත ඉතා දුක් උපද වන සුලු ය.

දිනක් රාජ සෙවයට යන මොහොට්ටාලට රාජාඩගනයට පිවිසෙන දොරටුව අසල අඹ ගසෙහි මිරණිවූ ලීලාවෙන් සිටි එක්තරා ගම් දරුවෙක් අවමන් කෙළේය. අභිමානවත් මොහොට්ටාල අඹ ගසෙහි සිටි කොලුවාගේ පා යටින් යනු නො රිසි වැ, ගසින් බසින ලෙස ඔහුට නියෝග කෙළේ ය. එහෙත් කොලුවා සොපහාස සිනහවෙන් අවඥකොට 'තා කැමැති නම් මා පා යටින් යා' ය යි මොහොට්ටාලට කීයේ ය. මේ මිනිසකු නො වැ අමනුෂ්‍යයකු බව එක් වරට ම තේරුම් ගත් මොහොට්ටාල රාජ සෙවයට නො ගොස් ආපසු හැරී බහිරව බන්ධනය ජප කරන්නට පටන් ගත්තේ ය. සියලඟ ගිනි දැල් වැළඳ ගත් කලෙක මෙන් පරිදහයෙන් වේදනාවට පත් බහිරව තෙමේ තමා මෙ උවදුරින් මුදවා ගැනීමට උත්පලවණ්- සුමන- කාතිතිකෙය- විභිෂණ යන සිවු මහ දෙවියන් කරා ගියේ ය. අවාසනාවකි! දෙවියෝ සිවු දෙන ම මොහොට්ටාලගේ නියෝගයෙන් යම් යම් කටයුතු වල යෙදී සිටියෝ ය. විභීෂණ තෙමේ බහිරවයා අමතා "එම්බල- තිවට- අඥාන- තමා පමණ නො දත් කාලකන්නිය! අපි දු මොහොට්ටාල ස්වාමීන්ගේ නියෝගය රක්නෝ වම්හ. එසේ කල තා මුදන්නට අපට කිසි දු ශක්තියෙක් නැති. එතකුදු වුවත්, මම තට උවදෙසක් දෙමි. තා මේ උවදුරින් මුදවා ගත හැකි වේ නම් රාජසිංහ රජුට පමණි. එ හෙයින් එතුමන් යදුව" යි කී ය. බහිරව තෙමේ රජු වැඳ සතුරු තොරතුරු සියල්ල කියා, සියලු නිධාන යනුත් දෙන බව දන්වා මේ උවදුරින් තමා මුදන ලෙස යාඥා කෙළේ ය. රජ්ජුරුවෝ මොහොට්ටාල ගෙන්වා බහිරව බන්ධනය මුදා හරින ලෙස නියෝග කළහ. "ගැත්තාට අවසර ලැබෙන්නකි" ය යි හිස් මුදුනෙන් පිළිගත් මොහොට්ටාල බහිරව බන්ධනය මුදා හැර ගෙදර බලා ගියේ ය. මග රැක සිටි බහිරවයා ගලකින් ගසා මේ කීර්තිමත් පුරුෂයා මරණයට කැප කෙළේ ය. කලින් මොහොට්ටාලට මෙ බඳු උවදුරක් නො වන ලෙස බහිරවයා පොරොන්දු කරවා ගත නො හැකි වීමෙන්, සිදු වූ මේ විපත ගැන රාජසිංහ රජු මරණය දක්වා පසු තැවිලි වූ ල.

මේ කථාව සත්‍යයෙන් කෙතෙක් ඇත් වුව ද, මොහොට්ටාලගේ අභිමානයත් මන්ත්‍ර වෛශාරද්‍යය ත්, ආශ්චර්ය්‍ය පුරුෂයකු මෙන් මහජනයා සැලකූ බවත්, පෙන් වීමට නම් මේ කදිම සාක්ෂියකි.

ඌවේ මොහොට්ටාල විසින් මේ ස්තෝත්‍රය බඳනා ලද්දේ රාජසිංහ රාජ්‍ය කාලය වූ ක්‍රි: ව: 1634–84 යන පනස් වස අතර බව නි සැක ය. රාජසිංහ රජු හා පෘතුගීසින් අතර ගන්නෝරුවේ සටන සිදු වූයේ ක්‍රි: ව: 1638 දී ය. රාජසිංහ ස්තෝත්‍රයක ගෞරවයෙන් දැක් විය යුතු මේ සටන පවා මේ ග්‍රන්ථයෙහි වචන මාත්‍රයකිනු දු නො දැක් වේ. මෙසින් පෙනෙනුයේ මෙම විරිදුව ගන්නෝරුවේ සටනින් පළමු රචිත වූ බවෙකි. තවද, යට දැක්වූ පද්‍යයෙන් මෙය රාජසිංහ රජු පිළිබඳ ආදිම විරුද වලිය නොවන බවකු දු හැඟෙයි. එබැවින් ක්‍රි: ව: 1634–38 අතර වූ වර්ෂ චතුෂ්ටයාගේ අවසාන භාගය මෙහි නිර්මාණ සමය ලෙස පිළිගැනීම යුක්ති තර ය.

මේ විරුද කාව්‍යය විවිධ වෘත්තයන්ගෙන් යුත් පද්‍ය එක්සිය දෙළසකින් ප්‍රතිමණ්ඩිත යැ. ත්‍රිවිධ කාව්‍ය මුඛයන් අතුරෙන් ආශීර්වාද මුඛයෙන් විරචිත යි. එහි ප්‍රථම පද්‍යය මෙසේ යි: —

'පොත ත් කිර කර ගිරි සිර වර ණා
ස සා ත් ආර සර කර උර බර ණා
මෙ ස ත් සාර කර හිම මෙර දෙර ණා
ර කි ත් වීර වර රජසිහ නර ණා'

මෙසේ බ්‍රහ්මාදි දෛවතයන් සිහිකොට රජුට අභිෂ්ට ප්‍රාර්ථනය ද, දෙ වැන්න පටන් සත් පනස් වැන්න තෙක් රාජ වර්ණනා ද, එ තැන් පටන් අනූ වැන්න දක්වා රජුගේ කිසියම් ප්‍රියාවකගේ වාක්ව්‍යාජයෙන් විප්‍රලම්භ ශෘංගාර රස සෙවක පද්‍ය සමූහයක් ද, එතැන් පටන් රාජ ස්තෝත්‍ර ද, දක්වා ඇත්තේ ය.

මෙහි භාෂාව බෙහෙවින් ශ්ලිෂ්ට සංස්කෘත ශබ්ද යන් හා මිශ්‍ර වූ සිංහල ය යි. උපමා රූපකාදි අර්ථාලඞ්කාරයෙන් යුක්ත වූයේ, ශ්ලිෂ්ට ගුණෝපේත ද වෙයි. රසයෙන් ආර්ද්‍ර වැ, අලඞ්කාරයෙන් සාලඞ්කාර වැ ගුණයෙන් සාටෝප වූ එම පද්‍යයෝ ශ්‍රොතෘන්ගේ චිත්තාහ්ලාදය පිණිස පවත්නාහු ය.

මේ විරුද වලිය ගෙතීමේදී 'පැරකුම්බා විරිදුව' ආදර්ශයට ගෙන තිබේ. මෙහි පැනෙන බොහෝ පද්‍යයන් රචනා මාර්ගයෙහි ලා ඒ හා සමානත්වයක් භජනය කරන හෙයිනි. සමහර පද්‍යයක අදහස් ද බොහෝ සෙයින් සමව ගොස් තිබේ. 'පැරකුම්බා සිරිතෙ' හි දැක්වෙන 76, 77, 79, 90 යන පද්‍යයන් හා මෙහි 42, 36, 37, 93 යන පද්‍යයන් අනුක්‍රමයෙන් ඒ සඳහා නිදර්ශන කළ හැකි ය.

මේ මෙසේ වුව ද, කුඩා මොහොට්ටාලගේ රචනා ශක්තිය පැරකුම් විරුද කරුවනට වඩා කිසිසේත් දෙ වැනි නො වේ. එයට ඔබගේ කෘතිය ම සාක්ෂි යැ. එද සිංහල සාහිත්‍ය වංශයේ උද්දීප්තිය ගෙන දෙන විරුද වලියෙක් මැ යි.

# රජසිංහ විරුදාවලි ii

කර්තෘ:- බිම්තැන්නේ ස්වාමි.
කාලය:- ක්‍රි: ව: 1638 ට සමීප.
ප්‍රමාණය:- පද්‍ය. 119.

අප අතට පත් රජසිංහ විරුදාවලීන් අතර බිම්තැන්නේ ස්වාමින්ගේ කෘතිය දෙ වැන්න කොට සැලකිය හැක්ක. කතුවරයන්ගේ නාමය ග්‍රන්ථයෙහි සඳහන් වැ නැත ත් කුඹා මොහොට්ටාලට මෙන් බිම්තැන්නේ ස්වාමීන්ට මෙහි කර්තෘත්වය ජන සම්මතයෙන් චිර කලක සිට ම පිරි නැමී තිබේ. කරුණු දක්වා සමර්ථනය කළ හැකි විරුද්ධ මතයක් පැන නගින තුරු, ඔබ මෙහි කර්තෘත්වයෙන් සැලකීම මැනවි. පොත පතින් තබා ශ්‍රුති මාත්‍රයකිනු දු මේ ගත් කතුවරයන් ගැන සැලකිය යුතු වෘත්තාන්තයෙක් මේ තාක් අපට හමු වී නැති.

ක්‍රි: ව: 1638 දී සිදු වූ ගන්නෝරු සටන මෙහි මැනවින් දැක්ත යැ. මින්පසු රජසිංහ රජු විසින් කරන ලද කිසිදු සටනක් පිළිබඳ නාම මාත්‍රයකු දු සඳහන් වී නැත. ගන්නෝරු සටනින් රජු ලැබූ විජය ශ්‍රිය වර්ණනා කිරීම මේ විරුදාවලිය ගෙතීමෙහි ලා මුඛ්‍යාර්ථය කොට ගත්කරුවන් සැලකූ බව පෙනේ. එ බැවින් මෙය ගන්නෝරු සටනින් පසු ඒ හා සමීප කාලයෙහි රචිත බව සලකනු යෙදේ.

මෙය ද කුඹා මොහොට්ටාලගේ විරුදාවලිය මෙන් ම විවිධ වෘත්තයන්ගෙන් නිබද්ධ පද්‍ය එක්සිය එකුන් විස්සකින් සමුපේත ග්‍රන්ථයකි. ආශිර්වාද මුඛයෙන් අරඹා තෙ සැත්තෑවැනි පද්‍යය දක්වා රාජ වර්ණනය ද, ඉක්බිති විරහිනී විලාප වශයෙන් නිබද්ධ පද්‍ය කතිපයක් ද, අවසානයෙහි රාජ ස්තොත්‍ර ද, දැක්වීම මෙහි වර්ණිත ක්‍රමය වේ. මේ නිසා මෙහි රචනා මාර්ගය පූර්වෝක්ත විරුදාවලී ක්‍රමය මැ යි.

එහෙත් බිම්තැන්නේ ස්වාමීන්ගේ කථා මාර්ගය ඒ හා කිසිසේත් සමාන නො වේ. මේ ස්තොත්‍රද්වය සංසන්දනය කරත්, කියවන්නා තුළ රජු කෙරෙහි සාභිමාන ගෞරවය උපදවා රාජභක්තිය ඉස්මතු කරවීමෙහි ලා බිම්තැන්නේ ස්වාමීන්ගේ විරුදාවලිය වැඩියක් සමර්ථ වන බව පෙනේ. මේ කවියාට අභිමත වූයේ පැරකුම්බා විරුදාවලී මාර්ගය අත් නො හළ කුඹා මොහොට්ටාලගේ රාජස්තුතිය වැනි විරුද කාව්‍යයක් ගෙතීම නො වැ, රජු කෙරෙහි තමන් තුළ පැවැති අතිමාත්‍ර සාදර භක්තිය ගායනා කොට දැක්වීම ය. ගන්නෝරු සටනින් රජු ලත් ජයග්‍රහණයෙන් උතුරාගිය ප්‍රීතියෙන් මත් වූ බිම්තැන්නේ ස්වාමීහු, ප්‍රතිමල්ලයා අභිභවා ජයඝෝෂය කරන පොර කුකුළකුගේ අහංකාරයෙන් යුක්ත වැ රාජසිංහ රජුගේ වීරත්වය අතිශයොත්කර්ෂයෙන් වර්ණනා කෙරෙත්.

‘ගන් නෝරුවෙ මාඩිලාපු පරංගි ජනයා සමගි තා
වන් තද වේගයෙන් යුදට රකුස් කැලන් ලෙසින් සෙදි තා
රම් රද සේ රාජසිංහ නිරිඳු වැදී සෙන් සමගි තා
දූන් බැට මේ කප පවතින යුදයකි ඉර සඳේ අදි තා’

රජු කෙරෙහි පැවැති ප්‍රසාදාත්මක හැඟීම ඔප නැගී එන්ම, සතුරා අනුස්මරණය වීමෙන් ඇතැම් විට ගත් කතුවරයෝ කෝප හරිත වෙති. මෙහිදී බිම්තැන්නේ ස්වාමීන් සතුරා පරිභවයෙන් හෙළා දක්නේ නුවණ නො මේරූ හැසි-දූසි ගැමියකුගේ බසිනි.

‘දෙවා බලුබැට දෙමින් වාලට මුගුරු ගල් මුල්වලින් තැන තැන
නො වං යුදයට දූපුණු ජනයා සමග අපමණ ගෙරින් අවගු න
ප වා තුරුහිස පමණ ඔලුගොඩගස්සවා අටුගණන් වෙන වෙන
ව වා සිරිලක මඟුල් ගෙය ලෙස කෙළේ පෙර මෙම මඟුල් යුදයෙනා’

ග්‍රන්ථයෙහි කිහිප තැනක ම පෙනෙන මෙබඳු යෙදුම් ස්වපාක්ෂික කියවන්නාතුළ සාභිමාන විකට සිනහවක් ඉපදවීමෙහි පොහොසත් වුව ද, බුද්ධිපාරිනත්‍යයට ගිය පඬිවරයකු තුළ නො පිහිටිය යුතු නො සත්සුන්කමකින් ගත්කතුවරයන් ලකුණු කිරීමට අවකාශ ගෙන දෙයි. කිහිපයක් නමුදු එබඳු පද්‍ය ඇතිවීම නිසා බිම්තැන්නේ ස්වාමීන්ගේ මේ ස්තොත්‍රය ග්‍රන්ථ විවේචකයකුගේ දෝෂ දර්ශනයට ලක් වන්නේ ය. මෙය මෙසේ වුවත්, මේ රචනාව, කියවන්නාත්, අසන්නාත්, එකසේ තෘප්ත කරවීමෙහි ලා සමර්ථ වෙයි. උත්පාදක කවිත්වය ප්‍රකට කරවන ආහ්ලාදජනක වර්ණනාවලින් මෙම ස්තොත්‍රය පරිපූර්ණව පවතී.

## රාජසිංහ විරුදවලි iii

කර්තෘ :— අවිනිශ්චිතයි.
කාලය :— ක්‍රි: ව: 1642—44 අතර.
ප්‍රමාණය :— පද්‍ය 214.

පරඞ්ගිහටන නමින් ප්‍රකට ග්‍රන්ථය ද යථෝක්ත ග්‍රන්ථ ගණයෙහි ලා ගැනෙන තවත් ‘රාජසිංහ විරුදවලිය’ කි: එහි කර්තෘ අවිනිශ්චිත ය. වාර්තාමානික බොහෝ දෙනකුන් එහි කර්තෘත්වය අලගියවන්න මොහොට්ටාලවෙත හිමිකරවතු දු, එය සමර්ථනය කිරීමට සාධක මෙතෙක් ඉදිරිපත් වී නැති. ගත්කතුවරයන් නිශ්චය කිරීමෙහි සාධක හමු වන තුරු මේ විරුදවලිය අවිනිශ්චිත කර්තෘක කොට තබනු මැනවි.

සම්මතව පවත්නා ‘පරඞ්ගි හටන’ යන ග්‍රන්ථ සංඥාවෙන් මෙය පෘතුගීසීන්ගේ ලංකා සටන් පිළිබඳ ඉතිහාස කථාවක් මෙන් හැඟියන නමුදු, සැබවින් ම මෙය වූකලී එබඳු පුරාවෘත්ත කථාවක් විස්තර වන ග්‍රන්ථයෙක් නො වේ. ගන්නෝරුව යුද්ධය වැනි ඇතැම් පරඞ්ගි හටනක් මෙහි සඳහන් වතු දු, ගත්කතුවරයන්ගේ අදහස වූයේ ඒ සටන් පිළිබඳ ඉතිහාස වාර්තාවක්

ලියා තැබීම නො වැ, ඉන් රජසිංහ රජු ලැබූ විජයශ්‍රීය වර්ණනා කරමින් රජු සොත්‍රයෙන් පැසසීම ය. පූර්වෝක්ත ග්‍රන්ථද්වය මෙන් ම මේ කාව්‍යය ද අවසානය තෙක් ම රචනා කරන ලද්දේ, විරුද කාව්‍ය ලක්ෂණයෙනි. එ බැවින් මේ ග්‍රන්ථයෙහි ප්‍රධාන නාමය විය යුත්තේ 'රජසිහ සිරිත' හෙවත් 'රජසිහ විරුදුව' යන්න මැ යි. 'පරංගිහටන' යනු ආනන්තර සංඥාවක් වශයෙන් සලකනු යෙදේ.

මේ විරුද කාව්‍යය රචනා කරන ලද්දේ රාජසිංහ රජුගේ රාජ්‍යය සමයෙහි බව නිසැක ය. එහෙත් ඒ රජුගේ රාජ්‍ය කාලය වූ පනස්වස අතර කිනම් වර්ෂයක රචිත ද? යන්න සිතාගත යුත්තේ ග්‍රන්ථාගත කරුණු පරීක්ෂණයෙන් විමසා බැලීමෙනි.

ක්‍රි: ව: 1640 දී පෘතුගීසීන්ගේ ගාල්ලේ කොටුව යටත් කොට ගැනීම රාජසිංහ රජුගේ සටන් පිළිබඳ මෙහි දැක්වෙන අවසාන ප්‍රවෘත්තිය යි. මෙ පුවත දක්වන විරුදකාර තෙමේ ඊට ප්‍රථමයෙන් යටත්කොට ගත් මීගමු කොටුව ගැන සඳහන් නො කරයි. ඊට හේතුව ක්‍රි: ව: 1642 දී පෘතුගීසීන් විසින් මීගමුව නැවතත් අල්ලා ගැනීම විය යුතු ය. පෘතුගීසි බලය එම කොටුවෙන් සම්පූර්ණයෙන් නැතිවී ගියේ, ක්‍රි: ව: 1644 දී දෙ වැනි වරට අත්කර ගැනීමෙන් පසුව ය. මේ විරුද කරුවෝ ක්‍රි: ව: 1644 න් පසුව සවකිය රචනය කළාහු නම් එකී ප්‍රවෘත්තිය ද මෙහි සඳහන් කෙරෙත්ම ය., මීගමුවට වැඩි බලයක් නො පැවැති මඩකලපුව දිනීම සඳහන් කරන ගත් කතුවරයනට මීගමු ප්‍රවෘත්තිය අමතක නො විය යුතු හෙයිනි. එ බැවින් මෙය ක්‍රි: ව: 1642 – 44 යන දෙ වර්ෂය අතර කාලයක රචිත බව මේ අනුව සිතා ගත හැක්ක.

මේ වූකලි මෙතෙක් අප හමුවට පැමිණ තිබෙන විශාල ම විරුදාවලිය යි. එහි ප්‍රමාණය පද්‍ය දෙසියතුදුසෙකි. රචනා ක්‍රමයෙහි ලා දක්නට ලැබෙන විශේෂය නම් අන් විරුදාවලින්හි නො පැනෙන අමුතු වෘත්තලක්ෂයන්ගෙන් බඳනා ලද පද්‍ය සමූහයක් ඇතිවීම ය. දෙවතා නාමානුස්මරණයෙන් රජුට ආසිරි පතා සිය විරුදාවලිය ඇරඹූ මේ ගත්කරු තෙමේ විප්‍රලම්භ ශෘංගාර රසය බෙහෙවින් ගරු කළ කෙනෙකි. ග්‍රන්ථ මධ්‍යයෙහි කිහිප තැනකදී ම රජප්‍රිය වල්ලභාවකගේ වාක් ව්‍යාජය ගත්තේ එහෙයිනි.

ගත්කරුවෝ අද්භූත වූ සවයං ප්‍රතිභානයෙන් සමන්විත යෝ යැ. කොතරම් විශාල අදහසක් වුවද, වචන කිහිපයකින් දැක්වීමේ සාමර්ථ්‍යය මේ කවියාතුළ නිසගීයෙන් පිහිටියේ ය. කවියා තෝරා ගත් උපමාවෝ ද වර්ණනයට අතිශයින් ගැලපෙන්නේ ය. කාව්‍යනායකයාගේ අනභිභවනීය ප්‍රතාපය වර්ණන කවියාට පෘතුගීසි ගජනා (තුවක්කු) වල භයංකර ඝෝෂය ඇසුණේ, පරාජයට පත් පෘතුගීසීන්ගේ සුසුම් හෙළීමක්

මෙන් ලං. අටලොස්වැනි පද්‍යයෙහි දැක්වෙන මේ උපමාව කවියාගේ මනොභාවය ප්‍රකට කරවීමෙහි ඉතා සමර්ථ යැ. මෙහි පැනෙන සෙසු බොහෝ උපමාවෝ ද මෙසේ අර්ථව්‍යක්තියෙහි නිපුණයහ. කාව්‍ය කතුවරයෝ ද රාජසිංහ රජු කෙරෙහි අතිශයින් ඇලුම් ඇත්තෝ ය. එහෙයින් ම—

'කරුණා ගුණ සිහිලඹ ඉසිමින් මුළුලොව සදවා ලා
දෙරණ පත් බුදුකුරු උතුමෙකි රජසිහ නරපා ලා'

'සෙසු නිරිඳුන් දුන්නත් මිණි රුවන් කැ ළි
අප නිරිඳුන් වදහල වදනක් නො ව ළි'

'දේ වා දිගා සිරි රජසිහ නිරිඳුන් ඩ
වේ වා දිගා මුළු කප් හිමි වැඩ ඉත් ඩ'

ආදි භක්ත්‍යාලාපයෝ මේ විරුදාවලියෙහි නිරායාසයෙන් වැදූ ගත්හ.

භාෂා තත්ත්වය අතින් මේ ග්‍රන්ථය එතරම් මට සිලුටු නො වේ. සවභාෂා විෂයෙහි මනා දැනුමක් ඇත්තකුට විනා බොහෝ පද්‍යයන්හි අර්ථාවගමය සෙස්සනට දුෂ්කර වෙයි. එහෙත් මේ ග්‍රන්ථයෙන් ලැබෙන ගීතාස්වාදය නම් කවරකුට වුවද, ඉදුරා ලැබිය හැකිය. මෙහි දැක්වෙන නොයෙක් වර්ණනාපටලයන් අතර රාජසිංහ රජුට රණමඬුලයක් වූ ගන්නෝරු සටන මේ විරිදුව කියවන්නකුගේ සිත වෙසෙසින් ඇදියන තැනකි. ග්‍රන්ථාරම්භයෙහි දැක්වෙන පද්‍ය කිහිපය කුඩා මොහොට්ටාලගේ කෘතියෙහි ආරම්භක පද්‍යයනට රචනා විලාශයෙන් හා පදයෙන් සමානත්වයක් දක්ව යි.

ග්‍රන්ථයේ මේ තත්ත්වය විමසීමේදී මෙ ද අපේ සාහිත්‍ය වංශයෙහි ජ්‍යෙෂ්ඨ විරුදාවලියක් හැටියට ගණන් ගැනීම සුදුසුය.*

* රාජසිංහ ii රජුට ස්තෝත්‍රවශයෙන් කරන ලද ග්‍රන්ථ කිහිපයකි. මින් රාජසිංහ විරුදාවලිය i ඒ පොත් ගණයෙහි මෙකල දක්නට ලැබෙන ආදිම ස්තෝත්‍රය යි. ඒ කෘතිය දුටු තවත් කීපදෙනකුන් විසින් විරුදාවලින් ගොතා ඔප්පු කළ බව කියනු ලැබේ. මේවා අතර දැනට ප්‍රචාරයට පත් ව තිබෙන්නේ මෙහි විස්තර වූ විරුදාවලීත්‍රය පමණක්. එහෙත් මේ ගණයෙහි ම ලා ගැනෙන තවත් පොත් තුනක් මුද්‍රිත ව තිබේ. ඒ **ශ්‍රීනාමය** නමින් දැක්වෙන පොත් දෙක සහ **පවන** ත් ය. මේ පොත් තුන කවීන්ගේ අමුතු රචනා නො වැ, යථොක්ත විරුදාවලීත්‍රයෙන් උද්ධෘත පද්‍යාවලීහු ය.

**ඉදුන් දූමින් අප්පුහාමි** විසින් සංස්කරණය කළ පද්‍ය පන්තිසකින් යුත් **ශ්‍රීනාමය** කුඩා මොහොට්ටාලගේ හා බිම්තැන්නේ ස්වාමීන්ගේ විරුදාවලියෙන් උද්ධෘත පද්‍යමාලාවකි.

ශංගොඩ කිවිඳුන්ගේ කෘතියකැ යි පවසමින් **පියදාස සිරිසේන** මහතුන් විසින් සංස්කරණය කළ පද්‍ය 108 කින් යුත් **ශ්‍රීනාමය** 'පරංගි හටන' නමින් ප්‍රසිද්ධ විරුදාවලියේ කොටසක් මැ යි.

**පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල** ස්ථවිරයන් වහන්සේගේ ශොධනයෙන් බිහි වූ පද්‍ය 323 ක් ඇති **පවන** 'පරංගි හටන' හා කුඩා මොහොට්ටාලගේ විරුදාවලියත් එක්තැන් වූවකි. මේ නිසා රාජසිංහ ස්තෝත්‍ර ප්‍රචාරයට පත් වී තිබෙන අයුරු මහත් අවුලකට හේතු වී තිබේ.

# වෛතාලන් කථා කාව්‍යය.

කර්තෘ :— කිරිමැටියාවේ මැතිඳු.
කාලය :— ක්‍රි: ව: 1734—84 අතර.
ප්‍රමාණය :— පද්‍ය 785.

වෛතාල නම් භූත විශේෂයෙකි. ඉන් එකකු කථා නායකයා කොට ගත් හෙයින් හෝ වෛතාලයකු කී අයුරින් කථාවස්තූන් සංග්‍රහ කරන ලද හෙයින්, මේ ‘වෛතාලන් කථා’ නම් විය. ප්‍රසිද්ධ ඉන්දීය කථාවක් වූ මෙය සිංහල භාෂාවට නඟා කවි කරන ලද්දේ සුප්‍රසිද්ධ කිරිමැටියාවේ මැතිඳුන් විසිනි.

ආණ්ඩුවේ මොහොට්ටාල ධුරයක් දැරූ එතුමා සතලොස් වැනි ශතවර්ෂයේ විසූ ප්‍රසිද්ධ කවිකාරයෙකි. මේ දක්වා අමුද්‍රිත ව පවත්නා **සඬලොක කාව්‍යය, මහාජනක කාව්‍යය, ජන නන්දන කාව්‍යය** සහ **උමන්ද කවත්**, මුද්‍රිත ව පවත්නා **මහපදරඬහජාතක කව** සහ **මහහටන** ත්, එතුමාගේ කෘති හැටියට සලකනු ලැබේ.

පද්‍ය සත් සිය පස් අසූවකින් නිමවුණු වෛතාලන් කථා කාව්‍යයෙහි කථාවස්තු පස් විස්සෙක් අන්තර්ගත වේ. මේ කථා පස්විස්ස සංස්කෘත සාහිත්‍යයෙහි ‘වෛතාල පඤ්ච විංසති කථා’ නමින් ආයේ ය. ද්‍රවිඩ පඬිවරයෝ එය ස්වකීය භාෂාවට නඟා ‘වෛතාලන් කථාව’ සැපයූහ. ද්‍රවිඩ භාෂා විශාරදයකු වූ කිරිමැටියාවේ මැතිවරයන් එය සිංහල කවියට නඟන ලද්දේ ය. ඉන් කථා ප්‍රිය සිංහල ගැමියනට සිදු වූයේ මහත් ලාභයකි.

අනුවාදකයන් පවසන්නාක් මෙන් ම “දෙමළ බස එළි කොට කියනු සිංහල බසින් උගහට” වේ ම ය. එහෙත් ආලඞ්කාරිකයන්ගේ නියුණු නීති–රීතින් හෝ පැරණියන්ගේ සම්ප්‍රදායයන් නොසැලකීම ත්, අදහස් කැටිකොට සතර පදයට නැගීමෙහි කවියාට තිබූ දීඝී පුරුද්දත් නිසා ඒ උගහට බව බොහෝසෙයින් මග හැරුණේ ය. කිරිමැටියාවේ කිවිඳුන් මෙහි ප්‍රමුඛ කොට ගන්නා ලද්දේ අසා සිටිනවුනට වැටහෙන

---

රාජසිංහ සෙතාත්‍ර සංඛ්‍යාවෙහි ලා ගැනෙන කවි පන්සිය ගණනකින් යුත් **මහහටන** නම් පොතක ද; ඇති බව කියනු ලැබේ. මුද්‍රණයෙන් බිහි නො වූ මෙම ග්‍රන්ථයේ තැන් තැන් වලින් උපුටා ගත් පද්‍ය 60 ක් **ගන්නෝරු යුධය** නමින් 1930 දී ප්‍රකාශයට පමුණුවා ඇත. ඒ පද්‍යාවලිය ද සෙතාත්‍රයක ස්වභාවය උසුලයි. එ මතු ද, එහි බිම්තැන්නේ ස්වාමීන්ගේ විරුදාවලි පද්‍යයනු ද, ඇතුළත් ව ඇත. එහෙයින් අමුද්‍රිත ‘මහහටන’ ද ‘රාජසිංහ විරුදාවලිය’ක් බව නිසැක ය. එහි පද්‍ය සංඛ්‍යාව පන්සිය ගණනක් වේ නම් මේතාක් අසන්නට ලැබුණු විශාල ම විරුදාවලිය ද එම විය යුතු ය. රාජසිංහ විරුදාවලින් පිළිබඳ ව ඇතිවී තිබෙන යථොක්ත අවුල නිරවුල් කරගැනීමට ඒ ‘මහහටන’ බෙහෙවින් උපකාරවත් විය හැකි බව වැටහී ගියෙන්, ‘ගන්නෝරු යුධය’ ප්‍රකාශකයන් සොයා ගියෙමු. අභාග්‍යයකි! සිහිල් දිය පිරි පොකුණක් අරක්ගත් දියරකුසකු මෙන් ඒ වෘඬයා එම පොත තමන් ළඟ නැතැ යි අප වංචා කරන්නට තැත් කෙළේය. එහෙයින් ලත් අවසරයෙහි කළ හැකි ව තිබූ ශාස්ත්‍ර සේවය අඬාල සේ නවතා තබන්නට සිදු විය.

සේ කථාව කීම ය. දෙ තුන් තැනක හැර අන් සියලු තන්හි එය මැනවින් ඉටුවූයේ ය. ග්‍රන්ථ සමාප්තිය මදක් අඳුල් වූයේ කවියා වෙහෙස වී උකටලී වැ ගත් හෙයිනැයි හැඟේ.

'තෙද රැසිනි සිංහ ය
වික්මෙන් කෙසර සිංහ ය
දින කුලට සිංහ ය
දියතහිම් අප රජ සිංහ ය'

ගත්කතුවරයන්ගේ මේ පද්‍යය සවකිය සමයේ සිටි රජු පැසසීම සඳහා ය. ඒ හැර ඔහු මෙහි සඳහන් වීමට හේතුවෙක් නැති. ඉන් මේ ග්‍රන්ථය රාජසිංහ ii යුගයට ඇතුළත් කළ හැකි වීම නවීනයනට ලැබුණු ලාභයකි. එහෙත් රාජසිංහ ධීහි පලුන්ගේ දීර්ඝ රාජ්‍යකාලය තුළ කවර වර්ෂයකට මේ කෘතිය අයත්දැ යි නිශ්චය කිරීමට නම් මින් ලැබෙන පිහිටෙක් නැති.

'පෞරන මේ කතාව ය
දෙමළෙන් තුබූ කතාව ය
පෙම සිත් ඉතා ම ය
කියමි වේතාලන් කතාව ය'

නමස්කාර දෙව ස්තෝත්‍රයන්ගෙන් පසු කිරිමැටියාවේ මැති දුන් කථා මාර්ගයට පිවිසි දොරටුව යැ මේ. මින්පසු වෙතාලන් පුවත විස්තර වේ.

**වෙතාලන් පුවත** දිනෙක උමාදේවී ලොවැ කිසිකෙනකුන් නොදත් අභිනවතම කථාවක් කියන සේ සවහතීශ ශිව දෙවියන් ඇයැදූ ය. ඊශ්වරයෝ ද මහත් සතුටින් එය ඉටු කළහ. රහසින් මෙය අසා සිටි බ්‍රහ්ම පුත්‍රයෙක් සිය බිරින්දට කියේ ය. ඕ සිවපත්නියට කීවා. සැපින්නක මෙන් කෝපයට පත් උමාදේවී කිසිවකුත් නො දත් කථාව බඹදේවී කෙසේ දැනුදැ යි? මෙහෙසුරුට රොස් වැ පිටිපා සැනපුනා ය. ඊශ්වර තෙමේ මහත් සේ ශෝක වැ දිවැසින් බලා සිදු වූ සියල්ල ඇති සැටියෙන් දැන, බ්‍රහ්මපුත්‍රයා ගෙන්වා ඔහුට "වෙතාල භූතයකු වේව" යි ශාප කෙළේ ය. රන්වන් බ්‍රහ්ම පුත්‍ර තෙමේ එ කෙණෙහි —

'ම ස් ලේ ලොන් තුමූසුව මන නදි තේ
පු ස් න හ රි න් ඇට වැසූ සම්කසි තේ'

යනුවෙන් පැවසෙන අඳමේ වෙතාලයකු වී ය. මෙහෙසුරුගේ නියමය පරිදි, හෙතෙමේ තමා මුදන වික්‍රම කෙශරී රජු පහළ වනතෙක් වඩුරියන් කටු ඇති එරබදු වෙනෙහි විසුම් ගත්තේ ය.

* * *

වික්‍රම කෙශරීහු රජයට පත්හ. ශාන්තශීල නමැති තවුසෙක් රජුට නවරුවන් මුවා දෙළුම් ගෙඩි තැගිකොට, පොළඹවා වෙතාලයා අල්ලා දෙන සේ මෙහෙසී ය. රජ්ජුරුවෝ

අව පසළොස්වක් දිනෙකැ මධ්‍යම රාත්‍රියෙහි කළු සළු පිළියෙන් සැරසී එරබදු වනයට ගිංගා වෙතාලයා අල්ලා ගත්තේ ය. "පින්වත! මම ඔබට කතාවක් කියමි" දූ හී? උපායශූර වෙතාලයා රජුගෙන් ඇසී ය. රජු 'මැනවැ' යි පිළිත කෙලෙන් මෙ කවෙළි, පළමු වැනි පදමාවතී කථාව කියා රජු ප්‍රීතියෙන් මුළා වෙද්දී. අත මුදගෙන එරබදු රුකට නැග ගත්තේ ය. දෙවැනි වර ද රජු ඉතා අමාරුවෙන් වෙතාලයා අල්ලා ගත් කල්හි ද, එසේ ම කථා රසයෙන් රජු මත්කොට එරබදු රුකට පැන ගත්තේ ය. මෙසේ සූවිසිවරක් ම රජුට කතාවක් කියමින් පලා ගියේ ය. ඒ කථා පස්විස්ස මෙහි සැත්තෑ වැනි කවේ සිට සත්සිය එක්සැටවැනි පද්‍යය දක්වා විස්තරව ඇත්තේ ය. රජු මත් කිරීමට වෙතාලයා කියූ කථාවන්හි රසය ගැන අමුතු වැනුම් නො වුවමනා යැ. මෙහි දක්වෙන ඒ කථා පස්විස්ස නම් වශයෙන් මෙසේ හි.

1. පදමාවතී. 2. චන්‍ද්‍රවතී. 3. ශිරා. 4. වීරසෙවක. 5. කුම්. 6. පුරන්සෙට්ටි. 7. ඉස්වැලැක්කු. 8. කප්පඩි සෙවක. 9. රරාට්ටනාපති. 10. මදනසෙනී. 11. ඉන්‍ද්‍රා කෙශරී. 12. අරුණ්ඩ බ්‍රාහ්මණ. 13. තික්ඛන් අමාත්‍ය. 14. මරණ තානාපති. 15. දණ්ඩරූප. 16. තෙසිවබ්‍රාහ්මණ. 17. තිමිනාවක්කන් රාජ. 18. උල්මාවතී. 19. ඉන්‍ද්‍රා ඥානකවතී. 20. පිණ්ඩපත්‍රදන. 21. පුංගමවාජ. 22. වෙනාඩග. 23. සිංහ. 24. ජීවිතමරු. 25. පොලිකඩ.

පස්විසිවැනි වර තමා අල්ලා ගත් විට වෙතාල තෙමේ තමා ගෙනයන්නේ කුමක් සඳහාදැ යි ඇසී ය. ශාන්තශීල තාපස යනට දෙනු සඳහා යැ යි කීවිට, ඒ ඔහුගේ දුෂ්ටෝපායකැ යි වෙතාලයා කීයේ ය. ඉක්බිති ඔහු දෙදෙන තමන් සම්මතකොට ගෙන හොමයෙහි පිදීම සඳහා තාපසයා දල්වා තිබූ ගිනි වළෙහි ඔහු ම හොවා තවුසාගේ දුෂ්ටෝපායයෙන් මිදුණහ. රජ්ජුරුවෝ වෙතාලයන් හට ඔහුගේ පූර්වාත්මය වූ බ්‍රහම රූපය ඇතිකරවා සිය නුවරට ම පැමිණියෝ ය.

## මහ හටන

කර්තෘ :— කිරිමැටියාවේ මැතිදු
කාලය :— ක්‍රි: ව: 1658—84 අතර
ප්‍රමාණය :— පද්‍ය 150

මේ වනාහි දෙවැනි රාජසිංහ රජු විසින් පෘතුගීසීන් සමග කරන ලද සටන් හඳුන්වමින් ලියූ සාමාන්‍ය කාව්‍යයකි. ග්‍රන්ථ සංඥාව පොතෙහි කිසිදු තැනක සඳහන් ව නැති. එහෙත් ව්‍යවහාරයෙහි මෙම කාව්‍යය 'මහහටන'* නමින් ප්‍රසිඬ යැ. පෘතුගීසි සිංහල සටන් නම් වශයෙන් නමුදු, මෙහි සඳහන් වන බැවින් 'මහහටන' යනු මෙයට නො ගැලපෙන්නේ නො වේ.

* 31 වැනි පිටේ අධො ලිපිය බලන්න.

‘සෙත් කල තිලොවට සුර රජු ලෙසි නා
සත් රැක වැජඹුණු රජසිහ නර නා
ගත් රජ රුපු බිඳ සිරිලක තෙදි නා
සිත් ලෙස පවසම් කල යස පෙම් නා’

යන ආරම්භක පද්‍යයෙන් ගත්කතුවරයන් ප්‍රතිඥා කළ පරිදි ඔවුනගේ අදහස වූයේ රජසිහ මහිපලුන් පෘතුගීසීන් හා සටන් කොට ලත් විජයග්‍රිය වර්ණනා කිරීම ය. එබැවින් මෙය පෘතුගීසි - සිංහල සටන් පිළිබඳ ලියූ ඓතිහාසික සටහනක් වශයෙන් සලකනු යෙදේ. පෘතුගීසීන්ගේ ලංකාවතරණයේ පටන් අවසානය දක්වා ඔවුන් පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු මෙහි සඳහන් යැ. එබඳු සමහර ප්‍රවෘත්තියක් මෙහි සඳහන් වනුයේ, සෙසු ඓතිහාසික ග්‍රන්ථයන්හි දක්වෙනවාට මඳක් වෙනස් ව ය. දෙවැනි තුන්වැනි හා සිවුවැනි පද්‍යයන්ගෙන් පැවසෙන පෘතුගීසීන්ගේ ලංකාවතරණ ප්‍රවෘත්තිය එබඳු තැනකි.

ක්‍රි: ව: 1658 දී ලන්දේසීන් යාපා පටුන අල්ලා ගැනීමත්, ඉන්පසු ලංකාවේ පෘතුගීසි බලය මුලුසුන් ව ගිය පරිදිත්, මෙහි සඳහන්වන අවසාන සිඬිනු ය. මින්පසු ගත්කතුවරයා රජු ප්‍රසාදාත්මක ආශීර්වාදයෙන් පුද්‍ර සවන්ය කෘතිය නිමව යි. ක්‍රි: ව: 1658 - 84 අතර වූ සවිසි වස තුළදී මෙය රචිත බව නම් නිසැක ය. එහෙත් ඒ කිනම් වර්ෂයකට අයත්දැ යි නිශ්චය කිරීමට කරුණු නැති.

ගත්කතුවරයා කිරිමැටියාවේ කිවිඳුන් බව ග්‍රන්ථයෙහි අවසාන පද්‍යයෙන් ප්‍රකාශ වේ.

මේ රචනය පූර්වෝක්ත විරුදවලීන් මෙන් විසිතුරු නො වේ. එහෙත් මෙය කවියාගේ අදහස් මනා පැකිල පැවසෙන සරල රචනයකි. සොළොස් මත් හා අටළොස් මත් විරිතින් පමණක් බඳනා ලද වෘත්ත ඇතිවීමත් එකී සරලත්වය බෙහෙවින් ගෙන දීමට හෙතු විය.

මෙහි පැනෙන ඇතැම් වාක්‍යයෝ පෘතුගීසීන් කෙරෙහි කවියා තුළ පැවැති කොපය මැනවින් ප්‍රකට කරවීමෙහි සමර්ථයහ.

‘තලා දමමු ජඹ සිවලුන් ලෙසි නා’
‘මැඩියන් සේ පොඩි කරවා ගෙරි රැ ළ’
‘නරින් ලෙස තලා ඇද පාගමින් බො වු’

මෙබඳු යෙදුම් විඥයනට ප්‍රිය එළවන්නේ නො වේ. එමෙන් සත් කාව්‍යයක ඇතුළත් විය යුත්තාහු ද නො වෙති. ග්‍රන්ථයේ මේ තත්ත්වය සලකනවිට ‘මහහටන’ සිංහල සාහිත්‍යයෙහි කණිෂ්ඨ ග්‍රන්ථයක් හැටියට සැලකුම් ලබයි.

**ජාතක කාව්‍ය**

සිංහල ග්‍රන්ථ ප්‍රවේණිය බෞද්ධ සාහිත්‍යය ම පිහිට කොට ඇත්තී ය. බෞද්ධ සාහිත්‍යයෙන් නො ලත් පිහිට ඇති සිංහල ග්‍රන්ථ කෙනෙක් වෙත් නම් ඔහු අතැඟිල්ලනට සීමා වූවාහු ය. එමතු ද, ඔහු ම ය සිංහල සාහිත්‍යයේ කාණ්ඩ ග්‍රන්ථ වූවෝත්.

ගුරුළුගෝමි — විද්‍යාචක්‍රවර්ති — ධර්මසේන — විමලකීර්ති ආදී මහා ග්‍රන්ථකාරකයන් බෞද්ධ ධර්මය ගැබ් කොට මහාර්ඝ ගද්‍ය කාව්‍යයන් ලියූ අතර පරාක්‍රමබාහු — ශ්‍රී රාහුල — වෑත්තෑවේ — අලගියවන්න ආදී පද්‍ය කවියෝ බෝධිසත්ත්ව චරිතයන් ආශ්‍රය කොට පද්‍ය ග්‍රන්ථ ලියූහ. සිංහල පද්‍ය සාහිත්‍යයෙහි උච්ච ශ්‍රේණියෙහි ගැනෙන 'කව් සිළුමිණ' — 'කව්සේකරය' — 'ගුත්තිලය' — 'කුසදාව' ආදී හැම පද්‍යයක ම ශරීරය වූයේ, බෝසත් සිරිතෙක් ම ය. මෙය වූකලි කවීන් හුදෙක් ලෙහෙසිය සලකා ගත් මඟක් නොවැ, අලඞ්කාරානුශාසනය අනුව යෑමෙකි. පද්‍යයෙන් ලිවිය යුත්තේ බුදුසිරිත ය යි සිංහල කාව්‍යානුශාසනය විය. එහෙයින් කිහ 'සියබස් ලකරෙහි' —

'පෙදෙන් බුදු සිරිතැ — බසින් වත් සිරිත් ඇ,
පද යුතු බසින් නළු ඇ — අනතුරු ලකුණු දක්වම්' යි.

මේ අනුශාසනය අපේ සිංහල කවියෝ කාව්‍ය නීතියක් වශයෙන් මතු නො වැ, බෞද්ධ සම්ප්‍රදායයක් කොට ද ආදර යෙන් පිළිගත්හ. එ හෙයින් ම කීර්තිමත් කවියෙක් තෙමේ —

''කිවි බව් කිවිදුමේ — කුසුම් සැපතෙහි විපුල් පෙලෙ,
බෝසත් සර වැනුම් — වියතෙ මුව පවත් වේවා'' යි

කවිත්වයෙහි මහත් ඵල (ගෙඩි) නම් බෝසත් සිරිත් වැනුමැ යි ද, ව්‍යක්තයෝ එහි සමර්ථ වෙත්වා යි ද සව ග්‍රන්ථයෙහි ලියා තැබී ය.

කාරුණු මෙසේ හෙයින්, පසුකල විසූ පද්‍ය රචකයෝ ද පූර්වෝක්ත ආලඞ්කාරික නියමය හා එ මගෙහි පිළිපන් පැරණි ශ්‍රේෂ්ඨ කවියන් ද ආදර්ශයට ගත්තෝ. බෙහෙවින් ජාතක කථාවක් ම ශරීර කොට කාව්‍යයන් කළහ. එහෙයින් මහ නුවර පද්‍ය සාහිත්‍යයෙහි 'හත්ථිපාල' - 'මණිචොර' - 'සමුද්දග'- 'දෙවධම්'— 'කව්මිණි කොඬල' — 'කව්මිණි මල්දම' — 'කාව්‍ය දීපනි' — 'කව් මුතුහර' — 'කව් මිණි රත්දම' ආදී ජාතක කාව්‍ය රාශියක් පහළ වූහ.

## ඇත්පල් ද කව

කර්තෘ :— නන්දන කවීන්ද්‍රයෝ
කාලය :— ක්‍රි: ව: 1679
ප්‍රමාණය :— පද්‍ය 441

බරණැස එසුකාරී රජ පෙරෙවි බමුණා සමග වැලි කෙළි යෙහි සිට ම දැඩි මිත්‍ර වැ සිටියේ ය. දිනෙක රජ සෙවයෙහි යන පෙරෙවි තෙමේ සත් දරු කෙනකුත් ලත් මැහැල්ලක දිටි.

**කථා සාරය**

'තෝ කවර පිනින් මෙ තෙක් දරුවන් ලදු දූ'යි බමුණාණෝ විචාළහ. "නෙල නුගරුකැ දෙවියෝ දුන්හ" යි මැහැල්ල කිවු ය. බමුණා නුගය වෙත එළඹ රජුට හෝ තමහට දරුවකු යැද, ඉදින් දරු කෙනකුන් දුන්නෙහි නම් මහ පුද කෙරෙම්. නැත, මෙ ගස මුල් පිසලන්නෙමැ යි වහසි බැණ ගියේ ය. සදිනක් මෙසේ යැද, "ඉදින් රුක් දෙවිය! සෙට සත්වැනි දවසෙහි අපට හෝ රජුට දරුවකු නො දුන, තෝ මෙ ගස වාසය මින් මතු නො ලබන්නෙහි" ය යි තර්ජනය කෙළේ ය. බිය පත් වූ දෙවියා, සිවුවරමුන් හා යක් සෙනෙවියන් වෙත එළඹ ද, නො ලත් පිහිට ඇත්තේ සක්දෙවිඳුන් කරා ගියේ ය. ශක්‍රයෝ ආයු පිරිහී මතු දෙව්ලොව රිසිවැ හුන් දිව්‍යපුත්‍රයන් සතරදෙනකු බැමිණිය කුසැ පිළිසඳ ගන්නා සේ පිළිත කර වූහ. සත්වැනි දින වැ පොරෝ ගෙන පැමිණි බමුණාට රුක්දෙවියෝ එ පුවත් කිහ. ක්‍රමයෙන් උපන් එ් කුමරුන් සිවුදෙනාට හත්ථිපාල — අස්සපාල — ගොපාල — අජපාල ය යි නම් කළහ. විය පැමිණි පසු ගිහි සැප පියා තපසට යෙති කුමරුන් ගැන පතළ පුවතෙක් විය. සැබවින් ම ඔවුහු තපසෙහි ඇලුණු සිත් ඇත්තෝ දූ'යි විමසනු රිසි වූ රජ බමුණු දෙ දෙන දළ මඩුලු බැඳ, දිවිසම් පෙරවැ, හත්ථිපාලයන්ගේ ගෙට ගියෝ ය. බෝසත් හත්ථිපාලයෝ රජ බමුණු දෙදෙන නො හැඳින ඔවුන් ආගන්තුක සත්කාරයෙන් සැතපූහ. හැසිරීමෙන් ම ඔහු මහණදමෙහි ඇලුණු බව දත් පිය බමුණෝ 'පුත හත්ථිපාල! මේ මහණදමෙහි රිසි පියවා තා රාජ්‍යයෙහි ගිවිස් වීමට මෙසේ වෙස්වලා පැමිණියම්හ' යි කිහ. හත්ථිපාල කුමරු ගිහි සැපෙහි ආදීනව හා මහණ බව්හි අනුසස් දක්වා රජු හා බමුණන් හඬද්දී ම පිරිවර සමග නික්ම ගංතෙර පැවිදිව විසී ය. මෙසේ සෙසු තුන් බෑයෝ ද පත් රජය හැරපියා හත්ථිපාල කුමරුන් අනුව ගොස් පැවිදි වූවෝ ය. අන්තිමේදී රජ-බිසෝ-බමුණු- බැමිණි ආදීන් හා සියලු බරණැස් වැසියෝ ද බෝ සතුන් වෙත පැවිදි වූහ.

ජාතකට්ඨ කථාවේ විංසති නිපාතයේ තෙළෙස් වැන්නට පැමිණි මේ ජාතකය ඇත්පල් ද කවේ කථා ශරීරය වූයේ ය. ක්‍රි: ව: 1679 දී කවි කරන ලදු යි පැවසෙන මේ ජාතකය 'නාඳන' නම් කවියකු ගේ කෘතියකි. උඩ පළාත පාහිංගමු පියසේ විජයසේකර නම් දෙලොස් දහස් කෝරළය කරවූ මන්ත්‍රීශ්වරයාගේ ආරාධනයෙන් මෙය කරන ලද බව පැවසෙයි. 'නාඳන' කවියා ගැන හෝ මේ ආරාධකයන් ගැන මීට වඩා ප්‍රවෘත්තියෙක් සඳහන්ව නැති.

ගත් කරුවෝ ආරම්භයෙහි ම දියතිලක නුවර රාජශේඛර නම් නරේන්ද්‍රයකු ගැන සඳහන් කෙරෙති. දියතිලක නුවර නම් මහනුවරට නො දුරෙහි 'හඟුරන්කෙත' නමින් ප්‍රසිඬ නගරය වේ. ක්‍රි: ව: 1664 දී නිලඹ නුවර වාසියන් ඉපද වූ

කැරැල්ල නිසා රාජසිංහ ii රජු යථොක්ත නගරයට පලාගිය බව සඳහන් යැ. කලකට පසු රාජසිංහ රජු දියතිලක නුවර අත්හල නමුදු, විවේක සුවය සඳහා එහි වරින්වර පැමිණියේ ය. එ බැවින් මෙ ග්‍රන්ථයෙහි සඳහන් වන රාජකේශර නිරිඳු නම් මේ රාජසිංහ ii ම වේ. 'කේශර' ශබ්දය ද 'සිංහ' යන අර්ථ ඇත්තේ ය.

කවි සාරසිය එක් සාළිසකින් සමන්විත වූ මේ ග්‍රන්ථයෙහි ත්‍රි සිංහලයේ බෙදීම, දියතිලක පුර හා විජයසේකර මැතිඳුන් පිළිබඳ වර්ණනයත්, ආරම්භයෙහි මැනවින් දර්ශිත යැ. මෙසේ සූ පනස් කවකින් ග්‍රන්ථ මුඛය නිමවා තෙසිය පන්සැටක් පද්‍යයන්ගෙන් ඇත්පල් දව වතාන ලද්දේ ය. අවසාන පද්‍ය දෙවිස්ස පුණ්‍යානුමෝදනා හා කර්තෘ නිගමනාදිය සඳහා ලියන ලද්දේ වේ.

සිංහල සාහිත්‍යයේ අප්‍රකට වූ මෙම ජාතක කාව්‍යය කවියාගේ තත්ත්වය තේරුම් ගැනීමට පවා අපහසු වන සේ ලේඛක දෝෂයෙන් පිරී ඇත්තේ ය. එහෙත් මෙහි දක්නට ලැබෙන ඇතැම් පද්‍යයන් දෙස බැලීමෙන් ගත්කරු නිවහල් සිතුවිලිවලින් යුත් රචනයෙහි පළපුරුදු ඇත්තකු බව පෙනේ. එ බැවින් ම 'නාඳුන' කවියා පැරණි කවීන්ගේ වර්ණනා මාර්ගයන් ම පිටපත් නො කොට තමන් ඇසූ දුටු දේ ඒ වූ පරිද්දෙන් දක්වීමට සමර්ථ වූයේ ය. කවියාගේ මේ ප්‍රතිභාන ශක්තිය විදහාපාන තැන් අතර දියතිලක නුවර තොරණ වැනූ සැටි කියවන්නාට අමතක නොවන සුලු ය.

'බැඳි තුඟු තොරන ව ලි
එහි අනගි තුම් පට පි ළි
කල සිතුයම් සිය ලි
සිටිනිදුටුවුදන දෙපා වෙළිවෙළි'

'බැඳි පහ මුදුන ද ද
එහි මද මද පවන් වැ ද
ලෙලෙන කල මිණි න ද
අසා සිටි පිය නගනු කවුරු ද'

'උරුසබ ගජන් රූ
පඤ්චනාරී ගට රූ
සෙමෙර ද තුරඟ රූ
සොබනා නවනාරී වරන රූ'

'සක්වා ලිහිණි ය න
හස පරවිය ගිරවු න
සිහ ගිජු ලිහිණි ය න
රුවින් බබලයි තොරණ තැන තැන'

මේ එදා ලංකාවේ පැවැති 'තොරණ' ක සවභාවය කවියාට පෙනුණු සැටි ය.

'රත් රිදී තඹ ක ල
යකඩ මැටි පොල් බෑ ව ල
මී වදය ලූ ක ල
ඇද්ද එහි රස වෙසෙස කිසි ක ල'

යනුවෙන් දක්වූ ඇතැම් වර්ණනා කවියාගේ ස්වයංකල්පිත අලංකාරයන්ගෙන් සැරසූ බවෙක් ද හෙළි වේ. ආරම්භයෙහි පැනෙන දියතිලක — බරණැස් පුර ආදි වර්ණනා කිහිපයක්

හැර මෙහි අන් දීර්ඝ වර්ණනාත්මක බන්ධනයෙක් ද නැති. දීක්වූ වැනුම්වලින් කථා මාර්ගය ප්‍රපඤ්ච කිරීමට කවියා නො කැමැති වූ සේ ය.

'නෑ නෑ ඇති අයෙක් — දරු සොයා නො ම ඇවිදිති
දූරිමු ඇති අයෙක් — නො බා යත් මිය කසා විත්තට'

මේ අයුරින් ධම්සෙන හිමියන්ගේ 'දහම් ගැටයෙ'හි දක්වෙන ප්‍රහෙළිකාවනට සමාන පද්‍ය කතිපයෙක් ද ග්‍රන්ථ මධ්‍යයෙහි දක්නට ලැබේ. ඒ වනාහි බන්ධන විෂයෙහි කවියාගේ චාතුර්‍ය්‍යය දක්වන තැනකි.

## මහපදරඩිහ ජාතක කාව්‍යය

කර්තෘ:— කිරිමැටියාවේ මැතිඳු
කාලය:— ක්‍රි: ව: 1692
ප්‍රමාණය — පද්‍ය 1514

මහපදරඩිහ නාමය සාමාන්‍ය ව්‍යවහාරයෙහි ඉතා ප්‍රකට යැ. අගක් - මුලක් නැති කථාවක් වෙතොත්, එය 'මහපතරඩිහ ජාතකය' මෙනැ යි ගම්වැසියෝ පවසති. මේ 'මහපදරඩිහ ජාතක' කථාව නම් මිනිසුන් සිතන කියන තරමට අගක් මුලක් දක්ක නො හැකි කථාවක් නො වේ. කවි එක්දහස් පන්සිය තුදුසකින් ප්‍රතිමණ්ඩිත වූ එම ජාතක කාව්‍යය කියවා එහි කථා ශරීරය තේරුම් ගැනීම නම් සාමාන්‍ය කෙනකුන් විසින් නො කළ හැකිය.

මේ මහපදරඩිහ ජාතකය ජාතකට්ඨකථායෙහි හෝ සිංහල ජාතක පොතෙහි දක්නට නො ලැබෙන්නකි. අපේ ජාතක පොතට ඇතුළත් නො වූ මෙ වැනි බොධිසත්ත්වාවදාන කතිප යෙක් සංස්කෘතාදි අනික් සාහිත්‍යයන්හි දක්නට ලැබේ. මහා යානිකයන්ගේ මාර්ගයෙන් ව්‍යාප්ත වූ ඒ බොධිසත්ත්වාවදානයෝ ජාතකමාලාදි බෞද්ධ සංස්කෘත ග්‍රන්ථයන්හි දර්ශිතයහ. මේ අතර ම ඇතැම් වෛදික ග්‍රන්ථයන්හි ද දක්නට ලැබෙන බොහෝ කථාන්තරයන්ට ද බෞද්ධ චරිත කථා ස්වරූපය පිවිස ගත්තේ ය. මහාභාරතාදියෙහි පැනෙන ඇතැම් කථාන්තරයෝ මෙය මැනවින් පැහැදිලි කොට දක්වති.

අප හමුවෙහි පවත්නා 'මහපදරඩිහ ජාතක කාව්‍යය' වූකලි ද්‍රවිඩ සාහිත්‍යයෙන් සිංහල භාෂාවට පෙරළා ගනු ලැබූවකි. සංස්කෘත සාහිත්‍යයෙන් ද්‍රවිඩ සාහිත්‍යයට ගන්නා ලද එය සිංහල කාව්‍යයට නගන ලද්දේ ක්‍රි: ව: 1692 දී ය. එය වූකලි රාජසිංහ ii රජු අභාව ප්‍රාප්ත වර්ෂය බව රාජා වලියෙහි සඳහන් වේ.

මේ ජාතකය කවි කරන ලද්දේ කොබ්බෑකඩුවේ නමින් ප්‍රසිද්ධ තෙරපාණ කෙනකුන් විසින් බව —

'කොබ්බෑකඩුවෙ සො        ද
අප මහ යතිඳු ගුණ ක        ද
සිංහල බසින් සො        ද
මෙ ජාතක කවි කළේ පද බැ        ද'

යන පද්‍යයෙන් පැහැදිලි වෙයි. එහෙත් මෙම පද්‍යය නම් කොබ්බෑකඩුවේ හිමියන්ගේ නො වැ, අනෙකකුගේ රචනයකි.

'මේ ජාතකය මු        දු
පැවසූ ලෙසින් අම බි        ඳු
වීමට නිවන් සි        දු
පසිඳු කිරිමැටියාවෙ මුදලි        ඳු'

ග්‍රන්ථාවසානයෙහි පෙනෙන මේ පද්‍යයෙන් මේ කව කිරිමැටියාව ගේ කෘතියක් බව ද හැඟි යේ. මේ වනාහි 'මහපදරඞ්ග ජාතකය' කවි කළ කතුවරයන් එක එල්ලේ හඳුනා ගත නො හැකි ලෙස පැටලී ගිය තැනකි.

'දෙමළෙන් කිවු පොර        ණ
සිංහල බසින් ම කිය        න
දුට වරදක් නො ගෙ        න
ඉවසූ මැන ගරුකර නැණැති ද        න'

මෙහි පැනෙන 'ම කියන' යන්නෙන් කිරිමැටියාවේ මැතිවරයන් අදහස් වෙතොත්, මෙ කාව්‍යකරණයෙහි කර්තෘත්වය ඔහු තමා වෙත කොට ගත් බව දක්ක හැකි. කාව්‍ය කර්තෘත්වය ගැන කොබ්බෑකඩුවේ හිමියන්ගේ වචනයකුදු නැති. ඔවුන් මෙ කව කළ බව කියන්නේ ද අනිකෙකි. (කිරිමැටියාවේ?) අවසානයෙහි හෙතෙමේ උන්වහන්සේට පුණ්‍යානුමෝදනාවක් ද කෙරෙයි. මේ කරුණු පිරික්සීමෙන් මෙ කවෙහි කර්තෘත්වය කිරිමැටියාවේ මැතිවරයන් වෙත හිමිකර විය හැක්ක.

එතුමන්ගේ සෙසු රචනා හා සංසන්දනය කර බලන විට ද මහපදරඞ්ගකාව්‍ය කරණය කිරිමැටියාවේ විසින් ම කළ බව සිතා ගත හැකි. ඒ කෙසේ වුවත් කොබ්බෑකඩුවේ හිමියන් මෙ කව කිරීමෙහි උපකාරවත් වූ බව පැහැදිලි ය.

කාව්‍ය කර්තෘ කවරෙක් වුවද, මෙය නම් එතරම් ශාස්ත්‍රීය රචනයෙක් නො වේ. ඡන්දසත් එළියත් කාව්‍යයේ ප්‍රමුඛ ලක්ෂණය කොට ගෙන සිවුපදය කෙසේ නමුත් සම්පූර්ණ කිරීමට බැලූවා මිස භාෂා තත්ත්වය ගැන සැලකිලිමත් වී නැති බැවිනි. මේ පදයෙන් මේ අර්ථය දිය හැකි දැ යි සලකා බැලීමට කවියාට කිසිම වුවමනාවක් තිබුණු බව නො පෙනේ. එලිසම කාව්‍යයට නගා 'මහපතරඞ්ග' හැල්ල නිම කිරීමට විනා අසන්නා තුළ මේ ප්‍රවෘත්තිය පිළිබඳ නිරාකූල අවබොධයක් ඇතිවන සේ සතැඟි සුඩියක් දීමට හෝ කවියා සමත් නො වී ය. ව්‍යාකරණයෙන් තොර වූ පුනරුක්තියෙන් දූෂිත වූ සම්බන්ධයෙන් ඇත් වූ

අවුල් ජාලයකින් කථා ශරීරය ගැවසී ගියේ ය. එ බැවින් මෙහි කථාසාරය පැහැදිලි සේ වෙන්කොට ගැනීම දෙතුන් වරක් කියවා මුත් නො කළ හැකි ය. මහපදරඞග කාව්‍යය මෙසේ දූෂිත වීමෙන් සිංහල සාහිත්‍ය වංශයේ නිකෘෂ්ට ග්‍රන්‍ථයක් හැටියට පත් වතුදු, සිංහල සාහිත්‍යයේ විශාල පද්‍ය ග්‍රන්‍ථයක් ලියා තැබීමට කතුවරයන් ගත් උත්සාහය සාහිත්‍ය ස්වාමීන්ගේ සම්මානනයට පාත්‍රවන්නකි. නිරාකූල භාෂා නෛපුණ්‍යයකින් තොර වුවද, මහපදරඞග කතුවරයා පද්‍ය රචනයෙන් ලත් අමන්ද ඥාභ්‍යාසය ඇත්තෙකි. එහෙයින් ම මෙහි බොහෝ පද්‍ය යන් අනායාශයෙන් ලියැ වී තිබෙන බවකු දු පෙනේ.

කථා ප්‍රවෘත්තියට ඇතුලත් වූ කාව්‍ය නායකයන්ගේ අවස්ථානුරූප චරිත ප්‍රවෘත්තීන් කියවන්නාගේ මනඃප්‍රීනනයට ඉවහල්වන සේ දක්වූ අයුරු රම්‍යය. තිරියෝන රජුගේ දූජිත චරිතයත්, වීම රජුගේ බොළඳ චරිතයත් ස්වාභාවික සේ කවියාගේ මුඛාරූඪ වූයේ ය. අවසානයෙහි දක්වෙන භයඞ්කර යුඞය පිළිබඳ විස්තරය ද කියවන්නාට අමතක නො වන ලෙස නිබඞ වැ තිබේ.

**කථා සාරය**

කලියුගයට පෙර පරරාජ නම් මුනිවරයෙක් විය. දිනෙක සෘෂිවරයන් දකිනු කැමැති වැ සිය විමනින් පිටත් වූ හෙතෙමේ සමුද්‍රයට පැමිණියේ ය. සමුද්‍රතරණය සඳහා යෙදූ නැව පඬුවකෙනා නම් දුගීඬ ශරිර ඇති ස්ත්‍රියක විසින් පදවන ලදි. නැවට පැමිණි පරරාජ තෙමේ නකත් යොගයක් දුක එම යොගයෙහි උපන් කුමරකු වී නම් ඔහු කල්පත්‍රය බැලීමෙහි සමත් වෙනි පවසා ඇය සමග වැස "වෙතවියාකර" නමැති පුත්‍රයකු ඉපද වී ය. පුත්‍රයාත් රැගෙන සෘෂීන් වෙත ගිය පරරාජ මුනි පුත්‍රොත්පත්තිය ප්‍රකාශ කෙළේය. එහිදී සෘෂිවරයන්ගේ නිය මය පරිදි 'වෙතවියාකර' තෙමේ සෘෂිවරයන්ගේ සහ පියාගේ උපත ප්‍රකාශ කෙළේ ය. එම පුවත සෘෂිවරයෝ ගණේන්ද්‍රයා කැඳවා මෙරු පර්වතයෙහි ලියා තැබ වූහ. මෙතැන් සිට දක් වෙනුයේ එම ප්‍රවෘත්තිය යි.

කාලෙක සඥත නම් රජෙක් දඹදිව එක්සත් කොට රාජ්‍යය කෙළේය. ඔහුට බිසෝවරු දෙදෙනෙක් වූහ. පළමු බිසව 'කාත්‍යායන' නම් දිව්‍ය ස්ත්‍රියක. දෙවැනි බිසව වූවා පූර්වොක්ත 'පඬුවකෙනා' වය. ඕ 'සිත්තන්,' 'සසත්‍රිකැන්,' හා 'ඉයල් සිත්තන්' යන දරු තිදෙනකු වැදුවා ය. නො බෝ දිනකින් මුව දඩ ගිය සඥත තෙමේ වෙනෙහිදී මළේ ය. මින්පසු රාජ්‍ය භාරය 'සිරිවිට්ටුම' කුමරහට පැමිණියෙන් හෙතෙමේ එය සුළු මවු වූ 'පඬුවකෙනාව'ට පැවරී ය. ඕ තොමෝ ස්වකිය දිවැස් ලත් පුත්‍රයා වන 'වෙතවියාකර' ගෙන්වා රාජ්‍යය භාරකළා ය. රාජ්‍යය නො කැමැති හෝ දරුවන් නො ලැබ සිටි 'සිත්තන්' ආදී තෙ කුමරුවනට යොග බලයෙන් දරුවන් දෙවා දෙව් ලොවට

වන. 'සිත්තන්' කුමරුගේ පුත්‍රයා ඇස්පියා ගත් දරුවෙකි. 'සසත්‍රිකැත්' ගේ පුත් 'පාණ්ඩුකුමාර' නම් ද, 'ඉයල්සිත්තන්' ගේ කුමරු 'තිරුණාරට්ටි' නම් ද වූහ. 'තිරුණාරට්ටි' තෙමේ රාජ්‍යයට පැමිණියේ ය. පණ්ඩුකුමරහට පණ්ඩු රාජ්‍යය පැමිණියේ ය. 'කාන්තකාරි' - 'කුන්තාදේවි' යන දෙ සොහොයුරියෝ මේ දෙ රජුනට අගමෙහෙසුන් වූහ. කුන්තාදේවී තොමෝ 'ධම්බුද්ධි' - 'ජීම' - 'අරුච්චන' යන තෙ පුතුන් ද, ඇගේ බාල සොහොයුරියක් වූ චෙතවියාදේවී, 'නකුල' - 'සකාතෙවන්' යන දෙ පුතුන් ද ලැබූ. මේ කථාවෙහි දක්වෙන **පස්බෑ කුමරුවෝ** නම් මොවුහු ය.

අගරජ දේවී වූ 'කාන්තකාරී' බිසව තෙළෙස් අවුරුද්දක් මුඩගබ් වූවා අන්තිමේදී නො ඉවසුම් ව වෙගයෙන් කුස පහලා ය. එකෙණෙහි කුස පුරා වූ රුධිර ධාරාව වැම්මෙන්නට පටන් ගත. සාෂ්වරයන්ගේ නියමය පරිදි ඒ ලේ දහර සියක් බඳුනට ගෙන නැළ වූවා ය. ඉන් කුමරුවෝ සියයක් පහළ වූහ. ප්‍රධාන තෙමේ 'තිරියොන' නම් විය. මෙහි දක්වෙන **සියක් කුමරු** නම් මොහු යැ.

මීටපසු දඹදිව රාජ්‍යය 'තිරියොන' හට හා 'ධම්බුද්ධි' බෝසත්හට බෙදී ගියේ ය. ජන්ම සිද්ධ දුෂ්ටයකු වූ 'තිරියොන' තෙමේ සම්පූර්ණ රාජ්‍යය පැතුයේ පස්බෑ කුමරුන් මැරවීමට නොයෙක් උපා යෙදී. මින් අතිශය කපට උපායක ප්‍රතිඵලයක් වශයෙන් පස්බෑ කුමරුනට දෙළොස් වසක වන වාසය සම්මත විය. වන වසන බෝසතු මැරවීමට 'තිරියොන' තෙමේ නැවතත් නොයෙක් උපා යෙදී. අන්තිමේදී බෝසත් ගෙවූ දෙළොස්වස ඇති වැ - දිනූ යෝගබල ඇත්තේ - සොහොයුරන් කැටුව අගරජු හා යුද පිණිස එළඹියේ ය. බලයෙන් - උපායෙන් හා කොපයෙන් පිරී සිටි තිරියොන තෙමේ ද, මහ පිරිස් පිරිවරා සටනට පැමිණියේ ය.

එක්වට පතිත වන අසනි දහසුන් මෙන් ද, ප්‍රලය සමුද්‍රය මෙන් ද, සඝොෂ වැ නින්නාද වැ, විද්‍යුත් ශතයෙන් ආලෝකව ගිය අන්ධකාර රැයක් මෙන් බඩගමාලා සම්භ්‍රමයෙන්, විහිදී ගිය ගිනිදළුවෙන්, පාතාල අවට ඇතිවැ - හිසින් හිස ගටා - දළින් දළ පැහැර - මෙ ගැජුම් ගැජු - අඳුන් කුළුවන් මහ ඇතුන් ගෙන් හා - අලාත චක්‍රාකාරයෙන් බමා — සතුරන් මැද කඩු පහරින් දෙබෙ ව පතිත අසුන් ගෙන් ද, කඩු - දුනු - කිරිච්චි - කෙටේරියෙන් උනුන් ඇන, ගලන ලෙහෙයෙන් - බනන සැහැසියෙන් — කැරෙන හැඬුමෙන් — ගසන පහරින් යුත් යෝබලන් ගෙන් ද, සාකුල වැ, ගහණ වැ, සම්භ්‍රමණය වැ, සංක්‍ෂොභ වැ, පැවැති මේ භයඞ්කර යුද්ධය අටළොස් දිනක් පුරා පැවැත්තේ ය. අවසාන දිනැ, දස සත කිරණයා පැදුම් සාගරයෙන් ස්නානය කොට අම්බරොදරයට පැමිණෙත් ම,

බෝසත් තෙමේ, ලොව කම්පා කෙරෙමින් 'තිරියොත' පරදවා - රාජ්‍යය ගත්තේ, දෙව් මිනිසුන් සතොස්වා පන් දහසක් හවුරුදු රාජ්‍යය කෙළේ ය.

## රාජාවලිය

කර්තෘ:— අවිනිශ්චිත ය
කාලය:— ක්‍රි: ව: 1693 ත් පසු
ප්‍රමාණය.— මුද්‍රිත පිටු 95.

රාජාවලී යනු රාජ පරම්පරාව යැ. එය පවසන ග්‍රන්ථය ද අභෙදෝපචාරයෙන් එ නම් විය. ඒ වනාහි සිංහල සාහිත්‍ය වංශයෙහි ප්‍රකට ඓතිහාසික ග්‍රන්ථයකි. විජය රජු පටන් විමල ධර්මසූර්ය ii රාජ්‍යාදය තෙක් සිටි එක්සිය අටසැටක් පමණ රජුන්ගේ කාලය මෙහි සංගෘහිතය. ග්‍රන්ථාරම්භ කථාවෙහි ලා ආදි කල්පික මහාසම්මත රාජ පරම්පරාව ද සැකෙවින් සඳහන් විය. එතකුදු වුවත් මෙහි දක්වන ලද සිංහල රාජ මාලාව ද සම්පූර්ණ වී නැති. බල්ලාටනාග රජු හා කණිරජානු පටන් වසභ තෙක් වූ රජුන් ද මෙහි ඇතුළත් ව නැති හෙයිනි. ආරම්භයෙහි ඒ රජුන් පිළිබඳ දැක්වෙන වර්ෂ සංඛ්‍යා ද, නිර වුල් වැ පිළියෙළ වී නැති. තුදුස් වසක් කොට දක්වන මහදැළියාමානා රාජ්‍යය මෙහි දක්වන ලද්දේ පනස් අවුරුද්දක් කොට ය. අටළොස් අවුරුද්දක් වූ ප්‍රසිද්ධ සද්ධාතිස්ස රජතුමන්ගේ කාලය 'රාජාවලි' යෙහි දැක්වෙන්නේ, සත්තිස් වර්ෂයක් ලෙසිනි. මෙසේ මෙහි සඳහන් අන්‍ය වූ ත් බොහෝ වර්ෂ සංඛ්‍යා සෙසු ඓතිහාසික ග්‍රන්ථයන් හා සංසන්දනය කළ නො හැකි තරම්ට අවුල් වැ ගොස් තිබේ. මේ ව්‍යාකූලතාව බෙහෙවින් සිදු වන්නට ඇත්තේ, අතිනතට ලියා ගෙන ආ ග්‍රන්ථ ලේඛකයනගේ වරදිනැ යි ද සිතිය හැක්ක.

රාජසිංහ ii රජුගේ අවසානයෙන් පසු ලියැවී තිබෙන මෙම ග්‍රන්ථයෙහි කතුවරයා කවරෙක් ද යනු සඳහන්ව නැත්තේය. ඔහුන් පිළිබඳ ආරංචි මාත්‍රයකු දු අසන්නට නැති. ගත්කරු කවරකු වුව ද, ඔහු සවකීය ග්‍රන්ථයෙහි පශ්චිම කොටසෙහි දැක්වූ කරුණු නම් ඉතා අගනේ ය. එහි ලා බොහෝ සෙයින් දැක්වූයේ තමන් ප්‍රත්‍යක්‍ෂ කොට දත් තොරතුරු ම ය. ග්‍රන්ථයෙහි ඓතිහාසික වටනාකම පවතිනුයේ ද එම කොටස සම්බන්ධයෙන් ම ය. ග්‍රන්ථය 'රාජාවලී' ය යි නම් කළ ද, කතුවරයනට අපේක්‍ෂිත වූයේ තමන් වෙන් කොට ගත් කාල පරිච්ඡේදයක ඓතිහාසික ප්‍රවෘත්තීන් සංග්‍රහ කිරීම ය.

පසළොස් වැනි ශතවර්ෂයේදී මහත් ප්‍රසිද්ධියට පත් ගම්පළ රජ පෙළ පත පටන් රාජසිංහ ii රජුගේ අවසානය තෙක් පැවැති ශතවර්ෂ තුනක පමණ ඓතිහාසික පරිමාණය මේ කතුවරයන්ගේ වර්ණනයට පාත්‍ර වූ සමය විය. ගත්කරු තෙමේ මුළු ග්‍රන්ථයෙන් තුනෙන් එකක් පමණ යොදා මේ ශතවර්ෂ ත්‍රය පිළිබඳ රාජාවලිය, රාෂ්ට්‍රිය තත්ත්වය හා සංග්‍රාමාදිය

පිළිබඳ ප්‍රවෘත්ති සවිස්තර වැ වර්ණනය කොට අපේක්ෂිත කාල පරිච්ඡේදය සම්පූර්ණ කෙළේ ය. විසි එක්දහස් සාරසියයක් පමණ වූ දීර්ඝ කාලය හුදෙක් පොතේ සම්පූර්ණතාව ම සලකා සංග්‍රහ කරන ලද්දේ විය. එම කොටසේ කෙතරම් ඌනාතිරික්තතාවන් තිබුණ ද, ග්‍රන්ථකර්තෘන්ගේ ශ්‍රමසාඵල්‍යයට එයින් බාධාවක් නො විණ. රාජාවලියෙහි ප්‍රාරම්භයක් වශයෙන් පැනෙන එම කොටසෙහි ද ජනශ්‍රැතියෙන් පැමිණි පුවත් ඇතුළත් කිරීමෙහි ගත් කතුවරයෝ උත්සුක වූහ. විජය රජු කුවේණියට දිවූට අයුරු, ඇගෙන් පඬුවස්දෙව් රජුට වැදුණු දිවිදෙස් හා දශමහා යොධයන් පිළිබඳ ඇතැම් කථාන්තර ද, එබඳු ප්‍රවෘත්ති කිහිපයකි.

ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන් මතු නො වැ සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් ද, රාජාවලිය ප්‍රයෝජනවත් ය. **අංගම් පොර** (කැරලිගැසීම), **පඬත්තලවරු** (යුඬමුලාදෑනිවරු), **ඳෙළිය** (රජකුමරිය), **දෙ-කට්ටුව** (දෙපස), **සනාන** (සමාදන), **උඩප්පර** (අහංකාර); **කුල්වන්නම** (බවුතිස්ම), **කුඩිය** (දසකම), **ආන්තු පාන්තු** (සාත්තු සප්පායම්), **ආසථාන** (රජු පුත්), **තරම** (හිස), **හදි** (මරණ), **සිල්වාරම්** (සවලප), **කුලාසි කාරසින්** (ඔරුකාරසින්), **පහඩමකළි** (දුදු කෙළිය), **විසුරේ** (ප්‍රතිරාජයා), ආදි මහනුවර යුගයේ පැවැති ශතසංඛ්‍යාත වචන සමූහයක් දක්නට ලැබීම භාෂා තත්ත්ව වේදීන් තුළ රාජාවලිය කෙරෙහි කෞතුකත්වය ඇතිකරවීමට හෙතු යැ. ව්‍යවහාර භාෂාව පිළිබඳ තත් කාලීන ප්‍රවෘත්ති හා ඇතැම් වචනයන්ගේ පරිණාමය පිළිබඳ පරීක්ෂණයට ද මේ ග්‍රන්ථය මහෝපකාරී යැ.

රාජාවලිය ලියන ලද්දේ ගැමි බසිනි. එත්කුදු වුවත් එම වාක්‍යයෝ විස්තරාර්ථයන් දෙන සේ සුදුසු පරිද්දෙන් ම ප්‍රයුක්තය හ. කෙතරම් අවුල් වූ හෝ ගූඪ වූ ඉතිහාස ප්‍රවෘත්තියක් වුවත් නිරවුල් සේ පැහැදිලි කරවීමෙහි 'රාජාවලී' වාක්‍යයෝ අතිශයින් සමර්ථ වෙති.

**ගායන නරඩහ**යෙහි නම් වශයෙන් නමුත් ඇතුළත් විය යුතු තවත් ග්‍රන්ථ කිහිපයෙක් වෙයි. සුප්‍රසිඬ කිරිමැටියාවේ කිවිඳුන්ගේ **මහාජනක — උම්මග්ග** යන ජාතක කාව්‍ය දෙක ත්, එතුමන් ම කර්තෘකොට ඇති **ජනනඳන** කාව්‍යයත් ඉන් සමහරකි. සම්පූර්ණ ගැමි කවි ස්වරූපය පළකරවන එම රචනාවන්හි විස්තරයෙන් දත යුතු දේ දුලීහ යැ. **ආලවක** සූත්‍රය වස්තු කොට ක්‍රි: ව: 1681 දී රචිත කවක්ද මේ අතර දක්නට

ඇත. කටුගම් කෝරළය කරවූ අධිකාරින්ගේ මුනුබුරු 'දවටන' නමැති මැතිවරයකුගේ ආරාධනයෙන් ලියැවී තිබෙන එහි කතෘ අවිනිශ්චිත ය. පද්‍ය සාරසිය සත්සාලිසකින් හෙබි මෙ කව කිරිමැටියාවේ රචනාවනට වඩා සාහිත්‍යයෙන් උස් තැනක් ගනී.

භාෂා තත්ත්වයෙන් නො ව, ඓතිහාසික තොරතුරු අතින් වටනා කමක් පෙන්වන **වන්නිරාජාවලිය** ද කැරුණේ දෙවැනි රාජසිංහ රජු දිනය. ඓතිහාසිය ගද්‍යයක් වූ මෙය වන්නි ප්‍රදෙශ ගැන යම් යම් තොරතුරු දැන ගැනීමට උපකාර වත් වේ.

**ගායන තරඞ්ගය මෙතෙකින්**
**නිම්යේ සි.**

# සිංහල සාහිත්‍ය වංශය

## නූතන අවස්ථාව

### II උද්ගම තරඞ්ගය
### (ක්‍රි: ව: 1700 — 1800)

රජවරු :—

| | |
|---|---|
| ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ | 1706 - 1739 |
| ශ්‍රී විජය රාජසිංහ | 1739 - 1747 |
| කීර්ති ශ්‍රී රාජසිංහ | 1747 - 1780 |
| ශ්‍රී රාජාධි රාජසිංහ | 1780 - 1798 |

## දෙශීය ප්‍රවෘත්ති

දෙවැනි විමලධර්මසූර්‍ය රජුගේ රාජ්‍යොදය ත් සමග උදා වූ සාමය රටේ කලක් පැවැත්තේ ය. ඉක්බිති රජ පැමිණි එ තුමන්ගේ පුත්‍ර ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ තෙමේ රාජ්‍ය පාලනයෙහි උද්‍යොගශීලී නරපතියෙක් නො වී ය. මූහුදුබඩ ලන්දේසීන්ගෙන් සිංහල රාජ්‍යයේ අභිමානයට කෙතරම් මදි කමෙක් සිදු වුව ද, ඒ ගැන මේ රජුගෙන් කිසිදු වග විභාගයක් නො කැරුණේ ය. එ හෙයින් මේ වන විට විසූ හෙන්ද්‍රික් බැකර්, ඔගස්තින් රම්ප්, ආදි උපාය පවීන ආණ්ඩුකාරවරු රජු නායම් මායම්වලින් සනසා සිය කටයුතු දියුණු කර ගත්හ. තෙතිස් වසක් රාජ්‍යය කොට ක්‍රි: ව: 1739 දී ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු අපුත්‍රක වැ මිය යැමෙන් අවුරුදු දෙදහස් තුන්සියයක් පමණ කල් පැවැත ආ සිංහල රාජවංශය කෙළවර වී ගියේ ය.

**නායක්කාර වංශය** ඉන්දියාවේ සොළී — පාණ්ඩි — කලිඟු — ආදි රටවලින් බිසෝවරුන් ගෙන්වා අග මෙහෙසි බව්හි තබා ගැනීම පෙර සිට ම බොහෝ සිංහල රජවරු සිරිතක් කොට පවත්වා ගෙන ආහ. එනමුත් කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු - මහනුවර විමලධර්මසූර්‍ය i ආදි නුවණැති රජවරු මේ දූරදර්ශීය අනුගමනය නො කොට සිය රටින් ම බිසෝවරුන් පාවා ගත්හ. සෙනරත් රජු සිය පළමු බිසවගේ අභාවයෙන් පසු මධුරාපුරයේ 'නායක්කාර' නම් ද්‍රවිඩ වංශයෙන් කුමරියක සරණ කොට ගත්තේ ය. ඊට පසු සිංහල රජවරු සිය අග බිසෝ තනතුරට එ රටින් ම කුමරියන් ගෙන්වා ගත්හ. මේ හේතුකොට මහනුවර ආරම්භයෙහි පටන් ම ලඞ්කාරාජ්‍යය සමග නායක්කර් වරුන්ගේ සම්බන්ධය ඇතිවිය. වරින්වර පැමිණි නායක්කර් වංශිකයන් ගෙන් බොහෝ දෙනෙක් මේ වන විට සිංහල රාජ්‍යයේ උසස් තිල තලවලට පැමිණ, බලයෙන් හා ධනයෙන් ආඪ්‍ය වැ විසූ හ. අන්තිමෙදී සිංහලය හා ඔවුනගේ සම්බන්ධය කෙතරම් දියුණු

වී ද යනහොත්, සිංහල කිරීටයේ හිමිකරුවන් හැටියට ද පෙනී සිටීමෙහි ඔවුනට අවස්ථාව ලැබිණ. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු අපුත්‍රක වූ බැවින් රජුගේ නියමය පරිදි එතුමන්ගේ ඇමැමෙන් නායක්කර් වංශික රජබිසවගේ සොහොයුරු 'හඟුරන්කෙත කුමාරයා'ට රාජ්‍යය හිමි විය. ස්වකීය පාරම්පරික හින්දුභක්තිය හැර දමා බුද්ධසමය වැළඳ ගත් ඒ කුමාරතෙමේ පෞරාණික සිංහල රාජ්‍ය චාරිත්‍රානුකූල ව ශ්‍රී විජය රාජසිංහ යන නමින් අභිෂේක ලැබී. සිංහලයන්ගේ ජාතිකාගමික උන්නතිය සඳහා නො මඳ වැ වෙහෙසී වැඩ කොට සිංහල බෞද්ධයන්ගේ සම්මානය ලැබූ මේ විජාතිය රජු පටන් සිංහල සිංහාසනය වඩුග රාජවංශයට ම හිමි විය.

ශ්‍රී විජය රාජසිංහ දේවියගේ සොහොයුරු කීර්ති ශ්‍රී රාජසිංහ තෙමේ මහනුවර ඉතිහාසයේ කීර්ති ධරයෙකි. මහනුවර රාජ්‍යයේ අභිමානයත්, රටවැසියාගේ කායික — චෛතසික — සුඛවිහරණය ත්, ජාතික — ආගමික හා රාජ්‍ය සේවයත්, තැකූ එතුමෝ මහා ජනයාගේ ආදරය බෙහෙවින් ලැබූහ. තෙතිස් වසක් පමණ වූ එතුමන්ගේ රාජ්‍යකාලය මහනුවර ඉතිහාසයේ ස්වර්ණයුගය වේ. එසේ වුව ද, කන්ද උඩ වැසි ජන තෙමේ සතුරු පීඩනයන්ගෙන් නො මිදුණේ ය. ක්‍රි: ව: 1763 දී මහනුවරට වැදුණු ඕලන්ද දමරිකයන් රජ මාලිගාදිය ගිනි ලා නගරය විනාශ කිරීම නිසා මෙතෙක් කල් දළුලමින් වැඩී ගෙන ආ ශ්‍රී සමෘද්ධියට පහරක් වැදිණ. මේ අවස්ථාවේදී නගරය හැර දුවූ රජ තෙමේ උවදුරුවලින් පසු නැවතත් මහනුවර රාජධානිය සමෘද්ධිමත් කරලීමෙහි ව්‍යාවෘත විය.

**ලංකාව හා– ඉංග්‍රීසීහු**

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවසාන කාලයේ දී මදුරාසියේ ඉංග්‍රීසි කොටුවේ සිට තානාපතියෙක් පැමිණියේ ය. ජෝන් පයිබස් නම් වූ හෙතෙමේ ඕලන්දයනට විරුද්ධ ව කරන සටන්වල දී සිංහලයනට උපකාර කිරීමට ඉංග්‍රීසීන් කැමැති බව දන්වා පොරොන්දුවක් විය. එහෙත් සිංහලයන් බලාපොරොත්තු වූ එම උපකාරය ඉංග්‍රීසින්ගෙන් නො ලැබුණ හෙයින්, ඔවුහු ප්‍රතිඥාඝාතක ජාතියක් කොට සිංහලයෝ තැකූහ. මෙහෙයින් ම රාජාධි රාජසිංහ රජු දවස පැමිණි බොයිඩ් මහතා ඇතුළු පිරිස සිංහලයන් විසින් නො පිළිගන්නා ලදී. මේ වන විට ඉංග්‍රීසීහු ලන්දේසින්ගේ ත්‍රිකුණාමල කොටුව යටත් කොට සිටියෝ ය. දින කිහිපයකට පසු බේලිද සෆ්‍රෙන් නමැති ප්‍රංශ සෙනෙවියකු විසින් ඉංග්‍රීසීන් පරදවා ත්‍රිකුණාමලය සිය වසඟයට ගන්නා ලද්දේ ය. එසේ වුව ද, ක්‍රි: ව: 1784 දී ඇතිකර ගත් පැරිස් ගිවිසුම නිසා නැවතත් ඒ කොටුව ලන්දේසීන්ට ම ලැබුණේ ය. පසුකල ඕලන්ද — එංගලන්ත දෙ-රට හෙද ව ගිය අවස්ථාවේදී මදුරාසියේ ඉංග්‍රීසීහු ස්ටුවර්

නමැති සෙනෙවියකු යටතේ පැමිණ ක්‍රි: ව: 1795 දී ත්‍රිකුණාමලය නැවත යටත් කොට ගත්හ. මේ වනාහි ලන්දේශීබලය පිරිහී ලංකාව ඉංග්‍රීසිනට අයිතිවීමේ මූලාරම්භය යි.

**ලංකාව හා ඉංග්‍රීසි ආණ්ඩුව**

මේ සිදුවූ නො බෝ දිනකින් ලන්දේශීහු ලංකාවේ තමනට අයිති සෙසු ප්‍රදේශ යන් ද ඉංග්‍රීසිනට පවරා දුන්හ. එතැන් පටන් ඉංග්‍රීසි වෙළඳ සමාගමට අයත් මදුරාසියේ ආණ්ඩුව විසින් පාලනයකරණු ලැබූ එ පෙදෙස් ක්‍රි: ව: 1798 දී එංගලන්ත ආණ්ඩුවට භාර කොට ඉංග්‍රීසි ඔටුන්නට යටත් ප්‍රදේශයක් කරන ලද්දේ ය. එම වර්ෂයේ අවසානයේදී ෆ්‍රෙඩ්‍රික් නෝර්ත්තුමා මෙහි ආණ්ඩුකාර ධුරයට පත් විය. එය මෙරට ඉංග්‍රීසි ආණ්ඩුවේ ආරම්භය වේ.

## ශාසනික ප්‍රවෘත්ති

අටලොස්වැනි ශතවර්ෂය ආරම්භ වන විට ද සතලොස් වැනි ශතවර්ෂයේ පැවැති ශාසනික තත්ත්වය එ ලෙසින් ම පැවතුණේ ය. එහෙයින් ශාසනය තවත් කලක් නො නැසී පැවතීමට නම් මේ වන විට ශාසනශොධනයක් අත්‍යවශ්‍යක ව පැවැත්තේ ය. මෙසේ පවත්නා අතර අනාගත ශාසනයට නව ජීවනයක් ලැබීමේ පෙර නිමිති පහළ කරවමින් වැලිවිට **සරණංකර මෙහෙණ පාණන් වහන්සේ** ප්‍රාදුර්භූත වූහ. සූරිය ගොඩ තෙරුන් සමීපයෙහි පැවිද්ද ලැබූ සරණංකර හිමිපාණෝ පිරිහී පැවැති උපසම්පදාකර්මය ඇතිකොට, එ කල අලජ්ජීන් ගෙන් ගහණ ව පැවැති ශාසනය ශොධනය කිරීමෙන් එය පුනරුත්ථානයට පත් කරවීමේ උදාරාධ්‍යාශයක් ඇතිකර ගත්හ. එ වැනි දුෂ්කරවූ ත්, අත්‍යුදාරවූ ත්, මහා ශාසන සංග්‍රහයක් ඇතිකර ළිමට නම් තමන් වහන්සේ පළමු කොට ප්‍රතිපත්තිධර– ශික්ෂාකාමී — සිල්වත් භික්ෂුවරයකු මෙන් ම ත්‍රිපිටක ධර්මය ඇතුළු භාෂාශාස්ත්‍රයන් හදාළ පණ්ඩිතවරයකු ද විය යුතු බව උන් වහන්සේ කල්පනා කළහ. එ හෙයින් මේ වන විට නෂ්ටප්‍රාය ව පැවැති පිණ්ඩපාතිකාදි ගුණධර්මයන් සමග ම පිරිසිදු සසුන් පිළිවෙත් පිරීමට ත්, තැනින්තැන විසිරී — අතුරු දහන් වෙමින් පැවැති ශාස්ත්‍රය ඉතා දුකසේ අවුලා ගැනීමට ත්, උන් වහන්සේ දිවා රෑ වෙහෙස ගත්හ. සරණංකර හිමි තුමන් ගේ මේ සියලු ආරම්භක ව්‍යාපාරයනට **සිටිනාමළුවේ**, **ඉලිපැන්ගමුවේ**, හා **කදිරාගොඩ**, යන සිල්වත් තෙ නම අනවරතයෙන් උපකාරී වූහ. මීටපසු සරණංකර හිමියන් අනුගමනය කළ බොහෝ කුලපුත්‍රයෝ ද, මේ අභිනව ශාසනික ව්‍යාපාරයෙහි සම්බන්ධ වූ හූ යැ.

**සිල්වත් සමාගම** සරණංකර හෙරණපාණන් වහන්සේ තමන් වෙත පැමිණි ඒ කුල පුත්‍රයන්ට ගුරු වත් හඳවා සිල් ගන්වා තමන් දත් ශාසනික පිළිවෙත්හි හා ධර්මශාස්ත්‍රයෙහි ද පුහුණු කරවූහ. අනුක්‍රමයෙන් මහත් ව ගිය මේ පිරිස **සිල්වත් සමාගම** නමින් ප්‍රකට විය. එ වකට අස්ගිරි — පොහොයමළු, යන විහාරද්වය ප්‍රමුඛ සෙසු ස්ථානයන්හි විසූ බොහෝ භික්ෂූහු මේ 'සිල්වත් සමාගම' නො ඉවසූහ. නන් අයුරින් අපහාස කරන්නට ද පටන් ගත්හ. එහෙයින් මේ පිරිසට **වැලිවිට උන්නාන්සේගේ සමාගම** යෑ යි ඔවුහු කීහ. එ-හෙත් අවංක ප්‍රතිපත්තීන් දුටු නරේන්ද්‍රසිංහ රජ තෙමේ මේ 'සිල්වත් සමාගම' ගැන අතිශයින් පහන් විය. එයින් උපස්ථම්භ ලත් සරණංකර හෙරණපාණෝ සවකීය මනදෙළ මුදුන් පමුණුවා ගැනීමට අවස්ථාව ලද්දාහු — උපසම්පදාව සොයනු කැමැත්තෝ — ඒ සඳහා කටයුතු සංවිධාන කළහ. ඉක්බිති රජ වූ ශ්‍රී විජය රාජසිංහ නරවරයන් ගේ නො මඳ උපකාරය ලත් උන් වහන්සේ, ප්‍රථම උපසම්පදා දූතකාර්ය්‍යය සඳහා සවකීය සිල් වතුන් පස් දෙනකු සුදු වත් හඳවා ඇමතියන් සමඟ විදෙශයට යැවූහ. මේ දූතකාර්ය්‍යය සඵල නො වූයෙන්, ඒ රජතුමන් ගේ කාලයේදී තවත් මෙහෙවරක දූතයන් යෙදූහ. එද ව්‍යර්ථ වූයේ ය. මෙයින් බලාපොරොත්තු සුන් කර නො ගත් සරණංකර සාමණේරයන් වහන්සේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ගේ උපකාරය ලැබ තෙ වැනි වරට ද දූත මෙහෙවරක් යෙදූහ. එය සාර්ථක වූයෙන් උපාලි මහාස්ථවිර ප්‍රමුඛ විංශද්වර්ගික භික්ෂු මහා සංඝ තෙමේ සියම්රටින් වැඩ, මෙතෙක් ලක්දිව අභාවප්‍රාප්ත ව පැවැති උපසම්පදාව ක්‍රි: ව: 1753 දී පිහිටුවා ලංකා ශාසනය චිරස්ථායී කෙළේ ය. මෙසේ ශ්‍යාම්දේශීය උපාලි මහාස්ථවිර ප්‍රමුඛ භික්ෂූන් ගෙන් ආරම්භ වූ මේ භික්ෂු වංශය අද දක්වා ලොක ශාසනයට මහදර්ඝයක් සලසනුයේ— **ශ්‍යාමොපාලි වංශික මහානිකාය** යැ යි දීප්තිමත් ව පවත්නේ යි. මේ වනාහි අටළොස්වැනි ශතවර්ෂයේ ලංකා බුද්ධ ශාසනය පිළිබඳ වෙසෙසින් සැලකිය යුතු සිද්ධිය යි.

## ශාස්ත්‍රීය ප්‍රවෘත්ති

ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ ව පසුගිය ශතවර්ෂයට වඩා මේ ශතවර්ෂය කරුණු කිහිපයක් නිසා සැලකිල්ලට පාත්‍ර වෙයි. මේ ශතවර්ෂයේ ශාස්ත්‍රීය කටයුතු ආරම්භවනුයේ, වර්තමාන ශාස්ත්‍රාභ්‍යුන්නතියට ප්‍රභවය වූ වැලිවිට සරණංකර හිමියන් ගෙනි. වැලිවිට විද්‍යා තඩාගය කරා ගලා ආ ශාස්ත්‍ර ප්‍රවාහද්වයකට ප්‍රස්‍රවණ භූමිය වූ වටඹුළුවේ මහාස්ථවිරයන් වහන්සේ මේ ශතවර්ෂයේ ශාස්ත්‍රය සම්බන්ධයෙන් පරීක්ෂකයකුට දැකිය හැකි ඉතා ඈත ස්ථානය වෙති. පාලිව්‍යාකරණය පිළිබඳ වැලිවිට හිමියන්ගේ ආචාර්ය්‍යවරයන් වන ලෙව්කේරළ හා පල්කුඹුරේ අත්ථදස්සී හෙරණපාණෝ ද, ඒ වටඹුළුවේ මහාස්ථවිරයන්

වහන්සේ ගේ ශිෂ්‍යයෝ ය. මෙ දෙපළ අතින් සරණංකර හිමියන්ගේ පාලිභාෂාඥනයට මුල් පදනම තැබුණේ ය. මෙසේ නොයෙක් තැනින් යම් යම් කරුණු අසා දැනගනිමින් ස්වබුද්ධියෙන් අනු පරීක්‍ෂා කොට පාළිභාෂාව පිළිබඳ සෑහෙන අවබෝධයක් ලැබ ගත් වැලිවිට හිමියෝ ඒ ඒ අවස්ථාවන්හි තමන් ඉගෙන ගත් දෙය ස්වකීය ප්‍රධාන ශිෂ්‍ය වූ සිටිනාමලුවේ සිල්වතුන් වහන්සේට ඉගැන්වීම ද කළහ. මේ ඉගැන්වීම කරන ලද්දේ, ලෙව්කේරාලට නො දැනෙන ලෙස ය.

ලෙවුකේරාල පමණක් නො වැ, එදා සිටි වෙනත් උගත්හු ද තමන් දත් දෙය ලෙහෙසියෙන් අනුනට දීමට කැමැති නො වූහ. එදා ශාස්ත්‍රය බොහෝ දුර්ලභ වැ පැවැතීම නිසා කෙනකුට ලෙහෙසියෙන් උගත හැකි වූයේ ද නොවෙයි. යම් කෙනකුට එය උගත හැකි වන්නේ වර්ෂ කිහිපයක් ගුරුන් සෙවනය කොට ඔවුන් සිත් ගැනීමෙන් පමණකි. එ කල ශාස්ත්‍රෝද්ග්‍රහණය පිළිබඳ ගුරු පඬුරු දීමත්, ගැනීමත් එකසේ බල පැවැත් වූ බව පෙනේ. සරණංකර සාමණේරයන් වෙත ලෙවුකේරාලට දිය හැකි ගුරු පඬුරක් නො වූයෙන් උන් වහන්සේ එතුමන් වෙත පුහුණු කළ සතිපට්ඨාන සූත්‍රය භාවනා කොට ඉන් ජනිත පුණ්‍යඵලය ගුරුපඬුරු වශයෙන් පිදූ බව ප්‍රකාශිත යි.

පොත්පත් දුර්ලභ වීමත්, ඉගැන්වීමෙහි කැමැත්ත දක්වූ ගුරුවරුන් නොමැතිවීමත්, එයට මාර්ග නො තිබීම ත්, යන කරුණු එදා ශාස්ත්‍රය යට පත්වීමට හේතු වූයේ ය. ශාස්ත්‍ර ව්‍යාප්තිය සඳහා ඒ අවහිරකම් නැති කරවීම සරණංකර හිමි තුමන්ගේ එක් අදහසෙක් විය. ඒ සඳහා ප්‍රමාණව ත් දැනීමක් ඇති ශිෂ්‍ය පිරිසක් ඇතිකළ උන් වහන්සේ නරේන්ද්‍රසිංහ රජු ගේ උපකාරය ලැබ උඩුනුවර නියමකන්දේ විද්‍යාස්ථානයක් පිහිටුවා ගත්හ. එදා ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ මධ්‍යස්ථානයක් වූ ඒ ශාස්ත්‍ර ශාලාවෙන් සිංහලයට මහත් සේවයක් සැලසුණේ ය. පොත්පත් මතු වී — පඬිවරයන් පහළ වී — ශාස්ත්‍රය සුලභ වීමෙන් ලංකාව බබලන්නට වූයේ, එතැන් සිට ය.

ශාස්ත්‍රීය කටයුතු අනුව අටළොස්වැනි ශතවර්ෂය බෞද්ධයනට මතු නො වැ, කතෝලික සමය වාදීනට ද සමරණීය අවස්ථාවක් වෙයි. කතෝලික සමය පිළිබඳ සිංහල ග්‍රන්ථයන් ගේ ආරම්භය ත්, අටළොස්වැනි ශතවර්ෂයට අයත් වන බැවිනි. මේ නිසා වර්තමාන ශාස්ත්‍රෝන්නතියේ උදය කාලය වූ එම ශතවර්ෂය වාර්තමානිකයන් විසින් සාදරයෙන් සිහිපත් කළ යුතු වේ.

# ග්‍රන්ථ විවරණ

## මණිචෝර ජාතක කාව්‍යය

කර්තෘ:— කුලසේකර අප්පුහාමි
කාලය:— ක්‍රි: ව: 1714
ප්‍රමාණය:— පද්‍ය 435

සොළොස්වැනි ශතවර්ෂයේ අවසානයේ පටන් මුහුදුබඩ ප්‍රදේශය පෘතුගීසීන් ගේ දරුණු පාලනයට පත් වූයෙන් ස්වභාෂා සාහිත්‍යයේ ද ශීඝ්‍රශීලී පරිහානිය ආරම්භ විය. එහෙයින් ම කෝට්ටේ යුගයෙහි මුල් බැස තිබූ මුහුදුබඩ ගත්කරු පරපුර කැඩී බිඳී ගියේ ය. මින්පසු කලක් ගත වන තුරු මුහුදුබඩ ගත්කරුවකු ගැන අසන්නට නො ලැබේ.

මේ මෙසේ තිබියදී 1714 වැනි ක්‍රිස්තවාබ්දයෙහි ලංකාවෙහි දක්ෂිණ දිශා භාගයේ විසූ වියතකු කෙරෙන් මට සිලිටු කාව්‍යයක් පහළ වූයේ ය. ඒ වූකලි මාතර කුලසේකර අප්පුහාමි ගේ **මණිචෝර ජාතක කාව්‍යය** යි. කුලසේකර අප්පුහාමි විශාරද පණ්ඩිතයකු හෝ කමනීය නිබන්ධකයකු නො වුව ද, පූර්වෝක්ත හේතූන් නිසා ගනඳුරු මැද කද්‍යෝකිමියකු මෙන් සිංහල සාහිත්‍ය වංශයෙහි පැනේ.

කුලසේකර අප්පුහාමි වනාහි ඌරුගමුවේ * රාජගුරු නම් පණ්ඩිතයාණ කෙනකුගේ ශිෂ්‍යයෙකි. අටළොස්වැනි ශතවර්ෂයේ මුල් භාගයේ විසූ විද්වතුන් කිහිපදෙනා අතර ඌරුගමුවේ රාජගුරුතුමා ද කෙනෙකි. සංස්කෘතාදි භාෂාන්තරයන්හි හා කාව්‍ය ව්‍යාකරණාදියෙහි ප්‍රවීණ වූ හෙතෙමේ වෛද්‍ය ශාස්ත්‍රයෙහි ද දක්ෂයෙක් වූයේ ය. එතුමන් වෙත ශාස්ත්‍රය හදාළ ශිෂ්‍යයන් අතර මේ කුලසේකර අප්පුහාමි ද කෙනෙකි.

සත්තුභත්ත ජාතක — කුස ජාතක — යන ශ්‍රේෂ්ඨ සිංහල කාව්‍යයන් මෙන් ම මණිචෝර ජාතක කාව්‍යය ද ලියන ලද්දේ කාන්තාවක ගේ ආරාධනයෙනි. කාව්‍ය කතුවරයන් විසින් ග්‍රන්ථාරම්භයෙහි ගුණස්තව පූර්වක වැ සඳහන් කරන ඒ කාන්තාව වූකලි මාතර සුප්‍රසිද්ධ විජයකෝන් නම් මැතිවරයකුගේ බිරිඳ යැ. දයා දාක්ෂිණ්‍යාදි ගුණයෙන් හා ශාස්ත්‍ර ඥානයෙන් උසස් ව සිටි විජයකෝන්දේවිය දූ සමයේ දියුණුව තැකූ ගුණවත් කාන්තාවකි. මෙම කාව්‍යය පමණක් නො වැ, ඇය විසින් තවත් ග්‍රන්ථ ලියවන ලද බව—

'අදර බැති බුදු ගුණ — දහම් පොත්පත් ලියෙව් අපමණ'

යන්නෙන් නිර්දිෂ්ට යැ. 'මණිචෝර ජාතක කාව්‍යය' වනාහි ඇගේ පශ්චිම ආරාධනයෙන් ලියූ ග්‍රන්ථය බව පෙනේ. මෙ කව නිම කිරීමට පළමු ව එම වර්ෂයේ ම ඇය මිය ගිය බව

* ඌරුගමුව මාතර ප්‍රදේශයේ පිහිටියේ ය. මෙගම රාජසිංහ ii රජු විසින් ස්වකීය අග්‍රාමාත්‍ය වික්‍රමරත්නට දෙවූ බව ජනකථා යි.

සඳහන් වන බැවිනි. එහෙයින් මේ හෙළු කවිය ඇසීමට ඇය කෙරෙහි පැවැති මනෝරථය මුදුන් නො පැමිණියේ ය. කුලසේකර කවියෝ ජාතකය කවි කොට නිමවා සවකීය ආරාධිකාව සිහි කරමින් මෙසේ පින් පමුණු වති.—

'මෙ ද හ මි  කවි කරන ලෙස සැලසු අනුහ  සිත්
තෙරුවන්  දුරු මුදුන මෙ කුලඹ පැතු ලෙ  සිත්
අ ද හ මි  සිවු අපායට ලං නො වම ගො  සිත්
ල බ මි ත්  පුරිස් බව දිවසිරි විඳුම තො  සිත්'

**කථා සාරය** බෝසත් බරණැස කෙලෙඹි පුත්‍රයෙකි. සුජාතා නම් බෝසත් පත්නී, පරම රූප සෞභාග්‍යයෙන් සමන්විත යෞවනප්‍රාප්තවූවා - දුටුවන් මනනුවන් පැහැර ගන්නී ය. නැදි-මයිලන් දකිනු රිසි බෝසත්හු සිය බිරින්දත් සමග රියෙන් යන තැනැත්තෝ—බරණැස් රජු විසින් දක්නා ලදහ. කාමයෙන් දශ්ධ වූ බ්‍රහ්මදත්ත තෙමේ බෝසත් බිරිඳ තමා අයත් කර ගනු සඳහා බෝසතුන් මැරවීමට කල්පනා කොට සිය ඔටුණු මිණ මෙහෙකරුවකු ලවා බෝසතුන්ගේ රියේ දමවිය. ඉක්බිති රජුගේ සිළුමිණ සොරකු විසින් පැහැර ගන්නා ලදැයි මුළුනුවර සොයන ඇමැතියෝ — බෝසත්රියේ තිබූ මිණ දැක—"මේ මණිචෞරයා" යයි අල්ලා ගෙන ගොස් රජ අණ පරිදි හිස් සිඳුවනු සඳහා දම්ගෙඩියෙහි හොවාලූහ. තමා උදෙසා නිර පරාධී සිය සැමියාට පත් වූ විපතින් කම්පා වූ සුජාතා දේවී — යෞවනයෙහි පටන් මෙතෙක් රැකි නො කැළල් පතිව්‍රතය සිහි කොට සිය හිමියන් මුදා දෙන ලෙස දෙවියන් ඇයදූ ය. එ සඳ ශක්‍රයන්ගේ පඬුඇඹුල හුණු විය. ශක්‍රයෝ දම්ගෙඩියෙහි හෙවූ බෝසතුන් ගෙන රාජාභරණයෙන් සරසා මඟුලැතු පිට තබා ඇතු අරා හුන් බඹදත් රජු ගෙන දම්ගෙඩියෙහි හොවාලූහ. ඔසවා ලූ පොරව රඳවා ගත නුහුණු වධක තෙමේ රජු හිස සිඳලී ය. ඇමැතියෝ බෝසතුන් බරණැස් රාජ්‍යයෙහි අභිෂේක ක ළහ.

පතිව්‍රතයෙහි ගුණමහිමය ප්‍රකාශ වන මෙම ජාතක කථාව ම කවි කිරීමට තෝරා ගැනීමේ හේතුව පූර්වෝක්ත ආරාධිකාව එම ගුණය මැණවින් දත් තැනැත්තියක හෙයිනි. යථාස්ථාන යන්හි සුදුසු වර්ණනා ඇතුළත් කරමින්, සම්භාවනීය පද්‍ය ග්‍රන්ථයන් ගුරුස්ථානයෙහි තබා කව් සාරසිය පන් තිසකින් යුක්ත කොට ගෙතූ මේ කාව්‍යය ආදේශයත්, විනෝදය ත්, සඳහා පශ්චිම ජනතාවට එළවත් යැ. වර්ණනාවන්හිදී ගත් කතුවරයන් ගුත්තිලය සහ කාව්‍යශේඛරය බෙහෙවින් ආශ්‍රය කොට තිබේ. නගර වර්ණනයන්හිදී කාව්‍යශේඛරයේ පුරවර්ණනා පද්‍යයන්හි අදහස — අලඞ්කාරය පමණක් නො වැ, වෘත්තය ද ගත්සේ ය. සුජාතා වර්ණනය කුසදාහි ප්‍රභාවතී වර්ණනාවට සමාන ය. නැදි - මයිලන් දැකීමට ගිය බෝසතුන් ගේ මාර්ගය වැනුයේ, දෙව්ලොව බලා යන බෝසතුන් පිළිබඳ වූ ගුත්තිල වර්ණනය ආදර්ශයට ගැනීමෙනි. මෙලෙසින් ම බෝසතුන්

බරණැස් රජය ලත් පසු නුවරුන් ඇරඹූ උළෙල මෙහි ආයේ. ගුත්තිල කාව්‍යයේ සැණකෙළි, විණාමණ්ඩප හා බරණැස් රජ පිරිස පිළිබඳ ලියැවුණු පද්‍ය රාශියකගේ සංකලනයෙනි.

'පා පියුම් මද ලැසි ගමන් අත් ලෙලදෙමින් නෙතඟින් බලා'

යනුවෙන් මෙ කවෙහි ආරබ්ධ නාරිනෘත්‍යය වැත්තෑවේ හිමියන් ගේ—

'රූ රුසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා'

යන සුරඞ්ගනා නෘත්‍යයේ ඡායාවක් බව එක් වරට ම පෙනේ. තවද,

'බරිනි සිරි පුර ගිර — යෙතෙහි බඹලූ වලල්ලක් මෙන'

'සුගත් සිවුරෙන් වසත සිරි වෙර'
'ඉඳවා දෙර දෙර පසතුරු රම් බා'

ආදී බොහෝ තැන්වල දක්නට ලැබෙන පද්‍යාර්ථයන්ගෙන් මේ කවියාට ගුත්තිල කව පිළිබඳ පැවැති පුහුණුව ප්‍රමාණ කර ගත හැක්ක.

මෙසේ උසස් සාහිත්‍ය කෘතීන් ඇසුරු කරමින් වුවද, තමන් ශරීර කොට ගත් කථාව සරල සේ නිරවුල් වැ පැවසීමට කවියා සමත් විය.

'දෙගොඩම සවි ඉසු රූ
එක පමණ වේ විසිතු රූ
කිරු සිරි තුළායු රූ
දිලෙහි පාලම එගඟ පියක රූ'

නිල්වලා ගඟේ පාලම වැනෙන මේ කවියෙන් කුලසේකර අප්පුහාමි තුළ කාව්‍යකරණයෙහි පැවැති ශක්තිය වටහා ගත හැකි ය. එය 'මණිචෝර ජාතක කාව්‍යය' පඬුවන්ගේ බුහුමනට පාත්‍ර කරවීමට ඇති අවකාශය යි.

## සාරාර්ථ සඞ්ග්‍රහ

කර්තෘ:— වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සාමණේරයන් වහන්සේ
කාලය:— ක්‍රි: ව: 1718
ප්‍රමාණය:— පරිච්ඡේද 9

නව අරහාදි බුදුගුණයන් අතුරෙන් 'බුද්ධො' යන වචනය ගෙන පෙළ – අටුවා – ටීකාදියෙන් කරුණු ගෙන හැර පා, එය සර්වඥයන් වහන්සේට අන්වර්ථානුගත නාමයක් බව සමර්ථනය කරමින් ලියූ ධර්මශාස්ත්‍රීය නිබන්ධය 'සාරාර්ථ සඞ්ග්‍රහ' නමින් හඳුන්වනු ලැබේ.

ගද්‍ය කාව්‍ය භෙදයෙහි ලා මෙම ග්‍රන්ථය කොෂ කාව්‍ය සඞ්ඛ්‍යාවට ඇතුළත් වෙයි. එක ජාතිය කරුණු සමූහයක් එක් තැන් කොට ලියනලද ග්‍රන්ථය 'කොෂ' නම්. ශබ්ද යන්ගේ සමූහ රචනය 'ශබ්ද කොෂ' වූවාක් මෙනි. මෙම ග්‍රන්ථය ද පෙළ — අටුවා — ටීකාවන්ගෙන් උපුටා ගත් විවිධ ධර්ම කොටස්‍යයන් එක්තැන් කොට ලියනලද හෙයින් කොෂ සඞ්ඛ්‍යාවට ම යේ. සිංහල සාහිත්‍ය වංශයෙහි අති ප්‍රකට බුත්සරණ — අමාවතුර — රත්නාවලී — පූජාවලී — ආදි මහඟු ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථයෝ ද මෙම කාව්‍ය ලක්‍ෂණයෙන් ම රචිත වූවාහු වෙති.

කරුණු පිළියෙල කළ අයුරින් මෙම ග්‍රන්ථයෝ, මෙසේ එක් මග ගෙන එක ම කාව්‍ය සංඛ්‍යාවකැ ඇතුළත් වු නමුදු — රචනයෙහිදී කතුවරයන් ගත් මග අනුව චූර්ණිකාදි විවිධ ගද්‍යාංශ භෙදයන්හි ඇතුළත් වෙති. ඒ භෙදයන් අතුරෙහි මේ 'සාරාර්ථ සඞ්ග්‍රහය' චූර්ණිකා සංඛ්‍යාවෙහි වැටේ. දීර්ඝ සමාස පදයන්ගෙන් තොර වැ, ප්‍රසාද ගුණයෙන් යුක්ත කොට කෙටි වාක්‍යාංශයන් ගෙන් රචිත වූ බැවිනි.

'සාරාර්ථ සඞ්ග්‍රහය' ලියූ වැලිවිට සරණඞ්කර සාමණෙර යන් වහන්සේ වාර්තමානිකයනට අමුතුවෙන් හඳුන්වා දිය යුත්තෝ නො වෙති. වර්තමාන ධර්මශාස්ත්‍රාදීපතියට මූලාරම්භකවූවෝ ඔබ ම ය.

සරණඞ්කර මාහිමියන් වහන්සේ ක්‍රි: ව: 1698 දී මහනුවරට සමීප තුම්පනේ වැලිවිට නම් ගමෙහි ජනිත වූහ. සොලොස්වියෙහිදී සූරියගොඩ තෙරුන් සමීපයෙහි පැවිදිව පස්පනස් හැවිරිද්දෙහි උපසම්පදව ලද්දුහ. ක්‍රි: ව: 1753 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සඟරජ පදවියෙන් පුදනු ලැබූහ. මේ වනාහි ලඞ්කා බුද්ධශාසනය ප්‍රතිපත්තීන්ගෙන් තොර වූ භික්‍ෂූන් සමූහයකින් යුත් සමයෙකි. ආරම්භයේ පටන් ම සරණඞ්කර හිමියන්ගේ දැඩි ආයාශය වූයේ පිරිහී පැවැති බුද්ධශාසනය නගා සිටුවා ධර්මශාස්ත්‍රාලොකයෙන් ලක්දිව බැබල වීමට ය. ඒ සඳහා පුරෝගාමී වැ කටයුතු කරනු කැමැති වූ උන් වහන්සේ ශාසනික ප්‍රතිපත්ති පිරිමත්, ධර්මශාස්ත්‍රාභ්‍යාසයත්, එකවට ඇරඹූහ. එවකට අභාවප්‍රාප්ත වැ පැවැති පිණ්ඩපාතිකාඞ්ගය ද, උන් වහන්සේ විසින් නැවත ආරම්භ කරන ලද්දේ ය. තැනින් තැන පැවැති ඉතා කුඩා ශාස්ත්‍ර විසුලිඩිතයන් ආයාශයෙන් එකතු කොට ගත් මේ පින්වතාණෝ රට මුලුල්ල එකලූ කරලූ මහා ශාස්ත්‍රාලොකයක් උපදවා ලූහ. මෙසේ ශාසනික ප්‍රතිපත්ති යළිත් ඇතිවී, ශාස්ත්‍රාලොකයට පවන් සැලී දිලිහී ගිය කල්හි සරණඞ්කර හිමිතුමන් වෙත නරෙන්ද්‍රසිංහ නරෙන්ද්‍රයන් ගේ හා මහාජනයා ගේ ප්‍රසාදය ද නො මඳ ව ගලා එන්නට පටන් ගත. මෙසේ රජතුමන් ප්‍රමුඛ රටවැසියන්ගෙන් උපස්ථම්භය ලත් උන් වහන්සේ ග්‍රන්ථ කරණයෙහි නිරත වූහ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රන්ථ කිහිපයක් සිංහලයෙහි හා පාලියෙහි ප්‍රවේශය ලැබූහ. එම කෘතීන් අතර **සාරාර්ථ සඞ්ග්‍රහය** සිංහල සාහිත්‍යයේ එවක ප්‍රවේශය ලත් ශ්‍රේෂ්ඨ ගද්‍ය ග්‍රන්ථයක් විය. 'අභිසම්බෝධි අලඞ්කාරය' පාලි සාහිත්‍යයෙහි ඛණ්ඩ කාව්‍යයක් විය. **සතරබණවර සන්නය, භේසජ්ජ මඤ්ජුසා සන්නය, මහාබෝධිවංස සන්නය, රූපමාලාව හා මුනිගුණාලඞ්කාරයත්** උන් වහන්සේ ගේ අවශේෂ කෘතීහු ය.

මෙසේ විනෂ්ට ව පැවැති උපසම්පදාව ඇති කරවා ලක්දිව කසාවතින් බබුලුවා — අනාගත ජනතාවට වැඩ වන පරිදි මහ වියතුන් සියගණනින් පහළ කර වූ මේ මහෝත්තමයාණන් වහන්සේ උත්පත්තියෙන් අසූවිය ඇත්තෝ ක්‍රි: ව: 1778 දී අපවත් වී වදාළෝ ය.

සඟරජ මාහිමියන් 'සාරාර්ථ සඞ්ග්‍රහය' ලියන ලද්දේ නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙනි. මේ වන විට උන් වහන්සේ උත්පත්තියෙන් සම විසිවියෙහි පිහිටිසේක් — පැවිද්දෙන් සතරවැනි වස ගෙවා සිටියෝ ය. සරණඞ්කර මාහිමියන් වහන්සේ ගේ උසස් ප්‍රතිභානයත්, අතුල්‍ය බහුශ්‍රැත භාවයත්, මැන ගැනීමට මේ වියෙහිදී කළ මේ 'සඞ්ග්‍රහය' රජු ප්‍රමුඛ රට වැසියාට ආදසයක් බඳු විය. පොත පත ආශ්‍රයෙන් ලත් පාණ්ඩිත්‍යය ඇති උගතුන් විරල වැ පැවැති, එසමයෙහි මේ ග්‍රන්ථයෙන් දක්වුණ සරණඞ්කර මාහිමියන් ගේ ග්‍රන්ථාභ්‍යාස ඥානය එකල සරාජක රටවැසියා විසම ගැන්වීමෙහි සමත්වූවාට සැක නැති. ප්‍රතිභානයෙන් උස් වූ බහුශ්‍රැත භාවයෙන් පොෂිත වූ මහා පඬිවරයකු මෙන් උන් වහන්සේ රටවැසියන් විසින් පිළිගනු ලැබූයේ, මින්පසු ව යැ.

'සාරාර්ථ සඞ්ග්‍රහය' ලිවීමෙදී ගත්කරුවන් වහන්සේ ග්‍රන්ථ විශාල සංඛ්‍යාවක් ඇසුරු කළහ. විසුද්ධිමග්ග—බුද්ධවංස—බෝධි වංස — ජාතකට්ඨකථා — ධම්මපදට්ඨකථා — මිළින්ද පඤ්හා — ආදි ග්‍රන්ථයන්ගෙන් වාක්‍ය ඛණ්ඩයෝ උපුටා දක්වන ලදහ. මේ හැර මෙහි නම් නො දක්වීමෙන් ඇසුරු කර ගන්නා ලද පෙළ — අටුවා පොත් ද බොහෝ ය. එබඳු හැම තැනෙක්හි ම දක්නට ලැබෙනුයේ, මූල ග්‍රන්ථයේ පරිවර්තන ස්වරූපය මැ යි. යම් යම් කරුණු සවුට කරලීමෙහි 'ෂට්දර්ශන සඞ්ග්‍රහ' වැනි බෞද්ධ න්‍යාය ග්‍රන්ථ ද, ඇසුරු කරන ලදි. ථූපවංස — බෝධි වංස ගැටපද — රත්නාවලී — පූජාවලී — ආදි පෞරාණික සිංහල ධර්ම ග්‍රන්ථයෝ ද මේ නිබන්ධ කරණයෙහි බෙහෙවින් උපයෝගී වූහ. එහිනුත් රත්නාවලිය ප්‍රකටසාම්‍යයෙන් ම ඇසුරු කරන ලද්දේ විය. මහාකප්පින ස්ථවිර චරිතය වැනි ඇතැම් කථාවක් රත්නාවලියෙහි ආ පරිද්දෙන් ම දක්වා ඇත. මණිකාර කුලූපග කථාව වැනි ඇතැම් තැනක වාක්‍යලීලය පමණක් ඇසුරු කැරිණි. 'සාරාර්ථ සඞ්ග්‍රහ' යෙහි දක්වෙන මූල ග්‍රන්ථයන් ගේ පාඨ පරිවර්තනය එක ම වාක් ස්වරූපයක

පිහිටා නැත. බොහෝ තැන පරිවර්තනය පදනුගත අර්ථ මාත්‍රය දෙන වාක්‍ය ස්වරූපය දක්ව යි. ඇතැම් තැනක් සරස-සාටොප — සාලඞ්කාර — උපමා පද්ධතීන්ගෙන් විසිතුරු කොට ලියැවුණේ ද වෙයි. මේ අතර දීර්ඝ වාක්‍යයන්හි සාරාංශය ඉතා කෙටියෙන් හා කෙටි වාක්‍යයන් විස්තරයෙන් ද, අනුවාදිත තැන් දක්නට ලැබේ. දම්සක් පැවතුන් සූත්‍රදෙශනාව වැනි ඇතැම් පාලිවාක්‍යයක අදහස දක්වන ලදුයේ, පදාර්ථ කථනයෙනි.

මෙසේ සියලු ග්‍රන්ථයන්ගෙන් ම උපුටා ගත් කථානුකථා පිළිබඳ බම් නය 'බුඬ' ශබ්දය සමර්ථනය සඳහා ම විය. ඒ වනාහි පරිච්ඡේද නවයකින් විශාල වූ බම්සඞ්ග්‍රයකි. එහි 'ප්‍රකරණාරම්භක' නම් ප්‍රථම පරිච්ඡේදයෙහි ප්‍රාරම්භය වශයෙන් 'බුඬ' ශබ්දයාගේ ව්‍යුත්පත්තිය — ග්‍රන්ථකරණ ප්‍රවෘත්තිය හා දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ද විස්තර කරන ලදි. දෙවැනි පරිච්ඡේදය 'ප්‍රථමාභිනිහාර' නමි. එහි සඳහන් වනුයේ දීපඞ්කර පාදමූලයේදී කල ප්‍රථමාභිනිහාරය හා පාරමී විභාගයත් ය. කොණ්ඩඤ්ඤාදි තෙවිසි බුදුන්ගෙන් ලත් විවරණ කථා ඇතුලත් කොට 'ද්විතියාභිනිහාර' නම් තෙවැනි පරිච්ඡේදය සංගෘහීත ය. චතුර්ථ පරිච්ඡේදයෙන් විස්තර වනුයේ බුඬත්වයට පැමිණීම හා බොධි මූලයෙහිදී අවබොධ කල ප්‍රතීත්‍ය සමුත්පාදය පිළිබඳ විභාගය ද වෙයි. ඒ 'අභිසම්බොධිකථා' නම් විය. සත් සති කථා හා දම්සක් පැවතුන් සූත්‍ර දෙශනාව දක්වා ප්‍රවෘත්ති 'දම්සක් පැවතුන් සූත්‍ර දෙශනා කථා' නම් පස්වැනි පරිච්ඡේද යෙහි ආයේ ය. විසුඬිමග්ගයේ දැක්වෙන ආර්ය සත්‍ය විභාගයේ ටීකාගත කරුණුවලින් ද යුක්ත අනුවාදය, 'ආර්යසත්‍යකථා, නම් කොට සවැනි පරිච්ඡේදයේ ඇතුලත් කරන ලදි. තෙලෙස් ධුතාඞ්ග හා කාශ්‍යප චරිතය 'මහා කාශ්‍යපස්ථවිරාවබොධ කථා' නම් සත්වැනි පරිච්ඡේදයේ ඇතුලත් විය. අටවැනි පරිච්ඡේදය මහා කප්පින ස්ථවිර චරිතය ප්‍රමුඛ කොට වර්ණනා කරන ලදුයෙන් 'මහා කප්පිනස්ථවිරාවබොධ කථා' නම් විය. 'මඞ්ගල දෙශනා' නම් වූ නවවැනි පරිච්ඡේදයේ මඞ්ගල සූත්‍රය විස්තර කරන ලද්දේ ය.

මේ හැම පරිච්ඡේදයක් ම අන්තයෙහි—

> "අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං- භාවෙතබ්බං ච භාවිතං
> පහාතබ්බං පහීනමෙම-තස්මා බුඬොස්මි බ්‍රාහ්මණ!"

යන ගාථාව දක්වමින් ග්‍රන්ථ කාරකයාණෝ ස්වකීය ප්‍රස්තුතය සනාථ කළහ.

# සුමුගු ද කව

කර්තෘ:- මහාසෙන හිමියෝ
කාලය;- ක්‍රි: ව: 1723
ප්‍රමාණය:— පද්‍ය 887

**කථා සාරය**

බෝසත්හු තවුසෙක් ව වනැ විසූහ. එවලැ වසන බෝසත්හට මිත්‍ර වූ බිරම් රකුසෙක් මනුෂ්‍ය ස්ත්‍රියක භාර්‍ය්‍යාකොට වෙසෙයි. හේ ඇය කරඬුවක බහා ලා කුසෙහි රඳවා රකියි. දිනෙක නහනු පිණිස පැමිණි රකුස් තෙමේ ඇය පළමු නහවා විල් තෙර කරඬුවෙහි සිටියදී නහන්නට වන. එකෙණෙහි වයස්සු පුත්‍ර නම් රූපත් විද්‍යාධරයෙක් අහසින් යන්නේ, ඇය විසින් දක්නා ලදි. ඕ ඔහු අත්සනින් කැඳවා කරඬුව තුළ දෙදෙන ම හෙවැ, නොපෙනී සිටියාහ. රකුසා කිසි ත් නො දත්තේ සුමුග ගිල පියා අතර මග බෝසත් දකිනු රිසි වැ අසපුවට ගියේ ය. "ති දෙනෙක් මේ කොහි යෙති" බෝසත්හු රකුසුගෙන් විචාළහ. විමතියට පත් රකුස් තෙමේ සියලු පුවත් විචාරා දැන කරඬුව වමාරා විවෘත කෙළේ ය. එකෙණෙහි ම විද්‍යාධර තෙමේ පැන ගියේ ය. බෝසතුන් කෙරෙහි පහන් සිතැති රකුස් තෙමේ තමා මරණින් ගැලවීම නිමිති කොට මුව නො සෑහෙන සේ තුති වදන් කියා ඔබගේ අනුශාසනයෙහි පිහිටා දරුණු කම් හැර දූහැමින් වාසය කෙළේ ය.

බෝසතුන් ගේ ප්‍රඥා මහිමය සහ ස්ත්‍රීන් ගේ දුර්ගුණය ප්‍රකාශ වන මේ වස්තුව ජාතකට්ඨ කථාවේ නවක නිපාත යෙහි ආයේ ය. එය කථා ශරීර කොට ගත්නෝරුව විහාරයේ වැඩ විසූ මහාසෙන හිමියන් විසින් මෙ කව කරන ලද්දේ ය. මහාසෙන හිමියෝ පෝයමලූ විහාරයේ වැඩ විසූ වටඹුළුවේ මහා ස්ථවිර පාදයන් ගේ අන්තේවාසිකයෙකි.

වටඹුළුවේ හිමියෝ ලක්දිව ශාසනය පිරිහී පැවැති අටළොස් වැනි ශත වර්‍ෂයේ ආරම්භ කාලයෙහි විසූ කීර්තිමත් උගතුන් කිහිප දෙනා අතර කෙනෙක් වූහ. විමලධර්මසූර්‍ය්‍ය ii රජුගේ කාලයේදී උපසම්පදාව ලත් නෛනිස් නම ගෙන් මෙතුමෝ ද කෙනෙකි. කරුණු සෙවීමේදී වටඹුළුවේ හිමියන් හමුවන්නේ හුදෙක් පඬිවරයකු වශයෙන් මතු නො වැ එකල විසූ අතළොස්සක් පමණ වූ ප්‍රතිපත්තිකාමී සුසිල්වත් භික්‍ෂූන් කිහිප දෙනා අතර ද කෙනකු හැටියට යැ. උන් වහන්සේ-ගෙන් ශාසනය උගත් පල්කුඹුරේ අත්ථදස්සි, ලෙවුකේ රාළ ආදී වියතුන්. අතර මේ 'සුමුගුද කව' කළ හිමියෝ ද කෙනෙක් වූහ.

'සුමුගුද කව' මහසෙන් හිමියන් විසින් නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනය පරිදි ක්‍රි: ව: 1723 දී කොට නිම වන ලදි. ග්‍රන්ථ කරණයෙහි ආරාධනය 1720 දී කර තිබෙන හෙයින්, ඒ වර්‍ෂත්‍රය තුළ මෙ කව කොට නිම කළ බව පෙනේ.

ආරම්භයෙහි එන පද්‍ය එක්සිය තිස ග්‍රන්ථ කරණ ප්‍රවෘත්ති සඞ්ග්‍රහ කොට සෙංකඩගල පුර සහ නරේන්ද්‍රසිංහ රජු වර්ණනා කිරීම සඳහා ලියන ලද්දේය. දූරෙ නිදානයෙන් ආරම්භ කොට ලියන ලද පද්‍ය සාරසිය තෙ විස්සකින් යුත්, බුද්ධ චරිත වර්ණනයෙක් මෙලෙහට එයි. බොහෝ ජාතක කවීන් ප්‍රස්තුතයට පෙරාතු ව මැ සංක්ෂිප්ත බුද්ධ චරිත වර්ණනයක් කළ නමුදු, මෙතරම් විශාල පද්‍ය සඞ්ඛ්‍යාවකින් සැරසූ බුදු ගුණ වැනුමක් අනික් එක ද ජාතක කාව්‍යයක වත් නැත. ඉක්බිති ලියන ලද පද්‍ය තුන්සියයකින් සුමුගුදුව විස්තර කරනලදි. අවසාන පද්‍ය සූතිස පුණ්‍යානුමොදනාදිය සඳහා උපයුක්ත යැ.

මෙසේ සුමුගුදු කව සිංහල සාහිත්‍ය මාර්ගයෙහි ප්‍රමාණයෙන් විශාල පද්‍ය ග්‍රන්ථයන්ගේ සම කක්ෂාවට පැමිණි නමුදු, මේ වූකලි කව් සිළුමිණ- කව් සේකර- වැනි මහා කාව්‍යයක් නොවේ. ඉදින් ගත් කතුවරයනට අභිමත වූයේ නම් මෙද සර්ග බන්ධ මාත්‍රයෙන් මහා කාව්‍ය සඞ්ඛ්‍යාවට ඇතුළත් කළහැකි ව තිබුණි. එහෙත් මහසෙන් හිමියෝ ද, වැත්තෑවේ හිමියන් මෙන් සවකීය ග්‍රන්ථය ඛණ්ඩ කාව්‍ය සංඛ්‍යාවෙහි බැස ගන්නට ඉඩ තබමින් නැවතුණහ.

මහනුවර ආරම්භයෙහි පටන් මේ වනතුරු රචිත ජාතක කාව්‍යයන් අතර ඉතා හොඳ පද්‍යයන් ඇති ග්‍රන්ථය මෙම සුමුගුදුව යි. මහසෙන් හිමියනට ද ගුරුපොත් වූයේ ගුත්තිලය හා කව්සේකර ය යි.

පටන් ගත් කථා මාර්ගය නො පැකිළ මට සිලුටු- ප්‍රසාද ගුණ යුක්ත- සරල පද්‍යයෙන් පැවසීමට මහසෙන් හිමියෝ සමත්වූහ. සුදුසු තන්හි යෙදූ වර්ණනාවෝ ද කථා ශරීරය හා සම්බන්ධ වූවෝ යැ. මහනුවර කාලයෙහි ශ්‍රේෂ්ඨ පද්‍ය ග්‍රන්ථ නො ලියවිණැ යි යන මතයට සුමුගුදු කවෙන් වජ්‍රවත් පිළිතුරක් දිය හැකි ය.

## හරිච්චන්ද්‍ර කථා කාව්‍යය

කර්තෘ— දෙඩම්වල කිවිදු
කාලය - ක්‍රි: ව: 1723
ප්‍රමාණය:— පද්‍ය 409

**කථා සාරය.** දඹදිව අයොධ්‍යා පුර හරිච්චන්ද්‍ර නම් රජෙක් සත්‍යය දිවි දෙවනු කොට රකී. දිනෙක ශක්‍ර පුර සුදම් දෙව් සබයේ දඹදිව කවර නම් රජෙක් සත්‍ය පරම වූයේ යථාවාදි වේ දැ යි ප්‍රශනයෙක් උපන. හරිච්චන්ද්‍ර රජ සත්‍යය දිවි දෙවනු කොට රකී යයි වශිෂ්ට මුනි කීය. "හේ කවර නම් සත්‍යවාදියෙක් ද? මුසා රජෙකැ "යි විශ්වා පුත්‍ර තාපසයෝ පැවසූ හ. "ඉදින් ඔහු ලවා බොරුවක් කියවනු හැකි වී නම්- හිසින් දූරු ගිනි කබලක් ඇතිව නිරය වට ඇවිදි මැ "යි වශිෂ්ටයෝ ප්‍රතිඥා කළෝය.

“ඔහු ලවා බොරුවක් කියවනු නො හැකි වී නම් මම ද ඒ වධය ම විඳිමැ”යි වහසි බිණූ විශ්වා පුත්‍ර තෙමේ අයෝධ්‍යා පුර නරපතීන් වෙත එළඹ, තමා කරනු කැමැති යාගයට ප්‍රමාණ වූ ධනය ඉල්වී ය. රජ තෙමේ එය ඉතා කැමැත්තෙන් හිමිස්සේ ය.

යළි, තාපස තෙමේ හිමව් වැද අයෝධ්‍යා පුර වැනසීමට වන සතුන් මවා පෑය. රජ මේ දරුණු සතුන් වනසන්නට පටන් ගත්තේ- හූරකු ලුහු බඳිමින් ක්‍රමයෙන් තාපසයා සමීපයට පැමිණියේ ය. “අප අයත් සතුන් වැනසීමට තෝ කවර සමතෙක් ද? ඉදින් එයට දඬුවම් වශයෙන් තා අයත් රජය මට නොදුනහොත්, ශාප කෙරෙමැ”යි තවුසා ගුගුළේ ය. බිය පත් රජ රාජ්‍යය තවුසනට පාවා දී දේවිය හා පුත්‍ර ද සමග යෑමට නික්මෙත් ම, “පිත්වත ප්‍රතිඥා කළ පරිදි අපහට යාගමිල නො දෙන්නෙහිදැයි තවුසා පිළිවිසීය. රාජ්‍යය භාරදෙන විට රජු අයත් වස්තුව ද තවුසන් අයත් වූයෙන්, රජුට යාග මුදල සඳහා සිඟමනට බසින්නට සිදුවිය. මෙහෙසිය හා කුමරු ද කැටුව ගෙයක් පාසා සිඟමන් කොට ද සත්‍ය ප්‍රිය රජහට යාග මූල්‍යය සපයා ගත නො හැකි විය. අන්තිමේදී පුත්‍ර සහ දේවිය වහල් මෙහෙයෙහි බමුණකුට විකුණා ලත් මුදල තවුසනට දෙන සේ කැටුව ආ තවුස් සේවකයාට දින. හේ මෙතෙක් කල් අනුව යෙමින් තමා ගත් වෙහෙසට මිලැයි එ මහත් ධනය නිරවශේෂයෙන් ගත්තේ ය. අනුකම්පා විහීන ලොවෙහි පුරාකෘත අභාග්‍යයෙන් ලත් දරුණු පහරැති හරිච්චන්‍ද්‍රයෝ නැවත වරක් යාග මූල්‍යය සපයනු වස් සොහොන් ගොවු ‘බෙරවා’ මහල්ලකුට අත්පා මෙහෙවරෙහි යෙදුණාහ. භුවනෙශ්වර තෙමේ සැරවයෙන් පිරි ගිය බෙරවා පයැ වණ සෝදති. පා මිරිකති. කෙළ බඳුන් අදිති.

* * *

බමුණු වෙත වහල් මෙහෙයෙහි යෙදුණු පූර්වෝක්ත රජ-කුමරු නයකු විසින් දෂ්ට කරන ලදුව මෙළේ ය. බමුණු මෙහෙවරෙහි කඨොර දුඃඛානුභවයෙන් කල් යැවූ හරිච්චන්‍ද්‍ර දේවී තොමෝ හෙන පහර ලත් කලක් මෙන් වැදුණු පුත්‍ර ශෝකයෙන් ප්‍රකම්පිතවූවා- අඬමින් වලප්මින් මළ සිරුර දවනු පිණිස රාත්‍රියෙහි සොහොන් බිමට පැමිණ වූවා ය. මෙවක සොහොන් ගොවුවෝ ජරත් භෛරවාදකයාට වහල් ව අවා දුක් විඳින හරිච්චන්‍ද්‍ර දූහියෝ යැ. පුත්‍ර මළ සිරුර ගෙන ආ මේ දිළිඳු ගැහැණිය හඳුනා ගැනීමට අපොහොසත් වූ හරිච්චන්‍ද්‍ර තෙමේ,- දැවීමෙහි මිල ඉල්ලා නො ලත් කල්හි- මළ සිරුර ඇද දැම්මේය. අසරණ දේවී මිල ගෙනෙනු වස් බමුණු ගෙදරට යන්නී- අතර මගැ තම පුත්‍රනට සමාන මළ දරුවකු ලැබ එහි හඬමින් ම රැය පහන්කළා ය.

අලුයම එ රට රාජසේවකයෝ මෝ රජපුතු මැරූ යක්ෂනියැ'යි අල්ලා මරනු පිණිස සොහොන් බිමට ගෙනාහ. කුරිරු වධක තෙමේ දුබල දේවියගේ ගෙලෙහි තියුණු කඩු පහරක් හෙළී ය. "අහෝ! මට අන් පිහිටෙක් නැති. මම යම් හෙයකින් නිදෙස්වෙම් ද? සත්‍යය පිණිස රජ සුව හැර මමත්, මහිමිත්, සිඟමනට පත්වීමු ද, එ සස් බෙලෙන් මතුත් හරිච්චන්ද්‍ර රජුට ම මෙහෙසිය වැ උපදිම්වා"යි දේවී පැතූ ය. පුදුමයකි! වධකයා ගැසූ කඩුපත ඇඹරී ගියේ ය! දෙ දෙව්ලොව දෙවියෝ අහස වසා සිට ගත්හ. මහ පිරිස රැස්විය. සිවරු පැමිණියහ. කරුණු යථා තත්ත්වයෙන් හෙළිවිය. හරිච්චන්ද්‍ර රජ්ජුරුවෝ ඒකාන්ත සත්‍යවාදීහයි තුන් ලොව එකනින් නාද ව කිතු ගොස නැඟිණ. පුතුට පණ ද ලැබිණ. සියල්ලෝ ම පිනාගියාහු රජ පිරිස ආශීර්වාදයෙන් පුද අයොධ්‍යා රාජ්‍යයෙහි පිහිටුවූහ.

දෙබම්වල කවීන්ද්‍රයෝ මෙම කථාව වස්තු කොට එය දෙමළ බසින් ආවෙකැයි කියා සිංහල රසිකයන් ගේ ප්‍රසාදය සඳහා කව් කරන බව පවසති. ද්‍රවිඩ සාහිත්‍යයෙහි අති ප්‍රකට වස්තුවක් වූ මෙය බෝධි සත්ව චරිතයකැ ස්වරූපය ඉඳුරා පළකරයි. එද මහායානිකයන් ගේ මාර්ගයෙන් සංස්කෘත සාහිත්‍යය ට විත් එයින් ද්‍රවිඩයට ආරූඪ වී ය යි සිතනු හැක්ක.

ග්‍රාමනාමයෙන් ප්‍රසිද්ධ ගත් කතුවරයන් ගේ ජීවන ප්‍රවෘත්තිය අප්‍රකට යැ. එතුමන් එවක සුප්‍රකට කවියකු වශයෙන් සිටි බව නම් නිසැක ය. ද්‍රවිඩ- සිංහල යන භාෂාවන් හා කාව්‍ය කරණයත්, මෙ ගත් කතුවරයනට ඉතා සුකර විෂයයෝ වූහ. අනුවාද ස්වරූපය සම්පූර්ණයෙන් ම වැසී- නව නිබන්ධයක් මෙන් කථා ප්‍රවෘත්තිය ඇත නො සිට අසන්නවුනගේ ශ්‍රොත්‍ර පථයෙහි ගලා බසිනුයේ එහෙයිනි.

මූල ග්‍රන්ථයෙහි ආ අතුරු කථාවෝ ද සහෘදයට බාධා නො එලවන සේ වැද ගත්හ. වන සතුන් නසමින් හිමාලය අඩවියට පැමිණි හරිච්චන්ද්‍ර රජු හමුවට එළඹැ, තමන් සරණ පාවා ගන්නා සේ ඉල්ලූ නාටිකාවන් දෙදෙන පිළිබඳ ප්‍රවෘත්තියත්, රජුගේ ප්‍රතිඥාව කඩ කරනු පිණිස තවුසා විසින් යෙදූ විවිධ උපා පිළිබඳ ප්‍රවෘත්තිනුත්, මෙහි දැක්වෙන්නේ කථා මාර්ගයෙන් මඳකුත් නො ඉවත් ව සිට යැ. සුදුසු තන්හි දක්වන ලද වර්ණනයෝ ද නාති විස්තරයෙන් මනහර ලෙස ඇතුළ් වූහ. රජුගේ විවාහය නිමිති කොට මහජනයා පැවැත් වූ සැණකෙළිය, වන සතුන් රට වැනසූ බියකරු විලාශය හා මහලු සොහොන්පල්ලාගේ ප්‍රතිකූල දර්ශනයත්, තැනට හොබනා වෘත්තයෙන් බැඳ, හාස්‍ය-භයානක- බීභත්ස රසයන් උතුරා යන සේ වර්ණිත අයුරු අතිශයින් ආශ්වාද කර ය.

එක්සිය එකොළොස් වැනි පද්‍යයේ සිට එක්සිය එකුන්තිස් වැනි පද්‍යය දක්වා පැනෙන සැණකෙළි වැනුම ගුත්තිල කාව්‍යයෙහි එන සැණකෙළි පද්‍යයන් ගුරු තන්හි තබා ලියූ බව පෙනේ. පදයෙන්— අර්ථයෙන්— මතු නො ව වෘත්තයෙන් පවා එම පද්‍යයෝ ඒ හා සාම්‍යයක් දක්වති.

> 'අ යෙ ක් සුර බී පු මතින්
> ව ත ක් රැගෙන තම සුර තින්
> කි ය ත් වදන් වියරු ම තින්
> නොයෙක් විසුළු කරති ග තින්'

යන හරිචන්ද්‍ර කථා කාව්‍යයේ පද්‍යය ගුත්තිල කාව්‍යයෙහි එන්නේ මෙසේයි:—

> 'රැගත් සුර පිරූ වි ති න්
> සුර ත් තඹුරු පෙති සෙ නෙති න්
> පුවත් නො දැන බමන ගති න්
> නටත් අයෙක් සුර මති න්'

ඇතැම් විට ජාතිමානයෙන් උදම් වූ ගත්කතුවරයා නො-සියුම් බුද්ධිමතකු සේ ඇතැම් කුලයන් පිරිහෙලමින් ලියූ පද්‍යය-කුදු මෙහි හමු වේ. නාවිකාවන් දෙදෙන හා සොහොන්පල්ලා හැඳින්වූයේ එබඳු පරිභවයකිනි.

'හරිචන්ද්‍රකාව්‍යය' කරන ලද්දේ ක්‍රි: ව: 1726 දී ය. නානා වෘත්තවලින් බැඳුණු මෙ කවෙහි ප්‍රමාණය පද්‍ය සාරසිය නවයකි. මට සිලිටු ව්‍යක්ත පද්‍යයක් වීම නිසා මේ කථා කාව්‍යය තත් කාලීන සාහිත්‍යවංශයෙහි උස් තැනක් ගනී.

## දෙව ධම් ජාතක කාව්‍යය

කතෘ.— වික්‍රම සිංහ පණ්ඩිත මුදලිඳු
කාලය:– ක්‍රි: ව: 1727
ප්‍රමාණය:- පද්‍ය 378

'දෙව ධම් ජාතක කාව්‍යය' වික්‍රමසිංහ පණ්ඩිත නම් මුදලි කෙනකුන්ගේ රචනාවකි. ගත් කතුවරයන් ගැන නිශ්චිත ප්‍රවෘත්තියක් මේ තාක් හමු වී නැත. එතකුදු වුවත්, ක්‍රි: ව: 1733 දී ලියැවී තිබෙන තුඹපනක වික්‍රමසිංහ පණ්ඩිත මුදියන්සේ කෙනකුන් ගැන සඳහන් වෙයි. මෙ කියන වික්‍රම සිංහයෝ නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහි දියවඩන නිලය දැරූවෝ වෙති. යටි නුවර රට– අතපත්තුව වී බද්ද– පාතරට කොට්ටල් බද්ද– හා සපරගමු මහ දිශාව යන තනතුරු දැරූවෝ ද මෙතුමෝ යැ. දෙව ධම් ජාතක කාව්‍යය ලියන ලද්දේ ක්‍රි: ව: 1727 දී ය. මේ දෙ වර්ෂය වික්‍රමසිංහ දෙ නාමය ම එක ම පුරුෂායුෂයකට අයත් බවට සාක්ෂි දෙයි. දෙදෙන ම වික්‍රමසිංහ පණ්ඩිත මුදියන්සේ වරු ය. එසේ නම් මේ දෙදෙන ම එක්කෙනකුන් වන්නට බැරි කමක් නැත. නො

එසේ වුව, අන්‍යොන්‍ය ඥති සම්බන්ධය ඇත්තාහු හෝ වෙති. ග්‍රන්ථාවසානයෙහි පෙනෙන පද්‍යයෙන් ගත් කතුවරයෝ තමන් භාෂා ශාස්ත්‍රයන් දත් 'ලඞ්කාවට ප්‍රසිඬ කෙනකුන්' බව හඟවති. ඊළඟ පද්‍යයෙන් ග්‍රන්ථකරණයෙන් සංචිත පුණ්‍යය අතිශය භක්තිප්‍රෙමයෙන් නරෙන්‍ද්‍රසිංහ රජුට පමුණුවති. මෙද මේ ගත් කතුවරයා පූර්වොක්ත තුඹපතෙහි සඳහන් වික්‍රමසිංහ පණ්ඩිත මුදියන්සේ යයි සිතා ගැනීමට තුඩු දෙන තැනකි.

**කථා සාරය**

දෙවධම් යනු හිරි-ඔතප් ය. හිරි-ඔතප් නො මැති සේ පිරිස් මැද හැසුරුණු භික්‍ෂුවකට සර්වඥයන් වහන්සේ වදාළ මහිංසාසක කථාව මෙ නමින් ආයේ ය. මහිංසාසක කුමරු බරණැස් රජු පුත් යැ. චන්‍ද්‍ර කුමාරයෝ බෝසත් මහිංසාසකයනගේ මලණුවෝ ය. පිය රජුගේ අන් මෙහෙසියක් ඇය පුත් සූයර්‍ය කුමරුට රජය ඉල්ලූ ය. ඒ වරය ප්‍රතික්‍ෂෙප කළ නො හැකි බරණැස් රජ වනයට යන සේ දෙ සොහොයුරන් ඇණ වීය. වලට යන දෙ කුමරුවන් දුටු ළදරු සූයර්‍ය කුමාරයෝ ද ලැබිය හැකි රාජ්‍යය නො තකා සහෝදර ප්‍රෙමයෙන් ඔවුන් සමග ගියෝ ය. වෙනෙහි විලකැ පැන් බීමට බට චන්‍ද්‍ර-සූයර්‍ය දෙ කුමරු එ විල අරක්ගත් රකුසකු විසින් අල්ලා ගන්නා ලදහ. දෙව ධර්මය දන්නවුන් හැර විලට බට සෙස්සන් කත හැක්කයි හේ වෙසවුණු රජුගෙන් වරම් ලද්දෙක. බෝසත් මහිංසාසකයෝ රකුස් හට දෙව් දහම කියා- ඔහු පන්සිල්හි පිහිටුවා- මලුන් ද මුදවා ගෙන බරණැසට පැමිණ පියහු ඇමැමෙන් රාජ්‍යය කළෝ ය.

ජාතකට්ඨ කථාමෙහි එකක නිපාතයේ එන මේ ජාතකය 'දෙවධම් ජාතක කාව්‍යයෙහි' ශරීරය වූයේ ය. වික්‍රමසිංහ ප්‍ණ්ඩිතයෝ අලඞ්කාරානු ශාසනාගත්හි කාව්‍ය ලක්‍ෂණයෙන් දක්වන ලද කුමාරොදය, චඞ්ත, පුර, නාරි මාගීාදි වණිනයන් ගෙන් සරසමින් අලඞ්කාරොකතීන් විචිත්‍ර කොට රසවතුන් පිනවන සේ මෙම ග්‍රන්ථය රචනා කළහ. මේ කෘතියෙහි කතුවරයා ද කව්සේකර- ගුත්තිල වැනි පද්‍ය කාව්‍යයන් ප්‍රකට පරිද්දෙන් ම ආශ්‍රය කළ බව පෙණේ. එහිනුදු මෙම ග්‍රන්ථයෙහි වැනුම් ක්‍රමය කාව්‍යශෙඛර මාගීයට නො-වෙනස් ව පිළියෙල වූ සේ යැ. රාජදෙවී- කුමාරොදය හා වන ප්‍රයානය යන වණිනයෝ- බැමිණි ලිය, සෙනක කුමරු හා තක්සලා මාගීය වැනු කව්සේකර පද්‍යයන් හා බෙහෙවින් සමාන තාවක් දක්වති. මේ උසස් කාව්‍යාශ්‍රයෙන් සැපයුණු හෙයින් මෙ කව සාහිත්‍යකාමීන්ගේ ප්‍රබොධය එළවන සේ සාරගභි විය.

එහෙත් අන්‍ය කවීන්ගේ වණිනාමාගීයන් සර්වථායෙන් ඇතුළත් කරන්නට යැමෙන් ප්‍රස්තුත කථා ශරීරය ඇතැම් තැනක දී විසමෘත කළ සේ ද පෙනේ. එහෙයින් ම ජාතකට්ඨ

කථායෙහි එන ප්‍රවෘත්තියට වඩා මෙහි ඇතැම් තැනක යම් යම් වෙනස්කම් ද දක්නට ලැබේ. අබුද්ධොත්පාදයෙහි විසූ බරණැස් රජුන් තුන්රුවන් නිසින් දුරු බව ක්‍රයේ ද, හිරි-ඔතප් දෙසූ බෝසත් මූවට සත්තුභත්ත ජාතකයේ සේනක පඬිවරයන් රජ පිරිසට කී පින්කිරියවත් පිළිබඳ ධර්මය නගන ලද්දේ ද එහෙයිනි. ඇතැම් ධර්මාගත ප්‍රසිද්ධ කාරණයන් පවා වෙනස් වැ යෙදුණු තැන් මෙහි දක්නට ඇත. ගයා ශීර්ෂයේ ජටිල සහස්‍රය තුන් පන්සියයක් කොට මේ කතුවරයා කියයි. වර්ණනයට සුදුසු තැන තෝරා ගැනීමෙහි වික්‍රමසිංහයන් තුළ ප්‍රහුණුවක් නො තිබුණු බව පෙනේ. අප්‍රාප්තාවසරයෙහි බලයෙන් ඇතුළු කරන ලද එබඳු වර්ණනයෝ කවි කථා ප්‍රවාහයට බාධා එළවන ගල්කුළු වැන්නෝ ය. සැවත්නුවර කොසොල් රජු හා දෙව්රම් වර්ණනයෙන් පසු, බුදුගුණ වැනීමට ගොස් කළ දීර්ඝ විවරණ කථාව එබඳු තැනකි. දුම් (දෙන ලද), සවන වසක් (සවසක්) ආදි දුෂ්ට ප්‍රයෝගයෝ ද, 'රුවැති වෙළුවන' ආදි අනුචිත විශෙෂණයෝ ද විපිනෙව්- චුතියත්- සවුන්දර- ආදි අනුචිත සේ බිඳගත් පදයෝදැයි මෙසේ මේ කාව්‍යයෙහි දක්නට ලැබෙන දුර්වලතාවෝ බොහෝ යැ.

මේ මෙසේ වුවද, යථාසථානයන්හි සදුපදෙශයන් ද ඇතුළත් කොට, සමුද්‍රඝොෂ- පදක- ගීති ආදි මනහර වෘත්තයන් ගෙන් බැඳ සරල ලෙස මෙහි පද්‍ය බන්ධනය කළ අයුරු මැනවි.

ග්‍රන්ථප්‍රමාණය පද්‍ය තුන් සිය එක් අසූවක් බව සඳහන් වෙතත්, එය දක්නට ලැබෙනුයේ පද්‍යත්‍රයකගේ ඌනත්‍වයෙනි.

## තෙරුවන් මාලා

**කර්තෘ:-** ගිනිගත් පිටියේ සංඝරක්ඛිත සාමණේරයන් වහන්සේ
**කාලය:-** ක්‍රි: ව: 1721-39 අතර
**ප්‍රමාණය:-** සිලෝ 107

සිංහලයෙහි පද්‍ය විද්‍යාව මුල් යුගයේ පැවැත්තේ ගීතින් විෂයෙහි ය. සියබස් ලකර පටන් දඹදෙණි යුගයේ ග්‍රන්ථ දක්වා දියුණුව පැවැති ඒ ගිති බන්ධනය කෝට්ටේ යුගයෙහි එළිසම කවියෙන් යටපත් වූයේ ය. එළිසම සිවුපදයේ උපත කෝට්ටේ යුගයෙන් ශත වර්ෂ කිහිපයකට පෙරාතු ව වුවත්, එහි උන්නතිය නම් එ සමයට අයත් ය. එළු සිලෝව ද මෙ සමග ම උදා වූයේ විය. කෝට්ටේ යුගයෙන් පෙර එළු සිලෝ කරණයක් ගැණ අසන්නට නො ලැබෙන හෙයිනි. සිලෝ කරණය ග්‍රන්ථ කිහිපයකට පමණක්, සීමා වූ බව පෙනේ. අටලොස් වැනි ශත වර්ෂයේ නිපැයුණු තෙරුවන් මාලාව, ඉන් දෙවැනි පොත බව කිව හැකි ය.

'තෙරුවන් මාලාව' කළෝ සරණඞකර සඟරජ හිමියන් ගේ ශිෂ්‍යයකු වූ 'ගිනිගත් පිටියේ' යයි ප්‍රසිද්ධ හෙරණපාණෝ ය. සරණඞකර හිමිපාණන් ගේ ශිෂ්‍ය වූ දීපඞකර-සඞ්ඝරක්ඛිත-යන

දෙ තෙරණුවෝ ම "ගිනිගත් පිටියේ" නමින් ප්‍රසිද්ධ ව විසූහ. ඉන් 'තෙරුවන් මාලාව' කළෝ සඞ්ඝරක්ඛිත සාමණේරයෝ ය. තුදුස් වියේ දී සඟරජ හිමියන් ඇසුරට පත් මුන් වහන්සේ 'නියම කන්ද' විද්‍යා ස්ථානයෙහි බොහෝ දෙනකුට ඉගැන්වූ සඟරජ හිමියන් ගේ ශිෂ්‍යවරයෝ ය. උපාලි තෙරණුවන් ප්‍රමුඛ සියම් භික්ෂූන් විසින් පැවැත්වූ දෙවැනි උපසම්පදාවාරයේ දී උප සම්පත්තිය ලදහ. පසු කල සත් කෝරළයේ සඞ්ඝ නායක පදවියට පැමිණ මැද්දේපොල වේරමුණකන්දේ තුන්බෝ පිහිටි ගල්ලෙන් විහාරයෙහි වැඩ විසූහ. සඞ්ඝරාජ හිමියන් ඇවෑමෙන් උන් වහන්සේ ගේ බොහෝ ශිෂ්‍යයෝ ද මේ ගිනිගත්පිටියේ නාහිමියන් ගුරු තැන තබා විසූහ. උන් වහන්සේ ගේ ශිෂ්‍ය පරම්පරා තොමෝ මේ දක්වා පවත්නී ය.

ගිනිගත්පිටියේ හිමියන් 'තෙරුවන් මාලාව' කරනලද්දේ කවර වර්ෂයක ද යනු අවිනිශ්චිත ය. උන්වහන්සේ සඟරජ හිමියන් ඇසුරට පැමිණියේ, ක්‍රි: ව: 1721 දී ය. මීට වර්ෂ හත අටකට පසු ව මෙය කළ බව සිතා ගත හැකි ය. එබැවින් තෙරුවන් මාලාව නරේන්ද්‍රසිංහ රජුගේ කාලයට අයත් කොට දක්විමු.

මේ කුඩා පොත ගත් කතුවරයන් ප්‍රතිඥා කළ පරිදි සිලෝ එක් සිය එකකින් පරිමිත ය. අවසානයෙහි කර්තෘනිගමනාත්මක පද්‍ය සයෙක් ද වෙයි. මෙහි ආරම්භයෙහි සිලෝ එකුන් තිසකින් බුද්ධ වන්දනාව ද, පසකින් ධර්ම හා සමතිසකින් සඞ්ඝ වන්දනාව ද දක්විණ. ඉක්බිති පද්‍ය දශයකින් දළදා වන්දනාව ද, එකුන්විස්සකින් සොළොස් මහා ස්ථාන හා සතකින් සිළුමිණි සෑ ආදි සිද්ධස්ථාන වන්දනාවෝ ද දර්ශිත ය හ.

'තෙරුවන් මාලාවෙහි' එන රත්නත්‍රය ප්‍රණාමක පද්‍යයන් විමසුත් නුවණින් බැලීමෙන් ගිනිගත්පිටියේ හෙරණපාණන් වහන්සේට ධර්මප්‍රදීපිකා — බුත්සරණ වැනි උසස් සාහිත්‍ය ග්‍රන්ථයන්හි නො මඳ අභ්‍යාසයක් පැවැති බව සිතා ගත හැකි. ඒ ග්‍රන්ථයන්හි දක්වෙන ඇතැම් වර්ණනාස්ථලයන්හි ඡායාව මේ පද්‍යයනට වැටී තිබෙන හෙයිනි.

සඞ්ඝාභිවාදනයෙහිදී සාරිපුත්ත — මොග්ගල්ලාන — කොණ්ඩඤ්ඤ — මහාකස්සප — උපාලි — අනුරුද්ධ - ආනන්ද - රාහුල — කප්පින — යන බුද්ධ කාලීන මහ රහතුන් වහන්සේ ද, ඉන් මොබ නාගසෙන මිහිඳු යන දෙ නම ද, කලු බුද්ධරක්ඛිත — මලියදේව — චූලනාග — යන ලාඞ්කික ක්ෂීණාශ්‍රව තෙ නමක් ද, ඉක්බිති ව සංගායනා සතරෙහි මූලික තෙරුන් ප්‍රමුඛ රහතන් වහන්සේ ද, අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් ද; සෙසු සියලු ශ්‍රාවක සමූහයා ද, සඞ්ග්‍රහ කොට ඇත. සොළොස් මස්ථාන වන්දනය පිණිස කළ පද්‍ය මාලාව ඉතිහාසය අතින් වැදගත් ය.

ගිනිගත්පිටියේ හිමියන් හුදෙක් මේ සිලෝව කරන ලද්දේ, සවකීය හකනිය දක්වන 'චන්‍දනා කාව්‍යය'ක් වශයෙන් බව නො අනුමාන වුවද, සාහිත්‍ය රසිකයනට නම් මෙ ගතින් ලැබිය හැකි අර්ථසිඩිය ඉමහත් ය.

'පෙර ගිරි මුදුනෙන් මා — යා බිසෝවුන් උදු වූ
මුනිවර සිය රැස් තුන් — ලෝ ගුවන්හි දිලී ගොස්,
මරු අවර ගිරි පත් — කල් දිලේමින් උදු වූ
හිමකර දළඳ මේ — අත් මුදුන් දී වඳිම් මම්'

මෙ පද්‍යයෙන් දෙන අර්ථය අතිශයින් ආශ්වාදකර ය. "සර්වඥ සූර්යයා මායා නමැති පෙරගිරි මුදුනින් උදු විය. තුන් ලොව නමැති අහස් තලයෙහි දිලුණේ ය. පිරිනිවන් නමැති අවර පර්වතයට බැස්සේ ය. මෙ කෙණෙහි දළඳ නමැති චන්‍ද්‍ර තෙමේ උදු විය." සැබව, සඳ උදු වනුයේ හිරු අස්තංගත වීමෙන් පසු ව ම ය. ලොවට දළඳ ලැබුණේ බුඩ පරිනිර්වාණයෙන් පසු ව මැ යි.

මාත්‍රාරක්‍ෂණය සඳහා විකෘත කළ පීදමින් (විසදමින්), තෙසරන් (තෙසරණ), පිළිසිඹින් (පිළිසිඹියාවන්) දකුත්සව් (දකුණුසව්) පිල්ගත් (පිළිගත්), ආදි ශබ්ද කිහිපයක් හා, මාත්‍රා පූරණය සඳහා යෙදූ 'එ, මෙ' ආදි ශබ්ද යනුදු බෙහෙවින් මේ පද්‍යයන්හි යෙදී ඇති. ශාස්ත්‍රය වැනසී — විචාර බුඩිය අතුරුදහන්වී — පැවැති එකල ලියූ මේ ග්‍රන්ථයෙහි පවත්නා ඒ දූෂිත ශබ්ද කිහිපය නිසා 'තෙරුවන් මාලාව' දෝෂ දර්ශනයකට පාත්‍ර කළ යුතු නො වේ.

## සාරාර්ථ දීපනී

### (සතර බණවර සන්නය)

කර්තෘ:— වැලිවිට සරණඞකර සාමණේරයන් වහන්සේ
කාලය:— ක්‍රි: ව: 1739—47 අතර
ප්‍රමාණය:— මුද්‍රිත පිටු 201

සර්වඥයන් වහන්සේ විසින් ඓහලෞකික උපද්‍රව විනාශය පිණිස වදාළ සූත්‍ර ධර්ම සමූහය පිරිත් නාමයෙන් කියැවේ. "හාත්පසින් ආරක්‍ෂාව සලසා ය" යන අර්ථයෙනි. අඞ්ගුත්තරාදි පස් මහ නිකායෙන් උඬෘත ඒ පරිත්‍රාණ ධර්මයන් එක්කොට පෞරාණික ආචාර්යවරයන් සඞ්ග්‍රහ කළ ග්‍රන්ථය 'පිරිත් පොත' යනුවෙන් හැඳින්වෙයි. බණවර වශයෙන් සතරක් වූයේ 'සතර බණවර' නමුදු වී. එහි සරණාගමන, දශ ශික්‍ෂාපද, සාමණේර ප්‍රශ්න, ද්වාත්‍රිංශාකාර, ප්‍රත්‍යවෙක්‍ෂණයන් ඇතුළු දසධම්ම, මඞ්ගල, රතන, කරණීය, ඛන්ධ, මෙත්ත, මෙත්තානිසංස, මොර, චන්‍ද, සූරිය, ධජග්ග, යන එකොළොස් සූත්‍ර දේශනාවෝ මුල් බණවරට ද, මහාකස්සප, මහාමොග්ගල්ලාන, මහාචුන්ද යන ත්‍රිවිධ බොජ්ඣඞ්ගයන් හා ගිරිමානන්ද, ඉසිගිලි සූත්‍රයෝ දෙවැනි බණවරට ද ඇතුළත් වෙති. ඉතුරු

දෙබණවරෙහි ම සඬගුහ වූයේ ආටානාටිය සූත්‍රය යි. මෙසේ දෙ පිසි පිරිතකින් සමන්විත වූ පිරිත් පොතට සරණඞකර මාහිමියන් ලියූ සන්නය 'සාරාර්ථ දීපනී' නම් විය.

ක්‍රි: ව: 1739 දී රජ පැමිණි ශ්‍රී විජය රාජසිංහ රජුගේ ආරාධනයෙන් මේ සන්නය ලියූ බව ප්‍රකාශිත යි. අට වසක් පමණ වූ එතුමන් ගේ රාජ්‍ය කාලය අතර කිනම් වර්‍ෂයකට මෙය අයත් දැයි කිව නො හැක්ක.

"පූර්‍වාචාර්‍ය්‍යවරයන් විසින් කරන ලද 'සාරාර්ථ සමුච්චය' නම් සතර බණවර අටුවාව හා එසේ ම 'සංක්‍ෂෙපාර්ථ විවරණය' ද බලා තදනුකූල කොට එක් ප්‍රකාරයකින් සතර බණවරට අර්ථ විවරණයක් කෙරෙමි" යන කර්තෘ ප්‍රතිඥාවෙන් මේ 'සාරාර්ථ දීපනිය'ට ආශ්‍රය වූ ග්‍රන්ථ දෙකක් ගැන කියැවෙයි. ඉන් 'සාරාර්ථ සමුච්චය' වූකලි ආනන්ද වනරතන මාහිමියන් ගේ ශිෂ්‍ය කෙනකුන් විසින් බුද්ධඝොෂ අටුවාවන්ගෙන් උපුටා පිළියෙල කරන ලද 'පිරිත් අටුවාව' ය. දෙවැන්න වූ 'සංක්‍ෂෙපාර්ථ විවරණය' අද දුලීභ ග්‍රන්ථයකි. එහෙත් 'සතර බණවර සන්න'යෙහි ඇතැම් සූත්‍රාර්ථයක දක්නට ලැබෙන—

i "අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ = අනේ වඩුවා විසින් කර වූ අරම්හි"

ii "බාළ්හ ගිලානො = බැල ගැල පත්."

iii "දස සහස්‍ස = දස සත්"

iv "ඵොට්ඨබ්බා අනත්තා = පොටබ් අනත"

v "බුද්ධො ගන්ධාරෝ පිණ්ඩාලො=බුද ගඳහර පිණ්ඩාල ය"

vi "හිංගු ච හිංගො ච = හිගු ද හිග ද"

ආදි පදාර්ථ කථනයන් දෙස බැලීමෙන් ඒ සංක්‍ෂෙපාර්ථ විවරණය තරමක් දුරට හඳුනා ගත හැකි වෙයි. මහනුවර භාෂා සත්‍යවය ඉක්ම ඉන් ශත වර්‍ෂ හත අටකට ඔබ භාෂා වික විලාශයක් ගෙනහැර පාන ඒ වචන 'සංක්‍ෂෙපාර්ථ විවරණ' යෙන් උද්ධෘත බව නිසැක ය. මේ වචනයන් පිළිබඳ සරණඞකර හිමියන් ගේ අර්ථ කථනය භාවසන්නයෙන් දත හැකි ය.—

i "අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ = අනේපිඬු මහ සිටාණන් විසින් කරවන ලද ආරාමයෙහි"

ii "දස සහස්‍ස = දස සංඥ"

ආදි වශයෙන් උන් වහන්සේ පූර්‍වොක්ත පාළි වචනයන් ම හෙළිවට නගති.

සරණංකර මාහිමියන් ගේ මේ සන්නය පදාර්ථ - භාවාර්ථ - නිදාන - නිරුක්ති - විස්තර යන අංග පසකින් සමුපලක්ෂිත යැ. ඇතැම් තැනක නිදානය දක්වන ලද්දේ පෙළ බසින් පමණි. එය 'සාරාර්ථ සමුච්ච'යෙන් උධෘත යි. මෙහි විස්තර නො කරන ලද ඇතැම් කරුණු තමන් වහන්සේ ගේ සාරාර්ථ සංග්‍රහයෙන් බලා ගත යුතු බව දක්වා ඇත.

එවකට පැවැති පිරිත් පොතෙහි චන්ද්‍රපරිත්තයට වැරදීමකින් වැටී තිබුණු **යො අන්ධකාරෙ තමසි පභඞ්කරො** ආදි ගාථාව ග්‍රන්ථ කර්තෘහු ඉන් ඉවත් කෙරෙමින් ඊට හෙතු යුක්ති මෙසේ දක්වති. "මේ ගාථාව චන්ද්‍ර පරිත්තයට නැත. කුමක් නිසාද යත්? පූර්වාචාර්ය්‍යවරයන් විසින් මෙම පිරුවාණා පොතට කරපු පදගතාර්ථ සන්නයෙහිත් මේ ස්ථානයේදී චන්ද්‍ර පරිත්තයට මේ ගාථාව නැත. ඒ කුමක් නිසාදයේ කියා මෙම පිරුවානා පොතට අටුවාචාරීන් වහන්සේලා කරපු 'සාරාර්ථ සමුච්චය' නම් සතර බණවර අටුවාව බැලීම්. එහනත් චන්ද්‍රපරිත්තයේදී මේ ගාථාව නැත. සංයුත් සඟියේ දෙවපුත්ත සංයුත්තය බැලීමි. එහි ද චන්ද්‍ර පරිත්තයට මේ ගාථාව නැත. මෙත් කුමක් නිසා දයේ කියා චන්ද්‍ර සූරිය පරිත්ත දෙක එක්කොට බැලීමි. චන්ද්‍ර පරිත්තයෙහි 'අථ ඛො භගවා චන්දිමං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි' කියා තෘතියා එකවචන තිබෙන බව ද, 'අථ ඛො භගවා සූරියං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාහි අජ්ඣභාසි' කියා සූරිය පරිත්තයෙහිදී තෘතියා බහුවචනව තිබෙන බව ද, 'අභිධානප්‍රදීපිකා' නම් පාලි නිඝණ්ඩුවේදී 'වෙරොචනො' කියා සූර්ය්‍යයාට තිබෙන බව ද, විශෙෂයෙන් දූත චන්ද්‍ර සූරිය පරිත්ත දෙකේ ම එකාකාර සෙසු කීම් තිබෙන නිසා චන්ද්‍රපරිත්තයට මේ ගාථාව අඩු දයේ කියා මැත භාගයෙහි එක්කොට ලීවා වෙන්ට ඇත කියා සිතා ගෙන සඳපිරිතේදී මේ ගාථාව සන්න නො කර හැරියෙමි. එ බැවින් මේ කි තාක් වචන පරීක්ෂා කොට බලනු"

මෙයින් සරණංකර මාහිමියන් ගේ විමංශන ශක්තිය මැන ගත හැකි. සූක්ෂම පරීක්ෂණයකින් යුතු වැ 'සාරාර්ථ දීපනිය' කළ බව පෙනෙන අතර ම උන් වහන්සේ ගේ සාමාන්‍ය වාක් ව්‍යවහාර තත්ත්වය ද සිතා ගැනීමට යථොක්ත පාඨය ප්‍රයොජනවත් වේ.

පිරිත් පොත ගැන දත යුතු ධර්මවිස්තරය පැහැදිලි කරමින් ද, උපාය මාර්ගය දක්වමින් ද, විමංශනාත්මක වැ ලියූ මේ විස්තරාර්ථ විවරණය සතර බණවරෙහි සවිශෙෂ විභාග ඥානයට අතිශයින් ප්‍රමාණවත් වන්නේ යි.

# වියොවග රත්න මාලය

කර්තෘ:— දෙන් ජාකුව් ද සිල්වා අභයගුණවර්ධන සමරජීව පත්තායමෙ ලේකම
කාලය:— ක්‍රි: ව: 1768
ප්‍රමාණය:— පද්‍ය 132

ජාතක කථාවෙන් ආරම්භ ව ආ සිංහල පද්‍ය සාහිත්‍යය ශතවර්ෂයෙන් ශතවර්ෂයට අතු පතර පැතිරෙමින් පත්‍රපල්ලව යෙන් ගහණ ව මල් පලින් ශොභාමත් වන මී අඹ රුකක් මෙන් වර්ධනය වන්නට පටන් ගත්තේ ය. කොෂ-ව්‍යාකරණ-ඡන්දොලඞ්කාර හා වෛද්‍ය ජ්‍යොතිශ - නීත්‍යාදී ශාස්ත්‍රයන් ද පිළිබඳ ව සැපයුණු ග්‍රන්ථ රත්නයන්ගෙන් සංහිත්‍යයට අභිනව අඞ්ගයන් වැදූ ගත්තේ ය. මෙය'තර ප්‍රතිභා සම්පන්න කවිඳු සාහිත්‍ය ධාරාව ගමන් කරවීමෙහි සුදුසු අමුතු මාර්ගයන් ද එළි කළහ. මෙසේ පැන නැඟුණු සන්දේශය—රාජස්තොත්‍රය—කථා කාව්‍යය — ද්‍රවිඩාදි අනුවාදය වැනි ඒ රමණීය පද්‍ය ප්‍රණාලියට අටළොස්වැනි ශතවර්ෂයේ අවසාන භාගය වන විට මේ ශෘඞ්ගාර බන්ධ කාව්‍ය කිහිපයක් ද වැදූ ගත්තේ ය. ශෘඞ්ගාරය තෙමේ රසයන් අතර ප්‍රමුඛ වූයේ, සකල කාව්‍යයෙහි වැද සිටියේ බුදුගුණාලඞ්කාරය ආදි භක්ති කාව්‍යයන් ගෙන් පවා තොර නො විය. මේ මෙසේ වුව ද, හුදු ශෘඞ්ගාර රසය ම ඇතුළත් කොට, එය එක ම අර්ථය කොට රචිත වූ ග්‍රන්ථයක් සිංහල සාහිත්‍යයෙහි දක්නට ලැබෙන්නේ, කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන්ගේ අභිෂෙකයෙන් එකුන් විසිවැනි වර්ෂයේ ය. ක්‍රි: ව: 1768 දී මේ පද්‍යයක් ලියමින් අභිනව මාර්ගයක ආදිම යාත්‍රිකයා වූයේ දෙන් ජාකුව් ද සිල්වා අභයගුණවර්ධන සමර ජීව පත්තායමේ ලේකම් තෙමේ ය.

වැලිවිට මෙඝ රාජයා ගෙන් වහනය වූ ශාස්ත්‍ර ජල ධාරාවන් මෙහෙයා, දකුණු ලක්බිම තෙමූ සිටිනාමල්දූවේ ධම්මජොති හිමියන් වෙතින් ශාස්ත්‍රාභ්‍යාසය ලත්, පද්‍ය බන්ධනයෙහි ඉතා සමර්ථයකු වූ සමරජීව කවියෝ 'වියොවග රත්න මාලය' ට අනතුරු ව 'කව් මිණි කොඬල' නමැති වටිනා පද්‍ය ග්‍රන්ථයත් 'රතවතී කථාව' නමැති කිඳුරු ජාතක ප්‍රබන්ධයත් කළෝ ය. ගිරිවා දනව්වේ දෙලොස් දහස් කෝරළය ජන්මභූමි කොට ඇති මෙතුමා පත්තායමේ ලේකම් නමින් ප්‍රසිද්ධ වූවෝ ය.

'වියොවග රත්න මාලය' රචනා කරන ලද්දේ සවකීය කාන්තාව කෙරෙන් වෙන් ව විසීමෙ සන්තාප සවරූපයකිනි. ගත්කරුවෝ දෙවියාවනයකින් ආසිරි පතා අනතුරු ව ග්‍රන්ථ මුඛය මෙසේ අරඹති.

'දිසි රන ලියක ලී ල ය සොඳුරු ලඳ ල ද
කර මිනි ම සිතු ආ ල ය ප හ ස විඳ වි ද
විරතට පැමිණි කාලය දු කි නි හඳ ත ද
'වියොවග රත්න මාලය' කි ය මි පද බැ ද'

ඉක්බිති කවි කිහිපයකින් මහාපදුම — උම්මදන්ති — මුදුලක්ඛණ — කුස ආදි ජාතකයන්හි බෝසතුන් පවා කාන්තා විරහයෙන් දුක් වූ බවත්, එහෙයින් ම තමා ස්ත්‍රීවිරහයෙන් විකල වූයේ, ආශ්චර්යයක් නො වන-බව ත්, දක්වා 'සයුරෙන් දිය බිඳක්' මෙන් ඇඟණියන් ගේ රූපශ්‍රියෙන් ස්වල්පයක් වර්ණනා කෙරෙති. හිස සිට පතුල දක්වා අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් විස්තර කරමින් බැඳුණු ඒ පද්‍ය සමූහය, ප්‍රතිභා ජන්‍ය අලඞ්කාරයෙන් ද, ඇතැම් තැන යුක්ත වූයේ අතිශයින් උත්කර්ෂවත් ය. මෙ තරම් රූපශ්‍රියෙන් යුක්ත වූ ඒ ස්ත්‍රියගෙන් වෙන්වීම ගැන සුසුම් හෙලන කවියා අනතුරු ව මනහර රාත්‍රි වර්ණනයකට බසී. රාත්‍රිය මනහර විය. උනඟා අඳුරු ඇතු අරා දුනු හී ගෙන කල්වියෝ පුරුෂයන් සොයමින් එන්නේ —

'කා ල් විරත ව ඉඳින මා දකි මි නේ සැ නේ
ඔ ල් වර හඬ ලලා වෙත අවු දි නේ ර නේ
සි ල් කරනෙමි ත වෙර යන මිග බැනේ ගෙ නේ
ම ල් සර විදින්නට වන සරෙ සිනේ මෙ නේ'

යි දුක්වෙන පරිද්දෙන් කාව්‍ය නායකයන් පෙළී ය. කවියා මින් පසු නම කත සිහි කොට හඬ යි. ඉක්බිති වෙනට පැමිණි කාන්තාව සමග ගත් කතුවරයන්ගේ සමාගමශ්‍රිය හා ශෘඞ්ගාරාවස්ථාව දක්විණ. අනතුරු ව පැමිණි රම්‍ය උදයෙහි යුවති — පති දෙදෙන ඔවුනොවුනට ආශීර්වාද කර ගනිති. මේ මෙ කාවෙහි එන ප්‍රවෘත්තිය යි.

මේ වූක්ලි කවියා නිර්මාණය කරගත් වස්තුවක් මිස සිදු වූ ප්‍රවෘත්තියක් නො වේ. එ හෙයින් ම මෙය විරහයෙන් තල දුඹුල් කවක් ද නො වේ. මේ වනාහි කර්තෘහුගේ රචනා කෞශල්‍යය හඟවන විශිෂ්ට බන්ධනයකි.

'ව සි න් සක සොලොස් සියතූ වනා තූ නා
ම සි න් බගව දසවෙනි සොම් තෙනා දි නා
තොසි න් සමර ජිව ලිපිසුරු ගුනා නැ නා
ර සි න් යුතු මෙ කව කෙලෙ අම මෙනා ම නා'

ය යි ගත්කරුවන් ම 'රසින් යුතු' කොට 'තොසින්' කළ බව කියා පෑම එයට සාධකයකි. මෙහි හැම කවියක ම සිවුපදයේ අවසාන තුන් වැනි අකුරත් අවසාන එලියෙන් ම යුක්ත කරන ලද්දේ ය. නිගමන කව පවා ඒ ලක්ෂණයෙන් වියුක්ත නො වී ය. එ මතු ද, එලිවැට තැබිය හැකි හැම තැනකදීම ඊට අවකාශදීම ගත්කරුට මහත් ප්‍රීතියක් විය. මේ නිසා මෙහි දූෂිත ව ද, නිරර්ථක ව ද, පුනරුක්ත ව ද, ආ පදයෝ බොහෝ ය. කවියාගේ විරහාවස්ථාව හා යුවති — පති දෙදෙනාගේ ශෘඞ්ගාරාවස්ථාව මෙහි දක්වූයේ ගැමි වහරින් ම කරන ලද අශ්ලීල ශෘඞ්ගාර වර්ණනයකිනි. එය 'වියොවගරත්නමාලයෙ'හි සභ්‍යයන් නො පින වීමට ඇති අවකාශයකි.

## සිංහල විමානවස්තු ප්‍රකරණය.

කතෘ:— ගම්මුල්ලේ රතනපාල සවිර * පාදයන් වහන්සේ
කාලය:— ක්‍රි: ව: 1770
ප්‍රමාණය:— පිටු 7

ඛුද්දක නිකායයෙහි පසළොස් ග්‍රන්ථයන් අතර 'විමාන වස්තුව' ද එකකි. ඒ එක්දහස් පන්සියයක් ගාථායෙන් සමන්විත යැ.—

'විමානං දේවතා වාසෙ — සතත භූම ඝරම්හි ච" යි විමාන ශබ්දය අර්ථ දෙකක පවත්නා බව කීහ. ඉන් මෙහි වාච්‍යවන්නේ 'දේවතාවාසය' යන අරුත යැ. වෙසෙසින් මානනය කටයුතු යන අර්ථයෙන් ඒ වි+මාන=විමාන ය යි කියනු ලැබේ. ඒ එසේ මැ යි. ඓශ්වර්‍ය්‍යාදි මහත්වයෙන් දේව ගෘහයෝ වෙසෙසින් මානනීය වෙති. කීයේ මැනු අර්ථකථායෙහි ද:—

"තත්ථ විමනානීති විසිට්ඨ මානානි දෙවතානං කීලා නිවාසට්ඨානානි.........විසෙසතො මානනීයතාය ච විමානානීති වුච්චන්ති" යි.

"විමානානං වත්ථු කාරණං එතිස්සාති විමානවත්ථු" ඒ විමනට කරුණු වූ දේශනාව ඇත්තේ නු යි විමානවත්‍ථු නමි. මෙයින් මේ වූකලි කර්ම — විපාක — සංදර්ශනාත්මක දේශනාවක් බව නිගමනය වන්නේ ය.

'දෙවතාහි කතං පුඤ්ඤං — යං යං පුරිම ජාතිසු,
තස්ස තස්ස විමානාදි — ඵල සම්පත්ති හෙදතො'
'පුච්ඡා වසෙන යා තාසං — විස්සජ්ජන වසෙන ච,
පවත්තා දෙසනා කම්ම — ඵල පච්චක්ඛ කාරිණී'

ය යි අර්ථකථාචාර්‍ය්‍යවරයෝ මේ අර්ථය මැනවින් පැහැදිලි කළෝ.

මෙසේ මෙහි හැම වස්තුවක් ම (දේශනාවක් ම) කුශලය, තත්ඵලය යි දෙකරුණකින් සමුපේත ය. පෘච්ඡාය විසර්ජනා ය යි දෙ කොටසක ගාථා කෙනෙක් මෙහි දක්නා ලැබෙති. බුදුන් හෝ මෞද්ගල්‍යායනාදි ශ්‍රාවකයන් විසින් නැතහොත් ශක්‍රයා විසින් හෝ ඒ ඒ දෙවියන් අතින් ඔවුන් ලත් සැප ඉසුරට හෙතුව විචාරීම පෘච්ඡා ගාථා වන්නේ ය. විසර්ජනා ගාථා ඒ ඒ දෙවියන්ගේ ය. එහි කේසකාරි විමාන වස්තුව වැනි ඇතැම් වස්තුවක් ශක්‍රයා විසින් විචාරණ ලදු ව, දෙවතාවක විසින් විසඳන ලද්දේ, හුදු දෙව භාෂිත ම වෙයි. පීඨාදි විමාන වස්තු මුගලන්, වංගීස, අනුරුඬාදි මහ තෙරුන් විසින් විමසන ලදු ව, දෙවතාවන් විසින් විසැඳුණේ—දෙව භාෂිත ද, ශ්‍රාවක භාෂිත ද, වෙයි. නතිය නාවාදි විමාන වස්තු බුදුන්ගේ පෘච්ඡා ගාථායෙන්

* ගම්මුල්ලේ සුමන නමින් ද සමහර තැනක සඳහන් වේ.

හා දෙවතාවකගේ විසර්ජන ගාථායෙන් ද සමන්විත වූයේ, බුඩ භාෂිත ද දෙව භාෂිත ද වන්නේ ය. මෙසේ 'විමානවත්ථුප්‍රකරණය' දෙවශ්‍රාවක භාෂිතයන්ගෙන් ද යුක්ත ය. එහෙත් ඒ ඒ වස්තූන් නිමිතිකොට බුදුරජුන් වදාළ ධර්මදේශනාය නිසා ඒ සියල්ල රාජ මුද්‍රායෙන් ලාංඡිත,වූ භස්තක් මෙන් බුඩභාෂිත බවට පැමිණියේ, ත්‍රිපිටකයෙහි අන්තර්ගත යැ.

මේ විමාන වස්තු ගාථාවනට පෞරාණික ආචාර්යවර යන්ගේ අර්ථකථානුසාරයෙන් නිදන සපයා බදරතිත්ථ ධම්පාල හිමියෝ විමානවත්ථු අටුවාව සම්පාදනය කළහ. එහි පීඨ චිත්‍රලතා පාරිච්ඡත්තක මාඤ්ජෂ්ටක මහාරථ පායාසි සුනික්ඛිත්ත ය යි වර්ග සතකි. පිළිවෙලින් ඒ ඒ වර්ගයන්හි සතළොස ය, එකොළොස ය, දසය, දොළස ය, තුදුස ය, දසය හා එකොළොස ය යි එකතුව කථා වස්තු පසාසූවක් වෙති. අතුරු කථාවනුත් සමග නම් මුළු සංඛ්‍යාව එක්සිය තෙවිස්සකි. මෙහි සම පනසක් වස්තු ස්ත්‍රීවිමානයන් සම්බන්ධ වූවෝ ය.

සෙංකඩගල උපෝෂිතාරාමයෙහි ගම්මුල්ලේ රතනපාල ස්ථවිරපාදයන් වහන්සේ මේ විමාන වස්තු අටුවාව හෙළුවට නගා සිංහල විමානවත්ථු ප්‍රකරණය සම්පාදනය කළහ. උපෝෂිතාරාමයෙහි වැඩ විසූ දූරම්පිටියේපොළ ධර්මරක්ෂිත හිමි පාණන්* රතනපාල හිමියන්ගේ ආචාර්යවරයෝ ය.

ග්‍රන්ථ කරණයෙහි ආරාධනය ලැබුණේ, "ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ශාසනොදය කාමී වූ ගලගෙදර ඉන්දජෝති" නම් තෙර කෙනකුන් වෙතිනි.

**පාලිය හැර වචනාර්ථ පමණක් ගෙන හෙළු බසට නගා එළු විමානවත්ථු ප්‍රකරණය සැපයූ බව ප්‍රකාශවෙතු දු, විමාන වත්ථු අටුවාව හා නො සැසදෙන තැන් කිහිපයක් මෙහි ඇත.**

i දෙවතාවන්ගේ සම්පත්තිය දක්වීමෙහි පෙළ වචනයන්හි අර්ථය ම නො වැ වාක්‍යාලඞ්කාරය පිණිස පවත්නා උපමාදි යෙන් ද යුක්ත කොට උදාර ගුණය වැඩෙන සේ වර්ණනය කෙළේ එක් විශෙෂයකි.

ii පීඨ — චිත්‍රලතා වර්ගයන්හි හැර සෙසු වර්ගයන්හි කථාවන් සංක්ෂිප්ත කොට දෙවතාවන්ගේ පූර්වකර්මය පමණක් දක්වීමෙන් කුශල කර්මය පමණක් දක්වූයේ, එක් විශෙෂයකි.

iii දක්වූ කථාවනට සමානතා දක්වන දුතියපීඨ, තතිය පීඨ, චතුත්ථපීඨ, දුතිය පතිබ්බතා, දුතිය සුණිසා, සොණදින්නා, උපොසථ, සද්ධා, දුතිය භික්ඛාදායිකා, උච්ඡුදායිකා, පල්ලඞ්ක, ලතා, මල්ලිකා, විසාලක්ඛි, පභස්සර, නාග, අලොමා, චතුරිත්ථි, අම්බ, උච්ඡු, වන්දන, චාරපාලක, කරණීය, දුතිය කරණීය,

* ක්‍රි: ව: 1774—84 යන කාලය තුළ මල්වතු විහාරයේ මහානායක පදවිය ඉසුලූවෝ මුත් වහන්සේ ය.

සූචි, දුතියනාග, දුතිය අගාරික, දුතිය උපස්සයදායක, යව පාලක, දුතිය කුණ්ඩලී, චිත්තලතා, මණ්ඩූක යන දෙතිසක් වස්තූන් විස්තර නො කොට නාම මාත්‍රයෙන් ඇතුළත් කෙළේ තමන් විශේෂයකි.

තතිය නාවුකා විමානවස්තුව සැකෙවින් කියා අවවාද පරිච්ඡේදය බැලිය යුතු බව ගත්කරුවෝ දක්වති. එසේ ම ආචාමදායිකා වස්තුවේදී "මෙහි විස්තර දේශනාව පරිච්ඡේද පොතෙහි එළු බසින් ප්‍රකාශ වූ බැවින් මෙ තැන්හි සංක්‍ෂෙප විය" යි ලියා තැබූහ. තවද, මට්ටකුණ්ඩලී වස්තුව සැකෙවින් දක්වා රත්නාවලියෙහි විස්තර දක්විණැ යි කීහ.

මේ වනාහි සිංහල විමානවස්තු ප්‍රකරණය සංක්‍ෂෙප කිරීමට ගත්කරුවන් දූරූ නැතක් උත්සාහයෝ ය. මෙසේ පොත සංක්‍ෂෙප වී යෑමෙන් තමනට මදි කමක් වේදෝ යි ගත් කරුවන් සිතූ බවකු දු පෙනේ. "අසමර්ථ කමක් නිසා නම් මෙබඳු පාලියක් හෙළු බසින් කෙරෙමි හි සිතිනු දු නො සිතමි" යි තෘතිය වර්ගයේ ආරම්භයේ දක්වූයේ එහෙයිනි. එහෙත් ග්‍රන්ථාරම්භයෙහි ම තමන් මෙ බඳු කාර්ය්‍යයකට නො සමත් බව "සිදුහතු කරඬුවක් ගෙන මුහුදු දිය ඉස්නට උත්සාහ කරන්නාක් වැනි", "තණ දණ්ඩක් ගෙන පොළොව පෙරළන්නට උත්සාහ කරන්නාක් වැනි", බරපතල කට යුත්තක් බව කියා පෑමෙන් දක්වූහ. ඒ වූකලි ස්වකීය නිරහඞ්කාරත්වය පෑ පූර්ව ග්‍රන්ථ රචකයන් අනුව යෑමක් පමණි. මේ කෙසේ වුව ද, රත්නපාල හිමියන්ගේ මේ පරිවර්තනය දෙෂ දර්ශනයකට ලක් නො වන්නේ ද නො වේ.

i "තස්ස භරියා උත්තරා උත්තරා ච නාම ධීතාති ද්වෙ එව ගෙහ මානුසකා = ඔහුගේ උත්තරා නම් භාර්‍ය්‍යාවෝ ද උත්තරා නම් දියණියෝ ද ඔහුගේ ගෙහි ම විසූහ."

ii අයං පරෙසං පවිෂ්ම ගෙහෙ වසති ස වස්ස ගෙහද්වාරං ගමිස්සාමි ඉමස්ස. හරියා මං දට්ඨුං න සක්ඛිස්සති. යාවස්ස හරියා හත්ථං ආදාය මග්ගං පටි පජ්ජති. තාව ඉධෙව භවිස්සාමීති = මොහුගේ භාර්‍ය්‍යාතොමෝ ගෙහි විසන්නී ය. මා විසින් නො දක්නා ලද්දී ය. එහෙයින් මම මොවුන්ගේ ගෙදෙර යමි."

iii "තුමෙහහි දිට්ඨ ධම්මස්ස භාගිනි අස්සං = ස්වාමීනි දෘෂ්ටධර්ම වශයෙන් පින් බලාපොරොත්තු වන්නෙමැ යි."

iv "අථ නං බහු සෙට්ඨී ගහපතිකාදයො කුලපුත්තා තෙන සද්ධිං මා විස්සාසං හිනදි. දෙහිස්ස ධීතරංති යාචිංසු = ඉක්බිති ඒ නුවර වාසය කරන්නා වූ බොහෝ සිටුවරු හා ගෘහපතිහු ද නුඹ වහන්සේ මේ සරණබන්ධනයම කැමැති නො වන්නාහු නම් ඒ රජගහ නුවර සිටුහු කෙරෙහි අපගේ විශ්වාසයෙක් නො වන්නේ ය."

v "තෙන ච සමයෙන අඤ්ඤතරා කට්ඨහාරිකා ඉත්ථි = එ සමයෙහි කට්ඨහාරී නම් වූ එක්තරා ස්ත්‍රියක්."

ආදි බොහෝ පරිවර්තන ස්ථලයන් මූල ග්‍රන්ථය හා වෙනස් වැ ආකුල ව ගොස් තිබීම දෝෂ දර්ශනයකට ඇති අවකාශ යයි.

රතනපාල හිමියන් මේ ග්‍රන්ථයට තැබූ නාමය **පරමත්ථජෝතිකා** යන්නය. ඒ වූකලි මූල ග්‍රන්ථයේ 'පරමත්ථ දීපනී' නාමය අනුස්මරණය වීමෙන් තබා ගත් බව නිසැක ය. එහෙත් මෙම ග්‍රන්ථය මහ ජනයා අතර ව්‍යවහාරයට පැමිණියේ 'සිංහල විමාන වස්තු ප්‍රකරණය' යන නමිනි.

බෞද්ධ ජනතාව අතර බහුල ප්‍රචාරයට ගිය ග්‍රන්ථයන්ගෙන් 'සිංහල විමානවස්තු ප්‍රකරණය' ද එකකි. භාෂාව සරල වැ කාලීන ව්‍යවහාරයට ගැළපෙන සේ ලියැවී තිබීම ත්, සැදැහැවතුන් පිනවන රසවත් කථා වස්තූන්ගෙන් සමන්විත වීමත්, එයට හේතු ය. මේ අනුවාදයෙන් අපේක්ෂිත වූ අර්ථය ද එයමැ යි. රතනපාල හිමියන්ගේ විමානවස්තු අනුවාදයටත් වඩා ඓතිහාසිකයනට මහඟු වන්නේ ග්‍රන්ථාවසානයෙහි එතුමන් ලියූ ශාසනොපකාර සඞ්ග්‍රහ වස්තුව යි.

රාජසිංහ ii රජු සිට ශ්‍රී විජයරාජසිංහ රජු දක්වා කාලයෙහි ලඞ්කා ශාසනයෙහි පැවැති බියකරු පිරිහීම ද, කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් හා සරණඞ්කර මාහිමියන්ගේ මහොද්‍යොගයෙන් ඇති වූ ක්‍රමොන්නතිය ද, මෙහි සැකෙවින් වුව ද, මැනවින් දක්වන ලද්දේ ය. එහෙයින් නිසැක නිශ්චිත ප්‍රවෘත්තීන්ගෙන් සමන්විත මේ සඞ්ග්‍රහය ශාසනික ඉතිහාස විවරණයක් වශයෙන් ඉතා අගනේ ය. තත් කාලීන ශාසන තත්ත්වය කැඩපතෙක්හි සෙයින් පිළිබිඹු වන මේ සඞ්ග්‍රහය ශාසන ඉතිහාසය දැනගනු කැමැතියනට බෙහෙවින් ප්‍රයොජනවත් ය.

සිංහල විමානවස්තු ප්‍රකරණය ඇසීමෙන් පහටු වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජ්ජුරුවෝ රතනපාල හිමියනට සතරකෝරළයේ අළුත් විහාරගම හා හිඟුලේ විහාරගමත් පුද කළහ. ග්‍රන්ථ ගෞරවය රැකීමට එම පමණි.

## සිංහල දළදා වංශය

කර්තෘ:— අවිනිශ්චිත යි.
කාලය:— ක්‍රි: ව: 1771
ප්‍රමාණය:— මුද්‍රිත පිටු 61

කුරුණෑගල පරාක්‍රමබාහු iv මහරජතුමාණන් දවස කිසියම් පඬිවරයකු විසින් ලියූ පරිච්ඡේද දෙළසකින් පරිමිත 'දළදා පූජාවලිය' සංස්කරණය කරමින් හා එතැන්සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මධ්‍ය යුගය දක්වා වර්ෂ සාරසිය සැටක් පමණ දීර්ඝ කාලයක දළදා වහන්සේ පිළිබඳ ප්‍රවෘත්ති සංග්‍රහ කරමින් ද

'සිංහල දළදා වංශය' ගළපා තිබේ. මූල ග්‍රන්ථය සංස්කරණයෙහිදී එහි එන පරිච්ඡේදයෝ මෙහි වෙන් නො කරනු ලද්දහ. ඇතැම් වාක්‍යයන් ද වෙන් කොට දක්වූහ. දළදා පූජාවලියේ ඒ ස්වභාවය මෙසේ වෙනස් කරන ලද්දේ 'සිංහල දළදා වංශය' හා ගළපනු සඳහා ය.

සිංහල දළදාවංශ සඞ්ග්‍රහ කරුවන්ගේ නාමය අවිනිශ්චිත යැ. කාලය අනුව සිතීමෙන් සඟරජ හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවේ කෙනකු බව පමණක් සිතං ගත හැකි ය. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍යෝදයෙන් සූවිසිවැනි හෙවත් ක්‍රි: ව: 1771 දී මෙය කරන ලද බව පැවසේ. මහාවංශාදි ප්‍රකට ඓතිහාසික ග්‍රන්ථයන්ගෙන් අනාවරණය නො වන ප්‍රවෘත්තීහු ද මෙහි නැති. තත් කාලීන රාජකීය ප්‍රවෘත්තීන් සහ දළදා වහන්සේ පිළිබඳ සාමාන්‍ය කථා ප්‍රවෘත්තිය ම විස්තෘත හෙයින් ඓතිහාසික පක්ෂයෙන් එතරම් වටනා ග්‍රන්ථයක් ද නො වේ. එ නමුත් භාෂා ශාස්ත්‍රයන් යට වී අන්ධකාරව පැවැති යුගයක 'සිංහල දළදා වංශය' වැනි ග්‍රන්ථ තත් කාලීනයනට බෙහෙවින් ප්‍රයොජනවත් වූවාට සැක නැති.

## වල්ලිමාතා කාව්‍යය

කතෘ:— අභයකෝන් විජයසුන්දර මුදලි
කාලය:— ක්‍රි: ව: 1772
ප්‍රමාණය:— පද්‍ය 228

'වල්ලිමාතා කව' මාතර අභයකෝන් විජයසුන්දර නම් මුදලි කෙනකුගේ රචනාවකි.

'පො බ ය තෙද පතල කල තෙදිය සවනි ඳූ
ලො බ ය වන කතාවක් දෙමළ බස රැ ඳූ
අ බ ය කෝන් විජේසුන්දරය මුදලි ඳූ
ලො බ ය සිතින් සිංහල බසිනි පද බැ ඳූ'

ග්‍රන්ථාවසානයෙහි එන මෙම පද්‍යය ගත්කරුවන් සහ ග්‍රන්ථ ස්වරූපය හඳුන්වා දෙයි. අභයකෝන් මුදලිඳුන් ගැන ප්‍රවතෙක් මීට වඩා ප්‍රකට ව නැති. ග්‍රන්ථය රචනා කරන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය ප්‍රාප්තියෙන් පස්විසි වැන්නෙහි යැ.

'වල්ලිමාතා කව' කරන ලද්දේ 'මකරධ්වජය' කළ මුදලිඳුන් විසින යනු ජනකථා යැ. ඇතැම් නවීන ඉතිහාස ග්‍රන්ථයන්හි ද එය ම සඳහන් වේ. ඒ මූකලි පොත නො දක ගතානුගතික ව ඇතිකර ගත් මතිමාත්‍රයකි. ඉදින් දිසානායක මුදලිඳුන් 'වල්ලිමාතා කවක්' කෙළේ නම් එය අනිකක් විය හැකි ය. මෙ පොතෙහි කතෘවරයන් නිශ්චය කරගැනීමට යථෝක්ත පද්‍යය ප්‍රමාණ යැ.

ගණපති සකන්ධකුමාර නමස්කාරයෙන් ඇරඹූ මෙ කවෙහි ප්‍රස්තුතය මෙසේ යි.

‘හිම් සඳුන් බර    ක ර
කල විවා මඟුලක්    පෙ ර
ඇසූ පමණ ගෙන    හැ ර
කියමි එළිවෙන් මඳක් කවි    ක ර’

මෙහි සඳහන් ‘පෙර කල විවා මඟුල’ නම් සකන්ධකුමාර-වල්ලි මාතා’ විවාහය යි. වෙදකථාවන්හි සඳහන් වන පරිදි සකන්ධ කුමාර තෙමේ අද දූ අවිවාහකයෙකි. කුමාර නම් වනුයේ ද එහෙයින් ම ය. බමුණු පඬිවරයින්ගේ ඒ මතය දෙමළ කිවිවරු නො සැලකූහ. එහෙයින් ඔවුහු කඳකුමරහට ද්‍රවිඩ ස්ත්‍රියක සරණ කොට දුන්හ. ද්‍රවිඩයෝ බෙහෙවින් සකන්ධ කුමාර භක්ති ඇත්තෝ ය. එහෙයින් එ දෙවියන් පිළිබඳ ලියැවුණු මේ කථාව ද ද්‍රවිඩ සාහිත්‍යයෙහි අති ප්‍රසිද්ධ වූවකි. අපේ වල්ලිමාතා කවියන් ද කඳකුමරුන් කෙරේ මහත් භක්ති ඇත්තකු බව පෙනේ. ස්වකීය පද්‍යයෙහි ප්‍රස්තුතය කොට වල්ලිපුවත ම ගැනීමෙහි කවියා පොලඹවන ලද්දේ මේ මහත් භක්තිය විසිනි.

**කථා සාරය** මේ කාව්‍යයෙහි එන පරිදි වල්ලි කුමරිය මුව දෙනක කුස ඉපද වැදි රජකු විසින් පොෂණය කරන ලද්දී ය. විය පැමිණි පසු ‘පාන්කි’ නම් යෙහෙළියක සමග තණ හේනක විසූ ඕ තොමෝ කඳකුමරුන් විසින් දකිනු ලැබ පාවා ගන්නා ලද්දු.

කවියා මෙ පුවතෙහි ලා වල්ලියගේ රූ සිරි, වැද්දන්ගේ කෲරකම්, ඇගේ වියෝදුක, හා සම්භෝගශ්‍රිය ද, වර්ණනයට පාත්‍ර කරයි. ගත්කරු සමර්ථ රචකයකු වී නම් කථාවස්තුව නිතැතින් ම ලබා දුන් මේ අවස්ථා කිහිපය මීට වඩා සිත්කළු වන සේ වර්ණනය කළ හැකි ව තිබුණි. ශෘංගාරය, භයානකය, රෞද්‍රය, විප්‍රලම්භය, ආදි ප්‍රමුඛ කාව්‍යරසයන් මතු කොට දැක්වීම සඳහා මේ ඉතා සුදුසු වර්ණනා භූමින් හෙයිනි.

‘ප ත ල . යස තෙද දියත හැම තැන රැඳුරු ගුණයුත් තෙකසුරු’
නැබ ල ඔද බිඳ සැවුලු දද බැඳ රනමයුරු නැගි මන    හරු
නි ම ල රුසිරුති වල්ලිමාතා සතුටු කල හිම් බර    කරු
ස ක ල සෙත දී අසිරි සලසති මෙ අප සමිඳුට තිර    ස රු’

ප්‍රස්තුතය නිම කොට මෙසේ කවියා අවසාන පද්‍ය දසයකින් රාජාශිර්වාදයක් කෙරෙයි. කඳකුමරුන්ගේ ප්‍රීත්‍යුත්කර්ෂය දක්වෙන මණ්ඩලයක් වැනූ හෙයින් ඔහු පිහිට යැදීමට මේ අතිශයින් සුදුසු අවස්ථාවකි. මෙය මැනවින් දත් කවියා රජු මතු නො වැ තමා ද රකින සේ කඳ කුමරුන් යදී.

වල්ලිමාතා කවෙහි භාෂාව සරල වුවත් අස්ථාන පතිත පදයන් නිසා තේරුම් ගැනීමට දුෂ්කර තැන් කිහිපයක් ද ඇති. අනුවාදය ද එතරම් ව්‍යක්ත නො වේ. රචනාව ද සාරවත් නැත. එබැවින් මෙ කව උද්ගම තරඞ්ගයෙහි කණිෂ්ඨ ස්ථානයට පත් වේ.

## ශ්‍රී සද්ධර්මාවවාද සඞ්ග්‍රහ

කර්තෘ:— තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහානායක හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1773
ප්‍රමාණය:— පරිච්ඡේද 13

දෘෂ්ට ධාර්මික සාම්පරායික පරමාර්ථ යන මෙයින් යථා යෝග්‍ය පරිදි දෙව් මිනිසුන්ට කරන ලද අනුශාසනා ඇති හෙයින් බුදුහු 'ශාස්තෘ' නම් වන සේක. මේ අර්ථය වර්ණනා කිරීම මුඛ්‍ය කාරණ කොට නව අරහාදි බුදුගුණ අතුරෙන් 'සත්ථා' යන අක්ෂර ද්වයකින් ප්‍රතිමණ්ඩිත වූ පදය උපන්‍යස්ත කොට 'ශ්‍රී සද්ධර්මාවවාද සඞ්ග්‍රහ'ය විරචිත ය. මෙසේ බුදු ගුණයක් උපන්‍යස්ත කොට ගද්‍ය සම්පාදනය සිංහලයෙහි උසස් සාහිත්‍යඥයන් කිහිපදෙනකුන් විසින් ආදෘත මාර්ගයකි. ඒ මාර්ගයෙහි අද දක්නට ලැබෙන පැරණි ම ග්‍රන්ථය ගුරුළුගෝමීන්ගේ 'පුරිස දම්ම සාරථී' පද වර්ණනා නම් **අමාවතුරය**. ඊට අනතුරුව මයූරපාද පිරිවෙන් හිමියන්ගේ 'අර්හත්' පදය වර්ණිත **පූජාවලියත්** සරණඞ්කර සඟරජ හිමියන්ගේ 'බුද්ධ' පද වර්ණනා නම් **සාරාර්ථ සඞ්ග්‍රහයත්**, එ මග ම ගත් ග්‍රන්ථයෝ ය. මේ **ශ්‍රී සද්ධර්මාවවාද සඞ්ග්‍රහ** ය වනාහි ඒ සඞ්ඛ්‍යාවෙහි ලා ගැනෙන පශ්චිම ග්‍රන්ථය යි.

සත්වයාගේ උභය ලෝකාර්ථ සිද්ධියට කාරණ වූ සර්වඥයන් වහන්සේගේ දේශනා සඞ්ඛ්‍යාත අනුශාසනා මාර්ගය සඞ්ග්‍රහ වන ග්‍රන්ථය ද අභේදෝපචාර විසින් 'ශ්‍රී සද්ධර්මාවවාද සඞ්ග්‍රහ' නම් විය.

ක්‍රි: ව: 1753 සිට 1773 දක්වා මල්වතු විහාරයේ මහා නායක ධුරන්ධර වැ වැඩ විසූ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධ රක්ෂිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ මේ ග්‍රන්ථයෙහි කතුවරයෝ ය. වැලිවිට සඟරජ හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයකු වූ මූන් වහන්සේ තත් කාලීන සියලු ම ශාසනික සඞ්ග්‍රහයන්හි සහායකාරී වූවෝ ය. **සතිපට්ඨානසූත්‍ර සන්නය**, **සද්ධම්මොපායන සන්නය**, සහ **ස්‍යාමොපසම්පදාවත** ත්, මේ හිමියන්ගේ අවශේෂ කෘතිහු ය. කුරුණෑගල පරාක්‍රමබාහු රජු පටන් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය දක්වා වර්ෂ තුන්සියයක පමණ දීර්ඝ ඉතිහාස ප්‍රවෘත්තිය පාලි ගාථායෙන් බන්ධනය කොට 'මහාවංශය' ට යාකළෝද මූන්වහන්සේ ම ය. කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන් උන් වහන්සේ පිදූයේ සඟරජ හිමියනට පමණක් දෙ වැනි වූ ආදර භක්තියකිනි. සරණඞ්කර හිමියනට

සඞ්ඝරාජ පදවිය පිදීමෙන් අනතුරු ව තිබ්බටුවාවේ හිමියනට මල්වතු විහාරයේ මහානායක පදවිය පවරන ලද්දේ එහෙයිනි. තිබ්බටුවාවේ මහානායක හිමියන්ගේ ප්‍රධාන ස්ථානය රිදී විහාරය විය. අවසානයේදී සවකීය ශිෂ්‍ය පිරිසගේ හිස්මීම සඳහා ව්‍යවස්ථා පත්තියක් තනා රජතුමන්ට ඉප්පු කළහ. උන් වහන්සේ මල්වතු විහාරයේදී අපවත්වී විදලේ සඟරජ හිමියන් ජීවත්ව සිටියදී ය.

තිබ්බටුවාවේ මහානායක හිමියන් 'ශ්‍රී සද්ධර්මාවවාද සඞ්ග්‍රහ'ය ලියන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආරාධනයෙනි. එය මූකලි උන් වහන්සේගේ අවසාන වර්ෂය වූ ක්‍රි: ව: 1773 වැන්නය. ග්‍රන්ථ කරණයෙහිදී පූජාවලිය හා සාරාර්ථ සඞ්ග්‍රහයත් ගුරු පොත් වූ බව දැක්වූහ: ඒ අතර අවශේෂ ධර්ම ප්‍රකරණයන්ගෙන් ගුරූපදේශ හා ධර්ම මාර්ගයන් ආශ්‍රය කොට 'සද්ධර්මාවවාද සඞ්ග්‍රහ' ය සම්පූර්ණ කළෝ ය.

**ධර්මානිශංසය, සම්බුද්ධගුණ, සද්ධර්මගුණ සඞ්ඝගුණ, සරණාගමන, අකුශල කර්මපථ, අකුශල කර්මභූමි, ශීල විභාගානිශංස, කුසලකර්මපථ, කුසල කර්මඵල භූමි, රාජධර්ම ගෘහපති ධර්ම විභාග, ධර්මානුශාසනා,** යනු මෙහි එන තෙළෙස් පරිච්ඡේදයෝ ය. බෞද්ධයකු විසින් අවශ්‍යයෙන් දත යුතු ධර්ම කොට්ඨාශවලින් මේ තෙළෙස් පරිච්ඡේදය ම සම්පූර්ණ විය ඒ සියලු ම ධර්මයන් **සඞ්ඛා** යන පදයෙහි ම සංගාහීත යි. බෞද්ධ ජනතාව සම්මාන පෙරටුව භාවිතා කරන මෙම ග්‍රන්ථය උද්ගම තරඞ්ගාගත වටනා ගද්‍යයන් අතර එකකි.

## ස්‍යාමොපසම්පදාවත

කර්තෘ:— තිබ්බටුවාවේ මහානායක හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1773
ප්‍රමාණය:— කොටස් 2.

'ස්‍යාමොපසම්පදාවත' සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහානායක හිමියන් විසින් පිළියෙල කළ කුඩා ගද්‍යයකි. මෙම ග්‍රන්ථය කොටස් දෙකකින් පරිමිත යැ, දෙවනපිය තිස් නරනිඳුගේ කාලයේ පටන් කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන් තෙක් සම්පාදිත ශාසනික ප්‍රවෘත්ති ප්‍රථම කාණ්ඩයෙහි එයි. එහි ගම්පල කාලය දක්වා සැපයූ පුවත් 'නිකාය සඞ්ග්‍රහ'යෙන් උපුටන ලදි. විස්තරාර්ථයන් හැර දැමූ නිකාය සඞ්ග්‍රහ වාක්‍යයෝ ම ඒ කොටසෙහි දක්වන ලදහ. යළි, කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු රජු පටන් කීර්ති ශ්‍රී රාජසිංහ මධ්‍ය යුගය දක්වා සඞ්ග්‍රහ වූ කරුණු තමන් වහන්සේ ගේ මහාවංශයෙන් උද්ධෘත යි. බුද්ධ වර්ෂය ගළපා ලියූ මේ ප්‍රථම කාණ්ඩයට සකරාජ වර්ෂය ගැළපීමෙන් දෙවැනි කාණ්ඩය අවුණන ලදි. මේ දෙවැනි කාණ්ඩය වනාහි සියම් දූත මෙහෙවරෙහි යෙදුණු විල්බාගෙදර නිලමේගේ ආරාධනය පරිදි සියම් දූත ගමන පිළිබඳ

එතුමන්ගේ සටහන් පෙනෙති* ඇතුළත් පිණ්ඩාර්ථය ගෙන සපයන ලද්දේ විය. එහි විමලධර්මසූර්ය i නරේන්ද්‍රයන් පටන් කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන්ගේ අවසානය තෙක් මේ රට ශාසනික ප්‍රවෘත්ති සංග්‍රහ වී ඇති. මෙය සපයන ලද්දේ 'ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ'යට පෙරව හෝ පසුව දැයි කිව නො හැකි. ක්‍රි: ව: 1776 දී කර නිමවූ බවක් ග්‍රන්ථාවසානයෙහි පැනේ. එහෙත් එය වූකලි ගත්කතුවරයන්ගේ අභාවයෙන් තෙ වසක් ගත වූ අවස්ථාව යැ. ඒ අවසාන වාක්‍ය කිහිපය යම් කිසිවකු විසින් ලියන ලද්දක් බව සිතා ගත හැකි ය. කෙසේ වුවත්, 'ස්‍යාමොපසම්පදාවත'ද 'සිංහල දළදා වංශය' මෙන් සාහිත්‍යකාමීන්ගේ සම්භාවනයට හිමි වේ.

## කව් මිණි කොඬල

කර්තෘ:— පත්තායමේ ලේකම් තුමා
කාල ය:— ක්‍රි: ව: 1773
ප්‍රමාණය:— පද. 724

මිණි කොඬල නම් සවනත හොබවන ආභරණයකි. යම් කිසි කවි වාක්‍යයක් නිරතුරු රස දන්නවුන් සවනත වැටේ නම් — හොබවා නම් — ඒ අර්ථයෙන් විසින් 'කව්මිණි කොඬල' නමි. සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ප්‍රකට විශාල කාව්‍ය ග්‍රන්ථයන් අතර එ නමින් හඳුන්වන ග්‍රන්ථයකු දු වෙයි. එය වනාහි පත්තායමේ ලේකම් තුමාගේ ශ්‍රේෂ්ඨ රචනය යි. ආලඞ්කාරිකයන්ගේ ලක්ෂණ කථනයට අනුකූල වූ නගරාර්ණව- ශෛලාදි මහා කාව්‍යයක ඇතුළත් විය යුතු වර්ණනයන්ගෙන් මෙ කව ආඪ්‍ය වුව ද, සර්ග බන්ධනයෙන් තොර වූයෙන් මහා කාව්‍ය සම්මතය නො ලබන්නේ ය. එ හෙත් පද්‍ය සංඛ්‍යාව ත්, රමණීය වර්ණනයනු ත්, අර්ධ මහා යමක, අර්ධ චන්ද්‍ර, සාමුද්‍ග, කපිල, පක්ෂ පත්‍ර, කමාට ත්‍රිශූල ආදි දුෂ්කර බන්ධනයනුත් මුල සිට අග දක්වා ම පෙනෙන ද්ව්‍යක්ෂර එලියත් ගැන සලකන විට මෙ කව සිංහල පද්‍යාවලියෙහි මහ කවක් කොට නොතැකීමට හේතු නැති.

'කව් මිණි කොඬල' සැපයීම ගැන පත්තායමේ ලේකම් තුමන් හා සම්බන්ධව ඇත්තේ විසිතුරු කථාවකි. ඒ වූකලි සිංහල සාහිත්‍යයෙහි අනික් කිසි ම ග්‍රන්ථයක් කිරීමට හේතු නො වූ ප්‍රවෘත්තියකි. ඒ එසේ මැයි. ගත් කතුවරයනට සමකාලීන පඬිවරයකු වූ කටුවාණේ දිශානායක නම් කවියෙක් ඉලඞ්ගකෝන් අභය ශ්‍රී වර්ධන මුදලි තුමන් වෙත ගූඪාර්ථ

* විල්බාගෙදර නිලමේගේ මෙ සටහන් පොත **ශ්‍යාම වර්ණනා** නමින් ප්‍රසිද්ධ යි. එහි දැක්වෙනුයේ ඒ දූත පිරිස මහනුවරින් පිටත් ව අයෝධ්‍යා පුරයට පැමිණීමත්, පෙරළා මහනුවරට පැමිණීමත් ය. ඒ පිළිබඳ සියලු මාර්ග විභාගාදි තොරතුරු මෙහි දක්වා ඇත. එකල සියම් රට පැවැති දැකුම් කටයුතු වැදගත් ස්ථාන පිළිබඳ තොරතුරු ද එහි දැක්වේ. දින—කාල—වේලා නියම වශයෙන් ම දක්වා සම්පාදිත මේ සටහන සියම් දූත ගමන පිළිබඳ වැදගත් විස්තරයක් ප්‍රකාශයට පමුණුවයි. සම්පූර්ණ කථා වහරින් ලියූ මෙය තත් කාලීන ගැමි වහර දැන ගැනීමට ද අතිශයින් උපකාරී වේ.

බන්ධනයක් එවමින්, එය තෝරාදුන් කෙනකුට තමා අතවැසි වන බව කීයේ ය. මුදලිතුමෝ එ කව තම සේවයෙහි යෙදී සිටි පත්තායමේ ලේකමට දුන්හ. "කටුවාණෝ මෙය එවන ලද්දේ මා විමසීමට" යයි කියමින් ලේකම් තැන එය තෝරා මුදලි තුමන් මගින් කටුවාණෝ වෙත යැවී. එයින් ප්‍රසාදයට පත් දිශානායක කවි තෙමේ ලේකම් තැන සම්මුඛ ව අන්‍යොන්‍ය මිත්‍රත්වය තහවුරු කර ගත්තේ ය. එ දින කවියන් දෙදෙනා තුළ හටගත් සංලාපයේදී එක ම නැකතින් අරඹා— එක ම කවි ගණනකින් කව් පොත් දෙකක් කොට එක ම දින යථොක්ත මුදලි තුමන් වෙත ඔප්පු කිරීම සඳහා කරගත් පිළිනයෙක් විය. සිංහල සාහිත්‍යයේ වටනා පද්‍ය ග්‍රන්ථ ද්වයක් වූ 'කව්මිණි කොඬල' හා 'කව්මිණි මල්දම' පහළ වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන්ගේ රාජ්‍යොදයෙන් සවිසි වැනි වර්ෂයේ හෙවත් ක්‍රි:ව: 1773 දී සිංහල සාහිත්‍ය වංශයෙහි ප්‍රවේශය ලත් මේ රචනාවන් අතර 'කව්මිණි කොඬල'ට ආශ්‍රය වූයේ, ජාතකට්ඨ කථාවේ තිංසති නිපාතයේ එන බෝසත් අලීන චිත්ත කුමරුන්ගේ චරිත ප්‍රකාශක ජයද්දිස ජාතක ය යි.

**කථා සාරය**

කම්පිල්ල රට පඤ්චාල රජුගේ දේවිය දෙවරක වැදූ දරුවෝ පූර්ව වෛරි යක්ෂණියක විසින් කන ලද්දුහ. තෙවැනි කුමරුන් යක්ෂණිය ගත් වේලෙහි ආයුධ ගත් යෝධයෝ ඈය ලුහුබඳවා ගත්තු. කුමරු ද ගෙන පලාගිය යක්ෂිනී එක් දිය සොරොව්වක සැඟවුණා ය. ළ දරුවා මම යයි හඟිමින් යක්ෂණියගේ තනය මුවින් ගත්තේ ය. යක්ෂණිය වුව ද, ඉතිරිය නම් දරුපෙමින් ඉතිරී ගිය තැනැත්තියක. එහෙයින් ඕ කුමරුන් කෙරෙහි හටගත් දරුපෙම් ඇත්ති— කිරි දී වැඩූ. වැඩිවිය පත් ඒ යක් මිනිස් තෙමේ ද, මිනිසුන් කා ජීවත් වේ. සතර වැනි වර පඤ්චාල දේවිය ලත් කුමාරයා උපද්‍රව රහිතව වැඩුණේ, ජයද්දිස යයි පතළ වැ එ රට පාලනය කෙරෙයි. එ රජු පුත් අලීන චිත්ත කුමාරයෝ අප බෝසත්හු යැ. වරෙක මුව දඩ ගිය ජයද්දිස රජ පූර්වොක්ත යක් මිනිසා විසින් අල්ලා ගන්නා ලදි. දෙ වැනි දින යකුට ගොදුරු පිණිස එන බව කියා ගැලවී ගිය ජයද්දිස රජ මෙ පුවත පුත් කුමරුට කීය. බෝසත් තෙමේ පියා වලකා යකු වෙත ගියේ— සචකිය ප්‍රඥානුගත— අභීත— ධීර— වීර— වික්‍රමාතිශයෙන් යකු පැහැද වී. ඉක්බිති පරීක්ෂා කොට බලා මෙතෙක් 'යකෙකැ'යි සිතා සිටිය ද ඔහු යකකු නො වැ තම පියාගේ වැඩි මහල් සහෝදරයන් බව දැන ඔහු ගිවිස්වා රාජ්‍යය සඳහා අයැදී ය. කලකිරුණු ඒ යක් මිනිස් තෙමේ තවුසකු ලඟ පැවිදි විය. අලීන චිත්ත කුමාරයෝ, අඹමින් වලජනා බන්ධූන් සහිත පුර වැසියන් තොස්වා නුවරට ආවෝ ය.

මෙය ශරීර කොට ගත් සමරජීව තෙමේ තෙරුවන් වැඳ, දේවායාචනය කොට කීර්ති ශ්‍රී මහිපාලයන්ද සමරණය කරමින් ග්‍රන්ථය අරඹයි. යළි සොළසක් කවියෙන් මාතර සිරි වනා ග්‍රන්ථ කරණයට ආරාධකයන් වූ යථෝක්ත ඉලඬගකෝන් මුදලි තුමා වනයි. එක්තිස්වැනි පද්‍යයේ සිට තෙ සැට වැන්න දක්වා මේ මුදලිඳුන් හඳුන් වන ලද්දේ ය. එහිදී පස් යුගයක සිට පිය — මුතු පරපුර දක්වා මුදලිඳුන් උත්කර්ෂයෙන් වැනීම ගත්කරුට අභිමත විය. ඉලඬගකෝන් මුදලිඳුන් සතුටු කර වීම එහි පරමාර්ථය යි. අනතුරු ව පද්‍ය කිහිපයකින් කථා සංදර්ශනය කොට —

'අප තිලෝ ආරි ය
අලින සත් කල දීරි ය
ලොවට පෑ මිරි ය
ගුණෙක පලකල පැරුම් වීරි ය'

යයි කථා ශරීර ප්‍රවෘත්ති සම්පිණ්ඩනය කොට දක්වයි. මීලඟට අටලොස් පද්‍යයකින් විත්මාන කථාව විස්තර කරන ලදි. එක්සිය අනූවැනි පද්‍යයෙන් ජයද්දිසදුව ඇරඹූ කවියා පඤ්චාල රජු ද, බිසවගේ දෙලදුකද, ජයද්දිස කුමරුන්ගේ රාජ්‍ය ප්‍රාප්තිය ද, වැනී ය. මෙහි එන බිසෝ වර්ණනය කාව්‍යශේඛරයෙහි බැමිණි ලිය වැනුම සිහිකර වන්නකි. බොධිසත්වොත්පත්තියේ සිට යුව රාජාභිෂේකය දක්වා කියූ දේ කාන්තිමත් ලෙස හැඩ ගැසී තිබේ. පද්‍ය තෙපනසකින් ග්‍රීෂ්ම, වර්ෂා හා සරත් යන සෘතුහු වර්ණිතයහ. කවියා සවකීය ශක්ති මහත්වය පෙන්වීමට වර්ණනා භූමි කර ගන්නා ලද්දේ මෙහි ආ වර්ෂා සෘතුව ය. පූර්වොක්ත අර්ධචන්ද්‍රාදි දුෂ්කර බන්ධනයන් දක්නට ලැබෙන්නේ, මෙහි ය. අනතුරු ව එන උද්‍යාන ජල ක්‍රීඩා හා සන්ධ්‍යා වර්ණනා කිහිපය 'කව්සිළුමිණෙ'හි තද්දිය වර්ණනා ස්ථානයන් සිහිපත් කර වීමෙහි සමර්ථ වෙයි. මෙහි ආ සන්ධ්‍යා නිශා වර්ණනා කාව්‍යයෙහි රම්‍යත්වය දියුණු කර ලන තැනකි. අලුගම කරනු ලැබූ වන්දිභට්ට ගායනයන් කියවන් නාට අමතක නො වන තවත් තැනකි. ධර්මසභා මණ්ඩපය හා බණ පිරිස දක්වූයේ ගුත්තිල කාව්‍යයේ පරිචිතිය හඟව මිනි. පද්‍ය දෙසාළිසකින් දක්වූ නැද බ්‍රාහ්මණයාගේ ධර්ම දේශනය කවියා ජාතකට්ඨකථාව ම නො පෙරලූ බවට ශාක්ෂි දෙයි. නැද බ්‍රාහ්මණයන් දම්දෙසන ලද්දේ "සබ්භිරෙව සමාසෙථ" ආදි සතාරහ ගාථා සතරින් බව ජාතක අටුවාහි දක්වේ. රජු සාරදහසක් වස්තුවෙන් ඔහු පුදන ලද්දේ ද එ බැවින්ම ය. එහෙත් සමරජීව කවියෝ මෙ බව අමතක කොට කාව්‍යශේඛරයෙහි ආ ධර්මදේශනය පිටපත් කරමින් දස අකුසල්, දෙලොස් කුසල් හා දසදන වස්තූන් විස්තර කළහ. මීලඟට ආ උදය වර්ණනය ඉතා කදිම ය. කථා වස්තුවට ම ඇතුළත් වන සේ කළ ඒ සමුද්‍රඝෝෂ පද්‍යාත්මක බන්ධන කිහිපය රචනයෙන් මෙන් ම අර්ථයෙන් ද විසිතුරු ය.

බෝසතුන් යක්ෂයා වෙත යන විට දුටු මග විසිතුරු පෙනී එන අවසාන වර්ණනය යි. ස්වාභාවික දර්ශනයෙන් යුත් ඒ වර්ණනය කරන ලද්දේ සංදෂ්ටකාදි යමක බන්ධන වලිනි.

ප්‍රථම පද්‍යයේ සිට අවසාන පද්‍යය දක්වා හැම පද්‍යයක ම අන්ත එළිය යුගලාක්ෂරයෙන් ඇතිකර තැබීම මේ ග්‍රන්ථයෙහි පැනෙන විශේෂ ලක්ෂණයකි. ගත්කරු පූර්වෝක්ත දුෂ්කර බන්ධනයනට පැමිණ පවා මේ ලක්ෂණය නම් බැහැර නො කොළේ ය. පද්‍ය සත්සිය සූ විස්සක් ම ධ්වනුව වර්ණයෙන් එළිය තැබීමට සිංහල ශබ්දකොෂ විෂයෙහි කෙ තරම් පෘථුල බුද්ධියක් තිබිය යුතු ද යනු අමුතුවෙන් විස්තර කළ යුත්තක් නො වේ. ගත්කරුවන් ද එම ලක්ෂණය ජේකප්‍රයොගයක් කොට තැකූ බව පෙනේ. මේ ධ්වනුව එළිය නිසා රසවිතුන් පිත වන කාන්ති ජනක අර්ථ රම්‍යත්වයෙන් මේ කව් මිදක් ලිහිල් ව ගිය සෙ යැ. ඒ එසේ මැයි. ශ්‍රිමත් ප්‍රවරසෙනයන් විසිනු දු:—

‘ඉච්ඡා ඉව ධණ රිඞි —
ජොබ්බණ ලඞිච්ච ආහි ආර් අසිරි,
දුක්ඛං සමහා විජ්ජ ඉ —
බන්ධවඡාආ ඉ අහිණවා අන්ගරි.’

යි බන්ධන කාන්තිය හා අර්ථ රසය එකවර ලැබීම දුසසේ සිදු වෙති කියන ලද්දේ ය.

බොහෝ තැන පදයන් හා ප්‍රත්‍යයාදිය විකෘත කොට යෙදීම ද, තේරුමක් නැති සේ එක ම වචන පෞනරුක්තියෙන් යෙදීමට ද මේ ධ්වනුව එළිය හෙතු වූයේ ය. එ පමණකුත් නො වැ, මේ ද්ව්‍යක්ෂර එළිය කවි කරුවන් ලවා ඉතා සුළු වියරණ ක්‍රම පවා උල්ලඞ්ඝනය කර වූයේ ය.

i “තොප කවිසි මන සිත්
නුදුටිමි වරද මන් සිස්”

ii “ඉති කුමරිඳු හිසි ස්
විය යළි කිගයි මෙ ලෙසින්”

iii “ලෙවින් බිඟු බමනී තියු ගොසිනි එකතුලේ”

iv “කියමින් මෙලෙසි නා
සිටියදි උන හිසි නා”

මේ ආදි තන්හි පෙනෙනුයේ ගත් කතුවරයන් සමාව නො ලැබිය හැකි සේ වියරණය මරා එළියට අවකාශ දුන් බවකි. මෙසේ ම කලිෂ්ට පද යෙදීමෙන් භාෂා ප්‍රයොගයන්හි දෙස් රැසක් ද මෙහි පැනේ. කවි බොහෝ ගණනක් මෙ වැනි දෙස්වලින් කැලල් වී තිබේ. මේ නිසා පන්නායමේ ලේඛම් තුමා මහදභිලාෂයෙන් යොදා ගත් පූර්වෝක්ත එළිය ග්‍රන්ථයට එළියක් නො වැ, අඳුරක් ම විය.

භාෂා තත්ත්වය අනුව 'කව්මිණි කොඬල' ගන්නා සවභාවය මෙසේ වුව ද, කථා රසය හා වර්ණනා මාර්ග අනුව නම් එයට අත්වන්නේ මීට වඩා උසස් තැනකි. එ හෙයින් ම බුධිමතුන්ගේ සම්භාවනයට මෙ කව පාත්‍ර වන්නේ ද වේ.

## කව්මිණි මල්දම

කර්තෘ:— කටුවාණේ දිසානායක මුහන්දිරම
කාලය:— ක්‍රි: ව: 1773
ප්‍රමාණය:— පද්‍ය 724

පත්තායමේ ලේකම බැඳුම් මිණි යොදා බුදු ගුණය කුණ්ඩලාභරණයක් කොට වියතුන් සවනත හොබවන අතර, කටුවාණේ දිශානායක මුහන්දිරම ද පූර්වෝක්ත පරිදි ශිවිසි ප්‍රතිඥාව මුද්‍රවමින් බැඳුම් මිණි බුදු ගුණ නමැති රුවන් හුයෙහි අවුණා විසිතුරු කොට කරන ලද මල්දමකින් කාව්‍යරසඥයන්ගේ ලය සැරසී ය. සාලිඇලේ මණිරතන හිමියන්ගේ ශිෂ්‍ය පරපුර මුල්ලේ හිමියන්ගෙන් කාව්‍ය ශාස්ත්‍රය උගත් මේ ගත් කතුවර තෙමේ ද, එකල දකුණේ විසූ සුප්‍රකට කවියෙකි. මකර ධ්වජය ද මෙතුමාගේ අනික් රචනාවකි:

'වස දසක දෙක දෙ ක
උනුවක් ද ඉත් වැඩිය ක
නො මැති ලද වයස ක
ඉගෙන මුනිදම් සතර පමණෙ ක'

යනුවෙන් දක්වෙන පරිදි 'කව්මිණි මල්දම' කරන විට කටුවාණේ කිවියන් සම දෙවිසි වියෙහි සිටි බව පෙනේ. එතරම් දහර වියෙක සිට, මෙ තරම් උසස් කාව්‍යයක් කිරීම ගැන එකල බොහෝදෙනාගේ සම්මානය මේ ගත්කතුවරයනට හිමි වූවා නිසැක යි.

'උඳුරුවිටි ගෙපිය ස
සුදී කව්සිපි තිසිලෙ ස
අත් පර වැඩ පිණි ස
බහා මුනිදම් කව්හි පදර ස'

ග්‍රන්ථයෙහි කර්තෘ හඳුන්වා ගත හැකි එක ම පද්‍යය නම් මේ යැ. මින් පැවසෙන 'උඳුරුවිටිගේ කාව්‍ය ශිල්පියා' කටුවාණේ දිශානායක බව ඒත්තු ගැනීමට මේ ග්‍රන්ථ ආය පිළිබඳ පවත්නා මුඛ පාරම්පරික කථාව ප්‍රමාණ ය. සමරජීව ලේකම්තුමන් මෙන් ම මෙතෙමේ ද මාතර ඉලඬ්ගකෝන් අභයශ්‍රීවර්ධන මුදලිතුමන් සෙවයෙහි යෙදී සිටියෙකි. එහෙත් 'මිණිකොඬොල්' කරුවනට මෙන් මෙතුමනට මුදලි තුමන්ගේ එ තරම් ළැදි බවෙක් හෝ ග්‍රන්ථකරණයෙහි ආරාධනයක් ලැබුණු බවෙක් නො දක්වේ.

'කව්මිණි මල්දම' ගෙතීමෙහි ආරාධකයා කවරෙක්දැයි දිසානායක කවීන්ද්‍රයෝ හෙළි කළෝ ය. කවිත්වයෙන් කිසි කැවී නිකම් සිටිනු නො හැකි බව හඟවනු වස් සරසවියගේ ඇරයුම ග්‍රන්ථ කරණයෙහි නිමිති කොට දැක්වූහ. කාව්‍යයෙහි අතරින් පතර තවත් පද්‍ය කිහිපයක් මෙන් ම මෙද කවියාගේ චරිතය ගෙන හැර දක්වන තැනකි.

'මිසදිටු ව පැවතු ම්
අනුන්'ත වැසිව පැවතු ම්
දුරද මෙත පැවතු ම්
නො වේවා මට මෙකී පැවතු ම්'

මිථ්‍යා දෘෂ්ටිය හා නපුරු රජුන් මෙන් ම අන් මෙහෙයෙහි යෙදීම ද සසර කෙදිනකවත් නො වේවා යනු කවියාගේ ප්‍රාර්ථනය යි. අහෝ! තරුණ කවියා අභයශ්‍රිවර්ධන මුදලිතුමන් සෙවයෙහි උකටලී වැ ගිය සේ ය.

'මිණිකොඬල' හා 'මල්දම' කිරීමට ගිවිස ගත් කාලය හැවුරුද්දක් බව උභය ග්‍රන්ථයන් සමීක්ෂණයෙන් දත හැක්ක. 'කව්මිණි කොඬල' ආරම්භයෙහි දැක්වෙන මේ පද්‍යයෙන් ග්‍රන්ථය ඇරඹූ වර්ෂය කියැ වේ.

'බුදු වසිනි දෙදහ ස
තෙ සිය තුදුසෙහි ලකහ ස
තෙදගින් නොව පහ ස
බිජ් නිරිදෙක් ලෙස පබදහ ස'

'කව්මිණි මල්දමෙ'හි එන්නේ ග්‍රන්ථය නිම කළ වර්ෂය යි. ඒ මෙසේ යි:—

'අප දියනා වසි න්
දෙදහස් තෙසිය සොළසි න්
පිරි වෙසගෙහි නිසි න්
මෙ නිම් පුණුපොහොදහි සතොසි න්'

දෙ හවුරුද්දකට දින ඇත්තේ සත්සිය තිසකි. එක් එක් ග්‍රන්ථයන්හි එන පද්‍ය සංඛ්‍යාව සත්සිය සූවිස්සකි. දිනකට එක් කවිය බැගින් වැටෙන සේ දින සංඛ්‍යාව ගෙන දෙ හවුරුද්දක් කාලය ග්‍රන්ථ නිමකිරීම සඳහා සීමා කොට ගත් බව මෙයින් සිතා ගත හැකි. බුඬවර්ෂ දෙ දහස් තුන්සිය තුදුස් වැන්නේ වෙසක් අව අටවක දින මේ ප්‍රතිඥාව කරන ලද නම් දෙ දහස් තුන්සිය සොළොස් වැන්නේ වෙසක් පුණුරසයට දින ගණන සත්සිය සූ විස්සෙක් වන්නේ ය. කවියන් දෙ දෙන ම රාජකාර්යයන්හි යෙදී අවිවේකිව ගත කළවුන් හෙයින් දෙ හවුරුද්දක් කල් ගැනීම වැඩිය යි නො සිතේ.

කවුවාණෝ කිවියන් ස්වකීය රචනය සඳහා ශරීර කොට ගන්නා ලද්දේ ජාතකට්ඨකථායේ සට්ඨිනිපාතයේ එන සොණක ජාතකය යි.

**කථා සාරය**

සෝණක කුමාරයෝ පුරෝහිත පුතණුවෝ ය. මගධ රජපුතු අරින්දම වැලි කෙළියෙහි සිට ම ඔහුට මිතු ව සිටී. ඔහු දෙදෙන එක්ව දේශසඤ්චාරය කරනුවෝ බරණැස් රජ උයනට ගියහ. මෙහිදී 'ඵුස්ස' රථය එවා බරණැස් රාජ්‍යයට අරින්දම කුමරු තෝරා ගන්නා ලදි. සෝණක කුමරුවෝ අරින්දම රජු නුවරට ගිය පසු ගල්තලයක් මතුයෙහි හිඳිමින් විවසුන් වඩා පසේ බුදු ව, නන්දමූලක ගල්ලෙනට වැඩියහ. අරින්දම රජ ඉසුරු බරින් මත් ව, සාළිස් වසක් ගෙවා සෝණක කුමරුන් සිහි කොට සොයා නො දක මහපිරිස් මැද හිඳ සෝණකයන් දන්වන්නකුට සියයක් ද, දක්වන්නකුට දහසක් ද දෙමැයි ගීයකට නගා කී ය. එ ගය මුළු නුවරෝ උගත්හ. පනස් වසකට පසු සොණක පසේ බුදුහු බරණැස් උයනට වැඩියහ. එ දින උයනැ පසෙක සත් හැවිරිදි දරුවෙක් පූර්වෝක්ත ගීතිකාව පුනපුනා ගයමින් දර සොයයි. පසේ බුදුහු පිළිතුරු ගයක් උගන්වා යැවූහ. එ ඇසූ රජ වහා අවුත් බණ අසා රාජ්‍යය හැර සවකීය මිත්‍රයාණන් සමීපයෙහි පැවිදි වූහ.

කවියා මේ අතීත වස්තුව මතු නො ව, වර්තමාන කථාව ද විස්තරයෙන් දක්වී ය. එහි ලා සැවත්නුවර හා දෙව්රම් වෙහෙර මැනවින් වර්ණිත යැ. දීපඞ්කර පාදමූලයේ සිට බුද්ධත්වය තෙක් එක් එක් පාරමිතාවට එක් එක් වස්තුව දක්වමින් සංක්ෂිප්ත නිදාන කථාව ද දක්වන ලදි. ඉන් මතු දම්සභායෙහි භික්ෂූන්ගේ ප්‍රවෘත්ති කථාව සඳහා කවි දෙසැත්තෑවක් ගෙතුයේ ය. එහිදී ගත් කතුවරයන් මහාභිනිෂ්ක්‍රමණය ගැන භික්ෂූන් කළ ඒ සල්ලාපයට පසුව බුද්ධකෘත්‍යය, පසැස්, සිතු ගොස, ආදි ජාතකට්ඨකථායෙන් පිටත් බොහෝ කරුණු දක්වන ලද්දේ ය. එය වනාහි ප්‍රතිඥාත කව් ගණන පුරවා ගනු සඳහා යෙදූ උපායකැයි හැඟේ.

එක්සිය එක්අනූවැනි පද්‍යයෙන් අතීත වස්තුවට බට කවියා සොළොස් මත් විරිත ගෙන රජගහ නුවර වනයි. ඉක්බිති තුදුස් පද්‍යයකින් කළ මගධ රජ වර්ණනය බෙහෙවින් 'කව්සිළුමිණෙ'හි එන කුසරාජ වර්ණනය හා සමාන බවක් දක්වයි. ඊළඟට ආයේ, කවියා මහත් අභිරුචියෙන් වැනූ මගධ රජ මෙහෙසිකාව යැ. කුමාරෝත්පත්තිය හා වර්ධනයට කාව්‍යශේඛර පද්‍යයන්හි ඡායාව වැටී ගියා සේ පෙනේ. දේශ සඤ්චාරයෙහි යෙදුණු දෙ කුමරුවන් දුටු මාර්ගී දර්ශනය වැනූ සමුද්‍ර ඝෝෂ පද්‍ය පන්තිය මෙහි එන උසස් වර්ණනාවන් අතර එකකි. සංදෂ්ටකාදි යමක බන්ධන කිහිපයකු දු මේ මාර්ගී වර්ණනා වෙහි ම දක්වේ. සෝණක කුමරුන් සිහි වූ කෙනෙහි බෝසත් අරින්දම රජුට ඇතිවූ ශෝකය ඉතා ස්වාභාවිකා සේ මේ කවෙහි ආයේ ය. පද්‍ය විස්සකින් වැනූ නාට්‍ය මණ්ඩපය ද, දරට ගිය සත් හැවිරිදි දරුවාගේ ප්‍රවෘත්තිය ද, රජු තපසට

යැම් වලක්වනු සඳහා ඇමතියන් කළ ආයාචනය ද, කවියාගේ සාමර්ථ්‍යාතිශය පෙන්වන ස්ථානයෝ ය. සෙපියෙන් වැනූ ග්‍රීෂ්ම හා සරත් ඍතූන් මධ්‍යයෙහි වර්ෂා ඍතුව දීර්ඝ වර්ණනාවක් වශයෙන් ආයේ ය. ධවජ - කපාට — පක්ෂපත්‍ර - ත්‍රිශූල - මුරජ - ඒකාක්ෂරාදි විචිත්‍ර බන්ධනයෝ එහිදී දක්නට ලැබෙත්. ඒ බන්ධන විශේෂයෝ පත්නායමේ ලේඛකමට නො දෙවැනි වූ රචනා ශක්තියක් කවුවාණේ මුහන්දිරමට තිබූ බව පැහැදිලි කරවති. සත්සිය එක්වැනි පද්‍යයෙන් ජාතක වස්තුව නිම කළ කවියා අවසාන දෙවිස්සක් පද්‍යයෙන් කර්තෘ සංදර්ශනය හා ප්‍රාර්ථනය කොට රචනාව නිම වයි.

දිශානායක කවින්ද්‍ර තෙමේ ද්ව්‍යක්ෂර එළිය හෝ එවැනි දුෂ්කර බන්ධන මාර්ගයක් ගෙන නිදහස් සිතුවිලි ලියට උණු දිය නො ඉස්සේ ය. එහෙයින් හෙතෙමේ පිරිසුදු වාක් ධාරාවක් ගෙන නො මැලවුණු අර්ථයක් දීමෙහි වඩා සමතෙක් විය. එළි සමය නිසා කැරුණු 'න' 'ල' කාර විපර්යාසය හල් 'ම'කාර 'න'කාරයන්ගේ අභේද නිරූපණ ය, ව්‍යාකරණවිරෝධ හා පුනරුක්තස්ථාන කිහිපයක් ද මේ කාව්‍යයෙහි දක්නට ලැබෙතත්, 'කව්මිණි කොඬල' තරම් භාෂා ප්‍රෞඪත්වයේ උපහාසයට මෙ කව ලක් නොවන්නේ ය.

## මකර ධවජය

කර්තෘ:— කවුවාණේ දිශානායක මුදලිඳු
කාලය:— ?
ප්‍රමාණය — පද්‍ය 116

මකරයා ධවජ කොට ඇත්තේ අනඞ්ග යැ. ස්වාමියාගෙන් වෙන් වූ ස්ත්‍රියක අනඞ්ග පහර ලැබ විරහ ශෝකයෙන් පෙළුණ සැටිත්, ස්වාමියා ලැබීමෙන් සොවින් මිදී ප්‍රීතිය ලත් සැටිත්, ව්‍යාජමුඛයෙන් පවසමින් ශබ්දාර්ථයන් විමසනු පිණිස පැන වතුන් හමුයෙහි තැබූ කාව්‍යයක් ද මකරධවජය නමින් එයි. ඒ වනාහි ශෘඞ්ගාර රසය ම අඞ්ගී කොට ගත් 'වියොවග රත්න මාලය' ගත් මඟ මැ එන අනික් රචනාවකි.

'ඉ ගෙ න කව් සතර හෙළි සඳ යුත් විය · ර
ර ද න සරසවිය කත නිති මුව තඹ ර
සො බ න දිසානායක මුදලි පැනස ර
බ දි න මෙ කව් පදරස නො විඳුනි කව ර'

මෙහින් පැවසෙන පරිදි දිසානායක නම් මුදලි කෙනකුන් 'මකරධවජ' යෙහි කර්තෘ බව දක්වේ. මෙ කියන දිසානායක යන් ගැන හෝ ඔවුන් විසූ කාලය පිළිබඳ කිසිදු පුවතෙක් මෙ කවෙහි සඳහන් ව නැති. එ බැවින් මෙහි කතුවරයා හා කාලය ගැන සිතා ගත යුත්තේ අනික් කරුණක් ම සංසන්දනය කර බැලීමෙනි. 'වියොවග රත්න මාලය', 'රතිවති කථාව', 'කව්මිණි කොඬල', 'කව්මිණි මල්දම' හා 'මකර ධවජය' යන මේ කාව්‍ය ග්‍රන්ථයෝ සමකාලීන කෘතින් හැටියට සලකනු

ලැබෙත්. මෙයින් 'මකරධ්වජය' හැර අනික් රචනා කිහිපය සමකාලිකබවට් ග්‍රන්ථයෝ තුළු ම දක්වති. එවිට 'මකර ධ්වජය' ත් ඒ ග්‍රන්ථ හා සමකාලීන කොට ගත හැකි වේ. 'මකර ධ්වජය' කළ දිශානායක මුදලි කවරෙක් ද යනු මීලඟට සෙවිය යුතු ය. මේ දිශානායක මුදලි 'කව්මිණි මල්දම' කළ කටුවාණේ දිශානායක මුහන්දිරම්තුමා බව සිතා ගත හැකි ය. පත්තායමේ-කටුවාණේ දෙ කවියෝ ස්වකීය සාමාර්ථ්‍යය දක්වන මහ කව් දෙක ඉලඞ්ගකෝන් මුදලිඳුන් වෙත පිළිගැන් වූහ. තමන් පිළිබඳ මහත් වර්ණනයක් ආ 'මිණිකොඬල' දුටු මුදලිවරයෝ මහත් සේ පහන් වැ කතුවරයනට සැපත් දුන්හ එහෙත් 'මිණිමල්දම' දුටු මුදලිතුමෝ නො පහන් වූහ. තරුණ කවියා එය ලියනලද්දේ සරසවියගේ ආරාධනයෙනි* මුදලිතුමන් ගැන උසස් වර්ණනයක් ද එහි නො ආයේ ය. ඒ කවියා ද 'මිණිකොඬොල්' කරුවන් මෙන් ම මුදලි තුමන් කෙරෙන් ප්‍රසාදය හා යස ඉසුරු බලාපොරොත්තු වූ නමුත්, "නුඹ සරසවියගෙන් ඉල්ලා ගනිත්නෑ" යි පිළිතුරු ලැබුණේ ය. මහළුවියට ලඟා වෙමින් සිටින උසස් නිල දරන පොහොසතුන්, වර්ණනයට ඉතා කැමැත්ත වුන් බවත්, ඔවුන්ගෙන් සැප සම්පත් ලැබිය හැක්කේ එසේ කළ කල්හි පමණක් බවත්, තරුණ කවියාට වැටහුණේ, මින් පසු ව ය. ඓශ්වර්යාපෙක්ෂාවෙන් 'මිණිකොඬොල්' කරුවන් කළ දීඝී පුද්ගලස්තවය ද; හෙතෙමේ පිළිකුල් කොට සැලකුවේ ය. සාහිත්‍ය පෝෂණයට ගත් උත්සාහය දුහුවිලි පුපුරටත් නොසලකා තමන් වර්ණනය නො කිරීම අපරාධය කොට තැකූ මුදලිඳුන්ගේ ආත්මශ්ලාඝාකාඞ්ක්ෂාව ද, කවියා කලකිරවූයේ ය. එ බැවින් හෙතෙමේ 'මකරධ්වජය'ට පැමිණ–

'එ යි න් නැණ ගුණා යුතු වියතුනි සක සා
වෙනින් වෙන උනා බල මැන විය ම බ සා
උ නු න් මන මනා දෙය කීවත් විම සා
අ: නු න් ගුණ වනා මිස නො ලබති යස සා'

යි මෙ කව ලියා සිය අත් දැකීම හෙළි කෙළේ ය. කටුවාණේ පසුකල මුදලි තනතුර ලැබීමත්, දෙදෙන ම දිසානායකවරුන් වීමත්, කාව්‍ය දෙක්හි ම වාක්දේවිය ගුණ ස්තවයෙන් සමරණය කිරීමත්, 'මකරධ්වජය' කටුවාණේ කවීන්ද්‍රයන්ගේ ම කෘතියක් බවට ඇති අනික් සාධකයෝ යැ. 'කව්මිණි මල්දම' ට පසුව රචිත බව පෙනෙන මෙහි රචනා කාලය නිශ්චය කළ නො හැකි.

---

* මා මුවගෙහි රඳ න
සරසවිය නම් දෙවඟ න
මුනි බණක් එළුවෙ න
කියව ම දිවට ඇයද සිටියෙ න (කව්මිණි මල්දම)

වාක්දෙවියට නමස්කාර මුඛයෙන් ඇරඹූ මෙ කව 'මකර ධ්වජයා' සමරණය කරවන පද්‍යයක් ඇසීමට වියතුන් මෙහෙයවා ගත්කරු ස්වකීය රචනාවේ තත්ත්වය මෙසේ පැහැදිලි කොට දක්වති.

'ත ද   බද ගැඹුරු වියරණ සත විසි බෙයැ   ති
එ ද   නෙකකුත් නොගෙන ගෙන කව්පද කැමැ   ති
බ ද   සුලකුණු වියත් පද සෙව්නා නොවෙ   ති
ස ද   සත දත් නැණැති උතුමෝ ම විසඳ   ති'

මෙයින් මෙ කව සාමාන්‍ය ජනයා උදෙසා කරන ලද්දක් නොවන බව පැවසේ. ඒ එසේ මැයි. ශබ්දාර්ථ ගැන මනා අවබෝධයක් ඇත්තවුන් විනෝදවත් කරවීමේ සමර්ථ ශෘඞ්ගාර රසයෙන් ආද්‍රව ගිය පද්‍ය පන්තියකින් මෙ ගත සැරසී ඇත. නිසා, විරහශෝක, හා සමහම් සැපත මෙහි වර්ණනාස්ථලයෝ වූහ. බන්ධන විෂයෙහි ස්වකීය සාමර්ථ්‍යාතිශය පෙන්වීම නිමිති කොට ගැමි වහරින් තොරව කරන ලද ශෘඞ්ගාර වර්ණනයක් වීමෙන් 'මකර ධ්වජය' වියතුන්ගේ සම්මානනයට ද පාත්‍ර වන්නේ ය.

## සිංහල මිලින්ද ප්‍රශ්නය

කර්තෘ:— හීනටිකුඹුරේ සුමඞ්ගල හිමියෝ
කාලය:— ක්‍රි. ව. 1773 - 78 අතර
ප්‍රමාණය:— වර්ග 22

බුදුන් පිරිනිවි පන්සියක්වස් ඉක්ම ගිය කල්හි දඹදිව යොන්රට මිලිඳු නම් රජෙක්* විය. හේ වජ්‍රෝපම තීක්ෂණ නුවණින් යුක්ත වූයේ, ශ්‍රැති, ස්මෘති, සාංඛ්‍ය, යොග, නීති, වෛශෙෂික, ගණිත, ගාන්ධර්ව, චිකිත්සා, චතුර්වේද, පුරාණ, ඉතිහාස, ජ්‍යොතිශ, මායා, හෙතු, මන්ත්‍රණ, යුද්ධ, ඡන්දස්, සාමුද්‍ර යන එකුනුවිසි ශාස්ත්‍රයෙක්හි කෙළ පැමිණියේ, අප්‍රතිවාදී වූයේ ය. මෙසේ ප්‍රඥාවෙන් හා තෙජසින් සමෘද්ධ වූ ඒ මහරජ තෙමේ සියලු වාදී දපී මර්දනයෙහි අප්‍රතිහට වූයේ, තමා හා වාදයට සුදුසු කෙනකුන් සොයමින් හැසුරුණේ ය.

එ සමයෙහි පූර්වෝපචිත ප්‍රාර්ථනා මහිම ඇති වාදීභකුම්භ ප්‍රදලනයෙහි කණ්ඨීරවෙන්ද්‍රශ්‍රීන් විරාජමාන ප්‍රඥාවෙන් දීප්තිමත් වූ නාගසෙන නම් ස්ථවිරයාණ කෙණෙක් අසූ දහසක් පිරිවරා සඞ්ඛ්‍යෙය පිරිවෙනට වැඩියහ. මිලිඳු රජ්ජුරුවෝ ඒ නාගසෙන ස්ථවිරයන් කරා ගොස් දෙ කෙළ නොදක්ක හැකි හෙයින් උභතොකොටික වූ විසර්ජනයෙහි සුදුෂ්කර වූ ගම්භීරාර්ථයෙන් සමන්විත වූ පැනවතුන් සිතුවිලි ගන්වන්නා වූ තෙ සිය සතරක් ප්‍රශ්න විචාළෝ ය. මහාබුද්ධි ඇති නාගසෙන

* මොහු වූකලී ග්‍රීක් රාජ්‍යය දඹදිව තෙක් විශාල කිරීමට යත්න දැරූ ග්‍රීක් රජුන් දෙදෙනාගෙන් කෙනකු වූ අලෙක්සැණ්ඩ්‍රියාවෙ කරසි නගරයේ උපන් මිණැණ්ඩර් රජු යයි ද, මිලිඳු ප්‍රශ්නයෙහි දෙව මන්ත්‍රිය, අනන්තකාය යැයි දක්වෙන්නේ එ රජුන් ඇමති ඩිමැට්‍රියෙස්, ඇන්ටිඔකස් යැයි ද, ඓතිහාසිය විවේචකයෝ කල්පනා කරති.

තෙරණුවෝ විචාලතාක් ප්‍රශ්න නියුණු කඩුවකින් උපුල්කලප් කපා හරින ශක්තිමත් පුරුෂයකු මෙන් සවකීය ප්‍රඥාවෙන් හා බලසම්පන්න වාග් ලීලාවෙන් විසඳා මිලිඳු රජු නිරුත්තර කළහ. පූර්වාචාර්යවරයෝ ඒ සියලු ප්‍රශ්නයන් අර්ථ විසින් මිලිඳු ප්‍රශ්නය යි ව්‍යවහාර කොට ඉන් දෙසිය දෙ සැටක් ප්‍රශ්නයන් ගෙන මිලිඳු පඤ්හ, ලක්ඛණ පඤ්හ, මෙණ්ඩක පඤ්හ, අනුමාන පඤ්හ, ඕපම්මකථා පඤ්හ, යයි පඤ්ච ප්‍රකාරයකට බෙදා ප්‍රෞඪයෝග යැයි ව්‍යවහෘතවාදීන්ගේ අතිත චරිතයකින් ද යුක්ත කොට පෙළ බසින් 'මිලිඳු පඤ්හය' තිබූහ. හේ වර්ග විසින් දෙ විස්සෙක්හි සඞ්ග්‍රහ වූයේ ය.

'පුච්ඡා විසජ්ජනා චෙව — ගම්භීරත්ථූපනිස්සිතා,
හදයඞ්ගමා කණ්ණසුඛා — අබ්භුතා ලොමහංසනා'

'අභිධම්ම විනයො ගාළ්හා — සුත්තජාල සමත්ථිතා,
නාගසෙන කථා චිත්‍රා —ඔපම්මෙහි නයෙහි ච.'

යි පැරණියන් කිවාක් මෙන් ඒ ප්‍රශ්නවිසර්ජනයෝ අර්ථ ගාම්භීර්යයෙන් හා ශ්‍රැති රමණීයත්වයෙන් ද යුක්තවූවාහු— ආශ්චර්ය දනවා ලොමුදහ ගන්වති. අභිධම් විනය දෙක්හි බැස සිටියෝ සූත්‍රජාලයෙන් සමර්ත්ථිතවූ වෝ — උපමා න්‍යාය යන් ගෙන් විචිත්‍ර වූවාහු ය.

මේ ප්‍රශ්නවිසර්ජනයන්හි දක්වූ වාද නිරසනය සඳහා බැහැරින් පැමිණි උපමාවෝ ද අතිශය චමත්කාර ජනක යහ. ක්‍රිස්තු වර්ෂයෙන් දෙ ශත වර්ෂයකට පෙර දක්වූ ඒ කරුණු රසායනාදි ශාස්ත්‍රයන් පිළිබඳ සමුත්පාතියක් පවත්නා මෙකල ද ඉතා අගය කොට සැලකිය යුත්තාහු වෙති.

ක්‍රිස්තු වර්ෂයෙන් පස්වැනි ශතවර්ෂයේ ත්‍රිපිටක ග්‍රන්ථයනට අටුවා සැපයූ බුදුගොස් හිමියන් මතභේද ස්ථානයනට පැමිණි සැක තැන් විසඳූයේ — මේ මිලිඳු ප්‍රශ්න විසර්ජනයන් ඇසුරු කරමිනි. විශුද්ධිමාර්ගාදියෙහි 'ථෙරො ආහ' යනුවෙන් සඳහන් වන්නේ. මේ නාගසෙන මහ තෙරුන් අරහයා ය. බුදුගොස් හිමියන් වැනි මහාග්‍රන්ථ කාරක කෙනකුන් විසින් පාඨ සමුද්ධරණය කිරීමෙන් ම 'නාගසෙන කථා'වන්හි ශ්‍රෙෂ්ඨත්වය වටහා ගත හැකි ය.

බුද්ධ ධර්මයෙහි ආධ්‍යාත්මිකත්‍වයනට සැක දනවන, පරවාදීනට ඉඩ ලබාදෙන, දුර්දර්ශ ස්ථානයන් නිර්ජට — නිග්‍රීම්බණය වන්නේ මේ ග්‍රන්ථයෙනි. ප්‍රකරණ පාලියෙහි ඇති න්‍යාය ශාස්ත්‍රානුගත ග්‍රන්ථයන් අතර 'මිලිඳුපඤ්හය' අග්‍ර ය.

මෙසේ මේ ග්‍රන්ථය පාලි භාෂාවෙන් පවත්නා කල්හි සෙංකඩගල රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ මිහිපලූන් "අනාගතයෙහි පහළ වන රජ රජ මහාමාත්‍යාදීන්ගේ ශ්‍රද්ධා-ප්‍රඥා - දෙක විසද කරවනු පිණිස දුරනුබොධ වූ පාලි භාෂාව

පෙරළා හෙළදිව් බසින් අර්ථ විවරණය කළ මැනවි" යි ආරාධිත වූ සීනටිකුඹුරේ සුමඞ්ගල හිමියෝ සිංහල බසට නගා ශ්‍රී **සද්ධර්මාදර්ශය** කළහ. සුමඞ්ගල තෙරණුවෝ අත්තර ගම රාජගුරු භණ්ඩාර පඬිවරයාන් පැවිදිව සිටියදී මහණ කරගත් ශිෂ්‍යයෝ ය. "සර්වශාස්ත්‍රාර්ණව පාරගත ගරුතර අත්තරග්‍රාම නිවාස භණ්ඩාර රාජගුරු විද්‍යාරත්න පණ්ඩිතාචාර්යෝත්තමයාණෝ" යි ග්‍රන්ථාදියෙහි හා "ඒ සඞ්ඝරාජෝත්තමයන්ගේ අතිශයාග්‍රශිෂ්‍ය වූ ගම්භීර වූ සමුද්‍ර ජලස්කන්ධය මෙන් ධරණ ලද ජිනදස් — ව්‍යාකරණ — ආදි ශාස්ත්‍රරාශියක් ඇත්තා වූ අත්තගාමවාසි භණ්ඩාර රාජගුරු නාමධේයෙන් ප්‍රසිද්ධ වූ ඒ පණ්ඩිතෝත්තමයා" යයි කාව්‍ය නිගමනයෙහි ද සඳහන් කරනු ලැබුවෝ ඒ මේ ධර්මාචාර්යවරයෝ යැ.

සුමඞ්ගල හිමියන් මේ අනුවාදය සැපයූ වර්ෂය ග්‍රන්ථයෙහි නො ආයේ ය. එබැවින් මෙහි රචිත වර්ෂය සොයා ගත යුත්තේ තත් කාලීන ප්‍රවෘත්තීන් පරීක්ෂා කර බැලීමෙනි. මේ ග්‍රන්ථය ලියන විට මල්වතු විහාරයේ මහානායක පදවිය දැරුවෝ දූරම්පිටිපල ශ්‍රී ධර්මරක්ෂිත හිමියෝ ය. සඟරජ හිමියන් අපවත් වීමට පළමු මේ අනුවාදය සැපයූ බව මෙහි ම දැක්විණ. එබැවින් දූරම්පිටිපල හිමියන්ගේ පදවි ලාභ වර්ෂය වූ ක්‍රි: ව: 1774 වැන්න හා සඟරජ හිමියන්ගේ අපවත්වීම වූ ක්‍රි: ව: 1778 අතර ඇති සිවු වර්ෂයතුළ 'මිලිඳු ප්‍රශනය' සිංහල සාහිත්‍ය වංශයෙහි ප්‍රවෙශය ලත් බව නිශ්චය කර ගත හැකි වේ.

මිලිඳුප්‍රශනය වැනි පාලි ප්‍රකරණයක් හෙළුවට නගාලීමට තරම් සාමර්ථ්‍යය ඇති උගත්තු එකල සුලභ නො වූහ. මේ පරිවර්තනය "පොළොව පෙරළීමක්" වැනි දුෂ්කර කාර්යයක් කොට හා "සමුදුර ඇළලීමක්" වැනි දුර්ලභ කටයුත්තක් කොට ගත්කරුවන් දැක්වූයේ එහෙයිනි.

පාලි මිලිඳු පඤ්හය තත් කාලීනයනට කෙතරම් දුර්බෝධ දෙයක් වීද යත් "ඝනතර පර්වත ප්‍රච්ඡන්න වස්තුවක් මෙනැ" යි සීනටිකුඹුරේ හිමියෝ කීහ. එ බැවින් සුමඞ්ගල යතීන්ද්‍රයන්ගේ මේ මිලිඳු පඤ්හ අනුවාදය තත් කාලීනයන් විෂම ගත්මත්තක් වූවාට සැක නැති.

සුමඞ්ගල හිමියන් මේ අනුවාදය [illegible] හුදෙක් මූල ග්‍රන්ථයේ පදනුගත අර්ථ මාත්‍රය [illegible] දීමෙන් නො වේ. බුත්සරණ — පූජාවලී — රත්නාවලී ආදි පෞරාණික දීප්තිමත් රචනාවන්ගේ වාක්‍ය [illegible] අනුගමනය කිරී මෙන් සාහිත්‍ය රසයත් ග්‍රන්ථයට ඇතුළත් වන පරිද්දෙනි. මේ අතර ඇතැම් තැනක පරිවර්තනය දුර්මත් [illegible] බවෙන් [illegible] දක්නට ලැබේ. පහත දක්වන පාඨ [illegible] ප්‍රාය භූෂිතව හා දූෂිතව ගිය සැටි පැහැදිලි කර ගැනීමට උපකාරී වේ.

i “තතො සො රොදන්තො භයෙන කචවරං ඡඩ්ඩෙන්තො =පහර කෑ ඉක්බිති භයින් තැති ගෙන ඒ හෙරණුන්දෑ හඬ හඬා කීකරු තැනක් සේ කුණු ලඟට ගොස් උක්කුටුකයෙන් හිඳ කරකැවී පහරදුන් තැනැත්තත් වහන්සේගේ මුහුණ යටසින් බල බලා කුණුගොඩ උකාගෙන ගොස් බැහැර දමමින්”

ii “එවං වුත්තෙ පූරණො කස්සපො නෙව සක්ඛි ඔගිලිතුං නෙව සක්ඛි උග්ගිලිතුං පත්තක්ඛන්ධො තුණ්හීභූතො පජ්ඣායන්තො නිසීදි = මෙසේ මිලිඳු මහ රජාණන් කී කල්හි පූරණ කාශ්‍යප නම් බුදුබැව් සොරාණෝ පිටිකර පහරක් කෑවා සේ ඇස් උඩ ඉදුවා ගෙන උගුරෙහි ගත් රළු කැවිල්ලක් සේ ගිලපියන්ටත් නො හැකි විය. වමාරන්ටත් නො හැකි විය. පක්‍ෂ බැඳුණු පක්‍ෂියකු සේ පත්තක්ඛන්ධ ව දත්ත බණක් නැති බැවින් තුෂ්ණීම්භූත ව තමහටම නින්ද බෙණෙමින් අවිද්ධ්‍යානයට සමවැදුනාක් මෙන් කරබාගෙන හුන්නේ ය.”

iii “නගරා නික්ඛමිත්වා බහි නගරෙ සෙනා ගණනං කාරෙත්වා සො රාජා හස්සප්පවාදකො ලොකායතවිතණ්ඩ ජන සල්ලාපප්පවත්තන **කොතුහලො** = නුවරින් නික්ම ගොස් පිටත මග එලිකතරකදී සේනාව ගණන් කරවා කථා වාදයෙන් වාද කරන්නා වූ ලොකායත විතණ්ඩ ශාස්ත්‍ර ජන සල්ලාප ප්‍රවෘත්ති ඇති **කොතුහල නම් විපරීත දෘෂ්ටියෙන්** යුක්ත වූ.”

iv “සුති – සම්මුති - සංඛ්‍යා – යොග – නීති – විසෙසිකා – **ගණිත** – ගන්ධබ්බා = වෙද ශාස්ත්‍රය, ස්මෘති ශාස්ත්‍රය, **ගණිතය**, කාම ශාස්ත්‍රය, නීති ශාස්ත්‍රය, වෛශෙෂිකය, **ගණිතය**, ගාන්ධර්වය.”

මේ මෙසේ වුව ද ගැඹුරු ධර්ම ශාස්ත්‍රයන් ගැබ් කොට ගැඹුරු පෙල බසින් ලියැවුණු ‘මිලින්ද පඤ්හය’ වැනි ප්‍රකරණයක් හෙළුවට නැඟීමෙහි ඇති දුෂ්කරතාව සලකන විට සුමඞ්ගල හිමියන්ගේ උත්සාහය සවීර්‍යායෙන් විඥතුන් පිත වීමෙහි සමත් වන බව කිව යුතු ම ය.

i “ලංඝකො = පිනුම්කාර පුරුෂයෙක් තෙම.”

ii “උභතො කුලානි සංවිස්සජ්ජාති = දෙගං ඉවුරු හාත් පසින් තලවමින්.”

iii “ශාලහං කචඡං බන්ධිත්වා = දූසිකොට අමුඩය ගසා.”

iv “උත්තාන සෙය්‍යකො = බලිසයනය කරන්නා වූ.”

v “පණ්ඩිතො බො අයං භික්ඛු = මේ මහණුන්නාන්සේ පණ්ඩිතවූ සේක.”

vi “පරිභුඤ්ජෙය්‍ය වා විස්සජ්ජෙය්‍ය වා = අනුභව කරන්නේ හෝ කාට කාටත් බෙදා දෙන්නේ හෝ.”

vii “ලෙඛාචරියා = ලියනාචාර්‍ය වූ සේක.”

viii "කොටින පක්ඛපූයති = තීන්දු කෙළවරක් නො පෙනෙන්නේ ය."

ආදි පරිවර්තිත පාඨ ගත් කතුවරයන්ගේ වාක් ව්‍යවහාරය පැහැදිලි කර ගැනීම සඳහා බොහෝ දුරට ප්‍රයෝජනවත් වේ.

සම්බුද්ධ දර්ශනය පිළිබඳ කරුණු දැන ගැනීමට මේ හැර අනික් පොතක් සිංහල සාහිත්‍ය වංශයෙහි මේ තාක් පිවිස නො ගත්තේ ය. භාෂා තත්ත්වයට වඩා ඇතුළත් වූ ධර්ම කොට්ඨාශය 'ශ්‍රී සද්ධර්මෝදසය' උසස් කෘතියක් වශයෙන් සම්මත වීමට හෙතු යැ.

## කව් මුතුහර

කර්තෘ — සාලිඇලේ මණිරතන හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1778
ප්‍රමාණය:— පද්‍ය 732

අටලොස් වැනි ශතවර්ෂයේ අවසාන භාගයේ පහළ වූ කාව්‍යයන් අතර සාලිඇලේ මණිරතන හිමියන්ගේ 'කව් මුතුහර' ශාස්ත්‍රීය රචනයකි. සරණංකර මෙඝ රාජයාගෙන් වහනය වූ විද්‍යා ජලධාරාවන්ගෙන් පිරී උතුරා ගිය සුපිළිපිත තඩාගයන් අතර සාලිඇලේ වැව ද අද්විතීය යැ. එහෙයින් ම එහි කව් මුතුහර, ප්‍රාතිහාර්‍ය ශතකය, අමාරසය, වැනි දසත පතළ සුවඳැති අභිරම් පද්මයෝ පැන නැංගහ.

දූරම්පිටිපල ධර්මරක්ෂිත මහානායක හිමියන් වෙත පැවිදි ලැබ, කරතොට ධර්මාරාම හිමියන් ඇසුරු කොට ශාස්ත්‍රය හදාළ සාලිඇලේ හිමියන් අතින් වූ සාහිත්‍ය සෙවය මෙ පමණ කට ම සීමාවන්නේ නො වේ. සුප්‍රසිද්ධ පරපමුල්ලේ ස්වාමීන් වැනි ව්‍යක්ත ශිෂ්‍යවරයන් ඇති කිරීමෙන් ද උන්වහන්සේ සරණංකර ශාසන ලතාවට පැන් වැඩූහ.

කීර්ති ශ්‍රී රාජසිංහ මහීපාලයන්ගේ අටවිසි වැන්නෙහි හෙවත් ක්‍රි: ව: 1778 දී 'කව් මුතුහර' නිම කළ බව දක්වේ. එහෙත් ආරම්භයෙහි එන—

> 'බුදු වසිනි දෙදහ ස
> තුන් සිය සවිසි වන ව ස'

යන පද්‍යාර්ධයෙන් බුද්ධවර්ෂ 2326 (ක්‍රි: ව: 1713) වැන්නෙහි වූ රජකු ගැන සඳහන් වේ.

> 'බුදුකුරු යුරු නිබ ද
> මෙ කිත්සිරි රජසිහ ර ද'

යනුවෙන් ඊට ඉක්බිති ව එන පද්‍යාර්ධයෙන් එ් රජු කීර්ති ශ්‍රී රාජසිංහ බව පෙන්වා දෙයි. එහෙත් ක්‍රි: ව: 1783 වන විට ලංකාවේ රජු කීර්ති ශ්‍රී රාජසිංහය යනු ඉතිහාස විරෝධ යැ.

එ රජ්ජුරුවන්ගේ රාජ්‍යසමය 1780 වැන්නෙහි අවසන් වූ බැවිනි. ග්‍රන්ථය නිම කළ වර්ෂ සංඛ්‍යාවත්, මෙහි එන රාජනාමයත්, කව්මුතුහර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයෙහි පහළ වූ බවට සාක්ෂි ය. එ බැවින් ග්‍රන්ථාරම්භයෙහි එන බුද්ධවර්ෂ නියමය අවුල් වූවක් බව පෙනේ. එය—

'බුදු වසිනි දෙදහ ස
තුන්සිය එකුනුවිසි ව ස'

කියා ගතහොත් කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍යෝදයෙන් එකුන්තිස් වැන්නෙහි ඇරඹූ මෙ කව එ රජුගේ එක්තිස් වැන්නෙහි නිම කළ බව සිතා ගැනීමට අවකාශ ලැබේ.

'කව් මුතුහර' ලියන ලද්දේ මාතර කැඳබඩපත්තුවේ අභයරත්න ඒකනායක මුහන්දිරම් තුමන්ගේ ළදරු පුත් සිංගිඅප්පුහාමිට පින් පැමිණ වීම සඳහා යැ. දෙලොස් වියේදී කළුරිය කළ මේ කුමාරයන් උදෙසා අභයරත්න මුහන්දිරම් තුමා කරවූ පින්කම් මේ ග්‍රන්ථයෙහි අසූසතරවැනි පද්‍යයෙහි සිට අනූවැන්න දක්වා විස්තර කොට ඇත. ඉක්බිති ධර්මදාන මය වූ පින්කමකින් ද, පින් අනුමෝදන් කරවීම සඳහා මණිරතන හිමියන් ලවා 'කව්මුතුහර' කරවන ලද්දේ වියඃ

'යෑ දු න් කළ මේ කව් බඳනට මැනිඳුහ ට
යෙ හෙ න් පුත්ව මලගිය අප්පුහාමි ට
මෙ පි න් සිදුව නො ගොසින් සතර අවය ට
එ සි න් බැහැර නො පැමිණ දරුණු දුකක ට'

'ඉ තා ප හ න් සිරිවිඳ සුරනර දෙතැ න
අ නා බ වෙ න් දින පුර ඝේතු මති ය න
මෙ තේ බු දු න් වෙත සදහම් කර සව න
නො සේ සි ති න් පැමිණෙව අමමා නිව න'

මෙසේ ග්‍රන්ථාවසානයෙහි පින් අනුමෝදන් කරවන්නේ ඒ මේ කුමරුට ය.

'කව් මුතුහර' ගෙතීමෙන් සාලිඇලේ හිමියෝ ළදරු කුමරුට පින් අනුමෝදන් කරවීම මතු නො වැ මුහන්දිරම් තුමාට සැනසීමක් ලබා දීම ද අදහස් කළහ. ග්‍රන්ථයෙහි කථා ශරීරය සඳහා 'දශරථ' ජාතකය ම තෝරා ගන්නා ලද්දේ එහෙයිනි. සර්වඥයන් වහන්සේ මේ ජාතකය දෙසන ලද්දේ ද පියා මළ ශෝකයෙන් හඬමින් සිටි කෙලෙඹියකුට ය. හිතවතකුගේ මරණයෙන් ශෝක වන්නකුට සැනසීම සඳහා මේ ජාතකයෙහි එන ධර්මෝපදේශ පන්තිය ඉතා වටනේ ය. සාලිඇලේ හිමියන් මේ ස්ථානයට පැමිණ ජාතකට්ඨ කථා යෙහි එන ඒ ගාථාවන්හි අදහස් පමණක් නොවැ, සල්ලසූත්‍රය, ධම්මපදගාථා ආදි වෙනත් පාලි ප්‍රබන්ධයන්හි එන දහම් කොටස් ද ගනිමින් එක්සාළිස් පද්‍යයකින් ජීවිතය අස්ථිර බව, වැළපීම නිරර්ථක බව, හා ධර්මචර්යාව ද සැකෙවින් දක්වන ලද්දේ ය.

**කථා සාරය** අතීතයේ බරණැස දශරථ නම් රජෙක් විය. එ රජු බිසව රාම-ලක්ෂ්මණ යන දෙපුතුන් හා සීතා නම් දුවක ද වදා මිය ගියා ය. රජු දෙවන බිසවක පාවා ගති. ඇය වැදූ දින රජ තෙමේ බිසවට සැමැති වරයක් ඉල්ලන සේ කී ය. දේවිය තම පුත් භරත කුමරුට රාජ්‍යය හිමි කරන සේ යැදූ. එය ප්‍රතික්ෂෙප නො කළ හැකි දශරථ තෙමේ දෙලොස් වසකින් තමා මළ පසු ඇවිත් රාජ්‍යය ගන්නා සේ දන්වා දෙ පුතුන් හා දියණියන් වලට යැවී. රජතෙමේ පුත්‍ර ශොකයෙන් පෙළී මෙළේ ය. භරත කුමරු මහ සෙනඟ ගෙන වන ගොස් රාම කුමරුට පියා මළ පුවත දැන්වී ය. එ පුවත ඇසූ ලක්ෂ්මණ - සීතා දෙදෙන තෙ වටක් විසඥව ගියහ. බෝසත් රාම කුමරුවෝ අකම්පිතයෝ ය. පියා මළ කල ද, ශොක නො වන්නට කරුණු ඇසූ භරතහට ශොකයෙහි නිරර්ථක බව දක්වමින් රාම පණ්ඩිතයෝ ධර්මයෙන් පිළිතුරු දුන්හ. යළි පිය වදන නොසික්මවනු රිසි බෝසත් සිය වහන් සඟල ගෙන ගොස් සිහසුන මත තබා රට පාලනය කරන සේ භරත කුමරුට අවවාද කොට යවා දෙලොස්වස ඉක්ම ගිය පසු බරණැසට පැමිණ රාජ්‍යය විචාළේ ය.

ජාතකට්ඨකථායේ එකාදශක නිපාතයේ එන මේ ජාතකය 'කව් මුතුහරෙහි' රත්නය වූයේ ය. එහි මුතුපල නම් වාගාර්ථ පඞ්ක්තිය යැ. යමක හා චක්‍ර ලක්ෂණ මුතුහරෙහි තැනින් තැන අවුණන ලද මැණික් බඳු යැ. එහෙයින් කියන ලද—

'ග න ර න්   හුය මෙද සියබසරුත් පසි   දූ
මු තු ව න්   යමක සක්මිණි තැනතැන සුසැ   දු
ම පි සි න්   ගෙතූ මෙ කව් මුතුහරය පරසි   දු
බ ල මි න්   රැගෙන කිවිඳුනි උරතෙලෙ පළ   දු'

නිදන වස්තුව දක්වීමෙහි මණිරතන හිමියන්ගේ සැවැත් පුර, කොසොල්රජ, හා දෙව්රම් වර්ණනය ත් පෙර කෘතින්හි එන සේ සම්පාදනය වී තිබේ. කථාවට නො ගැළපෙන ධර්ම සභා සංලාපයක් මෙහි නො මැතිවීම විශෙෂයකි. ඒ වෙනුවට යොදන ලද රම්‍ය වූ සංක්ෂිප්ත බුද්ධචරිත වර්ණනය කියවන්නා භක්තියෙන් පුරවන සුළු ය. දෙසිය එකුන්තිස්වැනි පද්‍යයෙන් අතීත වස්තුව ඇරඹූ කවියා ෂට්ත්‍රිංසත් පද්‍යයකින් බරණැස් පුර වනයි. මේ නගර වර්ණනය ද කවියාගේ සාමර්ථ්‍යය පෙන්වන තැනකි. කුමරුන්ගේ වනප්‍රයානයේදී දක්වූ මාර්ග වර්ණනය ඉතා දිග් වූවකි. උදය — සන්ධ්‍යා — රාත්‍රි ආදි සංක්ෂිප්ත වර්ණනාන්තරයන්ගෙන් යුක්ත කිරීම, විටින්විට වෙනස් කළ වෘත්ත විශෙෂ ඇතිවීම, යන දෙ කරුණ නිසා මේ දීර්ඝ මාර්ග වර්ණනය කියවන්නාට උද්වෙග දනවන්නක් නො වී ය. 'කව්සේකර'යෙන් පසු ලියූ බොහෝ ජාතක කාව්‍යයනට අසථානයේ වුව ද, මෙ බඳු මාර්ග වර්ණනයක් ඇතුළත් කිරීමට බොහෝ කවීන් උත්සාහ ගත් බව පෙනේ. එ නමුත් 'මුතුහරෙ'හි එන මාර්ගවර්ණනය වැනි සිත් ගන්නා වර්ණනයන්

දක්නට ලැබෙනුයේ කලාතුරිනි. මීළඟට එන්නේ වන වාසයට පැමිණි කුමරුනට සෘතූන් එළඹි සැටියකි. සාරසිය සතරවැනි පද්‍යයේ සිට සාරසිය දෙ අනූව දක්වා ක්‍රමයෙන් ෂට් සෘතූන් ම දක්වන ලදී. මේ වනාහි මෙතෙක් පළ වූ අවශේෂ සිංහල කාව්‍යයක දක්නට නො ලැබෙන විශේෂයකි. රම්‍යාර්ථ දීපක දුෂ්කරාතිදුෂ්කර බන්ධන විශේෂයන් දක්නට ලැබෙන්නේ යථොක්ත වන වර්ණනය හා මේ සෘතූන් වර්ණනයන්හිදී ය. දෙලොස් වස ඉක්මවා බරණැස් රාජ්‍යයට පැමිණි රාම කුමරුන් හමුයෙහි දක්වූ නළඟන රැඟුම ඉක්බිතිව කියවන්නාගේ සිත ඇදියන තැනකි. එහිදී කවියා 'ගුත්තිලය' ආදර්ශයට ගත් බව පෙනේ. මීට අනතුරු ව රජුගේ ශ්‍රී විභූතිය වනමින් ක්‍රම යෙන් උද්දමයට පැමිණෙමින් පැවති පාඨකයාගේ මනො තරඞ්ගය පරම කොටියට පැමිණ වූ කවියා —

'වි ද  මුහුලු මිණිරැස් විතර නො විත  ර
බැඳු  ඇදිලි හුන් මැති තඹුරු පොබක  ර
උ දු  ගල් හිසින් ලො පහළ දිනිඳු යු  ර
එ දු  නිරිඳු වැජඹිණි සිහසුන් සි  ර'

හි සර හඬසඳයෙන් කියවා ගීතාශ්වාදනය කරව හි. සත්සිය දෙළොස්වැනි පද්‍යයෙන් ජාතකය නිම කළ මණිරතන හිමියෝ වර්තමාන කථාව ගෙන බුදුන් විසින් කෙළෙඹියාට වදාළ ධර්ම දේශනය විස්තර කෙරෙති. එහිදී 'කව්සේකරය' බෙහෙවින් ආශ්‍රය කළා සේ පෙනේ. අවසානයෙහි "සබ්බෙ බුද්ධා බලප්පත්තා" ආදි ගය හෙළුවට නගා—

'නිවන්  අමා දුන් අට විසි මුනි  බෙලෙනි
පසන්  ගුණැති නෙපසේ මුනි තෙද  බෙලෙනි
ගතන්  නොමැති මුනි පුත් රහතන්  බෙලෙනි
බඳින්  අරක් සතහට මෙතුමන්  බෙලෙනි'

යනුවෙන් කාව්‍යය අවසන් කොට ඇත්තේ ය.

මේ අයුරින් බැඳුම් මග ගත් 'කව් මුතුහර' වූකලි මහනුවර සාහිත්‍ය වංශයෙහි උස් තැනක් හිමිවන පද්‍යයකි. නිගමන පද්‍ය දෙළසත් සමග පද්‍ය සත්සිය සූ සාළිසකින් හෙබි මෙය විවිධ වෘත්තාත්මක වූයේ කවියන් පිත වීමෙහි සමර්ථ වේ.

මූදලිඳු (මඳුර පර්වතය), ඉවිල් (උත්සාහය), පියතවුරු (ක්ෂීර සාගරය), සැකියත් (සංකිච්ච), බොවැදි (බ්‍රාහ්මණ), හුරුබිම (ලුණු කරබිම), බරම් (බ්‍රහ්ම), තොලිල් (ශිල්ප) ආදි වර්තමාන භාෂාවේ අප්‍රකට වචන ද. එළිසමය හා වෘත්තය, ආදී යම් යම් ස්ථානයකට පැමිණ යෙදූ අප ශබ්ද යත් ද පුනරුක්ත හා පුන පුනා වැනීම් කිහිපයක් ද,

i "කලුන් එ නුවර නිබඳ හැසිරෙති."

ii "මම ද නුවර එනතෙක් මිණි කම්නුදුල."

iii "රිවුන් සිවලුන් බුදිති එක ලෙස."

ආදි වියරණ දෙස් කිහිපයක් ද, මේ ග්‍රන්ථයෙහි දක්නට ලැබේ.

එම් මෙසේ වුවත්, රචනා විලාසය අනුව මේ කව 'මිණි කොඩොල', 'මිණි මල්දම' වැනි ග්‍රන්ථයන් හා සම කක්ෂාවට පැමිණේ.

## ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය

කර්තෘ :— සාලිඇලේ මණිරතන හිමියෝ
කාලය :— ක්‍රි: ව: 1778 ?
ප්‍රමාණය :— සිලෝ 102

'ප්‍රාතිහාර්‍ය්‍ය ශතක'ය ද සාලිඇලේ මණිරතන හිමියන් ගේ තවත් රචනාවකි. මෙතෙක් ප්‍රකට සිලෝ ග්‍රන්ථයන් අතර මේ තෙවැන්න යි. ගණ්ඩඹ මූලයෙහි නිර්මිත මර්තනය කරන සර්වඥයන් වහන්සේ පෑ යමක ප්‍රාතිහාර්‍ය්‍යය ප්‍රස්තුතය කොට ගන්නා ලදින් ග්‍රන්ථ සංඥාව අර්ථානුගත ය.

සාලි ඇලේ හිමියන්ගේ අනික් ග්‍රන්ථද්වයෙහි උන් වහන්සේ ගේ නම දැක්වෙතු දු, මේ ග්‍රන්ථයේ නම් කතුවරයන් ගැන වචන මාත්‍රයකු දු නැති. ආරම්භයෙහි නිමිත්ත සංදර්ශනයක් හෝ අවසානයෙහි කර්තෘ නිගමනයක් ද නැති. මේ මෙසේ වුවත්, ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය සාලිඇලේ හිමියන්ගේ කෘතියක් බව නිර්විවාද යැ.

සැවත්පුර වැනුමෙන්-පටන් ගත් ග්‍රන්ථය බුඩශ්‍රී වර්ණනයෙන් අවසන් විය. මාලිනී—ශාර්දූල වික්‍රීඩිත—මන්දාක්‍රාන්තා—ස්‍රග්ධරා—වෘත්තයන්ගෙන් බැඳි සිලෝ එක්සිය දෙකකින් යුත් මේ කව එතරම් ව්‍යක්ත රචනාවක් නො වේ. වෘත්තය සඳහා කළ මාත්‍රා විකෘති, මේ ග්‍රන්ථයෙහි සුලභ යැ. නො සිලිටි වචන හා පුන පුනා කීම් ද කිහිපයක් වෙති. එහෙත් ශාස්ත්‍රය දළු ලමින් පැවැති එ සමයේ හෙළ කවීනට වඩා නුපුරුදු සංස්කෘත වෘත්ත යන් අනුව කළ මේ නිබන්ධය සාහිත්‍ය කාමීනට රුචිකර වූ සුභාෂිත ඵලයකි. මණිරතන හිමියන් මේ ග්‍රන්ථය කරන ලද්දේ 'කව් මුතුහර'. කිරීමට පළමුව හෝ පසුවදැ යි නිශ්චය කළ නො හැකි. මේ ග්‍රන්ථයෙහි ආ ඇතැම් අදහස් වඩා ව්‍යක්ත ලෙස 'කව් මුතුහරෙ'හි දැක්වෙන හෙයින් මෙය ඊට පළමු කරන ලදැයි සිතා ගැනීමට අවකාශ ලැබේ.

මණිරතන හිමියෝ මේ රචනයෙහිදී පැරණි කාව්‍ය ග්‍රන්ථ කිහිපයක් ම ඇසුරු කළහ. ඉනුත් සැවුල් අස්න ප්‍රකට පරිද්දෙන් ම ආශ්‍රය කළෝ ය.

'මදහස පනැද මනරා තෙපුල සත්කා ර
පියවුරු වල වසා පස යොදමින් පත ර
බැම සැව්නෙත් සැරෙන් විද සලෙලු මුව ස ර
පුර සර වනසරත් මෙන් සරනි එ නුව ර'

සැවුල් අස්නෙහි එන මේ පද්‍යයේ ඡායාව ප්‍රාතිහාර්‍ය්‍ය ශතකයට වැදූ ගත් සැටි මෙසේ ය.

'මදහස පනැදීමෙන්—ලා නොයෙක් මත් තෙපුල් සත්
පියවුරු වුරුවල්නී — නිල්වසා පා නැගීමේන්,
බැමලිය සරසුන් නී — ලා නුවන්හී කලූන් ගොස්
විදි දුනු මුව කැන් වී — වල්සරත් මෙන් පුරේනී'

ප්‍රස්තුතය කොට ගන්නා ලද්දේ යමක ප්‍රාතිහාර්‍ය්‍යය වුව ද, බුද්ධ චරිතය හා බුද්ධ ශ්‍රීය සඳහා ද සැලකිය යුතු පද්‍ය සඞ්ඛ්‍යාවක් මෙහි ගෙවුණේ ය.

## කාව්‍ය දීපනිය

කර්තෘ :— දික්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ඛිත හිමියෝ
කාලය :— ක්‍රි: ව: 1778
ප්‍රමාණය:— පද්‍ය 973

**කථා සාරය** බරණැස බ්‍රහමදත්ත රජු මාංශ - ලොලයෙකි. හේ මස් නැතිව කිසි දිනක මෙහෙ නො නිමවයි. දිනක මස් නොලත් අරක්කැමි ගිනි වැටක් සේ කිපෙන රජහට නිරාමිස භොජනය එළවීමට බිය වූයේ අමු සොහොනින් ලත් අලුත් මිනී මසක් පිස එළවී ය. රජ්ජුරුවෝ මිනීමස් වලඳා එ රසයෙහි ඉතා ප්‍රිය ව දිනපතා එ මස් ම සපයන සේ අණ කළහ. අරක්කැම් තෙමේ දිනකට මිනිසකු බැගින් මරා පිසා දෙයි. කල් යැමකින් මෙ පුවත් දත් ඇමැත්තෝ, රජු රටින් නෙරපූහ. 'පොරිසාද (පුරිස+අද= මිනිසුන් කන) තෙමේ වනයෙහි සැඟ වී සිට මිනිසුන් මරා නො පිස ම බුදියි. පෝරිසාද නම් ඇසෙනු සමග ම ගම් දනවු වෙවුලයි. මෙසේ හෙතෙමේ දුටු දුටුවන් මරා කමින් වෙසේ. ඇතුන්, අසුන් ලූහු බඳවා වාලධියෙහි ගෙන අපුලා පියා තු තු කොට ලයි. මුලු දඹදිව පෝරිසාදයාට නො බන එකද මිනිසෙක් නැති.

දිනක් එක් සාත්තු නායකයෙක් ගැල් පන්සියයක් ගෙන පෝරිසාදයා වසන වන මැදට පැමිණියේ ය. නිමෙෂයෙක්හි "මම පෝරිසාදයෙමි" යන හඬක් දෙරැ ගසා ලූ දහසක් හෙණ මෙන් රැව් දුන්නේය. කඩුගත් රැකවල්හු මුහුණින් හී ගියහ. පෝරිසාද තෙමේ සාත්තු නායකයා දෙපයෙහි ගෙන දිවන්නට පටන් ගත. සිහි ලත් රැකවල්හු ඔහු ලුහුබඳවා ගත්හ. වේග යෙන් දුවන පෝරිසාදයාගේ පයෙහි හුලක් ඇනිණ. හේ මිනිසා දමා රුක් මුලකට වන්නේ— "රුක්දෙවිය! ඉදින් මා පයැ වණය සුව කෙලෙහි නම් දඹදිව සියක් රජුන්ගේ ගල

ලෙහෙයෙන්' බිලි දී ඔවුන්ගේ අනුග්‍රහයෙන් රැක්කද සරසවාලමි" යි රුක් දෙවියාට ඇප විය. දින කිහිපයකින් වණය වියළී සුව විණ. පෝරිසාද තෙමේ දඹදිව නව අනූවක් නුවර නව අනූවක් රජුන් අල්ලා බිලිය පිදීමට සැරසුණේ ය. පැමිණි විපතින් අසරණ රජුන් සමූහය මිදියැටි රුක්දෙවියා "සුතසෝමයන් හැර කරන බිලිය නො පිළිගනිමි" යි කියා අතුරුදහන් වි ය.

මෙ කල්හි බෝසත්හු කුරුරට ඉඳිපත් නුවර සුතසෝම නම් රජ වැ දැහැමෙන් රජ කෙරෙති. දිනක එක් බමුණෙක් සතාරහ (සත+අරහ=සියක් වටනා) නම් ගාථා ධර්මයක් ඉගෙන රජුට බණ කියැටි ව පැමිණියේය. රජ්ජුරුවෝ නහා පැමිණ බණ අසන බව දන්වා අලුයම මඟුල් පොකුණට ගියහ. මෙ කෙණෙහි පෝරිසාදයා හඬ නගා අවුත්, රජු අල්ලාගෙන දිවත්නට වන. අතරමඟ දී රජ්ජුරුවෝ තොරතුරු දන්වා දෙවැනි දිනයෙහි එනසේ පිළින කොට පෝරිසාදයාගෙන් මිදී නුවරට ආහ. බණ අසා බමුණාට සත්කාර කොට දෙවැනි දින රජ තෙමේ සත්‍යය රක්නේ ජීවිතාශාව පියා පෝරිසාදයා වෙත ගියේය. එහෙත් බිලිය නො පිදිණ. සුතසෝම රජ්ජුරුවෝ බණ කියා පෝරිසාදයා දමනය කොට ඔහු අයත් රාජ්‍යයෙහි පිහිටුවා ලූහ.

'කාව්‍ය දීපනි' යෙහි කථා ශරීරය වූයේ ජාතකට්ඨකථාවේ අසීති නිපාතයේ එන මේ සුතසෝම වස්තුව යි. දික්වැල්ලේ යන ග්‍රාම නාමයෙන් ප්‍රසිද්ධ ව විසූ බුද්ධරක්‍ෂිත නම් තෙර කෙනෙක් මෙහි කර්තෘ වූහ. සිරිනාමලුවේ ධම්මජෝති හිමියන් ඇසුරුකොට ශබ්ද ශාස්ත්‍ර උගත්තවුන් අතර මූන් වහන් සේ ද කෙනෙකි. ගත් කතුවරයෝ තමන් ගැන කාව්‍යදීපනියෙහි මෙසේ සඳහන් කෙරෙති.

'දි ය නා සසුන රනගිර කෙළි හෙළ හ ස ය
ර ක්‍ෂි නා බඹ සරත් පිරිසිදු ගුණ රැ ස ය
සි රි නා මලුවෙ තෙරිඳුන් අබතුරෙ වැ ස ය
ඉ ගෙ නා සකු මගද කව්සද සුබ ලෙස ය'

'සු ග ත් සසුන් වැද බණිගෙන නිදෙස් ව න
ර ක්‍ෂි ත් සියැස මෙත් සංවරය සිවු ව න
දි ය ත් පසිඳු කුලඹර පුත් නරිඳු ව න
වි ය ත් සිරි බුද්ද රක්‍ෂිත තෙරිඳු ව න'

ගාල්ලේ අභයවීර ශ්‍රී වර්ධන මුදලිතුමන්ගේ ආරාධනය ග්‍රන්ථකරණයෙහි නිමිති විය. මිය ගිය සිය බිරින්දට පින් පැමිණ වීම එහි අදහස ය. ශ්‍රී වර්ධන මුදලි තුමා ඕලන්ද ආණ්ඩුවෙන් තුප්පහි —අතපත්තු— මුකවෙටි— විදාන යන ස්ථානාන්තර ලත් කෙනෙකි. ගත් කතුවරයන්ගේ ඉතා හිතවතෙකි. ආරම්භයෙහි පද්‍ය පන්සාළිසකින් කුල පවත් පැවසීමෙන් එතුමන් උත්කර්ෂයෙන් වැනූයේ එහෙයිනි.

කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍යොදයෙන් එක්තිස් වැන්නෙහි මේ රචනාව කරන ලද්දේය. හැම කවක ම අන්තය ද්වයක්‍ෂර එළියෙන් නිම කිරීම බුද්ධරක්‍ෂිත හිමියනට අභිමත වූයේ 'කව් මිණි කොඬල' දුටීමෙනි. මේ නිසා ද්වයක්‍ෂර එළියෙන් රචිත නවන් කාව්‍යයක් අටළොස්වැනි ශතවර්‍ෂයෙහි ම සිංහල සාහිත්‍ය වංශයෙහි ප්‍රවේශය ලද්දේ ය. දුෂ්කර බන්ධන කිරීම මෙකල විසූ ප්‍රසිද්ධ කවීන්ගේ සිරිතක් වූයෙන් 'කාව්‍ය දීපනිය' ද එබඳු බන්ධනවලින් තොර නො වීය.

බුද්ධරක්‍ෂිත හිමියන්ගේ මේ රචනාව 'මිණිකොඬල'ට වඩා පද්‍ය දෙ-සිය නවසාළිසකින් විශාල යැ. එහෙත් කාව්‍ය දීපනිය 'මිණිකොඬල' තරම් ව්‍යක්ත රචනයෙක් නො වේ. මෙහි පද්‍ය එතරම් පැහැදිලි නැති. අපෙක්‍ෂිතාර්ථය ගෙන දීමෙහි කවියාගේ වචන ව්‍යක්ත නො වීම එයට හේතු යැ. මෙහි එන ඇතැම් වර්ණනාවන් ද ක්‍රමානුකූලව පිළියෙළවී නැත. සුතසෝම කුමරු තක්සලාවට ගිය මග වැනූ සැටි එබඳු තැනකි. එහිදී කවියා මාගී වර්ණනාව වෙනුවට වනයක්ම වැනී. එක ම වර්ණනාව සිහිප තැනක ම ආයේ ය. මේ ග්‍රන්ථයෙහි එන විශාල වන වර්ණනාත්‍රය ම එබඳු යැ.

මේ මෙසේ වුව ද 'කාව්‍ය දීපනිය' පිළිවතුන් නොපින වන රචනයක් නො වේ. එහෙයින් මෙ තරම් විශාල වස්තුවක් කවි කිරීමට ගත් උත්සාහය සඵලවීම සාහිත්‍ය කාමීනට ලැබුණු ලාභයකි. මේ විශාල වස්තුව කවි කිරීමේදී කියවන්නා ආයාශ නො වන පරිදි වරින්වර වෘත්ත අමුතු කරන ලද්දේ ය. අර්ධසම— මහා යමක—සාමුද්‍ර—පක්‍ෂපත්‍ර—මුරජ—සර්වතොභද්‍ර — සන්ද්‍රෂ්ට කාදීහු මෙහි එන බන්ධන විශෙෂයෝ ය. කවියා මේ බන්ධනයන්ට වස්තු කොට ගත්තේ සුතසෝම කුමරු පෝරිසාදයා සමීපයට ගිය අවස්ථාවේදී හමු වූ වනයත්, පෝරිසාදයා බෝසතුන් සමග පෙරළා ඒ මේදි හමු වූ වනයත් ය. උදගම තරඩගයෙහි වැටෙන මේ කව ද, තත්කාලීන විශාල පද්‍ය ග්‍රන්ථයන් හා සම තැන් ගනී.

## නව නාමාවලිය

කර්තෘ:— තල්ගහගොඩ රතනජොති හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1778
ප්‍රමාණය.— පද්‍ය 300 (වගී 15)

**සිංහල කොෂ ග්‍රන්ථ** කොෂ ඥනය වූකලි භාෂා විෂයෙහි වෛශාරද්‍යය සඳහා අතිශයොපයොගී කරුණකි. ශ්‍රෙෂ්ඨ සාහිත්‍යයක් ඇති භාෂාවන්හි කොෂ ග්‍රන්ථ දක්නට ලැබෙන්නේ, පැරණි පඬිවරුන් එ බව සැලකූ හෙයිනි. ලක්දිව ප්‍රථමවරට සම්පාදිත වූ කොෂ ග්‍රන්ථය පාලි භාෂාවෙන් ලියන ලද්දකි. එය වනාහි පොළොන්නරු පුර දූපාරාමයෙහි වැඩ විසූ මොග්ගල්ලාන මාහිමියන් විසින් ලියූ **අභිධානප්පදීපිකාව** යි. සිංහල සාහිත්‍ය

යෙහි දක්නට ලැබෙන ඉපැරණි කෝෂ ග්‍රන්ථය නම් **පියුම්මල් නිඝණ්ඩුව** යි. ඒ වූකලි නම් වට්ටෝරුවක් වශයෙන් පිළියෙල කරන ලද්දකි. එය කවර කලක විසූ කවරකු විසින් රචිත ද? යනු මේතාක් අවිනිශ්චිත යැ. කෝට්ටේ සිරි පැරකුම්බා රජු මේ නාම මාලාව පද්‍යයට නගා **රුවන් මල් නිඝණ්ඩු** ව තැනී ය. එ රජුගේ බෑණනුවත් වූ නන්නූර්තුන්මිණිඅන්නස් ඇමැතිතුමා ද නාමාවලියක් කෙළේය. **පුරාණ නාමාවලිය** නමින් හැඳින් වෙන එය 'රුවන් මල් නිඝණ්ඩුව'ට වඩා එම් කිහිපයකින් පැරණි ය.

**වනවාස නිඝණ්ඩු** ව හා **සිරිමල් නිඝණ්ඩුව** ත් කවියෙන් තැනූ තවත් කුඩා කොෂ දෙකකි. වෛද්‍ය කෝෂ වශයෙන් පෙනෙන මේ දෙකෙහි කර්තෘ වූවෝ සිප්ප්‍රකූලමේ දීපඞ්කර තෙර කෙනකුත් හා විල්ගම්මුල තෙර කෙනෙකි. රචනා විලාශය අනුව මේ කොෂ කාව්‍ය දෙක කෝට්ටේ යුගයෙන් පසු ලියැවී තිබෙනබව සැලකිය හැකි වුවත් කවර වර්ෂයන්හි රචිත ද යන්න නිශ්චය කිරීමට තරම් සාධක නො පෙනේ.

මීට පසු දක්නට ලැබෙන කොෂ ග්‍රන්ථය අටලොස්වැනි ශත වර්ෂයේ අවසාන භාගයට අයත් වූවකි. එය වනාහි ක්‍රි: ව: 1778 දී තල්ගහගොඩ රතනජෝති නම් යතිවරයකු විසින් කරන ලද නවනාමාවලි යයි.

'නවනාමාවලිය' ගෙතූ රතනජෝති යතිතුමා එතරම් ප්‍රකට වූවෙක් නො වේ. ග්‍රන්ථාන්තර පරීක්‍ෂණයෙන් උන්වහන් සේ ගැන ප්‍රවෘත්ති මාත්‍රයක් සිතා ගැනීමට අවකාශ ලැබීම භාග්‍යයකි. 'තල්ගහගොඩ යති' නාමය මහනුවර සාහිත්‍ය වංශයෙහි තුන් තැනක සඳහන් වී ඇත. i තිස්සව විහාරයේ වීරගොඩ හිමියන්ගේ * ශිෂ්‍යයෙක් තල්ගහගොඩ නම් විය. ii බුඹගද්‍යය සවරූපකොට ගත් **වීතරාගෙන්‍ද්‍ර ගද්‍යය** ලියූයේ තල්ගහගොඩ යතිවරයකු විසිනි. iii නව නාමාවලිය කෙළේ ද තල්ගහගොඩ නමින් ප්‍රසිද්ධ යතිවරයෙකි.

'වීතරාගෙන්‍ද්‍ර ගද්‍යය' හා 'නවනාමාවලිය' කෙළේ තල්ගහ ගොඩ රතනජොති යතිවරයන් බව ඒ පොත්හි ම සඳහන් ව ඇත. සමකාලික ව දක්නට ලැබෙන මේ සඳහන්වීම් අනුව මේ තුන්පළැ ම සඳහන් වන්නේ එක ම තැනැත්තකු කොට සැලකිය නොහැකි නො වේ.

'නව නාමාවලිය' වූකලි 'පුරාණ නාමාවලිය' ගුරු පොත වශයෙන් තබා සපයන ලද්දකි. එහෙයින් පුරාණ නාමාවලියට වඩා ඒ ඒ නාමයන් පිළිබඳ පර්යාය වචන සඞ්ග්‍රහ කිරීමට ගත්කරු සමත් වූයේ ය. මෙහි ප්‍රමාණය පද්‍ය තුන්සියයකි.

---

* වීරගොඩ හිමි ඉලිපැන්ගමුවේ තෙරුන්නුවන්ගේ ශිෂ්‍යවරයෙකි. ඉලිපැන්ගමුවේ හිමියෝ සඟරජ හිමියන් ආචාර්යකොට ඇත්තෝ ය.

ඉන් අටසිය අටසැටක් පමණ නාමයන්ගේ පයඨාය වචන ප්‍රකාශ වී ඇත. ඒ නාම වර්ග වශයෙන් පසළොසකට බෙදා දක්වන ලද්දේ ය.

මහනුවර සාහිත්‍ය වංශයෙහි විශිෂ්ට යුගය කීර්ති ශ්‍රී රාජසිංහ රජුන් සමයට හිමි වන්නේ, මෙ බඳු නොයෙක් විෂයීය ග්‍රන්ථයන් සම්පාදනය වූ හෙයිනි.

## සිංහල උම්මග්ගජාතකය

කතෘ :— කුණුමුලේ ධම්මානන්ද හිමියෝ
කාලය :— ක්‍රි: ව: 1770—78 අතර
ප්‍රමාණය :— මුද්‍රිත පිටු 19

ජාතකට්ඨ කථාවේ පනස්වැනි නිපාතයේ එන උම්මග්ගජාතකය පුවත සිංහල ජාතක පොතෙහි නො පැනෙන ජාතක කිහිපය අතර එකකි. සිංහල ජාතක පොතේ මේ ඌනතාව දුටු කුණු මුලේ ධම්මානන්ද නම් තෙර කෙනෙක් උම්මග්ගජාතකයේ සිංහලානුවාදය ලියා තැබූහ. මේ අනුවාදකයෝ වැලිවිට සරණංකර ධර්මරක්ෂිත මහානායක හිමියන්ගේ ශිෂ්‍ය වරයෙකි. සචකිය යුගයෙහි ගරු කොට සලකන ලද කම් වාක්‍ය කීම, පාමොක් දෙසීම, යුග සූත්‍ර අනුශාසනාදිය කීම, හා ධර්ම දේශනා ව ද යන මෙහි ඉතා දක්ෂයකු වූයෙන් ධම්මානන්ද හිමියෝ මහත් ප්‍රසිද්ධියක් ලැබූහ. ගම්මුල්ලේ රතනපාල, සීතාවකුඹුරේ සුමඞ්ගල යන ප්‍රසිද්ධ හත් කතුවරයන් වහන්සේ හා මෙතුමෝ ද සමවයස් ඇත්තෝ ය.

උම්මග්ගජාතක සිංහලානුවාදය කවර වර්ෂයකට අයත්දැයි ග්‍රන්ථයෙන් නිශ්චය කරගත නො හැකි. එ නමුත් සඟරජ හිමියන්ගේ අපවත් වීමෙන් පෙර මේ අනුවාදය සැපයූ බව ග්‍රන්ථාන්තරයෙන් පෙනේ. සම කාලීන වියතුන් කිහිප පලක විසින් මෙබඳු අනුවාද කිහිපයක් සපයන ලද්දේ ක්‍රි: ව: 1770–78 අතර බව පෙනෙන හෙයින් මේ අනුවාදයද එහි ලා සලකනු යෙදේ. සෙසු අනුවාද ග්‍රන්ථයනට වඩා ධම්මානන්ද හිමියන්ගේ මේ අනුවාදයෙහි විශෙෂයෙක් පැනේ. යෙදිය හැකි හැමතැනකදී ම අනුප්‍රාස ඝටනය ධම්මානන්ද හිමියන්ට බෙහෙවින් අභිමත වූයේ ය.

i "දියපත් නොවන බිය පත් මුවකු සේ"

ii "වැඩුවන් අඩු වූ හෙයින් පඬුවන් වූ"

iii "එ පවත් අපවත් නො කොට"

iv "දෙඩුම් සහිත ඇඬුම් හා"

v "නිධානයක් පිධානයක් හැර දක්වන ප්‍රධානයක්නු මෙන්"

vi "ආයර්‍ය ගුණයෙහි වීයර්‍ය ඇති සූයර්‍ය වූ ආයර්‍යයන් වහන්සේ"

vii "ඉඳුරා කිඳුරා ගේ සිත් ගත්තා අනත්‍රාඞ්ගනාවක් පරද වන කින්නරාඞ්ගනාවක්"

viii "එකල්හි ද නෙකල් අරුත් විකල් නොවී විමල් ව දුනී මෙන් අතුල්‍ය වූ"

ix "එවිට පුරා එ නරවරා විසිතුදුරා නො හැර පුරා මෙනෙහිතිරා දරින්දරා සුරාසි එ රජ දහම්වරා දරින්දරා විසු නරාධිපති තෙම"

ග්‍රන්ථයෙහි පිටක් පාසා යෙදුණු භාෂා ස්වරූපය මේ නිදර්ශන පාඨයන් අනුව සිතා ගත හැක්ක. ශබ්ද රසය ඉපද වීමෙහි ධම්මානන්ද හිමියන් දැරූ අමොඝ උත්සාහය නිසා උම්මදන්ති ජාතකය කියවීමෙහි ප්‍රිය ගද්‍යයන් අතර එකක් වූයේ ය. අනුප්‍රාසයෙන් මේ ගද්‍යය පරදිතොත් කුරුණෑගල සමයෙහි ලියැවුණු දළදා සිරිතට පමණි.

අනුවාදයෙහිදී බොහෝ තැන්හි පාලි වාක්‍යයන් හැකි තාක් විස්තරයෙන් හෙළිවට නැගීම ධම්මානන්ද හිමියන් සිරිතක් කොට ගන්නා ලද බව පෙනේ. එද අනුප්‍රාසයට ඉඩදෙනු සඳහා යැ.

i "තෙ තං දිස්වා සතිං පච්චුපට්ඨපෙතුං අසක්කොන්තා කිලෙස මද මත්තා භුත්වා අත්තනො විප්පකත භොජන භාවං න ජානිංසු = ඒ බ්‍රාහ්මණයෝ කුමාරිකාව දැක සිහි එළවා ගත නොහී ඒ කුමාරිකාවගේ ලක්ෂණ නමැති සුරාව තමන්ගේ ලොචන නැමති මුඛයෙන් තෘෂ්ණා නමැති පිපාසය නොසන් සිඳෙන තෙක් පානය කොට කෙලෙස් නමැති මදයෙන් මත් ව තමන් බත් අනුභව කොට නො නිමි බව නො දත්තාහු"

ii "අථ සූරියෙ අත්ථඞ්ගතෙ උග්ගතෙ පුණ්ණචන්දෙ = ඉක්බිති පුණ්ඩරීක වන ෂණ්ඩ මණ්ඩණ මාර්තණ්ඩ මණ්ඩලය අවර පත් කල්හි හෙවත් හිරු හසෙනාප ගත කල්හි අමන්ද කුන්ද නන්ද සම්පූර්ණ වූ චන්ද්‍ර මණ්ඩලය උදගත විය."

iii "උස්සව දිවසෙ = පොරණ සිට පුන් ලෙසට අන් නො හැර සිත් ලෙසට පැවැත් මෙන් එන උත්සව දවසෙක් හි"

මේ මෙසේ වුව ද පෙර ජාතකයන්හි විස්තරයෙන් ආ දේ මෙහි හකුළුවා දක්වන ලද්දේ ද වේ. එ බඳු වූ සමහර තැන් ඒ ජාතකයන් බලා දත යුතු බව ද කියන ලද්දේ ය.

විෂමව ගිය පරිවර්තන ස්ථානයෝ ද මෙහි බොහෝ ය. අනුප්‍රාසය නිසා නිරර්ථක වූ ද ශබ්ද ලක්ෂණයෙන් හීන වූ ද පදරාශියකුත් මෙහි දක්නා ලැබේ. එසේ වුවත් සිංහල

ජාතක පොතෙහි නො මැත්තක් වීම, ශබ්දාලඞ්කාරය උස් තැනක් ගැනීම, යන කරුණු නිසා කණුමුලේ හිමියන්ගේ මේ අනුවාදය මහනුවර සාහිත්‍ය වංශයෙහි කියවීමෙහි ප්‍රිය ග්‍රන්ථයක් කොට සලකනු යෙදේ.

## සඞ්ඝරාජ සාධුචරියාව

කතෘ:— ආසිත්තා ලියද්දේ මුහන්දිරම
කාලය:— ක්‍රි: ව: 1779
ප්‍රමාණය:— මුද්‍රිත පිටු 43

අටළොස්වැනි ශතවර්ෂයේ ලඞ්කාව ශොභාමත් කළ වීර වරයාණන් වූ වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර මාහිමියන් වහන්සේ ගුණ සභාවයෙන් පුදනු කැමැති තත් කාලීන විද්වතුන් කිහිපදෙනෙක් ඔබගේ සාධුචරිතය ලියා තැබීමෙහි උත්සුක වූහ. එහෙයින් 'සඞ්ඝරාජ සාධුචරියාව,' 'සඟරජවත,' 'ආදහන වත', වැනි චරිත කථා සවරූප ග්‍රන්ථ කෙනෙක් මහනුවර සාහිත්‍යවංශ කථාවට එකතු වූහ. ආසිත්තාලියද්දේ මුහන්දිරම් රාළගේ 'සඞ්ඝරාජ සාධුචරියාව' මේ කෘතීන් අතර උස් තැනක් ගන්නා ග්‍රන්ථයකි. "...... බොධිසත්ත්වාවතාර ගුණ විශෙෂ මහිම ඇති සඞ්ඝරාජ ධුරන්ධර සද්‍රණ්‍යාභිරත උපෙෘෂථාරාමවාසී සරණඞ්කරාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන්ගේ උත්පත්තිය සහිත ප්‍රව්‍රජ්‍යාභාවාදි කථන ප්‍රකාරයෙන් ශිෂ්‍ය ගණාභිවෘඩි වර්ධනයෙන් ශාසනාභිවෘඩියෙහි නියුක්ත ක්‍රම ප්‍රකාශ කිරීම් වශයෙන් සාධුජන මනොනන්දනීය වූ සඞ්ඝරාජ සාධු චරියාව නම් කථා ප්‍රබන්ධයක් ශ්‍රී ශුඞ ශකරාජ වර්ෂයෙන් එක්වා දහස් සත්සිය එක්වන්නෙහිදී ප්‍රකාශකොට ලියනු ලැබේ."

ගත්කරුවන් ලියූ මේ ආමුඛ පාඨය සඞ්ඝරාජ සාධුචරියාව හඳුනා ගැනීමෙහි හා රචිත වර්ෂය නිශ්චය කර ගැනීමෙහි ද උපකාර වත් ය. ඒ අනුව මේ කෘතිය කරන ලද්දේ ක්‍රි: ව: 1779 දී ය. මේ නම් සඟරජ හිමියන්ගේ අපවත් වීමෙන් දෙවැනි වර්ෂය යි.

සඞ්ඝරාජ සාධුචරියාවේ කතුවරයන් හැඳින ගැනීමට ග්‍රන්ථයෙන් ලැබෙන කිසි දු පිහිටෙක් නැති. ඊරිමිත්තේ විපස්සි හිමියන් ලියූ ආදහනවතෙහි සඞ්ඝරාජ සාධුචරියා කරු ආසිත්තාලියද්දේ මුහන්දිරම බව සඳහන් නො කරන ලද නම් මෙහි කතුවරයා සදහට ම අවිඥාතව පවතිනවා ඇත. ආසිත්තා ලියද්දේ මුහන්දිරම කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අමාත්‍ය වරයෙකි. මෙතෙමේ අවසාන වර සියම් දූත මෙහෙවරෙහි යෙදුණු රදලවරුන් පස්දෙනා * අතර ද කෙනෙකි. වෙඩික්කාර ලේකමේ දුම්බර වසම කර වූයෙන් ආසිත්තා ලියද්දේ මුහන්දිරම යන ධුර නාමයෙන් එතුමා හඳුන්වනු ලැබී. ඒ විනා එතුමන්ගේ පෞද්ගලික නාමය අප්‍රකට යැ.

---

* i පට්ටිපොල මොහොට්ටාල. ii ඇල්ලේපොල මොහොට්ටාල .iii ඊරිය ගම රාල. iv විල්බාගෙදර රාල. v ආසිත්තා ලියද්දේ රාල.

ආශිත්තා ලියද්දේ ප්‍රව්‍රජ්‍යාවෙහි පටන් අවසානය දක්වා වැලිවිට මාහිමියන්ගේ ජීවන චරිතය පිළිබඳ තොරතුරු මැනවින් දත් කෙනෙකි. සඞ්ඝරාජ චරිතය පිළිබඳ නිරවද්‍ය වූ පැහැදිලි ප්‍රවෘත්ති සමූහයක් පහසුවෙන් සවකීය නිබන්ධයේ සඞ්ග්‍රහ කර තැබීමෙහි එතුමා සමත් වූයේ එහෙයිනි. කෝට්ටේ සමයෙන් පසු අවුරුදු දෙසියයක් පමණ කාලයතුළ අනුක්‍රම යෙන් හායන පක්‍ෂයෙහි ගමන් ගත් ලඞ්කා බුද්ධ ශාසනය පුනරුත්ථාපනය කරලීම සඳහා සරණඞ්කර මාහිමියන් වහන්සේ ගත් අපරිමිත පරිශ්‍රමයෙහි ප්‍රතිඵල දැනගැනීමට මේ ග්‍රන්ථයෙන් ලැබෙන පිහිට අපමණි. උන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පර පුර පිළිබඳ මෙසා පැහැදිලි විස්තරයක් දැක්වූ ග්‍රන්ථයක් දුර්ලභ යැ. එ පමණක් නො වැ අර්ධශතවර්ෂයක් තරම් කාල පරිච්ඡේදය ගැන මේ ග්‍රන්ථයෙහි සඞ්ග්‍රහ වී තිබෙන සාරපූර්ණ ඉතිහාසය දෙස බලන විට මහාවංශය මෙන් මෙ ද ශ්‍රීී ප්‍රණාමයට සුදුසු යැ.

ග්‍රන්ථ කරණයේදී වාක්‍ය දෝෂයන් ගැන ගත්කරුවන් තුළ කිසි දු අපේක්‍ෂාවක් නො තිබූ බව පෙනේ. ඒ වූකලි මෙකලට අයත් මේ සඞ්ඛ්‍යාවේ ගත්කරුවන් * බොහෝ දෙනකුගේ රචනා සවභාවය විය. ග්‍රන්ථයෙහි ඇතුළත් වන අර්ථ ජාතය සම්බන්ධයෙන් මිස වාක්‍යාදදීපනිය පිළිබඳ ඔවුන්තුළ උත්සා හිත බවෙක් නො වී ය. එසේ කිරීමේ ශක්තියක් ද ඔවුනට තිබුණේ නො වේ. එද කථා ව්‍යවහාරයෙහි පැවැති භාෂාවෙන් මෙබඳු රචනා කරන ලද්දේ එහෙයිනි.

"අලගල්ලෙ කන්දෙ අඹගස † මුල ගල්ලෙනෙහි පැංචකු සමග අප්‍රසිද්ධ ලෙසින් පොරොත්තුව සිට ගෙන ඒ ප්‍රස්ථාවට පිණ්ඩපාත කිරීම නැතත් පාත්‍රයෙන් ම වළඳන නිසා තමන් වහන්සේට යැපෙන පමණට එ ගම් වැසි සැදැහැතියන් විසින් පාත්‍රයෙන් ගෙනවුත් දෙන භොජනය ලඟ සිටින පැංචාට මදින් මදවත් දෙවේලටමත් දෙමින් ඇතැම්විට අමුතු පැමිණි සිල්වත් නමකටත් එයින් ම දෙමින් සමහරවිට අවශිෂ්ට දිය වත්කොට තළුතැටියෙන් කැඳ වශයෙන් වළඳා මෙසේ ජීවත් වෙමින්"

මේ පාඨය සඞ්ඝරාජ සාධුචරියාවේ භාෂා තත්ත්වය මෙන් ම තත් කාලීන සාමාන්‍ය වාක් ව්‍යවහාරය පිළිබඳ අවබොධයක් ඇතිකර ගැනීමටද උපකාරී වේ.

---

* විල්බාගෙදර රාල ද මෙ වැන්නෙකි.

† මෙතෙක් කල් පැවැති මේ විශාල අඹගස අදට දෙතුන් මසකට උඩදී (1944, ජූනි) ගම්මුන් විසින් කපන ලදී.

## සුළු පූජාවලිය

කර්තෘ:— අවිනිශ්චිතයි.
කාලය:— ක්‍රි: ව: 1773 — 80 අතර
ප්‍රමාණය:— මුද්‍රිත පිටු 30.

'සුළු පූජාවලිය' ද 'සිංහල දළද වංසය, 'ස්‍යාමොපසම්පද වත' වැනි සඞ්ග්‍රහයන් අතර වැටෙන තවත් කුඩා ගද්‍යයකි. දඹදෙණි යුගයේ වැඩ විසූ මයූරපාද පිරිවෙන් හිමියන්ගේ 'පූජාවලී' නම් ශ්‍රේෂ්ඨ ධර්ම ශාස්ත්‍රීය සඞ්ග්‍රහයේ අවසානයෙහි එන 'උද්දේශික පූජාකථා' නම් සූතිස්වැනි පරිච්ඡේදයට සැපයූ පරිශිෂ්ටයක් වශයෙන් 'සුළුපූජාවලිය' ලියන ලද්දේ ය. බෝසත් විජයබා රජු පටන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වා එකුන්තිසක් පමණ රජුන් කරවූ උද්දේශික පූජාවන් සංක්ෂිප්ත කොට මෙහි දක්වා ඇත. එය මහාවංශයෙන් උපුටා ගනු ලැබී. අවසන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු දන්තධාතූන් වහන්සේ අරභයා කරවූ පුද පූජාදිය විශෙෂයෙන් සඞ්ග්‍රහ වී තිබේ. ඒ වනාහි 'ස්‍යාමොප සම්පදවතෙහි' එන පරිද්දෙන් ම දක්වා ඇත.

## සඟරජ වත

කර්තෘ:— මුංකොටුවේ අබේසිංහ රාල
කාලය:— ක්‍රි: ව: 1778 - 80 අතර
ප්‍රමාණය:— පද්‍ය 290

'සඟරජවත' සරණඞ්කර මාහිමියන් වහන්සේගේ චරිතාපදානය වනමින් ලියූ කාව්‍ය ග්‍රන්ථයකි. මෙහි රචනා කාලය නො දැක්වෙතත්, සඟරජ හිමියන් අපවත් වීම සමග ම කරන ලද ග්‍රන්ථයක් බව සිතා ගත හැකි.

'සදම් සිඳුතුළ වැ ද
තෙර දුටු ගැඹුරු විනි වි ද
මොරතොට දහම් ක ඳ
තෙවෙනි නායක තෙරිඳු මනන ද'

'සඟරජ ගුණ නොම ද
වනන ලෙස තුති පද බැ ද
කල අයජමිනි සො ඳ
මනැණ පමණට කියමි මද ව ද'

මේ මෙහි ග්‍රන්ථ කරණයෙහි නිමිත්ත කියා ලූ සැටි යැ. ඉන් මේ 'සඟරජවත' ලිවීමට ආරාධනා කෙළේ, මොරතොට ධම්මක්ඛන්ධ තෙවැනි නායක හිමියන් බව පැහැදිලි ය. එහෙත් ගත්කරු කවරෙක් ද යනු සිතා ගැනීමට ඉන් ලැබෙන පිහිටෙක් නැති.

'සඟරජවත' ලියන ලද්දේ මුංකොටුවේ අබේසිංහ රාල විසින් බව මුඛ පාරම්පරික කථා යැ. මුංකොටුවේ රාල සඟ රජ හිමියන්ගේ ශිෂ්‍යයකු වීමත්, ඔහු විසින් මීට සතළොස් වසකට පසුව ලියන 'මොරතොටවත' ට සමාන පද්‍යාංශයන්

ඇතිවීමත්, මේ පරම්පරා ශ්‍රැතිය සද්භූතවීමට ඇති හෙතු සාධකයෝ ය. මේ සාධක බිඳ නො වැටෙන තෙක් 'සඟරජ වත' කතුවරයත් මුංකොටුවේ රාල වශයෙන් සැලකීම අනුචිත නො වේ.

සඟරජවතෙහි විස්තර වන්නේ සරණංකර මාහිමියන්ගේ අපදානයෙහි ප්‍රසිද්ධ කරුණු කිහිපයකි. එම චරිත දර්ශනයෙහි අමුතු කරුණු හෝ සංඝරාජ සාධුචරියාවෙහි තරම් විස්තර හෝ සංග්‍රහ වී නැත. එ නමුත් දසඅටවැනි ශතවර්ෂයේ මුල් භාගයෙහි මෙරට පැවැති බුද්ධ ශාසනයෙහි සංවේගදායී පිරිහීම හා භික්ෂු තත්ත්වයත් පිළිබඳ විස්තරය ඓතිහාසික ගවේෂක යන්ගේ සිත් ගන්නා පරිද්දෙන් ලියවී තිබේ.

එ කා ලෙසින් බබුලුවා ලක්දිව බුදු සසුන් පිහිටුවා ලා
නෙකා ,බ සි න් අබිදුන ජනැස් දහම් බෝකර තබා ලා
ස කා ව සි න් එක් දහස් සත්සිය ඇසල පුණු පොහො යෙදිලා
ල කා මූ දූ න් මල්කඩසෙ උන් සඟරජු උකුත් වී වද ලා

මෙසේ එක්සිය අනූසතර වැනි පද්‍යයෙන් සඟරජ හිමියන්ගේ අපදානය නිම කළ කවියාගේ මුවින් මීළඟට නිකුත් වූයේ ශෝකාලාපයකි. පද්‍ය තෙළෙසකින් දක්වෙන ඒ ශෝකාලාපයෙහි සරණංකර මාහිමියන්ගේ ආදහන මංගලය දැකීමෙන් හටගත් කවියාගේ මහත් දුක සිත්තම් වී තිබේ. සඟරජ හිමිතුමන්ගේ ගුණ සිහිකර මේ ශෝකාලාපය කියවන කවරකුගේ වුව ද, නෙත් කඳුලින් පිරී යනවා ඇත.

මීළඟට දෙ අසූවක් පමණ පද්‍යයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු වර්ණිත යැ. මේ වර්ණනයෙන් රජු සතුටු කර වීංත් ග්‍රන්ථ කරණයෙහි එක් අදහසක් කොට කවියා ගත් බව පෙනේ. මුංකොටුවේ රාලට කීර්ති ශ්‍රී රාජසිංහ රජු කෙතරම් ප්‍රිය වී ද යනහොත් අනාගතයෙහි ඒ රජුටම ගැති වන ලෙස හේ පතයි.

සඟරජවත පද්‍ය මටසිලුටු ය. භාෂා තත්ත්වය එ තරම් උසස් නො වෙතත් කාටත් තේරුම් ගත හැකි සේ රචනාව සරල වී තිබේ. මේ රචනාව සඟරජ හිමියන්ගේ අපවත් වීම වූ ක්‍රි: ව: 1778 හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවසානය වූ ක්‍රි: ව: 1780 අතර වර්ෂයකට අයත් බව නිශ්චය කර ගත හැකි.

## අසදිස ද කව

කර්තෘ:— රාජාධි රාජසිංහ මහරජතුමා
කාලය:— ක්‍රි: ව: 1780 - 84 අතර
ප්‍රමාණය:— පද්‍ය 598

අටලොස්වැනි ශතවර්ෂයේ ඉතිහාස ග්‍රන්ථයන්හි අභිරුචි යෙන් සඳහන් ග්‍රන්ථ කිහිපය අතර අසදිසද කව ද එකකි. සිංහල සාහිත්‍ය වංශයෙහි අතලොස්සක් පමණ වූ රාජකීය කෘතීන් අතර මෙය ද එකක් වීම එයට හේතු යැ. ක්‍රි: ව:

1780 වැන්න පටන් 1797 දක්වා ලංකා රාජ්‍යානුශාසනා කළ රාජාධිරාජසිංහ මහිපාලයාණෝ අසදිසදා කාවෙහි කතුවරයෝ වූහ. මේ රජතුමා ශබ්ද ශාස්ත්‍ර විෂයෙහි විචක්ෂණයෙකි. විශේෂයෙන් කාව්‍ය ප්‍රියයෙකි. 18 වැනි ශතවර්ෂයේ ප්‍රසිද්ධ ප්‍රබන්ධ කරුවන් අතර ද කෙනෙකි. එතුමා ශබ්ද ශාස්ත්‍රය ප්‍රමුඛ කාව්‍ය ශාස්ත්‍රය උගත්තේ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් ඇසුරු කිරීමෙනි.

අසදිසදා කව රාජාධිරාජසිංහ රජුගේ සතළොස් වර්ෂය අතර කවර වර්ෂයකට අයත්දැයි එකවිට ම සිතා ගත නො හැකිය.

'මට ඉටු මිතුරු ව න 'මොක් සිරි ලබන මෙ න
නොයෙක් දහමට ගුරු ව න ගැඹුරු දහමක් එළිවෙ න
දම්කඳ නම් සොබ න කවිකර කියන මෙ න
යතිඳු සඳ සිත නො මඳ කුළුණෙ න්' කෙලෙන් ආරාදනා සතොසින'

යන දෙ කවෙන් දම්කඳ යතිඳුන්ගේ ආරාධනයෙන් කළ බවක් පැවසේ. මෙහි සඳහන් 'දම්කඳ යතිඳු' නම් මොරතොට ධම්මක්ඛන්ධ හිමියෝ ය. ඉදින් මේ ආරාධනය කරන ලද්දේ එ හිමියනට මහා නායක පදවිය ලැබීමෙන් පසුව නම් මෙහි සඳහන් වන්නේ 'දම්කඳ යතිඳු' යනුවෙන් නො වේ. ස්වකීය ගුරුවර වූත්, ඉෂ්ට මිත්‍ර වූත්, තෙරුන්ගේ සඞ්ඝ නෙතෘත්වය ගත්කරුවන් මහත් ආදරයෙන් සඳහන් කරනු නියත යැ. ආරාධනය ගරිෂ්ට වීම ගත්කරුවනට ද බුහුමනකි. මෙසේ ස්ථීථායෙන් එ බව සඳහන් කළ යුතු ව තිබියදී, එසේ සඳහන් නො කිරීමේ එක ම හේතුව මේ වනවිට ධම්මක්ඛන්ධ හිමියනට මල්වතු විහාරයේ මහානායක පදවිය නො ලැබී තිබීම යැයි සිතිය හැකි.

'ස ක වසින් එක්දහස් සත්සිය සයට පත් වූ මෙම ව සේ
ල ක උතුන් නිරිඳුගෙන් නායක ඉසුරු ලැබිලා තිසි ලෙ සේ'

යන 'මොරතොට වත' පද්‍යාංශයෙන් ධම්මක්ඛන්ධ හිමියන්ගේ ස්ථානාන්තර ප්‍රාප්තිය ක්‍රි: ව: 1784 වැන්නෙහි බව ප්‍රකාශිත යි. එ බැවින් අසදිසදා කව රචිත වර්ෂය රජුගේ රාජ්‍ය ප්‍රාප්ති වර්ෂය හා මොරතොට හිමියන්ගේ නායක පද ප්‍රාප්ති වර්ෂය වූ සිවු වසෙහි ලා සැලකිය හැක්ක.

**කථා සාරය**

බරණැස බ්‍රහ්මදත්ත රජහට අසදිසය, බ්‍රහ්මදත්තය, යි දෙ පුතු කෙනෙක් වූහ. දෙටු බෑ අසදිස කුමර අප බෝසතු යැ. ඔහු, පියරජු ඇවෑමෙන් තමහට පත් රාජ්‍යය කණිටු සොහොයුරු හට දින. මඳ කලකින් බෝසතුන් නො රුස්නා ඇමැතියෝ දෙ බෑයන් බිඳ වූහ. "ම සොහොයුරු යා නොදී අල්වව" යි රජ අණ දින. බෝසත් ධනුර්ධරයකු මෙන් පලා ගොස් ලක්ෂයක් වැටුප් ලබමින් පසල් රජකු සෙවය කෙළේය.

දිනෙක පිලික්ස ගිය අඹ කැනක් විදිමට බෝසත්නට පැවරිණ. බෝසත් ධනුශ්ශිල්පයෙහි පරතෙර පතුවන් පවා විස්මවමින් හී දෙකක් විද බස්නා හීයෙන් සිඳී වැටෙන අඹය එක් අතකින් හා හීය අනෙක් අතින් ද අල්ලා ගත්තේ ය. පොලොව ඉපිලී යන සේ අත් පොලසන් හඬ නැගිණ. රජනු ඇතුලු පුර වැසියෝ කඳු බැඳි වස්තුන්ගෙන් බෝසතුන් පිදූහ. මේ අතර අසදිස කුමරුන් නුවර නැති බව ඇසූ පසල් රජුන් සත් දෙනෙක් බරණැස වටලා ගත්තු. බියපත් බඹදත් රජ දූතයන් යවා අසදිස කුමරුන් ගෙන්වා ගත්තේ ය. බෝසත් තමන් නම ඇස් වූ පමණින් කැටක් ගෙන පලවන කපුටු රැසක් මෙන් සතුරන් පලවා මල්නට ඔවා දී තපොවනයට පිවිසියේ ය.

රාජාධිරාජසිංහ රජු ස්වකීය කෘතිය සඳහා ආශ්‍රය කරගත් වස්තුව මේ යැ. ගත්කරු සිංහල කාව්‍ය සම්ප්‍රදායයන් උල්ලඞ්ඝනය නො කොට පළමුව තෙරුවන් වැඳ ඉෂ්ට දෙවතානුස්මරණයෙහි යෙදී සෙංකඩගල පුර, දළදහිමි, පුෂ්පාරාම විහාරය හා මොරතොට හිමියන් වැනූයේ ය. යළි සම්බුද්ධයන් වහන්සේ පිළිබඳ නිදාන කථාවට බැස එක්සිය දෙසැටක් පද්‍යයෙන් දීපඞ්කර විවරණයේ සිට බුද්ධත්වය දක්වා බුද්ධචරිතය දැක්වී ය. දෙ සිය පනස්වැනි පද්‍යයෙන් කථා දෙරටුව හල කවියා තුන්සිය දෙසාළිසක් පද්‍යයෙන් අසදිසදාව විස්තර කෙළේ ය.

ග්‍රන්ථ මධ්‍යයෙහි දක්වෙන නගර — රාජ — වන ආදි වර්ණනා මෙතෙක් සිංහල කවීන් ආශ්‍රය කොට ගත් මාර්ගය අනුව ම ගිය සේ යි. ෂඩ්වර්ණ බුද්ධ රශ්මි වැණූ සැටි නම් ගුත්තිල කාව්‍යයේ අනුකරණයක් තරමට සමාන තාවක් දක්වයි. බෝසත් අසදිස කුමරු රාජ්‍යය හැර යද්දී දුටු දර්ශනය සඳහා කවියා වස්තු කොට ගත් වන — මාර්ග — ක්ෂෙත්‍රොද්‍යාන හා ගංගා බෙහෙවින් ස්වාභාවික කියුම් වලින් යුක්ත යි. සමහර වර්ණනාවක අලඞ්කාරය කියවන්නාගේ සිත් ඇදී යන සේ ගැබ් වී ඇත. බ්‍රහ්මදත්ත දේවිය වැනුම එබඳු තැනකි. එහි එන ස්තන වර්ණනය මෙසේ යි.

සිය ලගෙහි පැති රී
බුබුලෙව් යොවුන් ඉති රී
සිටින ලැම සපි රී
මගා සමනොව දෙතන එසි රී

තත් කාලීන බොහෝ කවි කෘතින්හි මෙන් මේ අසදිසදා කවෙහි ද පළමු කල වර්ණනය එලෙසින් ම දෙ වැනි වරටත් වැදූ ගත් තැන් දක්නට ලැබේ. සෙංකඩගල හා සැවැත් නුවර වැනුමෙහි එ වැනි පද්‍ය දක්නට ඇත.

භාෂා තත්ත්වය නො පිරිහෙලා එලිවැට සඳහා රීති විරොධ සේ යෙදුණු පද ඝටනාවලින් බොහෝ සේ ඈත්ව තිබීම, බන්ධනයේදී ප්‍රස්තුතයට බධා එලවන සේ අතුරු කථා නො ගැලපීම, තත් කාලීන බොහෝ කවීන් මහා සමන්ව කමක් කොට තැකූ දුෂ්කර බන්ධනයනට හා එලියට අවකාශ නො දීම, යන කරුණු නිසා අසදිසදෘකව අටළොස්වැනි ශතවර්ෂයේ ව්‍යක්ත කවියකුගේ මටසිලුටු පද්‍යයක් වශයෙන් සිංහල සාහිත්‍යවංශයෙහි පිවිස ගනී.

## සන්දේශ කාව්‍ය

'සන්දෙශ' යනු හස්න යැ. හස්නක් යවන සේ සැපයුණු කාව්‍ය විශෙෂයෙක් ද 'සන්දෙශ' නමින් ව්‍යවහෘත ය. ඒ මේ සන්දෙශ කාව්‍ය රචනයෙහි අනුගමනය කළ නීති සමූහයක් ද වෙයි. සන්දෙශ කාව්‍ය ලක්‍ෂණ නමින් ආ ඒ රීති ජාතය නම්—

i ප්‍රසිද්ධ පුරුෂයකු හෝ ස්ත්‍රියක කාව්‍ය නායක කිරීම.

ii ඉතිහාස කථාවක් හෝ ආශීර්වාදයක් පෙරටු කොට ගැනීම.

iii ආරොග්‍ය ප්‍රශ්නය පෙරටු කොට දූතයා වැනීම.

iv යා යුතු තැන කීම.

v දූත මාර්ගය විස්තර කිරීම.

vi නාගරික නායකාදිනට සතුති කිරීම.

vii වෘත්තාන්තය කීම.

viii දූතයාට ආශීර්වාද කිරීම යන මේ ය.

මේ කාව්‍ය ලක්‍ෂණයන් අනුව සාහිත්‍ය ලොකයෙහි පහළ වූ ප්‍රථම සන්දෙශය මහා කවි කාලිදාසයන්ගේ 'මෙඝදූත' ය යි. එහිලා කාලිදාසයෝ කථා වස්තුවක් නිර්මාණය කොට ගත්හ. තරුණ යක්‍ෂයෙක් කුවේරයාගේ නියමය පරිදි සවකීය ප්‍රියාව ගෙන් වෙන් වැ රාමගිරි ආශ්‍රමයෙහි විසී ය. වර්ෂා කාලය පැමිණීයෙන් යක්‍ෂ තෙමේ විරහයෙන් උමතු විය. සව ප්‍රියාවට හස්නක් යැවීමට හෝ අවකාශයක් නො තිබුණේන් හෙතෙමේ වඩාත් තැවුලියට පත් විය. මේ අතර දිනෙක ඔහුට වැසි වලාවෙක් පෙනිණ. යක්‍ෂ තෙමේ වලාව අමතා සවකීය ප්‍රියාව වෙත අස්නක් යැවී ය. මෙඝය දූතයකු කොට ගත් හෙයින් 'මෙඝදූත' නම් වූ එම සන්දෙශය සංස්කෘත සාහිත්‍ය වංශයෙහි චිරප්‍රසිද්ධ වූවකි. සිංහල සන්දෙශ නිර්මාණයට ඒ මේ 'මෙඝ දූතය' ගුරු පොත විය.

රාජ — දේවී — අමාත්‍යාදීනට ආරක්‍ෂාව සලසා සංග්‍රාම විජය, යසොවර්ධනය, ධන, පුත්‍ර, සවාමි ලාභාදිය අපෙක්‍ෂා කොට පක්‍ෂියකු දූත් මෙහෙවරෙහි යොදවා ප්‍රසිද්ධ දෙවියකු වෙත සන්දෙශයක් යැවීම, සන්දෙශ කරණයෙහි සිංහල කවීන්

සම්මත කොට ගත් රීතිය යි. මේ අනුව නිපැදුණු සිංහල සන්දේශාවලියෙහි මෙ කල දක්නට ලැබෙන වූ පැරණි සන්දේශය මයුර ය යි. ඉක්බිති ව දැදිගම පරාක්‍රමබාහු රජු සතුරන්ගෙන් මුදා රක්‍ෂා කරන සේ දෙවියන් යදිමින් කළ **තිසර** සන්දේශය පහළ විය. මින්පසු සිංහල සාහිත්‍ය වංශයේ සන්දේශ සමය එළඹියේ ය. එකල කාලයෙහි අහසැ බබලන දෙව්දූතු මෙන් රමණීය සන්දේශයෝ නැගී සිංහල සාහිත්‍යය හොබ වන්නට වන්හ. කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු රජු දවස බිහි වූ ඒ මේ **පරෙවි, හංස, සැළලිහිණි, ගිරා, කොවුල්, කහකුරුළු** ආදි සන්දේශ කාව්‍යයන් නිසා තත් කාලීන සාහිත්‍යය බෙහෙවින් පෝෂිත විය. අනතුරුව සන්දේශ කාව්‍යයක් දක්නට ලැබෙන්නේ සීතාවක කාල යෙහි යැ. කුක්කුට පක්ෂියකු දූත ක්‍රියාවෙහි යොදා අලගියවන්න පඬිවරයන් කළ ඒ **සැවුල්** සන්දේශයෙන් පැරණි සන්දේශ මාලාව අවසන් වේ. නූතන කාලය එළඹී කලක් ගතවන තුරු සන්දේශ ග්‍රන්ථයක් ගැන අසන්නට නො ලැබේ. මේ මෙසේ පවත්නා අතර අටළොස් වැනි ශතවර්ෂයේ අවසාන භාගයෙහි නැවත වරක් සන්දේශ සැපයීමෙහි සිංහල කවීහු උද්‍යොගවත් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් **කැටකිරිලි, නීලකොබෝ, දියසැවුල්,** ආදි සන්දේශ කාව්‍ය කිහිපයක් පැරණි සන්දේශාවලියට එක් වූහ. නූතන සමයේ රචිත මේ සන්දේශයන් අතුරෙ ඇතැමෙක් පැරණි රීතිය ඉක්ම වූහ. **නීලකොබෝ, දිය සැවුල්** ආදි සන්දේශයන් සවාජීවලාභාපෙක්ෂාවෙන් විරචිත හෙයිනි.

## කැටකිරිලි සන්දේශය

කර්තෘ:— අවිනිශ්චිතයි
කාලය:— ක්‍රි: ව: 1788
ප්‍රමාණය:— පද්‍ය 143

සතුරු උවදුරු නො මැතිව බොහෝ කලක් සැපයේ වාසය කිරීම සඳහා කතරගම දෙවියන්ගෙන් රාජාධි රාජසිංහ රජුට ආශීර්වාද පැතීම නිමිති කොට කැටකිරිලි පක්ෂියකු අත සමනතකූට පර්වතයේ සිට කතරගම දෙවිඳු වෙත යැවූ සන්දේශයකි මේ. මෙහි කර්තෘ ‘කවුඑරණ පියස ඔහු මුණු බුරු ය යි සඳහන් වේ. කවුඑරණ පියස නම් සපරගමු පළාතේ පිහිටි දේරපනය යි. එ ගම විසූ වියතකුගේ මුණුබුරකු මේ අස්නෙහි කර්තෘ බව දැක්වේ. ඒ විනා හේ කවරෙක් ද? යනු හැඳින ගැනීමට අන් පුවතෙක් නැති. එබැවින් මෙහි කර්තෘ අවිනිශ්චිත කොට සැලකීම මැනවි.

මහනුවර කාලීන සන්දේශාවලිය වෙත නෙත් හෙලත් නකුට කැටකිරිලි අස්න හමු වනුයේ එවක බිහි වූ උසස් සන්දේශ කාව්‍යයක් හැටියට ය. එකල බොහෝ කවීන් ප්‍රිය කළ දුෂ්කර බන්ධන නැති ව අර්ථ සූන්‍ය පද ඝටනා බොහෝසේ අඩුවීම එයට හේතුව යි. මේ සන්දේශය කිරීමෙන් ස්වකීය සාමර්ථ්‍යය පෙන්වීම හෝ අනිකකු සතුටු කරවීම කාව්‍ය කර්තෘගේ අදහස නො වූ බව පෙනේ. හුදු ශ්‍රද්ධා චිත්තයෙන් රාජාධිරාජසිංහ රජුට ආසිරි පැතීම සන්දේශය ගැලපීමේ පරමාධ්‍යාශය යි.

‘අ දි න  කුල දෙවිඳු ගෙන සිහිකොට සර  ණ
ස ව න  පද නැමද සිට මතුරු දහමෙ  න
සු ම න  සුරිඳු පද වැඳ අවසර රුගෙ  න
ත ය න  ගමන සිදු වෙයි ම මිතුරු කල  ණ’

මෙසේ සුමන සුරිඳුන්ගෙන් අවසර ගෙන කඳකුමරුන් වෙත යෑම සඳහා කැටකිරිල්ලට අණ කිරීම වූකලි අභිප්‍රේතාර්ථය නො වරදිනු සඳහා ගත්කරු යොදා ගත් මගකි. ගත්කරු සපරගම් වැසියකු වීම විශේෂයෙන් සුමන සුරිඳුන් අමතක නො වීමට හේතුව ය. හේ තම අස්න සමන් ගිරින් පිටත්කර වූයේ ද එහෙයිනි.

සමන් ගිරින් පිටත් වූ පක්ෂියා සිව්දිනක් ගතකොට පස්වැනි දින පස්වරුයෙහි කතරගමට ළඟා විය. පන්සාළිස් වැනි පද්‍යයෙන් ආරම්භ වන මේ මාර්ගවර්ණනාවෙහි ග්‍රාම දනව් අටසාළිසක් පමණ වර්ණනා වී ඇත. දෙක තුනක් හැර සෙසු ගම් දනව් නාම, කවියේ මුල හෝ අග එලියට අසු කිරීම සඳහා කවියා උත්සාහ ගත් බව පෙනේ. කාව්‍යයෙහි පද දෝෂ කිහිපයක් ඇතිවීමට එය හේතු වී තිබේ. ආරම්භක පද්‍ය සූසාළිස අභිප්‍රේතාර්ථය හා සමන්ගිර විස්තරය සඳහා යෙදී ය. එහිදී සර්වඥයන් වහන්සේ වැඩම කළ ප්‍රවෘත්තිය ද, විශේෂයෙන් ෂඩ්වර්ණ බුද්ධ රශ්මි මාලාව ද වර්ණිත විය. අනතුරු ව මාර්ග විස්තරය දැක්වීමෙන් අස්න සමාප්ත කොට ඇත.

## අමා රසය

කර්තෘ:— සාලිඇලේ මණිරතන හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1791
ප්‍රමාණය:— පද්‍ය 75

කවි පන්සැත්තෑවකින් හෙබි ‘අමාරසය’ නම් කාව්‍යය සාලිඇලේ මණිරතන හිමියන්ගේ කුඩා රචනයකි. ත්‍රිනේත්‍ර පණ්ඩිත වීරපණ්ඩු නම් පඬි රජකුගේ යශෝනුභූතිය මෙහි කථාශරීරය වශයෙන් ආයේ ය.

**කථා සාරය** බරණැස කාලිඞ්ග නම් සිටාණ කෙනෙක් වූහ. ඔහු ලෝභී හ. අදානශීලීහ. මෙ පුවත දත් දෙවෙන්ද්‍ර තෙමේ ඔහු සිත දනයට නමාලී ය. කාලිඞ්ග තෙමෙ දනයක් දී එ පිනින් පඬිරට සූර්‍ය වංශයෙහි ඉපිද රජ සිරි ලද්දේ ය. ශක්‍රයෝ විශ්වකර්‍මයන් එවා ඔහුට වඩුරියනින් තුන්දහසක් දිගැති පහයක් කොට දුන්හ. හස්ත්‍යශ්වාදි චතුරඞ්ග සෙනාවෙන් පරිවෘත ව, නිරතුරු සතුති ඝොෂයෙන් සපිරුණු සවන් ඇති ව, පරම රූප සෞන්දර්‍යයෙන් හෙබි වරඟනන් විසින් පරිවරනය කරනු ලබමින්, ඒ රතන ප්‍රාසාදයෙහි කල් යවන හෙතෙමේ දිනෙක ප්‍රාසාද තලයෙහි විවළ කවුළියෙන් නුවර සිරි බලා අපමණ ශ්‍රී විභූතියෙන් සමලඞ්කෘත වූ නගරය දුටුයේ ය. එ කෙණෙහි ඔහට "මම කෙසේ නම් දෙවෙන්ද්‍රයාට අඩු වෙම් ද? මා සැපත කෙසේ නම් ඔහට අඩුවේ" දැයි "කෙසෙල් ගසට පිදීමක්" වැනි, "මුවකුට මරුරවයක්" වැනි පවිටු අදහසක් උපන්නේ ය.

සාලිඇලේ හිමියන් 'අමාරසයෙ'න් ගෙන හැර පාන වස්තුවේ සාරය මේ යැ. කථා පුවත මෙසේ හදිසියේ අඩාල වූ බව පෙනෙතත්, පඬි රජුගේ පරිහානිය වූ සැටි පාඨකයාට සිතා ගත හැකිය.

මෙ පුවත කාව්‍යයට නගා ගත්කරුවෝ එය 'අමාරසය' යි නම් කරති. එහි ආරම්භක පද්‍ය පස්විස්සෙන් මඞ්ගලාචරණය හා පඬි රජුන් හඳුන්වන ලදි. සවිසිවැනි පද්‍යයෙන් කථා පුවතට බට කවියා පඬි රජුට නිමවා දුන් රතනප්‍රාසාදය විස්තර කරයි. මෙ කවෙහි චමත්කාර බන්ධන විශෙෂය දක්නට ලැබෙන්නේ මෙ තැන් සිට ය. පන්තිස් වැනි පද්‍යයෙන් ඇරඹෙන ඒ පද්‍ය දෙ විස්ස මධු ඡන්දසෙහි අටවිසිමත් විරිනින් බඳනා ලද්දේ ය. සංස්කෘත වචනයන්ගෙන් මිශ්‍ර වූ, එලියෙන් ආලොකය ලත් පදයන්ගෙන් සමන්විත වූ ඒ පද්‍ය පන්තිය කාණි රමනීයත්වය එලවයි.

'වි රා ජි ත කුංකුමා ලේපන පිත සුන්දර පයෝදර මැ ද<br>
ද රා බි ත උරසාර මුතුහර සැරි නෙක බරණින් මනෝන ද<br>
ප රා ජි ත රුසිරෙන් සුරංගන වරඟනන් දුන් සෙමර නලබි ද<br>
වි රා ජි ත පුරඳර සිරින් පඬි නිරිඳු සිංහාසන අරා හි ද'

යනුවෙන් ඒ පද්‍ය කිහිපයෙන් වණ්ණිත වූයේ රජුගේ අනුභූති මහත්වය හා පුරශ්‍රිය ද වේ. වෘත්තයට අනුකූලව නැගී එන අනුප්‍රාස රසය නිසා මෙහි බොහෝ පද්‍යයෝ කියවීමෙහි ප්‍රීතිය ගෙන දෙන්නෝ ය. අවසාන පද්‍ය කිහිපය රජුගේ පවිටු අදහස දක්වා එහි ප්‍රතිඵලය:—

'කපට සිතින් තම නැණ බල අඩු වෙමී න<br>
ගලට දලින් ඇන මෙහෙසුන ගජේකු මෙ න'.

යි සමාසොක්තියෙන් පෙන්වා දෙයි.

මණිරතන හිමියන් විසින් මේ රචනාව කරන ලද්දේ ක්‍රි: ව: 1794 දී බව දක්වේ. වෘත්ත භඩ්ග හිතියෙන් කරන ලද හ්‍රස්ව දීර්ඝයන් හා විපරීත ව යෙදුණු සංස්කෘත පදයන් ගෙන් මෙහි ඇතැම් පද්‍ය කිලිටු වුව ද, තත් කාලීන පද්‍ය ග්‍රන්ථ අතර අමාරසය සැලකිය යුතු ස්ථානයක් ගනී. පැරණි සව් සමය අනුව ගොස් කල චක්‍රවාකයෙහි 'ය' කාර එළිය, — නිරන්ථ ප්‍රාසය, ආදිය හැර දමන ලද්දේ නම් මණිරතන හිමියන්ගේ මේ රචනය වඩාත් රසවතුන් පිනවනු ඇත.

## මොරතොට වත

කර්තෘ :— මුංකොටුවේ අබේසිංහ රාල.
කාලය :— ක්‍රි: ව: 1797
ප්‍රමාණය:— පද්‍ය 186

'මොරතොට වත' වූකලි මුංකොටුවේ රාලගේ දෙවැනි සාහිත්‍ය කෘතිය යි. 'සඟරජ වත'ත් සතළොස් වසකට පසු එනම් ක්‍රි: ව: 1797 දී මෙය සාහිත්‍ය කාමීන් අතට පත් විය. මොරතොට ධම්මක්ඛන්ධ නායක හිමියන්ගේ වර්ණ කථනය මෙ කවෙන් අපේක්ෂිතයි.

මොරතොට හිමියෝ සඟරජ හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය වර යෙකි. • සීතාවකින් ඇරඹුණු උන්වහන්සේගේ වංශ ප්‍රවේණි යෙහි පටන් ස්ථානාන්තර ප්‍රාප්තිය දක්වා කරුණු මෙහි දක්වන ලද්දේ ය. ඒ කරුණු අතර උන් වහන්සේගේ පාණ්ඩිත්‍යය, ධර්මවාදිත්වය හා ශිෂ්‍ය පිරිස මෙහි ලා කවියාට වර්ණනා භූමි විය.

මොරතොට වතෙහි බොහෝ පද්‍යයෝ සඟරජවත පද්‍යයනට සමාන වෙති.

'දුසිරි හිම දුර ල — න
දන මන කමල පොබ ව — න
මුනි මුවගිර රඳ — න
සදම් දිනකර වදිම් දින දි — න'

සඟරජවතෙහි එන මේ පද්‍යය මොරතොට වතෙහි දක්වෙන්නේ මෙසේ යි —

'දුසිරි හිම දුර හ — ළ
මන කමල විකසිත ක — ළ
මුනි යුගඳුරු පහ — ළ
සදම් දිනරද වදිම් හැම ක — ළ'

වර්ෂ කිහිපයක් ඇතුළත දී බිහි වූ මෙම කාව්‍ය දෙකෙහි මෙතරම් සමානතාවක් ඇතිවීමට එක් හේතුවක් නම් මේ කෘති දෙක ම එක කර්තෘක වීම ය. පොත් දෙකේ රචනා ශෛලිය පිරික්සීමේදී මොරතොට වත වැඩියක් පළපුරුදු කවියකු අතින් නිපැයුණු බව පෙනේ. මොරතොට වත කරනවිට තත් කර්තෘ රචනයෙහි පරිනත බුද්ධියක් ලද්දකු ව සිටීම එයට හේතු ය.

මුංකොටුවේ කිවිඳු 'සඟරජ වත' ලියන ලද්දේ ගුරු භක්තියෙන් යුතු ව ය. එහෙත් 'මොරතොට වත' රචනා කරන ලද්දේ මිත්‍රත්‍වයෙන් බැඳුණු ආදරයෙනි.

'මොරතොට වත' කියවීමෙන් තවත් සිඩියක් එළිකර ගත හැකි ය. එනම් මොරතොට හිමියන්ට ප්‍රතිවිරුඬ පක්‍ෂයක් එකල සිටි බව ය. මල්වතු විහාරයේ නායක පදවිය අරභයා ඇතිවූ තරඟය එයට හේතු වූ බව පෙනේ.

i "සෑම දේට ම පමණ කෙළ දුටු කෙනෙකි
දම්කද තෙරිදු මොරතො ට"

ii "නොයෙක් ලෙසින් තුති කර වදලා
එ කිත්සිරි රජ සිහ ර දූ"

iii "වියත් කෙනකුත් බලා නායක ඉසුරු
ඕහට දිය යු තු"

iv "මේ ලෙස සමහරු නායක පදවිය කරලා
මෙ සසුන් පිරිහෙලූ වා"

v "මෙසේ සුසික්සිත කරවා අනතුරු නායක
ඉසුරට පමුණු ව නු"

vi "දහම් විනය වැකරණ උගත්තන් මේ දක
උත්සහ කෙරිය යු තු"

මුංකොටුවේ රාල මේ පද්‍යාංශයන්ගෙන් ව්‍යඞ්ගයෙන් කරන නම් ප්‍රහාරය ඒ විරුඬ වාදීනට යැ. විරුඬ වාදීන් වැටී සවකීය මිත්‍රයාණන්ට නායක පදවිය ලැබීම කවියාගේ මහත් ප්‍රීතියට හේතු වූ බවද එයින් විචාතයැ.

ග්‍රන්ථාවසානයෙහි දක්වූ මොරතොට හිමියන්ගේ සූවිස්සක් පමණ ශිෂ්‍ය පිරිස ඔමකල ඒ ඒ සඞ්ඝ පරම්පරාවන් සෙවීමේදී ඔබෙහෙවින් ප්‍රයොජනවත් වේ. මේ චරිත කථා කාව්‍යය දකිය වුන්නා ප්‍රීතිමත් කරවීමට සමර්ථ යි.

### ලොකොපකාරය

කර්තෘ:— රණස්ගල්ලේ හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1799
ප්‍රමාණය:— ගී 238

දෙක තුනකට සීමා වී පවත්නා සිංහල නීති ග්‍රන්ථයන් අතර **ලොකොපකාරය** ප්‍රමුඛ ස්ථානයක් ලබන්නකි. සීතාවක අලගියවන්න කිවිඳුන්ගේ එළිසම පද්‍යයෙන් බැඳි සුභාෂිතයෙන් පසු බිහි වූ එක ම නීති ග්‍රන්ථය හැටියට 'ලොකොපකාරය' සම්භාවනා ලබයි.

'සිරි සර ගුණැති මහ—නැණ තෙදිනි ලොව පරසිදු ව සිටි,
සිරි පිරි තොටගමුවෙ—වෙහෙර වැඩ සිටි බොහොසෙ
කල් හැර'

'කෙලවර කෙලෙ මෙ පොත— පුරසත්‍ය සකවස පිරි සිටි,
පර පුර වණ්ජ කුල — රණස්ගලු තෙර නමැති යතිඳු'

යන ග්‍රන්ථාවසාන ගීතීන්ගෙන් 'ලොකොපකාරය' "තොටගමු විහාරයෙහි වැඩ සිටි වෙළඳ කුලයෙහි උපන් රණස්ගල්ලේ තෙරණුවන්" විසින් කරන ලද බව පැවසේ.

රණස්ගල්ලේ හිමියෝ සඟරජ හිමියන්ගේ අනු ශිෂ්‍යයෝ ය. ඔවුනගේ ආචාර්ය්‍යවරයෝ ඇත්තෝරු විහාරයෙහි වැඩ සිටි ඇත්තෝරුවේ අත්ථදස්සී තෙරණුවෝය. අත්ථදස්සී හිමියනට ඇත්තෝරු විහාරය පැවරූයේ සඟරජ හිමියන් විසිනි.

'පුරසත්‍ය' යනු 'කටපය' ආදි ක්‍රමයෙන් යෙදූ ග්‍රන්ථය නිම කළ වර්ෂය යි. එනම් ක්‍රි: ව: 1799 වැන්නයි. මේ වූකලී පිළිමතලව්වේ දිසාව හා ජේද්‍රික් නෝර්ත් ආණ්ඩුකාරයාණන් අතර තදින් සාකච්ඡා පැවැති සිංහල රාජ්‍යයේ කුණාටු සමයෙකි.

දරක ප්‍රේමය හා රක්ෂණය සම්බන්ධයෙන් රණස්ගල්ලේ හිමියන් විසින් 'ලොකොපකාර' යෙහි උපදෙශ රාශියක් දක්වන ලද්දේය. විද්‍යාව හා උගතාන් සම්බන්ධයෙන් ද, සමාජ ශොධනය අරමුණු කොට ද, දක්වූ අනුශාසනා බොහෝ ගණනකි. වෛර යට මෙත් කළ යුතු බව, සුචරිත ඵලය, උඩඟුවෙහි ආදීනව, සත්පුරුෂ ධර්ම, බොධිසත්ව චර්‍ය්‍යා, ආදිය ඉන් සමහරකි. ගත් කරුවන් යථොක්ත උපදෙශයන්ගෙන් ස්ව ග්‍රන්ථය පොෂණය කිරීමට බෞද්ධ සාහිත්‍යය හා සංස්කෘත නීති ග්‍රන්ථයන් ද බෙහෙවින් ඇසුරු කරන ලද්දේ ය.

'පච් බැඳි සිත් නො මැති — දනහට යම් දෙසක්
පැමුණුනා ත්,
වණ නො මැති අල්ලෙහි — විසය නොනැගෙන මෙන්
නො වේ දුක්'

යන ගීයට ආශ්‍රය වූයේ —

'පාණිම්හි චෙ වණො නාස්ස—හරෙය්‍ය පාණිනා විසං
නාබ්බනං විසමන්වෙති — නත්ථි පාපං අකුබ්බතො'

යන ධම්මපද ගාථාව යි. යලි—

'කම්මැලි හට සිල්ප — නො සිදුවේ එ බැවින් නිදන වේ,
නි දන හට මිතුරු නැත් — එහෙයින් සිතට සැප නැත්'

යන ගීය හිතොපදෙශයෙහි එන—

'අලසස්‍ය කුතඃ ශිල්ප— මශිල්පස්‍ය කුතො ධනං
අධනස්‍ය කුතො මිත්‍ර— මමිත්‍රස්‍ය කුතො සුඛං'

යන ශ්ලොකයේ අනුවාදය යි. සෙසු ගී ද බෙහෙවින් සම්පාදනය වූයේ මේ අයුරිනි. තත් කාලීන සමාජ තත්ත්වය දෙස බලා ස්ව බුද්ධියෙන් නිපද වූ උපදෙස් ද මෙහි එති.

'හීනයන් රුගෙන ත්—ඉටුවනු දෙයක් කෙරෙනැ නැති යේ,
කතා නොම දුතිවත්— ලෝ කැබපතින් වත බලනු මෙන්'

යනු එබඳු තැනකි. ශබ්දාර්ථ වශයෙන් මෙහි සුලභව ඇත්තේ අර්ථ රසය යි. එහෙත් තැනින් තැන ශබ්ද රසය පෙන්වන ප්‍රාස යද ඇති බව—

'සඳ නඳ කරන සඳ— පහන් සියුරන් මන තෙමන මෙන්,
සඳ සඳ පහන් සඳ—සලෙලු සඳ කොඳ සඳ පහන් වේ'

යන ගීවලින් පෙනේ. ගී දෙසිය අටතිසකින් පරිමිත වූ මේ ග්‍රන්ථය පඬුවන්ගේ සම්මානනයට පාත්‍ර වන්නකි.

## කාලිඞ්ගබොධි ජාතක කාව්‍යය

කර්තෘ:— දුනුවිල රාජකරුණා ඒකනායක ධම්කීර්ති පණ්ඩිත මුදියන්සේ
කාලය:— ක්‍රි: ව: 1799
ප්‍රමාණය:— පද්‍ය 677

දස අටවැනි ශතවර්ෂයේ අවසාන මොහොතෙහි සිංහල සාහිත්‍යයෙහි පිවිස ගත් ග්‍රන්ථ කිහිපය අතර 'කාලිඞ්ගබොධි ජාතක කාව්‍ය' ද එකකි. දුනුවිල රාජකරුණා ඒකනායක ධම්කීර්ති පණ්ඩිත මුදියන්සේ රාලහාමි එහි කර්තෘ විය. මෙම කවියා වාර්තමානිකයන් අතර ප්‍රකට වනුයේ දුනුවිල ගජනායක නිලමේ යනු වෙනි. සිංහල ආණ්ඩුවේ ප්‍රසිඬ නිලයක් වූ ගජනායක පදවිය කරවූයෙන් මෙතුමා එ නමින් හඳුන්වනු ලැබී. දුම්බර දුනුවිල ගම උපන් මෙතෙම මිල්ලව මොහොට්ටාල ගේ පුත්‍රයෙකි. අත්තරගම රාජගුරු භණ්ඩාර පඬිතුමන් ආශ්‍රය කිරීමෙන් ශබ්ද ශාස්ත්‍ර උගත්තේ ය. දුනුවිල ගජනායක නිලමේ සාහිත්‍ය කාමීන් අතර වැඩියක් ප්‍රසිඬිය ඇත්තේ රාග නිශ්‍රිත පද්‍ය රචකයකු හැටියටය. **දුනුවිල හටන, රතිරත්නාලඞ්කාර** යන පොත් දෙක එතුමාගේ එබඳු රචනාවෝ ය. **කාලිඞ්ගබොධි ජාතක කාව්‍යය** වූකලි මෙතුමාගේ සාහිත්‍ය කෘතිය හැටියට සලකනු ලැබේ. සාහිත්‍ය වංශයෙහි එතුමාට අවකාශ ලැබෙන්නේ ද මෙ කව නිසාමැ යි.

'විජය සුන්දර ව ර
සෙනෙවිරත් වන පු ාත ර
අබයකොන් පඬිව ර
මුදලි නමකුත් ලබා මනහ ර'

'මෙ අගමැති කුලුණෙ න
දහමක් ගැඹුරු එළිවෙ න
කවි කර කියන මෙ න
කෙලෙන් ආරාදනා
සතොසි න'

යනුවෙන් විජයසුන්දර සෙනෙවිරත්න අභයකෝන් පණ්ඩිත මුදලි කෙනකුගේ ආරාධනයෙන් කලිඟු බෝද කව් කල බව පැවසේ. මේ ආරාධකයා නම් රාජාධිරාජසිංහ රජුගේ අවසාන වර්ෂයන්හි සහ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ආරම්භ කාලයෙහි මහ නුවර මහාධිකාරම් නිලය කරවූ දුම්බර රාජකරුණා සෙනෙවිරත්න වාසල අභයකෝන් පණ්ඩිත මුදියන්සේ රාලහාමි ය.

මහාධිකාරම් තුමා විසින් මේ ආරාධනය කරන ලද්දේ ක්‍රි: ව: 1780 දී ය. ගජනායක නිලමේ මේ කෘතිය නිම වන ලද්දේ මින් එකුන්විසි වසකට පසුව ය.

**කථා සාරය** කලිඟුරට දන්ත පුරයෙහි මහ කලිඟු නම් රජෙක් විය. එ රජ මල් සුළු කලිඟු කුමරු "ඔබ පැවිදි ව ජීවත්වෙහි! ඔබ පුතෙක් සක්විති වන්නේ ය" යි බමුණන් විසින් කියන ලදුයේ පුතු නිසා උපන් ගර්වයෙන් අහඞ්කාර ව හැසිරෙන්නට වන. රජ එය නො ඉවසා ඔහු ගන්නට මිනිසුන් මෙහෙයී ය. එ බව දත් සුළු කලිඟු කුමරු පලා ගොස් වල් වැද හොයක් අස තවුස් පැවිද්දෙන් විසී ය.

මෙ කල්හි මදුරට සාගල නුවර මදුරදහට රූපශ්‍රියෙන් විශිෂ්ට දුවක් වූ. ඇය බලා නෛමිත්තිකයෝ 'මැය පුතෙක් සක් විති වෙයි කී හ. එ දත් සියලු දඹදිව රජහු දුව හෝ දුන මැනව. යුද හෝ කළ මැනව යි සාගල නුවර වටලා ගත්තු. බිය පත් මද්‍ර රද දියනියන් හා බිරිඳ ගෙන වෙස්වලා වල් වැද කලිඟු කුමර හුගේ අසපුවට උඩුගංතෙර විසී ය. දිනෙක මදුරද දුව විසින් ගඟ යවන ලද මල් සුඹුළුවක් යටිගඟ සනගන කලිඟු කුමරහු හිසැ රැඳිණ. එ දුටු කුමරු උඩුගං බලා යනුයේ කුමරිය දක ඔවුනොවුන් පිළිවිස විසිවස් විය. දෙමාපියෝ කුමරිය ඔහුට ම දුන්හ. කල් යෑමෙන් ඔවුනට පුතෙක් ලැබිණ. හේ දෙ පිය මුතුන් කෙරෙහි අධීත විද්‍යා ඇත්තේ —දන්ත පුර මහ කලිඟුහු ඇවෑමෙන් සක්විති රජය ලද්දේ ය. දිනෙක ඔහු ඇතු අරු මහ පිරිසෙන් දෙ ගුරුන් සමීපයට යන්නේ — බෝමැඩ උඩින් යා නො හී—අහසෙහි උක්කුටුකව හුන් ඇත්රජ විදුරු අකු සෙන් මැරෙණ තුරු ඇන ද මෙහෙයා ගත නො හිණ. රජ බෝමැඩ අනුභාවයෙහි පැහැද බැස පියා මහ පුද පෙරහර පැවැත් වී. ඉක්බිති දෙ ගුරුන් කැඳවා නුවරට පැමිණ යෙහෙන් රජසිරි විඳ දෙව්ලෝ වනි.

ගජනායක නිලමේ ජාතකට්ඨ කථාවේ තෙරසක නිපාතයේ එන මේ කාලිඞ්ගබෝධි ජාතකය වස්තු කොට ඒ හා ගලපිනු සඳහා ග්‍රන්ථාරම්භක ප්‍රවෘත්ති, දූරෙ නිදාන කථාව හා වර්තමාන කථාව ත් පද්‍ය එක්සිය සිවුපණසකින් දක්වූයේ ය. එතැන් සිට හසිය එක්සැත්තෑ වැනි පද්‍යය දක්වා කථාවස්තුව කව් කෙළේ ය. එහිදී කවියා යථාස්ථානයන්හි පූර්ව කවීන්ගේ වර්ණනා මාර්ග අනුගමමින් රජ—පුර—උද්‍යාන—වන ආදිය දක් විය. මේ වර්ණනා ස්ථලයන් අතර තුන්සිය තෙපනස් වැන්න පටන් තුන්සිය තෙසැත්තෑව දක්වා කළ මදුරද දූ වැනුම මෙ කවෙහි අලඞ්කාරයෙන් උස්තැනක් ගන්නා පද්‍ය පන්තියකි.

'සිප් නම දත් පරසිඳු කර තිලෙ[illegible]ව ට
ගැප් රන මැව් එලදඟෙ උරු යුව[illegible]ල ට
ඔප් කල රත් ටැම් යුග කිව උව[illegible] ට
කප් ලිය තුල් කල වැනි උදු වැ[illegible]ක ට'

කාව්‍යශෙඛර ගුත්තිල බුදුගුණාලං[illegible]කාර වැනි පූර්වකෘතින් මෙ කවියා විසින් ද සවකීය රචනයෙ[illegible]දී ඇසුරු කරගන්නා ලදී. 'ධම්ප්‍රදීපිකා'වෙහි එන කා[illegible]ඞ්ගබොධි ප්‍රවෘත්‍යාගත වර්‍ණ සරත් වණිතයත් ඒ පිළිවෙළින් [illegible] ගත් බැව් පෙනේ.

පුන පුනා කිම් හා වියරණ දෙස් [illegible]හෙයින් මෙහි දක්නට ඇත. දුෂ්කර බන්ධන කරණයෙහි ද [illegible] කවියාගේ උත්සාහිත බවක් නො වී ය. කාටත් තේරෙන [illegible]රල කාව්‍යයක් වීමේ ගෞරවය නම් කාලිඞ්ගබොධි ජාතක [illegible]කාව්‍යයට නියතයෙන් ම හිමි වේ.

## නීල කොබෝ ස[illegible]ශය

කර්තෘ:— බරණගණිතැඳුරු
කාලය:— ?
ප්‍රමාණය:— පද්‍ය 148

සර්වාර්ථ සිද්ධිය අපෙක්ෂාවෙන් ර[illegible]ත සන්දෙශ කාව්‍යයන් අතර බරණ ගණිතැඳුරන්ගේ නීලකො[illegible]බෝ අස්න පළමුවැන්න හැටියට ගැනේ. මෙය කවර වර්‍ෂයක[illegible] රචිතද යි දක්වා නැති. එහෙත් ගත්කරු විසූ කාල පරි[illegible]දය අනුව මේ කව අටළොස්වැනි ශතවර්‍ෂයේ අවසාන [illegible]පස්විසි වර්‍ෂයතුළ බිහි වූවකැ යි සිතා ගත හැකි ය.

'නීලකොබෝ අස්න' කළ බර[illegible]ාචාර්‍ය තෙමේ දකුණු පළාතේ විසූ ප්‍රසිද්ධ නැකත් කරුවෙ[illegible]. සිටිනාමළුවේ ධම්ම ජෝති හිමියන්ගේ පා සෙවනේ [illegible]ැසි උන් වහන්සේගේ අනුග්‍රහයෙන් මහනුවර බමුණු [illegible]ඩිවරයකුගෙන් ගණිත ශාස්ත්‍රය පුහුණු කෙළේ ය. සෙත් [illegible]ාවි වස් කවි කිමෙහි සමතකු වශයෙන් ද මෙතෙමේ ප්‍රසි[illegible] විය. ගණිතැඳුරන්ගේ නැකත් දැනුම ගැන ප්‍රසාදයට පත් [illegible]කිර්ති ශ්‍රී රාජසිංහ රජු 'බරණ' යන ගරු නාමය දුන් බව [illegible]කාශිත යි. ගණිතැඳුරු ලියූ **වායස නිමිත්ත** නම් පද්‍ය 54 [illegible] යුත් කපුටු ශාස්ත්‍රය පිළිබඳ කුඩා කවක් ද දක්නට ඇත.

මොහුගේ පශ්චිම අවස්ථාවෙහි [illegible]ස් කවි කීමේ ඉහාත්ම විපාකය වශයෙන් ශරීරය වණ ග්‍ර[illegible]ණු වී ගියේ ය. මේ පාපරෝගයෙන් තමන් මුදවන ලෙස [illegible] තරගම දෙවිඳුන් යැදීම, නීලකොබෝ අස්න කිරීමේ පරම[illegible]ය යි.

'වා ත රෝග ඔහුගේ සියොල[illegible]වි හි
ගා ත වල දෙ යටිපලු සම්'[illegible]සැ
නී ත කුරිරු මේ මේ රෝග[illegible]ම සැ
බී ත නිසරු වියවුල තද [illegible]ස වි

'තද බල රෝග පත් උගෙ එ වෙනි සිය ග ත
තද නිල වන් වෙල ලෙස සිඳ ම නො නැව ත
තෙද බල මහිම යසසින් ඔබගෙ බරණෙ ත
සිදු කළ මැනවි පවතින උ සිත අබිම ත'

සිරිනාමලුවේ සිට කතරගම දක්වා ගමන් කළ පක්ෂියාට අස්න ගෙන යෑම සඳහා සිවුදිනක් ගත විය. මග දෙපස පිහිටි සත්තිසක් පමණ ගම් නියම් ගම් මෙහි වර්ණිත යැ. අර්ථ ව්‍යක්තියෙන් තොර වැ අප ශබ්ද බහුල වැ ව්‍යාකරණයෙන් පරිබාහිර වූ වාක්‍යයොජනයන් නිසා බරණෑදුරන්ගේ මේ කෘතිය සිංහල සන්දේශාවලියෙහි ලබන්නේ කණිෂ්ඨ ස්ථානයකි.

## සර්වඥ ගුණාලඞ්කාරය

කර්තෘ:— අවිනිශ්චිතයි
කාලය:— ?
ප්‍රමාණය:— පරිච්ඡේද 33

'සර්වඥ ගුණාලඞ්කාර'ය නමින් එන ගද්‍යය ද 'උදගම තරඞ්ග' යෙහි ලා වැටෙන විශාල කෘතියකි. ගත්කරුවන් හා ඔවුන් විසූ කාලය මේතාක් අනාවරණය නො වී ය. මෙහි කතුවරයා හා කාලය සඳහට ම විස්මෘතතාවෙන් වැසී සිටිය ද, සිංහල සාහිත්‍ය වංශයට නම් ඉන් නො පිරිමැසිය හැකි පාඩුවක් නො වන්නේ ය. මෙම ග්‍රන්ථය කෙනකුගේ අමුතු රචනයක් නො වන හෙයිනි.

"මුනිගුණ වර්ණනාත්මක රත්නාකර පොත්වහන්සේ ආදි පොත් වහන්සේලා සමූහයකින් සඞ්ග්‍රහ කොට ත්‍රෛලෝක්‍ය තිලක වූ සර්වඥයන් වහන්සේගේ බුදු ගුණය සඞ්ග්‍රහ කළ හෙයින් 'සර්වඥගුණාලඞ්කාර'ය යි කියා නාමයක් වූ."

යනුවෙන් ගත්කරුවෝ ම එ බව පැවසූහ. මෙහිලා කරුණු සඞ්ග්‍රහ කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව එකුනු විස්සකි. එයින් ප්‍රමුඛ වශයෙන් ඇසුරු කරන ලද්දේ 'සද්ධර්මරත්නාකර'ය යි. පරිච්ඡේද තෙතිසකින් හෙබි මේ පොතෙහි ගෞතම සර්වඥයන් වහන්සේගේ මූල ප්‍රනිධියෙහි පටන් ධාතු අන්තර්ධානය දක්වා ධර්මකථා සඞ්ග්‍රහ විණ. එහි බුද්ධ චරිතය, කල්ප විභාගය, අනාගත වංශය, ධර්මානිශංසය, ආදි සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනවත් විවිධ ධර්ම විස්තර සමූහයක් ඇතුළත් විය.

සිංහල දළදා වංසය, ඤාණොපසම්පදාවත, සුළුරාජාවලිය ආදි සඞ්ග්‍රහයන් දෙස බැලීමේදී මේ 'සර්වඥගුණාලඞ්කාර'ය ද තත් කාලීන වියතකුගේ එ බඳු පරිශ්‍රමයක් බව සලකනු මැනවි.

'උදාගම තරඞ්ග'යෙහි සාමාන්‍යයෙන් දත යුතු ග්‍රන්‍ථ කිහිපය අතර මාතර සබ්බේ විදානගේ සින්නමුත්තු කථාකව පළමු වැන්න ය. සින්නමුත්තු සොළීරට තරුණියකි. ඇය හිමියා අගොස්තීන් නම් ද්‍රවිඩ වෙළෙන්දෙකි. අගොස්තීන් වෙළඳාම පිණිස පිටරට යන්නට සූදානම් ව තම බිරිඳ සිය මිත්‍රු වෙත බාර කෙළේ ය. එහිදී සින්නමුත්තු සොර සැමියකු සමග වැස දරු දෙදෙනකු ලද්දී — නැන්දණියන් විසින් පිටමන් කරනු ලැබුවා ය. ඕ සිය නිවසෙහි වැස හිමියා පැමිණි කල එ පුවත් බොරු බව දන්වා දිවිරීම පිණිස කාලි කෝවිලට ගියා. උපායකින් බොරු දිවුල ඇගේ කපටිකම් දුක කාලි දේවිය හිස වනන්නට පටන්ගතු. ඇමැත්තෝ එ පුවත් රජුට කිහ. රජු පිළිමයේ හිස්සෙලවුම නවතනු ලෙස අණබෙර ලැවී. 'සින්නමුත්තු' කාලිහිසට ඉලපත් පහරක් දී හිස් සෙලවුම නැවත්වූවා ය. මාතර ඉලඞ්ගකෝන් මුදලි මේ කථාව දෙමළ වෙළෙන්දකු ගෙන් අසා එය කවියට නගනු රිසි විය. එහෙයින් එ පුවත කවි කරන ලෙස සබ්බේවිදානට එ මුදලිඳුන්ගේ නියමය විය. සිංහල සාහිත්‍යයෙහි මේ කව ප්‍රවේශය ලද්දේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් ඒ ගැමි බසින් කළ කථා කවකි.

චරිත කාව්‍යයක් වශයෙන් 'උදාගම තරඞ්ග'යෙහි ඇතුළත් විය යුතු කෘතියකි **සඟරජ මින්තිය**. ක්‍රි: ව: 1778 දී කන්නෑපොල කිවිඳුන් රචිත මින් සඟරජ හිමියන්ගේ ප්‍රසිඬ චරිතය කියැවේ. එහි ප්‍රමාණය පද්‍ය එක්සිය සත් සාලිසකි.

සඟරජ හිමියන් ගේ ආදාහන මඞ්ගලය විස්තර කොට ඊරිමින්නේ විපස්සි හිමියන් ලියූ **ආදාහනවත** මුද්‍රණයෙන් බිහි නො වූ තත් කාලීන තවත් රචනයකි.

**ශ්‍යාමොපසම්පදාව** නමින් දැක්වෙන කුඩා කව විනාහි උපසම්පදාව පිහිටුවනු පිණිස උපාලි සථවිර ප්‍රමුඛ ශ්‍යාම දෙශීය මහා සඞ්ඝයා වහන්සේ ගේ වැඩමවීම නිමිත් කොට ලියැවී තිබෙන්නකි.

මෙ කල පවා ගැමියන් අතර ඉතා ප්‍රකට **දෙවිදත් කථාව** හෙවත් **දෙවිදත් වරුණය** ලියැවුණේ ද මේ වකවනුයෙහි ය. පද්‍ය සාරසිය දෙළසකින් හෙබි මේ කවි කතාව කරන ලද්දේ කරගහගෙදර වනිගසේකර මුදියන්සේ විසිනි.

සිංහල සාහිත්‍යයේ ඉතා විශාල පද්‍ය ග්‍රන්‍ථය වන **උමන්දා කව** ලියැවුණේ ද මෙකල ම ය. කවි 2072 ක් ඇති එය දෙවගිරි විහාරාධිපති ආභිධම්මික තෙරුන්ගේ ප්‍රයාශයක ප්‍රතිඵලයකි.

ක්‍රි: ව: 1787 දී ලියැවී තිබෙන **අනුරාග මාලය** නමැති කවක් ද වේ. ඒ වනාහි බලවත්තල මැණිකේ ගේ සුප්‍රසිද්ධ **අනුරාගමාලය** වැනි රාග නිශ්‍රිත පද්‍යයක් නො වැ සෙනාරත්න නම් මුදලි කෙනකුට තුති වශයෙන් කරන ලද්දකි. එහි කර්තෘ වූයේ රත්නසාර නම් කවියෙකි.

'උද්‍යාම තරඞ්ගය' යථෝක්ත ග්‍රන්ථ සන්තතියෙන් පමණක් නො වැ ක්‍රිස්තු සමය පිළිබඳ ලියැවී තිබෙන කතෝලික ග්‍රන්ථ සමූහයකින් ද විශිෂ්ට වන්නේ ය. ඒ ග්‍රන්ථ ශ්‍රේණිය ද ලඞ්කාවේ ක්‍රිස්තු සමය පිළිබඳ ඉතිහාස කථාව පෙරටු කොට යථාවසරයෙන් මෙ තැන් සිට දක්වනු ලැබේ.

## ලඞ්කාව හා ආගම්

ශ්‍රී විභූතියත් සමග ම ලක්දිවට බුද්ධාගම පැමිණියේ ද, හත් අට දෙනකුන් හැර අන් සියලු නරපතියන් බෞද්ධෝපාසකයන් වුව ද, කිසිදු කලෙක ලක්දිව අන්‍යාගමිකයන් ගෙන් සිස් නො වී ය. දූරාතීතයෙහි සිට ම ජාත්‍යන්තර සම්බන්ධය අගය කොට සැලකූ සිංහලයන් ගෙන් මේ කිසිදු ලබ්ධිකයකුට පීඩාවක් නො වීය. ඔවුන් නොයෙක් විට ලැබුයේ නම් සඞ්ග්‍රහයකි. සම්මානයකි. මෙහෙයින් සියලු කල්හි සිංහල රාජ්‍යයෙහි විවිධ දෘෂ්ටිකයෝ විසූ හ. ශෛව — වෛෂ්ණව — ආජීවක — මාහම්මදීය — ක්‍රෛස්තව ආදී ඒ විවිධ ලබ්ධිකයන් අතර මෙහි විවේචනය වනුයේ ක්‍රෛස්තවයන් සම්බන්ධයෙනි.

**ක්‍රිස්තු සමය**

ලක්දිව ක්‍රෛස්තවයන් ගැන පළමු වරට අසන්නම ලැබෙනුයේ හවැනි ශතවර්ෂයේ දී ය. මෙ සමය වන විට ඊජිප්තු වැසියෝ ලක්දිව වෙළඳාමෙහි යෙදී සිටියහ. මේ වෙළෙන්දෝ 'නෙස්ටෝරියන්' නම් නිකායට අයත් ක්‍රිස්තු ලබ්ධිකයෝ ය. ඔහු තුමූ මෙහි 'ක්‍රිස්තියානි සභාව' පිහිටුවා පල්ලි ගොඩනඟා ගෙන ස්වසමය අදහමින් සිටියහ. එහෙත් ඔවුන් දෙශීන් අතර ආගම පතුරුවා හැරීමේ උත්සාහයක් කළ බවට සාක්ෂියෙක් නැති. මෙ සමයෙහි ලක්දිව සිටි ඊජිප්තු වෙළෙන්දෙක් පසුකල පාදිලිකෙනකු වූයේ "ක්‍රිෂ්චියන් ටොපෝග්‍රැෆි" නම් පොතක් ලීවේය. ලක්දිව ක්‍රිස්තු ධර්මය ගැන පළමු වරට කරුණු දක්නට ලැබෙන්නේ ඒ පොතෙහි ය. මින් පසු පැමිණි විදෙශිකයන් ලක්දිව ක්‍රිස්තියානින් ගැන සඳහන් නො කරන්නේ පාර්සි — ඊජිප්තු වෙළෙඳුන් අත පැවැති ක්‍රිස්තියානිය ක්‍රමයෙන් දිරා ගිය හෙයිනැ යි සිතිය හැකි.

**කතෝලික නිකාය**

මීට අනතුරු ම පෘතුගීසීන්ගේ අවතරණය දක්වා ක්‍රිස්තු ලබ්ධිකයන් ගැන ලඞ්කා ඉතිහාසයේ කිසිදු ප්‍රවෘත්තියක් සඳහන් ව නැති. පෘතුගීසීහු නම් ස්වකීය බලය දියුණුකර ගනු සඳහා ආගම දඬ මීමා කොට ගත් ජාතියකි. ලක්දිව

පැමිණි විදෙශිකයන් අතුරෙන් මෙ තරම් ආගම් පිස්සුවෙන් පෙළුණු තවත් ජනතාවක් නැත්තේ ය. යුක්තිය සඳහා නො වැ ශක්තිය සඳහා, පරලොව පිණිස නො වැ මෙලොව පිණිස, ආගම උපයෝගී කර ගත් ජාතියකි පෘතුගීසීහු. ධම්පාල කුමරුන්ගේ කාෂ්ඨ රූපයට ඔටුණු පැළඳවීම සඳහා ලිස්බන් නුවරට ගිය ලංකා තානාපතියන් සමග පෘතුගීසි පූජකයෝ රෝමානු කතෝලික ලබ්ධිය ගෙන මෙහි පැමිණියහ. කෝට්ටේ රජුගේ ආරක්ෂාව හා පෘතුගීසීන්ගේ අනුබලය ලත් ඒ පූජකයෝ ලක්දිව පුරා ඇවිදිමින් ලබ්ධි ප්‍රචාරයෙහි නියුක්ත වූහ. අනුශාසනයට නො නැමෙත්නාවුන් ධනයෙන් ද, එ දෙකට ම නො නැමෙත්නාවුන් අවියෙන් ද සිය ආගමට හරවා ගැනීමෙහි පෘතුගීසීහු සන්තානයෙන් නිරත වූහ. නිල තල — ගම් බිම්, හා ගරු නම් ලබනු කැමැති සිංහලයෝ බොහෝ දෙනෙක් නමින් පමණක් ද, ටික දෙනෙක් ඇත්ත විශයෙන් ම ද ක්‍රිස්තු ලබ්ධිකයෝ වූහ. හිරිහැරයට බියෙන් ක්‍රිස්තු ලබ්ධිය වැළඳ ගත් බානසුලු ඇතැම් සිංහලයෙක් ද මේ අතර විය. මෙසේ පෘතුගීසීන් ගොඩ බට එක් පනස් වැනි හවුරුදුයෙහි එනම් ක්‍රි: ව: 1556 දී මුහුදුබඩ මස් මරන්නන් සමූහයක් ප්‍රසිද්ධියේ ක්‍රිස්තු ලබ්ධිය වැළඳ ගත්තෝ ය. මින් නොබෝ කලකින් 'ද නොරොන්හා' නම් පෘතුගීසි සෙන්පතියාගේ මෙහෙයීමෙන් බියගත් කෝට්ටේ රූකඩ රජයා ද, දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් ක්‍රිස්තියානිය වැළඳ ගත්තේ ය. ධම්පාලයන් ගේ ආචාර්ය 'ද කොණෙඩ' ආදි දෙව්ගැතිවරුන් පහතරට පුරා ක්‍රිස්තු ධර්මය පැතිර වූ එ සමයේ 'ප්‍රන්සිස් ක්ෂාවියර්' පියතුමා යාපනයේ ශිව භක්තිකයන් 'දෙව පුත්‍රයන්' බවට පත් කිරීමෙහි යෙදී සිටියේ ය. එ සමයෙහි ම 'පස්කෝල්' නම් දූව්ගැති කෙනෙක් කන්ද උඩරට ජයවීර රජු කරා එළඹ මහනුවර දෙවස්ථානයක් ඉදිකර ගැනීමට අවසරය ඉල්ලා සිටියේ ය. ජයවීර රජුගෙන් ඊට ලැබුණේ අවසරය පමණක් නො වැ ආරක්ෂාව හා අනුබලයත් ය. එය රට වැසියන් ගේ නො සත්සුත් කාමට හෙතු වුව ද, දෙවස්ථානය ගොඩනැගී දේව මෙහෙය පැවැත්වුණේ ය.

සිංහල රාජ්‍යයේ මේ අභාග්‍ය සම්පන්න සන්ධ්‍යා සමයෙහි විසූ රජ — කුමර — ඇමැති ආදී ප්‍රභූහු ද බෙහෙවින් ආගම වාත්සල්‍යයෙන් තොරවූවෝ ය. ආධිපත්‍යය වූකලී රට ජාතිය හා ආගමේ දියුණුව සඳහා පැවැත්විය යුත්තක් නො වැ ස්වකීය අත්‍යාපනිමත් කාමසුඛානුභවය සඳහා උපයෝගී කර ගත යුත්තක් කොට ඔවුහු සිතූහ. මෙසේ එක් රජෙක් තමනට නො හිමි රාජ්‍යය සඳහා* ද, එකෙක් වෛරයට පිළියම සැව හරින පිණිස† ද, තවෙකෙක් ආරක්ෂාව සඳහා‡ ද ආගම පෙරළි කිරීමෙහි නො පසුබට සජීයන් මෙන් සිතූ විට වූහ.

* ධම්පාල † රාජසිංහ i ‡ ජයවීර

ලක්දිව රාජ්‍ය ප්‍රභූත්වය සියතට ගැනීමට මහදභිලාෂයෙන් සිටි පෘතුගීසීනට කෝට්ටේ හා සෙංකඩගල ප්‍රභූවරයන් කතෝලික ලබ්ධිය වැළඳ ගැනීම මහෝපකාරයක් විය. කෝට්ටේ දොන් ජුවන් පෙරිය බණ්ඩාර, කරල්ලියද්දේ ජයවීර, දෝන කතිරිනා කුමරිය, දොන් ජෝන්, කොනප්පු බණ්ඩාර, දොන් පිලිප්, නිකපිටියේ බණ්ඩාර, මාතලේ විජයපාල, දොන් සමර කෝන්, දෙමිංගු කොරයා, සීමන් කුරේ, දොන් ජෑරනිමෝ අලගියවන්න මොහොට්ටාල, ආදි ඒ ජනනායකයන් නිසා දහස් ගණන් සිංහලයෝ පෘතුගීසි බලය තරකිරීමෙහි යෙදී සිටියහ. මේ සිංහල අධිපතියන් හා සමගම තදනුගාමීන් ද, සිය ගණනින් ක්‍රිස්තු ලබ්ධිය වැළඳගත් හෙයින් මහනුවර රාජ්‍යයේ මධ්‍ය යුගය වන විට සිංහල ගම් නියම් ගම් රැසක් කතෝලිකයන් ගෙන් පිරී පැවැත්තේ ය.

**කතෝලික නිකායට අනතුරු**

පෘතුගීසි රාජ්‍ය බලය බිඳ වැටී ලන්දේසි බලය උදුවත් ම ලක්දිව කතෝලික නිකායට මරු පහරක් වැදුණේ ය. පෘතුගීසීන්ගේ දුෂ්ට කම් නිසා ඔවුන් කෙරෙහි මතු නො වැ කතෝලික ධර්මය කෙරෙහි ද කලකිරී සිටි සිංහල රැටියෝ ලන්දේසීන්ගේ රෙප්‍රමාදු නිකාය වඩා ප්‍රිය කළහ. වැළිත් ඒ සිංහලයෝ කතෝලික ලබ්ධිය හැර දමා රෙප්‍රමාදු නිකාය වැළඳ ගත්හ. ලන්දේසීන් ගෙන් නිලතල හා සැපසම්පත් ලැබිය හැක්කේ, එසේ වූ කල්හි පමණක් බැවිනි. ඔවුනට කතෝලික නිකායයෙහි හෝ රෙප්‍රමාදු නිකායයෙහි අමුත්තක් නො වී ය. කිමෙක්ද යත්? ඒ සිංහලයෝ නියම වශයෙන් ම බෞද්ධයෝ වූහ.* පාරම්පරික රුධිරය දක්වා කාවැදී තිබුණු ඒ භක්තිය ඔවුන් සිත්තුළින් මරණය දක්වා නො මැකිය හැක්කේ විය. ආරක්ෂාවත්, සැප පහසුවත් සලකා පැහැය වෙනස් කරන බොහො ඔත් මෙන් ඔවුහු ලබ්ධිය වෙනස් කළහ.

පෘතුගීසි රාජ්‍යය නමැති මන්දිරයට කතෝලික ලබ්ධිය බලරුකුලක් විය. එහෙයින් නැවත පෘතුගීසි රාජ්‍යය ඇතිවිය නො දෙනු කැමැති ලන්දේසීහු මේ බලරුකුල මුලසුන් කර දැමීමෙහි අධිෂ්ඨාන කර ගත්හ. කොළඹ පාලනය සියතට ගත් 1658 වැනි වර්ෂයේ ම කතෝලික පාදිලි කෙනකුට නවාතැන් දීම, මරණීය දණ්ඩනයට සුදුසු වරදක් බව නීතිමගින් ප්‍රකාශ කළහ. හෙන්ද්‍රික් බැකර් නම් ආණ්ඩුකාරයෙක් කතෝලික නිකායෙහි චාරිත්‍රයක් වූ රූප වන්දනය තහනම් කොට බරපතල දඬුවම් ද පැනවී ය. ෆන්ගොලෑන්ස් නම් අනෙක් ආණ්ඩුකාරයෙක් කතෝලිකයනට පූජක තනතුර සඳහා ඉගෙනීම තහනම් කෙළේ ය. රෝමානු සභාවට අයත් දේවගැතියෝ පෘතුගීසි චරපුරුෂයන් හැටියට සලකනු ලැබූහ.

---

* අලගියවන්න කිවියන් ලාභය තකා කතෝලික ලබ්ධිය වැළඳ ගෙන සිටිය ද, සිතින් නියම බෞද්ධයකු බවට ඔවුන්ගේ 'කොන්ස්තන්තිනු හටන' දෙස් දෙන්නේ ය.

**සිංහල බෞද්ධයන්ගේ උපකාර**

මෙසේ කතෝලිකයනට හිරිහැර ඇති වන්නට පටන් ගත් කල්හි තත් කාලීන සිංහල රජවරු ඔවුනට බෙහෙවින් පිහිට වූහ. විමලධර්මසූර්ය ii, නරේන්ද්‍රසිංහ වැනි රජවරු කතෝලිකයනට පල්ලි ගොඩනගා ගැනීමට— පෙරහර පැවැත්වීමට හා වෙනත් භක්තිපූජාවනට අවසර දුන්හ. එ පමණක් නො වැ, ලන්දේසීන් ගෙන් කතෝලික පූජක පක්ෂය ආරක්ෂා කර ගැනීමට ද නැතක් තැත් දැරූහ. නරේන්ද්‍රසිංහ රජතුමා දෙවමෙහෙය පවත්වන දිනවල දෙව ස්ථානයට ඉටිපන්දම් පවා යැවී ය. ශ්‍රී විජය රාජසිංහ රජ්ජුරුවෝ ක්‍රිස්තුතුමන් ගේ පිළිමයක් බෝලවත්තේ දෙව ස්ථානයට යැවූහ. සිංහල බෞද්ධයන්ගේ මේ සමාදර — කාරුණික ක්‍රියා නිසා නොවේ නම් ලංකා කතෝලිකයෝ මීට වඩා බැරෑරුම් ලෙස ලන්දේසීන්ගෙන් හිරිහැර ලබන්නෝය.

**කතෝලික පූජක-වරුන්ගේ උද්‍යෝගය**

රෙප්‍රමාදු නිකාය නිසා කතෝලික නිකාය මෙසේ පරිහානිය කරා ගමන් ගත් කල්හි පුරුෂ වීර්යයෙන් යුත් ඇතැම් කතෝලික දෙව්ගැති කෙනෙක් හරන ලද ජීවිතාලය ඇතිව ගම් දනව් සැරිසරමින් සව සාමයිකයින් ගේ ලබ්ධිය දූෂි කිරීමෙහි හා අලුතෙන් මිනිසුන් හරවා ගැනීමෙහි ද, යෙදී සිටියහ. ගෝවෙන් යාපනයට පැමිණි ජුසේවාස් පියතුමා එබන්දෙකි. පුත්තලමේ හා නුවර පළාතේ ඇවිදිමින් දෙවධර්ම ප්‍රචාරයෙහි නියුක්ත වූ වාස් පියතුමා ලාංකිකයන් ගේ සම්මානනයට පාත්‍ර වූවෙකි. මහනුවර සමයෙහි කතෝලික නිකායට නව ජීවනය දුන්නෝ මේ පියතුමෝ ය. මහනුවර මසූරිකා රෝගය පැතිරී ගිය කල වාස් පියතුමන් දැක්වූ කරුණාශීලි පරාක්‍රමය නිසා රාජසිංහ ii රජ්ජුරුවෝ ද මේතුමන් කෙරෙහි අනුකූල බවක් දැක්වූහ.

අනතුරු ව ලක්දිවට පැමිණි ජාකෝමේ ගොන්සාල්වෙස්, ජෝසප් ද ජේසු මරියා, මනුවෙල් ද මිරන්ද, මිගෙල් ද මැල්ලෝ, ඉග්නේසියස් ද අල්මේද, ආදි දෙව්ගැති වරුන්ගේ ක්‍රියා කලාපය කතෝලික නිකායට බෙහෙවින් වැඩදායක විය.

**බෞද්ධයන්ගේ-අනාදරය**

සිංහල බෞද්ධයන් ගේ යථෝක්ත කාරුණික ක්‍රියා අස්ථානයෙ යොදා ගත් ඇතැම් කතෝලික දෙව්ගැතිවරු මහජනතාව ගේ හැඟීම ගැන නො සලකා ක්‍රියා කළහ. බෞද්ධයන් ගේ ආදරය යට වී අනාදරය මතු වීමටත්, සාමය යට වී දණ්ඩය ඇතිවීමට ත් හේතු වූයේ ඒ අවිචාර ක්‍රියා කලාපය යි. ජුසේ වාස් 'ශ්‍රෙෂ්ඨ' තුමන් විමලධර්මසූර්ය ii රජුගේ සේවකයන් සමූහයක් බවුතිස්ම ගැන්වූ විටත්, ගොන්සාල්වෙස් පියතුමන් බෞද්ධ භික්ෂුවක් මර්ස්ලීන් නමින් ප්‍රසාදස්නානය දෙවූ විටත්,

මහජනයා කැලඹී ගියේ ය. බුද්ධාගමට විරුද්ධ ව ගොන්සාල්වෙස් පියතුමන් ලියූ පොතක් දුටු නරේන්ද්‍රසිංහ රජුගේ ඇමැතියෝ මහත් සේ කෝප වූහ. කවර කරුණක් නිසාවත් ස්වකීය උත්ථානයටත්, පැවැත්මටත් අසහාය හේතු වූ නිර්මල බුද්ධාගමට දෙස් නගනු දැකීම ඒ සිංහලයෝ නො රිස්සූහ. මේ සමග ම උපායප්‍රවීණ ලන්දේසීහු බුද්ධාගමේ දියුණුවට හේතු වූ ක්‍රියාවන් ට උපකාර කළහ. මෙ රට උපසම්පදාව පිහිටුවීමට සියම් රටින් භික්ෂූන් ගෙන්වීම සඳහා යවන ලද්දේ ලන්දේසීන් ගේ නැව් ය. මෙසේ සිංහලයන් කතෝලිකයන් කෙරෙහි කලකිරී රෙප්‍රමාදු ලබ්ධිකයන් කෙරෙහි පැහැදීමට පටන් ගත්තෙන් ලංකා කතෝලික සභාව ක්‍රමයෙන් පරිහානි පක්ෂය භජනය කළා ය.

**කතෝලික සිංහල-සාහිත්‍යයේ ආදි-කතුවරයා**

ජුසේවාස් පියතුමන් ඇතුළු ලංකාවට පැමිණි පූජකවරුන් අතුරෙන් ලංකා කතෝලික සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ඉතා ගෞරවයෙන් සිහි පත් කළ යුත්තෝ නම් 'ජාකෝමේ ගොන්සාල්වෙස්' පියතුමෝ ය. සිංහල භාෂාවෙන් පළමු වරට කතෝලික ග්‍රන්ථයක් ලීවෝ — මෙ තුමෝ ය. ජුසේවාස් පියතුමන්ට සහාය වනු පිණිස ගෝවේ සිට ක්‍රි: ව: 1705 දී ලංකාවට පැමිණි ගොන්සාල්වෙස් පියතුමා සිංහල හා දෙමළ මැනවින් උගත්තේ ය. ඊට පසු ජුසේවාස් 'ශ්‍රේෂ්ඨ'තුමන් දෙමළ බසින් සම්පාදනය කොට තිබූ ඥාන — උපදේශ — ප්‍රාර්ථනා — පාද නමස්කාර — ජපමාලා — අභිරහස් ආදි සුළු යාඥා ග්‍රන්ථ කිහිපයක් සංශෝධනය කිරීමෙන් සිංහල භාෂාවට පරිවර්තනය කෙළේ ය. එ කල මෙරට කතෝලිකයනට මුද්‍රණ යන්ත්‍රයක් නො වූයෙන් 'කම්මල' නම් ගමින් කැඳවා ගත් ලිපිකරුවන් දෙළොස් දෙනකු ලවා මේ ලිපි තල්පත්හි ලියවන ලද්දේ ය. අනතුරු ව ගොන්සාල්වෙස් පියතුමා ලංකා කතෝලික නිකාය උත්ථානයට පත් කිරීමේ මහාව්‍යාපාරයක යෙදුණෝ ය. ඒ වනාහි කතෝලික පූජකයකු එළියේ හැසිරීම තමාට පමණක් නො ව, අසල් වැසියනට ද, මරු කැඳවන භයානක අවස්ථාවකි. ලංකා කතෝලික නිකාය උත්ථානයට පත් කිරීමෙහි ගොන්සාල්වෙස් පියතුමන් වෙත පැවැති උද්‍යොගයත් අභිලාෂයත් ඉඳුරා පැහැදිලි වන්නේ මේ අවස්ථාවෙහි එ තුමන් කළ සේවයෙනි. ජුසේවාස් පියතුමන් ගේ ඇවෑමෙන් නායක දෙව්ගැති තනතුරට ද පත් කරනු ලැබූ මෙ තුමා පසු කල මහනුවර නැවති සිටියේ ය. මෙ සමයෙහි එක් උදයක ඇනුම් අරින පියතුමන් ගේ හනුව අවසන්ධි විය. මූඛය පැත්තකට හැරී හක්ක ද වක් ව ගියේ ය. නො එක් වෙදුන් ලවා පිළියම් කරවූ නමුත් සුවය නම් නො පැමිණියේ ය. නරේන්ද්‍රසිංහ රජු ද මෙහි දී පියතුමනට වෙදුන් යැවීම් ආදියෙන් සිය කරුණාව දැක්වූයේ ය. මේ අභාග්‍යසම්පන්න

රෝගය පියතුමනට විරූපයක් හා කතෝලික සභාවට පාඩුවක් ද විය. එහෙත් එම රෝගය සිංහල සාහිත්‍යයට නම් සුරූපයක් හා ලාභයක් ගෙන දෙන්නක් වූයේ ය. දේශනා කිරීම නවත්වා පොත් පත් ලිවීමෙහි ගොන්සාල්වෙස් පියතුමන් යෙදුණේ මීට පසුව හෙයිනි.

**කතෝලික සිංහල-සාහිත්‍ය ග්‍රන්ථ**

ගොන්සාල්වෙස් පියතුමෝ සිංහල හා දෙමළ බසින් පොත් පත් රැසක් ලියූහ. ශබ්දකෝෂ කිහිපයක් සම්පාදනය කළහ. එතුමන් ලියූ දේව වේද පුරාණය, දේව වේද සංක්ෂේපය, සුවිශේෂ විසර්ජනය, වේද කාව්‍යය, දුක්ප්‍රාප්ති ප්‍රසංගය, ඥානාඤ්ජනය, ප්‍රාතිහාර්යාවලිය, සුකෘතදර්පණය, දේවනීති විසර්ජනය හා බුද්ධ බණ ප්‍රත්‍යක්ෂයත් කතෝලික සිංහල සාහිත්‍යයෙහි ප්‍රමුඛ ග්‍රන්ථයෝ යැ. ශබ්දකෝෂ කිහිපය අතරු පෘතුගීසි — සිංහල — දෙමළ මහා ශබ්දකෝෂය අග තැන් ගනී. මේ පොත් ලිවීමේ පරමාධ්‍යාශය කතෝලික සිංහලයනට 'ආගම සත්‍යය'ත් විස්තර කර දීම විය. ඇතැම් පොතක් සමසමයට වැඩිපුර ජනයා බඳවා ගැනීම පරමාර්ථ කොට ලියන ලද්දේ ද විය. මේ අතර තවත් පොතක් ලියූයේ, බෞද්ධ — රෙප්‍රමාදු ආදි අනික් ආගමක් හෙලා දකිනු සඳහා ය.

මේ පොත් පෙළෙහි ම දක්නට ලැබෙන රචනාශෛලිය මෙතෙක් විස්තර වූ සිංහල ග්‍රන්ථයන්හි නො ආවේකි. මේ පොත්හි පැනෙනුයේ පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන් ගේ වචන — ගැමි වහරෙහි පැවැති වචන, හා භාෂාන්තර වචනයන් ගේ සංකලනයෙන් ඇති කර ගත් සිංහල වාක් වින්‍යාසයකි. ඒ වූකලි යම් තම් සිංහල උගත්තකු භාෂාන්තර ග්‍රන්ථයක් පරිවර්තනය කිරීමෙහි ඇතිවෙන ස්වරූපය දක්වයි. මේ අනුව හෙළකවියකුගේ ශ්‍රේෂ්ඨ කෘතියකින් අත්වන ප්‍රයෝජනය මේ පොත් පෙළින් ම නො ලැබී යයි. ඒ එසේ වුවද, විදේශිකයකු ගේ මේ උත්සාහයෙන් සිංහල සාහිත්‍යයට යම් කිසි සේවයක් නො සැලසුණේ නොවේ. එ බැවින් ඒ සේවය සාහිත්‍යකාමීන් ගේ ගෞරවාදර සම්මානනයට පාත්‍ර වන්නේ ම ය. ගොන්සාල්වෙස් පියතුමන් ගේ ග්‍රන්ථයන් අතරු පෘතුගීසි — සිංහල — දෙමළ මහා ශබ්දකෝෂය පඬුවන් ගේ විශේෂ සැලකිල්ලකට භාජන වේ. එක පෘතුගීසි වචනයකට සිංහල අර්ථ දසයක් හෝ දොළොසක් දීමට ගොන්සාල්වෙස් පඬිවරයෝ සමර්ථ වූහ. සිංහල ගැමියන් ගේ ව්‍යවහාරයෙහි පැවැති බොහෝ වචන ගණනක් උගත හැකි වීම මේ ශබ්දකෝෂයෙන් නවීනයනට අත් වන ලාභය යි. එ තුමාගේ අවශේෂ කෘතින් බැලීමෙන් ද එ බඳුම අප්‍රකට වචන මාලාවක් දැන ගත හැකි ය. තත්කාලීන සමාජ තත්ත්වයේ යම් යම් තොරතුරු අනාවරණය කර ගත හැකි වීම ගොන්සාල්වෙස් කෘතීන් ගෙන් ලැබෙන තවත් ප්‍රයෝජනයකි.

පොත පතින් නොවැ, මවින්පිටින් සොයා ගැලපීමෙන් සකස් කරන ලද ප්‍රසථාව පිරුළු රාශිය පාඨකයාට මෙම කෘතීන් අමිනක නො වීමට හේතුවක් වේ. මේ කරුණු නිසා ගොන් සාල්වෙස් පියතුමාත්, එතුමාගේ කෘතිනුත්, වාතීමානිකයන් විසින් ආදරයෙන් සිහි පත් කරනු ලැබේ.

## දෙව වෙද පුරාණය

කර්තෘ:— ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
කාලය:— ක්‍රි: ව: 1712 - 41 අතර
ප්‍රමාණය:— පරිච්ඡේද 30

කතෝලික සිංහල සාහිත්‍යයෙහි අතිශය විශාල වූ ග්‍රන්ථය නම් මේ දෙව වෙද පුරාණය යි. මහනුවර ගද්‍ය සාහිත්‍යයේ විශාල ග්‍රන්ථයන් අතර මෙ ද එකකි. දෙව වෙද පුරාණයේ මුල් පොත පැවැත්තේ පද්‍යයෙනි. ඒ වූකලි තෝමස් සවීවන්ස් නම් ඉංග්‍රිසි ජාතික දේවගැතිවරයකු විසින් 'කොන්කානි' භාෂාවෙන් රචනා කරන ලද්දකි. ක්‍රි: ව: 1712 දී මේ පොතෙන් පිටපතක් දුවාර්ත්තේ ආරච්චි තැනගෙන් ලත් ගොන්සාල්වෙස් පියතුමා එය සිංහල ගද්‍යයට නගා සංක්ෂෙප කරමින් දෙව වෙද පුරාණය සැපයී ය. මෙ ගත්කතුවරයන් ගේ මෙ පොතෙහි පමණක් නො වැ අන් එකද ග්‍රන්ථයකවත් රචිත වර්ෂය සඳහන් නො වේ. එ නමුත් මේ පොත් පෙළ ලියන ලද්දේ ක්‍රි: ව: 1712 සහ ගත්කරුගේ අභාවය වූ ක්‍රි: ව: 1742 අතර ඇති තිස් වස තුළ බව ප්‍රකාශිත යි. එ බැවින් ගොන් සාල්වෙස් කෘතින් මේ තිස් වසෙහි ලා රචිත වූයේ සලකනු යෙදේ.

බයිබලයේ මුල් පොතේ සිට දශීන පොත දක්වා ඇතුළත් සියලු කරුණු සැකෙවින් දෙව වෙද පුරාණයේ අන්තගීත වෙයි. අතරින් පතර මුඛ පාරම්පරික කථා ද දශීශිත යැ. ප්‍රමාණ වශයෙන් කාණ්ඩ දෙකකින් යුක්ත වූයේ, පරිච්ඡේද තිසකින් සමන්විත ය. පරිච්ඡේද අටවිස්සකින් යුත් පුරාණ ගිවිසුමට අයත් කරුණු ප්‍රථම කාණ්ඩයේ දක්වේ. දෙවැනි කාණ්ඩයේ පරිච්ඡේද දෙකින් අලුත් ගිවිසුමට ඇතුළත් කරුණු විස්තෘත යැ.

සිංහල භාෂාව විෂයෙහි මේ විජාතික පඬිවරයා තුළ කෙතරම් පෘථුල දැනීමක් තිබුණේ දැ යි දැනගැනීමට දෙව වෙද පුරාණය කැඩපතකි. ක්‍රිස්තියානි ධම්යෙහි සුබාවබොධයට මෙතරම් පොතක් තවමත් සිංහලෙන් ලියවී නැති. ග්‍රන්ථයේ දක්වෙන සියගණනින් පරිමිත උපමාවන් අතර කිහිපයක් මෙසේ යි.—

i "ගිත්තෙන් උනු වූ ඉටි දිය සිලිලසින් දූසිමුවාසේ."

ii "එක ම ඉරුරැසින් ඉටි උනුව ද මඩ දූසිව ද යන්නාසේ"

iii "ලක්‍ෂ දහස් කුරුකුහුඹින් එක කකුලෙන් පොඩිකලාක් මෙන්"

iv "පොළගාට නෙළුම් මලක් දී මා දණට කරන්ට එපා කීවා සේ"

v "දුමට හයිත් ගින්නට පනින්නාක් මෙන්"

නිරුක්ති සෙවීමෙහි ලා පඬුවන් වෙහෙස කරවන දහස් ගණන් වචනයන් අතුරෙන් කිහිපයක් මෙසේ යි.—

අමණ්ඩ (යටත්), ඇයා (ඉත්තෑවා), ඉවාලන (පැලවෙන), උබය (කලිසම), උත්කිනිච්චිය (නියමකර ගැනීම), ඌන මානය (ගොලු), තුනිත්ව් (වීයකී), අඥයම (කඳවුර), අනසන (හිමිනැති), කලකුඩුවෙන (පවුල්වෙන);

## දෙව වෙද සංක්‍ෂෙපය

ගොන්සාල්වෙස් පියතුමා දෙව වෙද පුරාණයට අනතුරු ව එහි සාරාංශය ප්‍රශ්නොත්තරයට නගා 'දෙව වෙද සංක්‍ෂෙපය' රචනා කළහ. 'පුරාණය' ඉගෙන ගන්නවුනට 'අත්වැල්' පිමත් ආගම නො දත් ආධුනිකයන් ගේ ධර්මඥනය වර්ධනය කිරීමත්, එහි ප්‍රයොජනය කොට සලකන ලද්දේ ය. පාර්‍ශ්ව විසර්ජන වශයෙන් මෙහි දක්වූයේ උද්ග්‍රහණයට මෙන් මැ අභ්‍යාසයටත් ලෙහෙසි මගක් හෙයිනි. මේ ග්‍රන්ථය අභිව්‍යක්තියෙන් යුක්ත ය. සුදුසු තන්හි ආ උදාහරණ වාක්‍ය සමූහය එයට බල රුකුලකි. පොත පතින් පමණක් නො වැ වටපිටිනුදු සොයා ගත් එම උදාහරණ වාක්‍යයෝ කරුණු ව්‍යක්ත කරනු සඳහා සුදුසු පරිදි උපයුක්තයහ.

i "ගෝදුම පූපයෙහි පවත්නා දෙව රූපය, පූපය කැබලි කළ කල්හි සියලු කැබලි වල ම සම්පූර්ණයෙන් පෙනෙන්නේ ය. කණ්ණාඩිය බිඳුනු විට සියලු කැබලි වල මූහුණ සම්පූර්ණ ලෙස ම පෙනෙන්නාක් මෙනි."

ක්‍රියා පාන කරුණ සවුට කරලීම පිණිස යෙදූ ප්‍රස්ථාව පිරුළු ද මේ ග්‍රන්ථයෙහි බෙහෙවින් ආයේ ය. එම් ඉන් කිහිපයකි.

i "කඩුවෙන් කොටන අය කඩුවෙන් ම නසී."

ii "ගෙඩි බලා වෘක්‍ෂය ඇඳින ගන්නා සේ ක්‍රියා බලා මනුෂ්‍යයා ඇඳින ගත යුතු යි."

iii "තමා ගේ ඇසේ තිබෙන දූවක් නො බලා අනුන් ගේ ඇහේ තිබෙන රොඩ්ඩක් බලන්නේ කිම ද?"

iv "ඉල්ලූ අයට ලැබේ."

v "නඟුල අතින් අල්ලා පස්ස බලන කෙනෙක් මෝක්ෂ රාජ්‍යයට හේතුකාරයා නො වේ."

ග්‍රන්ථයෙහි දක්වෙන ජේසු ස්වාමි දරුවන් ගේ දේශනාවන්හි ඇතුළත් මහාර්ඝ උපදේශයෝ මෙ වැනි පිරුළුවලින් සමර්ථනය කරන ලද්දේ ය.

පොළොවේ විස්තාරය, ආකාශ වස්තූන් පිළිබඳ විස්තරය, මිනිසුන්ගේ ජිවි වර්ණ භේදය ආදි ආගමට "අඩුත්තු" (ඇතුළත්) නො වන ඇතැම් කරුණු ද මෙහි තැනින් තැන ආයේ ය. ග්‍රහ අපල ආදි තත් කාලීන ඇතැම් අයගේ විශ්වාසයට පහර දෙමින් ඒ පිළිබඳ ස්වකීය විනිශ්චය දක්වා ගෙන හැර පෑ කරුණු ද මෙහි සංග්‍රහ වූයේ ය.

ග්‍රන්ථ විභාග වශයෙන් මෙ පොත කොටස් අටවිස්සකින් යුක්ත ය. ඒ අටවිසි විභාගය හඳුන්වන්නේ 'ප්‍රශ්න' නාමයෙනි. එහි සංගෘහිත ප්‍රශ්න සංඛ්‍යාව අට සියයකි.

ග්‍රන්ථය සැපයීමේ දී රොබර් ද නෝබිලි දෙව්ගැති වරයන් ගේ "සත්තිය වේදගම සංක්ෂේපම්" නම් ද්‍රවිඩ ග්‍රන්ථය ආශ්‍රිත බව සලකනු ලැබේ. සෙසු ග්‍රන්ථයන්හි මෙන් ම මෙහි ද අප්‍රකට වචන රාශියක් දක් වේ. ඉනිදු කිහිපයක් මෙසේ හි.

පඩිමාව (ක්‍රමය), උසවු (කුමන්ත්‍රණ), හුනර (වල්ගය), බලප්පත්තු (බලහත්කාරකම්), කූට්ටරච්චි (සමූහය), සික්ෂා (දුක්), කොලදිම (ගොයම් පෑගීම), තොලිල් (කර්මාන්ත), වර්තමාන (පුවත්).

## සුවිශේෂ විසර්ජනිය

ඉරු දින— ණය මඞ්ගල දින හා කතෝලිකයන් ගේ වෙනත් ප්‍රසිද්ධ මඞ්ගල දිනයන්හි කියවන වාක්‍ය පාඨයෝ 'සුවිශේෂ' නමින් හැඳින් වෙති. මේ 'සුවිශේෂ' පාඨයන්හි ක්‍රිස්තු ස්වාමි දරුවන් ගේ චරිතය— ධර්මදේශනා— උපදේශ— උපමා කථා— ප්‍රාතිහාර්ය— දුක්ඛප්‍රාප්තිය— මරණය— ස්වර්ගා රෝහණය යන කරුණු විස්තර වන්නේ ය. මඞ්ගල දින යන්හි දෙවස්ථානයේ ප්‍රසාදි තුමන් මිහිරි හඬින් කියවන විට භක්තිමත් කතෝලිකයන් ප්‍රීතියෙන් සවන් දී සිටින්නේ මේ 'සුවිශේෂ' පාඨයන්ට ය. මේ පාඨයනට විස්තර ලියමින් කළ ග්‍රන්ථය 'සුවිශේෂ විසර්ජනිය' නමින් හැඳින් වේ. බෞද්ධයනට අටුවාව මෙන් කතෝලිකයනට සුවිශේෂ වාක්‍යාර්ථයන් තෝරා ගැනීමෙහි මේ 'විසර්ජනිය' බෙහෙවින් උපකාරය. එක් අතකින් මේ ග්‍රන්ථය ආගමික ලිතක් හා සමානය. මේ ග්‍රන්ථය උසස් වන්නේ සුවිශේෂය නිසා නො වැ, විසර්ජනිය නිසා යැ.

"ක්‍රිස්තු තුමන් උපන් විට පළමුවෙන් රජ රජාමාත්‍යා දීන් ට නො දන්වා එඬේරුන්ට දන්වූයේ මන්ද?

ii "තුන් රජුනට ජේරුසලම් නුවරදී තාරකාව නො පෙනී ගියේ මන්ද?"

iii "ක්‍රිස්තු ස්වාමිදරුවන් ලෝකයාගේ ඉපදීමටත් විනාශය ටත් හෙතු වන්නේ කෙසේ ද?"

iv "ස්වාමිදරුවන් ඇතකු අශ්වයකු නො නැග කළුඳුවකු අරුවැඩියේ මන්ද?

v "එතුමා කුරුසයේ ඇණ ගසනු ලැබීමට කැමැති වූයේ මන්ද?"

ආදි ක්‍රිස්තු චරිතයෙහි වටනා කොටස් සහ ධර්මයෙහි සැල කිය යුතු කරුණු සමූහයක් දැන ගැනීමට මේ පොත අදාළ වන්නේ ය.

## වේද කාව්‍යය

ක්‍රිස්තු චරිතය කථා ශරීර කොට ගොන්සාල්වෙස් පියතුමන් ලියූ මේ පද්‍ය ග්‍රන්ථය කතෝලික ජනතාවට භක්ති කාව්‍යය කි. ආරම්භයෙහි දක්නා ලැබෙන අට සැටක් පද්‍යයෝ මනුෂ්‍යයා මැවීම තෙක් ලොකාරම්භ කථාව විස්තර කිරීම සඳහා උප යුක්තයහ. එහි දෙවියන් හැඳින්වීම, සුඛවූ ත්‍රිත්වය, දෙවදූතයන් මැවීම, සුගති උයන, හා මනුෂ්‍යයා මැවීම යන කරුණු විස්තර කරන ලද්දේ ය.

අනතුරු ව දෙව්මවගේ උපතෙහි පටන් දෙව පුත්‍රයන් වහන්සේ ගේ ස්වර්ගාරොහණය තෙක් කරුණු විස්තර විය. දෙව දූතයන් දැකීම, ජේසු තුමන් ගේ උත්පත්තිය, තුන් රජ දරුවන් පැමිණීම, ඊජිප්තුවට යෑම, දෙව මාලිගාවේ නැවතීම, යෝර්දන් නදිය, යක්ෂයා ගේ පරීක්ෂාව, ශිෂ්‍යයන් තෝරා ගැනීම, දස පණත, ජේරුසලමට වැඩීම, දෙව ප්‍රාතිහාර්‍ය්‍ය, ජුදසින්ට පාවා දීම, වධ කිරීම, මරණයට ගෙන යෑම, මෑණියන් හමු වීම, කුරුසයේ මරණය, කුරුසයෙන් බෑම, නැගිටීම, හා සුර ලොව වැඩීම යන ක්‍රිස්ත්වාවදානයේ සිදුවීම් ප්‍රස්තුත කොට ගෙන මේ කොටස ලියන ලද්දේ ය.

බෞද්ධ කවීන් මෙන් වන වර්ණනාදී විට පිට කරුණු ගෙන අභිරමනීය කාව්‍යයක් තැනීමට නො වැ ගොන්සාල්වෙස් පියතුමාට අභිමත වූයේ ස්වකීය ආගම් කතුවරයන් ගේ දිව්‍යාවදානය විස්තර කෙරෙමින් තදීය ආගම් ධර්මයෙහි මිනිසුන් හික්ම වීම ය.

'නොම දූන යුතු හස ර
යනෙතු නොම වෙයි පැණස ර
ආගම සැමට පෙ ර
කියමි අස සීහලෙන් කවි කා ර'

යයි ගත් කරුවෝ ආරම්භයෙහි ම එ බව කිහ.

ගොන්සාල්වෙස් පියතුමා මෙ කව කිරීමේදී ගුත්තිලය බුදුගුණාලංකාරය හා කුසදවත් ආශ්‍රය කරන ලද්දේ ය. මෙයිනුදු බුදුගුණාලංකාරය විශෙෂයෙන් ආශ්‍රිත යි.

අ තිත් රැගත් කුසුම් ද මි ත්
සි තිත් රැගත් මුනි සදමි ත්
බැතිත් අයෙක් ඇති පදමි ත්
නිතිත් මුනිඳු යෙති පුදමි ත්

යන බුදුගුණාලංකාර පද්‍යයේ ඡායාව වෙද කාව්‍යයට ඇතුළත් වූයේ මෙසේ යි.

'අ තිත් රැග ත් අතු ගසමි න
සි තිත් රැග ත් පෙම අදරි න
මූ වෙ න් කිය ත් තුති වදනි න
සු රි න් දු යත් මෙසෙ පුද යෙ න'

භාෂා තත්වය හා කාව්‍ය රීතීන් අනුව වෙද කාව්‍යයට අත්වත්තේ සිංහල කාව්‍ය ග්‍රන්ථයන් අතර කණිෂ්ඨ ස්ථානයකි. අප ශබ්ද, විකෘත පද, පුනරුක්ත, පද සන්ධාන, යතිභ්‍රංශ, හතවෘත්ත, යවහන් ආදි දෙස් රැසකින් මෙ කව කැඩතොලු වී ගිය හෙයිනි.

මේ මෙසේ වුවද, වෙද කාව්‍යයෙහි පාඨකයා ගේ සිත් ගන්නා තැන් නැත්තේ ද නො වේ. "කුරුසයේ මරණය" පිළිබඳ කොටසෙහි දැක්වෙන දෙව මාතා විලාපය කරුණ රසයෙන් ආර්ද්‍රව ගිය තැනකි.

'කී ප කල්පයක් තිලෝක ජීවමාන දිව නෙ තා
දී ප දූප දජ පතාක කුඹ කොසි ළත් නිති ප තා
මී ප ජේසු නසරේ ගේ දිවි ගිය සතුරන් අ තා
රූප සාර කන්නි මැණි සෝක බෝය ඒ සි තා

ආදි කියවන්නා මෙන් ම අසන්නා ද පිනා යන සේ හඬ නැගෙන පද්‍යයන් නිසා 'වෙද කාව්‍යය' කවියන්ගේ ප්‍රසාදයට හිමි වේ.

## දුක් ප්‍රාප්ති ප්‍රසංගය

සවකීය අමරණීය නාමය සමස්ත ජනතාවට මිණි කොඬොල් කළ, කරුණා ප්‍රවාහයෙන් දස දිගන්තරය සොඳ හැර සහශ්‍ර සංඛ්‍යාත ශ්‍රාවකයනට ශාන්ත මූක්තිය සැලසූ මහොත්තම ශාස්තෘවරයෝ දෙදෙනෙක් ලෝවැසියනට මොක්ෂ

සුඛය ලඟා කර දීමේ බලාපොරොත්තුවෙන් අති කඨින, දුෂ්කර විවිධ දුඃඛයන් අනුභව කිරීමෙන් මිනිස් සිතක් ඇති හැම සත්ත්වයකු ම සංවේගයෙන් කම්පිත කොට ලොවට යම් කිසි ආදර්ශයක් තැබුවෝ ය.

අනෝමා නදීතීරයෙහි පැවිදි ව, චණ්ඩසූර්ය්‍යාතාපය හෝ ධාරා නිපාතයෙන් කඩා හැලෙන වර්ෂාව නිසා ගෙයක් නො සොයා අභ්‍යවකාශයෙහි වැස, රජ කුලයෙහි සුගන්ධ ශාලි භෝජනයෙන් පිනූ රස නහරයන්, ලුණු නැති පිලුණු කැඳින් තෙත් හෝ ඉඳි වැටුණු රුක්පතින් හෝ සතපා කුස පිරූ, එහෙයින් ම, ගිලී ගිය දෙනෙතින්, ඉල්පී ගිය නහරින්, මැහැර ගිය සිරුරින්, සිඳී ගිය ලෙමසින් යුතු වැ මාරණාන්තික වැ බිම වැටී හොත් ශ්‍රී සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය සිංහ සර්වඥ ස්වාමි දරුවෝ පළමු වැන්නෝ ය.

දෙවැන්නෝ වූකලි ජේරුසලම් නුවර අමානුෂික ජුදයන්ගේ පාපිෂ්ඨ අත් වලට හසු වැ, හිසෙහි ගැසූ තියුණු කඩුවෙන් සිල් වැ අනවරතයෙන් කඩා හැලෙන රුධිර ධාරාවෙන් නැහැවී තැලී පොඩි වී ගිය මුහුණින්, පුපුරාගිය පිට සමින්, කැඩී බිඳී ගිය අඟ පසඟ වලින් නො හඳුනාගත හැකි තරම් විරූප වෙශධාරි ව මහ පිරිස් මැද නිරුවත් කොට කපාල කන්දෙහි සිටවුණු කුරුසයෙහි ඇන ගසා මරණු ලැබූ, දෙව් පියාණන් ගේ පුත්‍ර දයා සාගර පාරග ජේසු ක්‍රිස්තු ස්වාමි දරුවෝ ය.

ගලක් මෙන් දැඩි ලයක් ඇත්තකු වුවද, තමන් උදෙසා ස්වකීය මහෝත්තම ශාස්ත්‍රෘවරයන් විඳි මේ දුක් රාශිය ඇසීමෙන් දෙනෙතින් සැලෙන කඳුලින් යුතුවැ, ශොක කරනු නො අනුමාන ය. මේ නිසා උභය සාමයිකයෝ ම ස්වකීය ශාස්ත්‍රෘ වරයන් වහන්සේ ගේ මේ දුක්ඛ ප්‍රාප්ති ප්‍රසඞ්ගය සංවේගාලීඪ වාක් මාලාවෙන් විස්තර කොට දැක්වූවෝ ය.

ගොන්සාල් වෙස් පියතුමන් ගේ 'දුක් ප්‍රාප්ති ප්‍රසඞ්ගය' ද ලියන ලද්දේ ඒ මේ අදහසිනි. ජේසු ස්වාමි දරුවන් ජුදයන් අතට හසු ව විඳි දුක් රැස මේ ග්‍රන්ථයෙහි දෙශනා නවයකට බෙදා දක්වන ලද්දේ ය. භක්තිමත් කතෝලිකයා සෝ සයුරේ පතුලට ම කිඳවන එකී දෙශනාවෝ පියතුමන් ගේ වේගවත් වාක් ධාරාව නිසා අන්‍ය සාමයිකයින්ගේ වුවද, දෙ ඇසින් කඳුළු සැලීමෙහි සමර්ථයහ.

මෙය ලියූයේ ඉදිරියෙහි සිටින පිරිසකට සාධ්‍ය විකාන්ති යෙන් දෙශනා කරන විලාශයෙනි. ශත වර්ෂ දෙකකට පමණ පෙර ශසංකබගල හා මුහුදු බඩ නගරයන්හි ද, මහරුක් සෙවනෙහි එක් උරයක් වසා දමාගත් සරමකින් සැරසුණු සිංහල ගැමියන් සමූහයකට ක්‍රිස්තු සමය දෙශනා කිරීමෙහි යෙදුණ පාදිලි කෙනකුන් දැක එතුමන් ගේ දෙශනය ඇසීමට

කැමති නම් මේ 'දුක් ප්‍රාප්ති ප්‍රසඞ්ගය' පෙරලිය යුතු ය. එක් එක් දේශනාවසානයෙහි 'දයාධික මනස්තාපය' ක් දක්වා පවිත්ර්දෙන සේ ශ්‍රාවකයන් ගිවිස් වන්නේ ය.

ග්‍රන්ථයෙහි භාෂාතත්ත්වයත් දේශකයාගේ වාක් විලාශයත් දැන ගැනීමට උපකාර වන ග්‍රන්ථ පාඨයක් මෙසේ යි:—

"අය්යෝ! මාගේ කුමාරයෙනි! මාගේ ජීවිතයෙනි! මාගේ රත් ආභරණයෙනි! මේ ඔබගේ ශ්‍රී මුහුණ දෝ? දිව්‍ය කාන්තියෙන් දිලිහි දිලිහී තිබුණේ මේ මුහුණ දෝ? චන්ද්‍ර සූර්‍ය්‍ය පරදවා තිබුණේ මේ මුහුණ දෝ? සුරලොව ඇත්තන් ප්‍රීති කරවා දුටු දුටු වේලෙහි මා සතුටු කරවා තිබුණේ මේ මුහුණ දෝ? අහියෝ මාගේ රම්බර කුමාරයෙනි! කවුරු ඔබට ගාවිනා කෙළේ ද? කවුරු නුඹේ සියළු රූප සවභා මකා මෙලෙස අවලක්ෂණ කෙළේ ද?"

දයාව, ඉවසීම, ආදි මහඟු ගුණධර්මයන් ඇති කර ගැනීමට සුදුසු උපදේශයෝ ද තැනින් තැන ආවාහු වෙති. බුත්සරණ, පටාචාර කථාව, වෙස්සන්තර කථාව හෝ මහා පරිනිබ්බාන සූත්‍රය කියවන බෞද්ධයකු සංවේගයෙන් කම්පිත වන්නේ යම්සේ ද මේ ග්‍රන්ථය අසා කතෝලිකයන් ලබන ශෝකයත් එබඳු යැ.

## ඥානාඤ්ජනය

සව පාක්ෂිකයන් සුසිරිතෙහි හසුරුවාලීම පරමාර්ථ කොට පියතුමන් ලියූ ග්‍රන්ථ කිහිපය අතර 'ඥානාඤ්ජනය' ද එකකි. මනුෂ්‍යාත්මයෙහි වටනාකම ආදි මාතෘකා පාඨ දෙළසක් යටතේ මෙය ලියන ලද්දේ ය. එම් මාතෘකා පාඨ අනුව මෙ ගත පරිච්ඡේද දෙළසකට බෙදෙන්නේ ශ. එකී පරිච්ඡේද යත් හැඳින්වෙන්නේ 'සමාති' නාමයෙනි. මේ "සමාති" අවසන් වන්නේ—

> "මේ ඥානාඤ්ජනයෙන් ඇස් ඇර කළ පාපයට දුක්වන සංතාපයෙන් අඹා දෙවියන් වහන්සේට යාඥ කරවිව හෝ කත්තලා කියවිව" යනුවෙනි.

කාම් සුවෙහි ලොල් වැ එහෙයින් ම දුසිරිතෙහි ඇලී වසන්නවුන් අනන්තර භවයෙහි ලබන දුක්ඛ විපාකයෙන් භය ගන්වා මරණානුස්මෘතියෙහි යොදවමින් සුසිරිතට හරවා ඔවුනට මෝක්ෂ-ධර්ම-ප්‍රසාද සඞ්ඛ්‍යාත දිව්‍ය සම්පත් සාධා ගන්නා සැටි ඥානාඤ්ජනයෙහි විස්තෘතව ආයේ ය. කියන කාරණය සවුට වන සේ නිදර්ශන—සංදර්ශනය කිරීම ගත් කරුට මැනවින් පුරුදුව තිබුණු බවට මේ ග්‍රන්ථය ද දෙස් දෙයි. මෙහි එන බොහෝ විස්තර බෞද්ධ අදහස්වලට සාකල්‍යයෙන් සමානයහ-

i "න තං මාතා පිතා කයිරා" යනුවෙන් ධම්මපදයෙහි කියැවෙන අදහස "කොයි තරම් කෙනෙක් මුත් තමා විසින් ම තමා නගිනවා විනා වෙන වෙන ගැටියකින් නොවේ" යයි මෙහි දර්ශිත යි.

ii "කු ම ට ද කාබී නිති සැරසෙ න් නේ
කොතන ද මේ කය ඇරගන ය න් නේ"

යන 'ලෝවැඩ සඟරා' පද්‍යයෙහි අදහස ඥානාඤ්ජනයට වැද්ද ගත්තේ මෙසේ යි.--

"කුණු කසල සමාන දුර්ගන්ධ වූ ආත්මය ගෙන සුවඳ පුෂ්ප විහිදෙන වස්ත්‍රාභරණවල් අඳින්නේ කුමට ද?"

iii "උපනීයති ජීවිත මප්පමායු". "මත්තා සුඛ පරිච්චාගා".
"න කහාපණ වස්සේන". "අජ්ජෙව කිච්චං ආතප්පං."

ආදි ශ්‍රී මුඛ පාඨයන්හි අදහස් ඥානාඤ්ජනයේ මනුෂ්‍යාත්මයේ මහිමය, තෘෂ්ණාව, පව් දුරුකිරීම, යන කාරණා සම්බන්ධ තැන්හි සඞ්ග්‍රහ වී තිබේ. මේ අදහස් මෙසේ සඞ්ග්‍රහ වීමට හේතුව බෞද්ධ පොත පත ගොන්සාල්වෙස් පියතුමාට පුරුදුව තිබීම මිස අනිකක් නොවේ.

සාධාරණ බුද්ධියෙන් ආත්ම ඥානය පෙරටු කොට ගෙන ලියන ලද හෙයින් 'ඥානාඤ්ජනය' මධ්‍යස්ථ මතධාරීන්ගේ ද සම්මානනයට පාත්‍ර වන්නේ වේ.

## ප්‍රාතිහාර්යාවලිය

"ස්වභාව ගතියෙනු ත්, මනුෂ්‍ය, යක්ෂ බලයෙනු ත් යෙදෙන්නට නුපුළුවන් දේ දෙව බලය පමණකින් සිදුවීම" ප්‍රාතිහාර්ය නමැයි දෙව වෙද සංක්ෂෙපයේ විසිවැනි ප්‍රශ්නයේ විස්තර විය. ඒ මේ ප්‍රාතිහාර්ය සිද්ධීන් ගේ ආවලිය 'ප්‍රාතිහාර්යාවලිය' නමි. කවර ආගමිකයන් අතර ත්, අප්‍රබුද්ධයන් ප්‍රිය කරනුයේ සව සමය සම්බන්ධ මානුෂික බලය ඉක්ම වූ "හාස්කම්" පිළිබඳ පක්ෂය යි. එහෙයින් පියතුමා ක්‍රිස්තු ලබ්ධික ගැමියන් ගේ සමය වාත්සල්‍යය අභිවර්ධනයට පත් කරනු කැමැති වූයේ— අට සැත්තෑවක් කථා වස්තුන්ගෙන් සමන්විත කොට 'ප්‍රාතිහාර්යාවලිය' සැපයූහ. ඉන් අග දැක්වූ කථා වස්තු සූවිස්ස දෙව මාතාවන් සම්බන්ධයෙනි. ඉතුරු සූපනස දෙව පණත්, සුද්ධ වූ සභාවේ පණත්, හා දෙව ප්‍රසාද නිධාන ආදිය සම්බන්ධයෙනි.

බොරු දිවිරීම, දෙවියන් රැවටීම, දෙවරූපවලට අවඥ කිරීම, මව්පියන් හෙළා දැකීම, මිනී මැරීම, පරදාර සේවනය, සොරකම් කිරීම, බොරු ශාක්ෂි කීම, කේලාම් කීම,. පරහට අවමන් කිරීම, පවට පසුතැවිලි නොවීම, ආදි අකුශලයන්හි දරුණු ආදීනවයන් හා පූජාවෙහි ඵල, පාපොච්චාරණය, ඒක්වරු ශීලය, දෙව භක්තිය, ජාගර්යය, ආදි උත්කෘෂ්ට

ගුණාඪ්‍යයන්හි ආනිශංස ත් සමහර කථාවල අන්තර්ගත වෙති. මේ නිසා කවර සාමයිකයකු ගේ වුව ද, සැලකිල්ලට මේ ග්‍රන්ථය හිමි වේ.

පියතුමන් ගේ අනික් පොත්වලට ත් වඩා තත් කාලීන වාක් ව්‍යවහාරයට ගැලපෙන සුලු භාෂාව දක්නට ලැබෙන්නේ මේ පොතෙහි යැ. නූගත් ගැමියනට පහසුවෙන් තේරුම් ගත හැකි සේ හැකිතාක් ගැමි වහරට ළංවන පරිද්දෙන් මෙ ගත ලියූ බව පෙනේ. කතෝලික නිකායට විරුද්ධ වැ ලන්දේසි ආණ්ඩුවෙන් නීති පැනවූ අවස්ථාවේදී ඇතැම් චාරිත්‍ර විධි කඩ කිරීමට කතෝලිකයන් පටන් ගත් කල්හි, එහි දරුණු විපාකයන් පෙන්වීමට මේ ග්‍රන්ථය ලියූ බවකුදු සිතා ගත හැකි.

## සුකෘත දර්පණය

i ධර්ම ක්‍රියා ගුණ ලක්ෂණ. ii ලොක ත්‍යාජය. iii නිහත මානිකම. iv සිතේ දිළිඳුකම. v දෙව භක්ති තෙජස. vi පරහට දයාව. vii භික්ෂා දානය. viii ඉවසීම. ix සත්පුත් කම. x තපස. xi ව්‍රත භාවය. xii කීකරුකම. xiii දෙව චිත්‍රානුකාරය. xiv මර්යාදාව. xv අධර්මය යන ප්‍රස්තුතයන් විස්තර කරමින් 'සුකෘත දර්පණය' සම්පාදිත ය. මෙය කුඩා වුවත්, ඇතුළත් කරුණු ඉතා සාරවත් ය. කතෝලිකයනට මතු නො වැ, ඕනෑම සාමයිකයකුට සව ලබ්ධිය කැළල් නො වන සේ කියවිය හැකි පරිදි මෙ ගත සම්පාදනය වී තිබේ. ඥානාඤ්ජනයෙහි මෙන් සුකෘත දර්පණයෙහි ද දක්වූ බොහෝ අදහස් බුද්ධාගමේ ඉගැන්වීම්වලට සාකල්‍යයෙන් සමාන වෙති.

i සප්පුරිස දාන සූත්‍රයට අනුකූල ව සත්වැනි වූ භික්ෂාදාන විධිය සම්පාදනය වුණේ ය.

ii අටවැනි වූ 'ඉවසීමෙහි' සංග්‍රහය වූයේ—'යො හවෙ බලවා සන්තො' යනුවෙන් කියවෙන බෞද්ධ ධර්මයේ අදහස්ය.

iii තුදුස් වැනි ව ලියූ 'මර්යාදා' පරිච්ඡේදයෙහි—'කායෙන සංවරො සාධු' ආදි ධම්මපදයට සමාන අදහස් සංග්‍රහ වූයේ ය.

ගොන්සාල්වෙස් පියතුමාට බෞද්ධ පොත පතේ ආශ්‍රය තිබූ බවට මෙද සාක්ෂියකි.

බාහිර පණ්ඩිත මතයන්ගෙන් ද මේ ග්‍රන්ථයට කරුණු ගන්නා ලද්දේ ය. ඉවසීම සම්බන්ධයෙන් සීසර් රජුට ලැබුණු අනුශාසනය මෙහි දක්වූයේ එබඳු ස්ථානයක යැ. තවද මෙ පොත කියවන්නන් උනන්දුකරවීම සඳහා ධර්මක්‍රියාවන්හි හැසිර සැප ලැබූ සත්පුරුෂයන් ද අධර්මවර්යාවෙන් විපතට පත් පාපීන් ද කාය ශාක්ෂි කොට දක්වන ලද්දේ ය. අගොස්තීනු ධර්මධර ආදි නම් ගොත් විසිත් ප්‍රසිද්ධ වූ හා නො වූ බොහෝ පුද්ගල— පුද්ගලාවන්ගේ චරිතයන් ද දක්වමින් සුකෘත දර්පණය සාරවත් කරන ලද්දේ ය.

## දෙව නීති විසර්ජනය

ලෝකාන්තිමයෙන් පසු ක්‍රිස්තු ස්වාමි දරුවන් සමස්ත ලෝක යුක්ති විසර්ජනයට පැමිණීම විස්තර කරමින් ලියූ ග්‍රන්ථයකි දෙව නීති විසර්ජනය. අන්තිම නඩු විසඳීම යැ හි ද, නඩු පොත යැ හි ද, පැරණියෝ මීට නම් කළහ. මෙය ගද්‍ය රචනයක් වුව ද, දෘශ්‍ය කාව්‍යයක ස්වභාවය උසුලයි. ග්‍රන්ථය කොටස් තුනකින් යුක්ත වේ. එහි පළමුවැනි කොටසින් ලෝක සංහාරය, විනිශ්චයට කැඳවීම, විනිශ්චය කාරයාණන් මෝක්‍ෂ වාසීන් පිරිවරා නඩුවට පැමිණීම, යන කරුණු විස්තර කරන ලදි. දෙව පණතින් කෙරෙන පැමිණිල්ල, ධර්මිෂ්ඨයන් ඉදිරිපත් කරන පැමිණිල්ල හා ශරීරයෙන් කියැවෙන පැමිණිල්ල යන ත්‍රිවිධ පැමිණිල්ලක් ද්විතියාඞකයේ දක්විණ. තුන් වැනි කොටසෙහි අන්‍යාගමිකයන් රෙප්‍රමාදුකාරයන් හා නරක කතෝලිකයන් පිළිබඳ විනිශ්චය දක්වන ලද්දේ ය.

මේ රචනය බොහෝ තන්හි වාද දෙ බස් ලීලාවක් ද දක්වයි. වාක්‍ය වින්‍යාශය අනුප්‍රාසයට හා යමක ලක්‍ෂණයට බෙහෙවින් සමානතාවක් ගෙනහැර පායි.

> “දිරා යන ලෝක සම්පත්තිය තිර යයි සිතා—මැරී යන කය අමර ජීවිත යයි සිතා— ප්‍රඥා අන්ධකාර වූ සත්වයෝ සසර සුවයෙහි ම සිත ඇලී— පව් දගෙහි බැඳී— නිරයෙහි ගිනි මුඛයට ගොදුරු වී යන්නාහ.”

ග්‍රන්ථය ලිවීමේදී අන්‍ය ලබ්ධිකයන් පරිහාසයට ලක් කර ගත් බවකුදු පෙනේ. තත් කාලීන සමාජ තත්වයනට ද යම් යම් තැනකදී පහර දෙන ලද්දේ ය.

## බුඩ බණ ප්‍රත්‍යක්‍ෂය

ගොන්සාල්වෙස් පියතුමන් ලියූ මාතර ප්‍රත්‍යක්‍ෂය, බුදුමුල යී පැරණියන් වෙන්කොට ගත් පොත් දෙක ‘බුඩ බණ ප්‍රත්‍යක්‍ෂය’ නමින් ප්‍රකාශිත යි. මෙය ලියන ලද්දේ බුඩාගම පරිභවයෙන් හෙළාදැක්ම පරමාර්ථ කොට ගෙන යැ. ඒ අතර රෙප්‍රමාදු නිකායට ද පහර දෙන ලද්දේ ය. කතෝලිකයන් කෙරෙහි බෞඩයන් ගේ අනාදරය පැවැති අවස්ථාවේ ඔවුන්ගෙන් පලි ගැනීමේ චේතනාව පිට ‘බුඩ බණ ප්‍රත්‍යක්‍ෂය’ ලියූ බව පෙනේ.

ග්‍රන්ථය කොටස් දෙකකින් පරිමිත යැ. පළමු වැන්නෙහි බුඩ වැරදීම්- බුඩාගම සැදුණු සැටි- සැදූ අය හා බුඩාගම පවතින රටවල් යන කරුණු මාතෘකා කොට ගන්නා ලද්දේ ය. ‘හෙද කාරයන්ගේ නකීය’ නම් දෙවැනි කොටසේ රෙප්‍රමාදු ආගම සැදුණු සැටි- හා එහි වැරදි මත සතක් ද පෙන්වන ලද්දේ ය.

ඥානාඤ්ජනය, සුකාන්ත දර්ශනය වැනි ග්‍රන්ථ ලිවීමෙන් මධ්‍යස්ථ මතධාරී සකල භක්තිකයන්ගේ ප්‍රසාදයට භාජන වූ ගොන්සාල්වෙස් දෙව්ගැතිවරයා අපකීර්තියට ත්- අවඥාවට ත්, පාත්‍ර වූයේ මේ 'බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය' ලිවීමෙනි.

i "මෙසේ බුදුන් දිය ගොඩ දෙක්හි පන්සිය පනස් වාරයක් මනුෂ්‍ය- මාග ජාතියෙහි ඉපද කළ හේතුවලින් බුදු බව ලද්දේ ය."

ii "බුදුන් නගින තුරු සත්‍රීන් අත් නො හැරියේ ය.

iii. "බුදුන් ගේ මළ කය ආදාහන පූජාවෙන් අලුකොට නාගරාජයා ශිල්ලාය කියන තැන දළ දතුව ඉතිරි වුණේ කොහොමද?"

ආදි අවිචාර අසත්‍ය දේ බුද්ධාගම කොට හෙතෙම කල්පනා කෙළේ ය. එහෙයින් නො දන්නා දේ ගැන කරුණු දක්වන්නට ගොස් හේ විඥයන්ගේ උපහාසයටත්, සහෘදයන් ගේ අපහාසයටත්, පාත්‍ර විය. එ බැවින් ගොන්සාල්වෙස් දෙව්ගැතිවරයන් ගේ 'බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය' මධ්‍යස්ථ අදහස් ඇති කතෝලිකයන් ගේ පවා සම්මානය නො ලබන්නේ ය.

i "එකගෙයි කෑම." ii "තිස්තුන් කෝටියක් දෙවියන් විශ්වාස කිරීම." iii නාථ — පත්තිනි — කතරගම ආදි දෙවියන් ඇදහීම. iv මඟුල් තුලා පැවැත්වීමෙහි මස්මාංශ ගරු කිරීම. v මස්කඩ තිබීම. vi දඩ බල්ලන් ඇතිකිරීම. vii සුරාව උසස් කොට සැලකීම. viii රා මදින්නට ගෙන් ගෙට අවසර තිබීම. ix සියලු ක්‍රියාවන්හි නැකත් ගරු කිරීම. x ලිත් නැකත් පොත් තිබූ බව. xi ගණිත්තන් යක්දෙස්සන් ආදීන්ට පුවෙණි සලස්වා තිබීම. ආදි නොයෙක් සාමාජික තොරතුරු මෙහි දක්වා ඇත. මේ අනුව ගොන්සාල්වෙස් කෘතීන් අතර තත්කාලීන සමාජතත්ත්වය පිළිබඳ කරුණු දැනගැනීමට මේ පොත බෙහෙවින් උපකාරී වේ. මෙසේ ම ප්‍රස්ථාව පිරුළු, වර්තමාන ව්‍යවහාරයෙහි නො එන අප්‍රකට වචන සෙවීමෙහි ද මේ පොත බොහෝ දුරට ප්‍රයොජනවත් කර ගත හැකි වේ.

උද්ගම තරඞ්ගය මෙතෙකින් සමාප්තයි.

---

# සිංහල සාහිත්‍ය වංශය

## නූතන අවස්ථාව

### III වර්ධන තරඞ්ගය
### (ක්‍රි: ව: 1800—1900)

රජවරු:—

| | |
|---|---|
| ශ්‍රී වික්‍රම රාජසිංහ | ක්‍රි: ව: 1798 — 1815 |
| ඉඞ්ග්‍රීසි ආණ්ඩුව | ක්‍රි: ව: 1815 — 1900 |

## දේශීය ප්‍රවෘත්ති

රාජාධි රාජසිංහ රජතුමන්ගේ ඇවෑමෙන් එ වකට මහාධිකාරී වූ පිළිමතලව්වේ නිලමතුමන් විසින් රජ මෙහෙසියක ගේ සොහොයුරියක පුත් වූ කණ්ණසාමි නම් තරුණ කුමරෙක් ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රාජ්‍යයට පත් කර ගන්නා ලද්දේ ය. මේ වන විට බොහෝ සිංහල ප්‍රභූහු වඩුගරජ පරපුර නො රුස්නාහු – ඔවුන් පිටු දකිනු කැමැත්තෙන් සිටියේ ය. ඔවුන තර රාජ්‍යතන්ත්‍රයෙහි පටුතර බුද්ධිමත් අභිමාන පරවශ වූ පිළිමතලව්වේ නිලම තෙමේ මහනුවර සිංහාසනය විජාතිය රාජවංශයකට හිමි ව තිබීම ගැන අතිශයින් නො පහන් වූයේ යළිත් සිංහල රාජවංශයක් ඇති කර ලීමට ක්‍රියාරම්භ කිරීමෙහි යෙදී සිටියේ ය. ඒ සඳහා එක ම සුදුස්සා තමා බව කල්පනා කළ හෙතෙමේ තමන් ගෙන්. රජ පෙළපතක් ඇරඹීමට කට යුතු ද පිළියෙළ කෙළේ ය. රාජාධි රාජසිංහ රජුගෙන් පසු රාජ්‍යයට හිමියන් පසෙක සිටියදී — ඔතෑනි කුමරෙකැ යි කල්පනා කළ කණ්ණසාමි රාජ්‍යයට පත් කර ගන්නා ලද්දේ සිය අදහස මුදුන් පත් කර ගැනීමේ පූර්වෝපායයක් වශයෙනි. එහෙත් සිංහල ප්‍රභූන් තුළ පැවැති ඔවුනොවුන් නො කැමැති ස්වාර්ථකාමිත්වය පිළිමතලව්වේගේ යථොක්ත අදහස මුදුන් පමුණුවා ගැනීමට බාධා එළවන්නක් විය. මින්පසු පිළිමතලව්වේ විසින් යෙදූ හැම උපායයක් ම, සිංහල රාජ්‍යයේ අභාග්‍යයට දෝ — රට අසමගි වීමටත්, රජු නො සතුටු වීමටත්, සතුරු බල වැඩි වීමටත්, හේතු ම විය. මෙසේ රජු වැනසීමට යෙදූ එක් උපායකදී පිළිමතලව්වේ හිස් ගැසුම් කන ලද්දේ ය. ඉන්පසු මහාධිකාරී ධුරයට පත් එ තුමන්ගේ බෑනණුවන් වූ ඇහැලේපොල විජයසුන්දර බණ්ඩාර තෙමේ ද මයිලණුවන් අනුගමනය කරන්නේ — රජු පවාදීම සඳහා ඉංග්‍රීසීන් හා ගිවිසුම් ඇතිකර ගැනීමට යුහුසුලු විය. මෙය මහනුවර රාජ්‍යතන්ත්‍රය අවුලෙන් වියවුලට වැටී—කලින් ඔතෑනි දුබලයකැ යි කල්පනා කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දරුණු දමරිකයකු වීමටත් හේතු වූයේ ය. එ තෙමේ කෙතරම් දරුණු වී ද යත් — මවක ලවා දරුවන් කොටවීමට තරම් සාහසික ක්‍රෑර

තරමයක් වී. මහ පොළොව පවා වෙවුලු වූ ඒ අතිඋග්‍ර අපරාධයන් නිසා අන්තයට ම කලකිරී ගිය රටවැසියෝ තවත් ස්වාධීන ආණ්ඩුවක් ගැන බලාපොරොත්තු නො වූහ.

**සිංහල රාජ්‍යයේ අවසානය**

කවර ජාතියක් යටතේ වුවද, තමන්ට සැනසිලි දෙන ආණ්ඩුවකට යටත් වීමට තරම් එ කල රටවැසියෝ නො මැලිව සිටියහ. කන්ද උඩ රාජ්‍යයේ පැවැති මේ පෙරළිය හොඳින් දත් ඉංග්‍රීසිහු කල්යල් බලා ආයුධ සන්නද්ධ වූවාහු — මහනුවර කරා ගමන් ගත්තෝ ය. රට ගැනීමේ අදහසින් පැමිණි කිසිම ජාතියකට මෙ තෙක් තමන්ගේ අත්‍යුත්තම රාජධානියට අනවසරයෙන් පා තැබීමට ඉඩ නො දුන් සිංහලයෝ එද මේ විදෙශිකයන් අතිමාත්‍ර කැමැත්තෙන් ම පිළිගත්හ. පලාගිය රජු අල්වා පාවා දුන්නෝ ද ඔවුහු මැ යි. මෙසේ දෙ දහස් තුන්සිය සත්පනස් වසක් ස්වාධීනත්වයේ හිණි හිසට නැග ප්‍රතාපයෙන් සාමන්ත ජාතීන් බිය ගැන්වූ සිංහල රාජ්‍යය අවසන් වූයේ — ක්‍රි: ව: 1815 මාර්තු මස 3 වැනි දින මහනුවර මඟුල්මඩුවේදී ගිවිසුම් පත්‍රයක් පිට එංගලන්තයේ තුන්වැනි ජෝර්ජ් මහරජතුමාණන් වෙත පවරා දෙන ලද්දේ ය.

**නූතන ලංකාව**

මෙසේ ලංකාව ඉංග්‍රීසිනට භාරවූ පසු යුරෝපියයනට මූලස්ථානය වැ පැවැති කොළඹ ලංකාවේ අගනුවර විය. මින්පසු ලංකාවෙහි මෙතෙක් පැවැති පෞරාණික තත්ත්වය අනුක්‍රමයෙන් අතුරු දහන් වී 'නවීන' විපරිනාමයකට පරිවර්තනය වන්නට පටන් ගති.

සිංහල නරපතීන් පරසතුරන්ගෙන් ආරක්ෂාවීමේ ස්වභාවික උපායයක් කොට සැලකූ ගිරිදුර්ග, වනදුර්ග, පංක දුර්ගයන් හෙළි පෙහෙළි වී, මංමාවත් තැනී—ඒදඬු පාලම් බැඳී—ලංකාව සුගම භූමියක් වූවා ය.

මෙතෙක් සරුසාරව පැවැති ධාන්‍යක්ෂෙත්‍රයන් මුඩුව යද්දී—ලංකාවේ වනශ්‍රිය එළවූ වනගහනයන් යුරෝපිය වතුකර බවට පරිවර්තනය වැ අර්ථකර වැවිලිවලින් පොෂිත විය.

අනාවෘත ව අමිශ්‍ර ව පැවැති කන්ද උඩරට බොහෝ පෙදෙස්හි එ වතු ඇතිවීමෙන්, එ තෙක් අමිශ්‍ර ආර්ය රුධිරයෙන් ප්‍රතාපවත් ව සිටි ජනතාවකට වාසභූමි වූ ගම් නියම් ගම් දනව්වල එඩිසුන් භග්නමාන ඇති ජනතාවක් පහළ වන්නට විය.

'ලංකාව සිංහලයාටය' යන මෙතෙක් පැවැති සිංහලයේ දෙශ මාමක හැඟීම 'මෙතැන්' පටන් ගගන පුෂ්පයක් බවට පත් විය. කලක් පදිංචිව සිටි කවර තරාතිරමක විදෙශික

යකුට වුවද, 'මමත් ලාංකිකයෙක්මි' හඬනගා රට ජන්මභූමිය කොට වෙසෙන්නන්ට ඇති අයිතිවාසිකමට සමාන උරුම කිය හැකි පරිද්දෙන් පාලන ප්‍රණාලිය හැඩගැසී ගියේ ය.

ශතවර්ෂ තුනක පමණ දීර්ඝ කාලයක සිට ම යුරෝපීය යන්ගේ ආශ්‍රය ලත් හෙයින් මුහුදුබඩ සිංහල ජනතාව තුළ නම්ගම්, ඇඳුම් — පැළඳුම්, කෑම් — බීම් ආදියෙහි සිංහල චාරිත්‍ර යටපත් වී යුරෝපීය ක්‍රම මතුවී තිබුණ ද, ඉංග්‍රීසි පාලනයට සිංහලය යටත් වන තුරු ම කන්ද උඩ පෙදෙස් නම් ඒ යුරෝපීය අනුකරණයන්ගෙන් වෙන්ව පැවැත්තේ ය. එහෙත් මින්පසු රටේ ඇතිවූ පූර්වෝක්ත වෙනස්වීම් නිසා දෙ රට ම එකාබද්ධව ගියෙන් එ පෙදෙස් ද යුරෝපීය අනුකරණයන්ගෙන් විෂම වූහ.

මේ කරුණු මෙසේ වුවද, නිදහස් සැහැල්ලු සිතින් හා පැවැත්මෙන් යුක්තව සිටීමටත්, ස්වකීය දෛනික කටයුතු පහසුවෙන් කර ගැනීමටත් රටවැසියාට ඉඩ ලැබුණේ, ඉංග්‍රීසි කාලයෙන් පසු මේ එකුන්විසිවැනි ශතවර්ෂයේදී ය.

## ශාසනික ප්‍රවෘත්ති

දහනමවැනි ශත වර්ෂයේ ආරම්භයේදී ඇතිවූ ශාසනික සිදුවීම් අතර **ශ්‍රී ලංකා අමරපුර නිකාය** පිහිටුවීම වෙසෙසින් සැලකිය යුතු සිද්ධියකි. යටකී උපාලිවංශික නිකායයෙන් පැවිදි ලත් අඹගහපිටියේ ඥානවිමල තිෂ්‍ය සාමණේරයන් වහන්සේ බුරුමරට අමරපුර නුවර ඥානාභිවංශ ධර්මසෙනාපති සංඝරාජ ස්වාමීන්ද්‍රයන් ප්‍රමුඛ මහා සංඝයාවහන්සේ වෙතින් උපසම්පදාව ලැබ ක්‍රි: ව: 1803 දී ලක්දිව් වැඩ අමරපුර නිකාය නමින් භික්ෂු පරපුරක් පිහිටුවා වදාළෝ ය. මීට පසුව ද කිහිප දෙනකුන් වහන්සේ විසින් බුරුම රටින් උපසම්පදාව ගෙන ලක්දිව පිහිටුවනු ලැබුවේ වී නමුදු ඒ සියල්ල ත් මේ මූමමවංශික නිකායෙහි ම සංග්‍රහ වන්නේ ය. මෙසේ කන්ද උඩ සහ මුහුදුබඩ දෙපෙදෙස් හි ම ව්‍යාප්ත වූ ඒ භික්ෂු සංඝයාවහන්සේ මේ දවස ලංකා ශාසනයට අත්‍යන්තෝපකාරී වැ වැඩ වෙසෙන්නාහ.

මෙ ලෙසින් ම උපාලිවංශික නිකායයෙන් පැවිදි ලත් ඉන්දසභ වරඤාණ යන නාමයෙන් පසුකල ප්‍රසිද්ධ වූ අඹගහවත්තේ සරණංකර සාමණේරයන් වහන්සේ බුරුම රට රත්නපුණ්ණ නුවර ඥෙය්‍යධර්ම සංඝරාජ ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් ලත් උපසම්පදා ඇත්තෝ ක්‍රි: ව: 1864 දී ලංකාවට පැමිණ උපසම්පදාව පිහිටුවූවෝ ය. අද ද ලක් බුදු සසුනට මහත් වැඩ සලසමින් **ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය** යැ යි පළට වැ වැඩ වෙසෙනුයේ එයින් ඇතිවූ භික්ෂු සංඝ තෙමේ ය.

මෙසේ නිකාය වශයෙන් තුනක් වූයේ නමුදු, එකම ථෙර වාදී ගණයෙන් පැවැත එන මේ මහා සඞ්ඝයා වහන්සේගේ ව්‍යාප්තිය එකුන් විසිවැනි ශතවර්ෂයේ ලංකා බුද්ධ ශාසනය පිළිබඳ ව සිදු වූ අත්‍යුත්කෘෂ්ට උන්නතිය වන්නේ ය.

## ශාස්ත්‍රීය ප්‍රවෘත්ති

පූර්වෝක්ත පරිදි උද්ගත වූ විද්‍යාලතාව එකුන් විසිවැනි සියවස ආරම්භයෙහි නැවත වරක් කොඩ වන්නට වන. නුදුරෙහි පැමිණි අවසානය ඇති සිංහල රාජ්‍යය අවුලෙන් වියවුලට යමින් පැමැති එ සමයෙහි ශාස්ත්‍ර වර්ධනාදි කටයුතුවලට තරම් සන්සුන්ව රට නො පැවතුණේ ය.

අවටින් පුපුරණ හෙණ ඇති, සිය දහස් විදුලියෙන් හා ධාරා නිපාතයෙන් ප්‍රචණ්ඩ වූ වර්ෂාව පවතින ඝනතර තිමිර පටලයෙන් එකාන්ධකාර වූ අඩ රාත්‍රියක මං නො දූන පදවන නැවක් මෙන්, සතුරු මිතුරන් වෙන් කොට ගත නොහී නීති රීතියෙන් පිහිට නො ලැබ අවිචාරවත් ව පැවැති රාජ්‍ය භාරයක් ඉසුලූ රජරජ මහාමාත්‍යයෝ කෙසේ නම් මේකල ශාස්ත්‍ර වර්ධනයට අනුබල දෙන්නෝ ද?

ආරබ්ධ ශාස්ත්‍රානන්තියෙහි මූලිකයාණ වූ වැලිවිට සරණඞ්කර මාහිමියන් වහන්සේ, නුදුරු අනාගතයෙහි සිංහලය නැව ත් පොළොන්නරු යුගයට ගෙන මහ පැර කුම්බා රජු වැනි මහ දෙරණිසුරන් ලවා රාජ්‍යය කරවා; ගුරුළුගෝමි විද්‍යාචක්‍රවර්තීන් වැනි මහ පඬිවරුන් ලවා පොත් පත් ලියවා; කාශ්‍යප ශාරිපුත්‍ර වැනි මාහිමිවරුන් ලවා ශාසන භාරය උසුලවා; සිරිලක අමරපුරයක් බවට පත් කර වීමට නොවරදින අන්දමින් මාර්ගය පිළියෙලකොට තබන ලද්දේවී නමුදු, තත් කාලීනයන් බලාපොරොත්තු නො වූ අන්දමින් එකුන්විසිවැනි ශතවර්ෂයත් සමග උරිතුර ගැටී ආ සිංහල රාජ්‍යය පිළිබඳ ප්‍රලයාවස්ථාවෙන් ඒ සියල්ලක් පිළිබඳ මාර්ගය ඇවිරී ගියේ ය. මේ නිසා උන්වහන්සේ බලාපොරොත්තු වූ අන්දමින් අසිරිසිරියක් සිරිලකට නොඑළඹුණ ද, ඒ උතුමාණන් වහන්සේගේ පරිශුද්ධ චේතනාවගේ බල මහිමයෙන් දෝ උන්වහන්සේගේ ශාස්ත්‍රලතාව නොවියැලුණේ ය. ශාසන රැකට උපද්‍රවයක් නො එළඹියේ ය. එහෙයින් ශාසනයත්, ශාස්ත්‍රයත් අමුතු අභිවෘද්ධියක් නැතිව වුව ද නො නැසී පැවතුණේ ය.

මේ අතර ම මහනුවර සිංහාසනය ඉංග්‍රීසිනට අත්වූ ටික කලකින් පන්සලෙන් පාසැලට පැමිණි ගුරුදෙවියා රටේ අධ්‍යාපන තත්ත්වය වෙනස් කරවී ය. රාජ්‍ය කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් ඇරඹීම ත් ඉංග්‍රීසියට වැඩි සැලකිලි හිමිකර වීම ත් නිසා සිංහලයන් තුළ සිංහලයට පැවැති ආශාව තුනී වන්නට පටන්ගත්තේ මීට පසුව ය.

මෙසේ සිංහල භාෂාව යළිත් අවනතියකැ ගමන් ගත් කල්හි ප්‍රාචීන ධර්ම ශාස්ත්‍ර සාරය කැටි වීමෙන් මූර්තිමත් ව ගිය කලක් මෙන් පහළ වූ බහුශ්‍රැත පඬිවරයන් සිහිපත්දෙන කූන්ගේ මහෝද්‍යෝගය නිසා සිංහල සාහිත්‍යයේ අභිවෘද්ධියට හේතු වූ අඩිය කිහිපයක් ඇති විය. ධර්මශාස්ත්‍ර විෂයෙහි බුද්ධියෙන් මෙන් ම අරොහ පරිනාහ සම්පත්තියෙන් ද ආඪ්‍ය වූ වලානේ ශ්‍රී සිද්ධාර්ථ ස්වාමීන්ද්‍රයන් විසින් ආරබ්ධ පිරිවෙන් ඉගැන්වීම අනුගාමික ශාස්ත්‍ර සෙවීන් විසින් පතල කරන ලද්දේ මහදභිවෘද්ධියක් සැලසී ය. අනතුරුව නානා පෙදෙස් වැසි සූ නිශිත බුද්ධිමත් පඬිවරයන් විසින් ග්‍රන්ථශෝධන කාර්‍ය්‍යය අරඹන ලදින් ව්‍යාඛ්‍යා විස්තර පරිකථාදියෙන් සමලංකෘත වූ පෞරාණික සාහිත්‍ය ග්‍රන්ථ ශ්‍රේණි තොමෝ ප්‍රස්කොළයෙන් කඩදසියට නැගී—මුද්‍රණයෙන් බිහිවන්නට වූවා ය. සිප්කඩුව රත්මලාන පෙදෙසින් ජනිත වැ ලංකාවට විද්‍යෝදයත්, විද්‍යාලංකාරයත් කළ ඒ මහ පඬිවරු මේ අතින් විශාල සේවයක් කළාහු වෙති. තවද 'විදුලකර' හිමියෝ ශත වර්ෂ ගණනක් ව්‍යාකූල ව තිබූ සිංහල අක්ෂර වින්‍යාශයය යථාස්ථානයට පමුණුවා ලූහ.

මුද්‍රණ කාර්‍ය්‍යයේ පිටුවහල ලත් සිංහල ග්‍රන්ථ ප්‍රවේණිය මෙ තෙක් නො පත් තරමේ ප්‍රචාරයකට පත්ව, ශාස්ත්‍රය හිරු රැසක් මෙන් සාධාරණව බෙදී යන්නට පටන්ගත් කල්හි විවිධ තරාතිරමේ උගත්හු නැගී, විවිධ විෂයීය සාහිත්‍ය කෘතීන් සඳහා උත්සාහ වන්නට වූහ. පහත දක්වනු ලබන ලිත් සඟරා පුවත් පත් නාටක ආදි අපූර්ව අඩිය කිහිපයක් පහළ වීමෙන් සිංහල සාහිත්‍යයට පරිපූර්ණතාවක් එළඹ සිටියේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

**පඤ්චාඞ්ග ලිත**

කල්පාරම්භයෙහි චන්ද්‍රසූර්‍ය්‍ය නක්ෂත්‍ර ග්‍රහ තාරකාවන් පහළ වූ තැන් සිට අනුක්‍රමයෙන් කාලමානය සඳහා ලොකයෙහි ග්‍රහ ගණිතය පහළ වූයේ වන. මෙමැ සිංහල ද්වීපයෙහිදු සිංහල ජනයාගේ ජාතික සභ්‍යත්වය ඇතිවූ සමයෙහි ම මනුෂ්‍ය ජීවිතයෙහි විධිමත් ආලෝකයක් එළවන විද්‍යාවන් අතුරෙහි අග්‍රගණ්‍ය වූ නක්ෂත්‍රය ද භාවිතයට ආයේ මැ යි. මෙ කල මෙන් ජනතාවගේ අදූර සම්බන්ධයක් නැති අතීතයෙහි ලක්දිව නොයෙක් පළාත්වල වැජඹුණු බුද්ධිමත් නකත් ඇදුරන් විසින් වර්ෂයකට ප්‍රමාණ වන සේ ගැණ සකස් කළ ලිත වාර—නක්ෂත්‍ර—තිථි—යොග—කරණ යන පඤ්චාඞ්ගයෙන් උපලක්ෂිත වූයේ ය. එයින් ලියැවුණු පිටපත අසල්වැසි නැකැත්තන්ගේදු ප්‍රයොජනය පිණිස විය. මෙ බඳු වාර්ෂික ලිත් එක් රැස්කොට සැපයුණු ලිත් පොත දනු දු පැරණි පොත්ගුලුවලැ දක්නට ලැබේ.

**මුද්‍රිත ලිත**

එකුන් විසි වැනි ශතවර්ෂයේ මුද්‍රණ ශිල්පය පැතිර යත් ම විදුලි පහනකින් හස්සක දු නො හැර අඳුරු කැල නසාලන කලක් මෙන් ලොවට අබිරහස් වැ තිබූ ශාස්ත්‍රීය පොත පත පවා සියලු දෙනා අතරෑ ඉතා ශීඝ්‍ර වැ පැතිර යන්නට වන. මේ ආශිර්වාදය නිසා ම හවුරුදු දහස් ගණනක් මුලුල්ලෙහි වර්ෂයක් පාසා සියතින් ම පඤ්චාඞ්ග ලිත ලියා ගනිමින් ප්‍රයෝජන ගත් ලක්දිව සියගණන් නැකැත්තනට සිදු වූයේ මහත් ලාභයෙකි. ක්‍රි: ව: 1855 දී අහුන්ගල්ලේ ගුරුන්නාන්සේ ය යි ප්‍රසිඬවැ විසූ අර්නෝලිස් මැන්දිස් අභයශේඛර අප්පුහාමි විසින් ශකවර්ෂ 1777 සංවත් සරය සඳහා ගැන සකස් කළ **පඤ්චාඞ්ග ලිත** මුද්‍රණය කරවා ප්‍රසිඬ කරන ලද්දේ ය. පඤ්චාඞ්ග ලිත සාහිත්‍ය පක්‍ෂයෙන් උසස් තැනක් නොගනිතු දු, ශිෂ්ටතම ශාස්ත්‍රීය සේවයක් වූ හෙයින් ද එකල විසූ සාහිත්‍ය සේවීන්ගේ වාක් ව්‍යවහාරය දැනගැනීමට උපකාර වන හෙයින් ද මෙම සාහිත්‍ය කථායෙහි ලා මෙ ද ඇතුළත් කරලීමු අවශ්‍ය විය. මේ ඒ 'පඤ්චාඞ්ග ලිත' අඳුන්වා ලූ සැටි ය.

> "ශ්‍රී ලඞ්කාවිපවාසී ජෝතිශාස්ත්‍රඥ පඬිතයෝ ලෝවැඩ සඳහා සාදනලද ලිත් ග්‍රහචාර අතින් අතට ලියැවී යාමෙන් නොයෙක් තැන බොහෝ වැරදිවලින් සමන්විත ව තිබෙන ආන්ත්‍රාව අත් ඇරී යන පිණිස හීනටිගල ගනිතාචාර්‍ය්‍ය යන්ට සිස්‍ය වූ අනේනාලිස් මැන්ඩිස් අහුන්ගල්ලේ ගුරුන්නාන්සේ විසින් සාදඬ යෙදුනු සක වර්ෂ 1777 තේ ලිත පඤ්චාඟ වස්යෙන් සහ ග්‍රහචාරය නවාංසක වසයෙනු ත් පිළිවෙලට යොදා පහත අත්සන් කරණ මා විසින් හරි වැරදි බලා මෙලෙස අච්චුගස්වා ප්‍රසිඬ කලාය.— මේ ගැන වෙන්නා වූ වියදම සම්පාදනය කරගැනීමට ලෝකයාගෙන් උපකාර ලැබුනොත් අවුරුදු පතා ලිත් ග්‍රහචාර මෙම ක්‍රමයට සද අච්චු ගසවඬ පිලිවන් වෙනවා ඇත."

අනතුරු වර්ෂයෙහි ද මේ මහතුන් විසින් ම සකස් කළ ලිත මුද්‍රණයට පැමිණියේ ය. ලක්දිව නකත් දතුවනට පසලොස් වක සඳවැනි **ඈපා පඤ්චාඞග ලිත** මුද්‍රණයෙන් බිහිවූයේ එයට ද අනතුරු වූ ක්‍රි: ව: 1857 වැනි වර්ෂයෙහි යැ.

මෙහින් පසු කාලවල ද ඒ ඒ ඇදුරුවරයන් විසින් ගැණුණු ශුඬ පඤ්චාඞ්ග ලිත, සිංහල පඤ්චාඞ්ග ලිත ආදි පඤ්චාඞ්ග ලිත් බොහෝ ගණනක් ප්‍රසිඬියට පැමිණි නමුදු ලක්දිව ඇදුරු පර පුරක් ඇසුරු කළ අහුන්ගල්ලේ ගුරුතුමන් ලිත් මුද්‍රණය කර විමේ ප්‍රාරම්භකයා වන අතර ම දඹදිව ඇදුරු පරපුරක් ඇසුරු කළ ඈපා අප්පුහාමි සහ තත් පුත්‍ර පෞත්‍රාදීහු ආරම්භයෙහි, සිට මේ දක්වා වාක් ප්‍රහාරාදි විවිධ දුෂ්කරතා මධ්‍යයෙහි වුවද, පඤ්චාඞ්ග ලිත අඛණ්ඩ කොට මුද්‍රණය කරවාලීමේ ගෞරවය ලබන්නාහු ය.

මෙසේ 'පඤ්චාඞ්ග ලිත' මුද්‍රණය වීමෙන් නැකැත්තනට මහදඵ සිඞියක් සැලසුණු අතර ම ලක්දිව පඤ්චාඞ්ග ගණිතය හදුරත්තවුන්ගේ සඞ්ඛ්‍යාව අනුක්‍රමයෙන් පිරිහෙන්නට වන. මේ නිසා—

'පබාකර සිදත් සමහරු ගණිති ඉද'

යනු විසින් කවීන්ගේ වැනුම් මග පුළුල් කළ ශ්‍රේෂ්ඨතම අධ්‍යාපනාංශයක් පිරිවෙනින් බැහැර ගියේ යි.

මේ අවස්ථායෙහි ම මතාන්තරධාරි උගතුන්ගේ බාහුල්‍යයෙන් ආගම හා ශාස්ත්‍ර විෂයෙහි නොඑක් විවාදයෝ ද උපන්හ.

## විවාද විෂය

ලක්දිව පෙර පටන් නොඑක් ධර්ම ශාස්ත්‍රීය විෂයයන් අරභයා නොයෙක් පක්ෂයන් අතර විවාද උපන. එහෙයිනි අටුවා කථාවල පවා ආචාර්ය වාද දක්වාලීම හා විතණ්ඩවාද නිරාකරණය ද අවශ්‍ය වූයේ. සිදතෙහි අක්ෂර සඞ්ඛ්‍යා දැක්වීමෙහි ලා නිදසුන් පෑවෝ මතාන්තර නිරාකරණය පිණිස මැ යි. එකුන් විසි වැනි ශත වර්ෂයාගේ මධ්‍ය භාගය පැමිණෙත් ම පඬුවන් අතර නන් වැදෑරුම් වාද බිහිවන්නට විය. පැරණි වාද කරුවන්ගේ වාදයන්ට වඩා ශීඝ්‍ර ශිලී වැ හස්සක් මුල්ලක් නෑර වියත් අවියත් සියලු දෙනා අතර මැ පිදුරු ගින්නක් මෙන් පැතිර ගියේ ය. පුවත්පත් සඟරාවන්ගේ පහළ වීම මෙයට විශිෂ්ට රුකුලක් විය. මෙම ශත වර්ෂයේ අපරාර්ධය ලක්දිව 'වාද සමය' යි නම් කළ ද වරදෙක් නැතියේ ය. ඒ ඒ පක්ෂය ගත් වියත් අවියත් ගිහි පැවිදි කවුරුන් අතර වුව ද සාකච්ඡාවක් පහළ වූ නම් බෙහෙවින් වාද කථාවක් ඇසුරු කොට ඇත්තී වූ යැ.

මෙකල පහළ වූ විවාදයෝ ආශ්‍රිත කරුණු අනුවැ කොටස් සතරකට බෙදිය හැක්කාහු ය. **ශාස්ත්‍රීය වාද, සමය වාද, සමයාන්තර වාද, කුල වාදය** යි.

i **ශාස්ත්‍රීය වාද**

ශාස්ත්‍රීය වාදයන් අතුරෙහි **සව්සත්දම් වාදය** ප්‍රමුඛ ස්ථානය ගන්නේ ය. මේ වූකලි 'ගඞ්ගා රෝහණ වර්ණනා' යෙහි එන "සසර සරන සව් සත්—දම් අමායෙන් සතොස්වා" ආදි සිලෝයෙහි 'සව්සත්දම්' යන ශබ්ද යෙහි අග වර්ණ විනිශ්චය කිරීමෙහි ලා උපන. එකල ලක්දිව විසූ ගිහි පැවිදි පඬුවන් සාකල්‍යයෙන් උභයපක්ෂයට බැඳී ප්‍රසිද්ධ පුවත්පත් සඟරා මගින් බොහෝ කලක් දූසි අධිෂ්ඨානයකින් යෙදී මෙම වාදය කරගෙන ගිය බව පෙනේ. "මුල මැදග වර්ණිත්" යී කී තැන "මුල මැදග කුරිත්" යී යෙදුණේ නම් මෙම වාදයට ඉඩෙක් කැළ ම නැත. ශාස්ත්‍රීය කරුණු ගවේෂණයෙහි හා සිංහල සාහිත්‍යාධ්‍යයන් පුහුණු

කිරීමෙහි අභිලාෂය ද මේ හේතුකොට ගෙන බොහෝ දෙනා තුළ පහළ විය. ප්‍රස්තුතය තබා වෙනත් කරුණු වාදයට ඇද ගැනීම ද, මර්මච්ඡේදක වචන වලින් ප්‍රතිවාදීන් වෙහෙසීම ද, මෙ කල ඇති වූ අන්‍ය වාදවල මෙන් මෙහි දු විරල නො වී ය. එ හෙයින් ම වරද හෝ නිවරද වුවත්, ස්ව මතය දූෂිව ගෙන අවිනිශ්චිත ව ම මෙම වාදය අවසන් විය. එහෙත් මේ හේතු කොට ගෙන සිංහල සාහිත්‍යයට සිදු වූයේ වැදගත් සේවයකි.

**බුබ වෂී වාදය** ද ශාස්ත්‍රීය වාදයක් වුවත් ආගමික හැඟීම් පදනම් කොට, 'ගත සංවත්සර ව්‍යවහාරය', 'ආගත සංවත්සර ව්‍යවහාරය' යන දෙ කරුණ අරභයා උපන් ප්‍රබල වාදයකි. මේ වාදය පිළිබඳව පුවත් පත් මඟින් පළ වූ ලියවිලි ශාස්ත්‍රීය පක්ෂයෙන් මෙන්ම සාහිත්‍යය අතින් ද ඉතා වැදගත් විය. බොහෝ කලක් පැවැති මෙම වාදය මල්වතු විහාරයේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ තීරණාත්මක ලිපියකින් පසු අවසන් විය. එනමුදු වුවත්. තත් තත් පක්ෂග්‍රාහීහු මෙ දවස දක්වාත් ස්ව ග්‍රහණය ලිහිල් නොකරන හෙයින් වාදයකින් ලැබිය යුතු නියම ඵලය නො ලැබුණේ මැ යි.

## න ණ, ල ළ, වාදය—වරගත වාදය—ගුත්තිල වාදය.

ආදි අනිකු දු වාද බොහෝ ගණනෙක් කලින් කල පැන නැඟිණ. මේ වාදයන් හෙතු කොට ගෙන ද බොහෝ දෙනකු තුළ ශාස්ත්‍රීය විමර්ශනයට මඟ හෙලි වීමත්, මධ්‍යස්ථ වාචක යන්ගේ ශාස්ත්‍ර යුක්ති විඥානයත්, සිදු වූයේ වන. ශාස්ත්‍ර නයින් ම ස්වමත ස්ථාපනය කිරීම මෙබඳු වාදයක ගත යුතු මඟ වුව ද, බොහෝසෙයින් ලේඛකයා ප්‍රස්තුතයෙන් බැහැර ගොස් ශාස්ත්‍රයුක්ති අතුරෙහි ම නම්ලාප ද බහාලීමෙන් ප්‍රති වාදියා අධොමුඛ කිරීමට යත්න කළ හෙයින්, යථොක්ත ප්‍රතිඵල වූවා අවිලම්බයෙන් නො සිදු විය. මෙයින් ඇතැම් වාදයන් පිළිබඳ පුවත් පත්වලින් උපුටා ගත් ලිපි ග්‍රන්ථ වශයෙන් ද මහජනයා අතට පැමිණියේ වන.

ii **සමය වාද** — මෙහි **සමය වාද** යි ලක්ෂිත වූවාහු බෞද්ධයන් බෞද්ධයන් සමඟ මැ ධර්ම විෂයයන් අරභයා පහළකළ මතාන්තර නිමිතිකොට උපන් වාද යෝ යි. මෙ කල පහළ වූ මෙ බඳු වාදයන්ගේ සංඛ්‍යාව මහත් වුව ද, **අධිමාස වාදය** හා **පාරුපණ වාදය** උසස් තැනක් ගත්තේ යි. තවද මෙකී වාදයන් අතුරෙන් කිසිවෙක් පුවත් පත් මඟින් සිදුවූ අතර, කිසිවෙක් උභය පාක්ෂිකයන් ඔවුනොවුන් සම්මුඛ වැ උත්තර ප්‍රත්‍යුත්තර කථායෙන් හා ස්ව මතය පිහිටුවා ලන්නට ග්‍රන්ථ සම්පාදනයෙන් ද, සිදුවිය. **අධිමාස ප්‍රකාශිනී, මාසර්තු ලක්ෂණය** ආදි කුදු මහත් පොත් රැසක් ම පහළ වූයේ මේ හෙතුවෙනි. වාදයන් නිමිති කොට සැපයුණු මේ පොත් වලිනු දු සිංහල සාහිත්‍යයට පිටු වහලෙක් නො වූයේ නො වේ.

**iii සමයාන්තර වාද** බෞද්ධයන් හා ක්‍රෛස්තවයන් අතර ආගම් නිමිතිකොට උපන් වාදයෝ සමයාන්තර වාද ය යි මෙහි ලා සලකනු ලැබෙත්. මේ වාදයන් අතුරෙහි දු කිසිවෙක් පුවත් පත් මගින් හා ග්‍රන්ථ සම්පාදනයෙන් ද ඇතැම් වාදයක් ප්‍රති පාක්ෂිකයන් සම්මුඛවීමෙන් උත්තර ප්‍රත්‍යුත්තර කථායෙන් ද සිදු විය. ඉනිදු පානදුරා වාදය ජගත් ව්‍යාප්ත වූයේ අද පවා සිංහලයන් අතර මූර්තිමත් ව මෙන් පවත්නේ ය.

**iv කුල වාද** භාරතීයයන් මෙන් පැරණි සිංහලයෝ ද කුල භේදය ඉතා උසස් කොට සැලකූහ. සිංහල පාලකයන්ගේ බලය පිරිහී යත් ම 'කුල භේදය' පිළිබඳ ක්‍රමවත් පරිවර්තනය කු දු පහළ වන්නට විය. මේ අතරම තත් තත් කුලිකයෝ සවකුලය නගාලනු වස් පර කුලයනට නිගා දෙමින් විවිධ ග්‍රන්ථ සම්පාදනයට යුහුසුලු වූහ. මේ ග්‍රන්ථයනු දු වාදයන්ගේ වේශයගෙන සිටි හෙයින් මේ අඬකයෙහි ලා දක්ක මනා විය. ශාස්ත්‍රීය වාදයන්හි හා සමය වාදයන්හි ප්‍රති පාක්ෂිකයන් දුර්මුඛ කිරීම සඳහා මඳ වශයෙන් අනුගමනය කළ නම්ලාප යුක්ත වාක්‍ය යෙදීමේ මාර්ගය, සමයාන්තර වාද හා කුල වාදයන් පිළිබඳ ග්‍රන්ථ රචනායෙහිදී උච්චස්ථානයට ම ගියේ ය. එහෙයින් මොවුනතුරෙන් බොහෝ පොත්වල ඇතුළත් වී තිබෙන වාක්‍ය ප්‍රදේශයන් තබා ග්‍රන්ථ නාමය පවා අසන සභ්‍යයන් විලියෙන් හකුලුවා ලන සුලු ය. එබඳු ග්‍රන්ථයන් ගෙන් ලැබුණු සාහිත්‍ය ඵලය ගොම මුසු වූ කිරීමෙනැ යි කියනු පවා නොයෙදෙයි. එහෙයින්ම මොවුන් මෙම සාහිත්‍ය වංශයෙහි නාම මාත්‍රයෙනු දු බැහැර කළම්හ.

එකුන් විසිවැනි ශතවර්ෂයේ ශාසන ප්‍රචාරයට ප්‍රවෘත්ති පත්‍ර සඟරාවන්ගේ පහළ වීම අතිශයින් උපකාරී විය. සවකීය මතය ප්‍රචාරය කිරීමෙහි බොහෝ වාදීන් මෙය මාර්ගයක් කොට ගත් හෙයින් ආරම්භයෙහි මේ සඟරා හා පුවත් පත් වාද විවාදයන් සඳහා කැප කරන ලද්දවුන් සේ දක්නා ලදහ.

## සඟරා

ලඬකා නිධානය ප්‍රථම වරට ආරබ්ධ සිංහල සඟරාව ය යි අසනු ලැබේ. එයින් ලත් ප්‍රතිඵලය විශිෂ්ට වූයෙන් සිංහල සඟරාව, යතලබ, ශාස්ත්‍රාලංකාර, සම්‍යක් දර්ශන, සාරාර්ථ ප්‍රදීපිකා, සමය සඞ්ග්‍රහ, සත්‍ය සමුච්චය, ඥානෝපාසිනී, ඥානාවභාස, විභාව්‍යාලාප, කවිමිණි නිදන, ඥානාදර්ශ, විද්‍යාදර්ශය, සිතුමිණ, කල්‍යාණ මිත්‍රයා, ඥානාදර්ශය, පරෝපකාරය, කවිකලඹ, සෙනර්ල සඟරාව, වෙළඳ සඟරාව, ගොවිකම් සඟරාව ආදී බෞද්ධයන් ඇරඹූ සඟරා හා සත්‍ය ප්‍රබෝධනය, රුවන් මල්දම, ජ්‍යුලේ මිත්‍රයා හා ක්‍රිස්තියානි මිත්‍රයා ආදී ක්‍රෛස්තවයන්ගේ සඟරා කිහිපයක් ද වරින් වර

පහළ වූයේ ය. මින් 'සමය සංග්‍රහ', 'සත්‍ය සමුච්චය' හා ඥානාදර්ශය යන සඟරා තුන ශාස්ත්‍රීයත්වයෙන් අන් සඟරාවන්ට වඩා බෙහෙවින් එලදයී විය. වාදීන්ට රඟ බිම නොවීම එයට හේතු යි.

ශාස්ත්‍ර ප්‍රචාරයෙහි සඟරාවට මාර්ගය ලැබී නොබෝ කලකින් ම පුවත් පත ද ලංකා සාහිත්‍ය සමාජයේ දක්නට ලැබිණ..

**ප්‍රවෘත්ති පත්‍ර** **ලක්මිණි පහණ**, **ලක් රිවි කිරණ**, **ලංකාලෝකය** ආදියෙන් ඇරඹුණු ප්‍රවෘත්ති පත්‍රය ද ආරම්භයෙහි වාද විවාදයෙහි ලා ඉමහත් සේවයක් සැලසී ය. මෙසේ ම **සරසවි සඳරැස**, **දිනකර ප්‍රකාශය**, **කවට නරේන්ද්‍රයා**, **කල්‍යාණෝදය**, **කල්‍යාණශ්‍රීය**, **සත්‍යෝදය**, **ලංකාවතංශය**, හා **ඥානාර්ථ ප්‍රදීපය**, ආදි තරඟ දෙමින් නැඟුණු මේ පුවත් පත් ද, වයසින් මුහුකුරා යත් ම, විෂය මහත්වයෙන් හා ප්‍රයෝජන බාහුල්‍යයෙන් සංවර්ධිත වූයේ ප්‍රවීනයන්ගේ ප්‍රබෝධයටත් නවීනයන්ගේ අවබෝධයටත් කරුණු වූයේ ය.

**නාට්‍ය ග්‍රන්ථ** මෙසේ ම මේ ශතවර්ෂයෙහි ඇතිවූ තවත් අඩියක් නම් නාට්‍ය ග්‍රන්ථයන්ගේ සම්භවය යි. සිංහල සාහිත්‍යයට නාට්‍ය ග්‍රන්ථ සාකල්‍යයෙන් ම නුපුරුදු එකකැ යි කිව නො හැකි නමුත්, අද දක්නට ලැබෙන නාට්‍ය ග්‍රන්ථයන්ගේ සමුද්භවය නම් සිදුවී තිබෙන්නේ එකුන් විසි වැනි ශත වර්ෂයේ අවසාන මොහොතෙහිදී ය. **රූබිනා**, **සිම්බලින්**, **සෙලෙස්තිනා**, **පෝර්ෂියා**, **ඥාන සෞන්දරී**, **අහමඩ්**, **අශෝකමාලා**, **ඇහැලේපොල**, ආදි එම නාට්‍ය ග්‍රන්ථයන්ගෙන් භාෂා සාහිත්‍යයට උසස් සේවයක් නො සැලසුණ නමුදු, බොහෝ කලක් සිවුපද වන්නම් ආදියෙන් සැරසී සිටි සිංහල නාට්‍යය අමුතු වෙසයකින් සාහිත්‍යයෙහි ප්‍රවේශය ලද්දේ ය.

19 වැනි ශත වර්ෂයේ ඇතිවූ මේ හැම ව්‍යාපාරයක් ම සිංහල සාහිත්‍යයේ අභිවර්ධනය සඳහා ම උපයෝගී වූයේ යි.

## ග්‍රන්ථ විවරණ

### ශ්‍රී වික්‍රම රාජසිංහ විරුදාවලි

කර්තෘ:— වැලිගල කිවිඳු?
කාලය:— . ක්‍රි: ව: 1803 ?
ප්‍රමාණය:— පද්‍ය 298.

සිංහලයන් විසින් ඉංග්‍රීසීන් සමග කරන ලද ප්‍රථම යුද්ධය මූලික කරුණු කොට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ වීර්‍යාතිශය විරුදුවකට නැගීමෙන් කරන ලද කාව්‍යය **ශ්‍රී වික්‍රම රාජසිංහ විරුදාවලී** නමින් හඳුන්වනු ලැබේ. මහනුවර සිංහලයන්

විසින් වෙළඳාමෙහි පැමිණි මුහුදුබඩ වැසි මුස්ලිම් ජාතික මිනිසුන් සමූහයකගේ පුවක් ආදී වෙළඳ ද්‍රව්‍ය පැහැර ගැනීම හේතු කොට ගෙන ක්‍රි: ව: 1803 දී හටගැනුණු අරගලය මෙහි සඳහන් යුද්ධය යි. මේ සටන වස්තුකොට ඉංග්‍රීසීන්ගේ පරාභවය පෙන්වා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ විජයෝත්සව වර්ණනයෙහි යෙදී එතුමනට ස්තුති පූජනයක් කිරීම මේ විරුදුව කිරීමෙන් කවියා අපේක්ෂිත වූ ඵලය යි. ග්‍රන්ථයෙහි කිහිප තැනකද් ම කවියා රාජ ප්‍රිය වල්ලභාවක ගේ ස්වරූපයෙන් පෙනී සිටියේ—පැරණියන් ගත් විරුද කාව්‍ය ලක්ෂණයට අනුරූප වනු සඳහා යැ. ඉංග්‍රීසි හටන නමින් ප්‍රසිද්ධ මෙම ග්‍රන්ථයට වඩා යෝග්‍ය නාමය 'ශ්‍රී වික්‍රම රාජසිංහ විරුදාවලී' හෝ 'සිරිත' යන්න මැ යි.

ග්‍රන්ථ කර්තෘ කවරෙක්ද යනු මෙහි සඳහන්ව නැත. එ නමුත් වැලිගල නමින් ප්‍රසිද්ධ කවීන්ද්‍රයා මෙය කළ බව අසන්නට ලැබේ. වැලිගල කිවිඳුන් කළ 'ඇහැලේපොළ විරිදුව' දෙස බලන විට 'ශ්‍රී වික්‍රම රාජසිංහ විරිදුව'ත් ඔවුන් විසින් ම කැරිණැ යි සැලකීමට අවකාශ ලැබේ. මේ පොතේ රචනා කාලය පිළිබඳව ද නියම වර්ෂයක් සඳහන්ව නැත. 1803 වැනි වර්ෂයේ සිදු වූ ප්‍රවෘත්ති මෙහි සඞ්ග්‍රහ වන බැවින් ඒ හා සමීප කාලයක රචිතය යි සිතා ගත හැකි.

මෙහි ප්‍රථම පද්‍යයේ සිට අසූ එක් වැන්න දක්වා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ගුණාතිශය ද, එතැන් පටන් පද්‍ය එක්සිය තිසකින් ඉංග්‍රීසි සිංහල මහ සටන ද වර්ණනා වී ඇත. අනතුරු ව ආ පද්‍ය පන්තිස රජුට ස්තුති පූජනය සඳහා කරන ලද්දේ ය.

මෙම පද්‍යයන්ගේ භාෂාව බෙහෙවින් සිංහල සංස්කෘත ව්‍යතිමිශ්‍ර වූවකි. අදහස් ව්‍යක්තව පැවසේ. ශ්‍රැතිය ද කන්කලු ය. එහෙත් සත් කාව්‍යයක ඇතුළත් නො විය යුතු ග්‍රාම්‍ය වචන රැසක් මේ පද්‍යයන් හි වැද්ද ගත්තේ ය. එහෙයින් සිංහල විරුදාවලී මාලාවෙහි මේ කාව්‍යයට හිමි වන්නේ කණිෂ්ඨ ස්ථානයකි.

## ගඞ්ගාරෝහණ වර්ණනාව

කර්තෘ:— දොන් තෝමිස් සමරසේකර දිසානායක මුහන්දිරම්තුමා.
කාලය:— ක්‍රි: ව: 1806:
ප්‍රමාණය:— සිලෝ 103.

මාතර දවිත් ද සරම් විජයශෙඛර මුදලිඳුන් විසින් නිල්වලා නදියෙහි කරවූ මහ පින්කම නිසා 'ගඞ්ගාරෝහණ වර්ණනා' නමැති නවත් සිලෝවක් සිංහල සාහිත්‍ය වංශයෙහි පහළ වූයේ ය. මහනුවර සාහිත්‍ය වංශයෙහි ඇතුළත් වන සිලෝ ග්‍රන්ථ කිහිපය අතර මෙය නවීනතර ය. සිලෝ සියයකින් පරිමිත වූ හෙයින් ගඞ්ගාරෝහණ සතක යනු ද මෙයට නම්. සිලෝ ග්‍රන්ථ සම්පාදකයන් පද්‍ය සතයකින් ම කාව්‍යය නිම කිරීමට උත්සාහ කළ සේ පෙනේ. කෝට්ටේ කාලයෙහි රචිත

‘එළු සිලෝ සතකය,’ මහනුවර කාලයෙහි වැටෙන ‘තෙරුවන් මාලා සතකය,’ ‘ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය’ හා මේ ‘ගඞ්ගාරෝහණ සතකය’ත් බැලීමෙන් මේ නිගමනයට සාධක ලැබේ. කාව්‍යානුශාසනයන්හි නො දක්මු සිංහල කවීන් විසින් ම සම්මත කර ගන්නා ලද සම්ප්‍රදායයන් අතුරෙන් මෙද එකකැ යි සැලකිය හැක්ක.

‘ගඞ්ගාරෝහණ’ යනු ගඟට නැඟීම යන අර්ථ ඇත්තේ ය. ගඟට බැසීමක් මත් නැඟීමක් නො කට හැකි බැවින් ‘ගඞ්ගාවරෝහණ’ යනු මිස ගඞ්ගාරෝහණ යනු නුසුදුසු සේ පෙනෙතත්, ගඟෙහි කරන ලද මඩුවට නැඟීම ද ගඟට නැඟීමක් සේ සැලකිය හැකි හෙයින් එහි අනුචිත බවෙක් නැත. මේ කාව්‍යයට හේතු වූ පූජාව කිරීමට කාව්‍ය නායකයන් මෙහෙයුණේත්, කවියනට මේ නාමය අභිමත වූයේත්, පූජාවලියෙහි එන ‘ගඞ්ගාරෝහණ පූජා’ යන්න දැකීමෙනැ යි සිතේ. එහි ද ගඟෙහි වූ නැවට නැඟීම ගඞ්ගාරෝහණ නමින් සලකන ලද්දේ ය.

සරම් මුදලි තුමා මාතර සිට ගොඩපිටිය දක්වා නිල්වලා නදී දෙපස සරසවා ගඟෙහි කණු ගස්වා දෙමහල් තුන් මහල් පස්මහල් සත් මහල් පායන් නංවා යුගාසන ධර්මදේශනා පවත්වා තෙමාල් පායෙක්හි සර්වඥ ධාතුන් වඩා හිඳුවා දස දිනක් ඇතුළත මහාපූජෝත්සවයක් පැවැත්වී ය. මේ පූජෝත්සවයෙහි එකල ලක්දිව ප්‍රධාන භික්ෂූන් වහන්සේ ද ප්‍රභූවරයෝ ද සහාය වූහ. ‘ගඞ්ගාරෝහණ වර්ණනා’ වෙහි කථා ශරීරය වූයේ මේ පූජෝත්සවය යි. මේ මහා පින්කම පැවැත් වූයේ ක්‍රි: ව: 1806 දී ය. එහෙයින් මෙ කව කරන ලද්දේ එම වර්ෂයේදී ම යයි සිතිය හැක්ක. කාව්‍ය කර්තෘ වූකලි—

“සව් කව් නිවෙස් දනපදේ — ගිරිපාද නම් යුත්
දැ ගොයි කුලේ සමරසේ — කර නම් දිසානා
කිත් ලෙව් පසන් කිවිතුමා — ගුණයෙන් නැණින් යුත්
මේ ගත් සියේ හෙළු බසින් — ගළපා මෙසේ කී.”

යි ග්‍රන්ථාවසාන පද්‍යයෙන් ප්‍රකාශ වන පරිදි ගිරුවා පත්තුවේ ගොවි වංශයේ ජනිත සමරසේකර දිසානායක නම් කවියෙකි. හෙතෙමේ ලබන ලද මුහන්දිරම් තිලයක් ද ඇත්තේ මාතර ඉලඞ්ගකෝන් මුදලිතුමා සේවයෙහි යෙදී සිටියේ ය. මේ ඉලඞ්ගකෝන් මුදලි වූකලි ‘දියසැවුල් අස්නේ’ උත්කර්ෂයෙන් වැනෙන අභය ශ්‍රී වර්ධන ඉලඞ්ගකෝන් මුදලිඳු ය. ‘කව්මිණි කොඬල’ ආදි ග්‍රන්ථ කිහිපයෙක් හි වර්ණිත වූයේ එතුමන්ගේ පියතුමා ය.

දිසානායක මුහන්දිරම් තුමා ආරම්භක සිලෝ නවයෙන් තුනුරුවනට නමස්කාර කොට මාතර පුර ශ්‍රිය හා පින්කම කරවූ සරම් මුදලිතුමා වැනී ය. අනතුරු පද්‍ය නවයකින් නිල්වලා නදියෙහි කරවූ මණ්ඩප හා සර්වඥ ධාතූන් වඩා කරවූ මහ

උළෙල දක්වී ය. මීළඟ එන පද්‍ය දෙළස මේ මහ පින්කම නැරඹීමට, නත් දෙසින් පැමිණි ජනකාය සම්බන්ධයෙනි. පන්තිස් වන සිලොවින් පටන්ගෙන සත් සාලිස් වන සිලොව දක්වා ඒ උත්සවයෙහි නාත්‍ය විලාශය පළ කෙළේ ය. රාත්‍රී කාලයේ පැවැත්වූ ගිණිමල් පූජාව මීට අනතුරුව එයි. ඒ වනාහි මේ කාව්‍යයෙහි දක්නට ලැබෙන රමණීය තැනකි. පුෂ්ප චක්‍ර, භූමි චක්‍ර, ආකාශ චක්‍ර, මේ ගැජ්ජම්, සිදු ගැජ්ජම්, මල් නිලා, හිරුරැස්, සඳරැස්, නකත් කුඹු, ආදී බොහෝ මල්වෙඩි විසතර වනුයේ මෙහිදී ය. මෙසේ ආරම්භයෙහි පටන් සැට නව වැනි පද්‍යය තෙක් එන විසතරය ශත වර්ෂ එකහමාරකට ප්‍රථම ලංකාවේ පැවැති පින්කමක ස්වාභාවික දර්ශනය ගෙනහැර පායි.

> 'ඒ ගංතෙරේ දිලි පහන් — සිළු වන් ගඟේ සේ,
> ආ නා පුරෙන් පුදවූ රන් — දද කැන් බලා ලා
> ගන්නා සපුන් ගුරුළු යය් — සිතමින් බියෙන් උන්
> ලා දිව් සිරින් කට මැණික් — පළවූ එතැන් හී'

සී මෙසේ අවසානයේ එන සිලෝ තිය එම උත්සව ශ්‍රිය පළ කෙරේ.

දිසානායක කවි තෙමේ මේ රචනය කොට සරම් මුදලි තුමාට පිළිගැන්විය. අතිශයින් පිනාගිය මුදලිතුමා මෙහි යම් කිසි දෙසක් ඇතොත් කිව මැනව හි සාභිමාන හස්නක් සමග ගාලු කෝරළය කරවූ කාව්‍ය ප්‍රිය අබේසිංහ මුදලිඳුන් වෙත මේ පොත යවන ලද්දේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රසිද්ධ 'සව් සත් දම් වාදය' හට ගැනුණේ ය. දවසිතේ විශාල ශාස්ත්‍ර ප්‍රබෝධයකට හේතු වූ එම වාදය නිසා **ගඞ්ගාරෝහණ වර්ණනාව** අතිශය ප්‍රසිද්ධියකට පාත්‍ර වූයේ ය. පූන පූනා කිම් අනුචිත වැනුම් ආදි දෝෂ කතිපයකින් සලකුණු වුවද කාව්‍ය රසිකයන් පිනවීමට මෙ කව පොහොසත් වේ.

## උපාසක ජනාලඞ්කාරය

කර්තෘ:— මොරතොට ධම්මක්ඛන්ධ මහා නායක හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1804—1811 අතර
ප්‍රමාණය:— පරිච්ඡේද 9

සිංහල සාහිත්‍යයෙහි සඞ්ග්‍රහ වන තවත් අනුවාද ග්‍රන්ථයක් නම් උපාසක ජනාලඞ්කාරය යි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස් අතර තුන්වැනි සතර වැනි දෙ පිරිස් වූ උපාසක උපාසිකාවන් විසින් අවශ්‍යයෙන් දැන ගත යුතු ධර්ම විභාගයක් ඇතුළත් කරමින් ආනන්ද නම් පූර්වාචාර්ය මහ තෙරකෙනකුන් විසින් පාළිභාෂාවෙන් රචිත 'උපාසක ජනාලඞ්කාරය' මෙහි මූල ග්‍රන්ථය වේ. සිංහල රාජ්‍යය නැමති මහ සයුර මාඝයන්ගේ දෙමළ බල මුලුව නැමති උත්පාතයෙන් ඇළලී ගොස් ශාසනය හා සාහිත්‍යය භයඞ්කර පරිහානියකට මුහුණ පා සිටි කල්හි අතවා රක්ෂාව අපේක්ෂා කළ මහ තෙරුන් පඬිපුර බලා ගමන් යාදී

සැටවී ගිය මේ ආනන්ද තෙරණුවෝ චෝඩ ගඞ්ග නම් සාමන්ත භූමිපාලකයකුගේ ආරක්ෂාවෙහි පැවැති සිරි වල්ලභ පුර වෙහෙරක විසූහ. මේ 'උපාසක ජනාලඞ්කාරය' රචිත වූයේ ඒ අතර වර්ෂයකදී ය.

ක්‍රි: ව: 1784 සිට 1811 දක්වා මල්වතු විහාරයේ මහා නායක පදවිය ඉසුලූ සඟරජ හිමියන්ගේ ම ශිෂ්‍ය මොරතොට ධම්මක්ඛන්ධ හිමියාණෝ මෙහි අනුවාදකයෝ ය. රාජගුරු ස්ථානාන්තර ලත් ධම්මක්ඛන්ධ හිමියන් මේ අනුවාදය සැපයූ වර්ෂය සඳහන්ව නැත. එ බැවින් අසවල් වර්ෂයට මෙය අයත් ය යි එක එල්ලේ කිව නො හැක. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දෙවරක් මහනුවර වෙත පැමිණි සතුරන් පලවා හැරි බවක් මෙහි නිගමන කොටසේ සඳහන් වේ. මේ දෙවර නම් ක්‍රි: ව: 1803 ස්හ 1804 යන වර්ෂ බව පෙනේ. එබැවින් මේ ග්‍රන්ථය ක්‍රි: ව: 1804 ට පසුව රචිත බව පමණක් සිතා ගත හැකි ය. මොරතොට හිමියන්ගේ අවසානය සිදු වූයේ ක්‍රි: ව: 1811 දී ය. එ බැවින් මේ සප්ත වර්ෂය අතර මේ අනුවාදය සැපයුණු බව නිශ්චය කළ හැකි. මොරතොට හිමියනට මේ අනුවාදය සැපයීමට ගත වූයේ දෙ මස් සත්විසි දිනකි.

බෞද්ධොපාසක–උපාසිකාවන් අවශ්‍යයෙන් උගත යුතු ධර්ම පරිච්ඡේදයක් මෙහි විස්තර වන්නේ ය. සිංහල බෞද්ධ ගිහි ජනතාවගේ ධර්ම ඥානය ඇතිකරලීම පරමාර්ථ කොට මේ අනුවාදය සපයන ලද්දේ විය. ධුතාඞ්ග ආදි ඇතැම් කරුණු ගෙනහැර පෑමේ දී ගෘහස්ථ ජනතාවට පමණක් ප්‍රයෝජනවත් වන දේ විස්තර කරන බව අනුවාදකයන් විසින් ම පවසන ලද්දේ එහෙයිනි. සරණගමනාදිය පටන් ලෝකෝත්තර සම්පත්තිය දක්වා ධර්ම මාර්ගය මේ ග්‍රන්ථයෙහි සංක්ෂෙපයෙන් ආයේ ය. එද, සරණගමන, ශීල, ධුතාඞ්ග, ආජීව, දශ පුණ්‍ය ක්‍රියා, අන්තරායකර ධර්ම, ලෞකික සම්පත්ති, ලෝකෝත්තර සම්පත්ති, පුණ්‍යඵල සාධක සී පරිච්ඡේද වශයෙන් නිර්දේශ නව යෙක්හි ලා විස්තර කරන ලද්දේ ය.

භාෂා ස්වරූපයෙන් ම මූල ග්‍රන්ථයක පරිවර්තනයක් බව ඉඳුරා දක්වන ධර්මක්ඛන්ධ නාහිමියන්ගේ මේ අනුවාදය රතනපාල හිමියන්ගේ විමාන වස්තු අනුවාදය හෝ බුද්ධරක්ෂිත හිමියන්ගේ සද්ධර්මාවවාද සඞ්ග්‍රහව තරමට නො වත ත්, තත්කාලීන ගද්‍යයන් ගෙන් පොදු ජනයා අතර වැඩියක් ප්‍රචාරයට පත්වූ ග්‍රන්ථයකි.

## දිය සැවුල් අස්න

කර්තෘ:— තල් අරම්බෙ ධම්මක්ඛන්ධ හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1813
ප්‍රමාණය:— පද්‍ය 174

'නීල කොබෝ සන්දේශය' මෙන් සර්වාර්ථ සිද්ධ්‍යපෙක්ෂාවෙන් රචිත තවත් කාව්‍යයක් නම් 'දිය සැවුල් අස්න' යි. මෙය කරන ලද්දේ තල්අරම්බේ නමින් ප්‍රසිද්ධ යතීන්ද්‍රයකු විසින්. මූන්

වහන්සේ වූකලි සඟරජ හිමියන්ගේ අනුශිෂ්‍යවරයකු වූ මාතර කුඹුරේ විහාරේ වැඩ විසූ දෙමටපිටියේ සඞ්ඝරක්ඛිත නාහිමියන්ගේ අන්තෙවාසිකයෙකි. ධම්මක්ඛන්ධ නම් වූ තල් අරඹේ හිමි 19 වැනි ශතවර්ෂයේ මුල්භාගයේ වැඩ විසූ ප්‍රසිද්ධ කවීන් කිහිපදෙනා අතර කෙනෙකි. 'කව් සිළුමිණ' නමින් ප්‍රසිද්ධ අද්භූත ජාතක කාව්‍යයක් මෙතුමාගේ අනික් රචනාවකි.

පි ද  වෙන ලෙස කුළුණු බඹ  ස යු ර ගේ  ර ඟේ
බැඳ  කව්මිණ  පඬුරු  සෙව්  ම සි ත ගේ  තු ඟේ
කඳ  කුමරිඳුනි  බල  මැන  දි ව ස ගේ  ර ඟේ
සි ඳ  ගල මෙ හැම  රෝදුක්  ප ද යු ගේ  ම ඟේ’

යනුවෙන් පැවසෙන පරිදි තල්අරඹේ හිමියන් මේ සන්දේශය කරනලද්දේ සවකීය පා දෙකෙහි හටගත් රෝගයක් දේවායාචනයකින් සුව කරගනු සඳහා ය. ඒ පිණිස මේ සන්දේශය තනා දිය සැවුලකු අත කතරගම දෙවිඳු වෙත යවන ලද්දේ ය. අලුත් බණ්ඩාර හා කොස්ගම දෙවිඳු ද පත්තිනි හා වල්ලිඅම්මා ද අභිෂ්ටාර්ථ සිද්ධියෙහි ලා යැදිය. කුඹුරුගමුවේ සිට කතරගම දක්වා මාර්ගය මෙහි වර්ණිත යැ.

දිය සැවුල් අස්න බඳනාලද්දේ දුෂ්කර පද්‍යයක් වශයෙනි. හැම පද්‍යයක ම අවසාන අකුරු තුනේ මුල—අග එකම එළි වැටින් යුක්ත කිරීමට තල්අරඹේ හිමියන් මහත් උත්සාහයක් ගෙන තිබේ. එමතුද, කාව්‍ය බන්ධනයේ දී ඉඩ ලැබෙන අනික් හැමතැනකදී ම එළියට ගරු තැනක් දෙන ලද්දේ ද වෙයි. එළිවැට පිළිබඳ මෙබඳු ප්‍රයත්නයක් සඳහා ගත් කරුවන් පෙළඹ වීමට හෙතු වූයේ එකල මෙ බඳු බන්ධන උසස් කොට සැලකූ හෙයිනැයි සිතේ. වියෝවගරත්න මාලය සහ රත්නවති ප්‍රබන්ධයත් ගත් කරුවන්ගේ මේ එළියට ගුරු පොත් වූ බව පෙනේ.

මෙතෙක් පළ වූ හැම සන්දේශයක ම ආරම්භය ගීයකින් බැඳුණ ද, දියසැවුල් අස්න බැඳුණේ, සිවුපදයකිනි.

‘සැ ර ද  ස ර ද  සොමි පැහැ රුසිරු දුල ද  ල
පැ ල ඳ  පැල ඳ  සියපත් කනක පෙල පෙ  ල
නි බ ඳ  ප බ ඳ  රත්වත් තුඩැති සුල ක  ළ
ස බ ඳ  ස බ ඳ  සැවුලිඳු මෙ සිරි පල ක  ළ

මෙසේ සන්දේශ මුඛය ඇරඹූ කවියා මාර්ග වර්ණනාවට බැස මාතර ඉලඞ්ගකෝන් නම් මුදලිවරයකු උත්කර්ෂයෙන් වනයි. ඒ මුදලිඳුන් නම් ''කව්මිණි කොඬලේ'' දක්වෙන ඉලඞ්ගකෝන් මුදලිඳුන්ගේ පුත්‍ර තෙමේ ය මේ මුදලිවරයන් සතුටු කරවීමත් දිය සැවුල් අස්න කිරීමෙදී එක් හෙතුවක් කොට ගන්නා ලදී. එළියත් දුෂ්කර බන්ධන ලක්ෂණයත් ගුරු තන්හි තබා කළ බැවින්

මේ අස්නෙහි කවි බොහෝ ගණනක් අප ශබ්දයන්ගෙන් කිලිටුව ගොස් තිබේ. ගත් කතුවරයන්ගේ උත්සාහයේ නියම ප්‍රතිඵල සාහිත්‍ය කාමීනට නො ලැබී යෑමට එය හෙතුවක් විය.

## වඩුග හටන*

කර්තෘ:— වැලිගල සිව්දු
කාලය:— ක්‍රි: ව: 1815—1818 අතර
ප්‍රමාණය:— පද 257

වඩුග හටන වූකලි සිංහල රාජ්‍යයේ අවසාන කාලයෙහි මහාධිකාරම් ධුරය කරවූ ඇහැලේපොල නිලමතුමන්ගේ ගුණ වනමින් ලියූ සතුති කාව්‍යයකි. වඩුග රාජ වංශයේ වැනසීම මෙයින් ප්‍රකාශවන හෙයින් ඒ නාමය ද මේ ග්‍රන්ථයට නොගැලපෙන්නේ නො වේ. එහෙත් මෙම කාව්‍යයට 'ඇහැලේපොල විරිදුව' හෝ 'සිරිත' යනු වඩා සුදුසු නාමය යි. ඇහැලේපොල නිලමතුමා ගුණසනවයෙන් පිදීම මේ රචනාව කිරීමෙ පරමාර්ථය වූ හෙයිනි.

මේ වන්දිභට්ටයා නම් වැලිගල යන ග්‍රාම නාමයෙන් ප්‍රසිද්ධ වූ කවීන්ද්‍රයා යි. පද්‍ය සාරසිය සූනිසකින් යුත් දළදාවංශ කථාව ප්‍රකාශිත **දළදාගොත් ප්‍රදීපය** ත් මේ කවීන්ද්‍රයාගේ අනික් රචනා වකි.

නියම වශයෙන් මේ විරිදුව රචිත වර්ෂය නො දක්වේ. එය නිශ්චය කරගතයුත්තේ, ග්‍රන්ථාගත කරුණු පරීක්‍ෂා කිරීමෙනි. මෙහි දක්වෙන අවසාන ප්‍රවෘත්තිය ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඥාති පිරිසකුත් සමග මද්‍රාසියේ 'වෙල්ලෝර්' නම් බලකොටුවට ගෙන යෑම යි. මෙය සිදු වූයේ ක්‍රි: ව: 1816 ජනවාරි මස 6 දය. මින්පසු ඇහැලේපොල නිලමේ කලක සිටම තමා බලාපොරොත්තු වූ පරිදි ඉංග්‍රීසීන්ගේ සහායයෙන් රජවීමට කල්පනා කෙළේ ය. මේ අවස්ථාවේදී එතුමා හඳුන්වනු ලැබුයේ යුවරාජ වශයෙනි. යුවරජුගේ මේ අදහස සාර්ථක කරගැනීමට ඉංග්‍රීසීහු අවකාශ නොදුන්හ. මීට්පසුම හේ ඉංග්‍රීසිනට විරුද්ධ වැ ක්‍රියාරම්භ කෙළේ ය. ඉංග්‍රීසීහු ක්‍රි: ව: 1818 දී යුවරජු අල්ලා ක්‍රි: ව: 1825 දී මුරිසි දිවයිනට යැවූහ. සිංහල රාජ්‍යය පිළිබඳ ඇහැලේපොල නිලමේගේ බලාපොරොත්තුව පැවැති 1815–18 අතර වර්ෂයක මේ රචනාව කළ බව සිතාගත හැක්ක.

'සි රි සි දු පොත අත නැඹසර පියුම ත
නැණි නි දු ලඹොදර මෙහෙසුරු කොත අ ත
ගොනි නි දු ඇහැලේපොල යුවරද වෙ ත
රි වි ස දු හිමි සිරි සෙත දී රැක දෙ ත'

* ඇහැලේපොල වර්ණනාව නමින් ළඟදී මුද්‍රණය වූයේ මේ පොතයි.

මෙසේ ඇහැලේපොල නිලමේට කළ ආශීර්වාදයකින් ඇරඹූ මෙහි සොළොස්වන පද්‍යය තෙක් එතුමාගේ ගුණ කීර්තන ය ද එතැන් සිට එක්සිය හවැනි පද්‍යය දක්වා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සාහසික ක්‍රියා හා එහි ප්‍රතිඵල ද අනතුරු ව එන පද්‍යයන්ගෙන් නිලමේගේ වීයප්‍රීතිශය ද ප්‍රකාශිත යි. කාව්‍ය නායකයා ගුණසතවයට භාජන කිරීමේදී නොයෙක් විට කවියා ප්‍රිය වල්ලභාසවරූපය ගත්තේ ය.

මෙහි බොහෝ පද්‍යයන් බැඳුණේ පූර්වෝක්ත විරුදුවලීන්ගේ වාක් විලාශයෙන් ම ය. එහෙත් ඒ ග්‍රන්ථයන්හි නො ආ වෘත්ත ලක්ෂණ කිහිපයකින් බැඳුණු පද්‍ය කතිපයක් ද මෙහි ඇත. වඩුග රාජවංශය ගැන කවියා තුළ පැවැති ක්‍රෝධය අති මහත් වූයෙන් ඇතැම් පද්‍යයක වැදගත් වචන විලාශය සභ්‍යයන් නො පිනවන තරමට ග්‍රාම්‍ය විය. එබැවින් මෙය සාහිත්‍ය වංශයේ කණිෂ්ඨ සථානයෙන් පවා ඇත්වන විරුදුවලියකි.

‘සවසති ශ්‍රී විජය රැක්කු මඞගලම්
මහාසත්‍යාවබොධ රැක්කු මඞගලම්
සවණීමණීධාර රැක්කු මඞගලම්
දුන කණිාවතාර රැක්කු මඞගලම්

යන ශාන්ත්‍යෂ්ටකයෙන් ග්‍රන්ථය නිමවා තිබේ.

## සියබස් මල්දම

කර්තෘ:— කිරම ධම්මානන්ද හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1820
ප්‍රමාණය:— පද්‍ය 235

සිංහල රාජ්‍යය ඉංග්‍රීසි කිරීටයට යටත්වීමෙන් පස්වැනි වර්ෂයෙහි එනම් ක්‍රි: ව: 1820 දී කිරම ධම්මානන්ද යතිවරයන් විසින් ලියූ ‘සියබස් මල්දම’ විජයරජුගේ පරම්පරා කථාව ශරීර කොට ඇත්තේ ය. ග්‍රන්ථාරම්භයෙහි එන මේ පද්‍යයෙන් එය පැහැදිලි ය.

‘පෙ ර මෙම සිරිලක පළමුව රජක ළ
ව ර තර එ විජයබා රජුගේ දු ල
ප ර පුර ගෙනහැර දක්වමි මන ක ල
ක ර දර සුදනෙනි සවි එහි පිළිවෙ ල

වඟුරජ හා දේවිය, සුප්පාදේවිය, වෙළඳමුළ, කුමරිය පැහැර ගත් සිංහයා, සිංහ මිනිස් දෙදෙන, සිහබා රජ, විජය කුමරු ආදීන් පිළිබඳ විස්තර දැනීමක් ඇතිවන සේ පද්‍ය දෙසිය සතිස කින් නිම වූ මේ කථා කාව්‍යය කවි සමයාගත පිරවීම් නිසා අමුතු ආලෝකයක් හා කියවීමෙහි අභිරුචිකත්වයක් ගෙන හැර පායි. තමා විදි පිය සිංහයා බලා සිහබා කුමරු ගත් විලාපය හා දුබල ව වැටුණු පිය සිංහයා ඇසහැර බලා තමා දෙ පුතුන් වැඳූ සැටි විස්තර කළ අයුරු එබඳු පිරවීමකි. මෙතැන් හිදී කාව්‍ය කරුට මෘගසිංහයාට මනුෂ්‍යත්වය ආරෝපණය වූ සැටි නො පෙනී ගියේ ය.

'සියබස් මල්දම' ව්‍යක්ත රචනයෙකි. ස්වභාව කථනයෙහි ලා එහි පද්‍යයෝ තත් කාලීන කෘතීන් අතර උස් තැනක් ගනිති. එහෙත් අලංකාර සමයෙක්හි බිහි වූ පද්‍යයක් හෙයින් එහි යම් යම් දෙස් නැත්තේ ද නො වේ. 'කවිසමය' පිළිබඳ නිරවද්‍ය වැනුම් මඟකින් හෝ පුනරුත් ආදි දෙසින් හෝ මෙ කව් විනිර්මුක්ත නො වූ හෙයිනි.

කිරම ධම්මානන්ද තෙරණුවෝ එකුන්විසිවැනි ශතවර්ෂයේ සමර්ථ කවියකු ලෙස ප්‍රසිද්ධයහ. මාතර ගොඩපිටියේ රජමහා විහාරයේ කීර්ති ශ්‍රී ධර්මරක්ෂිත හිමියෝ උන්වහන්සේගේ ආචාර්යවරයෝ ය. සාලිඇලේ මණිරතන හිමියෝ ධර්මාචාර්යවරයෝ ය. පද්‍ය රචනයෙහි මහත් රුචිකත්වයක් දැක්වූ ධම්මානන්ද හිමියන් විසින් කරන ලද රචනා කිහිපයකි. ඉන් **සියබස් මල්දම, කාඤ්චනදේවී කථාව, නන්දිය වෙළඳ පුවත** හා **සම්බුලා ජාතකය** ත් ප්‍රමුඛයහ.

## කව් සිළුමිණ ii

කර්තෘ — තල්අරම්බේ ධම්මක්ඛන්ධ හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1826
ප්‍රමාණය — පද්‍ය 124

මයූර යුගලය, කව්මුතුහර යුගලය, ආදි සිංහල සාහිත්‍යයෙහි එක් නමින් ආ ග්‍රන්ථ යුගලයන්ට 'කව්සිළුමිණි' යුගලයක්ද එක් වූයේ ය. එක් වෘත්තයෙන් සිවුපද සතර බැගින් බැඳි මේ ග්‍රන්ථයෙහි වෘත්ත සංඛ්‍යාව එක්තිසකි. එයින් ම මෙහි පද්‍ය සංඛ්‍යාව ද අනාවෘත වෙයි. මේ වනාහි තල්අරම්බෙ හිමියන් විසින් උන්වහන්සේගේ අවසාන කාලයෙහි කරන ලද කාව්‍යයක් * හැටියට සලකනු ලැබේ. වෘත්ත ගණනාවකින් ග්‍රන්ථය නිම කිරීම උන්වහන්සේගේ අභිප්‍රාය විය.

මෙහි කථා ශරීරය වූයේ ජාතකට්ඨ කථායේ එකක නිපාතයේ එන අණ්ඩභූත ජාතකය යි. බරණැස් රජ සිය පුරෝහිතයා සමග දූ කෙළින්නේ —

'සබ්බා නදී වඞ්ක ගතා - සබ්බෙ කට්ඨමයා වනා
සබ්බිත්ථියො කරෙ පාපං - ලභමානා නිවාතකෙ'

යන ගය ගයා ඒ සත්‍යානුභාවයෙන් හැම විට දිනයි. මෙ කරුණ පරීක්ෂා කොට දත් බමුණු තෙමේ රජුගේ ගය නො සැබෑ කරනු වස් උපායයක් යෙදී. ගැබ්දරි ස්ත්‍රියක සිය මැදුරට ගෙන්වා ගෙන ඇය වැදූ කුමරිය අන් පුරුෂයකු නො දක්නා දී වඩා තම හට බිරිය කොට ගත්තේ ය. එහෙයින් ඕ තොමෝ පිරිසුදු පතිව්‍රතය ඇත්තී වූ යෑ. ඉක්බිති රජ හා දූ කෙළියෙහි යෙදුණු පුරෝහිත —

---

* මෙම කාව්‍යයේ අවසාන පද්‍ය කිහිපය තල්අරම්බේ හිමියන්ගේ ශිෂ්‍ය සුමිත්ත හිමියන් විසින් කරන ලද බව කියති.

'සියලු ඉතිරිනු ඉඩ—ලදෙත් පව් නො ම නො කෙරෙනි' යී රජුගැයූ විට මගේ භාර්‍යාව හැර ගැහුව මැනවි යි කී ය යි. රජුගේ බස බොරු වන්නෙත් රජ පැරදේ. රජු උපායයෙන් පුරුෂයකු යවා ඒ ස්ත්‍රියගේ පතිව්‍රතය බිඳ වූයේ ය. ගිය පුරුෂ තෙමේ ස්ත්‍රිය ලවා ඇස් බැඳ බමුණා නටවා ඔහුගේ හිසෙහි මිටින් පැහැර (ටොකු ඇන) ආයේ ය.

මේ කථාව වස්තු කොට ගත් තල්අරඹේ හිමි කවන් පිනවනු වස් දෙවැනි කව් සිළුමිණක් සිංහල සාහිත්‍ය වංශයට එක් කෙළේ ය.

## කව්මිණි රන්දම.

කර්තෘ:— තල්අරඹේ සුමිත්ත හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1832
ප්‍රමාණය:— පද්‍ය 365

කව්මිණි රන්දම වූකලි සිළුමිණ—සේකර—මිණිකොඬල—මිණිමල්දම— ආදි කව් පොත් පෙළෙහි වැටෙන මේ සම්පාදිත ග්‍රන්ථයකි. කව්මිණියෙන් සැරසූ රන්දමක් වැනිනු යි මේ අන්වර්ථ විසින් එ නම් විය. මෙහි රන්දම වූකලි ජාතකට්ඨ කථායෙහි එකක නිපාතයේ එන පඤ්චායුධ ජාතකය යි. කාව්‍ය යෙහි මුල සිට අග තෙක් පවත්නා මේ කථා ශරීරය නො කැඩී පවත්නා රන්දමක් වැන්න. ශබ්දාර්ථ විසින් දෙ වැදෑරුම් වූ මෙහි පවත්නා අලඞ්කාර ජාතය මේ රන්දමෙහි අවුණා ලූ මිණි රුසකි. මෙසේ මේ ග්‍රන්ථය කාව්‍ය රසඥ සාධුන්ගේ ගෙල හොබ වන කව්මිණි රන්දමක් විය.

මාතර තලකඳ වෙහෙර වාසී සුමිත්ත නම් තෙරකෙනෙක් මේ ග්‍රන්ථයෙහි කර්තෘ වූහ. මුන් වහන්සේ සුප්‍රකට කවියකු වූ තල්අරඹේ ධම්මක්ඛන්ධ හිමියන්ගේ ශිෂ්‍යවරයෙකි*.

මේ ග්‍රන්ථය රචනා කරන ලද්දේ සිංහල රාජ්‍යය ඉංග්‍රීසි කිරුළට අයත් වීමෙන් සතළොස් විසකට පසුව ය. එනම් ක්‍රි: ව: 1832 වැනි වර්ෂයේ යැ. මේ වූකලි සර් රොබට් විල්මට් හෝර්ටන් (ක්‍රි: ව: 1831—37) ආණ්ඩුකාර තුමන්ගේ කාලය යි.

දකිනා ලෙස මොක් පු ර
අප මුනි රදුගෙ ගුණස ර
පෙර සිරිතක් ගෙනැ ර
කියමි සැකෙවින් මදක් එළික ර

මගද සහ සකු බ ස
නො හසල සතට කිසි ලෙ ස
දැනුමට යුතු වෙසෙ ස
එ ගැණ පවසමි මදක් වී තො ස

* සුමිත්ත හිමියන්ගේ පැවිදි ආචාර්‍යවරයෝ කැබිලියපොල අත්ථසාර මහා ස්ථවිරයෝ ය. අත්ථසාර හිමි මිරිස්සේ ධම්මදස්සි සිල්වතුන් ඇදුරු කොට ඇත්තේ ය. මේ සිල්වත්හු සඟරජ හිමියන් හා සමකාලීන වූහ.

යනුවෙන් ග්‍රන්‍ථ කරණයෙහි නිමිති දක්වූහ. මේ රචනාව කරන විට ගත් කරුවන්ගේ වයස තෙ විස්සකි. වයසින් මුහුකුරා නො ගියද කාව්‍ය පරිචිතියෙන් පරිනතව සිටි බවට මේ රචනාව නිදර්‍ශන කොට හැකි ය.

**කථා සාරය.** බරණැස් රජහු පින් බෝසත් පඤ්චායුධ කුමරු තක්සලායෙහි උගත් ශිල්ප ඇත්තේ -පෙරලා නුවරට එයි. අතරමග සිලෙසලෝම නම් යකකු අරක්ගත් වනයෙක් ඇත. වන මාර්‍ගයට අභිමුඛව එන කුමරුට "පින්වත! ඉදිරි මාර්‍ගයෙහි රකුස් නිවෙස ය. දිවි කැමැත්තෙහි නම් වන මඟින් ඉමිත්ව යව" යි ගම්හු කීහ. බිය නම් කුමක්දැයි නො දත් කුමරු ඔවුන් බස් නො ගිවිස වන මැදට පැමිණියේ ය. යමයා මෙන් දල්වූ නෙතු මුවැති රකුසු ඉදිරියට එන. කුමරු හියක් දුනුදිය රඳවා වේග දනවා විද පියා. දල ලොමින් හෙවුණු රකුස් සමෙහි හිය රැඳිණ. කුමරු මෙසේ පන්සියයක් ම හී විද පියා නිරායුධ විය. ඉක්බිති කිලි පොලා පියා හී බිම හෙලා තමන් වෙත පැමිණි රකුසුට කුමරු අතින් ගැසීය. එ යත් සිරුරෙහි ඇලිණ. දෙවන අතින් හා දෙ පයින්ද ගසා කෙලවර හිසින් ද ඇන පි ය. කුමරු පස්තැනින් ම රකුස් සිරුරෙහි ඇලිණ. එහෙත් හේ නො බිය වැ සිටී. "සැබවින් ම පින්වත! මට ගොදුරු ව සිටිමින් මෙසේ නො බිය වන්නෙහි කුමක් හෙයිනැ යි රකුසා පිළිවිසී ය. "එම්බල රකුස මා ලයෙහි අවි පසෙක් ඇත. එයින් ලෝවැස්සෝ මා පඤ්චායුධ ය යි දනිති. ඉදින් තෝ මා කෑයෙහි නම් අපි දෙදෙන ම එක තැන නසින්නමු. එහෙයින් මම නො බියවමැ"යි කුමරු පැවසී ය. අනතුරු ව බිය පත් රකුසා දමනයෙහි ලා පන්සිල්හි පිහිටුවා සිය නිවසට ගෙන ගොස් දෙවොලක වස්වා වැටුප් තැබවී ය.

"කව්මිණිරන්දමේ" රත්හුය වූයේ මේ බොධිසත්ත්වාපදානය යි. මේ අපදාන කාව්‍යය පුර-ස්ත්‍රී-වනොද්‍යානාදි මහා කාව්‍යයකට වුවමනා බොහෝ වර්‍ණනාවලින් සමුපෙත යැ. පඤ්චායුධ කුමරු තක්සලාහි සිට එන අතර හමුවූ වනයත් කුමරු නුවරට වන් විට පත් ග්‍රීෂ්ම කාලයත්, මෙහි මැනවින් වැනූ දෙ තැනකි. යමකාදි දුෂ්කර බන්‍ධන දක්නට ලැබෙන්නේ එහිදී ය. මහායමක -අර්‍ධභ්‍රම - අවුල්ජල - පක්‍ෂපත - මුරජ-කූටාගාර-කචාට-ධවජ-ඒකාක්‍ෂර ආදී එම දුෂ්කර බන්‍ධන සුමිතත හිමියන්ගේ බන්‍ධන චාතුර්‍ය්‍යය විදහා පෑමෙහි සමර්‍ත්‍ය යැ. මහනුවර කාලයෙහි විසූ සුප්‍රසිද්ධ දුෂ්කර බන්‍ධකයන් වන පත්තායමේ-කටුවාණේ-සාලිඇලේ-තල්අරම්බේ යන කවීන්ගේ සාමර්‍ථ්‍යයට නො දෙවැනි චාතුර්‍ය්‍යයක් ඇතිබව පෙන්වීම මෙබඳු දුෂ්කර බන්‍ධන ගෙතීමේ එක් පරමාර්‍ථයක් බව පෙනේ. එකල විසූ ලොකු කුඩා සියලු කවියන් මෙන් ම සුමිතත හිමියන් ද සවකීය කෘතියෙහි කාව්‍යශෙඛර-ගුත්තිල ආදී ශ්‍රෙෂ්ඨ කාව්‍යයන් අනුගමනය කිරීමෙන් ම වස්තු වර්‍ණනය කරනලදී. එක ම වස්තුව දෙ තුන් තැනක වර්‍ණනය වූ නමුදු එහි දක්නා ලැබෙන රචනා දීපනිය

වූකලී ගත් කරුවන් වෙත සාහිත්‍ය කාමීන්ගේ ගෞරවය අදනා සුලුය. එක වෘත්තයකින් පද්‍ය හත අටක් කියා නැවත වෙනත් වෘත්තයකින් පටන් ගැන්ම මේ රචනාවෙහි ලා අනුගමනය කළ විශෙෂ මාර්ගයකි. ව්‍යක්ත සරල පද්‍යයක් වීම නිසා සුමිත්ත හිමියන්ගේ මේ රචනය වර්ණන තරඞ්ගයෙහි උස් තැනක් ගත්තේ ය.

## කව් මුතුහර ii

කර්තෘ — කිරම ධම්මානන්ද හිමියෝ
කාලය:— ක්‍රි ව: 1820—33 අතර
ප්‍රමාණය:— පද්‍ය 115

සිංහල සාහිත්‍යයෙහි කව්මුතුහර නමින් ආ ග්‍රන්ථ ද දෙකකි. සාලිඇලේ මණිරතන හිමියන්ගේ ප්‍රසිද්ධ කව්මුතුහර පළමුවැන්නය. ඕබගෙන් ධර්ම ශාස්ත්‍ර උගත් කිරම ධම්මානන්ද සථවිරයන් වහන්සේගේ ග්‍රන්ථය දෙවැන්නය.

'කව්මුතුහර නමි ත
යුතු මෙ කව් දන මන ගෙ න
සත් පෙම් වඩවමි න
පවතිවා ඇතිතෙක් ම මෙ සසු න'

යනුවෙන් දක්වෙනුයේ ඒ කිරම දම්නද හිමියන්ගේ 'කව් මුතුහර' යි. මේ වනාහි රසවාහිනියෙහි එන කාඤ්චනදේවි වත්ථුව කවියට නැගීමෙන් කරන ලද්දකි.

ශාස්තෘන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව උන් වහන්සේගේ පාත්‍රා ධාතූන් වහන්සේ පිළිබඳ ව නොයෙක් පූජෝපහාරයන් ගෙන් මහත් උත්සවයක් කෙරෙති. මෙය පාත්‍ර මහ පූජාව ය යි නම් විය. එකල දෙවපුත්ත නගරයෙහි රජ තෙමේ රන්මුවා රථයක් තනා සෛන්ධවයන් සිව්දෙනකු යොදා අසු රියන් උණ දණ්ඩක් මතුයෙහි පාත්‍රා ධාතූන් වහන්සේ තබවා නගරය ප්‍රදක්ෂිණා කර විය. සත්දිනක් මේ උත්සවය පැවැත් වීමෙන් පසු ධර්ම දෙශනාවක් කර වූයේ ය. මේ ධර්ම දෙශනාවට මිනිස්-යක්-රකුස්-නාගාදි නොයෙක් පිරිස පැමිණියේ ය. මේ අතර කුමරිබඹසර රකින කුමරියක් ද වූවා. ඇය කෙරෙහි සිත් ඇති එක් නාගයෙක් නොයෙක් ක්‍රමයෙන් ඇය වසඟ කිරීමට යත්න දැරී. එසිනු ද අභිමතාර්ථය පූරණය නොවූ නාග තෙමේ ඇය සිය දරණ වැලින් වෙලා හිස් මුදුන්හි පෙනය තබා සිටියේ ය. ධර්ම දෙශනාවසානයෙහි පිරිස ඒ දැක කිම්දැයි විචාළේ ය. කුමරි සියලු පුවත් දන්වා ඇගේ කුමරි බඹසර බෙලෙන් තමා මුදවා යි සත්‍යක්‍රියා කළාය. මෙයින් පැහැදුණු නාග තෙමේ ඇය මුද පෙන සියයක් මවා ඇය ඊ මතු යෙහි තබා ගෞරව කෙළේ ය. සියලු ලෝවැස්සෝ ද ඇය පිදූහ. ඕ ඉන් චුත ව ගොස් දෙව්පුත් නුවර රජහට දූ ව උපන්නා ය. මෑ උපන් දින රුවන් වැස්සක් වටුයෙන් ඕ කාඤ්චන දෙවී නම් වූවා -විශිෂ්ට රූ ඇත්ති- ගිහි සැපත් හැර මහණ ව රහත් වූ.

දම්නද හිමියන්ගේ කෘතියෙහි මුතුහර වූයේ මේ වස්තුව යි. එය කවි එක්සිය පසළොසකින් නිමවා තිබේ. ආරම්භයෙහි සහ අවසනැ පද්‍ය දසයකි. සියබස් මල්දමටද වඩා මේ ග්‍රන්ථය මටසිලුටු ය. මෙහි තුන්තිස්වැන්න පටන් තෙ අසූවැනි පද්‍යය දක්වා කථාවෙහි එන ධර්ම දෙශනාවේ විස්තරය ඇතුළත් වේ. මේ පද්‍ය පනස මුතුහර කියවන්නාගේ සිත තදින් ඇද ගනී. මෙ බඳු දීර්ඝවූත් සාරගර්භවූත් ගැමියනට ප්‍රයෝජනවත් අවවාද කොටසක් ලෝවැඩ සඟරාවෙහි හැර අන් කිසි ම ග්‍රන්ථයක ලියවී නැති තරම් ය.

‘සු ව ද සඳුනෙන් මලින බරණින් සැරසු ගත ඇති යම් කෙනෙ ක්
නොම ද පිළිකුල් කරන වණ පිළියල් ලෙඩටපැමිණි නැත ක්
දු ග ද විද විද මැරී කුණුවී ගිය කලට ගඳ මැසි උද ක්
මොකද පෙර ගෑ සුවඳ සඳුනෙන් පිහිට පින් සුවඳ ම මිස ක්

මෙලෙසින් එහි එන සෙසු අවවාදයනු දු මනහර සේ පද්‍යයට නැඟී ඇත.

කව්මුතුහර ii කවර වර්ෂයකට අයත් දැ යි නො දැක් වේ. සියබස්මල්දමේ පද්‍යයනට වඩා පරිණත බුද්ධියකින් මෙහි කවි ගෙතූ බැවින් ඒ ග්‍රන්ථය හා ගත් කතුවරයන්ගේ අවසානය අතර වූ ක්‍රි: ව: 1820–33 ට අයත් තෙලෙස් වර්ෂය මේ රචනාවට හිමි වන කාල පරිච්ඡේදය වේ.

## නරේන්ද්‍ර චරිතාවලෝකන ප්‍රදීපිකා.

කර්තෘ:— යටත්වල ශ්‍රී සුනන්ද මහානායක හිමියෝ
කාලය:— ක්‍රි: ව: 1834
ප්‍රමාණය:— පරිච්ඡේද 88

අස්ගිරි විහාරයේ වැඩ විසූ යටත්වල ශ්‍රී සුනන්ද මහානායක හිමියන් විසින් පාලි මහාවංසය අනුගමනය කරමින් ලියූ සංක්ෂිප්ත ඉතිහාස ග්‍රන්ථය ‘නරේන්ද්‍ර චරිතාවලෝකන ප්‍රදීපිකා’ නමින් හැඳින් වේ. පරිච්ඡේද අටඅසූවකින් හෙබි මෙහි ලංකා ඉතිහාසයේ ආරම්භයෙහි පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසානය දක්වා සිංහල රාජවංශ කථාව හා තත් කාලීන ප්‍රවෘත්තීන් පිඬු කොට දක්වන ලද්දේ ය. නැවත ලක්දිව ඉංග්‍රීසි කිරීටයට අයත් වූ තැන් පටන් ඇඩ්වඩ් බාන්ස් ලංකේශ්වරයන් ගේ කාලය දක්වා මෙරට ඇතිවූ වෙනස්වීම් කිහිපයකු දු අව ශාන පරිච්ඡේදයෙහි සඞ්ග්‍රහ වී ඇත්තේ ය.

පාලි මහාවංස කථාව සිංහලට පෙරළා ඉතිදු සංක්ෂිප්ත ඉතිහාසයක් සැපයීම ඒ කාලය අනුව කෙතරම් දුෂ්කර වූවක් ද යනු තේරුම් ගත හැකිය. එ බඳු දුෂ්කරතාවකට මුහුණ පාමින් වුව ද, යටත්වල මහානායක හිමියන් සැපයූ මේ ග්‍රන්ථය බොහෝ දෙනාට වැඩ සැලසීමෙහි ප්‍රමාණවත් ය. එකල සිංහල ඉතිහාසයට මහත් සම්පූර්ණතාවක් මේ පොතෙන් ඇතිවී තිබේ.

මේ ඉතිහාස ග්‍රන්ථය සම්පාදනයේදී ගත් කරුවන් වහන්සේ අනුගමනය කළ වාක්‍ය ඝටනාව දීර්ඝවූවකි. එනමුත් අපේක්ෂිතාර්ථ ය නිරවුල්ව අවබොධ වීමට ඉන් බාධාවක් නො වි ය. ගත් කරුවන්ගේ ශබ්දාර්ථාවබොධයත් පරිවර්තන ශක්තියත් ඉතා උසස් කොට සැලකීමට මේ ග්‍රන්ථය උපයෝගී යැ. ඇඩ්වඩ් බාන්ස් ලඞ්කෙශ්වරයන්ගේ ආරාධනය පරිදි මේ ඉතිහාස ග්‍රන්ථය සපයන ලද්දේ විය.

> "ශ්‍රී ලඞ්කාධිපති වූ සාර් ඇඩ්වඩ් බාන්ස් ලොයි තනනත උතුමාණන් වහන්සේගේ අවසරය හෙවත් ආරාධනාව කරණකොට ගෙන කරන ලද නරෙන්ද්‍ර චරිතාව ලොකන ප්‍රදීපිකාව අති සංක්ෂෙපාති විස්තර වර්ජිත කොට මධ්‍යම ප්‍රමාණයෙන් දක්වනු ලැබේ."

බාන්ස් ආණ්ඩුකාරතුමන්ගේ සත් වර්ෂය (ක්‍රි: ව: 1824–31) තුළ කවර වර්ෂයක මේ ආරාධනාව කරන ලද්දැයි සඳහන්ව නැත. එනමුත් ග්‍රන්ථය නිම කරන ලද්දේ ක්‍රි: ව: 1834 බව සඳහන් ය. ඒ වනාහි සර් විලියම් හෝර්ටන් ආණ්ඩුකාරයන්ගේ ලඞ්කාවතරණයෙන් තුන්වැනි අවුරුද්ද වේ.

## හෙලදිව් රජනිය.

කර්තෘ:— ජෝන් පෙරේරා මහත්මයා
කාලය:— ක්‍රි: ව: 1853
ප්‍රමාණය:— පරිච්ඡෙද 20

මේ වනාහි විජය රජු පටන් ඉංග්‍රීසීන්ගේ මුල් කාලය දක්වා ලඞ්කා ඉතිහාසය පිළිබඳ ලියූ ග්‍රන්ථයකි. මහාවංස–පූජාවලී–නිකායසඞ්ග්‍රහ–රාජරත්නාකර–රාජාවලී හා පෘතුගීසි–ලන්දේසි–ඉංග්‍රීසීන් විසින් ලියූ පොත්වලින් ද කරුණු සපයා අභිනවයෙන් ඉතිහාසය ඉගෙන ගන්නවුන්ගේ ප්‍රයෝජනය සඳහා මේ "හෙල දිව් රජනිය" නිපදවන ලද්දේ ය. එකල සිංහල අභ්‍යාස විද්‍යාලයේ ප්‍රධානාචාර්ය වූ ජෝන් පෙරේරා මහත්මයා මෙහි සම්පාදකයා විය. උන්නැහේ විසින් මේ ග්‍රන්ථය සපයන ලද්දේ පරීක්ෂණාත්මක විවෙචන බුද්ධියකිනි. ග්‍රන්ථාගතව පැමිණිය ද ඇද හිය නො හැකි සේ පත් කරුණු වෙන්කොට දක්වා නිශ්චිත ප්‍රවෘත්ති පමණක් ම ග්‍රන්ථයෙහි සන්ධිය කොට දැක්වීමෙහි ගත්කරු යත්න දැරූ බව පෙනේ. මුද්‍රිත ඉතිහාසාදිය දුලභ වැ අධ්‍යාපන කටයුතු දුෂ්කර වැ පැවැති එ සමයෙහි මේ වැනි ග්‍රන්ථයක් සැපයීම එ තරම් ලෙහෙසි කරුණක් නො වේ එ හෙත් ඉතා නිරවුල් වැ සාරගර්භකොට මේ ඉතිහාස ග්‍රන්ථය සපයා තිබීම, ගත්කරු පුරාවෘත්ත විෂයෙහි විශෙෂ දැනුම් ඇත්තකු ව සිටි බව පෙන්වයි. අක්ෂර–පද ආදී වියරණ සුද්ධියක් නම් මේ ග්‍රන්ථයෙහි දක්නට නැත. තත් කාලීන වාක් ව්‍යවහාරය ම රචනා මාර්ගයෙහි යෙදී ඇත. ග්‍රන්ථය කිරීමේ හේතුව සහ එකල ව්‍යවහාර භාෂාව දැන ගැනීම පිණිස ත් හෙලදිව් රජනියේ ප්‍රාරම්භයෙහි එන වාක්‍ය ඡෙදයක් මෙහි බහාලමු.

> "දැනට ඉංග්‍රීසි සිල්පසාලාවල ඉගෙන ගැනීම පිණිස පත්වී සිටින සිංහල තරුණයින්ගෙන් එරෝපා කුරේ සිඬ වුනා ය කියන යම් කාරණයක්වත් එහලනන රාජ්‍යයේ රජ්වරු පැවතා ක්‍රමයවත් එකී රාජ්‍යවල චාරිත්‍ර ධර්මය සහ ප්‍රදෙශ විස්තරයට අදල කෙබඳු කාරණයක් නමුත් ඇසුවා ම එකී රාජ්‍යවල බොහෝ කලක් පදිංචි ව සිට ඒවා දැන කියාගත් අයවල් හා සමානව යුහුව ම උත්තර දෙනවා ඇත. නුමුත් තමාට උප්පැත්තිය දුන් තමාගේ බාලකාලයේ පටන් මේ වනතුරු ම වාසයකරන ලංකාවේ තමා නිතර අසන දකින දේවල් ගැනවත් කඳු හෙල් ගඞ්ගා යනාදිය පිහිටා තිබෙන ඉඩම් ගැනවත් පුරාණ රාජධානි වල පැවති ආංඩුක්‍රමය සහ චාරිත්‍රය ගැනවත් යමක් විචාලොත් ............හරි උත්තර පවා අනුමාන උත්තරයක්වත් දෙන්නට සමහර විට සියයකුගෙන් එක්කෙනකුට වත් පුළුවන් වෙන්නේ නැත. මෙසේ............(ඒ) සිංහල මනුෂ්‍යයින්ට තේරුම් ගැනීමට පහසු අදමට තමන්ගේ ජන්ම භාෂාවෙන් මෙබඳු පොතක් මේ කාලයේදී ප්‍රසිඬ කරනවා නම් බොහෝ ප්‍රයෝජන ව ඇත කියා මෙම පොත සාදන්නා වූ මට කල්පනා වෙනවා පමණකුත් නො ව කියවන්නා වූ සියල්ලන්ට ද එසේ හැඟී යා ය කියා මම විස්වාස කරණවා ය.

මුලසිට අග දක්වා ම ලියැවුණේ මේ බසිනි. මේ මෙසේ වුවත් කියන කරුණු නම් ඉතා ම සාර ය.

මුල් පරිච්ඡේදයේ ලඞ්කාව ගැන හැඳින්වීමක් ද දෙවැන්නේ සිට එකුන්විසිවැනි පරිච්ඡේදය දක්වා සිංහල ඉතිහාස කථාව ද විසිවැනි පරිච්ඡේදයේ පෘතුගීසි කාලයේ පටන් ක්‍රි: ව: 1850 දක්වා ලඞ්කාවේ වැදගත් සිදුවීම් පිළිබඳ සටහනක් ද දක්වන ලද්දේ ය.

'හෙලදිව් රජනිය' නවීන ඉතිහාස ග්‍රන්ථ මාලායෙහි පළමු වැන්න ය. එහෙයින් මේ ග්‍රන්ථය තත් කාලීන බුඬිමත් ඓතිහාසිකයන් විසින් බහුතර සම්මානනයෙන් පිළිගන්නා ලද්දේ ය. අද වුවද යම් යම් කරුණු නිශ්චය කර ගැනීමෙහි ලා මේ ග්‍රන්ථයෙන් ලබන හැකි ප්‍රයෝජන අපමණ හි.

එකුන්විසිවැනි ශතවර්ෂයේ නිපැයුණු තවත් ග්‍රන්ථ විශාල සඞ්ඛ්‍යාවක් දක්නට ලැබෙතු දු, සාහිත්‍ය ප්‍රමාණය අනුව ඒවා එතරම් විස්තරයෙන් දත යුත්තාහු නො වෙති. ග්‍රන්ථ බාහුල්‍ය හීනිය නිසා ඒ ග්‍රන්ථ සමූහය මෙහිදී උද්දෙශ මාත්‍රයෙන් හඳුන්වනු ලැබේ. 'කවිතිලක' යන අපර නාමයක් ඇති **කොටහේවා මඞගලය** කිරිමෙන් ප්‍රසිඬියටපත් මිදෙල්ලව කෝරාල විසින් 'අරිෂට ශතකය' හා 'යොග ශතකය' නමැති ප්‍රසිඬ වෛද්‍ය සඞග්‍රහ දෙක හෙළු කවියට නගා කව් 264 කින් හා 231 කින් නිම කල **අරිෂට මාලාව** හා **යොග මාලාව** කෝට්ටේ සමයෙහි කල 'යොගරත්නාකර'යෙන් පසු නිපැයුණු,

සිංහල වෙදපොත් දෙකකි. එතුමන් කළ **රාජනීතිය** ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නැවි නැංවීම වස්තුකොට ඇති කවි 95 කින් යුත් කුඩා පද්‍යයකි. **නෙවිලි මාලය** ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහි කර වන කවකි. එක ම වෘත්තයකින් රචිත කවි 49 ක් ඇති එහි එ රජු ‘දුම්බර කෙත’ නෙළු වූ සැටි විස්තර වේ. මෙ සමයෙහි ම ලියැවුණු තවත් ඉතිහාස පොත් දෙකක් නම් **සුළු රාජාවලිය** හා **රාජවංශය** යි. මින් සුළු රාජාවලියෙහි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසානය දක්වා ඉතිහාස කථාව සංක්ෂෙපයෙන් සඞ්ග්‍රහ වන අතර, රාජවංශයෙහි කොලින් කැමල් ආණ්ඩුකාරතුමන් දක්වා තොරතුරු ඇතුළත් වෙයි. හිරුවාපත්තුවේ කණුමුල්දෙණියේ වැඩ විසූ ‘පුස්වික්‍රම’ නමින් ප්‍රසිද්ධ ධම්මාරාම හිමියන්ගේ **විබත් මල්දම** කැරුණේත් මේ කල ම යැ. එය වනාහි සිදත්සඟරාවෙන් පසු මේ වන තෙක් සාහිත්‍යයෙහි ප්‍රවේශය ලත් එක ම ව්‍යාකරණ ග්‍රන්ථය යි. සත් විබත්—තෙකල්—විදි—ආසි—පෙර— මුසු හා පියදු යන ක්‍රියා සොදහරණ වැ එහි දක්සිත යි. එ කල සිංහල භාෂාව ඉගෙන ගත් බොහෝ දෙනා ට මේ විබත් මල්දම ප්‍රයොජනවත් විය.* මේ පුස්වික්‍රම හිමියන්ගේ තවත් පොතක් නම් **සුධා භොජන ජාතක කාව්‍යය** යි. එහි පද්‍ය 294 කි. ක්‍රි. ව. 1827 දී **ශ්‍රීපාදස්ථානයේ නායක පදවිය ලත් ගාල්ලේ මෙධඞ්කර*** හිමියන්ට සුභ ප්‍රාර්ථනා පිණිස කළ **කවි බිඹු හෙම් දපණ** නම් ස්තුති කාව්‍යයක කර්තෘවූවෝ ද මේ දම්රම් හිමියෝ ය. ක්‍රි. ව. 1818 දී රචිත වූ **බුඩ ස්තොත්‍ර කාව්‍යයක්** ද දක්නා ලැබෙතත් එහි කර්තෘ අවිනිශ්චිත ය. එ කවෙහි බුදුරජුන්ගේ අතීත ආත්ම කිහිපයෙක්හි අනුභාව මහත්වය හා බුඩ වන්දනාව කු දු ඇතුළත් වී ඇත. **නාරි සත් සන්දේශය** මෙ වක ලියූ ගමන් විස්තරයකි. නාතගනේ ස්ත්‍රීන් සත්දෙනකු දඹුලු විහාරය වැඳි පුවත විස්තර වන එහි කතුවරයා සත් කෝරළයේ මැටිඹඑව ගමේ ශිල්පාධිපති නමැති ගණිතැදුරු යි. ‘ගමන් අස්න’ නමින් හැඳින වූ මෙහි මුල්කොටස වෘත්තගන්ධි ලක්ෂණයෙන් ලියූ වාසගමකි. නැවත එය ම 150 ක් කවියට නැගී මෙන් දෙවන කොටස සම්පාදිත ය. එය ‘සන්දේශය’ නමින් ආයේ ය. මාතර සරණපාල හිමියෝ විවිධ විෂයීය පොත්

---

* කරතොට ධම්මාරාම නාහිමියන් වෙත ශාස්ත්‍රය උගත් ගාල්ලේ මෙධඞ්කර හිමියෝ පැල්මඩුල්ලේ පුරාණ විහාරයට පැමිණ ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසකට ඉගැන්වීම ආරම්භ කළහ. උන් වහන්සේගේ ඇවෑමෙන් ශ්‍රී පාදස්ථානයේ නායක පදවිය ලත් ඉඳුරුවේ සුමඞ්ගල හිමියෝ පූර්වොක්ත ශිෂ්‍ය පිරිසට ඉගැන්වීම කරමින් වැඩ සිටියහ. මෙ දෙපඬිවරයන් ඇසුරෙන් ධර්මශාස්ත්‍රාදී ග්‍රහණය කළ වුන් අතර වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයෙහි ප්‍රමුඛයාණ වූ වලානේ සිද්ධාර්ථ හිමියෝ ශ්‍රෙෂ්ඨය හ.

කිහිපයක් සැපයූ බහුශ්‍රැතයෙකි. **හෙලදිව් අබිදනවන** නමැති නාමාවලිය, **කෝලම්ඩිය**, **වෙදහටන**, **ලෝවැඩ භාෂිතය**, **මයි මතය**, **යොගාභරණය** ආදී කුඩා පොත් සමූහයක් ම සැපයූයේ උන් වහන්සේ විසිනි. කෙසෙල්හේනාවේ සිංහබා කවියා **තෙලපත්ත ජාතකය** හා **ජින වංශය** නම් ලද මහා සම්මත ප්‍රවෘත්තිය කවි කෙළේ ය. ක්‍රි. ව. 1852 දී හෙතෙමේ දෙතිස් කුණපය විස්තු කොට පද්‍ය අටසැටකින් යුත් **පිළිකුල් භාවනා කව** කෙළේ ය. බලහරුවේ සුමඞ්ගල හිමියන් එ කරුණ ම විස්තර කොට **පිළිකුල් භාවනාව** නම් ගද්‍යය ලීවේ ද ඒ වර්ෂයේ දී ම ය. **කව්මිණි පහන** නමින් ප්‍රසිද්ධ සාරසිය දෙළොසක් පද්‍යයෙන් යුත් 'දීඝීතිකොසල ජාතකය' කවි කෙළේ වැලිහිටියේ සුමන තෙරණුවන් විසිනි. කවි 197 කින් යුත් **මයූර සංදේශය** ද උන් වහන්සේගේ අනික් රචනාවකි. ඒ අස්න තාළිකා වැනුම්වලින් යුත් රමණීය පද්‍යාවලියකි. ස්වකීය තැපකරුවකු වන බබුන් අප්පු ගොවිරාළගේ නෙත්‍ර රෝගය සුවකර දෙන සේ කතරගම දෙවිඳුන් යැදීම එහි පරමාර්ථය විය.

ශාස්ත්‍රය වහා පැතිරවීමට ඇතිව තිබූ අවකාශය නිසා 19 වැනි ශත වර්ෂයේ මධ්‍ය යුගය වන විට දිවයිනේ නොයෙක් දෙසින් ප්‍රබන්ධ කරුවෝ පැන නගින්නට වන්හ. කන් බිහිරි වන සේ කරදර හඬ නගමින් එන දෙමළිනි රැලක් මෙන් හැම පැත්තකින් ම මේ කවියන්ගේ කවිහඬ ඇසෙන්නට වූයේ ය. ඔවුහු තම යුගයේ මතු වී පැවැති යම් කිසි සිදුවීමක් හෝ දුටු ඇසූ යමක් හෝ ගෙන කවි කීවෝ ය. මෙසේ මෙ සමයෙහි **වෙද උරේ**, **වින්නි හත**, **මත්වතු ලකර**, **මඟුල් කපුරාළගේ චරිතය**, **සියම් රාජ කුමාර පැවිදි වත**, ආදි විවිධ කාව්‍ය ප්‍රබන්ධ සමූහයක් මුද්‍රණයෙන් ප්‍රචාරයට පැමිණියේ ය. බොහෝ දෙනකුගේ සිත කවියට නැමී පැවැති මෙ සමයෙහි උසස් පද්‍යයක් පහළ වූයේ කලාතුරිනි. එකල රචිත වූ ගද්‍ය ග්‍රන්ථයන් අතර **සිංහල රාමායනය**, **අරාබිනිසොල්ලාස වස්තුව** හා **සිංහල බයිබලය** ත් ප්‍රමාණයෙන් විශාල අනුවාද තුනකි. කියවීමට රසවත් වූ කථා වස්තූන් ඇතුළත් වූයෙන් රාමායන කථාව හා අරාබිනිසොල්ලාස වස්තුව එකල බොහෝ දෙනාගේ ප්‍රමොද්‍යය පිණිස පැවැත්තේ ය. එහෙත් සෙසු සාහිත්‍යාඞ්ගයන්ගෙන් බෙහෙවින් ඈත්වූ නිසා මෙ බදු අනුවාදයන්ගෙන් සැලසුනු සේවය ද එ තරම් විශාල නො වේ. මේ නිසා මිළහට 'වර්ධන තරඞ්ග'යෙහි ලා විස්තර විය යුතු ශ්‍රෙෂ්ඨතම කෘතිය නම් මහාවංස අනුවාදය යි.

## සිංහල මහාවංසය

කතෘවරු: —i හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක හිමියෝ
ii ශ්‍රී දෙවරක්ඛිත බටුවන්තුඩාවේ පඬිතුමා
කාලය :— ක්‍රි. ව. 1874.
ප්‍රමාණය :— පරිච්ඡෙද 100.

සිංහලයන්ගේ ශ්‍රේෂ්ඨතම ඓතිහාසික ග්‍රන්ථය මහාවංශ යයි. බුදුරජාණන් වහන්සේගේ ලඞ්කාවතරණයෙන් ආරම්භවන ලඞ්කා මහාවංශ ඉතිහාසය සිංහල ජාතියේ අවසානය තෙක් වැඩෙන එක ම ග්‍රන්ථය ද වේ. අදට වසර දෙදහස් හාරසිය අසූවක් වි පවත්නා මේ ග්‍රන්ථයෙහි කතුවරයන් පස්දෙනෙකි. ධාතුසේන රජුගේ මයිලණුවන් වූ **මහානාම** හිමිපාණෝ ය, පොළොන්නරු පුර දූපාරාමයෙහි විසූ **මුගලන්** හිමිපාණෝ ය, දඹදෙණි කල විසූ ධම්**කිත්ති** සංඝරාජයෝ ය, කිත්ති ශ්‍රී රාජසිංහ මිහිපලුන් සමයෙහි වැජඹුණු තිබ්බටුවාවේ **සිද්ධාත්ථ බුද්ධරක්ඛිත** මහානායක හිමියෝ ය, ගෝනගල සුධර්මාකර පරිවෙණාධිපති පණ්ඩිත යගිරල **ශ්‍රී ප්‍රඥානන්ද** පහතරට ප්‍රධාන නායක හිමියෝ ය යන ඒ පඬිවරයන් විසින් පිළිවෙලින් පරිච්ඡෙද සත්තිස ය, තෙසාළිස ය, දසය, දසය හා තුදුස බැගින් ලියන ලදු ව විශාල පාලි මහා කාව්‍යයක් වූ මහාවංශය ඉතිහාස ග්‍රන්ථයන් අතර සාම්‍රාජ්‍යය ලබන්නේ ය. ලඞ්කා පුරාවෘත්තයෙහි මතු නො වැ භාරත පුරාවෘත්තයෙහි පවා අන්ධකාර ස්ථානයන් පහදා ගැනීමෙහි මහා වංශයෙන් ලැබෙන පිහිට සලකන විට සමස්ත ලෝක සම්භාව්‍යත්වය ලැබීමෙහි එහි ඇති සුදුසුකම පැහැදිලි වන්නේ ය. රාජකීය පුස්තකාලයන්හි හා වෙනත් ස්ථානයන්හි තැන්පත්ව තිබූ ලිපි ලේඛන, ග්‍රන්ථාගතව හා පුරාවෘත්තගතව එන වෘත්තාන්ත කථාද සමකාලීය සමකීය සමයන්හි ඒ ඒ කතුවරයන්ගේ ප්‍රත්‍යක්ෂයන් ද ඇතුළත් මෙමින් ක්‍රමානුකූල ව සඞ්ග්‍රහ වූ සත්‍යයෙන් සත්‍යය ගැටගසා කරන ලද හෙයින් සත්‍යසන්ධාන වූ මහාවංශය ඉතිහාස සම්පාදකයනට ආදර්ශකර ද සමාලෝචක යනට ප්‍රබෝධකර ද වන්නේ ය. සිද්ධාත්ථ බුද්ධරක්ඛිත හිමියන් ගේ භාගයෙන් අවසන්ව පරිච්ඡෙද සියයකින් හෙබි පාලි මහාවංසය එකුන්විසිවැනි ශතවර්ෂයේ අවසාන භාගයතෙක් පාලි භාෂාව දත්තවුන්ගේ ප්‍රයොජනය සලසමින් පැවැත් තේ ය. විසිතුරු සිත්යම් පටක් ගත කඩකින් මැසුවාක් මෙන් තමන් විසින් අවශ්‍යයෙන් දත යුතු ස්වජාතිය අතීත ප්‍රවෘත්තිය මෙසේ වැසී තිබීම ඉතිහාස කථා ජිඥාසුන්ගේ අසහනයට හෙතුවක් විය..

ලංකා මහජනතාවට හිත වැඩ සැලසීමෙහි සතතාභිලාෂවත් වූ සර් හෙන්රි ග්‍රැගරි ලංකාමණ්ඩලේශ්වරයන්ගේ ඇරයුම පරිදි ක්‍රි. ව. 1874 වැනි වර්ෂයෙහි තත් කාලීන ලංකා සාහිත්‍යාම්බරයෙහි ගුරු-සිකුරු දෙ තරුව වැනි වූ මහා පණ්ඩිවරයන් දෙදෙනකු මහාවංශ අනුවාදයෙහි යෙදුනේ මේ නිසා යැ. විද්‍යෝදය පරිවෙණාධිපති සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක ස්වාමීන්ද්‍රයන් හා බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පණ්ඩිතුමන් ද යන ඒ දෙ පණ්ඩිවරයන්ගේ උත්සාහය නිසා වැසී තිබූ මහාවංශ කථාව වලාකඩක් පහව ගිය කල්හි මිහිතෙලෙහි පලායන සඳරැසක් මෙන් ලක්දිව පුරා පැතිරී ගියේ — රසඥයන් ගේ සිත් කුමුදු පෙබ යූයේ යි.

**වර්න තරඞ්ගය මෙතෙකින්**
**සමාප්තයි.**

සමස්ත සාධු ජනතාවට ප්‍රීති ප්‍රමෝදාවහ වූ සිංහල ග්‍රන්ථාවලියෙහි **නූතන අවස්ථාව** පිළිබඳ තරඞ්ග ත්‍රයකින් සමුපේත වූ **සන්නස්ගල සන්නස් මුදියන්සේලාගේ පුඤ්චිබණ්ඩාර** හෙවත් **පුඤ්චිබණ්ඩාර සන්නස්ගල** විසින් කරන ලද සිංහල **සාහිත්‍ය වංශය** මෙතෙකින් නිමියේ යි.

# සාහිත්‍ය ශේෂය

මහනුවර සාහිත්‍ය වංශයෙහි නම් වශයෙන් වුවත් සඳහන් විය යුතු පොත් තවත් විශාල සංඛ්‍යාවකි. ව්‍යාඛ්‍යා යැ, සාමාන්‍ය යැ, ශාස්ත්‍රීය යැ යි එම ග්‍රන්ථයෝ මෙහි තුන් කොටසෙක්හි සංග්‍රහ කොට සංක්ෂෙපයෙන් හඳුන්වනු ලැබෙති. මෙයින් කිහිපයක් හැර සෙසු පොත්වලින් තත් තත් විෂයනට මැ මිස සාහිත්‍යයට එ තරම් සේවයක් නො සැලසේ.

## 1. ව්‍යාඛ්‍යා ග්‍රන්ථ

ව්‍යාඛ්‍යාව වනාහි මහනුවර සාහිත්‍යයෙහි උසස් අඩියකි. පොත් පත් දැවී- ශාස්ත්‍රය වැනසී පැවැති මහනුවර මුල් භාගයේ පාලි සංස්කෘත භාෂාධ්‍යාපනය අති දුෂ්කර කාර්‍ය්‍යයක් ව පැවැත්තේ ය. එ කල තද් භාෂාශාස්ත්‍රයන් දැන උගත් කිහිප දෙනෙක් වුහු නම් ඔවුහු ගුරු මුඛයෙන් ලත් දැනීම් මාත්‍රයක් ම ඇත්තෝ වූහ. ව්‍යාකරණාදී දුෂ්කර විෂයීය ග්‍රන්ථයන් පිළිබඳ ගුරු පරපුරෙන් පැමිණි අර්ථ මාර්ගීය මේ පඬිවරයන් විසින් ඉතා දුකසේ ස්මෘතියෙන් ධරණ ලද්දේ ය. විචාර්‍ය්‍ය ප්‍රතිභානය සැඟවී පැවැති ඒ අවස්ථාවෙහි දෙශ විෂමත්වය අනුව පැමිණි ස්මෘති විකලත්වය නිසා එ ද ක්‍රමයෙන් අතුරුදහන් වන්නට විය. එ බඳු සමයක පහළ වූ සරණඞ්කර සඟරජ හිමියන්ගේ ශාස්ත්‍ර-ව්‍යපත්ති ව්‍යාපාරයාගේ ප්‍රධාන අඩියක් වශයෙන් මේ ව්‍යාඛ්‍යාකරණය නැවත ආරම්භ විය. එහි ආරම්භක කර්තව්‍යය වශයෙන් උත්වහන්සේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් **භෙසජ්ජ මඤ්ජූසා** නම් වෛද්‍ය ග්‍රන්ථය ව්‍යාඛ්‍යාන කළහ. පාලිභාෂාවගේ අල්පව්‍යාප්තිය ය, වෛද්‍යග්‍රන්ථයක් වීම ය, අන් පොතකින් උපස්ථම්භ නො ලැබීම ය, යන තෙ කරුණට එළඹ සරණඞ්කර මාහිමියෝ එහිදී මහත් ආයාශයක් ඉසුලූ හ. ඔබගේ නො පසුබට ධෛර්‍ය්‍යය ප්‍රකාශ වූයේ ග්‍රන්ථය ඔප්පු කරන ලද්දේ එහෙයින් ම පහන් වූ රජතුමෝ ඔබට ධෛර්‍ය්‍ය පිණ්ඩයක් බඳු හස්ති රාජයකු පුද කළහ.

ශාස්ත්‍රාලෝකයෙන් එකලුව ගිය මෙ සමයෙහි ග්‍රන්ථාන්තර යෙන් ලත් පිහිට ඇතිවැ නිපැයෙන ව්‍යාඛ්‍යාවනට ශාස්ත්‍රධාරීන් ගේ සැලකිල්ල එ තරම් උසස් නො වුව ද, එ දින ව්‍යාඛ්‍යාව කොතරම් උසස් රචනයක් කොට සලකන ලද්දේ ද යනු මින් අනාවරණය වෙයි. මෙයින් උපස්ථම්භය ලත් පඬිවරු මීට පසු නොයෙක් ක්‍රමයේ සන්න නිපදවීමෙහි ව්‍යාවෘත වූහ. සඟරජ හිමියන්ගේ **බොධිවංස සන්නය**, **සතර බණවර සන්නය**,

ආදිකොට ඇති නොයෙක් සූත්‍ර සන්න මේ අතර පහළ විය. එයින් නිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහා නායක හිමියන්ගේ **සතිපට්ඨාන සූත්‍ර සන්නය**, කුඹුරුපිටියේ ගුණරතන හිමියන් ගේ හඤ්පෙදපම, **කාලකාරාම** යන සූත්‍ර සන්න, කුංකුණාවේ සුමඞ්ගල හිමියන් ගේ **ධම්මචේතිය සූත්‍ර සන්නය** බැම්බුණිවත්තේ හිමියන් ගේ **අරියවංස සූත්‍ර සන්නය** කඩුවෙල ශොභිත හිමියන් ගේ **බාල පණ්ඩිතොපම සූත්‍ර සන්නයත්** එවක අතිශයින් ප්‍රසිද්ධ වූ හ. අභයගිරිකයන් ගේ ධර්ම පුස්තකයකැ යි සලකන **සද්ධම්මොපායනය** ද, බුද්ධරක්ෂිත මහා නායක හිමියන් විසින් ව්‍යාඛ්‍යා කරන ලද්දේ ය. දියසුන්නත ධම්මජෝති හිමියෝ **බාලාවතාර ලියන සන්නය** කළහ. සඟරජ හිමියන් ගේ ශ්‍රේෂ්ඨ ශිෂ්‍යයකු වූ අත්තරගම රාජගුරු බණ්ඩාර තෙමේ **සාරසංක්ෂෙපය** ප්‍රමුඛ කොට ඇති සංස්කෘත ව්‍යාඛ්‍යාන කිහිපයක් කෙළේ ය.

මේ අයුරින් පහළ වූ සියලු සන්නයන් ගෙන් ම භාෂා-සාහිත්‍යයට යම්කිසි ප්‍රයෝජනයක් ගෙන නො දෙන්නේ නො වේ. එහෙත් මහනුවර මේ සන්න පොත් පෙළ වාර්මානිකයන් ගේ සම්භාවනයට පාත්‍රවන්නේ ඒ ප්‍රයෝජන මාත්‍රය නිසා නො වැ, වියළෙමින් පැවැති තත් කාලීන සෙංකඩගල ශාස්ත්‍ර ලතාවට වැගිරුණු සිහිල් ජලයක් වූ හෙයිනි.

## 2. සාමාන්‍ය ග්‍රන්ථ

නොයෙක් අයුරින් ලියැවී තිබෙන ගද්‍ය පද්‍ය ග්‍රන්ථ මෙහි සාමාන්‍ය යැ යි හඳුන්වනු ලැබේ. මේ පොත්වල බෙහෙවින් කර්තෘ කාලාදිය සඳහන් ව නැති. මින් බොහොමයක් ම පද්‍ය යෝ ය. මේ පද්‍යයන් ලියූවන් අතර බොහෝදෙනෙක් ම සිවු පදය ගැට ගැසීමට වැඩි උගත් කමක් හෝ අභ්‍යාසයක් නො ලත් ගැම්යෝ ය. අසම්බන්ධතා— ග්‍රාම්‍යතා— උනාතිරික්තතා— පරස්පර විරෝධතා ආදී විවිධ දෝෂයන් ගෙන් ගහණ වැ ගිය මේ පොත් ගැන දෝෂ විචාරයක් ද එහෙයින් ම අනවශ්‍ය ය. යථෝක්ත කවිපොත් ලියූවන් අතර ඇතැමෙක් තමන්, වියරණ කවි සමය තබා යවහන් පමණවත් නො දනිති යි තුමූ ම කිහ.

ය ව හ න් පද අග මුල නො දූ නෙයි මට
ඉ ව ස න් වියතුනි උනත් වරද මට
දි ව ස න් පත්වෙයි ඇසූ දනන් හට
ප ව ස න් ගුණ අවුරුදු පන්දහ සට

(මහබිනික්මන්කව)

මෙසේ යවහන් පමණ වත් නො දූන කවි ලිවීමෙන් ඇති විය හැකි වස් දෙස් ගැන ද ඇතැමෙක් බිය වූහ. එහි දී ඔහු ග්‍රන්ථාරම්භයෙහි ම එයට ප්‍රතිකර්මයක් වශයෙන් දෙවියන් බුදුන් මතු නො වැ සිද්ධස්ථාන ද සවකීය කෘතියෙහි වස් දෙස් පහව්ම සඳහා යැදූහ.

'කීවෙමි පදහිත් අක්සර නො දන ම ගත් තේ
දෙවියන් තිස්තුන් කෝටිය ගණිතක් නැත් තේ
තොසියම් විටවත් දෙවියෝ සිහිකර ගත් තේ
මහියංගන දතු බෙලෙන් වස් මට නැත් තේ'

(උමන්දකව)

සවකීය අව්‍යක්තතායෙන් සාහිත්‍ය ක්ෂෙත්‍රයෙහි ඉපදිය හැකි ලවන් වැනි විපත්තිකර දෙෂයන්හට තමන් කෙරෙහි උරණ නොවන සේ කෙත් හිමියන් වූ ශ්‍රෙෂ්ඨ කවීන් අයැද සිටි කවි කරුවෝ ද මේ අතර වූහ.

'සෙතේ කමින් මම බතේ බලා ගෙන තැනේ
මෙ පද මම කවි කෙරුව හි
වි තේ කමින් සිට දූතේ නැතිත් හට ගුණේ
වඩා ලැය සමාදි වෙ හි
පි තේ මහිම මට පෙනේ උතුම් ලෙස දූතේ
සයලු සැප මතු සිදු වෙ හි
අ තේ මෙ මට කිවිඳුනේ උරණ නො වැ පෙනේ
දෙස සැම මකරෙට යෙ හි'

(හිමාල විසතරය)

මෙසේ බියෙන් හා සැකයෙන් පිරිකී ඇරැඹූ පද්‍යාවලිය සිය ගණින් දෙෂ ජාතයන් මැද අවසන් කල මේ කවිකරුවෝ, අවසනැ තමන් කල 'මහ පිංකමෙහි' විපාක ඵලය 'ඇල්ලේ වැල්ලේ කෙළිනා දෙවියන්' පටන් මහබඹුන් දක්වා සියලු දෙවියන්ට අනුමෝදන් කරවති. ඉක්බිති එසින් තමනට ද භවයෙහි සකල සම්පත්තිය ප්‍රාර්ථනා කරති. මේ කවියන් අතර මෙ සිරිත අනුගමනය නො කල කෙනෙක් වී නම් ඒ කලාතුරකිනි.

මෙසේ සාමාන්‍යයැ යි හැඳින වූ එම ග්‍රන්ථ සමූහය **සාමයික යැ, ඓතිහාසික හෝ ප්‍රවෘත්තිකථායැ, සාමාජිකයැ, ශික්ෂාපනයැ**, යි සිව් වැදෑරුම් වේ. එහි දූ සාමයික ග්‍රන්ථයෝ නැවත, **වෙස්සන්තරාදි ජාතකයැ, යසොදරාදි චරිතයැ, දෙතිස්කුණපවණිනාදි ධර්මසඞග්‍රහයැ, තුන්සරණ ආදි වන්දන කාව්‍යයැ** යි චතුර්විධ වෙත්.

## i සාමයික ග්‍රන්ථ

**i ජාතක කාව්‍ය**

මෙහි ජාතක කාව්‍යයෝ මහත් සඞ්ඛ්‍යා වෙති. මෙතරම් විශාල සංඛ්‍යාවක් ඇති වූයේ එකකු විසින් කරන ලද්ද ම තව කිහිපදෙනකුන් විසිනුත් නන් අයුරින් කව් කරවා තැබීමට තැත් කිරීම නිසා යැ. මෙසේ එකම 'වෙස්සන්තර ජාතකය' **කාව්‍යයක්–නාට්‍යයක්–සැහැල්ලක්–සිඳුවක්–මඩිහලයක්** හා

**සාන්තියක්** වශයෙන් ද දක්නට ලැබෙන්නේ ය. එකකු විසින් කළ රචනයක් දුට 'හැයි! මටත් මෙ වැන්නක් නො කළ හැකිදැ?' යි සිතූ ගැමියන් ම මිස මෙ ගත් කරුවෝ බෙහෙවින් උගත්තු නො වූහ. එහෙයින් ම ය මෙ ගත් වලින් භාෂා සාහිත්‍යයට එතරම් සේවයක් නො සැලසෙන්නේ.

මේ මෙසේ වුව ද **ධර්මපාල**, **නේමිය** වැනි ඇතැම් ජාතක කවියක යම්කිසි අගයක් නැත්තේ ද නොවේ. උස් හඬින් මිහිරි කොට කියවන මේ පද්‍යයකින් අවස්ථානුකූල නාට්‍යරසය මතු වෙමින් ලැබෙන ශ්‍රැතිය ඉතා පිය ජනක යැ. කථා ප්‍රවෘත්තියේ ඇති චමත්කාරී භාවයත්, ගැමිබසින් සිතා ගැමිබසින් ලිවීමෙහි බුහුටි ගැමියන් අතින් නුපුරුදු අලංකාරාදියකට නො බැස කථා මාර්ගය නො අවුල් වන සේ ලියැ වී තිබීමත් මේ ශ්‍රැති සෞභාග්‍යය ඇතිවීමට හේතු වයි. **වෙස්සන්තර**, **සෙරිවාණිජ** වැනි ජාතක කව් කළ ඇතැම් කෙනෙක් ජාතක කථාව හැකිතාක් විස්තර යෙන් ලියා තැබූහ. එහිදී ඔවුන් දැක්වූ චින්තන ශක්තිය ද වෙසෙසින් උත්කර්ෂවත් ය. කවිත්වය නැතත් චින්තනශක්තිය ඇති ඇතැම් මුඛරි ගැමියකු ගේ රචනා රසවත් ය. සත් කාව්‍යයක බෙහෙවින් දක්නට ලැබෙන උපමා අර්ථාන්තරන්‍යාස-අන්‍යාලාප සහෝක්ති ආදි අලඞ්කාරයන් ගෙන් හෝ ශ්ලේෂ යමක වැනි ශබ්ද වෛචිත්‍ර්‍යයෙන් හෝ නගරාර්ණව-ශෛලර්තු-චන්ද්‍රෝදය ආදි වර්ණනයන්ගෙන් හෝ නො වැ ආවස්ථික ප්‍රාණයෙන් හා රසයෙන් යුක්ත වීම නිසා කියවන්නා ල ගැන්මෙහි ශක්තියක් එ බඳු රචනාවල ඇත්තේ ය. **මුවජාතකය** කවි කරන එ බඳු මුඛරියකු දූරි වූ මුව දෙනක දම්ගෙඩියට නියම වූ විට ඇතිකළ සිතුවිල්ල කෙතරම් අවස්ථාවෝචිත සේ වාක්‍යයට නැගීදැ? යි පහත දැක්වෙන පද්‍ය පඞ්ක්තිය දක්වාලයි.

'මාගේ කුළුඳුල් දරුවන් දෙන් නේ
වඳ ගන්ඩ බැරිවුණි මරගින් නේ
සුරතල් තුදුටිම් මම දරුවන් නේ
කාට ද කියනෙම් මම මෙලෙසින්නේ'

'දුකසේ මම ලත් ද රුවෝ
කෙළ කෙළ ඉන්නෙත් ද රුවෝ
සුරතල් දැක සිත් පි රුවෝ
විගසට ආවයි ම රුවෝ'

'උ රා තනේ කිරි කවද පොව මිදේ
නු රා කරන දරු සුරතල් නො දු මිදේ
පු රා තැනක කළ පව් පල දුනි මිදේ
ද රා මගේ සිත කෙලෙසක ඉදි මිදේ'

'එ ත් මෙත් කවදද පෙම් කෙළ මුදු ල්ලේ
බොත්තේ කවදද කිරි මගෙ බුරු ල්ලේ
ඉ ත් තේ කවදද නුඹ මගෙ තුරු ල්ලේ
ය ත් තේ කවදද මගෙ සිත තැවු ල්ලේ'

'දරු ව ත් වඩ ගෙන ඉන්නා කලට අ නේ
සුරු ව ත් කර තිබූ දන සම්පත් ලෙ සි නේ
එ රුව ත් බල බලා ඉන්ඩත් නූනි අ නේ!
මරු ව ත් පැමිණි කල නැත ඉන්ඩ දරු ව නේ'

'ය ත් ඔ ත් බැරිය වැට අස්සෙන් පිටත් වෙලා
ඉ ත් ඔ ත් බැරිය අහසට දෙරණ රත් වෙලා
කා ත් ඔත් බැරිය පෙර ලෙස බුදින තණ ප ලා
ය ත් ඔ ත් බැරිව හුනු මෙන් ඇවිදිති වෙ වූ ලා'

මුව දෙන එ වේලෙහි නැඟූ විලාපය මේ යයි කියවින්නා හමුයෙහි පෙන්වන චිත්‍රපටියකි මේ. ඇතැම් විට අපේ මහා කවියකු අතින් පවා අතහැරි යන හැකි මෙ වැනි අවසථාවන් ඉතා සවභාවික සේ දක්වා ලීමෙහි අපේ ගැමි කවියෝ අතිශයින් සමත් වූහ.

මේ අතර ඇතැම් ජාතක කාව්‍යයක් සාහිත්‍ය මාලාවට පවා ඇතුළත් විය යුතු සේ පෞරාණික කාව්‍ය මාගීය නො ම ලැග ලියවුණේ ද වෙයි. ගාලු කෝරලයේ කරුණාරත්න නම් මුදලි කෙනකුත්ගේ ආරාධනයෙන් ලියැවී තිබෙන කවි එකසිය සූ පනසකින් සමන්විත බිළාරකොසිය ජාතකයත්, ක්‍රි: ව: 1828 දී කවි කරන ලද වෙදබ්භ ජාතකයත් එවැනි ශාස්ත්‍රීය රචනා දෙකකි. එසේ ම වීදගම පරපුරෙහි කවියකු කවි සාරසිය තෙ සැටකින් නිම කළ විධුර ජාතක කාව්‍යය, මේ ග්‍රන්‍ථ කිහිපය අතර ද උස් තැනක් ගන්නේ ය. "තොසත් වඩන බුදු බව ගන්ඩ ආ සැටී" යනුවෙන් පටන්ගෙන කවි එක්සිය පන් තිසකින් නිම කළ විධුරජාතක කාව්‍යය වූකලී යථොක්ත ග්‍රන්‍ථයට පසුව ලියන ලද ගැමියකුගේ ආලාප මාලාවකි. මේ ගණයෙහි ලා ගැනෙන කාව්‍යයන් අතර පවා ආශ්වාදනය කළ හැකි යම්කිසි රසයක් ගැබ් වී නැත්තේ නොවේ. එය වූකලී එම රචකයාගේ පද ඝටනාව නිසා පහළ වන්නකි.

'කපුටී නම් කවුද අනේ
කිඤ්චිමානිකාවො නො වෙ ද අනේ
කපුටා නම් කවුද අනේ
දෙව්දත් තෙර නො වෙ ද අනේ'

කකීට ජාතකයෙහි එන මෙ බඳු රචනා ඇති ජාතක කවි කිහිපය අතර ඇතැම් ජාතකයක් කියවීමේදී තත් කවියාගේ සාමර්ථ්‍යය ගැන වියතුනට සානුකම්පික සිතහවක්ද පහළ කළ හැකි. සතිස්ලක්‍ෂ දසදහසක් යොදුන් සමසත චක්‍රවාටාන්තර

යෙහි හුත් අසඞ්ඛ්‍ය සඞ්ඛ්‍යාත සත්ත්වයනට ඇසෙන සේ අෂ්ටාඞ්ග සමුපේත බ්‍රහ්ම ඝෝෂය පතුරුවා දම් දෙසන බුදුන්ගේ මධුර නාදය මදුරුවකුගේ කෙඳිරීමක් වැනි ය යි කියවන්නාට එක විට ම අවබෝධ වන ලෙස පිරිනිවන් ජාතක කවියා පවසන සැටි මෙසේ යි.

'මදුරුවන් නාදයෙන් දම් දෙසූ හැම සඳේ
සිඳුරුවන් තිලෝතල කිමෙක් බෝහිමි සඳේ'

මෙය මෙසේ වුවත් **සමුදඝ, නිමි** ආදී ඇතැම් ජාතක කාව්‍යයකින් කිසිම රසයක් හෝ විනෝදයක් ලැබිය හැකිද නො වේ. කථා සාරය පමණක් යම්තම් එතර කරවමින් ඒ ජාතක කවි සැපයී තිබෙන හෙයිනි. මෙසේ විවිධ ආකාරයෙන් හැඳින් විය හැකි මේ ජාතක කාව්‍යයන් අතර **වෙස්සන්තර සෙරිවාණිජ** විධුර ආදි කව් මහජනයා අතර අතිශයින් ප්‍රචලිත යි. **සාම-ජයද්දිස-සම්බුලා** ආදිය සාමාන්‍යයෙන් ප්‍රකට ව පවතින අතර **උරග කෝසිය** ආදී ඇතැම් ජාතක කවක් ප්‍රචාරයට නො පැමිණියේ ද වේ.

**ii චරිතකථා කාව්‍ය**

මෙසේ බොහෝ දෙනකුන් ජාතක වස්තූන් ප්‍රස්තුත කරගත් අතර, ඇතැමෙක් **යසෝදරා - පදුමවතී- තුන්යහළු** වැනි බෞද්ධ චරිත කථා කවි කළෝ ය. ජාතක කථාවක් තරමට ම හෝ ඊටත් වඩා ජන සම්මානය ලත්, එහෙයින් අත්‍යන්තයෙන් ප්‍රචාරයට පත් ඒ කවි කතා ද, හුදෙක් ග්‍රාමීන සංස්ථාවකට සැලසිය හැකි විනෝදයත් උපදේශයත් එල කොට පවති. ව්‍යක්ත සේ කියැවෙන ප්‍රවෘත්තිය මධුර සේ ඇසෙන ශ්‍රැතිය හා චමත්කාර ජනක සේ නැගෙන ස්වභාවිකත්වය නිසා මේ පොත් පෙළ ද, භාෂා මාත්‍රය තේරුම් ගත හැකි දනව් වැසියනට ඉතා ප්‍රිය වේ. මේ කවි කතාකරුවන් අතර කෙනෙක් කථාවෙහි එන පුද්ගලයන් හඳුන්වා දීමෙහි ඉතා සමත්හු යැ. තමන් හොඳින් දන්නා හඳුනන කෙනකුන් සේ එ වැනි පුද්ගලයන් වැනූ හෙයිනි. සමහරවිට එබඳු වර්ණනාවකදී ඇතැම් කථානායක—නායිකාවකට ස්වභාවයෙන් නො ම අයත් වූ ගැමි ස්වරූපයක් ද මේ කවිවලින් ලැබුණු සේ පෙනේ. මේ වනාහි කතු දත්තවුනට ගත් කතු- වරයාගේ තත්ත්වය හා සිතුම් පැතුම් හැඟී යෑමට අවකාශ ලැබෙන තැනකි. කවි එක්සිය සතරකින් යුත් **තුන්යහළු කථාව** මේ බොහෝ අඞ්ගයන් ගෙන් සම්පූර්ණ වූවකි. රසවාහිනියෙහි දක්වෙන ජම්බුද්වීපීය වස්තුවක් වූ මේ තුන්යහළු පුවත සිංහල ගැමියන් අතර පවත්නා ප්‍රචාරයට හේතු වූයේ, මූලික ග්‍රන්ථය හෝ එහි අනුවාදය වූ සද්ධර්මාලංකාරය නො වැ, මේ කවි පොත ය යි හඟිමි. මෙ ලෙසින් ම **ස්වර්ණතිලකා—සෝමාදේවී- කනකෙකිනි—අලවු—කපිරාජ—දෙව්දත්—ගෝලකාල** ආදී කථාවන්ගේ ප්‍රචාරයට හේතු වූයේත් ඒ ඒ කථාවන් සංගෘහිත

මූලික ග්‍රන්ථයන් නො ව, මේබඳු ගැමියන් ගේ කවි කතා මැ යි. මින් උම්මග්ග ජාතකයෙහි සංක්ෂේපයෙන් දක්වන ලද අතුරු කථාවක් වූ **ගෝලකාල පුවත** නො දත් කෙනකුන් නැති තරමට ගමෙහි ප්‍රචාරයට පැමිණියකි. ගැමියා ස්වකීය ජන සමාජයේ දුර්ලභ නො වූ සිද්ධියක් ශරීර කොට එහි, ගැමියන් විෂයෙහි යෙදිය හැකි උපක්‍රම-චාටුබස්-ක්‍රියාවිලාශ ආදිය, ඥනයකින් නො ව, සිය අත්දැකීමෙන් ම දැන, ඉතා ස්වාභාවික සේ ලියා තිබීම එයට හේතු විය. අනුන්ගේ රූබර බිරිඳක් තමන් අයත් කොට ගනු කැමැති ගැමියකු, ඇගේ ස්වාමියාගේ අඩු ලුහුඬුකම් දක්වා තමන්ගේ හැඩහුරුකම් පවසන්නේ මෙසේ ය.

'ඔය මිනිහා මොන මිනිහා බඩ ගෙඩි මහ ගෙම්බා වගේ
ඔය මිනිහා මොන මිනිහා හේනේ දැලි කාණුව වගේ
ඔය මිනිහා මොන මිනිහා දත් බොල්ලෑ කොරල වගේ
ඔය මිනිහා මොන මිනිහා හරියට මහ රකුස වගේ'

'උඹත් මමත් එක වාගෙයි රූවට පිනට යසට ගුණට
උඹත් මමත් එක වාගෙයි එක වයසයි බැලූව හොඳට
උඹත් මමත් එක වාගෙයි සිනහ මූණ කතා බසට
උඹත් මමත් එක වාගෙයි බොහොම හොඳයි එක්වන්නට'

**iii ධර්මසඞ්ග්‍රහ කාව්‍ය**

**විජම්බණදෙසුම්**, **මාරයුද්ධය** වැනි කාව්‍යයෝ ආශ්චර්ය රසය කැමැති ගැමියන්ගේ කාන්තිහු ය. නො උගත් ගැමි ජනතාව විසින් අද්භූතයත්, භයානකයත් තවදත් අතිශයින් ආශ්වාදිත රසයෝ ය. පූර්වෝක්ත **මාරයුද්ධය** වැනි කවි ගම්මුන්ගේ ප්‍රසාදය පිණිස පැවැතිය හැක්කේ එහෙයිනි. බුද්ධ චරිතයෙහි ඇතැම් කොටසක අප්‍රබුද්ධයන් ප්‍රිය කරන පක්ෂය ආශ්‍රිත ව, කවි කොට පද්‍ය පන්තිසකින් නිම වූ **පිරිනිවන්හඬ** හෝ **දිනරදසිරිත** එතරම් සිත් ගන්නා සුලු රම්‍ය රචනා නො වෙති. පන්තිරූ එක්සිය සත්අසූවකින් යුත් **මහබිනික්මන්කව** කඩවත ලේකම්ගේ මහා ප්‍රයත්නයක් වුව ද පන්තිරූ සතක් ඇති රඹුකේ යතිවරයන්ගේ **මඟුල්ලකුණ** තරමටවත් ජනාදෘත නො වේ.

කුරුධර්මය කවි එක්සිය පසකින් යුත් කුඩා පොතකි. නමස්කාරයට ම පොල්තෙල් පහන ගෙවූ මේ කවියා කන්දක් පිලි ලා කෙන්දක් වැදී ය. සත් ගවුවකින් ඈත සිට දිය වැසුම අදිමින් ආ මොහු මුහුදු තෙරදී ද සැරසී නිම නො විණ. එහෙයින් පොත මුළුමනින් කියවුවත් ප්‍රස්තුත 'කුරුධර්මය' කුමක්දැයි වටහා ගත නො හැකි ය. කොතෙක් වත් හෙතෙමේ 'කුරුධර්මය' ලියැවීමෙහි හෝ ඇසීමෙහි අද්භූත අනුසස් ම කියා පායි. මේ වනාහි මෙකල සිටි සමහර කවිකාරයකු කවි කලාව කුමක්ද? කියාවත් නො දත් සැටි හැඟි යන තැනකි.

උඩුමල්වත්තේ **සිරිදණත්ගේ** **දෙතිස්කුණප වර්ණනාව** ව්‍යක්ත රචනයකි. දෙපනස් පද්‍යයකින් මුළු ග්‍රන්ථය ම කර තිබෙන්නේ, සංදෂ්ට යමකයෙන් උපලක්ෂිත ව යැ. පිළිකුල් භාවනා සන්තය පාඩම් කරගනු නො හැකි වුවනට ප්‍රයෝජන වත් වන පරිදි දෙතිස් කුණප සිවුපදයෙන් පවසන බව හේ කියයි. ප්‍රස්තාවොචිත උදාහරණයෙන් යුක්ත කොට දෙතිස් කුණපය වනා තිබෙන අයුරු සිත් ගන්නා සුළු ය.

‘ඇ ට  වල ලකුණු බැලුවොත් මේ කයේ  යට
ය ට  ලී දමා පරහල ලූ ගෙයසෙ  දූට
දු ට  හට නො කිමි දහමෙන් පෙනුනා මෙ  මට
ම ට  දූනගත්ට ලැබුණිය තුන්සියකි  ඇට’

මෙහි ම කොටසක් වූ **දෙතිස්කුණප සිඳුව** කවියට වඩා සිත් ගන්නා බන්ධනයකි. දෙතිස් කුණප කොට්ඨාශය සූවිස්සක් පද්‍යයට කෙතරම් ව්‍යක්ත සේ නගා තිබේදැයි ඒ සිඳුව කියවන්නාට පෙන්වා දෙයි. එ මතු ද, සිංහල සාහිත්‍යයෙහි විද්‍යමාන රසවත් කියුම් අතර එකක් ද වේ දෙතිස් කුණප සිඳුව.—

‘මෙ ත්න  සුදන  තේ— අසනුය
බි ත් න  නැත අ  තේ
ඇ ත් න  මුනි බ  ණේ— බලනුය
පෙ ත්නු  සැටි දූ  තේ

කේස ලෝම නිය ද දත්  ද
සම් මස් සහ නහර ඇට  ද
ඇට මිදුළු ද වකු ගඩුව  ද
හද මස අක්මා කුණප්ප  ද

නි න ර  කය තු  ලේ— මෙම කුණු
වැ ති ර  සැම වෙ  ලේ
සි රැ ර  මල කැ  ලේ— ලූ කල
ගො දු ර  බලු රැ  ලේ

රත් රිදියෙන් සැදුනෙත්  නැත
මුතු මැණිකෙන් සැදුනෙත්  නැත
පබළුවකින් සැදුනෙත්  නැත
දෙතිස් කුණෙන් පිඬු විය  ගත’

**මුනිදම්හර** සහ **ලෝකෝපකාරය** යන නිබන්ධ ලෝවැඩසඟරා -සුභාෂිත-ලෝකොපකාර යන සුප්‍රකට ග්‍රන්ථ හැරුන විට සිංහල සාහිත්‍ය වංශයෙහි දක්නට ලැබෙන ධර්ම නීති සංග්‍රහ දෙකකි. බෞද්ධ ධර්මයෙන් ම පුෂ්පිත මේ ග්‍රන්ථ දෙක අතර පද්‍ය එක්සිය දෙතිසකින් හෙබි මුනිදම්හර පැරණි බවෙන් හා සාරත්වයෙන් වැඩි ය.

iv **වන්දනා කාව්‍ය**

**තුන්සරණය** මෙරට බෞද්ධයනට හඳුන්වා දීමට යත්න දැරීම ගිලීමලයට බුලත හඳුන්වා දීමක් වැන්න. ඉසවන ලද බරින් යුතු වැ, සියලඟ ගලන සෝදියෙන් තෙමී, සැඩ හිරු රැසින් පෙළී, ගමන් වෙහෙසින් පිරිකී, ගමන් කරන බෞද්ධ වන්දනා කරුට, සාමූහික වැ- උස් හඬින් කියවන **තුන්සරණය** සිහිල් මද පවනකටත් වඩා මාගීශ්‍රමය· සන්සිඳුවන අනුභාව සම්පන්න මන්ත්‍රයක් වැන්න. සැමේ මනාත්‍රීන්ගේ · මුනුබුරකු වූ ලෝකුරු ඇඳුරන්ගේ මේ රචනාව ධර්ම ඥානයෙන් නො වැ භක්තියෙන් ම බෞද්ධත්වය පිරූ අපේ උවැසි-උවසුනට හොඳට පළ පුරුදු යැ. කවි පන්සිය ගණනකින් හෙබි මේ පොතෙහි ව්‍යවහාරයට පත් සිය ගණනක් පද්‍යයන් අතරැ මුල් පදය මතක් කොට දෙනු තරමින් දෙව්ලොවට ඇසෙන සේ ඉතිරි භාගය උන්නාදයෙන් ගායනා කිරීමට අපේ උවැසියෝ සමත්හු ය.

අනුරාධපුරය, මහියඞ්ගනය, කැලණිය හෝ තිස්සමහ-රාමය, වැනි අනික් පුණ්‍ය තීර්ථයක් කරා යන සියලු වන්දනා කරුවනට ම **තුන්සරණය** සාධාරණ වුව ද, **හිමගතවණ්ණනාව** හා **සමනල්හෑල්ල** එසේ නො වේ. ඒ දෙ පොත වූකලි හුදෙක් ශ්‍රීපාද වන්දනා කරුවන් සඳහා ම ලියන ලද්දේ- එහෙයින් ම ඔවුනට ආවේණික වූයේ වෙයි. දෙ පොතෙහි ම කාව්‍ය සංඛ්‍යාව එක්සිය අනූවකින් පමණ සීමිත වුව ද සතියක් පමණ වූ හෝ වන්දනා කාලයට එය පොහොනේ වෙයි. පළුතොච්චාරණය තමනට ම උරුම වූවක් සේ ඔවුන් කරන ගායනය එතරම් දීර්ඝ වන හෙයිනි· **සමනලවැඳීම**, **සමනල විස්තරය**, හා **සමන් දෙවිවරුණන්**, මේ අත්‍යුත්තම සිද්ධස්ථානය අරභයා ම ලියැවී තිබෙන තවත් කවිපොත් තුනකි. මෙයින් **සමනලවැඳීම** කරන කවියා අවසානයේදී ශ්‍රීපාදස්ථානයේ බුද්ධ පූජාව ගසා කෑමට සැරසී සිටින්නන් ගැන කථා කරන සැටි ඉතා හොබනේ ය.

‘ඉ න ට    ඇඳ දූලි කුණු වැගිර රෙදි අතට පොල්කටු පත්කොළේ
ද න ට    ඉල්ලති සකුරු පැණි ලුණු සාල් දුප්පත් වුනු ක    ලේ
ප න ට    මදකුත් නොකොට ආලේ මුදල් සත්ද ඉද ග    ලේ
පි න ට    මුනිඳුට පිදූ සම්පත් ගන්න ගොල්ලකි සමන    ලේ’

කුසිනාරා නුවරදී කළ ධාතු බෙදීම හා ඒ පිහිටි තැන් පිළිබඳ විස්තරය ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් නිබද්ධ වැ ලියන ලද **ධාතුවිස්තරයත්**, **ඡද්දන්ත ජාතකය** ශරීර කොටකළ කවි එකසිය එකකින් යුත් **සද්දන්තහෑල්ලත්**, පත්තිනි දේවියගේ උපත ප්‍රකාශිත පද්‍ය එක්සිය පනසකින් යුත් **පත්තිනිහෑල්ලත්** මෙසේ ම බෞද්ධ ජනතාව අතර වන්දනා කාව්‍ය හැටියට සම්මත ව පවත්නා ග්‍රන්ථයෝ ය.

අටමස්ථාන වන්දනාවෙහි ගිය ගැමි කවියා සවකීය නඩය පිළිබඳ ගමන් විස්තරය **අටමස්ථාන වන්දනාවකැ** ලියා තැබුයේ ය.

'පිඹු රු නා පොළොං ගමරුන් ඇති මෙ ව තේ
ගැඹු රු දියතලා වැව් ඇත සිය ගණ තේ
ඇඹු ල් සහ නානු සැම දෙන යොදු ග තේ
ද ළු එ ඔය ලඟදි කෙරුවෝ ස්නා තේ'

බොධි වන්දනාව උදෙසා ලියූ **බොධිවන්දනාව** හා **සිරිමා බොධිවන්දනා** නම් තවත් කව් දෙකක් අපට දක්නට ලැබිණ. කවි සතිසකින් යුත් **ගමන් වල්ලිය** වනාහි තවත් පැරණි බෞද්ධයකුගේ වන්දනා ගමනක් සිහිපත් කරවන්නකි.

## ii ඓතිහාසික හෝ ප්‍රවෘත්ති කථා කාව්‍ය

අපේ පැරණි ගැමි කවියෝ සාමයික වස්තූන් මතු නො ව, ඉතිවෘත්තයෙන් හෝ ප්‍රවෘත්තියෙන් පැමිණි කථා කවි කිරීමෙහි ද ව්‍යාවෘත වූවාහු ය. එහෙයින් ම **වල්ලිමාතා, නාලමන්ත්‍රී, සතර මන්ත්‍රී, මාතලන්, වේතාලන්, ඒමන්; නාමල් කුමාර, සපුමල් බිසෝ, ෂසාකරි, නිකිණි, බාරි, කාපිරි, සින්නමුත්තු, මුත්තු කුමාරි, දඹුමොනර,** ආදි පාරම්පරික කථාන්තර හා **රාවණ, සකරාජ, සිංහවල්ලි; ගජබා, දුටුගැමුණු, කලුංදෙව,** ආදි ඓතිහාසික කථා කාව්‍යයෝ ද පහළවූ හ. බෙහෙවින් සිත්කළු වස්තුවක් ම ගැබ්කොට ඇති මේ කාව්‍යයන්හි කියවීමෙහි රුචිකරත්වයක් ඇති නමුදු, යථොක්ත බෞද්ධ කථා වස්තූන් මෙන් මේවා ගැමි ගෙදර වැඩිපුර භාවිතයට නො පත් සේ පෙනේ. ජන්ම දායාද වැ ලත් බුදු සමය කෙරෙහි ඉමහත් භක්ති ප්‍රේමාදරයක් ඇති අපේ ජනතාව බෞද්ධ වස්තුවක් තරමට මේ පොත් කියවීමෙහි ආශාවක් නො දැක් විය. එහෙයින් කොතරම් රසවත් වූ හෝ ඓතිහාසිකත්වයෙන් වැදගත් වුව ද, මේ කථා කාව්‍යයන් කියවන ලද්දේ හුදෙක් විනෝද ලාභය කැමැති කිහිපදෙනකුන් විසින් පමණි.

උතුරු කුරු දිවයින, දඹදිව වැනි ශීර්ෂ යටතේ කවි ලියූ වෝ ද මේ අතර වෙති. **උතුරු කුරු දිවයින් විස්තරය** හා **දඹදිව විස්තරය** නමින් හැඳින් වෙන ඒ නිබන්ධ ලියන ලද්දේ යටත් පිරිසෙයින් ඒ රටවල් මේ ය යි දැන හෝ හැඳින නො වෙයි. පොත පතෙහිම ආ කරුණු කිහිපයක් සංග්‍රහ වන සේ කවියට නැඟීමෙනි. **කපිල වස්තු** හා **ශබ්මැඩ අලංකාරය** ත් මේ ගණයෙහි ම ලා සැලකෙන කුඩා කව් දෙකකි. **ගංගා විස්තරය** හා **සෙංකඩ ගල වර්ණනාව** මීට වඩා මානනීය යැ. ඒ කවීන් තමනට පුරුදු දෙයක් ම වැනූ හෙයිනි.

සමනල ගිරින් ගලා යන මහවැලි ගඟ වනන හෙතෙමේ එහි තොටුපලවල් ආදිය විස්තර කරමින් කවි සැත්තෑපසකින් පමණ ස්වකීය ප්‍රස්තුතය නිම කෙළේ ය. සෙංකඩගල වර්ණනාව සඵලය කොටගත් අනික් කවියා සෙංකඩගල අලංකාරය කියා පාමින් දෙවන රාජසිංහ රජුට ස්තුති පූජනයක් කරයි. පද්‍ය එක්සිය සූ විස්සකින් හෙබි ඒ රචනය රාජසිංහ ස්තෝත්‍රයක් තරමට ම සාර යැ.

ක්‍රි: ව: 1800 දී පාලුවැවේ ධම්මපාල යතිවරයන් විසින් කළ **ශ්‍රී නාම රත්නාලඞ්කාර කාව්‍යය** ශාස්ත්‍රීය රචනයකි. සෙංකඩගල විස්තර හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පිළිබඳ ප්‍රවෘත්ති සංග්‍රහ කොට මෙය සපයන ලද්දේ ය. ගත් කතුවරයන් වහන්සේ වූ කලී මොරතොට ධම්මක්ඛන්ධ නා හිමියන් ගේ ශිෂ්‍යයෙකි. පද්‍ය එක්සිය එකකින් යුත් **පඬුවස් දෙව් කාව්‍යය** ද මෙ වැනි ම ශාස්ත්‍රීය රචනයකි. පඬුවස් දෙව් රජුට කුවේණිය නිසා ඇතිවූ දිවි දෙස්, යාග බමුණන් විසින් සංසිඳ වූ ප්‍රවෘත්තිය එහින් විස්තර කෙරේ. සත් කෝරළයේ විදූ නාහල්ලේ හිමියන් ගේ **ගිරිමානන්ද තෙර වත** ද මීට වඩා උසස් රචනයකි. දඹදෙණි පරාක්‍රම බාහු රජතුමන්ට ඇති වූ විනදෙස් පහකර පීමට දඹදිවින් බමුණන් සත් දෙනකු ගෙන් වා කළ යාග පුවත කවියට නැඟීමෙන් **බමුණු වත** සම්පාදිත ය. කවි එක් සිය පස් විස්සක් ඇති එහි එකී බමුණන් රජවාසලින් ගම් ලැබ කුල ස්ත්‍රීන් පාවා ගන දනව් වැසියන් සමග මිශ්‍ර වූ සැටි ද දක්වන ලද්දේ ය. 'හෙළු අත්තනගලු වංසය' ආශ්‍රය කොට රචිත තත් **විහාරවංස කාව්‍යයකුදු** දක්නට ලැබේ. අත්තනගල්ලේ ඤාණරතන හිමියන් ගේ කෘතියක් වූ එය පද්‍ය පන්සිය පස්පනසකින් විශාල වූ කවකි. ශාස්ත්‍රීය පක්ෂයෙන් නො වැ අත්තනගලු විහාරවංශ ඉතිහාසයෙන් එම රචනාව සාරවී තිබේ. **වෛෂ්ණවයකු** ගේ කෘතියක් වූ **වෛකුණ්ඨාලඞ්කාරය** කවි අට සාළිසකින් යුත් විෂ්ණු ස්තෝත්‍රයකි. ස්තෝත්‍ර සඞ්ඛ්‍යාවෙහිලා ගැනෙන **ශෘඞ්ගාරය** හා **ශෘඞ්ගාරාලඞ්කාරය** ත් මධුර රචනා දෙකකි. මේ දෙ කව ම කරන ලද්දේ නරේන්ද්‍රසිංහ රජුට ස්තුති සඳහා ය. කියවීමෙහි රසවත් එහි පද්‍යයන් ගෙන් දෙකක් මෙසේ යි.

'ළ කල් කල් දෙන දෙපස සිට ගෙන සෙමර මුගතල විඳ විඳ
උපුල් මුතු සේ සත් නැගූ නව රුවන් විසුතුරු බත් සොඳ
නිමල් සිංහාසනා රූඪ වූ නරේන්ද්‍ර සිංහ හිමියනි සඳ
මඟුල් වේවා ඔබට ජයසිරි වැඩී ඇතිතෙක් ඉර සඳ'

'සඳිසි දිනෙන්ද්‍ර සිසිකර චන්ද්‍ර සපැමිණ තුඞ්ග ගිරි හිසි තේ
සයුරු සරේන්ද්‍ර රුචි නොම සුන්ද්‍ර යකු හඞ මෙන්ද වනි සව තේ
පසිඳු නරේන්ද්‍ර සිංහ විජේන්ද්‍ර රාජ රජේන්ද්‍ර හිමි සඳි තේ
යුදට රතීන්ද්‍ර නො වඩිනු කිත් ද මත වරනිත් ද යුරු ගම තේ'

කවි එක්සිය අනූවකින් යුත් ජනනන්දනය පැරණි රචනයකි. ලෝකයේ මුල් උපත පිළිබඳ ප්‍රවෘත්ති එහි වෙසෙසින් දර්ශිත යැ. මෑත කාලයේ ජීවත්වී සිටි වේකොළදෙණියගේ **කලියුග කාව්‍ය** සමාජ තත්ත්වයට ඔබිනා කිවි වලින් පෝෂිත යි. **මවු පිය උවටන** කවි කිරීමෙන් වැසි මහල්ලන් ගේ සමාදරය ලත් තැඹිලිපොල කිවිඳුන් ගේ **ඇහැලේපොල හටන** හෙවත් පෙරලි හටන ද මේ හා සම කාලීන රචනය කි. කවි එක්සිය එකුත් සැත්තෑවකින් හෙබි එ කාවෙන් ඇහැලේපොල දුක්මුසු ප්‍රවෘත්තිය ප්‍රකාශ වන්නේ ය.

## iii සාමාජික ග්‍රන්ථ

සිංහලයන් ගේ සංස්කෘතිය— සාමාජිකත්වය— හා අභිරුචිකත්වය දක්වන ග්‍රන්ථ මාලාවක් ද මහනුවර කාලයෙහිදී ලියැවී තිබේ. විද්‍යාචක්‍රවර්තින් ගේ 'බුත් සරණ' හෝ ධර්මසෙන හිමියන් ගේ 'රතනා වලිය' වැනි ශ්‍රේෂ්ඨ රචනා නො වෙතත් ඒ හැරෙනවිට දෙශජනත්වය පිළිබිඹු කොට දක්වන ග්‍රන්ථ පෙළක් මේ හැර නැති. මෙසින් **ආඬිමාලය** වැනි ග්‍රන්ථ කතිපයක් හැර සෙස්ස ගැමියන් ගේ කෘති සංඛ්‍යාවෙහි වැටේ;

අද මතු නො වැ, ඉකුත් යුගයෙහි පවා සිංහලයන් තුළ නිසර්ගී සිද්ධව තිබූ නර්මාලාප බිහීමේ චතුරත්වයත් අභිරුචිකත්වය ත් කියා පාන පොතකි **ආඬිමාලය.** සීතාවක රාජසිංහයන් ගේ මහමැති ධුරය දරද්දී පවා අරිට්ඨකී වෙණ්ඩු පෙරුමාල් ගොපළු දරුවන්ගේ ද නර්මාලාපයට පාත්‍ර වූ සැටි අද දු පරම්පරාශ්‍රැතියෙන් අසන්නට ලැබේ. 'ආඬිමාල' යෙන් කියැවෙන්නේ ද අරිට්ඨකී වෙණ්ඩු පෙරුමාල් වැනි ම ප්‍රභූ ආඬියකුට ගැමියන් ලවා උපහාස කරවීම පිණිස ලියූ පද්‍යයකි. පොතෙහි කියැවෙන හැටියට රජ කමට පවා ඉදිරිපත් වූ මේ සන්නාසියා ගේ උද්ධච්චය හා ආත්මාර්ථකාමිත්වය මේ කවියා ගේ නර්මාලාපයෙන් වැදෙන තියුණු පහරින් යුත් සොපහාස කවියට ඉලක්ක වූයේ ය. සෙනරත් රජුගේ අග්‍ර මන්ත්‍රී යාලේ ගොඩ දිසාපති තුමන් ගේ මුනුබුරකු, බව කියන මේ ගත්කරු ව්‍යක්ත කියුම් කාරයකා. ස්වයං නිබන්ධ උපමාවෝ උපහාස රසයෙහි ගෙදූ උග්‍ර විෂයක් මෙන් ඉලක්කයට තියුණු වේදනා ගෙන දෙන සුල්ලභ.

**ස්ත්‍රීවිලාශය** ද සාමාජික තත්ත්වයට ප්‍රයෝජනවත් ලෙස ලියූ කවකි. සමුද්‍රඝොෂ වෘත්තයෙන් බැඳි පද්‍ය එක්සිය අනූවකින් පරිමිත එහිත් කෙරෙනුයේ කාන්තාවන් පිළිබඳ ගුණා ගුණ දර්ශනයකි. ස්ත්‍රීන් තුළ පවත්නා ස්වාභාවික දූගුණ ගත්කරු තෙමේ සාෂි භාෂිතයකින් හෝ බෞද්ධ චරිත කථා සමරණයෙන් විශිෂ්ට කරයි. අවසානයේ දී ස්ත්‍රීන් පිළිබඳ දෙව—නාග—යක්‍ෂ භූත ආදි තත්ත්ව දර්ශනයකු දු කෙරේ.

**ගොයම් මාලය, කුරහන් මාලය, පාරු මාලය,** යනු විසින් කියැවෙන ගුණ පරම්පරාව ද නාම මාත්‍රයෙන් නමුත් අප අතර ප්‍රකට යැ. අපර දෙශීය සංස්කරණයෙන් පැරණි සිංහල ශිෂ්ටත්වය මිශ්‍ර වන්නට පළමු ස්වකීය කර්මාන්ත, ජීවන වෘත්තිය සඳහා ම නො වැ ගෞරවය ත් විනොදයත් ගෙන දෙන්නක් කොට අපේ සිංහලයන් තැකූ බව විදහා පාන ගුණ පෙළකි ඒ. එහෙයින් ම අද දු පිරිසර දක්ක හැකි ගොයම් කැපීමේ උත්සව ශ්‍රිය ගොවියෝ කවියට ඇතුළත් කොට **ගොයම් මාලයක්** තැනූ හ.

කුරහන් ප්‍රමුඛ අමු — මෙනේරි — තල — මුං ආදි නොයෙක් ධාන්‍ය වලට උපන වූ හේන් විස්තරය **කුරහන් මාලය** කින් අලඞ්කාර කළහ. ගඟ පහරින් සෙමින් පැදෙමින් යන පාරුකරු ස්වකීය නදී යාත්‍රාව කවියට නගා **පාරු මාලය** තැනී ය. මේ අතර ගෙදර තරඟයට පැදුරු විවූ නැදි-යෙහෙළණියෝ **පැදුරු මාලය** සැපයූ හ. මහිල්—බෑනණුවෝ **සිඳු පද තරඟ මාල** යෙන් අසා සිටින්නවුන් . පින වූහ. මුතුන්—මිත්තෝ **උපදෙස් මාල** යෙන් බාලයන් හික්ම වූහ. අහසෙහි දුමු කලය බලන්නවුන් ප්‍රීත කොට බිම නො හියදී අල්වා ගැනීමෙහි සමත් ඝට ක්‍රීඩකාව ස්වකීය ජීවන වෘත්තිය කවියෙන් තව ද අශ්වාද මත් කළා. ඒ **කළගෙඩි මාලය** නම් විය. ඒ අතර අනිකක් තොමෝ **ඔලිඳ කෙළිය** සැපයූවා. එ මතු දු, පුස්කොළ ලිවීමෙහි සමත් ලෙඛකයා **පුස්කොළ උපත** දක්වූයේ ය. කපු කටින්නෝ **කපු යන්ත්‍රය** කළ හ. බෙර ගසන්නෝ **බෙර උපත** දක්වූහ. උඩැක්කි ගසා නටන්නෝ **උඩැක්කි උපත** හෙළි කළ හ. සංක්‍රාමික වසන්ත රෝගයනට ප්‍රති කර්මයක් වශයෙන් උඩු යටි හෙදයෙන් දෙ පිළකට බෙදී කරනු ලැබූ සුප්‍රකට අං ඇදීමේ ක්‍රීඩාව කෙසේ ඇති වීදැයි **අං කෙළි උපත** පෙන්වයි. මේ අතර අහිකුණ්ටිකයාගේ නාග නර්තනය දුටු ගැමියා නයි නැටවීමක් ද කෙළේ ය. එ මතු ද,—

‘රැප්පා වල ඉඳ කෙළි යේ
තුප්පා ගිනි උසුල පි යේ
සප්පා යම් නිදි ද ගි යේ
අප් පා නුඹෙ කොතන ගියේ’

‘පාඩ මි ඇඹුමට නිබ දේ
කුඩ ත් පිල්වල නොයි දේ
ආ ඩ මි බර නොකර යි දේ
නාඩත් හොරතල් බිළි දේ’

යනුවෙන් **දරු නැලවිල්ලේ** කවි යෙන් මැණිවරු බිළිඳුන් නැලවූ හ.

දරු ලත් මවුන් දෙශීය හැඟීම් ඇතුළත් වූ ගීතයෙන් දරුවන් නලවා තුමූනුත් නැලවෙන අතර, දරු නො ලත් සත්‍රී හු-

‘දරුවන් ඇති අම්මා ලා
දරු සුරතල් පෙම්මා ලා
දරුවන් නැති අම්මා ලා
නිකන් ඉඳිනි බුම්මා ලා’

යන මුව ජාතක කවි කරුවා කී පරිදි දෙම්නස්ව සිටිනු දැක්ම ස්වාභාවික ය. සිංහලයන් පෙර සිටම එබඳු වඳ ස්ත්‍රිය අභාග්‍යයේ පා පහර ලත් නිශ්‍රිත නැනැත්තක, කොට දුටු බවට අපේ සාහිත්‍යයෙහි ලැබෙන සාධක. බෙහෙවි. **ගැහැනි වින් දරුවන් නොලද්දු සේ හි ධම්සෙන හිමියෝ** එ බඳු ස්ත්‍රිය ස්ත්‍රීත්වයෙහි අග්‍ර ඵලය නො ලත් එකක බව කීහ. මේ අවමින් හැඟිම සිංහලයන් තුළ පාරම්පරිකව පැවැත ආ බව මේ වකවනුවෙහි විසූ අපේ ගැමි කවියන්, වඳ ස්ත්‍රීන් උපහාසයට ලක්කොට පද්‍යාවලීන් සැපයීමෙන් පෙනේ. මෙ පමණක් නො වැ, කනවැන්දුම්ය ද පෙර මගෙහි දැකීම පවා නො ලද යුතු තරමේ අවාසනාවන් එකක කොට සැලකූ බව **කණවැන්දුම්** හටන පෙන්වයි.

වස් වදින තරමට හෝ මරණය ගෙන දෙන තරමට බියකරු දෙයක් කොට සම්මතව පැවැති තහංචිය ගම් වැසියාගේ වතු කැන-හෙරලි ගෙඩිය හෝ කිතුල් මල වැනි බෝග වගී හොර හතුරාගෙන් ආරක්‍ෂා කරගැනීම සඳහා බෙහෙවින් උපකාරි විය. තරහ කැරුවක් වැඩි වූ ගමයා ගෙදර රැක ගැනීම සඳහා ගෙදර වත්තට නො පැමිණිය හැකි ලෙස වැට කඩුල්ල තහංචිකර තබයි. මෙ වැනි දේ **කඩුළු තහංචි** වැනි ප්‍රබන්ධයන්හි සංගෘහිත යැ. **මඟුල් තහංචිය** වූකලි මිට වඩා සිත් ගන්නා සුලු රචනයකි. මනාලියගේ ගෙදර මනාල පක්‍ෂයට පරිහරණය වන ඇඳ—පුටු, කෑම—බීම් ආදි සියල්ල දැනමුත්තා තහංචි කරයි. ඒ තහංචිය කඩා මනාල පක්‍ෂය විසින් ඒවා පරිහරණය කටයුතු යි. මේ තහංචිය වූකලි මනාලිය ගේ ගෙදරට පිවිසෙන කඩුල්ලේ සිට ආරම්භ වෙයි. තහංචියත් තහංචි ඇරවීම ත්, යන දෙපක්‍ෂයේ කියුම් නිසා එද අපේ මඟුල් ගෙදර ඇතිවූයේ සිත් ගන්නා දර්ශනයකි. මඟුල් ගෙදර පවත්නා මේ තහංචි අතර බුලත් තට්ටු තහංචිය ත් එහි ඇරවීම ත් මෙසේ ය.

'නා ලොව නා රජ මිදුලේ බුලත් උපන් තේ
යනතු පසක් ලියලා එහි මුර සිටු වන් තේ
යනතු පසට සැම දෙවියෝ දිවස් එලන් තේ
යනතු බෙලෙන් බුලත් හෙප්පු තහංචි වන් තේ'

'මහ කෙල මග නාග රාජ දූහැත් රැගෙන එත් එමවි ට
දූහැත් තට්ටු සාදූ සිට පූජා කෙරුවයි මුනිඳු ට
දූහැත් වළඳමින් මුනිරජ පින්පෙත් දුන් නාරජුන් ට
එ අනුහසින් තහංචි නැත බුලත් තට්ටු ගන්ට අප ට'

මෙසේ තත් තත් ප්‍රවෘත්තීන් පිළිබඳ ඉතිහාසය උත්කර්ෂය විනෝදය හා ප්‍රයෝජනයත් දක්වෙන වාක් ප්‍රපඤ්චයෙන් හෙබි මේ ආදී බොහෝ ග්‍රන්ථ ගණනක් අප හමුයෙහි ඇති. ඒවා පැරණි සිංහලයන්ගේ ජීවන මාර්ගය ක්‍රමවත් සංස්කෘතියක ගමන් කළ බවට ශාක්‍ෂියහ.

මද්‍යෝන්මාදය කවියට රුකුලක් කොට ගත් කිහිපදෙනකුන් විසින් ලියූ රාග නිශ්‍රිත ග්‍රන්ථ කතිපයක් ද ජන සමාජයේ තදින් පැතිර ඇත්තේ ය. අනුරාග පරවශ වැ, යෞවන ජ්වරයෙන් පෙළී ලියන ලද එබඳු කාව්‍යයෝ සමාජ සභ්‍යත්වයට අකුල් හෙළන්නෝ ය. **අනුරාග මාලය, වියෝවිගමාලය, රණහංස මාලය, සල්ලමාලය, කම්රඝමාලය, සම්භන්සොකමාලය විරහරත්නමාලය, ආදරරත්නමාලය** හා **රාගමැසිවිල්ල** ත්, එබඳු ග්‍රන්ථ කිහිපයකි. කිසිවිටකත් පණ්ඩිත ජනයා පිනවීමෙහි සමත් නො වන මේ ග්‍රන්ථ සන්තතිය සාහිත්‍ය වංශයක විවරණ විය යුත්තේ නො වේ. එ බැවින් ම රාගයෙන් මත් වූ නො දමුණු තරුණයකුගේ ආලාප වැනි පද්‍යයන් වැටීම නිසා සුප්‍රකට කවියකු වූ දුනුවිල ගජනායක නිලමේගේ කවි දෙසිය තෙතිසකින් හෙබි විසිතුරු රචනයක් වූ **රතිරත්නාලඞ්කාරය** ත්, එසේ ම එ කවියන්ගේ **දුනුවිලහටන** නමැති කඩා පද්‍යයත්, අකැමැත්තෙන් වුව ද සාහිත්‍ය වංශයෙන් ඈත් කිරීමට සිදු වේ.

මඩ ගොහොරු මෙන් සභ්‍යයනට පිළිකුල් උපද වන ශෘඞ්ගාරාලාපයන් හෝ ගිනි පුපුරුමෙන් වැදුණු තැන දවන නර්මාලාපයන් නොවීම නිසා මහනුවර සමයෙහි රචිතවූ විකටාලාප බෙහෙවින් සමාජයෙහි පැතිර ගියේ ය. සිංහලයන් බෙහෙවින් ප්‍රිය කළ සමාජ අඞ්ගයක් වූ හාස්‍යය අමාවතුරු-රත්නාවලි-උමංද කරුවන් කවි නිම්න මාර්ගයකින් ඉපද වූ අතර නූතන සමයෙහි වූ ගැමිකවියෝ උසුළු-විසුළුවෙන් හා විකටාලාපයෙන් මතු කොට දැක්වූහ. රාජ්‍ය පාලනයෙන් විඩා වූ රජ-මැතියන් පිනවීම සඳහා රාජ්‍ය සභායෙහි සෙවය කළ අන්දරේ වැනි එබඳු කවියන් ගැන වෘත්තාන්ත ජනකථා සුලභ ය. රාජ්‍ය සභාවක ආශ්‍රය නො ලදත් විකටාලාප බිහිමෙහි අන්දරේට නො දෙවැනි චතුර ගැමි කවියන් බොහෝ දෙනකුන් සිටි බවට ඇතැම් ප්‍රබන්ධයන් පවා නිදසුන් කළ හැකි ය. එබඳු ප්‍රබන්ධ කරුවකුගේ ඉෂ්ට දෙවතා නමස්කාරය මෙසේ යි.

'ක ර ද ර ලෙව් සත නෙදුකින් මුද නා
සු ර පු ර සැපටත් මැඩි සැප දෙව නා
පු ර ද ර ටත් මැඩියෙන් බල තිබෙ නා
නිර තු ර කාසී දෙවි වැඳ බැති නා'

'තැමෙනුය බත් නැති අය බඩගින්න ට
නැසෙනුය බත් නැත් නම් ලෙව් සතහ ට
නිවෙනුය සාගිනි අම්මප කෑ වි ට
දෙවනුව නමදිමි එ බත් පිඟාන ට'

(ගජබින්නාලඞ්කාරය)

ආරම්භයෙහි සිට අවසානය දක්වා ම විකට අදහස් ගැබ් වූ මෙබඳු පද්‍යාවලීන්ගෙන් ඒ ප්‍රබන්ධ කරුවන් බලාපොරොත්තු වූයේ හුදෙක් අසන්නන් සිනා සෙවීම බව නො අනුමාන වුව ද, මෙයින් එකල පමණක් නො වැ මෙකල වුව ද සමාජයේ

බොහෝ දෙනෙකුන් තුළ සැඟවී පවත්නා ඇතැම් අදහසක් හෙළි වන සැටි නිරායාසයෙන් දක්ක හැකි ය. එහෙයින් සංස්කෘතිය හා සභ්‍යත්වය හෙළි කර ගැනීමෙහි මේ විකාවාලාපයන්ගෙන් පවා සැලසෙන්නේ අනල්ප සේවයකි.

## iv ශික්ෂාපනික ග්‍රන්ථ

වර්තමාන අධ්‍යාපන ක්‍රමයට පෙරාතු ව පන්සල් අධ්‍යාපනය නමින් ලක්දිව පැවැති ඉගැන්නුම් ක්‍රමය මහනුවර කාලයෙහි විධිමත් ලෙස සකස් වී තිබුණේ ය. **පන්සල්හෝඩියෙන්** පටන් ගෙන **සූර්යශතකය** හෝ **බෞද්ධශතකය** දක්වා සැරුණු මූලික අධ්‍යාපනය මුළුමනින් යොමු වී පැවැත්තේ පිරිසුදු වර්ණොච්චාරණයෙහි ශිෂ්‍යයා සමතකු කරවීම සඳහා ය. එකල ප්‍රාථමික අධ්‍යාපනය සඳහා **හෝඩිය**, **නම්පොත**, **මඟුල් ලකුණ ගණදෙවි හැල්ල වදන් කවිපොත බුද්ධ ගද්‍යය** හා **සකස්කඩය** ත් සම්පාදනය වී තිබුණේ ය. මේ ග්‍රන්ථ පෙළ අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමන් විසින් කළ හැටියට සම්මත වී තිබේ. එ තුමන්ගේ මේ ග්‍රන්ථ කිහිපය හැර ශික්ෂාපනයෙහි යෙදූ අන්‍ය ග්‍රන්ථයෙක් වී නම් එය එකකින් හෝ දෙකකින් වැඩි නො විණ. 'බුද්ධ ගද්‍යය' සේ සකස් වී තිබෙන තල්ගහගොඩ රතනජෝති හිමියන්ගේ **වීතරාංගඥ ගද්‍යය** එබන්දකි. ඊට පසුව ලියැවුණැ යි සලකන **බාලෝවාදය** ද තවෙකකි. මේ ග්‍රන්ථය ළදරුවනට මතු නො වැ තරුණයනට වුව ද, සංවරය සඳහා ගත යුතු උපදෙස් රැසකින් සංගෘහිත යැ. මේ හැර එකල ඉගැන්වීම සඳහා ලියැවුණු පොතක් දක්නට නැති. ශික්ෂාපනික ග්‍රන්ථ මෙතරම් අඩු වීමට හේතු වූයේ යථෝක්ත ග්‍රන්ථ කිහිපය ම ඒ සඳහා ප්‍රමාණවත් කොට එවක පඬිවරුන් පිළිගත් හෙයිනැ යි සිතමි.

## 3. ශාස්ත්‍රීය ග්‍රන්ථ

මෙහි ශාස්ත්‍රීය ය යි සලකනු ලබන්නේ, වෛද්‍ය — ජ්‍යොතිෂ හා භූත විද්‍යාත්මක වූ ග්‍රන්ථ සමූහය යි. මෙයින් වෛද්‍ය හෝ ජ්‍යොතිෂ පක්ෂයට අයත් ව්‍යාඛ්‍යාවකට හෝ කවකට වඩා සැලකිය යුතු වැඩි ග්‍රන්ථයක් මහනුවර සාහිත්‍යයෙහි ඇතුළත් ව තිබෙන බවක් දක්නට නො ලැබේ. හිනිගත්පිටියේ සංඝරක්ෂිත හිමියන්ගේ ශිෂ්‍ය දියහුන්නත හිමියන් විසින් 'භෙසජ්ජ මඤ්ජුසාව' අලළමින් ලියූ **යෝග පිටකය** වටිනා වෛද්‍ය සංග්‍රහයකි. කවි දෙතිසකින් යුත් **මෙඩ් කුළු පටලය** දෙවැනි රාජසිංහ සමයෙහි කවිකර තිබෙන නැකැත් පොතකි.

මේ මෙසේ වුවත් යාදිනි — ශාන්ති — මඩිගල ආදි භූත විද්‍යාත්මක වූ ග්‍රන්ථ සමූහයක් නම් මහනුවර සාහිත්‍යයෙහි දක්නට ලැබේ. කලින්කල පහළ වූ චාර්වාකාදි ඇතැම් මහා දර්ශනිකයකුගේ උපහාසයට ලක්වුව ද, දෙවතා පූජනය හෝ

මන්ත්‍ර විද්‍යාව කවර කලකවත් ලොවින් පිටු දක්ක හැකි නො වේ. ඓහික සම්පත්‍යාකාංක්ෂාවෙන් අනතයට ගිය, නැත හොත්, මනොකල්පිත භූත භෞතිකයන් ගෙන් තැති ගැනී ගිය ලොව සවිඥානකා විඥානක වස්තූන් පිළිසරණ කොට යෑම නො වැලක් විය හැකි සිද්ධියක් හෙයිනි. මෙසේ අනාදිමත් කාලයක සිට ලොවට පුරුදුව තිබූ භූතයන් පිදීමේ සිරිත සිංහලයන් අතර ද සමාරම්භයේ පටන් ම කිඳා බැස තිබුණේ ය. එහෙයින් මෙරට නොයෙක් ක්‍රමයේ බලි - බිලි, යක් - තොවිල්, ආදි යාග කර්මයෝ ඇතිවූහ. වෛදික බමුණන් ගේ සමාශ්‍රයෙන් ව්‍යාප්තියට පැමිණි එකී හෝම කර්ම සිංහලයේ කෙතරම් උසස් කොට සලකන ලද්දේ ද යත් — සිංහල නරපතියන් පවා අපල උපද්‍රවයනට මතු නො ව, සංග්‍රාම විජය ග්‍රහණාදිය අපේක්ෂා කොට හින්දු බ්‍රාහ්මණයන් ගෙන්වා ශාන්ති කර්ම කරවා ගත්තා ලද්දේ ය. ඇතැම් රජකෙන කුන්ට ඇතිවූ උවදුරු දුරුකිරීම අපේක්ෂා කොට ලියන ලද ග්‍රන්ථ කිහිපයක් ද දක්නා ලැබේ. වෘත්තගන්ධි නම් ගද්‍ය ලක්ෂණයෙන් ලියූ යාදින්නක ස්වරූපය ලබන **කුවෙණි අස්න** **සිහබා අස්න** වැනි ග්‍රන්ථ මේ ගණයෙහි වැටෙති. මින් නරේන්ද්‍රසිංහ නරේන්ද්‍රයන්ට කුවේණිය ගෙන් ඇතිවූ දිවිදෙස් දුරු කිරීම සඳහා අවිඥාත කතුවරයකු විසින් ලියන ලද **සිහබා අස්න** මහනුවර යාදිනි ග්‍රන්ථ අතර උසස් රචනයකි.

පසුකල සිංහලයෝ බමුණන්ගේ ශාන්ති කර්ම ඉගෙන ඒ පිළිබඳ මූලික රීතීන් ද අනුගමනය කොට ශාන්ති ග්‍රන්ථ නිපද වන්නට පටන් ගත්හ. එහිදී දෛවතයන්ගේ ශක්ති මහත්වයෙන් ශාන්තිය සලසා ගත හැකි නම් කුමක් නිසා රත්නත්‍රයේ ගුණ මහිමයෙන් ශාන්තිය නො සැලසිය හැකිදැ යි සිතූ බෞද්ධ යාගකරු, දශාවතාරයෙන් පෙනී සිට අසුරයන් මර්දනය කළ සැටි කියා පා බමුණන් කෘෂ්ණ දෙවියන් යදිද්දී, අඞ්ගුලිමාලාදි අදම්‍ය පුරුෂයන් දැමූ සැටි කියමින් බුදුන් සරණ යැදී. මේ නිසා ම, රත්නත්‍රයේ ගුණ සමුදය ප්‍රකාශක **බුදුගුණ සිරසපාද මහා සිරසපාද නමස්කාර සිරසපාද බුදුගුණ සාන්ති සුබමඟුල් සාන්ති යශෝදරා සාන්ති හංසරාජ මඞ්ගල වෙස්සන්තර මඞ්ගල රතනකාව්‍ය මඞ්ගල** ආදි බෞද්ධ යාග ග්‍රන්ථ පහළ වූහ. මේ සියල්ල ම මහනුවර කාලීන ග්‍රන්ථ යයි නො කිය හැකි වුව ද, මහනුවර ග්‍රන්ථ මේ අතර නැත්තේ ම නො වේ.

සතළොස්වැනි ශතවර්ෂයේ ආරම්භයේ සිට ම ඇතිවූ වඩුග රාජ සම්බන්ධය නිසා වඩුග දේශයේ විහිත යාග ක්‍රම බෙහෙවින් මෙහි දියුණු වන්නට වූයෙන්, වඩුග යාග පොත් ස්වභාෂාවට නගන ලද්දේ මහනුවර කාලයෙහි ය. **වඩිග සිරසපාද**,

**වඩිග පඩුන** හා **වඩිග තන්ත්‍රය** ත් එබදු යාග ග්‍රන්ථ තුනකි. මේ ග්‍රන්ථ අතර **වඩිග පඩුන** වැනි ඇතැම් ග්‍රන්ථයක් ලියන ලද්දේ ව්‍යති මිශ්‍ර භාෂාවෙනි. ශත සංඛ්‍යාත ද්‍රවිඩ වචන එහි දක්නට ලැබෙනුයෙන්, බොහෝදෙනාට ඒවා තේරුම් ගැනීම පවා දුෂ්කර වැ පවති.

බෞද්ධ යාග ග්‍රන්ථ අතර සමහරක් සාහිත්‍ය වංශයෙහි ඇතුළත් වීමට තරම් උදාර රචනා යැ. පද්‍ය සත්තෑ පසකින් යුත් **හංසරාජ මඞ්ගලය** එවැන්නකි. මේ එහි ආරම්භය යි.

“ස්වස්ති ශ්‍රී වෛවස්වත මනු සංඛ්‍යාත මහා සම්මත පරම්පරානුයාත වූ සාගල් පුර පණ්ඩුවාස නම් නරේන්ද්‍රයාහට පැමිණි දිව් දෝෂාන්ධකාරය දුරු කිරීමට ‘හංසරාජ මඞ්ගලය’ දක්වූහ.

ස න හ ට පැමිණි නෙක රෝ දුක් සියල් ලේ
දු රු කො ට සවන පින වන සිත කර ලොල් ලේ
හැ ම වි ට ලොව සතට සැප දෙන සුවිපුල් ලේ
කා වි කො ට කියමි රන හස රජ මංගල් ලේ”

නවග්‍රහාදි ශාන්ති ප්‍රකරණ අතර **රුවන් සූත්‍ර ශාන්තිය** ද එබඳු ම මනහර රචනයකි. එහින් කෙරෙන ගායනය ඉතා රම්‍යය. නමස්කාර පාඩියේ වචනයක් පාසා විස්තර කොට සෙත් පතන **නමස්කාරපාද** යේ කියුම් ද එසේම රසවත් ය. මෙහින් පෙනෙන්නේ ව්‍යක්තයන් කළ කවර විෂයීය ග්‍රන්ථයක් වුවත් සාහිත්‍යයෙහි උස් තැනක් ගන්නා බවය.

සිංහල භාෂාවෙන් ලියැවී තිබෙන යාග ග්‍රන්ථ අතර වෛදික බ්‍රාහ්මණයන් යැදූ දෛවතයන් පිළිබඳ සෙතාත්‍රද්වාර යෙන් සැපයුණු ග්‍රන්ථ හා, මූලික ග්‍රන්ථයන්හි අනුවාදයෙන් ලියූ ග්‍රන්ථ ද බොහෝ ගණනකි. **ශ්‍රී විෂ්ණු සිරිත සකන්ධ කුමාර සිරිත රන්දුනු පරලය කඳකුමර ශාන්තිය ඹවුනු මාලය ඛදලි කාණ්ඩය දවිමුර උපත** ආදිය එබඳු රචනා කිහිපයකි.

සමන් — අළුත්නුවර — මින්නේරි — ගලේබණ්ඩාර ආදි ලාංකික දෙවියන් අරභයා ලියූ යාතිකා ද, මගසොහොන්, කළුකුමාර, රිරි, වැනි ලාංකික යකුන් පිළිබඳව තැනූ ප්‍රබන්ධ හා යාදිනි ද **බඹයාග නාගමාල** ආදි යාග ග්‍රන්ථ ද මල ප්‍රේත ආදි නොයෙක් භූත පිසාචයන් වෙනුවෙන් තැනූ යාතිකා ද ගණනාවක් ම දක්නට ලැබෙති. මේ සියල්ල ම මෙරට යාග කරුවන්ගේ ප්‍රයොජනය සඳහා පවත්නේ යි.

# පැරණි ලිපි

මීළඟට සාහිත්‍ය ගවේෂකයකුගේ පරීක්‍ෂණයට භාජන විය යුත්තේ පැරණි ලියවිලි ය. මහනුවර කාලයට අයත් වන එවැනි ලියවිලි බොහෝ ගණනක් දක්නට ලැබේ. ඒවා සාහිත්‍ය පෝෂණයෙහි ලා එතරම් ප්‍රයෝජන නොවතු දු, සාහිත්‍යයේ කෞතුක වස්තූන් හැටියට බුහුමනට පාත්‍ර වෙති. සාහිත්‍ය පක්‍ෂයෙහි ලා එයින් අත්වන ප්‍රයෝජනය නම් තත් කාලීන ව්‍යවහාර භාෂාව දැනගැනීම පමණි. සාහිත්‍ය සම්බන්ධයෙන් මේ ලියවිලිවල තත්ත්වය මෙසේ වුව ද, ඓතිහාසික පක්‍ෂයෙන් නම් ඒවායේ ඇති වටිනා කම කියා නිම කළ නොහැකි තරම් ය. සමාජ චාරිත්‍ර, ගනු - දෙනු, නම් - ගම්, වැව්ලි, විදෙශ වෙළඳාම, පාලන කටයුතු, රටේ තත්ත්වය ආදි අප්‍රකට ඓතිහාසික සිඩීන් අනාවරණය කිරීමට එබඳු ලේඛන අතිශයින් වහල් වන හෙයිනි. මේ නිසා ඒ පැරණි ලියවිලි ඓතිහාසික ග්‍රන්ථයක මිනා මෙ වැන්නක විවරණය කිරීමට අවකාශ නැත. ඒ පිළිබඳ මෙහි දැක්විය යුත්තේ උදේශ මාත්‍රයක් පමණි.

රාජ්‍යය පිළිබඳව ද, සමාජය පිළිබඳව ද මහනුවර සමයෙහි ලියැවී තිබෙන ලිපි වර්ග බොහෝ ගණනකි. ඒ ලිපි අතර වැදගත් ලේඛනයන්හි බෙහෙවින් ලිපි නාමය සඳහන් වෙයි. ඒ අනුව විවිධ කොටස්වලට අයත් වන මේ ලිපි වර්ගයන් අතර **ශිලාලිපි, සන්නස්, සිට්ටු, තුඩපත්, තල්පත්, විත්ති, වට්ටෝරු** යන ලිපි වර්ග සත ප්‍රධාන කොට සැලකිය හැකි ය. මෙයින් ශිලාලිපි (ගල්සන්නස්) හැර සෙස්ස පත්‍රයන්හි ලියන ලද්දාහු වෙති. ලිපියේ ඇති වැදගත්කමේ හැටියට ඒවා රන් — රිදී — තඹ ආදි ලෝහ පට්ටයන්හි ද, තල්කොළ ආදි පත්‍රයන්හි ද ලියන ලද්දේය. විත්ති සහ වට්ටෝරු හැර සෙස්ස බෙහෙවින් රාජකීය ලේඛනයන් සඳහා උපයුක්ත ය.

## i ශිලා ලිපි

ශිලා ලිපි වනාහි ගම් — බිම් පුද කිරීමක් හෝ අවශේෂ සිඩියක් සමරණය කරවීමෙහි ලා ගලෙහි කොටවා තබන ලේඛන විශෙෂයෙකි. එහි කරවූ තැනැත්තාගේ නම සහ පිහිට වූ ස්ථානය ද, පුද කළ දේ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද, ඇතුළත් කොට ඇත. විශෙෂයෙන් ම මේ ලේඛන රජ කෙනකුන් ගේ නියෝගයෙන් හෝ එවැනි ම ප්‍රධානයකු ගේ අනු දැනීමෙන් ම කරවන ලද්දේ වේ. මහනුවර කාලයට අයත් සෙල්ලිපි ඇත්තේ ඉතා විරල වශයෙනි.

## ii සන්නස්

සන්නස වනාහි රජු විසින් දෙවනු ලැබූ යම්කිසි දීමනාවල් සඳහන් ලිපි විශෙෂයකි. එහි සඳහන් වන්නේ රජුගේ පණිවින් එය දෙවනු ලැබූ බව යි. **වදාළාවූ පණත** යනුවෙන් ආරම්භ

කොට ලියනු ලබන ඒ සන්නස **මේ සන්නස දේවා වදාළ පණතත් ඒ පණතත් මෙසේ ම පණිවුඩ පණතයි.** යනු වෙත් අවසන් කරනු ලැබේ. ඒ හැර ලේඛකයාගේ හෝ අනිකකුගේ අත්සන සඳහා කිසි ම නමක් එහි යොදනු නො ලැබේ. සමහර සන්නසක ආරම්භයෙහි රජුගේ නාමය ත්, අනෙකෙක ශ්‍රී යන්න පමණකුත් යොදා ඇත. මහනුවර කාලයෙහි ලියැවී තිබෙන මෙබඳු සන්නස් සිය දහස් ගණනකි. මේ හැර රාජ්‍ය කටයුතු පිළිබඳ අන් ආණ්ඩුවකට හෝ අනික් ප්‍රධානයකුට රජු විසින් යවනු ලැබූ ලියුම් ආදි වැදගත් ලේඛන ද මේ සන්නස් නමින් ම හඳුන්වා ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඕලන්ද ආණ්ඩුව වෙත යැවූ ලියවිල්ල එවැන්නකි.

## iii සිට්ටු

සිට්ටුව ද බෙහෙවින් සන්නසට සමාන දීමනාවල් සඳහන් ලියවිල්ලකි. මහාධිකාරම්තුමාගේ හෝ දිශාධිකාරම්තුමාගේ නම් යොදා දෙවීම එහි ඇති විශේෂය යි. සමහර සිට්ටුවක තවත් රාජ්‍ය නිලධාරීන් කිහිපදෙනකුගේ ද නම් දක්නට ලැබේ. සන්නසකින් හා තුඹපතකින් පිටත් රාජ්‍යයේ අව ශේෂ වැදගත් දීමනාවල් බෙහෙවින් දී තිබෙන්නේ මේ සිට්ටු මගිනි. එසේ ම මහ ජනයාට ආණ්ඩුවෙන් ලැබෙන අනිත් අනිත් කටයුතු පිළිබඳ ලියුම් කියුම් ද මේ සිට්ටු නමින් ම ව්‍යවහාර වී තිබේ. මහනුවර කාලයෙහි ලියැවී තිබෙන මේ සිට්ටු සිය දහස් ගණනක් අද දු ඒ ඒ තැන්හි තැන්පත් ව ඇත.

## iv තුඹපත්

තුඹපත ද බෙහෙවින් සිට්ටුවට සමාන ලියවිල්ලකි; සාමාන්‍ය සිට්ටුවකට වඩා එහි ඇති විශේෂය නම් 'තුඹපත' උසස් දීමනා සඳහා යෙදූ බව යි. රජුගෙන් ත්‍යාග වශයෙන් ලැබෙන දේ මේ තුඹපත් මගින් හිමි කර වන ලද්දේ ය. 'බාරස' කාව්‍යය නැමැති දුෂ්කර බන්ධනය ලියූ කරතොට ධර්මාරාම හිමියන් වෙත 'පල්ලේබැද්ද' නැමැති ගම පුද කෙළේ මෙ වැනි තුඹපතකිනි. මේ තුඹපත් වලත් මහාධිකාරමගේ අත්සන යොදනු ලැබේ. යළි දු, පැරණි දීමනා සඳහන් සන්නස නැතිවූ විටක දෙවනු ලැබූ ලියවිලි ද 'තුඹපත්' යී සමහර තැනක දක්වේ. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමන් විසින් රත්ගිරි දඹුළු විහාරයට ලියවා දුන් 'තුඹපත' එ වැන්නකි. රාජාඥාව මුල් කොට දෙවූ එහි කිසිවකුගේ ත් අත්සනක් යොදා නැත. සෙනරත් නරවරයන් විසින් දෙවූ සන්නස් නැතිවූ බැවින් 'තුඹපත' ලේඛනය කරවා දෙන බව එහි සඳහන් ව තිබේ. මේ මෙසේ වුව ද, පැරණි සන්නස අළුත් වැඩියා කරනුයේ සන්නසකිනි. වික්‍රමබාහු නම් නරේන්ද්‍රයකු විසින් ගෙඩිගේ විහාරයට දෙවූ සන්නස අළුත් වැඩියා කරමින් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් දෙවූ ලියවිල්ල එවැන්නකි. සමහර අවස්ථාවක තුඹපතෙහි හා සන්නසෙහි විශේෂයක් දක්නට ද නො ලැබේ.

## v තල්පත්

පොදු වැසියාගේ ප්‍රවේණිය සඳහා දෙනු ලැබූ ඉඩකඩම් සඳහන් ලිපි වර්ගයකු ද වෙයි. ඒවා බෙහෙවින් හඳුන්වනු ලබනුයේ 'තල්පත්' නමිනි. ඇතැම් විහාරස්ථානයකට කරන ලද පූජාවෝ ද මේ තල්පත්හි සඳහන් වී තිබෙත්. මේවා ලියන ලද්දේ 'මොහොට්ටාල' විසිනි. මොහොට්ටාල ගේ අත්සන හා ශාක්ෂිකරුවන් ගේ අත්සන් ද එහි පිහිටුවා ඇත. වර්තමාන 'ඔප්පුව' බෙහෙවින් මේ 'තල්පත'ට සමාන වූවකි. තවද. තමන් ගේ ඉඩ — කඩම් ස්වකීය දරු පරපුරට හිමි කර දෙනුයේ ද මේ තල්පත් මගින් ම යැ.

## vi විත්ති

'විත්තිය' නම් වර්තමාන 'පෙත්සම'කට සමාන ලියවිල්ලකි. පොදු වැසියා පිළිබඳ මොනයම් කරුණක් නමුත් මහ වාසලට දැන්වීමේදී ඒ මේ විත්තියකින් ම ඔප්පු කරනු ලැබේ. එවැනි ලියවිල්ලක ආරම්භය මෙසේ යි: —

"සර්ව නරේන්ද්‍ර තිලකොපෙත දීප චක්‍රවර්ති දෙවි ස්වාමිදරුවූ උතුම් මහ වාසලට ඔප්පු කරමින් ශ්‍රී කරුණා මහිමනාවෙන් නඩු හැටියට ඇහුම් බැලුම් වෙන පිණිස මහ නිලම් දෙපල ඉදිරියෙහි මතක් කරවා සිටින **විත්ති** වසමේ වගනම්."

ගම්මුන්ගේ සියලු ම ආරාවියවුල් සංසිඳවා ගැනීමට රජ වාසල වෙතින් අයැද සිටින උපකාර මේ 'විත්තිය'ක ම සඳහන් වන්නේ ය.

## vii වට්ටෝරු

මහ ජනයා අතරත්, භික්ෂූන්වහන්සේ අතරත්, හුවමාරු වූ ලිපි විශේෂය බෙහෙවින් හඳුන්වනුයේ 'වට්ටෝරු' නමිනි. පෞද්ගලික ලියකියමන් සියල්ල ම මේ සඞ්ඛ්‍යාවෙහි වැටේ. මහනුවර කාලයෙහි ලියැවී තිබෙන එබඳු ලියවිලි ද රාශියක් මෙකල දක්නට ඇත. මේ ලිපි අතර වැලිවිට සරණඞ්කර සාමණේරයන් වහන්සේ ස්වකීය ශිෂ්‍ය පිරිසකට අනුශාසනා වශයෙන් යැවූ 'වට්ටෝරුව'ක අවසානය මෙසේ යි—

"ඒ වගත් මෙසේ ම මේ අනුශාසනා **වට්ටෝරුව** ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් දෙසිය සැත්තෑ තුනට පැමිණි වර්ෂයෙහි පොසොන් මස පුර දසවෙනි සිකුරාද ලියා එවූයේ මදක් මෛත්‍රියෙහි අනුසස් සලකන වැලිවිට සරණංකර සාමි වම්හ."

**කතිකාවත** ද තවත් පැරණි ලියවිල්ලකි. එම ලියවිලි බුද්ධ ශාසනයේ චිර ස්ථිතිය අරභයා භික්ෂු පරපුරගේ දූනාගැනීම පිණිස ශාසනික ප්‍රතිපත්ති සඞ්ග්‍රහ කරමින් ලියා තැබූවකි. මහනුවර සමයෙහි ලියැවුණු එවැනි කතිකාවත් දෙකකි. පළමුවැන්න **කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත** නමින් ද, දෙවැන්න **ශ්‍රී රාජාධිරාජසිංහ කතිකාවත** නමින් ද ප්‍රකාශ වැ ඇත.

තවද, මහනුවර කාලීන ලිපි අතර ගනු-දෙනු පිළිබඳ ලේඛන, කඩයිම් ලේඛන, කෝරළ, විත්ති-වසම් හා පින්කම් පිළිබඳ ලේඛන ද, නාම වට්ටෝරුද බොහෝ ගණනක් දක්නට ලැබේ. ඒවා එකිනෙකට මෙහි විස්තර කිරීමට අවකාශ නැත. ප්‍රමාණයෙන් කෙතරම් විශාල ලේඛන වුවත්, එහින් සාහිත්‍ය පක්ෂයට අත්වන ප්‍රයෝජනය යට දැක්වූ ප්‍රමාණය ම බැවිනි.

## ප්‍රබන්ධ

මහනුවර සමයට අයත් පැරණි වියතුන් විසින් නොයෙක් අවස්ථාවන්හි කරන ලද පද්‍යරචනයෝ මෙහි 'ප්‍රබන්ධ'යහ යි අදහස් කරනු ලැබෙත්. මෙකල අසන්නට ලැබෙන එම ප්‍රබන්ධ සියදහස් ගණනකි. ඒවා ජන සමාජයේ සිදු වූ නොයෙක් කරුණු ගැබ්කොට පවතිත්. සමහරවිට එහින් අනාවරණය වන කථාන්තර ද චමත්කාර ජනක ය. එම රචනා බෙහෙවින්ම එබඳු කථාන්තරයක් මූලාශ්‍රය කොට ඇත. සමහර ප්‍රබන්ධ කවිකාර මඩුවේ කීම් හැටියට ද ප්‍රසිද්ධියක් උසුල යි.

සිංහල රජවරුන්ගේ කවිකාර මඩුවක් ගැන බොහෝවිට අසන්නට ලැබේ. ජන ශ්‍රැතියෙහි එන මෙය කිසි ම පොතක නම් ලියැවී නැත. සිංහල රාජ්‍යයේ නිල නාමයන් අතර සඳහන් වන කවිකාර මඩුවේ 'මුහන්දිරම් නිලම' පදවිය ද, මහනුවර 'කවිකාර වීදිය' නමින් හඳුන්වන මාවත ද, මෙ බඳු කවිකාර මඩුවක් තිබූ බවට නො වරදින සුළු සාක්ෂි වෙත්. මෙ කියන කවිකාර මඩුවේ කිවිවරු නම් පෙරසිට ම රජවරුනට සතුති කථනයෙහි පුරුදුව සිටි වන්දිභට්ටයෝ ය. ඔවුන් විසින් තත් තත් කාලීන රජුනට ආසිරි පතා කළ විරුදාවලී ද ඇත්. මෙසේ රාජසිංහ ii, නරේන්ද්‍ර සිංහ, ශ්‍රී වික්‍රමරාජසිංහ යන රජුන්ගේ කවිකාර මඩුවෙහි සිටි වන්දිභට්ටයන් විසින් ගොතන ලද විරුද කාව්‍යයෝ අපේ සාහිත්‍යයෙහි ප්‍රසිද්ධයහ. අන් රජ කෙනකුන් පිළිබඳව කළ විරුදාවලීන් අපට දක්නට නො ලැබෙතත් ඔවුනට කවිකාර මඩු නො තිබුණැ යි සිතිය නො හැක්ක.

මේ අතර ග්‍රන්ථයක නොඑන හුදෙක් මුඛ පරම්පරායෙහි ම පැවත එන ප්‍රබන්ධයෝ ද වෙත්. ඒ ප්‍රබන්ධයන්හි සත්‍යාසත්‍යය කෙතෙක් දුර ඇත්දැ යි කිව නො හැකි ය. ඔවුනතර බොහෝ පද්‍යයෝ සභ්‍යත්වයෙන් ඈත්වූවෝ ය. රචනයෙන් අව්‍යක්තයහ. බොහෝ ප්‍රබන්ධ කරුවන් ශාස්ත්‍රාභ්‍යාසයෙන් ලත් කවිත්වය ඇත්තවුන් නො වැ, ජන්ම සිද්ධ මුඛරත්වය පමණක් ඇති ගැමියන් වීම එයට හේතු යැ. එකී ප්‍රබන්ධ ඔවුන් විසින් කරන ලද්දේ ද සාහිත්‍ය පෝෂණය අපේක්ෂා කොට නො වේ. විනෝදස්වාදය වැනි යම් යම් පෞද්ගලිකාර්ථයන් පිරිමසා ගන්නා අටියෙනි. ඒ එසේ වුව ද, එබඳු පද්‍යයන් කියවීමට ප්‍රිය කරන්නෝ නම් බොහෝ වෙති. එහෙයින් මේ ප්‍රබන්ධ සාහිත්‍ය

පොෂණියෙහි මහත් රුකුලක් මෙන් පෙනෙතු දූ, මෙසිනු දූ ලැබෙත්තේ ප්‍රද්‍යෝතන පැරණි ලිපිවලින් මෙන් ම කෞතුක රසය පමණි. භාෂා විකාශය දූන ගැනීමට හෝ හේතු නො වනු යෙන් ලිපියෙන් පමණවත් සාහිත්‍ය සෙවයක් නොවෙති යි සිතනු නිවරද යැ.

මහනුවර සමයෙහි විසූ මෙ වැනි ප්‍රබන්ධකාරුවන් අතර **දස්කොන් අධිකාරම** වෙසෙසින් සැලකිය යුත්තෙකි. ලන්දෙසි පියකු නිසා සිංහල මවක කුසින් උපන් මෙතෙමේ පසුකල නරේන්ද්‍රසිංහ රජුට මිත්‍ර වැ අධිකාරම් නිලයක් ද ලැබී ය. එනමුත් ඔහුගේ අවසානය පිළිබඳ ව අසන්නට ලැබෙනුයේ කණිකටුක ප්‍රවෘත්තියකි. ඒ වනාහි රජ බිසව කෙරෙහි පැවැති අයථා සම්බන්ධයක විපාකය යි. එම ප්‍රෙම බන්ධනය මුල්කොට අධිකාරම විසින් බඳනා ලද පද්‍යයෝ කිහිපයකි. මහජනයා අතර ප්‍රකට එම පද්‍යයෝ සහෘත්‍යියෙන් ඈත්ව සිට රචනා කරන ලද්දෝ ය. මේ කරුණු නිසා නොවැ කවිත්වයෙහි පැවැති විශිෂ්ට ප්‍රතිභාශක්තිය නිසා **දස්කොන් අධිකාරම** පඬුවන්ගේ සම්මානය යට පාත්‍ර වෙයි. **කව්අන්දය** නමින් ප්‍රකට කඩෙ නැටීමේ සින්දුවත්, **ශෘංගාරඅඩු මාලය** ත් ඔහුගේ ප්‍රසිද්ධ ප්‍රබන්ධ දෙකකි. එ ද රචනාකරන ලද්දේ යථොක්ත ප්‍රෙමය මුල්කොට ගෙන ය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දින විසූ සරණඞ්කර මාහිමියන්ගේ ශිෂ්‍ය **කරතොට ධර්මාරාම** හිමියෝ සිංහල සාහිත්‍යයෙහි පැනෙන සුප්‍රකට ප්‍රබන්ධ කාරකයාණ කෙනෙකි. කවි තුනකින් කවිදෙළසක් කියවෙන සේ රචිත **බාරස කාව්‍යය** දුෂ්කර බන්ධනයන් අතර අති දුෂ්කර බන්ධනයකි. එ බැවින් ම තුටු පහටු රාජාධි රාජසිංහ මහීපාලයෝ **පල්ලේබැද්ද නම්** ගම් වරය උන්වහන්සේට සතුටු පඬුරු කොට දුන්හ. **පත්තායමේ ලේකම්තුමා** ද මෙලෙසින් ම ප්‍රසිද්ධ බන්ධන කරුවෙකි. කවි සොළසකින් යුත් **රාවණී** ප්‍රබන්ධය එ තුමාගේ ව්‍යක්ත රචනායකි. **ගල්ඇටුඹේ දුෂ්කරබන්ධනය** ද මෙ සමයට අයත් තවත් ප්‍රබන්ධයකි.

‘කා ර තොට බෝවල ද ගාල’කුරුසි නම් න
කී ර මද කිවිඳු දෙනගම දම්කිත් පටු න
තෙ ර සත් ගල්ඇටුඹේ දම් බනු වටි න
ප ර සිදු සමත් යති රට පාත මෙ පම ණ’

යන කවෙන් පැවසෙන සත් පඬිවරුන් අතර ගල්ඇටුඹේ නමින් ප්‍රසිද්ධ **පියදස්සී** යතීන්ද්‍රයෝ එහි කර්තෘ වූහ.

මෙසේ ම මේ සාර්ධ ශතසංවත්සර වයක් පමණ දීර්ඝ කාලයෙහි දක්නට ලැබෙන තවත් බොහෝ ප්‍රබන්ධ කරුවන් අතර **ගම්මුල්ලේරාළ, ඕපාත මහත්මයා, ඇලපාත මුදලි, අබරන් අප්පුහාමි, ගජමන්නෝනා, බලවිත්තල මැණිකේ, මිහිරිපැන්නේ ස්වාමි, කොක්ගල පඬිතුමා** ආදී කවීහු යම් යම් කරුණු නිසා ප්‍රබන්ධ කිරීමෙන් වැඩියක් ප්‍රසිද්ධියට පත්වූවෝ ය.

පාරම්පරිකව පැවත එන මේ කෞතුක බන්ධනයෝ සාහිත්‍ය පක්ෂයෙන් කෙසේ වුව ද ඉතිහාසය අතින් නම් ඉතා වැදගත් කොට සැලකිය යුත්තෝ වෙති. තත් කාලීන ගැමියන්ගේ වාග් විලාසාදියත්, ගම්බද තත්ත්වයත්, ආහාර-පාන විහරණ වැනි සාමාජික තොරතුරුත් බොහෝ දුරට මේ ප්‍රබන්ධවලින් අනාවරණය වන බැවිනි. එහෙයින් ලංකා ඉතිහාසයට මහත් සම්පූර්ණත්වයක් ගෙන දෙන මේ **කෞතුක ප්‍රබන්ධ ද** පැරණි ලිපි මෙන් ම නොනැසියදී ආරක්ෂා කරගැනීම වාතීමානිකයන්ගේ පරම යුතුකම වන්නේ යි.

**සාහිත්‍ය ශේෂය මෙතෙකින් සමාප්ත යි.**

# විෂය සූචිය


පිටු

අත්තනගලු වංශය xxx
අත්තරගම රාජගුරු බණ්ඩාර. 89, 166, 180
අනාගත වංශය xxix
අභයකෝන් විජයසුන්දර මුදලි 74
අභිධම් ව්‍යාඛ්‍යා xviii
අභිධම්මාර්ථ සඞ්ග්‍රහ සන්නය xix
අමාරසය 110
අමාවතුර xxi
අරාබිනි සොල්ලාස වස්තුව 162
අසදිසදා කව 105
ආඩි මාලය 176
ආසිත්තාලියද්දේ මුහන්දිරම 102
ඇත්පල්දා කව 36
ඇහැලේපොළ හටන 176
උපාසකජනාලඞ්කාරය 149
ඌවේ කුඹා මොහොට්ටාල 25
එළු සිලෝ සතකය xxxiv
ඓතිහාසික කාව්‍ය 174
කඞ්ඛාවිතරණී සන්නය xxvi
කටුවාණේ මුහන්දිරම 78, 82
කඨිනානිශංසය xxxiv
කණුමූලේ ධම්මානන්ද 100
කතෝලික සමය 120
කතෝලික සිංහල සාහිත්‍යයේ ආදි කතුවරයා 124
කතෝලික සිංහල සාහිත්‍ය ග්‍රන්ථ 125
කරතොට ධම්මාරාම 187
කව්සිළුමිණ xxiv
කව්සිළුමිණ ii 154
කව්මිණි කොඬොල 78
කව්මිණි මල්දම 82
කව්මිණි රන්දම 155
කව් මුතුහර 91
කව්මුතුහර ii 157

පිටු

කව්ලකුණුමිණ xxxiii
කාලිඞ්ගබෝධි ජාතක කාව්‍යය 115
කාව්‍යශේඛරය xxxi
කාව්‍යදීපනී 96
කැටකිරිලි සන්දේශය 109
කිරම ධම්මානන්ද 153
කිරම ධම්මාරාම (පුස්වැල්කිරම) 161
කිරිමැටියාවේ මැනිදු 32
කුලසේකර අප්පුහාමි 51
කුවේණි අස්න xxix, 181
කුස්තන්තීනු හටන xxxvii
කුසජාතක කාව්‍යය xxxvi
කෝකිල සන්දේශය xxxii
කොට්ටේ උන්නතිය හා අවනතිය 5
ගඞ්ගාරෝහණ වර්ණනාව 147
ගණින්නාන්සේවරු 22
ගම්මුල්ලේ රතනපාල 71
ගිණිගත්පිටියේ සඞ්ඝරක්ඛිත 63
ගිරා සන්දේශය xxxii
ගුත්තිලය xxxiii
ගෝලකාල පුවත 171
චරිත කාව්‍ය 170
ජාකෝමේ ගොන්සාල්වෙස් 124
ජාතක කාව්‍ය 36
ජාතකගාථා සන්නය xxii
ජාතක ගැටපදය xxiii
ජාතක පොත xxviii
ජුසේවාස් 123
ජෝන් පෙරේරා 159
ඥානාඤ්ජනය 132
තල්අරඹේ ධම්මක්ඛන්ධ 154
තල්අරඹේ සුමිත්ත 155
තල්ගහගොඩ රතනජෝති 99
තාහංචි 178

පිටු

තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත 76
තිසර සන්දේශය xxx
තෙරුවන්මාලා 63
තෝමස් සමරසේකර 147
ථූපවංසය xxii
දඹදෙණි අස්න xxix
දසකොන් අධිකාරම 187
දහම් ගැටය xxvii
දහම්ගැට මාලාව xxxiii
දහම්සොඬ කව xxxvi
දළදා පූජාවලිය xxiv, 73
දළදා සිරිත xxii
දික්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ෂිත 97
දියසැවුල් අස්න 150
දුක්ප්‍රාප්ති ප්‍රසඞ්ගය 130
දුනුවිල ගජනායක නිලමේ 115
දෙනිස් කුණප වර්ණනාව 172
දෙවධම් ජාතක කාව්‍යය 61
දෙවවේද පුරාණය 126
දෙවවේද සංක්‍ෂෙපය 127
දෙවනීති විසර්ජනය 135
දෙඩම්වල කිවිඳු 60
ධම්පියා අටුවා සන්නය xvii
ධම් සරණ xxii
ධම් ප්‍රදීපිකා xxi
ධම්ශාස්ත්‍ර පරිහානිය 11
ධම් සඞ්ග්‍රහ කාව්‍ය 171
ධාතුවංශය xxxv
නන්දන කිවිඳු 37
නරේන්ද්‍රචරිතාවලෝකන ප්‍රදීපිකා 158
නවනාමාවලිය 99
නාමාවලිය xxxiv
නාමාවශිෂ්ට ග්‍රන්ථ xiv
නාරිසත් සන්දේශය 161
නායක්කාර වංශය 46
නිකාය සඞ්ග්‍රහ xxix
නිරය වර්ණනා xxvii
නීලකොබෝ සන්දේශය 117
නූතන ලඞ්කාව 138
නෙළුම් මාලය 161
ප්‍රථම ලිපිබද්ධ සාහිත්‍යය xiii

පිටු

ප්‍රබන්ධ 186
ප්‍රවෘත්ති පත්‍ර 146
ප්‍රාතිහාර්ය ශතකය 95
ප්‍රාතිහාර්යාවලිය 133
පඤ්චාඞ්ග ලිත 141
පඤ්චිකා ප්‍රදීපය xxxiv
පඬුවස්දෙව් කව 175
පත්තායමේ ලේකම 68, 78
පරෙවි සන්දේශය xxxii
පවන 31
පාලුවැවේ ධම්මපාල 175
පැරකුම්බා සිරිත xxxiv
පැරණි ලිපි 183
පියුම්මල xxxiv
පිළිකුල්භාවනා කව 162
පූජාවලිය xxvii
බමුණු වත 175
බරණගණිතැඳුරු 117
බාරස කාව්‍යය 187
බින්තැන්නේ ස්වාමි 28
බුත්සරණ xxi
බුදුගුණාලඞ්කාරය xxxiii
බුද්ධබණ ප්‍රත්‍යක්ෂය 135
බෝධිවංශය xxix
බෞද්ධයාග ග්‍රන්ථ 181
භූතවිද්‍යා ග්‍රන්ථ 182
භෙසජ්ජමඤ්ජුසා සන්නය 165
මකරධ්වජය 85
මණිචෝර ජාතක කාව්‍යය 51
මයූර සන්දේශය xxx
මයූර සන්දේශය ii 162
මහනුවර 13
මහපදරඞ්ග ජාතක කාව්‍යය 39
මහහටන 32, 34
මහාසේන 57
මාතර සරණපාල 161
මිදෙල්ලව කෝරාල 160
මුංකොට්වේ රාල 104, 112
මූවජාතක කාව්‍යය 168
මූවදෙව්දාවත xx
මොරතොට ධම්මකඛන්ධ 149
මොරතොට වත 112
යටත්වල ශ්‍රී සුනන්ද 158

පිටු

යාදිනි 181
යෝග පිටකය 180
යෝගරත්නාකරය xxxiv
රණස්ගල්ලේ හිමි 114
රතවතී කථාව 68, 187
රාගනිශ්‍රිත ග්‍රන්ථ 179
රාජරත්නාකරය xxxv
රාජසිංහ i විරුදවලී 25
රාජාධිරාජසිංහ 105
රාජාවලිය 43
රුවන්මල් නිඝණ්ඩුව xxxiv
ලක්දිව ආදිම ලේඛන ix
ලකුණුසර xxxiii
ලංකාව හා ආගම් 120
ලංකාව හා ඉංග්‍රීසීහු 47
ලෙව්කේ රාල 50
ලෝකෝපකාරය 113
ලෝවැඩ සඟරාව xxxiii
ව්‍යාඛ්‍යා ග්‍රන්ථ 165
වටඹුළුවේ හිමි 49, 57
වඬුග හටන 152
වන්දනා කාව්‍ය 173
වන්නි 6
වර්තමාන භාෂාවේ ආරම්භය xii
වල්ලිමාතා කව 74
වලානේ සිද්ධාර්ථ 141, 161
වැලිගල කිවිඳු 146
වික්‍රමසිංහ පණ්ඩිත මුදලි 61
විකටාලාප 179
විනය විනිශ්චය සන්නය xxvi
විමුක්ති සංග්‍රහ xxxv
වියෝගරත්නමාලය 68
විරිත් මිණිමල (එළුසඳස් ලකුණ) xxvii
විරිත සත්‍යය xx
විල්බාගෙදර රාල 78, 102
විවාද විෂය 143
විශුද්ධිමාර්ග සන්නය xxvi
වෙතාලන් කව 32
වෛද්‍ය කාව්‍යය 129
ශ්‍යාමවර්ණිනා 78
ශ්‍රී දේවරක්ෂිත බටුවන්තුඩාවේ 163
ශ්‍රී නාමය 31
ශ්‍රී නාමරත්නාලංකාරය 175
ශ්‍රීවර්ධනපුර නාමය 14
ශ්‍රීවික්‍රම රාජසිංහ විරුදවලී 146
ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ 76
ශෘංගාරය 175
ශෘංගාරාලංකාරය 175
ශික්ෂාපනික ග්‍රන්ථ 180
ස්‍යාමෝපසම්පදා වත 77
සඟරජවත 104
සඟරා 145
සඟසරණ xxii
සංඝරාජ සාධුචරියාව 102
සතරබණවර සන්නය 65
සද්ධර්මරත්නාකරය xxxiv
සද්ධර්මරත්නාවලිය xxvii
සද්ධර්මාලංකාරය xxix
සඳකිඳුරුදා කව xxxiii
සන්දේශ කාව්‍ය 108
සර්වඥගුණාලංකාරය 118
සරණංකර සංඝරාජ 48, 5x
සසදාවත xx
සාමාජික ග්‍රන්ථ 176
සාරාර්ථ සංග්‍රහ 53
සාලිඇලේ මණිරතන 91
සැවුල් සන්දේශය xxxvi
සැළලිහිණි සන්දේශය xxxi
සිඛවලඳ හා එම විනිස xvii
සිදත් සඟරාව xxvii
සිත්තමුත්තු කථාකාව 119
සිජකඩුවේ ශ්‍රී සුමංගල 163
සියබස් මල්දම 153
සියබස් ලකර xv
සිල්වත් සමාගම 49
සිංහබා කිවිඳු 162
සිංහල උම්මදනාති ජාතකය 100
සිංහල කෝෂග්‍රන්ථ 98
සිංහල දළදා වංශය 73
සිංහල භාෂාව 1
සිංහල මහාවංශය 163
සිංහල මිලින්ද ප්‍රශ්නය 87
සිංහල රාජ්‍යයේ අවසානය 158
සිංහල රාමායනය 162

| | පිටු | | පිටු |
|---|---|---|---|
| සිංහල විමානවස්තු ප්‍රකරණය | 70 | සුළුපූජාවලිය | 104 |
| සිංහල සාහිත්‍යය | 3 | සෙංකඩගල | 15 |
| සීතාවක | 9 | සෙල්ලිපි භාෂාව | |
| සීනටිකුඹුරේ සුමඞ්ගල | 88 | හරිශ්චන්ද්‍ර කථා කාව්‍යය | 58 |
| සුකෘත දර්පණය | 134 | හංස සන්දේශය | xxxii |
| සුභාෂිතය | xxxvi | හෙරණසිඛ | xviii |
| සුමුගුද කව | 57 | හෙලදිව් රජනිය | 159 |
| සුවිශේෂ විඥප්තිය | 128 | හෙළ'ටුවා | xiii |



ඇස්. ඇස්. ඇම්. අප්පුහාමි මහතා වෙනුවෙන් බර්නාඩ් ද සිල්වා විසින් කොළඹ ලේක් හවුස්හි දිනමිණ යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවන ලදී. 1. 2. 47.



